323 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 323 - இல. 11
Volume 323 - No. 11

2025 නොවැම්බර් 27 වන බ්‍රහස්පතින්දා
2025 நவம்பர் 27, வியாழக்கிழமை
Thursday, 27th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම [තීරුව 2165]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 2167]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2169-2195]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ස්වාධීන සේවක අර්ථසාධක අරමුදල් අධිකාරියක් පිහිටුවීම [තීරුව 2204]

**අයහපත් කාලගුණය හේතුවෙන් ඇති වී තිබෙන ආපදා තත්ත්වය:**
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2206]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 - [දහහත්වන වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 118, 281, 282, 285-289, 292, 327, 337 (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 2209–2368]

**වී අලෙවි මණ්ඩලය:**
වාර්ෂික වාර්තාව (2017) [තීරුව 2369]

**වී අලෙවි මණ්ඩලය:**
වාර්ෂික වාර්තාව (2018) [තීරුව 2370]

**කල් තැබීමේ යෝජනාව:**
ත්‍රිරෝද රථ සේවාව නියාමනය කිරීම [තීරු 2370-2380]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற் காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு: உறுப்பினர்கள் நியமனம் [ப: 2165]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 2167]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2169-2195]

**தனி அறிவித்தல் மூல வினா:**
சுயாதீன ஊழியர் சேமலாப நிதிய அதிகாரசபையொன்றைத் தாபித்தல் [ப: 2204]

**சீரற்ற காலநிலை காரணமாக நிலவும் அனர்த்த நிலைமை:**
போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 2206]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட பதினேழாம் நாள்]:**
[தலைப்புக்கள் 118, 281, 282, 285-289, 292, 327, 337 (கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசனம்)] – குழுவில் ஆராயப்பட்டது [ப:2209– 2368]

**நெல் சந்தைப்படுத்தல் சபை:**
வருடாந்த அறிக்கை (2017) [ப:2369]

**நெல் சந்தைப்படுத்தல் சபை:**
வருடாந்த அறிக்கை (2018) [ப:2370]

**ஒத்திவைப்புப் பிரேரணை:**
முச்சக்கரவண்டிச் சேவையை ஒழுங்குறுத்தல் [ப:2370-2380]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Select Committee to Look into and Report to Parliament on the Release of 323 Containers from the Port of Colombo without Undergoing Mandatory Physical Inspection and Submit its Proposals and Recommendations in that Regard: Nomination of Members [Col. 2165]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2167]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2169-2195]

QUESTION BY PRIVATE NOTICE:
Establishment of an Independent Employees' Provident Fund Authority [Col. 2204]

DISASTER SITUATION PREVALENT DUE TO ADVERSE WEATHER:
Statement by Minister of Transport, Highways and Urban Development [Col. 2206]

APPROPRIATION BILL, 2026 – [Seventeenth Allotted Day]:
Considered in Committee – [Heads 118, 281, 282, 285-289, 292, 327, 337 (Agriculture, Livestock, Land and Irrigation)] [Cols. 2209–2368]

PADDY MARKETING BOARD:
Annual Report (2017) [Col. 2369]

PADDY MARKETING BOARD:
Annual Report (2018) [Col. 2370]

ADJOURNMENT MOTION:
Regulation of Three-Wheeler Service [Cols. 2370-2380]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 27 වන බ්‍රහස්පතින්දා***
*2025 நவம்பர் 27, வியாழக்கிழமை*
*Thursday, 27th November, 2025*

**පූ.භා. 9.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.00 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
### கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு: உறுப்பினர்கள் நியமனம்
### SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE RELEASE OF 323 CONTAINERS FROM THE PORT OF COLOMBO WITHOUT UNDERGOING MANDATORY PHYSICAL INSPECTION AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ" සේවය කිරීම සඳහා ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාගේ සභාපතිත්වයෙන් යුතුව මතු සඳහන් මන්ත්‍රීවරයන් මවිසින් පත් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

ගරු අනුර කරුණාතිලක මහතා
ගරු චතුරංග අබේසිංහ මහතා
ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු අර්කම් ඉල්යාස් මහතා
ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු ඩී.වී. චානක මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 නොවැම්බර් 27වන බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 2.00ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් යෝජනා සම්මතය සහ නියෝග ඉදිරිපත් කරමි.

(i) (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධ යෝජනා සම්මතය

(2025 නොවැම්බර් 07 දිනැති අංක 2461/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(ii) 2019 අංක 19 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 6 වගන්තිය යටතේ ආනයනය කළ භාණ්ඩවල වටිනාකම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 නොවැම්බර් 07 දිනැති අංක 2461/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය; සහ

[ගරු බිමල් රත්නායක මහතා]

(iii) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 නොවැම්බර් 07 දිනැති අංක 2461/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය.

මෙම යෝජනා සම්මතය සහ නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

Hon. Speaker, on behalf of the Chairman of the Committee on Public Finance, I present the Report of the Committee on Public Finance on the -

(i) Social Security Contribution Levy (Amendment) Bill;

(ii) Betting and Gaming Levy (Amendment) Bill; and

(iii) Regulation under Section 22 read with Section 26 of the Finance Act, No. 11 of 2004,

which were referred to the said Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) ගුන්නෑපාන, හපුවල, උයන්වත්ත, අංක 88 යන ලිපිනයෙහි පදිංචි ජී.එච්.එම්.ඊ.ආර්. වඩිගමන්ගාව මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) මහනුවර, වලල, මැණික්හින්න, පොල්අඹකොටුව, අංක 82/1 යන ලිපිනයෙහි පදිංචි ඊ.එම්.ටී. එදිරිසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ගම්පොළ, පන්විලතැන්න, පහළ ලැගුම්දෙනිය, අංක 290/4/1/ඒ යන ලිපිනයෙහි පදිංචි කේ.එම්.එන්. දමයන්ති කල්ලෝරා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ගරු කථානායකතුමනි, බලංගොඩ, වැලිපතයාය, අංක 23 යන ලිපිනයෙහි පදිංචි යූ.කේ.එස්. නිවර්තනා වීරසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කඹුරුපිටිය, කරගොඩ උයන්ගොඩ, නාකන්දපුර අංක 125/3/ඒ/1 යන ලිපිනයෙහි පදිංචි එච්.ඒ. කවිඳු දිල්ෂාන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) තිහගොඩ, අකුරුගොඩ, ඇටන්ගොඩවත්ත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එල්. විරාජිනී සඳමාලි මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, මේ මොහොතේ රටේ ඇතිව තිබෙන ආපදා තත්ත්වය පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්නත්, ඊට මුහුණ දීම සඳහා ආණ්ඩුව ගෙන ඇති පියවර පිළිබඳව දැනුවත්වීම සඳහාත් මට එක මිනිත්තුවක් ලබා දෙන්න.

මේ වන විට දිවයිනේ දිස්ත්‍රික්ක ගණනාවකටම - විශේෂයෙන්ම අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, කුරුණෑගල, බදුල්ල, මොනරාගල, නුවරඑළිය, ගාල්ල, මාතර ආදි දිස්ත්‍රික්ක ගණනාවකටම - අයහපත් කාලගුණය දැඩි ලෙස බලපා තිබෙනවා.

දිස්ත්‍රික්ක කිහිපයක පුද්ගල මරණ පවා වාර්තා වෙනවා. ඉදිරි පැය කිහිපය මීට වඩා අවදානම් කියලා කාලගුණ අංශ අනතුරු අඟවනවා. රජයත් යම් යම් පියවර ගෙන තිබෙනවා කියලා කියනවා. අ.පො.ස. (උසස් පෙළ) විභාගයත් දින දෙකකින් කල් දමා තිබෙනවා. මේ අවදානම් තත්ත්වය තවදුරටත් වර්ධනය වීමේ අවදානමක් තිබෙන නිසා, ජනතාවගේ ජීවිතත්, දේපළත් ආරක්ෂා කර ගැනීමට සියලු අංශ එකතු කරගත් වැඩ පිළිවෙළක් රට පුරා ක්‍රියාත්මක කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම අප විරුද්ධ පක්ෂය හැටියට මේ වෙලාවේ ජනතාවගෙනුත් ඉල්ලා සිටින්නේ මේ අවස්ථාවේ ඉතා වගකීමෙන් ආරක්ෂාකාරීව කටයුතු කරන්න කියලායි. ඒ ඉල්ලීමත් අපි මේ වෙලාවේ කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා ඒ ආපදා තත්ත්වයට මුහුණ දී තිබෙන දිස්ත්‍රික්කවල සියලු මන්ත්‍රීවරුන් අද දිනයේ උදේ 9.30ට කැඳවා තිබෙනවා, පාර්ලිමේන්තුවට පැමිණ ඒ ගැන සාකච්ඡා කරන්න. ඒක එක කාරණයක්. ඒ වාගේම බලාපොරොත්තු වෙනවා, අද දවල් වරුව තුළදී Minister of Public Security and Parliamentary Affairs සහ ඒ අදාළ අමාත්‍යාංශවල අමාත්‍යවරුන් ඒ ඒ ප්‍රදේශවලට - නුවර, නුවරඑළිය වාගේ ප්‍රදේශවලට - යවන්න.

ගරු කථානායකතුමනි, අද දින ඔබතුමාගේ න්‍යාය පත්‍රයේ "අමාත්‍යාංශ නිවේදන" යටතේ මගේ අමාත්‍යාංශයෙන් නිවේදනයක් ඇතුළත් කර තිබෙනවා. එම නිවේදනය තුළ තිබෙන්නේත් ආපදා තත්ත්වය සම්බන්ධව මූලික පැහැදිලි කිරීමක්. ඒ නිසා ආණ්ඩුව පැත්තෙන් අපි මේකට යම් මැදිහත්වීමක් කරමින් ඉන්නවා. ඒ සඳහා සැම දෙනාගේම සහයෝගය ලබා දීම අපි අගය කරනවා.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -207/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -228/2024- (2), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය පිහිටුවීම පිළිබඳ ප්‍රශ්නය මම දෙවැනි වතාවටත් අහනවා. මේ ප්‍රශ්නයට උත්තර නොදීම පුදුමයි. දූෂණ විරෝධී බවටයි කථාව. හැබැයි, මේ ප්‍රශ්නයට උත්තර නැහැ. බොහොම කනගාටුදායකයි, මේ තත්ත්වය. ඉක්මනින්ම පිළිතුරු දෙන්න. නැත්නම් මෙය තවත් මාසයකට දෙකකට කල් ගිහිල්ලායි පිළිතුරු දෙන්නේ. මේ ආණ්ඩුවට නියමිත අවුරුදු පහේ කාලයෙන් දැන් අවුරුද්දක් ගත වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. තවම එක නඩුවක් පවරා ගන්න බැරි වුණා, දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ. අඩු ගණනේ ප්‍රශ්නයට උත්තර දෙන්නේත් නැහැ. ලජ්ජා සහගතයි, මේක.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]*

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ප්‍රශ්නයට උත්තර දෙන්නත් බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -315/2024- (2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය අහන්න පෙර මම කියන්න ඕනෑ, මේ ප්‍රශ්නය මා අවුරුද්දකට ඉස්සර වෙලා යොමු කරපු ප්‍රශ්නයක් බව. මම මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ 2024 වර්ෂය අගදී. නමුත්, මේ ප්‍රශ්නය 2025 වර්ෂය අගදීයි, න්‍යාය පත්‍රයට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා කාර්ය මණ්ඩලය දැනුවත් කරන්න, මෙසේ ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කරන දිනය දීර්ඝ වෙනවා නම් ඒ දිනයට අදාළව උත්තරය ලබා දෙන ලෙසට වන සඳහනක් එකතු කරන්න කියලා. මොකද, මේ ප්‍රශ්නය අහපු මීට අවුරුද්දකට ඉස්සර වෙලා තිබුණු තත්ත්වය නොවෙයි අද තිබෙන්නේ. අවුරුද්දකට පෙර තිබුණු ප්‍රශ්නයක් ගැනයි මට අද මේ අහන්න වෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. මම අවුරුදු 25ක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ මේ තත්ත්වය දැකලා තිබෙනවා. ඒ අවුරුදු 25දීම මන්ත්‍රීවරු ප්‍රශ්න ඉදිරිපත් කළා; ප්‍රශ්න දහස් ගණනක් ඉදිරිපත් කළා. ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම සඳහා

[ගරු බිමල් රත්නායක මහතා]

Parliamentary Business Committee එකේදී අප කවුරුත් පිළිගත්තු, ඉතාම සාධාරණ සහ විද්‍යානුකූල ක්‍රමවේදයක් හඳුනාගෙන තිබෙනවා. මා හිතන විධියට, ඒ ක්‍රමවේදයම තමයි ඉදිරියට යෝජනා කරලා ඔබතුමා අනුමත කළේ, Private Members' Motions සම්බන්ධවත්. එසේ කළේ ඒ ක්‍රමවේදය හරි නිසා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට නියමිත කාලයක් වෙන් කර තිබෙනවා. පාර්ලිමේන්තුව රැස් කරන්නේ ප්‍රශ්න ඇසීම සඳහා පමණක්ම නොවෙයි. ඒ නිසා මේ දීලා තිබෙන කාලය ඇතුළත නේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න 10කට උත්තර දෙන්න අපට පුළුවන් වන්නේ. ඒක තමයි අප මේ කරගෙන යන්නේ. එහෙම නැතිව, අපි කිසිම දෙයක් වෙනස් කරලා නැහැ. ඒ නිසා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, යම්කිසි පිළිගත් එකඟතාවකට ආවාට පසුව ඊට අනුව කටයුතු කරන්න කියලා. මාධ්‍ය අවධානය ගන්න මොනවා හරි කළාට මට කමක් නැහැ.

පාර්ලිමේන්තුව විධියට අපි සද්භාවයෙන් ප්‍රශ්නවලට උත්තර දෙන්න උපරිම උත්සාහ කරනවා. නමුත්, මෙහෙම තමයි හැමදාම පාර්ලිමේන්තුවේ සිදු වුණේ. අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න කියලා අපි ඇමතිවරුන් උනන්දු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට වාර්තා කර තිබෙනවා අසන ලද ප්‍රශ්නවලට ආණ්ඩුව පාර්ශ්වයෙන් පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන්. පාර්ලිමේන්තුවේදී අසන ලද ප්‍රශ්නවලට උත්තර ලබා දීම පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයෙකු හෝ සභානායකවරයෙකු හෝ පාර්ලිමේන්තුවට වාර්තා කරනවා මම මීට පෙර කවදාවත් දැකලා නැහැ. සමහර විට එහෙම වාර්තා කරලාත් ඇති. නමුත්, මම එවැන්නක් දැකලා නැහැ. ගරු කථානායකතුමනි, මේ ගරු මන්ත්‍රීතුමා හැම දාම වාගේ ප්‍රශ්න ඉදිරිපත් කරනවා. ඒ අහපු ප්‍රශ්නවලට අපි උත්තර දෙනවා. ප්‍රශ්න පෙළගස්වන්න පුළුවන් ප්‍රමාණයක් තිබෙනවා. ඒ ප්‍රමාණයට අනුව තමයි එය කරලා තිබෙන්නේ. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කර සිටිනවා. හැමදාම කරන මේ දෙය සම්බන්ධයෙන් අපට කරන්න දෙයක් නැහැ. පාර්ලිමේන්තුවේ පිළිගත් න්‍යාය පත්‍රයක් තිබෙනවා, Standing Ordersවලට අනුව.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මට point of Order එකක් නඟන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මේක සම්ප්‍රදායක් තිබිච්ච පාර්ලිමේන්තුවක්. ඔය කථා කරන බිමල් රත්නායක මහත්මයාලා මතු කළේම, පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉඳලා, ප්‍රශ්න අහලා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීමක්]* දැන් එතුමා කථා කරලා, බණත් කියලා, ඒ ඔක්කෝම කියන කල් ඔබතුමා,- *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම ඉල්ලා සිටිනවා එය හැන්සාඩ් වාර්තාවෙන් සම්පූර්ණයෙන් ඉවත් කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුරු සපයන්න. *[බාධා කිරීමක්]* අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒක point of Order එකක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මේ සභාව චණ්ඩින්ගේ පාලනයට ගන්න ඉඩ දෙන්න එපා, ගරු කථානායකතුමනි. මම බොරුවක් කිව්වේ නැහැ. මම මේ පාර්ලිමේන්තුවේ,- *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔබතුමා කොහොමද කියන්නේ ඒ ටික අයින් කරන්න කියලා? *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අයින් කරන්න කියන්නේ, ගරු කථානායකතුමාට. [බාධා කිරීම්] එතුමාට එහෙම අයින් කරන්න පුළුවන්. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එතුමා raise කළේ point of Order එකක් නොවෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 92 (2) යටතේයි මෙම කාරණය මතු කරන්නේ. එහි බොහොම පැහැදිලිව තිබෙනවා රීති ප්‍රශ්න මතු කිරීම ගැන. දැන් එම ප්‍රශ්නය අයින් කරන්න කියලා මොකක් යටතේද බිමල් රත්නායක ඇමතිතුමා ඔබතුමාට කියන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අදාළ- [බාධා කිරීමක්]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකක් යටතේද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එකක් නොවෙයි කියන කාරණාව විතරයි මම සඳහන් කළේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) ගැන මම කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුර දෙන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම තවම ප්‍රශ්නය ඇහුවේ නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා ඉදිරිපත් කළේ point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මගේ කාරණය මතු කරන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ point of Order එකක් නොවෙයි කියලා විතරයි මම ප්‍රකාශ කළේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මගේ point of Order එක ඉදිරිපත් කරන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 92 (2) (අ) යටතේ තිබෙන, "... නිවැරදි ක්‍රමවේදය අනුගමනය කරනු ලැබ තිබේ ද..." කියන රීති ප්‍රශ්නයක් මම අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වැරදි ක්‍රමවේදය මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක තමයි මම මේ කියන්න හදන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ප්‍රශ්නවලට උත්තර දීම සම්බන්ධව මේකේ බොහොම පැහැදිලිව තිබෙනවා. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා යම් ප්‍රශ්නයක් මතු කළා. ඒක ඉවත් කරන්න කියන්නේ මොන ස්ථාවර නියෝග යටතේද? අපි ඒකයි අහන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණයට අදාළ නොවන නිසා තමයි මම ඒ සම්බන්ධයෙන් නියෝගයක් දුන්නේ. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ point of Order එකක් නොවෙයි.

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව රැස්වන දවසකට රුපියල් මිලියන 11ක වියදමක් දරනවා කියලා ඔබතුමන්ලා හෙළිදරව් කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය අහනවාද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලා තමයි-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, රවී කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්නේ නැත්නම්- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය අහනවාද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අහනවා.

## 2020-2024 දක්වා මුළු දේශීය සහ විදේශීය ණය: විස්තර
2020-2024 வரையான மொத்த உள்நாட்டு மற்றும் வெளிநாட்டுப் படுகடன்: விபரம்
TOTAL FOREIGN AND DOMESTIC DEBT FROM 2020-2024: DETAILS

315/2024

**3. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) ශ්‍රී ලංකාවේ -

(i) 2024.12.31 දිනට මුළු ණය ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් සහ එක්සත් ජනපද ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2021 සිට 2024 දක්වා කාලය තුළ එක් එක් වර්ෂයට අදාළ මුළු ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2024.12.31 දිනට මුළු ණය ප්‍රමාණය දේශීය ණය සහ විදේශීය ණය වශයෙන් බෙදී යන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) බහුපාර්ශ්වික ණය, ද්විපාර්ශ්වික ණය, ජාත්‍යන්තර ස්වෛරී ණය සහ වාණිජ ණය ලෙස වර්ගීකරණය කළ විට 2024.12.31 දිනට විදේශ ණය සංයුතිය කවරේද;

(v) 2020 සිට 2024 දක්වා කාලය තුළ විදේශ ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) 2024.12.31 දිනට මුළු බහුපාර්ශ්වික ණය ප්‍රමාණය කොපමණද;

(vii) ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහාවූ ජපාන බැංකුව සහ අයර්ලන්ත මිත්‍ර බැංකුව වෙතින් ලබාගත් බහුපාර්ශ්වික ණය ප්‍රමාණය 2020 සිට 2024 දක්වා කාලයට අදාළව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) 2024.12.31 දිනට මුළු ද්විපාර්ශ්වික ණය ප්‍රමාණය කොපමණද;

(ix) 2020 සිට 2024 දක්වා කාලය තුළ එක් එක් වර්ෂයට අදාළ මුළු ද්විපාර්ශ්වික ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கையில் -

(i) 2024.12.31இல் உள்ளவாறாக மொத்தப் படு கடன் தொகை இலங்கை ரூபாயிலும் ஐக்கிய அமெரிக்க டொலரிலும் யாது என்பதை வெவ்வேறாகவும்;

(ii) 2021ஆம் ஆண்டு முதல் 2024ஆம் ஆண்டு வரை ஒவ்வோர் ஆண்டுக்குமான மொத்தப் படுகடன் தொகை யாது என்பதை வெவ்வேறாகவும்;

(iii) 2024.12.31இல் உள்ளவாறாக மொத்தப் படுகடன் தொகையில் உள்நாட்டுப் படுகடன் மற்றும் வெளிநாட்டுப் படுகடன் என்பவற்றின் விபரங்கள் யாவை என்பதை வெவ்வேறாகவும்;

(iv) பல்தரப்புக் கடன், இருதரப்புக் கடன், தேசிய அரசாங்கத்தின் பன்னாட்டுக் கடன் மற்றும் வணிகக் கடன் என வகைப்படுத்தப்பட்டு 2024.12.31இல் உள்ளவாறாக மொத்த வெளிநாட்டுப் படுகடன் விபரங்கள் யாவை என்பதையும்;

(v) 2020ஆம் ஆண்டு முதல் 2024ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் வெளிநாட்டுப் படுகடன் தொகை யாது என்பதை வெவ்வேறாகவும்;

(vi) 2024.12.31இல் உள்ளவாறாக மொத்தப் பல்தரப்புக் கடன் தொகை யாது என்பதையும்;

(vii) உலக வங்கி, சர்வதேச நாணய நிதியம், ஆசிய அபிவிருத்தி வங்கி, சர்வதேச ஒத்துழைப்புக்கான யப்பான் வங்கி மற்றும் எலய்ட் ஐரிஷ் வங்கி ஆகியவற்றின் அடிப்படையில், 2020ஆம் ஆண்டு முதல் 2024ஆம் ஆண்டு வரை பல்தரப்புக் கடன் தொகை யாது என்பதை வெவ்வேறாகவும்;

(viii) 2024.12.31இல் உள்ளவாறாக மொத்த இருதரப்புக் கடன் தொகை யாது என்பதையும்;

(ix) 2020ஆம் ஆண்டு முதல் 2024ஆம் ஆண்டு வரை ஒவ்வோர் ஆண்டுக்குமான மொத்த இருதரப்புக் கடன் தொகை யாது என்பதை வெவ்வேறாகவும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House, of Sri Lanka, the -

(i) total debt as at 31.12.2024 in Sri Lanka Rupees and United States Dollar, separately;

(ii) total debt from 2021 to 2024, in each year separately;

(iii) breakdown of the total debt as at 31.12.2024, as per domestic debt and foreign debt separately;

(iv) composition of foreign debt as at 31.12.2024 categorized as multilateral debt, bilateral debt, international sovereign debt and commercial debt;

(v) foreign debt from 2020 to 2024, separately;

(vi) multilateral debt in total, as at 31.12.2024;

(vii) multilateral debt from 2020 to 2024, separately as per the World Bank, International Monetary Fund, Asian Development Bank, Japan Bank for International Cooperation, Allied Irish Bank;

(viii) total bilateral debt, as at 31.12.2024; and

(ix) total bilateral debt from 2020 to 2024, in each year separately?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2024.12.31 දිනට ශ්‍රී ලංකාවේ මුළු ණය ප්‍රමාණය පහත දැක්වේ.

| 2024.12.31 දිනට ශ්‍රී ලංකාවේ මුළු ණය ප්‍රමාණය | ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියන | එක්සත් ජනපද ඩොලර් බිලියන |
|---|---|---|
| මධ්‍යම රජයේ ණය | 29.6 | 101.2 |

එය අපි දේශීය සහ විදේශීය වශයෙන් වෙන් කර ගත්තොත්, ඩොලර් බිලියන 64.5ක් දේශීය ණය. ඩොලර් බිලියන 36.7ක් විදේශීය ණය.

(ii)

| එක් එක් වර්ෂාවසානයේ පැවති මධ්‍යම රජයේ ණය ප්‍රමාණය | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියන | 17.6 | 27.5 | 28.7 | 29.6 |
| ඇ.ඩො. බිලියන | 87.9 | 75.7 | 88.6 | 101.3 |

(iii) 2024.12.31 දිනට ශ්‍රී ලංකාවේ මුළු ණය ප්‍රමාණය දේශීය හා විදේශීය ලෙස බෙදී යන ආකාරය පහත දැක්වේ.

| රජයේ 2024.12.31 දිනට මුළු ණය ප්‍රමාණය | ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියන | ඇ.ඩො. බිලියන |
|---|---|---|
| දේශීය ණය | 18.9 | 64.5 |
| විදේශීය ණය | 10.7 | 36.7 |
| එකතුව | 29.6 | 101.3 |

(iv) ශ්‍රී ලංකාවේ බහුපාර්ශ්වික ණය, ද්විපාර්ශ්වික ණය ජාත්‍යන්තර ස්වෛරී ණය හා වාණිජ ණය ලෙස වර්ගීකරණය කළ විට 2024.12.31 දිනට විදේශ ණය සංයුතිය පහත දැක්වේ.

| 2024.12.31 දිනට ශ්‍රී ලංකාවේ විදේශ ණය සංයුතිය | ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියන | ඇ.ඩො. බිලියන |
|---|---|---|
| ද්විපාර්ශ්වීය | 3.1 | 10.8 |
| බහුපාර්ශ්වීය | 3.8 | 12.9 |
| ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර | 3.1 | 10.6 |
| වාණිජ ණය | 0.7 | 2.4 |
| එකතුව | 10.7 | 36.7 |

(v)

| ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියන | 6.0 | 6.5 | 12.5 | 11.6 | 10.7 |
| ඇ.ඩො.බිලියන | 32.5 | 32.5 | 34.3 | 35.9 | 36.7 |

(vi) 2024.12.31 දිනට ශ්‍රී ලංකාවේ මුළු බහුපාර්ශ්වීය ණය ප්‍රමාණය පහත දැක්වේ.

| 2024.12.31 දිනට ශ්‍රී ලංකාවේ මුළු බහුපාර්ශ්වීය ණය ප්‍රමාණය | ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියන | ඇ.ඩො. බිලියන |
|---|---|---|
| | 3.8 | 12.9 |

එක්සත් ජනපද ඩොලර් රුපියල් බවට පරිවර්තනය කිරීම සඳහා, වසර අවසාන විනිමය අනුපාතය රුපියල් 292.5833 ලෙස සැලකේ.

(vii) ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව, අයර්ලන්ත මිත්‍ර බැංකුව වෙතින් ලබා ගත් ණය ප්‍රමාණය 2020 සිට 2024 දක්වා වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

| එක් එක් වර්ෂය තුළ ලබා ගත් ණය ප්‍රමාණය (ඩොලර් මිලියන) | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| ලෝක බැංකුව | 330.1 | 536.5 | 424.9 | 737.8 | 556.5 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | - | - | - | 682.3 | 346.8 |
| ආසියානු සංවර්ධන බැංකුව | 612.3 | 610.6 | 641.8 | 827.1 | 871.0 |
| ජාත්‍යන්තර සහයෝගිතාව සඳහා වූ ජපාන බැංකුව | - | - | - | - | - |
| අයර්ලන්ත මිත්‍ර බැංකුව | - | - | - | - | - |

(viii) ශ්‍රී ලංකාවේ 2024.12.31 දිනට මුළු ද්විපාර්ශ්වික ණය ප්‍රමාණය පහත දැක්වේ.

| ශ්‍රී ලංකාවේ 2024.12.31 දිනට ද්විපාර්ශ්වික මුළු ණය ප්‍රමාණය | ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියන | ඇමෙරිකානු ඩොලර් බිලියන |
|---|---|---|
| | 3.1 | 10.8 |

(ix)

| මුළු ණය ප්‍රමාණය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියන | 2.3 | 2.2 | 4.1 | 3.5 | 3.2 |
| ඇමෙරිකානු ඩොලර් බිලියන | 12.3 | 11.2 | 11.3 | 10.8 | 10.8 |

(ආ) පැන නොනඟී.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ලැබී තිබෙන පිළිතුර අනුව මීට පෙර අහන්න තිබුණු ප්‍රශ්නය මම දැන් පළමුවෙනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නම්. මේ පාර්ලිමේන්තුවේ දවසකට වියදම රුපියල් මිලියන 10ක් යනවා කියලා කියනවා. මේක කිව්වාට පස්සේ, මීට අවුරුද්දකට විතර ඉස්සෙල්ලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පළමුවෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අතුරු ප්‍රශ්නය තමයි මම මේ අහන්නේ, ගරු කථානායකතුමනි. නැත්නම් ඒකත් ලියලා මට එව්වා නම් ඔබතුමාට ඕනෑ විධියට අහන්නම්. මෙහෙම නොවෙයි තිබෙන්නේ. මේක මම පාර්ලිමේන්තුවට මීට අවුරුද්දකට ඉස්සෙල්ලා දීලා තිබෙන ප්‍රශ්නයක්. සම්පූර්ණ ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 29යි කියලා මෙතැන තිබෙන්නේ. මේ කියන මොහොත වන විට ට්‍රිලියන 33කට ආසන්න සම්පූර්ණ ණය ප්‍රමාණයක් තිබෙනවා. ට්‍රිලියන 3ක වෙනසක් තිබෙනවා. එදා මේ ප්‍රශ්නයට කල් ගත්තා නම්, මේ කාරණය අඩංගු කරලා අද දිනට තොරතුරු සඳහන් කළා නම් කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මම මේ අහන්නේ සාමාන්‍ය ප්‍රායෝගිකභාවයක් ඇතිව. ඒ විතරක් නොවෙයි, Parliamentary Business Committee එකේදී අපි මේ ගැන කිව්වා. මේ ඇමතිතුමා ඒක පිළිගත්තා. ඉතින්, ඒක කිව්වාම 2024 දෙසැම්බර් මාසය ගැන කියන්නේ. අපි අහන ප්‍රශ්නයට වටිනාකමක් දෙන්න කියලා තමයි මම කාරුණිකව ඉල්ලන්නේ. ඒක හිසරදයක් නොවෙයි නේ. අලුත් ප්‍රශ්නයක් එකතු කරනවා නොවෙයි නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම අතුරු ප්‍රශ්නය අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක නේද අතුරු ප්‍රශ්නය? ගරු මන්ත්‍රීතුමනි, විනාඩි දෙකක් ඇතුළත ප්‍රශ්නය අහන්න. අතුරු ප්‍රශ්නයට වැඩි වෙලාවක් ගන්න එපා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම අහපු එකට උත්තරයක් ලැබුණා නම්, ප්‍රශ්නය ලේසියෙන්ම අහන්න පුළුවන් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එතකොට අතුරු ප්‍රශ්න තුනක් වෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම අතුරු ප්‍රශ්නය අහන කොට එහෙත් බලනවා, මෙහෙත් බලනවා. මමයි ප්‍රශ්නය අහන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වියදම අඩු කිරීම ගැන අහන්න ගිය ප්‍රශ්නය, මම දැන් අහන්නම්. අද මේ කියන මොහොතේ සම්පූර්ණ ණය ප්‍රමාණය ට්‍රිලියන 32.6 නොවෙයිද? ඒ සම්බන්ධයෙන් අද දවස වනවිට දැරිය යුතු පොලිය අවුරුද්දකට කීයද? මේ ප්‍රශ්නය තමයි මම අහන්න හැදුවේ.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු ට්‍රිලියන 32.6 කියන එක වැරැදියි. ඔබතුමා ඒ අගය ගත් මූලාශ්‍රය දෙන්න. *[බාධා කිරීමක්]* රවී මූලාශ්‍රය කියන්න එපා. අද මම ඒ සංඛ්‍යාව කියන්නම්. ණය පිළිබඳව රාජ්‍ය ණය කළමනාකරණ පනතේ නිර්වචනයට අනුව ඒ සංඛ්‍යාව පැහැදිලිව ඉදිරිපත් කරනවා. මධ්‍යම රජයේ ණය තමයි මේ සංසන්දනය කරගෙන යන්නේ. ඒක 2024.12.31 දිනට තමයි ට්‍රිලියන 29.6ක් කියලා කිව්වේ, ගරු කථානායකතුමනි. 2025 ජූලි මාසය වනවිට ට්‍රිලියන 30.7යි; සැප්තැම්බර් වන විට ට්‍රිලියන 30.93යි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන් ගත් සංඛ්‍යා මම කියන්නේ. ගරු මන්ත්‍රීතුමා කියන ට්‍රිලියන 32.6 කියන එක මොකක්ද කියලා මම දන්නේ නැහැ. මම වගකීමෙන් කියනවා, සැප්තැම්බර් 30වන දා වෙනකොට තිබෙන්නේ රුපියල් ට්‍රිලියන 30.93යි කියලා. ඒ වාගේම තමයි, අතීතයේදී, විශේෂයෙන්ම ඔබතුමන්ලා ආණ්ඩු කරපු කාලයේ - 2015 ඉඳලා 2019 වෙනකොට - මේ ණය සියයට 74ක් වාගේ ප්‍රමාණයකින් වැඩිවෙලා තිබෙනවා. ඒ වාගේම, අපි මේ ස්ථායීකරණ කටයුත්ත තුළට ආවාට පස්සේ අසාමාන්‍ය විධියට ණය අරගෙන නැහැ. ණය කළමනාකරණ වැඩසටහනක් ඇතුළේ තමයි කටයුතු කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ දත්ත අපට ලැබුණේ, ඔක්තෝබර් මාසයේ 20වැනිදා වාගේ දිනයක, මුදල් අමාත්‍යාංශයේ Public Debt Management Office එකේ නිලධාරීන් Public Finance Committee එකට ඇවිල්ලා ඉදිරිපත් කළායින් පසුවයි. මම දන්නේ නැහැ, පරස්පරයක් ඇති වුණේ කොහොමද කියලා. සාමාන්‍යයෙන් මේ ඇමතිතුමා වැරදි තොරතුරු කියන්නේ නැහැ. නමුත්, කාර්ය මණ්ඩලය ඒ කමිටුවට ඇවිල්ලා කියලා තිබෙන්නේත් බොරුද කියන ප්‍රශ්නය මතු වෙනවා. මේ තත්ත්වය තුළ ඔබතුමා ණය ගත්තේ නැහැ නොවෙයි, බංකොලොත්භාවය නිසා ඔබතුමාට ණය ගන්න බැරිවෙලා තිබෙනවා. මම ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නය තුළින් අහලා තිබෙන්නේ, මේ පාර්ලිමේන්තුවේ අවසර නැතුව රටේ debt standstill තත්ත්වයක් ඇති වුණේ කොහොමද කියන එකයි. ණය ගෙවන්නේ නැතුව ඉන්න අවසර දුන්නේ කුමන පදනමක් තුළද? ඒ නිසා තමයි ණය ගන්න බැරිවෙලා තිබෙන්නේ. 2022 අප්‍රේල් මාසයේ 12වැනි දාට පස්සේ ණය ගන්න බැරිවෙලා තිබෙනවා. එවැනි අවස්ථාවකට මේ පාර්ලිමේන්තුව අවසර දුන්නාද, නැද්ද කියලා මම අහපු ප්‍රශ්නයට උත්තරයක් ලැබිලා නැහැ. ඉතින්, ඉංග්‍රීසියෙන් half-baked කියනවා වාගේ මම මේ අහන ප්‍රශ්නයට හරියාකාර උත්තරයක් ලබා ගන්න බැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දෙවැනි අතුරු ප්‍රශ්නය ළඟට තමයි මම මේ පදනම හදාගෙන ආවේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම අහපු ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නයට උත්තර දුන්නා නම්, මේ පාර්ලිමේන්තුව මෙන්න මේ දවසේ තමයි debt standstill එකට අවසර දුන්නේ කියලා, හරි නේ. මේක තමයි ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය තුළින් ඇතිවෙලා තිබෙන ප්‍රතිවිපාකය. දැන් උත්තරයක් දෙනවා, ණය ගන්න බැහැ කියලා. ණය ගන්න බැරි වෙලා තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ අවසරයක් නැතුව මේ රට බංකොලොත් කියලා ප්‍රකාශයට පත් කරපු නිසායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ඔබතුමා විනාඩි දෙකක් ගත්තා. ඒ නිසා ඉක්මනින් ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එතකොට, අහන ප්‍රශ්නය නොවෙයි වටින්නේ, ප්‍රශ්නය අහන්න යන වෙලාව තමයි වටින්නේ, නේද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා කෙටියෙන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම කෙටියෙන් ප්‍රශ්නය ඇහුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා පිළිතුරු දෙන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම ස්ථාවර නියෝග 27(2) යටතේ වූ ප්‍රශ්නයෙන් ඇහුවේ, මේ රටේ පාර්ලිමේන්තුවේ අවසරයක් නැතිව debt standstill එකක් ප්‍රකාශ කළේ කොහොමද කියලායි. ඒ ප්‍රශ්නයටත්, ඒ නිසා තමයි අපට ණය ගන්න බැරි වෙන්නේ කියන එකටත් උත්තර දෙන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මෙතැන ණය ගන්න බැරි ප්‍රශ්නයක් නැහැ. බංකොලොත්භාවය ප්‍රකාශ කළාට පස්සේ ණය ප්‍රතිව්‍යුහගත කරලා තිබෙනවා. ඒ ප්‍රතිව්‍යුහගතකරණය ඉදිරියට අරගෙන ගිහිල්ලා ඒ සියලු ගිවිසුම් අපි අවසාන කරමින් ඉන්නවා. අපේ ආණ්ඩුව මේ රටේ ආර්ථිකය ස්ථාවර කළාට පස්සේ අපි 2024දීත්, 2025දීත් ඒ ණය ගෙවමින් තිබෙනවා. විශේෂයෙන්ම විදේශීය ණය ගෙවලා තිබෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඒ ණය එකතුවීම සම්බන්ධයෙන් මම තව කාරණයක් කියන්නම්, ගරු මන්ත්‍රීතුමනි. මේ ප්‍රතිව්‍යුහගතකරණය නිසා, ඒ කියන්නේ ණය නොගෙවා හිටපු නිසා අතීතයේ ඉඳලාම ඒ සඳහා එකතුවෙලා තිබුණු පොලියක් - past due interest එකක් - තිබෙනවා. පොලිය කියන්නේ ණය බරක් නොවෙයි, වියදමක්. අන්න ඒ වියදම පවා ණයක් හැටියට එකතු වුණා. ඒක රුපියල් බිලියන 1.6ක්. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, අපට ණය ගන්න බැරි වෙලා නැහැ. අපි ණය නිසි පරිදි ගෙවමින් ඉන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
"කොහෙද යන්නෙ, මල්ලෙ පොල්" කථා නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා මට කිව්වා, ඉක්මනට, කෙටියෙන් අතුරු ප්‍රශ්නය අහන්න කියලා. නමුත්, මම අහපු ප්‍රශ්නයට නොවෙයි උත්තර ලැබෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4, ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමා ඔබතුමාට උත්තර දුන්නා කිව්වා. *[බාධා කිරීමක්]* ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්නේ නැද්ද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමා උත්තර දුන්නා කියනවා, නමුත් මන්ත්‍රීතුමා පිළිතුර ගැන සෑහීමකට පත් වෙන්නේ නැහැ කියනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, he is a Party Leader. So, let him raise the point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Point of Order එකක්. *[බාධා කිරීමක්]*

## ඩිජිටල් හැඳුනුම්පත හඳුන්වා දීම: විස්තර
## டிஜிட்டல் அடையாள அட்டையின் அறிமுகம்: விபரம்
INTRODUCTION OF DIGITAL IDENTITY CARD: DETAILS

552/2025

**4. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා ඩිජිටල් හැඳුනුම්පතක් හඳුන්වා දෙන්නේද;

(ii) ඩිජිටල් හැඳුනුම්පත භාවිතයේ වාසි කවරේද;

(iii) එම හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රමවේදය කවරේද;

(iv) එක් හැඳුනුම්පතක් සකස් කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(v) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති සියලු ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා එම හැඳුනුම්පත සකස් කිරීමට වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඩිජිටල් හැඳුනුම්පත හඳුන්වා දීම සඳහා අරමුදල් සපයා ගනු ලබන ආකාරය කවරේද;

(ii) ඒ සඳහා විදේශ ණය හෝ ආධාර ලබා ගන්නේ නම්, එම ණය/ආධාර ලබා දෙන රට හෝ ආයතන කවරේද;

(iii) එම හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රියාවලියට මුදල් ආයෝජනය කරන ආයෝජකයන්ට ලබා දෙන ප්‍රතිලාභ කවරේද;

(iv) එම ආයෝජකයන්ට පුද්ගලයන්ගේ දත්ත ලබා ගත නොහැකි බවට සහතික වන්නේද;

(v) ඩිජිටල් හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන සියලුම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

டிஜிட்டல் பொருளாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைப் பிரசைகளுக்காக டிஜிட்டல் அடையாள அட்டை அறிமுகப்படுத்தப்படுமா என்பதையும்;

(ii) டிஜிட்டல் அடையாள அட்டையைப் பயன் படுத்துவதன் நன்மைகள் யாவை என்பதையும்;

(iii) அந்த அடையாள அட்டையைத் தயாரிப்பதன் செயன்முறை யாது என்பதையும்;

(iv) ஓர் அடையாள அட்டையைத் தயாரிப்பதற்குச் செலவாகும் தொகை எவ்வளவு என்பதையும்;

(v) ஆட்களைப் பதிவுசெய்யும் திணைக்களத்தில் பதிவுசெய்யப்பட்டுள்ள அனைத்து இலங்கைப் பிரசைகளுக்கும் அந்த அடையாள அட்டையைத் தயாரிப்பதற்குச் செலவாகும் மொத்தத் தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) டிஜிட்டல் அடையாள அட்டை அறிமுகப்படுத்தப் படுவதற்கு நிதி பெறப்படும் விதம் யாது என்பதையும்;

(ii) அதற்காக வெளிநாட்டுக் கடன் அல்லது உதவி பெறப்படுமாயின், அக்கடன்/உதவியை வழங்கும் நாடுகள் அல்லது நிறுவனங்கள் யாவை என்பதையும்;

(iii) அந்த அடையாள அட்டையைத் தயாரிக்கும் செயன்முறையில் முதலீடு செய்யும் முதலீட் டாளர்களுக்கு வழங்கப்படும் அனுகூலங்கள் யாவை என்பதையும்;

(iv) அந்த முதலீட்டாளர்களால் தனிப்பட்டவர்களின் தரவுகளைப் பெற முடியாது என்பது உறுதியளிக் கப்படுமா என்பதையும்;

(v) டிஜிட்டல் அடையாள அட்டையைத் தயாரிக்கும் செயன்முறை தொடர்பான அனைத்து ஒப்பந் தங்களும் சபையில் சமர்ப்பிக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Digital Economy:

(a) Will he inform this House -

(i) whether a digital identity card will be introduced for the citizens of Sri Lanka;

(ii) the advantages of using the digital identity card;

(iii) the methodology that is adopted in preparing the said digital identity card;

(iv) the cost that will have to be incurred on preparing one digital identity card; and

(v) the total cost that will have to be incurred on preparing the said digital identity card for all Sri Lankan citizens who have been registered with the Department for Registration of Persons?

(b) Will he also inform this House -

(i) the manner in which funds required for introducing the digital identity card will be sourced;

(ii) if foreign loans or assistance is obtained for that, the name of the country or institution from which such loans/assistance will be obtained;

(iii) the benefits that will be provided to the investors who invest money on the process of preparing the said identity card;

(iv) whether it will be ensured that the said investors cannot obtain any personal data of the people; and

(v) whether all the agreements that have been entered into in relation to the process of preparing the digital identity card will be tabled?

(c) If not, why?

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

ගරු කථානායකතුමනි, ඩිජිටල් ආර්ථික ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ගරු කථානායකතුමනි, මෙම ඩිජිටල් අනන්‍යතා පද්ධතිය හඳුන්වා දීම ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තන ගමනේ අතිශය තීරණාත්මක පියවරක්. මෙහි ප්‍රධාන වාසි කිහිපයක් පහත පරිදි වේ.

- පුද්ගලයෙකුගේ උපතේ සිට මරණය දක්වා සියයට 100ක්ම විශ්වසනීය අනන්‍යතාව තහවුරු කරන ID එකක් වෙනවා, මේ digital ID එක.

- ඒ වාගේම අපේ පුරවැසියන්ට රාජ්‍ය සේවාවන් හා පෞද්ගලික සේවාවන් -බැංකු, සෞඛ්‍ය, අධ්‍යාපනය වැනි සේවාවන්- වඩාත් ඉක්මනින්, පහසුවෙන් හා කාර්යක්ෂමව online මාර්ගයෙන් ලබා ගන්න මෙය උපකාරී වෙනවා.

- පුද්ගල අනන්‍යතාව ඉතා සුරක්ෂිතව තහවුරු කළ හැකි බැවින් සුබසාධන ප්‍රතිලාභ බෙදාහැරීම වැනි කටයුතුවලදී සිදු වන වංචනික ක්‍රියා සහ අක්‍රමිකතා මුළුමනින්ම නතර කරන්න මෙය උපකාරී වෙනවා.

- තවද, අපේ ඩිජිටල් ආර්ථිකයට සහ මූල්‍ය පද්ධතීන්ට සියලු පුරවැසියන් පහසුවෙන් සම්බන්ධ කර ගැනීමේ හැකියාවත් ලැබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, අපි දන්නවා මූල්‍ය ක්ෂේත්‍රයේ කටයුතු online මාර්ගයෙන් කරන්න ගියාම OTP එක වෙන phonesවලට අරගෙන එතැන සිදු වන අක්‍රමිකතා සහ වෙන පුද්ගලයන් මුදල් ලබා ගැනීම් වාගේ ප්‍රශ්න තිබෙන බව. ඒවා නැති කරගන්න මේ ඩිජිටල් පද්ධතිය උපකාරී වෙනවා.

- අනෙක් කාරණය මේකයි. ජාතික ආරක්ෂාව තහවුරු කිරීමේ සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිවලටද මෙය උපකාරී වෙනවා. මොකද, දැන් තිබෙනවා වාගේ එක්කෙනෙකුට IDs කීපයක් හදාගන්න, එහෙම නැත්නම් ව්‍යාජ විධියට IDs හදාගන්න බැරි වෙනවා. මොකද, මේක biometric dataවලින් තහවුරු වන digital ID එකක් නිසා.

[ගරු එරංග වීරරත්න මහතා]

- අනෙක් එක තමයි, අපේ තිබෙන සේවා සඳහා නැවත නැවත ලේඛන ඉදිරිපත් කරන්නේ නැතුව, ඩිජිටල් මාර්ගයෙන්, ඒ වෙලාවේම සහතික කරපු ඩිජිටල් ලේඛන ලබා දීමේ හැකියාව ඒ හරහා ලැබෙනවා. අපට එක එක තැන්වලට applications ඉදිරිපත් කරන්න ඕනෑ වුණාම, සහතික කරපු හැඳුනුම්පත් copies නැවත නැවත දෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

(iii) මෙම ක්‍රියාවලිය කරනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන බහු අදියර ක්‍රියාවලියක් හරහායි. ඒකෙදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ISO සහ ICAO standardsවලට හදපු ඉහළම සුරක්ෂිතභාවයෙන් යුතු මෘදුකාංග පද්ධතියක් උපකාරී වෙනවා. ඒකෙදි දත්ත එක්රැස් කිරීම, ඒ කියන්නේ පුද්ගලයන්ගේ ජනවිකාස තොරතුරු -නම, උපන් දිනය සහ ලිපිනය- සහ ජෛවමිතික තොරතුරු - biometric data - ඇඟිලි සලකුණු, iris හෙවත් කළු ඉංගිරියාව හෝ මුහුණේ ස්වරූපය- ඩිජිටල් මාර්ගයෙන් මේ පද්ධතියට ලබා ගන්නවා. අනෙක් එක තමයි, මේකෙදි SLUDI Number කියන තනි අංකයක් උපතේ සිට මරණය දක්වාම පාවිච්චි කරන්න පුද්ගලයින්ට ලබා දෙනවා. ඒ කියන්නේ, අපේ උප්පැන්න සහතිකයට පවා ඒ SLUDI Number එක එනවා. ඒ එක්කම digital ID Number එකත් එනවා. ඒ වාගේම අනාගතයේදී අනෙකුත් සේවාවල ID එකත් මේකම කරන්න අපට අවස්ථාව ලැබෙනවා.

(iv) මේ පද්ධතියට වැය වන මුදල ගණන් බැලීමේදී, අපට ID එකක් සඳහා වන වියදම ගණන් බලන්න සිද්ධ වෙනවා. මොකද, ඉස්සෙල්ලාම අපි ස්ථාපිත කරන්නේ ඩිජිටල් යටිතල පහසුකමක්. මේ යටිතල පහසුකම ස්ථාපිත කරනකොට මෘදුකාංග, මධ්‍යස්ථ දත්ත ගබඩාව, ඒ වාගේම ජෛවමිතික දත්ත රැස් කරන උපකරණ ඇතුළු සමස්ත පද්ධතියක් මේකට උපයෝගී වනවා.

ඒ පද්ධතියට රුපියල් බිලියන 14ක වාගේ මුදලක් වැය වෙනවා. අපේ ඉන්න ජනගහනය ගත්තාම, මිලියන 17.5කට මේ digital ID එක මේ අවස්ථාවේදී ලබා දිය යුතුයි. ඒ අනුව බලනකොට ID එකකට රුපියල් 800ක වාගේ පිරිවැයක් තිබෙනවා. මීට අමතරව අලුතින් ID එකක් ලියාපදිංචි කරන කෙනෙකුට පොලිකාබනේට් digital ID කාඩ් පතක් ලබා දිය යුතුයි. ඒකට යන පුනරාවර්තන වියදම ඇතුළත් වෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]* පොලිකාබනේට් කාඩ්පත සම්බන්ධයෙන් දැන් ටෙන්ඩරයක් දාලා තිබෙනවා. ඒ අනුව තීරණය වෙයි, කාඩ් එකක වියදම කොපමණද කියන එක. *[බාධා කිරීමක්]* අතුරු ප්‍රශ්නවලදී මම ඒකට උත්තර දෙනවා.

(v) ශ්‍රී ලංකා රුපියල් බිලියන 15යි. මෙයින් රුපියල් බිලියන 10කට වැඩි ප්‍රමාණයක් ඉන්දියානු රජයෙන් ආධාරයක් විධියට අපට ලැබෙනවා.

(ආ) (i) ඉන්දීය රජයේ ආධාර සහ ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ප්‍රතිපාදන.

(ii) ඉන්දීය රජයෙන් ලැබෙන මුදල් ආධාර.

(iii) ඉන්දියාවෙන් ලැබෙන මූල්‍ය ආධාරයට කොන්දේසියක් විධියට මේ පද්ධතිය මුලින් සකස් කිරීම ඉන්දියානු සමාගමක් හරහා කරගන්න ඕනෑ. මම නැවත කියනවා, සකස් කිරීම පමණයි කියන එක. ඒ කියන්නේ, ඒක පවත්වා ගෙන යෑම නොවෙයි. පවත්වා ගෙන යෑම ශ්‍රී ලංකා රජයට අවශ්‍ය විධියට කරන්න පුළුවන්. නමුත්, මේ පද්ධතිය සකස් කිරීම ඉන්දියානු සමාගම් හරහා කරන්න ඕනෑ කියලා ඒ ආධාරයේ කොන්දේසියක් තිබෙනවා. ඊට අමතරව කිසිම විශේෂ ප්‍රතිලාභයක් කිසිම ආයෝජකයෙකුට ලැබෙන්නේ නැහැ.

(iv) ඔව්.

මෙම පද්ධතියට රජයේ ඉහළම ප්‍රමුඛතාව ලබා දී තිබෙනවා. මොකද, අපේ දත්තවල සුරක්ෂිතභාවය සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අපේ රජය පූර්ණ සහතිකය ලබා දෙනවා. මේකේ නීතිමය කාරණා පැත්තෙන් බැලුවාම දැනට තිබෙනවා, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතක්. ඒ පනත අනුව මේ දත්තවල පරම හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජයට සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට හිමි වෙනවා. අපේ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුව මේකේ controller සහ operator කියන දෙදෙනාම වන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව. ඒ නිසා කිසිම පෞද්ගලික අංශයක් හවුල් වෙන්නේ නැහැ, මේ දත්ත එක්රැස් කිරීමට සහ ඒවා process කරන එකට. මේකේ දත්ත ගබඩාව ගත්තාම, ඒ දත්ත ඉතාම සුරක්ෂිත විධියට තැන්පත් කරන ආකාරයට හදලා තිබෙනවා. මේකේදි ඉහළම ගුප්ත කේතන - encryptions - පාවිච්චි වෙනවා. AES-256, RSA-2048 වාගේ ආරක්ෂක විධිවිධාන සහ hardware based HSM encryptions මේකට ඇතුළත් වෙනවා. ඒක නිසා මේකෙදි කිසිම විධියකින් දත්ත ආපහු එළියට ගන්න හැකියාවක් නැහැ. ඒ වාගේම, මේ දත්ත පද්ධතියට ඇතුළු වෙන්න පුළුවන් වන්නේත් ශ්‍රී ලංකා රජයෙන් අනුමත කරලා තිබෙන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සිටින ශ්‍රී ලාංකික ඉංජිනේරුවරුන්ට විතරයි.

(v) නැත.

(ඇ) මේක ද්විපාර්ශ්වික රාජ්‍ය තාන්ත්‍රික එකඟතාවක්. ද්විපාර්ශ්වික රාජ්‍ය තාන්ත්‍රික එකඟතාවලට අනුව එක් පාර්ශ්වයකට පමණක් තීරණය කරන්න බැහැ, මේක එළියට නිරාවරණය කරන්න. මේක රජයන් දෙකක් අතර වෙන ගනුදෙනුවක්. ඒ ගනුදෙනුව තුන්වෙනි පාර්ශ්වයකට නිරාවරණය වීම හරහා ගැටලු මතු වෙන්න පුළුවන්. මොකද, එක එක රජයන් වෙනත් රජයන් එක්ක වැඩ කරනවා. ඒ නිසා ඒකපාර්ශ්විකව අපට මේ ගිවිසුම් එළියට දමන්න බැහැ. නමුත්, මේ ක්‍රියාවලියේදී වෙන සෑහෙන ගිවිසුම් එළියේ තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, මේකේ ටෙන්ඩර් එකේදී දෙන Request for Proposal - RFP- publicly දාලා තිබෙනවා. ඒ වාගේම ඒකේ දාලා තිබෙනවා, ඒ සමාගමත් එක්ක ඉදිරියේදී එළඹෙන්න ඉන්න ගිවිසුමේ draft එකක්. ඒ කරුණු එළියේ තිබෙනවා. ඒවා ඕනෑම කෙනෙකුට බලාගන්න පුළුවන්. නමුත් රාජ්‍ය තාන්ත්‍රිකව එළඹෙන ගිවිසුම් අපට එළියට දෙන්න විධියක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් මේ සම්බන්ධව ඉදිරිපත් වෙලා තිබෙන 2025.06.27 දරන Notice Inviting Tenderහි පැහැදිලිව තිබෙනවා "h"එකේ, "Undertaking from the MSI that the Indian shareholding is greater than or equal to 51 per cent" කියලා. එතකොට මේක අනුව බොහොම පැහැදිලිව, ඉන්දියානු කොම්පැනිවලට පමණයි සියයට 51ට වඩා ගන්න පුළුවන් වාතාවරණය තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් අපි දිගටම මතු කළ කාරණය තමයි, - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද සම්බන්ධවත් මම කිව්වා- අඩුම තරමේ මේ ඩිජිටල් එක සම්බන්ධව හදපු ගිවිසුම් ටිකවත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියන එක.

ඔබතුමන්ලා, අනුර දිසානායක මැතිතුමන්ලා එදා ඇති වෙන්න කෑ ගැහුවා, මේ රටේ ස්වෛරීභාවය පිළිබඳව; දත්ත සභවා ගැනීම පිළිබඳව. ජෛවමිතික දත්ත පද්ධතියක් මේ තිබෙන්නේ. ඒ නිසා අපට දැනගන්න ඕනෑ,- ඔබතුමා කිව්වා කියලා අපට කථා කරන්න බැහැ- මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් තිබෙන ක්‍රමවේදය ඔබතුමා සභාගත කරනවාද කියලා. මොකද, මේ සම්බන්ධයෙන් Attorney-General කියා තිබෙනවා, "රජයෙන් අහන්නේ නැතුව මට මේක ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන්න බැහැ" කියලා. ඒ නිසා මේක අල්ලලා වීසි කළා. ඊට පස්සේ ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයටත් ස්තුති කළා. මෙච්චර කාලයක් මේ රටේ කිසිම දෙයක් කරන්න තමුන්නාන්සේලා ඉඩ දුන්නේ නැහැ. ජෛවමිතික තොරතුරු ටික සම්බන්ධයෙන්ප වන ටෙන්ඩර් එකේ තත්ත්වයත් එක්කයි මම මේ කාරණා කියන්නේ. සියයට 51ක් ඉන්දියානු කොම්පැනිවලට ගන්න පුළුවන් කියලා තමයි තිබෙන්නේ. ඒ කියන්නේ, ලංකාවේ කිසිම කොම්පැනියකට මේකට සම්බන්ධ වෙන්න බැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, සියයට 51ක් ගියාට පසුව අපිට ඉතිරි වෙන ප්‍රමාණය මොකක්ද, අපේ තිබෙන සත්‍ය තත්ත්වය මොකක්ද කියන එක. ඒ සම්බන්ධව අපට දැනගන්න ඕනෑ. ඒ නිසා කරුණාකරලා ඒ ගිවිසුම් ටික සභාගත කරනවාද, නැද්ද කියලා අපට කියන්න.

මොකද, මේක රටේ ස්වෛරීභාවය පිළිබඳ ප්‍රශ්නයක්. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි, මේක රටේ ස්වෛරීභාවය පිළිබඳ ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, ඒ නිසා මම ඉල්ලා සිටිනවා ඒවා සභාගත කරන්න කියලා. මොකද, හේතුව? තමුන්නාන්සේලා ගිහිල්ලා ඉන්දියාවත් එක්ක මොනවා අත්සන් කළාද කියලා අපි දන්නේ නැහැ. ඉන්දියාවත් එක්ක වැඩ කරන්න ඕනෑ, ඒකේ කිසි ගැටලුවක් නැහැ. හැබැයි, මේ විධියට තමන්ගේ රටේ ජෛවමිතික තොරතුරු යනවා කියන්නේ; බොහොම පැහැදිලිව අපේ සියලු තොරතුරු ඉන්දියාවේ තිබෙන කොම්පැනි එකකට සියයට 51කට වැඩිය යනවා කියන්නේ අනිවාර්යයෙන් අපට මේ ප්‍රශ්නය සම්බන්ධව හිතන්න වෙනවා කියන එකයි. ලංකාවේ තිබෙන කොම්පැනියකට මේකට ඉදිරිපත් වෙන්න බැහැ. සියයට 51ක් ඉන්දියානු කොම්පැනියකට යනවා. ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ සම්බන්ධව තිබෙන ගිවිසුම් ටික ඔබතුමා සභාගත කරනවාද, නැද්ද කියලා කියන්න කියලා. මොකද, ඒක අපට දැනගන්න අවශ්‍යයි මේ රටේ පුරවැසියෝ විධියට.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weerarathna)

ගරු කථානායකතුමනි, මම හිතන විධියට, අපේ ගරු මන්ත්‍රීතුමාට පටලැවීමක් වෙලා තිබෙනවා. සියයට 51ක් ඉන්දියානු සමාගමකට ලැබෙනවා වාගේ කථාවක් මෙතැන කොහෙත්ම නැහැ. මේකේ තිබෙන්නේ, ඉන්දියාවෙන් ශ්‍රී ලංකා රජයට ආධාරයක් දෙනවා මේ digital ID පද්ධතිය ස්ථාපිත කරන්න. ඒ යන පිරිවැයෙන්, ඒ මුල් පද්ධතිය සකස් කරන්න යන පිරිවැයෙන් ඒ පද්ධති ලබා ගන්න පුළුවන් ඉන්දියානු සමාගම් හරහා කියන එකයි මේ කියන්නේ. ඒකෙන් කියන්නේ, ඒ මුල් system එක ගේන එක. මම ඉස්සෙල්ලාත් පැහැදිලි කළා, ඒ system එක දැම්මාට ඒකේ digital ID එකක්, biometric data නැහැ කියන එක. ඊට පස්සේ ඒ දමන පද්ධතිය තමයි ලංකාවේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සහ ලංකාවේ මේ ක්ෂේත්‍රයේ ඉන්න ප්‍රවීණයන් එක්ක නඩත්තු කරගෙන ඉස්සරහට යන්නේ. එහෙම යනකොට ඒක සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන්නේ ශ්‍රී ලංකා රජයේ අපේ ඉන්න රාජ්‍ය නිලධාරින් හරහා. මේක වෙනම සමාගමක් හදලා, ඒ සමාගමෙන් සියයට 51ක් ඉන්දියාවට දීලා, ඒ වාගේ යන වැඩ පිළිවෙළක් නොවෙයි. මේක හරියට කියවලා බලන්න මන්ත්‍රීතුමා. අපේ RFP document එකේ හරි පැහැදිලිව තිබෙනවා, මේ system එකක් ගෙනැල්ලා ලංකාවට දමන එකක් තමයි තිබෙන්නේ කියලා. ඒ දමනකොට ලංකවේ ඒ සම්බන්ධයෙන් ඉන්න ප්‍රවීණයන් ඒ පද්ධතියේ security එක සම්බන්ධව, ඒක හදලා තිබෙන ක්‍රමය අනුව ඔක්කෝම සොයා බලනවා. ඒකෙදි කිසිම විධියකින් ඒ දමන system එක අපේ රට ඇතුළේ තිබෙනවා මිසක් පිටට යන්නේ නැහැ. මේ පද්ධතිය හැදෙන්නෙත් ලංකාවේ තිබෙන data centresවල. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉන්න නිලධාරින්ට තමයි ඒකට ප්‍රවිෂ්ට වෙන්න අවකාශය තිබෙන්නේ. ඒ අනුව මේකෙන් දත්ත පිටට යන්නෙත් නැහැ, ඔබතුමා කියන විධියට වෙනත් සමාගමක් හෝ රජයක් මේ දත්ත පරිහරණය කරන්නවත්, ඒවා කළමනාකරණය කරන්නවත් කිසිම විධියකින් එන්නේ නැහැ කියන එකත් මම පැහැදිලිවම මේ ගරු සභාවට කියන්න කැමැතියි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, දැන් මම මේ කිව්වේ වෙන එකක් නොවෙයි, tender notice එකේ තිබෙන එක. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාගේ මුඛයෙන් කියන ඒවා විශ්වාස කරලා ඕනෑ නම් මට ඉඳගන්න පුළුවන්. නමුත් ප්‍රශ්නයක් තිබෙනවා. Tender notice එකේ තිබෙන එක මම මේ කියන්නේ. ඔබතුමා හොඳට කියවලා බලන්න. මම කියවන්න ඕනෑ නැහැ. මේක ඉංග්‍රීසියෙන් තිබෙන්නේ. ඉංග්‍රීසියෙන් තියෙන කොටස තමයි මම කියෙව්වේ, A to H කියලා තිබෙනවා. ඒකේ තිබෙනවා, "...attach the copies of the following original documents" කියලා. මෙන්න මේ මේ දේවල් වෙන්න ඕනෑ කියලා මේකේ තිබෙනවා. ඉතින් ඒකත් එක්ක තමයි මම මේ ප්‍රශ්නය ඇහුවේ. ඔබතුමා කියන එක මට පිළිගෙන, අපි දෙන්නා, මන්ත්‍රීවරු දෙන්නෙක් විධියට කථා කරලා මට ඕනෑ නම් ඉඳගන්න පුළුවන්. නමුත්, ප්‍රශ්නය ඒක නොවෙයි. ඔබතුමා කියවන්නකෝ, මේ ටෙන්ඩර් දැන්වීමේ තිබෙන විස්තරය. මට තේරෙන්නේ ඔබතුමා එය කියවලා නැහැ කියලායි.

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නයට මම දැන් එන්නම්. විශේෂයෙන්ම ඔබතුමා කියන කාරණය ගත්තොත්, - ඔබතුමා ගැන මට ගෞරවයක් තිබෙනවා. ඒක වෙනම කාරණයක් - අපට කථා කරලා මෙතැන ඉඳගන්න පුළුවන්. හැබැයි, තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. මේ digitalization පිළිබඳ ප්‍රශ්නය ඊයේ දිගටම කථා වුණා. ඩයලොග් ආයතනය, හාන්ස් විජේසූරිය මහත්තයාගේ කොම්පැනියකින් මේකේ තිබෙන බලපත්‍ර ලබා ගැනීම ආදිය ගැන කථා කළා. ඒ බලපත්‍ර සම්බන්ධයෙන් ටෙන්ඩර් එකක් ගියාද? ඒ මොකක්වත් ගැන නැහැ. ඔබතුමා මේ තනතුරට එන්න කලින් companies දෙකක CEO විධියට වැඩ කරලා තිබෙනවා. දැන් ඒකෙන් අයින් වෙලා තිබෙනවා. නමුත් ඔබතුමාට තවම shares තිබෙනවා. එතකොට අපි කොහොමද, මේක ගැන

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

විශ්වාස කරන්නේ? මම ඒකයි අහන්නේ? ඊයේ ඇති වුණු තත්ත්වයත් එක්ක විශේෂයෙන් ප්‍රසාද් සිරිවර්ධන මැතිතුමා, ඊළඟට අජිත් පී. පෙරේරා මැතිතුමා ඇතුළු පිරිසක් මේ සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න ගණනාවක් මතු කළා. ඔබතුමා දක්ෂයෙක්. ඒක වෙනම කාරණයක්. අපි ගරු කරනවා, ඔබතුමා වාගේ කෙනෙක් මේ තැනට ඇවිල්ලා, මේ පාර්ලිමේන්තුවට ඒම ගැන. හැබැයි, ඒකත් එක්ක ඔබතුමා පිටිපස්සේ backpack එකක් අරගෙන එනවා. මොකද, ඔබතුමා තවම ඒ කොම්පැනිවල shares අයිතිකාරයෙක්, ඔබතුමා දැන් CEO නොවුණාට. ඉතින් ඒ නිසා අපට හිතා ගන්න බැහැ. මොකද, හේතුව ඒකේ දැනටමත් toll එක සම්බන්ධව ඔබතුමාගේ කොම්පැනියක් වැඩ කරනවා. ඒ නිසා මම හිතන විධියට, ආණ්ඩුවත් එක්ක ගිවිසුම්ගත වීම සම්බන්ධව ඩිලාන් පෙරේරා එදිරිව රාජිත සේනාරත්න මැතිතුමාගේ නඩුවත්, විලියම් සිල්වා නඩුවත් ගත්තාට පස්සේ මේ නඩු දෙකෙන්ම බොහොම පැහැදිලියි, මේ කාරණය. රිචර්ඩ් පතිරණ මහත්තයා ආපසු පාර්ලිමේන්තුවට එන්නේ ඒ කාරණයත් එක්ක. ඉතින් ඔබතුමා සම්බන්ධයෙන් conflict of interest එකක් - බැදියාවන් පිළිබඳව ගැටුමක් - ඇති වෙලා තිබෙන බව පෙනෙනවා. ඒ නිසා කරුණාකරලා නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට ඔබතුමා ඒ සියලු තොරතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද, නැත්නම් ඒ සම්බන්ධව ප්‍රකාශයක් කරලා ඔබතුමා ඉල්ලා අස් වෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමාට උත්තර දෙන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමා අහපු ඒ ප්‍රශ්නයට අදාළ උත්තරය ගරු නියෝජ්‍ය ඇමතිතුමා ලබා දෙයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා සම්බන්ධව එවැනි ගැටලුවක් තිබෙනවා නම්, - එතුමා මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් කර තිබෙන්නේ අපේ පක්ෂයෙන් - ඒ සඳහා අපි පිළිතුරු ලබා දෙන්නම්. නියෝජ්‍ය ඇමතිතුමා, මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට අදාළව උත්තර දෙයි.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

ගරු කථානායකතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අහපු අතුරු ප්‍රශ්නයට පිළිතුර මේකයි. ගරු මන්ත්‍රීතුමා, කිසි විධියකින් බය වෙන්න අවශ්‍ය නැහැ. ඔබ කියපු ආකාරයට ඩයලොග් සමාගමවත්, මම ඉන්නා ඔය සමාගම් කිසිම එකක්වත් ඉන්දියාවේ සමාගම් නොවෙයි. මම නැවත ප්‍රකාශ කරනවා, මෙම දත්ත පද්ධතිය සකස් කිරීම සහ එය ලංකාවට ලබා දීම ඉන්දියානු සමාගම්වලට කරන්න පුළුවන් බව. ඒක නිසා මේ එක සමාගමක්වත් ඔීකට අත ගහන්න විධියක් නැහැ. ඔබතුමා කිසිම සැකයක්වත්, බයක්වත් තියා ගන්න අවශ්‍ය නැහැ. ඔය කියන ප්‍රසම්පාදනය නීත්‍යනුකූලව හරි විධියට ක්‍රියාත්මක වෙයි. ඒ වාගේම ඒ එන පද්ධතිය සම්බන්ධව අපේ රජයේ නිලධාරින් හරි විධියට බලා රජයටත්, රටටත්, අපේ ජනතාවටත් ඔබින විධියට ඒ පද්ධතිය ලංකාවේ ස්ථාපිත කිරීමට කටයුතු කරයි.

## BYD වාහන ආනයනය: විස්තර
### BYD ரக வாகனங்கள் இறக்குமதி: விபரம்
### BYD VEHICLES IMPORTED: DETAILS

1262/2025

**5. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වාහන ආනයනය කිරීමේ නීති ලිහිල් කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවට මේ වනවිට ආනයනය කර ඇති BYD වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන අතරින් මේ වනවිට ශ්‍රී ලංකා රේගුවෙන් මුදාහැර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම වාහන සංඛ්‍යාව ඒවායේ එන්ජින් ධාරිතාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එන්ජින් ධාරිතාවය කිලෝ වොට් 100 සහ එන්ජින් ධාරිතාවය කිලෝ වොට් 150 අනුව අය කරනු ලබන තීරු බදුවල වෙනස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வாகன இறக்குமதி தொடர்பான சட்டங்கள் தளர்த்தப்பட்டதைத் தொடர்ந்து, இலங்கைக்கு இன்றளவில் இறக்குமதி செய்யப்பட்டுள்ள BYD ரக வாகனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி வாகனங்களில் இன்றளவில் இலங்கைச் சுங்கத்தால் விடுவிக்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) மேற்படி வாகனங்களின் எண்ணிக்கை அவற்றின் எஞ்ஜின் திறன் அடிப்படையில் வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iv) எஞ்ஜின் திறன் 100 கிலோ வோட் மற்றும் எஞ்ஜின் திறன் 150 கிலோ வோட்டுக்கு அமைவாக அறவிடப்படும் தீர்வை வரிகளின் வித்தியாசம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) number of BYD vehicles that have been imported into Sri Lanka to date since the relaxation of the vehicle import laws;

(ii) number of vehicles that have been released by Sri Lanka Customs to date, out of those vehicles;

(iii) number of such vehicles categorized by their engine capacity, separately; and

(iv) difference in the duties levied for vehicles with an engine capacity of 100 kilowatts and those with an engine capacity of 150 kilowatts?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2025.11.23 දින වනවිට ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති BYD වාහන සංඛ්‍යාව 9,100කි.

(ii) ඒ අතරින් ශ්‍රී ලංකා රේගුවෙන් මුදාහැර ඇති වාහන සංඛ්‍යාව 202.11.23 දින වනවිට 8,190යි.

(iii) එම වාහන සංඛ්‍යාව එන්ජින් ධාරිතාව අනුව සඳහන් කරන්න කියා මෙම ප්‍රශ්නයෙන් කියා තිබෙනවා. නමුත් එන්ජින් ධාරිතාවම ප්‍රස්තුතය කරගත් නඩු කටයුත්තක් මේ වනවිට ක්‍රියාත්මක වන බැවින් එම තොරතුරු ඉදිරිපත් කිරීම සුදුසු වෙන්නේ නැහැ කියා ප්‍රකාශ කරනවා.

(iv) එන්ජින් ධාරිතාව කිලෝවොට් 100 සහ කිලෝවොට් 150 අනුව තීරු බදු ප්‍රමාණයන් තීරණය වන්නේ මෙන්න මේ විධියටයි.

කිලෝවොට් 100ට අඩු සහ කිලෝවොට් 100ට වැඩි වශයෙන් කාණ්ඩ 2ක් තිබෙනවා. කිලෝවොට් 100ට අඩු කාණ්ඩය ආයෙත් කොටස් 2කට වෙන් වෙනවා. ආයු කාලය අවුරුද්දකට වඩා අඩු වාහනවලට කිලෝවොට් 1කට නිෂ්පාදන තීරු බද්ද රුපියල් 24,100 බැගින් අය කරනවා. කිලෝවොට් 100ට අඩු, එහෙත් ආයු කාලය අවුරුද්දකට වඩා වැඩි වාහන ඊළඟ කොටස තුළ දක්වා තිබෙනවා. ඒවාට කිලෝවොට් 1කට රුපියල් 36,200 බැගින් අය කරනවා.

ඊළඟට තිබෙන්නේ කිලෝවොට් 100ට වඩා වැඩි කාණ්ඩය. එම කාණ්ඩය තුළ ආයු කාලය අවුරුද්දකට වඩා අඩු වාහන සම්බන්ධයෙන් කිලෝවොට් 1කට රුපියල් 36,200ක් අය කරනවා. අවුරුද්දකට වැඩි වාහන සම්බන්ධයෙන් කිලෝවොට් 1කට රුපියල් 60,400ක් අය කරනවා. වැඩි විස්තර ඇමුණුමෙහි දක්වා තිබෙනවා. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

---

** පිළිතුර අවසානයේ පළ කර ඇත.*
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම

**Table 01 - Sri Lanka Customs National Imports Tariff Guide - 2025**

**Tax Structure**

| HS Code | Description | Excise (S.P.) Duty | CID | VAT | Surcharge on Customs Duty | Luxury Tax (*Amount an excess of Tax Free Threshold) |
|---|---|---|---|---|---|---|
| 8703.80.32 | Capacity of motors exceeding 50kW, but not exceeding 100kW | Rs.24,100/- per kW for not more than one year old | 20% | 18% | 50% | 60% |
| | | Rs.36,200/- per kW for other | | | | |
| 8703.80.33 | Capacity of motors exceeding 100kW, but not exceeding 200kW | Rs.36,200/- per kW for not more than one year old | | | | |
| | | Rs.60,400/- per kW for other | | | | |

*Note. – *Tax Free Threshold* Rs 6.0 Mn

*PAL, CESS and SSCL are not applicable*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මම ඒ පිළිතුරෙන් සෑහීමට පත් වෙනවා. මේ වෙලාවේ රටේ ආපදා තත්ත්වයක් ඇති වෙලා තිබෙන හින්දා අතුරු ප්‍රශ්න අහනවාට වඩා හොඳයි ඒ ගැන කියන එක. බදුල්ල දිස්ත්‍රික්කයේ මේ වනකොට 18දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. දැනට තිබෙන තත්ත්වය ඒකයි. ඉදිරි පැය කිහිපයේදී මිලිමීටර් 200ට, 300ට වැඩි වර්ෂාපතනයක් ලැබෙන්න පුළුවන් කියලා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කියා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, අපි ඒ සම්බන්ධව මීට වඩා වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ කියලා. ලුණුගල, පස්සර, මැටිගහතැන්න, ඇකිරිය, ඇතුළුව බදුල්ල දිස්ත්‍රික්කයේ කොහේටවත් මේ වනකොට යන්න බැහැ; පාරවල් ඔක්කෝම වැහිලායි තිබෙන්නේ. ඒ නිසා මම ගරු සභානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, විශේෂයෙන් ඩෝසර් ටිකක් හරි යොදවලා, පෞද්ගලික වාහන හරි යොදවලා- *[බාධා කිරීමක්]* මම අතුරු ප්‍රශ්න අහන්න වෙලාව ගන්නේ නැහැ. මම මේ වෙලාවේ මේ කාරණාව කියන්න ගත්තේ රටේ අද ඇති වී තිබෙන තත්ත්වය බෙහෙවින්ම දරුණු නිසායි. ලුණුගල, ඇකිරිය, මැටිගහතැන්න, බත්තෑව, මඩොල්සිම, කැන්දගොල්ල කියන ප්‍රදේශවල 18දෙනෙක් මේ වනකොට මිය ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මේ තත්ත්වය වෙනුවෙන් කුමන හෝ වැඩ පිළිවෙළක් හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරන්න වෙනවා. ජනාධිපතිතුමා ඇවිල්ලා දැන් පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 2හි ඉන්නවා කියලා තිබෙනවා. ඒ නිසා අපි එතැනටත් යන්න ඕනෑ. මම කියන්නේ, අපි මේ ආපදා තත්ත්වය වෙනුවෙන් මේ වෙලාවේ මැදිහත් වෙන්න ඕනෑ කියලායි. මෙතැන අනං මනං අහ අහ ඉන්න එක නොවෙයි කරන්න ඕනෑ. මොකද, මේ කාලගුණික තත්ත්වයත් එක්ක මේ රටේ දැන් පවතින තත්ත්වය එච්චර හොඳ නැති බව කියන්න ඕනෑ. ඒ නිසා එයට මුහුණ දීම වෙනුවෙන් අපට සහයෝගය දෙන්න, ජනතාවට සහයෝගය දෙන්න ආණ්ඩුවට වැඩ කරන්න සිදු වෙයි කියන එක මම මේ වෙලාවේ කියනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් දැනුම් දීමක් කළා. ගරු ජනාධිපතිතුමා දැන් Committee Room No. 1වල ඉන්නවා කියලා තමයි මට දැනුම් දීලා තිබෙන්නේ. ආපදා තත්ත්වයට ලක් වෙච්ච දිස්ත්‍රික්කවල පක්ෂ, විපක්ෂ සෑම මන්ත්‍රීවරයෙකුටම ජනාධිපතිතුමා ආරාධනා කර තිබෙනවා. මම ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට ඒ

[ගරු බිමල් රත්නායක මහතා]

පිළිබඳව ලිඛිතව දැනුම් දුන්නා. දැන් ඒ meeting එක පැවැත්වෙනවා, ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාත් ඒ meeting එකට ගියා නම් හරි. The Hon. President will help.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
නුවරඑළිය දිස්ත්‍රික්කයේත්-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්, ඔව්. ඒ කියන්නේ ඒ ඛේදවාචකය, ඒ disaster එක සිදු වෙමින් තිබෙන ප්‍රදේශවල සියලු මන්ත්‍රීවරුන් සමඟ දැන් ඒ සාකච්ඡාව පැවැත්වෙනවා. ඔබතුමා එතැනට යන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා රටේ පවතින ආපදා තත්ත්වය පිළිබඳව සැලකිල්ලට ගෙන, ඒ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කරන්න.

දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -207/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මම වරප්‍රසාද ප්‍රශ්නයක් අහලා තිබුණා. ඔබතුමා කියලා තිබෙනවා, ඒක පොලිස්පතිතුමාට යොමු කරනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධයෙන් දැනුම් දීලායි තිබෙන්නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔව්, ඒක තමයි. ගරු කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නය අහන්න හේතුව ඔබතුමාගෙන්- *[බාධා කිරීමක්]* ඔබතුමා පාර්ලිමේන්තුවට පොලිස්පතිතුමා ගෙන්වා ඒ කාරණය කිව්වා. ඊට පස්සේ, ඒ කියන්නේ ඔබතුමාගේ රැස්වීමෙන් පස්සේ අපි පොලිස්පතිතුමාට ලිපියකුත් යැව්වා. ඊට පස්සේ එතුමා බුද්ධි වාර්තා කැඳෙව්වා. ඒ වුණාට තවමත් ඒකට උත්තරයක් හම්බ වුණේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් අවශ්‍ය වැඩ කටයුතු කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, I am raising this point of Order under Standing Order No. 28. එහි සඳහන්ව තිබෙන්නේ මෙසේයි:

> "Unless the Standing Orders otherwise direct, notice shall be given of any motion which is proposed to make with the exception of the following:-"

Standing Order No. 28.(g) යටතේ සඳහන්ව තිබෙන්නේ මෙසේයි:

> "A motion arising out of the business of the day immediately after that business is disposed of and before any fresh matter is entered upon."

Hon. Speaker, my question is related to the answer the Hon. Deputy Minister of Digital Economy gave yesterday. ඒ කියන්නේ, අපි එතැනදී ලොකු ප්‍රශ්නයක් පිළිබඳව අවධානය

යොමු කළා. මොකද, පොලිකාබනේට් කාඩ් මිලියන 15ක් ගන්න කියලා ටෙන්ඩර් එකක් දාලා තිබුණා. දැන් ගරු ඇමතිතුමාගේ උත්තරයේදී කිව්වා,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Let me finish please.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
He is on his feet!

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එතකොට ගරු ඇමතිතුමා කිව්වා, ඒ ටෙන්ඩර් එක වෙනස් කරනවා කියලා; ඒ මිලියන 15ක ඩෙන්ඩර් එක, මිලියන 5ක් ලෙස වෙනස් කරනවා කියලා. එතකොට අපි තර්ක කළා, "ඒක එහෙම කරන්න බැහැ" කියලා. හැබැයි, ඒ මිලියන 15, මිලියන 5කට අඩු කරනවා කිව්වා. නමුත්, අද උදේ මේ tender document එක අලුතින්,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් මේක debate එකක් වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, Standing Order No. 28.(g)වලින් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මතු කරපු කාරණය මතු කරන්න බැහැ කියන එක ඉතා පැහැදිලියි. මොකද, එහි තිබෙන්නේ main Businessවලට යන්න කලින්, ඊට කලින් අවසන් නොවෙච්ච විශේෂ කරුණක් තිබෙනවා නම් එයයි. *[බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒක තමයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට නිසි ලෙස ගරු කරනවා, ආර්ථික විද්‍යාව සම්බන්ධ කරුණුවලදී. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නිකමට මෙහෙම හිතන්න. ඔබතුමා කථානායක අසුනේ සිටියා නම්, ඔය විදියට ප්‍රශ්න මතු කරන්න ගත්තොත් මොකද කරන්නේ? ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔය කියන විදියට ඕනෑම මන්ත්‍රීවරයකුට පුළුවන් නේ, Standing Order No. 28.(g) යටතේ කථා කරන්න. ඒක කරන්න බැහැ. *[බාධා කිරීමක්]* Please! මම මේ කියන්නේ මේකයි. ස්ථාවර නියෝග පිළිබඳව මට එක පොතකුත්, ඔබතුමාට වෙන පොතකුත් නැහැ නේ. මේ, එකම පොත නේ. Please, මේ Standing Orders follow කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, ඒක debate එකක කොටසක් නේ. Debate එකක කොටසක්, ගරු මන්ත්‍රීතුමා- *[බාධා කිරීමක්]* මේක ගිය debate එකක තිබුණු කාරණාවක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Pandora's box එක open කරන්න එපා. එහෙම වුණොත් අපිත් එය පාවිච්චි කරනවා. මම ගොඩක් මහන්සි වෙනවා Standing Ordersවලට අනුව කටයුතු කරගෙන යන්න. කරුණු දැනුවත් මන්ත්‍රීතුමන්ලා ස්ථාවර නියෝග මෙහෙම හිතාමතා violate කරනවා නම්, අපිත් violate කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ලේකම් මණ්ඩලය දැනුම් දෙන්නේ, එය debate එකට අදාළ කාරණාවක්- *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Standing Order No. 28.(g) යටතේ ඔය කාරණය මතු කරන්න බැහැ, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. Please, ඒක තේරුම් ගන්න. ඔබතුමන්ලා ස්ථාවර නියෝග study කරලා බලන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මම මේ කාරණය මතු කරන්නේ ස්ථාවර නියෝග 91 (ඒ) යටතේයි. විශේෂයෙන්ම ඊයේ පාර්ලිමේන්තුව විසින් නිවේදනයක් නිකුත් කර තිබුණා, මා මතු කරපු ප්‍රශ්නයක් සම්බන්ධයෙන්. ඒකේ මගේ නම සඳහන් කරලා තිබෙනවා. ඒ නිසා ඒ ගැන කියන්න මට අවස්ථාවක් දෙන්න. එම නිවේදනයේ මගේ නම තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ සේවිකාවන්ට වෙච්ච යම් අසාධාරණයක් සම්බන්ධයෙන්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ජනවාරි මාසයේ කළ ප්‍රකාශයක්- *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, ඒක තමයි. ඒ සම්බන්ධව තමයි. එම statement එක දීලා තිබෙන්නේ මගේ නම සඳහන් කරලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ නම සඳහන් කරලා තිබෙන්නේ, ඔබතුමා පාර්ලිමේන්තුවේදී ඒ සම්බන්ධව ප්‍රකාශයක් කරපු නිසා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒක තමයි. මම පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් මතු කළා නේ, ගරු කථානායකතුමනි. ඔබතුමා කමිටුවකුත් පත් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ කමිටුවේ වාර්තාව ඔබතුමාට භාර දීලායි තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය අහන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, එම කමිටුවේ වාර්තාව සභාගත කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ඒක හොඳයි. කාරණය පැහැදිලියි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, ඔබතුමා හරි අසාධාරණයි. මගේ නම සඳහන් කරලා statement එකක් දුන්නාම-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා එම වාර්තාව,- *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එම වාර්තාව Staff Advisory Committee එකට ඉදිරිපත් කළාට පසුව - *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එම statement එකේ මගේ නම තිබෙනවා. මට අවස්ථාවක් ඕනෑ. මේක ඉතා අසාධාරණයි. අපේ නම් දාලා statements නිකුත් කරනවා. හැබැයි, අපට අවස්ථාවක් දෙන්නේ නැහැ, ඒ ගැන කරුණු කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, Staff Advisory Committee එකට - *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට mike එක දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ජනවාරි මාසයේ කරපු ප්‍රකාශය මතක් කරලා බලන්න. [*බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඊයේ නේ, ඒ statement එක දුන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කරනවා, මේ පාර්ලිමේන්තුව ඇතුළේ ලිංගික හිංසනයක් තිබෙනවා කියලා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, ඉතින්?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම එකක් නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඉතින්, මට කථා කරන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා එහෙම කියනවා වුණත් එහෙම නැහැ කියලා- *[බාධා කිරීමක්]* මම ඔබතුමාත් එක්ක තර්ක කරන්නේ නැහැ. Staff Advisory Committee එකට එම වාර්තාව ඉදිරිපත් කරනවා. එය ඉදිරිපත් කළාට පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නවා.

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය අහන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමා කොහොමද එහෙම එකක් නැහැ කියලා කියන්නේ? එහෙම නම්, මගේ නම සඳහන් කරන්නේ නැතිව ඉන්න ඕනෑ. මගේ නම සඳහන් කරලා- *[බාධා කිරීමක්]* එහෙම කරන්න බැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. ඔබතුමාට දැන් අවස්ථාව දුන්නාම ඔබතුමා එය ඉදිරිපත් කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමා එය ඉදිරිපත් කරන්නේ නැත්නම් මට ඊළඟ කාරණයට යන්න සිදු වෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මේ වැඩේ වැරැදියි නේ, ගරු කථානායකතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මෙතුමාට පාර්ලිමේන්තුවේදී වෙච්ච සිද්ධියක් ගැන ඔබතුමාගේ ගෙදර ඇවිල්ලා අහන්න බැහැ නේ. පාර්ලිමේන්තුවේදී අහන්න දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ අවස්ථාව තිබෙන්නේ. ඔබතුමා කථා කරන්නේ නැත්නම් මට යන්න සිද්ධ වෙනවා, අනෙක් කාරණයට.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I wish to -

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්නකෝ. *[බාධා කිරීමක්]* මට තත්පර කිහිපයක් දෙන්නකෝ, මගේ ප්‍රශ්නය අහන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව දුන්නා. ඔබතුමා කථා කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, -

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේ පාර්ලිමේන්තුවේදී ඒක විසඳන්න දෙන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 91 (ඊ) යටතේ මට අවස්ථාව දෙන්නකෝ. මොකද, මම දැන් රීති ප්‍රශ්නයක් මතු කරලා තිබෙනවා, ස්ථාවර නියෝග 91 (ඊ) යටතේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාව ඉල්ලන්නේ මගේ නම සඳහන් වුණු නිසායි. නැත්නම් මට අවශ්‍ය නැහැ උත්තර දෙන්න. ඔබතුමන්ලා පාර්ලිමේන්තුවෙන් මාධ්‍යවලට නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා, මගේ නම සම්බන්ධ කරලා. ඒ නිසායි මම කියන්නේ. මටත් සාධාරණයක් ඉටු වෙන්න එපායැ. ගරු කථානායකතුමනි, ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ කථානායක වෙන්න කලින් අවස්ථා කිහිපයකම යම් යම් සිද්ධි වෙලා තිබෙනවා. එක් කෙනෙක් සේවයෙන් අයින් කරලා තිබෙනවා, කාන්තා හිංසනය නිසා. ඒ වාගේ සිදුවීම් කිහිපයක් වාර්තා වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ සේවය කරන කාන්තාවන් මට වාර්තා කළ දේ ඒ අය වෙනුවෙන් තමයි මම මේ පාර්ලිමේන්තුවට වාර්තා කළේ. ඔබතුමා ඒක අහලා කමිටුවක් පත් කරලා, ඒ ගැන හොයපු එක හොඳයි. නමුත්, ඒ කමිටු වාර්තාව සභාගත කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වාර්තාව Staff Advisory Committee එකට ඉදිරිපත් කිරීමෙන් පසු සභාගත කරනවා.

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I wish to ask the following Question.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, there is another point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අපි සභාවේ ඉදිරි වැඩකටයුතු ටික කරගෙන යමු.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, first, let him finish.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I wish to ask the following Question under Standing Order No. 27(2). - *[Interruption.]* Hon. (Dr.) Harsha de Silva, Do you want to speak?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Yes.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා ප්‍රශ්නය මතු කරන Standing Order එක මොකක්ද, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් අහනවා අර කලින් අහපු ප්‍රශ්නය මට අහන්න පුළුවන්ද කියලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඒක debate එකක ගිය කාරණාවක් නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මම අහන්න කැමැතියි, මට අහන්න පුළුවන්ද කියලා ඒ ප්‍රශ්නය, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ (අ) කොටසේ 4 වන කාරණාව යටතේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. එතුමා ඉදිරිපත් කළාට පසුව අවස්ථාව තිබෙනවා නම් බලමු, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

පුළුවන් නම් මට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ස්වාධීන සේවක අර්ථසාධක අරමුදල් අධිකාරියක් පිහිටුවීම
### சுயாதீன ஊழியர் சேமலாப நிதிய அதிகாரசபையொன்றைத் தாபித்தல்
### ESTABLISHMENT OF AN INDEPENDENT EMPLOYEES' PROVIDENT FUND AUTHORITY

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I wish to ask the following Question under Standing Order No. 27(2) from the Hon. Minister of Finance, Planning and Economic Development on the subject of the establishment of an independent Employees' Provident Fund Authority. Under the new rule reducing the time allotted for this, I presume I would get the Answer today itself.

The Employees' Provident Fund - EPF - created under Act No. 15 of 1958, now exceeds Rs. 5 trillion, representing the savings of 2.6 million active contributors and millions of dormant members. It is the largest pool of worker' savings in Sri Lanka and is also a very big captive source. Despite this, the Fund remains under the administration of the Central Bank of Sri Lanka - CBSL - whose statutory role was redefined by Act No. 16 of 2023 as an independent monetary authority tasked with ensuring price stability, financial system stability and regulatory oversight. The Central Bank of Sri Lanka - CBSL - is neither structured nor mandated to manage a social security fund, and its dual role as a regulator and an operator creates a conflict of interest.

Over 90 per cent of EPF assets remain concentrated in Government securities, yielding sub-optimal returns, while equity holdings in regulated banks raise concerns of regulatory imbalance. International practice shows that provident funds are best managed by autonomous authorities such as EPFO in India, KWSP in Malaysia, CPF in Singapore and NPS in Korea, ensuring transparency, diversification and stronger returns that do not have conflicts of interest.

Sir, I wish to ask the following questions from the Hon. Minister. Will the Hon. Minister state,

1. whether the Government recognizes a conflict of interest in CBSL's dual role under Act No. 16 of 2023, which means that it is a regulator and an operator;
2. whether steps will be taken to establish an independent EPF Authority with its own governance, professional management and Parliamentary oversight;
3. the current total asset value and investment composition of the EPF and whether concentration in Government securities has reduced contributors' real returns;

The Central Bank's EPF gets about 30 per cent while the EPF that the normal people, you and we, contribute gets only 11 per cent.

4. why, despite IMF recommendations - this was one of their conditions under the Debt Sustainability Agreement as well as in their management review to the Government - debt management was removed from CBSL to avoid policy conflicts, but the EPF was retained and whether this inconsistency will be rectified;

5. whether EPF equity holdings in regulated banks create undue advantage and how that is addressed;

6. whether independent audits, actuarial valuations or performance reviews have been conducted during the past three years and whether such reports will be tabled in Parliament and if not, why;

7. whether EPF operations will be digitized to ensure transparency and efficiency;

8. whether international models have been studied and if a code of conduct/ conflict of interest framework exists for CBSL officers, whether it would be tabled;

9. whether the Government has considered amalgamating the EPF and the ETF into a single independent Authority to reduce duplication and improve efficiency?

Sir, this is the first time that we are asking a Question under Standing Order No. 27(2) after it has been limited to 350 words and cutting down the allotted time. So, I am sure that the Answer would be blowing in the wind as well.

Thank you.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට කාලය ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, අමාත්‍යාංශ නිවේදන.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ සභාවේ කටයුතුවලට කාලය මදි කියනවා. අපි අහන ප්‍රශ්න දීර්ඝ වැඩියි කියනවා. අපි අහන දවසේම උත්තර දෙන්න ඕනෑ කියනවා. නමුත් ස්ථාවර නියෝග 27(2) යටතේ මම මේ අහපු පළමු ප්‍රශ්නයටම උත්තර දෙන්න කල් ගන්න ඕනෑ කියනවා. ගරු කථානායකතුමනි, කොහොමද මේක පිළිගන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඇහුවේ මට අවස්ථාවක් ගන්න පුළුවන්ද කියලා. මේ ලේකම් මණ්ඩලයෙන් මම මේ ගැන ඇහුවා. Under Questions of Privilege, මම මේක අහනවා. මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා එය ලිඛිතව ලබා දෙන්න.

අමාත්‍යාංශ නිවේදන, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා.

## අයහපත් කාලගුණය හේතුවෙන් ඇති වී තිබෙන ආපදා තත්ත්වය: ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## சீரற்ற காலநிலை காரணமாக நிலவும் அனர்த்த நிலைமை: போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரினது கூற்று

## DISASTER SITUATION PREVALENT DUE TO ADVERSE WEATHER: STATEMENT BY MINISTER OF TRANSPORT, HIGHWAYS AND URBAN DEVELOPMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளு மன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මම මේ විශේෂ ප්‍රකාශය කරන්න හිතුවේ විශේෂයෙන්ම රට තුළ තිබෙන වර්ෂාපතනයත්, ගංවතුර තත්ත්වයත්, නාය යෑම් ඇතුළු ප්‍රශ්නත් නිසායි.

ගරු කථානායකතුමනි, මුලින්ම මම කඩුගන්නාවට අදාළ කරුණු ගැන කෙටි පැහැදිලි කිරීමක් කරලා, ඒ සඳහා අරගෙන තිබෙන පියවර ගැනත් කියලා, ඉන්පසු රටේ වර්තමාන තත්ත්වය කියන්නම්. විපතට පත් වෙච්ච ඒ ඒ ප්‍රදේශවල ගරු මන්ත්‍රීතුමන්ලා සමඟ සාකච්ඡාවක් ගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීමෙන් අද මේ මොහොතේ පාර්ලිමේන්තුවේ කෙරෙනවා. අපි බලාපොරොත්තු

[ගරු බිමල් රත්නායක මහතා]

වෙනවා මහජන ආරක්ෂක අමාත්‍යතුමා මාර්ගයෙන් ඒ ඒ ආරක්ෂක අංශ, NBRO එකේ නිලධාරින් ඒ ඒ ප්‍රදේශවලට යවන්න. මගේ අමාත්‍යාංශය පැත්තෙන් ගත්තොත්, මීට මාසයකට කලින් - ඔක්තෝබර් මාසයේදීත්, සැප්තැම්බර් මාසයේදීත් - දැනුවත් කරලා තිබෙනවා, මේ ආපදා තත්ත්වය අපි දන්නා දෙයක්, ඒකට සූදානම් වෙන්න කියලා. ගරු කථානායකතුමනි, මෙතැනදී මම ඉදිරිපත් කරන්නේ 2025 නොවැම්බර් 25වැනි දා කෑගල්ල දිස්ත්‍රික් ලේකම්තුමාට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය නිකුත් කළ වාර්තාව. NBRO එකේ ඒ සම්බන්ධව කටයුතු කරන බණ්ඩාර කියන භූ විද්‍යාඥ මහතා සමඟත් මම කථා කළා.

ගරු කථානායකතුමනි, එම ලිපියේ මෙසේ සඳහන් වනවා:

"කොළඹ-මහනුවර මාර්ගයේ 97/5 km - 97/6 km ප්‍රදේශයේ 2025.11.22 දින උදෑසන ඇති වූ පාෂාණ පතනය හේතුවෙන් එම මාර්ගයේ ගමනාගමන කටයුතු මුළුමනින්ම ඇනහිට ඇත. උක්ත බෑවුමේ තවදුරටත් පාෂාණ කුට්ටි හා පස් ස්ථර රැඳී ඇත. එම පාෂාණ කුට්ටි සහ පාංශු ස්ථර, වර්ෂාව මඟින් මාර්ගයට පතිත වීමේ යම් හැකියාවක් පවතී. තවද, එම මාර්ගයේ 99/5 ප්‍රදේශයේ මාර්ගයේ කොටසක ගිලා බැසීමක් ද සිදුව ඇත. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ නිලධාරීන් විසින් එම ස්ථානයන්හි ගවේෂණ කටයුතු සිදු කරන ලද අතර, ඒ අනුව එම නිරීක්ෂණ පදනම් කරගෙන පහත නිර්දේශ ඉදිරිපත් කළ හැකිය."

ගරු කථානායකතුමනි, මේ නිරීක්ෂණ ඊයේ හවස මම මෙතැන කථා කරද්දීත් සිද්ධ වුණා. දැනුත් මේ පර්යේෂණ කටයුතු එම ආයතනයෙන් සිද්ධ වනවා. එම ආයතනයේ මඟ පෙන්වීම අනුව තමයි මාර්ග සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් ලේකම්තුමන්ලා ඇතුළු සියලුදෙනාම කටයුතු කරන්නේ. ගරු කථානායකතුමනි, මම මේ ලේඛනය සභාගත කරන්නම්. ඒ මඟින් ඔවුන් කරන නිර්දේශ ප්‍රමාණයක් තිබෙනවා. ඒ පිළිබඳ මම කෙටියෙන් කියන්නම්.

එහි මෙසේ සඳහන් වනවා:

"කෙටි කාලීන නිර්දේශ

97km කණුව අසල ඇති වූ පාෂාණ පතනය

1. වැසි නොපවතින විට පමණක්, පහත සඳහන් කර ඇති නිර්දේශවලට යටත්ව සුදුසු පරිදි වාහනය ධාවනය (දකුණුපස පමණක්) යෝජනා කෙරේ.

මේ ලිපිය 25වැනි දා එවපු එකක්.

1.1 මාර්ගයේ වම් පස එනම්, පාෂාණ පතනය සිදු වූ පැත්තේ, වැලි සහ පස් කොට්ටවලින් තැනූ මීටර් 2ක අවම උසින් යුත් බාධකයක් ඉදිකිරීම.

ගරු කථානායකතුමනි, දැන් තිබෙන පාෂාණ තත්ත්වය පරීක්ෂා කළාම ඔවුන් විශ්වාස කරන විධියට ඒවායේ යම් ප්‍රමාණයක් ගොඩක් පහළට ඇවිල්ලා තිබෙන්නේ. ඒවා ආවා වුණත් වැලි සහ පස් කොට්ටවලින් බේරාගන්න පුළුවන් කියලා ඔවුන්ගේ විද්‍යාත්මක අත්දැකීම් අනුව හිතනවා.

1.2 අවදානම් කලාපය දෙපස පූර්ණකාලීන සංඥාකරුවන් - flagmen - යෙදවීම හා ආලෝක සංඥා යොදා ගැනීම - traffic colour lights -

1.3 මෙම ස්ථානය විදුලි පහන් යොදා රාත්‍රී කාලයේ මනා ලෙස ආලෝකමත් කර තබා ගැනීම.

1.4 මෙම ස්ථානයේ ඉහළ හා අවට සිදු විය හැකි කිසියම් අස්ථාවරත්වයක් හෝ භූමියේ සිදුවන වෙනස්කම් පිළිබඳව නිරන්තරයෙන් පූර්ණ අධීක්ෂණයට ලක් කිරීම.

1.5 යම්කිසි භූ අස්ථාවරත්වයක් හෝ වෙනසක් නිරීක්ෂණය කළහොත් මාර්ගය වසා දැමීම..."

ගරු කථානායකතුමනි, මම මේ ලිපිය **සභාගත*** කරනවා.

මෙහි මූලික කාරණයක් වශයෙන් දැනට තිබෙන අත්දැකීම් අනුව ඔවුන් ඉදිරිපත් කරන දේ තමයි, වැසි තත්ත්වය දිගට පැවතුණේ නැති වුණොත් පෙරළීමට ඉඩ තිබෙනවාය කියලා විශ්වාස කරන විශාල ගල, ගුරුත්වාකර්ෂණ මට්ටම ගත්තොත් ඒක balanced. නමුත්, වැස්සොත් ඒක slip වෙන්න පුළුවන්. ඒ නිසා තමයි ඔවුන් පැහැදිලිව කියන්නේ, වැස්සොත් තත්ත්වය වෙනස් වෙනවා, වැස්සේ නැති වුණොත් යම් කිසි ආකාරයකට සීමිත කොන්දේසි යටතේ මේ පාරේ ගමනාගමනයට ඉඩ දෙන්න පුළුවන් කියලා. එම නිසා අපි ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම වර්ෂාව පතනය වෙනවා නම් කඩුගන්නාව කොටසේ පාර අනිවාර්යයෙන්ම වහනවා. එම නිසා ඒ හරහා යන්න විකල්ප මාර්ග පාවිච්චි කරන්න කියලා අපි ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැන් ඒ පාර වහලාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔව්, දැන් වහලා. දැන් වහින නිසා පාර වහලා. ඒ කාරණය ගැන තමයි ජනතාව දැනුවත් කරන්න තිබෙන්නේ. වහිනවා නම් එතැනට ගිහිල්ලා අතරමං වෙන්නේ නැතුව විකල්ප මාර්ග සොයා ගන්න. ගරු කථානායකතුමනි, නමුත් අපි දිගටම අ.පො.ස.(උසස් පෙළ) විභාගය ලියන දරුවන් සඳහා විශේෂ ආරක්ෂක තත්ත්වයක් යටතේ ප්‍රවාහන පහසුකම් ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ වන විට රටේ ඇති වී තිබෙන ආපදා තත්ත්වය පිළිබඳව, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ එච්.එච්. හේමසිංහ මහතා විසින් නිකුත් කළ වාර්තාව අනුව, 2025.11.20 දින සිට 2025.11.27 දින -අද දින- උදේ 8.30 දක්වා වාර්තා වූ සමස්ත නායයෑම් ආපදා තත්ත්වය පිළිබඳ සමාලෝචනය මා ළඟ තිබෙනවා. මේ වාර්තාවත් වෙනස් වෙන්න පුළුවන්. මේ වාර්තාව මම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, දැනට තිබෙන තත්ත්වය ගත්තොත්, අද උදේ 8.30 වෙනකොට සිදුවීම් 140ක් වාර්තා වෙලා තිබෙනවා. නමුත්, දැන් ඒ තත්ත්වය 170ට වඩා වැඩිවෙලා තිබෙනවා. ඒ වාගේම දැනට මරණ 26ක් සිදුවෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ තත්ත්වයත් වෙනස් වෙන්න පුළුවන්. අද උදේ වෙනකොට තිබුණු තත්ත්වය තමයි මම මේ කියන්නේ. මේ වන විට බදුල්ල දිස්ත්‍රික්කයේ 16ක් සහ මහනුවර දිස්ත්‍රික්කයේ කඩුගන්නාවේ කලින් ඇති වූ සිද්ධියෙන් 06ක් සහ මේ වන විට තවත් 4දෙනෙක් ඇතුළුව 26දෙනෙක් මරණයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම නුවරඑළිය දිස්ත්‍රික්කයේ 4දෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා කියලා වාර්තා වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අද උදේ වෙනකොට වාර්තා වූ ස්ථාන 140න් ස්ථාන 97ක්ම NBRI එක විසින් පරීක්ෂා කර තිබෙනවා. තවත් ස්ථාන පරීක්ෂා කරන්න තිබෙනවා.

ඒ වාගේම විශේෂයෙන් දැනුවත් කළ යුතු කාරණයක් තිබෙනවා. නැඟෙනහිර පළාතේ මාර්ග ගණනාවක් වසා තිබෙනවා. මඩකලපුව දිස්ත්‍රික්කයේ මාර්ග 10කුත්, අම්පාර දිස්ත්‍රික්කයේ දැනට එක් මාර්ගයකුත්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

එක් මාර්ගයකුත් වසා තිබෙනවා. ගරු කථානායකතුමනි, නමුත් වතුර වැඩි වන ප්‍රමාණයත් එක්ක මේ තත්ත්වය අනිවාර්යයෙන්ම වෙනස් වෙන්න පුළුවන්. අවසාන වශයෙන්, අපට මෙන්න මේ ඉල්ලීම තමයි කරන්න තිබෙන්නේ. විශේෂයෙන්ම මේ අනතුරු බලන්න යන්න එපා කියන එක තමයි අපි ජනතාවගෙන් ඉල්ලන්නේ. ජනතාවගෙන් එම ඉල්ලීම කරන්න කියලා NBRI එක අපට කියලා තිබෙනවා. කලින් කඩුගන්නාවේ සිද්ධිය ඇති වූ තැන බලන්නත් මිනිස්සු ගියා. නමුත්, දැන් යන්න බැරි වෙයි. මේ ආපදා තත්ත්වය පිළිබඳව කලින් දැනගත් නිසා අපි මීට මාසයකට කලින් ඉඳලා ආණ්ඩුවක් ලෙස යම් සැලසුම්කරණයක් සහිතව උපරිම මැදිහත් වීමකින් කටයුතු කළා. අද ජනාධිපතිතුමා සමඟ කරන සාකච්ඡාවෙන් පසුව, එහිදී ගනු ලබන ක්‍රියාමාර්ගත් එක්ක ඉදිරි කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, National Building Research Organization එකෙන් 1999 දෙසැම්බර් මාසයේ සකස් කරන ලද "Preliminary Investigation Report for the Evaluation of Slope Stability and Geo-environmental Hazards Associated with Rocky Embankments of Kadugannawa Area" නමැති වාර්තාව මම **සභාගත*** කරනවා.

ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, දැන් කරන - මාසයක් විතර - researchesවලින් පස්සේ ගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡාවක් පවත්වලා ඒ පිළිබඳව අනාගතයේදී ගත යුතු පුළුල් ක්‍රියාමාර්ගවලට යොමු වෙන්න. මොකද, මේක historical and stretched පාරක්. අපට මේක වසා තබන්න බැහැ. ඒ නිසා මේක preserve කරලා, මේ area එක සංවේදී කලාපයක් ලෙස නම් කරලා, ජනතාවත් ආරක්ෂා කරගෙන ඔවුන්ට ලබා දිය හැකි සහන ලබා දීලා තමයි කටයුතු කරන්න වෙන්නේ. වාර්තා මත පදනම් වෙමින්, ගරු ජනාධිපතිතුමා සමඟ සිදු කරන සාකච්ඡාවෙන් පසුව තමයි ඒ පිළිබඳව අවසාන නිගමනය ගන්න වෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026 - කාරක සභා අවස්ථාව, දහහත්වන වෙන් කළ දිනය,

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

***කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: නොවැම්බර් 26]***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: நவம்பர் 26]*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. - [Progress: 26th November]*
*[THE HON. SPEAKER in the Chair.]*

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**118 වන ශීර්ෂය,- කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යවරයා**

01 වන වැඩසටහන,- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 4,294,000,000

**தலைப்பு 118.- கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 4,294,000,000

HEAD 118.- MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 4,294,000,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 118, 281, 282, ශීර්ෂ අංක 285 සිට 289 දක්වා සහ ශීර්ෂ අංක 292, 327 සහ 337.

සලකා බැලීම පූර්ව භාග 10.30 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.12]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු සභාපතිතුමනි, "2026 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.11.27වන බ්‍රහස්පතින්දා විවාදයට ගැනෙන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 118, 281, 282, 285 සිට 289 දක්වා, 292, 327 සහ 337 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මේ රටේ ඉතා වැදගත්, ඒ වාගේම විශාල පිරිසක් නියෝජනය කරන කෘෂිකර්ම අංශය ගැන තමයි අද කථා කරන්න තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ගොවීන් වෙනුවෙන් පොරොන්දු විශාල සංඛ්‍යාවක් තමුන්නාන්සේලා දීලා තිබුණා. මේ රටේ කෘෂිකර්මයේ නියැළෙන ගොවීන් අද වන විට අන්තිම අසරණ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා; තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය, වැඩ පිළිවෙළ, ආණ්ඩුවේ තිබෙන අකාර්යක්ෂමතාව නිසා අද වන විට ගොවියා අන්තිම අසරණ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ලෝක බැංකු වාර්තා අනුව මේ රටේ දරිද්‍රතා රේඛාවෙන් පහළ සියයට 35ක් ඉන්නවා. ඒ අයගෙන් සියයට 80ක් ගොවියෝ. මොනරාගල, අනුරාධපුරය, පොළොන්නරුව වාගේ දිස්ත්‍රික්කවල ජීවත් වන ගොවියෝ අද අන්තිම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මේ රටේ ජනතාවගෙන් සියයට 24ක් ඉන්නේ ගොවි ජනතාව. හැබැයි, පසුගිය අවුරුද්දේ දළ දේශීය නිෂ්පාදිතයට මෙගොල්ලන්ගේ දායකත්වය සියයට 8.1යි. මට මතකයි, එදා - 1994 වනකොට- එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කෘෂිකර්මයෙන්

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

මහ විප්ලවයක් කරලා ඉවර කරනකොට ඒ අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට සියයට 22ක දායකත්වයක් තිබුණා. ඒ කියන්නේ, මේ අවුරුදු 31 තුළ මේ රටේ ගොවියා අන්තිම අසරණ, දුප්පත් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා තමුන්නාන්සේලා පිළියම් යොදලා තිබෙනවාද? නැහැ. පසුගිය අවුරුද්දේ විතරක් ගොවිතැනින් -ගොවිතැන් කරන අයගෙන්- 150,000ක් ඉවත් වෙලා තිබෙනවා. සියයට 10ක් ගොවි බිම්වල ගොවිතැන් කරන එක නවත්වා තිබෙනවා. මේ රටේ ගොවිතැන මේ තත්ත්වයට කඩා වැටිලා තිබෙනවා. අද ගොවියා රටේ දුප්පත්ම මනුස්සයා බවට පත් වෙලා තිබෙනවා. ගොවිතැනින් ලැබෙන නිෂ්පාදනය අඩු වෙනවා. ප්‍රධාන දෙයක් තමයි, රජයේ සේවකයින්ගේ පඩි වැඩි කරනවා. අපි ඒකට විරුද්ධ නැහැ. වෙන වෙන දේවල් කරනවා. නමුත් ගොවියාට දෙන එකම සහනාධාරය වන පොහොර සහනාධාරය, එන්න එන්නම අඩු වෙනවා. තමුන්නාන්සේලා පොහොර සහනාධාරය දෙන්නේ වීවලට විතරයි. එදා, යහ පාලන ආණ්ඩුවේ අපි මේ රටේ ඕනෑ ගොවියෙකුට -වී ගොවියාට, බඩ ඉරිඟු වවන කෙනාට, තේ වවන කෙනාට, පොල් වවන කෙනාට- පොහොර මල්ලක් රුපියල් 1,500ට දුන්නා.

අද වෙළෙඳ පොළේ පොහොර මල්ලක මිල රුපියල් 11,000ක්, 12,000ක් වෙනවා, ගරු සභාපතිතුමනි. ගොවියා ගොවිතැන් කරන්නේ කොහොමද? එන්න එන්න නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. මම ඊයේ පෙරේදා මහවැලි ප්‍රදේශවලට ගියා. ඒ ගොවීන් කිව්වා, එම ප්‍රදේශවල අක්කර දෙකහමාරක කුඹුරකින් මුලදී වී කිලෝ 7,000ක් ගත්තා, දැන් ගන්නේ වී කිලෝ 5,000යි කියලා. වියදමත් වැඩියි, අස්වැන්නත් අඩුයි. මගේ දිස්ත්‍රික්කයේ තිබෙන මුතුකණ්ඩිය ව්‍යාපාරයට අයත් ප්‍රදේශවලට මම ගියා. ඒ ප්‍රදේශයේ සිටින ගොවීන් කිව්වා, අපි ඉස්සර වී කිලෝ 6,000ක් 6,500ක් ගත්තා, දැන් ඒක 4,500ට බැහැලා කියලා. එම නිසා ඒකට යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. පොහොර සහනාධාරය ගත්තොත්, එන්න එන්නම එය අඩු කරනවා.

මම රවී කරුණානායක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමා 2015 යහ පාලන ආණ්ඩුව කාලයේ පොහොර සහනාධාරය සඳහා රුපියල් බිලියන 49ක් දීලා තිබෙනවා. අද ඒක රුපියල් බිලියන 36ට අඩු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා කිව්වේ, ගොවියාට සලකන්නයි බලයට එන්නේ කියලා. ලෝක වෙළෙඳ පොළේ රුපියල අවප්‍රමාණයවීමත් එක්ක දැන් ඩොලරයේ අගය රුපියල් 310යි. එදා ඩොලරයේ අගය රුපියල් 138යි. එදා ලෝක වෙළෙඳ පොළේ පොහොර මිටියක මිල රුපියල් 4,000ක් විතර වුණා. අද ඒක රුපියල් 10,000කට වැඩියි. තමුන්නාන්සේලා අද කරන්නේ බොරුවක්. ගොවීන්ගේ බැංකු ගිණුම්වලට නියම වෙලාවට මුදල් දමන්නේත් නැහැ. හැබැයි, රුපියල් බිලියන 36ක් වෙන් කරලා තිබෙනවා. මහ කන්නයට හෙක්ටෙයාර ලක්ෂ 8යි, යල කන්නයට හෙක්ටෙයාර ලක්ෂ 5යි. තමුන්නාන්සේලාගේ ගොවිජන සේවා අධ්‍යක්ෂ ජනරාල් කියනවා, ගොවීන්ගෙන් සියයට 93කට සහනාධාරය දීලා තිබෙනවා කියලා. ඇමතිතුමා කියනවා, නැහැ, පොහොර දැම්මාට පස්සේ තමයි අපි සහනාධාරය දෙන්නේ කියලා. ගොවීන්ට සල්ලි නැති නිසායි මේ සහනාධාරය දෙන්නේ.

තමුන්නාන්සේලාගේ ජංගම ගිණුමේ අතිරික්තයක් තිබෙනවා, මෙච්චර තිබෙනවා, ට්‍රිලියන ගණනක් තිබෙනවා කියලා තමුන්නාන්සේලා කියනවා. එහෙම නම් ගොවියාට සහනාධාරය දෙන්න බැරි ඇයි? තමුන්නාන්සේලා ගොවියාගේ සහනාධාරය දෙන්නේ නැහැ. තවමත් අපේ ප්‍රදේශවල ගොවීන්ට සහනාධාරය දීලා නැහැ. යල කන්නයේ ගොයම් කපලා ඉවර වුණාට පස්සෙයි සමහර ප්‍රදේශවලට සහනාධාරය දුන්නේ. තමුන්නාන්සේලා එච්චර අකාර්යක්ෂම ආණ්ඩුවක්. දැන් ගොවියා වගාවෙන් ටිකෙන් ටික ඈත් වෙනවා. තමුන්නාන්සේලා බලය ගත්තේ මේවා කරන්නද? සාපේක්ෂව බැලුවොත්, 2015 වසර වනකොට මුළු වියදමෙන් සියයට දෙකක් පොහොර සහනාධාරයට ගිහිල්ලා තිබෙනවා. දැන් එය සියයට එකකටත් අඩුයි. ඒ කියන්නේ, ගොවියාට සලකන එක අඩු වෙලා තිබෙනවා. අපි තමුන්නාන්සේලාගෙන් අහනවා, තමුන්නාන්සේලා ගොවිතැන ආරක්ෂා කරන්නේ මේ විධියටද කියලා.

ඒ විතරක් නොවෙයි. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් කියනවා, අද වන විට මහ කන්නයට සියයට 93ක් සල්ලි - රුපියල් බිලියන 6ක් - යවලා තිබෙනවා කියලා. හරි විධියට නම් හෙක්ටෙයාරයකට රුපියල් 15,000 ගණනේ හෙක්ටෙයාර 800,000ට රුපියල් බිලියන 12ක් යවන්න ඕනෑ. ඒකෙන්ම බොරුව පෙනෙනවා. හෙක්ටෙයාර 800,000ක් නේ. හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක් ගෙවන්න එපායැ. ඉතින්, තමුන්නාන්සේලා මේ විධියටයි කටයුතු කරන්නේ.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා, අද වනකොට කුඹුරු හෙක්ටෙයාරයකට පොහොර දමන්න රුපියල් 52,000ක් විතර වැය වෙනවා කියලා. යූරියා දෙකයි, TSP, MOP ඔක්කෝම එනකොට 52,000ක් විතර වැය වෙනවා. දැන් තමුන්නාන්සේලා දෙන්නේ රුපියල් 25,000යි. ඉස්සර අපේ ආණ්ඩුව තිබියදී, මේ රවී කරුණානායක මැතිතුමා මුදල් ඇමති වෙලා ඉන්නකොට ගොවීන්ට සියයට 75ක සහනාධාරයක් දුන්නා. ගිය ආණ්ඩුව කාලයේ තිබුණු දේවල් තමුන්නාන්සේලා අද වන විටත් වෙනස් කරලා නැහැ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මේ රටේ ගොවිතැන විනාශ කරන්න කටයුතු කළා. ඒකත් මම මතක් කරනවා. ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය දුන්නේ මේවා හදයි කියලා. නමුත්, තමුන්නාන්සේලා මේවා හදලා නැහැ. එම නිසා තමයි මේ රටේ තරුණයින් -අලුත් පරම්පරාව- ගොවිතැනින් එළියට යන්නේ. මේ වන විට හැම වගාවකම අස්වැන්න අඩු වෙලා. අර්තාපල් අස්වැන්න අඩු වෙලා. ලූනු අස්වැන්න අඩු වෙලා. වීවල තත්ත්වය මම ඉස්සෙල්ලා කිව්වා. මේ නිසා පොහොර සහනාධාරයට වැඩි මුදලක් වෙන් කරන්න. ගොවියා වෙනුවෙන් ඒ කටයුත්තයි තමුන්නාන්සේලා කරන්න ඕනෑ.

අපි බැලුවා, මෙවර අය වැයෙන් මොනවාටද මුදල් වෙන් කරලා තිබෙන්නේ කියලා. රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා, dryers ගන්න. ඒ, වී වේළන්න. වී මෝල් මුදලාලිලාට තමයි මේකේ වාසිය තිබෙන්නේ. එතකොට ඒගොල්ලන් තෙත නැති, වේළුණු වී ගනීවි. මට මතකයි, ජනාධිපතිතුමා ඇවිල්ලා ඉස්සෙල්ලාම කිව්වේ මොකක්ද? රුපියල් 10කින් හාල් මිල වැඩි කරනවා කිව්වා. ඒ, ගොවියාට නොවෙයි, මුදලාලිලාට සහනයක් දෙන්න. ඒ අවස්ථාවේදී මෙතුමන්ලා මේසවලටත් තට්ටු කළා. මම අද තමුන්නාන්සේලාගෙන් අහන්නේ මෙයයි. කෘෂිකර්ම ඇමතිතුමනි, ඔබතුමා බොහොම මිත්‍ර ඇමතිවරයෙක්. ගිය වසරේ මේ රටට ආහාර ද්‍රව්‍ය ගේන්න විතරක් රුපියල් බිලියන 1,045ක් වැය වෙලා තිබෙනවා. ඒ, ආහාර ද්‍රව්‍ය ගේන්න විතරක්! 1994 වසර වනකොට මේ රට අලවලින් ස්වයංපෝෂිත වෙලා තිබුණු බව මට මතකයි. අද සියයට 10ක් විතර තමයි අපි නිෂ්පාදනය කරන්නේ. ඉස්සර අපි අලවලින් ස්වයංපෝෂිත වෙලා තිබුණා. ගරු සභාපතිතුමනි, අපි 1948දී නිදහස ලබනකොට මේ රටට අවශ්‍ය හාල්වලින් සියයට 34යි නිෂ්පාදනය කළේ. හැබැයි, අවුරුදු 76ක ශාපය ඉවර වනකොට අපි හාල්වලින් සියයට 100ක් ස්වයංපෝෂිත වුණා. ඩඩ්ලි සේනානායකලා, ඩී.එස්. සේනානායකලා, ජේ.ආර්. ජයවර්ධනලා, ගාමිණී දිසානායකලා, රණසිංහ ප්‍රේමදාසලා තමයි කෘෂි කර්මාන්තය ඒ තත්ත්වයට පත් කළේ. අද වී නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. එතුමන්ලා රට ස්වයංපෝෂිත කළාට අද මොකද වෙලා තිබෙන්නේ? 1948දී

ජනගහනය හිටියේ මිලියන 6.5යි. එවකට අපේ නිෂ්පාදනය සියයට 34යි. අද ජනගහනය මිලියන 21.7යි. අපි සියල්ල නිෂ්පාදනය කරනවා. පසුගිය කන්නයේ වී මෙට්‍රික් ටොන් 4,200,000ක් අපි නිෂ්පාදනය කළා. මේක මෙට්‍රික් ටොන් ලක්ෂ 50ට ගිහිල්ලා තිබුණා, 2020 වසර විතර වනකොට. අද ඒක අඩු වෙලා තිබෙනවා.

අද මේ ජනපද ගොවීන්ට පොඩි ඉඩමක්, සීමාසහිත මුදලක් තිබෙන්නේ. අද අපේ රටේ නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. මේ රටට අවශ්‍යයි, කෘෂිකර්ම නවීකරණයක්. ඒ නවීකරණය සිද්ධ කළේ නැහැ, පසුගිය අවුරුදු ගණනේම. අපි රජයෙන් ඉල්ලන්නේ මුදල් තිබෙනවා නම් මේ නවීකරණය කරන්න කියලායි. අලුත් බීජ වර්ග ගැන, පොහොර ගැන, කුඹුරුවල තිබෙන පසේ රසායනික සංයුතිය කොහොමද කියන කාරණායි හොයන්න ඕනෑ. හැබැයි, ඒවා නොවෙයි දැන් කරන්නේ. තමුන්නාන්සේලා මේ සම්බන්ධව පොරොන්දු දුන්නා. නමුත් ඒ පොරොන්දු ඉෂ්ට කළේ නැහැ.

බලන්න, බඩඉරිඟු ගොවියෝ මුහුණ දී තිබෙන තත්ත්වය. මේ රටේ දුප්පත්ම දිස්ත්‍රික්කවල තමයි බඩඉරිඟු ගොවියෝ ඉන්නේ. ඒ, මොනරාගල, අනුරාධපුරය, අම්පාර වැනි දිස්ත්‍රික්කවල. අපි 2020 වසර වනකොට මේ රටට ඕනෑ බඩඉරිඟුවලින් සියයට 80ක් නිෂ්පාදනය කළා. අපේ පරිභෝජනයට සහ කුකුළු කෑමවලට බඩඉරිඟු මෙට්‍රික් ටොන් ලක්ෂ 6ක් ඕනෑ. බඩඉරිඟු මෙට්‍රික් ටොන් ලක්ෂ 4,1/2ක් අපි එදා නිෂ්පාදනය කළා. අද ඒක මෙට්‍රික් ටොන් ලක්ෂ 2ට අඩු වෙලා. ඒ, ඇයි? බඩඉරිඟු ගොවියාට අවශ්‍ය පොහොර ටික, සහනාධාර ටික අද ලැබෙන්නේ නැහැ. තමුන්නාන්සේලා මොනරාගල දිස්ත්‍රික්කයේ බඩඉරිඟු ගොවියෝ ඒ ඉඩම්වලින් එළවනවා. තමුන්නාන්සේලා ඒ ගොවීන්ට අද වගා කරන්න අවස්ථාව දෙන්නේ නැහැ. මේ රට සතු විදේශ විනිමයෙන් බිලියන ගණනක් වැය වනවා, බඩඉරිඟු ගේන්න. බඩඉරිඟු මේ රටේ වවන්න පුළුවන්. තමුන්නාන්සේලාගේ අක්‍රමවත්භාවය තමයි මේකට හේතුව. කරුණාකරලා මේ රටේ සියලු ගොවීන්ට මේ පොහොර සහනාධාරය දෙන්න, ගරු ඇමතිතුමනි. මේ රටේ ඉතිහාසයේ වී ගොවියාට විතරක් නොවෙයි, හැම ගොවියාටම ඒ සහනාධාරය ලබා දුන්නා. තමුන්නාන්සේලා තේ වවන අයට, රබර් වවන අයට, බඩඉරිඟු, එළවලු, පළතුරු වවන අයට අද ඒ සහනාධාරය සීමා කරලා තිබෙනවා. අපට බඩඉරිඟු නිෂ්පාදනය අවශ්‍යයි. බඩඉරිඟු වැඩි වශයෙන් ගන්නේ කුකුළු කෑමවලට. එය සියයට 80ක්. දුප්පත්ම මිනිහාට ප්‍රෝටීන් ටිකක් ගන්න පුළුවන් බිත්තරේකින්. එතැන තිබෙන්නේ ඒක. අද තමුන්නාන්සේලා ඒ දේ කරන්නේත් නැහැ. ඒ විතරක් නොවෙයි. අද බඩඉරිඟු ඇල්කොහොල් නිෂ්පාදනයටත් යොදා ගන්නවා. තමුන්නාන්සේලා කියන ඔය මහ බැංකු ගනුදෙනුවට අදාළ සමාගම්වල තමයි අද බඩඉරිඟුවලින් එතනෝල් නිෂ්පාදනය කරන්නේ.

අද බීජ කිලෝ පහක බෑග් එකක් රුපියල් 15,000ක්, රුපියල් 20,000ක් වෙනවා. අපි ඉල්ලා සිටිනවා, මේ ගොවීන්ට සහනාධාරයක් දෙන්න කියලා. එතකොට මේගොල්ලන් ඒ සම්බන්ධයෙන් උනන්දු වෙයි. පොහොර සහනාධාරය දෙන්න. ජනාධිපතිතුමා වාගේම ආණ්ඩුව කෑ ගහනවා, "භාණ්ඩාගාරයේ මුදල් මෙච්චර තිබෙනවා. මෙච්චර අතිරික්තයක් තිබෙනවා" කියලා. එහෙම නම්, ඇයි මේගොල්ලන්ට සලකන්න බැරි? මිනිසුන්ගෙන් බෙල්ල මිරිකලා බදු අරගෙන ආණ්ඩුව පොහොසත් වෙනවා, ගොවියා දුප්පත් වෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවත් "ලෝකයට පරකාසේ - ගෙදරට මරගාතේ" වාගේ තමයි. ඔන්න, ගොවියා පත් වෙලා තිබෙන තත්ත්වය. ඩබ්ලි පොහොසත් වෙලා. ඔබතුමා උත්තර දෙන්න, ගරු ඇමතිතුමනි. *[බාධා කිරීමක්]* රටේ ගොවියා කඩාගෙන වැටිලා. IMF එකට ගිහිල්ලා කියනවා, "අපි බොහොම සාර්ථකයි" කියලා. ඒක නේ තමුන්නාන්සේලා කියන්නේ.

ඊළඟට බලන්න, බී ලූනු ගොවියා ගැන. ඉස්සර මේ රට තුළ බී ලූනු නිෂ්පාදනයෙන් සියයට 40ක්, 50ක් නිෂ්පාදනය කරනවා. අද ඒ ප්‍රමාණය අඩු වෙලා, ටොන් 55,000ට. තමුන්නාන්සේලා කොහොමද බද්ද දැම්මේ කියන එකයි අපි අහන්නේ. සාමාන්‍යයෙන් කෘෂිකර්ම ඇමති, වෙළෙඳ ඇමති ඉන්න ආහාර සුරක්ෂිතතා කමිටුවක් තිබෙනවා. ඒ කමිටුව තමයි අස්වැන්න එනකොට බද්ද පනවන්න තීන්දුව ගන්නේ. තමුන්නාන්සේලා මොනවාද කළේ? කමිටුව රැස් වුණා. බද්ද වැඩි කරනවා කිව්වා. සාමාන්‍ය ක්‍රමය තමයි, බද්ද වැඩි කරපු ගමන් ඒක ගැසට් කරන එක. අන්තිමට ඒකේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ප්‍රදීප් කුමාර මහත්තයා අස් කළා. එතුමා කිව්වා, මේක ඉක්මනට කරන්න කියලා. තමුන්නාන්සේලා සති දෙකකට පස්සේ බද්ද දැම්මේ. වෙළෙන්දෝ ලූනු ටිකයි, අල ටිකයි ගෙනැල්ලා. ඇයි, ඒ? ඉන්දියාවෙන් නැවක් එන්න දවස් තුන හතරක් විතරයි ගත වෙන්නේ. ටොන් 29,000ක් ගෙනැල්ලා තිබෙනවා. අපි ටොන් 55,000ක් නිෂ්පාදනය කරලා තිබෙනවා. 2024 සැප්තැම්බර් වෙනකල් ගෙනැල්ලා තිබෙන්නේ ටොන් 156,000යි. මේ අවුරුද්දේ ගෙනැල්ලා තිබෙන්නේ ටොන් 226,000යි. ඒ අනුව වෙළෙඳ පොළේ අතිරික්තයක් තිබෙනවා. අපේ ගොවියාගේ ලූනු ටික විකුණා ගන්න බැහැ, තමුන්නාන්සේලාගේ පැහැදිලි නැති, අකාර්යක්ෂම වැඩ පිළිවෙළ නිසාවෙන්.

ඒ කාලයේ අනුර දිසානායක මහත්තයා කිව්වා, "මේ රටට ආණ්ඩුවක් ඕනෑ නැහැ. පිටකොටුවේ මුදලාලිලා ටික හිටියාම ඇති" කියලා. තමුන්නාන්සේලා ඒක අද කරලා තිබෙනවා. පිටකොටුවේ මුදලාලිලා ටික විතරක් පිට රටින් බඩු ටික ගෙනෙනවා. ලූනු ගොවීන්ට තමන්ගේ අස්වැන්න විකුණා ගන්න විධියක් නැහැ. රාජපක්ෂලාගේ පාලන කාලයේ පොල් ගෙඩියේ විතරයි වට රවුම මැන්නේ. දැන් ලූනු ගෙඩියේත් වට රවුම මනිනවා. ඒක තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ තත්ත්වය. මේ තත්ත්වයට මේ රටේ ගොවීන් පත් කරන්නේ ඇයි කියලා අපි ඇමතිතුමාගෙන් අහනවා. බලන්න, අර්තාපල් ගොවියා දිහා. මට මතකයි, 1994 වෙනකොට මේ රට අර්තාපල්වලින් ස්වයංපෝෂිත වුණු බව. නමුත්, අද මොකද වෙලා තිබෙන්නේ? එන්න එන්නම අර්තාපල් අස්වැන්න කඩාගෙන වැටිලා. 2019දී වගා කළේ හෙක්ටෙයාර 5,610යි. පසුගිය අවුරුද්දේ වගා කළේ හෙක්ටෙයාර 3,253යි. දැන් ඒ ප්‍රමාණය හෙක්ටෙයාර 1,000කට කිට්ටු වන ප්‍රමාණයකට අඩු වෙලා කියලා මට ආරංචි වුණා. ඇමතිතුමනි, ඒක ඇත්ත නේද? ඇයි, ඒ? බීජ අල ටොන් එකක් රුපියල් 45,000ක් විතර වෙනවා. ගොවීන්ට ඒවා අරගෙන වගා කරන්න බැහැ. අගෝස්තු මාසයේ අස්වැන්න ලැබෙනවා. හැබැයි, අගෝස්තු 28වැනි දා තමයි බද්ද පනවන්නේ, ගරු සභාපතිතුමනි. අල ටොන් 23,000ක් ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා අපේ රටේ ගොවියා නිෂ්පාදනය කරන අල ටික විකුණා ගන්න විධියක් නැහැ. කරුණාකර මේ සම්බන්ධයෙන් ගොවීන්ට සහනාධාර ක්‍රමයක් හදන්න. මේ රටේ සියයට 24ක් ඉන්නේ ගොවීන්. රුපියල් බිලියන 1,000ක් වැය වනවා, සීනි ටික, අල ටික, ලූනු ටික, කෑම බඩු ටික ගෙනෙන්න. පසුගිය අවුරුද්දේ ඒ වෙනුවෙන් රුපියල් බිලියන 1,045ක් වැය වෙලා තිබෙනවා. මේවා ගොවිතැනින් ස්වයංපෝෂණය කරන්න ඕනෑ. නමුත්, තමුන්නාන්සේලා ඒවා ස්වයංපෝෂණය කරන්නේ නැහැ.

තමුන්නාන්සේලා පසුගිය අය වැයෙන් කිව්වා, කෘෂිකර්ම දත්ත පද්ධතියක අවශ්‍යතාවක් තිබෙනවා, ඒක කරන්න ඕනෑ කියලා. මම දන්නේ නැහැ, ඒක ඇති කළාද කියලා. ඒක ඇති කළා නම් අපේ නිෂ්පාදනය, අපේ අවශ්‍යතාව මොකක්ද, අපි කොච්චර නිෂ්පාදනය කරන්න ඕනෑද, අපි පිට රටින් කොච්චර ගෙනෙන්න ඕනෑද කියලා තමුන්නාන්සේලා ළඟ සංඛ්‍යාලේඛන තිබෙන්න ඕනෑ. ඒ අනුව තමයි බදු ගහන්නේ; ඒ අනුව තමයි ඒවා ගෙනෙන

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

එක නවත්වන්නේ. නමුත්, ඒ දත්ත පද්ධතිය ක්‍රියාත්මක කරලා නැහැ. තමුන්නාන්සේලා මුංඇට, අර්තාපල්, රතු ලූනු නිෂ්පාදනයට වාගේම ඒවායේ ඵලදායීතාව වැඩි කිරීමට රුපියල් මිලියන 500ක් වෙන් කර තිබුණා. ගිය මාසයේ 30වැනි දා වෙනකොට එයින් වියදම් කර තිබෙන්නේ රුපියල් මිලියන 9යි. ඔන්න, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කාර්යක්ෂමතාව.

ඒ විතරක් නොවෙයි, තරුණ කෘෂිකර්ම ව්‍යවසායකයින් 50,000ක් අවුරුදු 5කින් බිහි කරනවාය කියලා තිබුණා. එහෙම නම්, පළමුවන අවුරුද්දට 10,000ක්වත් හදන්න ඕනෑ නේ. රුපියල් මිලියන 500ක් ඒ වෙනුවෙන් වෙන් කර තිබෙනවා. 28දෙනෙකුට ණය දීලා තිබෙනවා. ව්‍යවසායකයින් 50,000ක් හදනවාය කියලා 28දෙනෙකුට ණය දීලා තිබෙනවා. මෙහෙමද තමුන්නාන්සේලා වැඩ කරන්නේ? මම මේ කියන්නේ පසුගිය මාසයේ 30වන දා වෙනකොට තත්ත්වය. ගල්ඔය, නුවර, රාජාංගනය වැව් හදන්න රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබුණා. එහි ප්‍රගතිය සියයට 37යි.

තමුන්නාන්සේලා පසුගිය කාලයේ මේ රටේ සත්ව සංගණනයක් කළා. මේ රටේ ගොවිතැනට අද වනකොට විශාල හානියක් -සියයට 30ක්, 40ක්- වෙනවා, රිළවුන්ගෙන්, වඳුරන්ගෙන්, මොනරුන්ගෙන් සහ දඬු ලේනුන්ගෙන්. බර ගණනක් වියදම් කරලා තමුන්නාන්සේලා සංගණනයක් කළා. ඒ සතුන් එක්කෝටි තිස්ලක්ෂයක් ඉන්නවා කියලා තමුන්නාන්සේලාගේ සංගණනයේ තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව අවසන් වෙනකොට රටේ ජනගහනයට වඩා ඒ සතුන් ප්‍රමාණය වැඩි වේවි. අපි බැලුවා, මේ අවුරුද්දේ අය වැයෙන් ඒ වෙනුවෙන් කීයක් හරි වෙන් කර තිබෙනවාද කියලා. නමුත්, කීයක්වත් ඒ වෙනුවෙන් වෙන් කර නැහැ, ඇමතිතුමනි. ගරු සභාපතිතුමනි, කීයක්වත් ඒ වෙනුවෙන් වෙන් කර නැහැ. තමුන්නාන්සේලා මේ වෙනුවෙන් ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද?

මට මතකයි, ඉස්සර අපේ පැත්තේ වගා ආරක්ෂා කරන්න තුවක්කු licence දුන්නා. මගේ පියා 1960දී පාර්ලිමේන්තුවට ඇවිල්ලා කරපු පළමුවෙනි ඉල්ලීම තමයි, ඒ තුවක්කු licence දෙන්න කියන එක. 1988-89 කාලයේ තමුන්නාන්සේලා මොකක්ද කළේ? ගෙවල්වලට ගිහිල්ලා ඒ තුවක්කු ටික එක්කහු කළා. ගරු සභාපතිතුමනි, ඔබතුමා එහෙම නැහැ. ඔබතුමා NPP නේ. *[බාධා කිරීමක්]* අද වගා ආරක්ෂාව නැහැ. අපි කියන්නේ, කරුණාකරලා මේවාට මොනවා හෝ ක්‍රමයක් හදන්න කියායි. තමුන්නාන්සේලා එක එක දේවල් කිව්වා. නමුත්, තවම මුකුත් කෙරිලා නැහැ. තවමත් ඒ සත්තු ටික ඉඩම්වල තිබෙන සියලු භෝග කනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මට තව විනාඩි දෙකතුනක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, විපක්ෂයේ වෙලාවෙන් එතුමාට විනාඩි දෙකක් දෙන්නම්.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මේක තමයි අද කෘෂිකර්මයට ඇති වෙලා තිබෙන තත්ත්වය. තමුන්නාන්සේලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නම් තිබුණා, අක්කරයකින් රුපියල් ලක්ෂ 30ක ආදායමක් උපද්දවන්න කටයුතු කරනවා කියලා. ගොවිතැන් කරන අක්කර ලක්ෂ 60ක් තිබෙනවා. එහෙම නම්, අපේ රට ලෝකයේ ආදායම් පැත්තෙන් - per capita income එකෙන් - නොම්මර එකට එන්න ඕනෑ.

තමුන්නාන්සේලා කරුණාකරලා මේ තිබෙන ටිකවත් ආරක්ෂා කරන්න. අපි මේවා කියන්නේ තමුන්නාන්සේලාට දොස් කියන්න නොවෙයි, මේ රටේ ගොවි ජනතාව දුක් විඳින නිසා.

තව කාරණා කිහිපයක් ගැන කථා කරන්න තිබුණත් ඒවා කියන්න මට තිබෙන වෙලාව ප්‍රමාණවත් නැහැ. අද වනවිට රටේ විශාල ආපදා තත්ත්වයක් තිබෙනවා. මෙවැනි ආපදා තත්ත්වයන්ට අපි සූදානම් වෙලා ඉන්න ඕනෑ. අපි දන්නවා, අවුරුදු හත අටකට සැරයක් මේ චක්‍රය -circle එක- එන බව. 2016-2017දීත් මෙවැනි ආපදා තත්ත්වයක් ආවා. එදා අපි ස්වාභාවික ආපදා සම්බන්ධයෙන් ජාත්‍යන්තර රක්ෂණයක් කරලා තිබුණා අපට මතකයි, ගරු සභාපතිතුමනි. අපි ඒ වෙනුවෙන් රුපියල් මිලියන 1,500ක වාරිකයක් ගෙව්වා. මේ රටේ දේපොළ විනාශ වුණාම, ගෙයක් විනාශ වුණාම රුපියල් ලක්ෂ 20ක්, ව්‍යාපාරයක් විනාශ වුණාම රුපියල් ලක්ෂ 25ක් ගෙවනවා. මම ඒ වෙලාවේදී ආපදා කළමනාකරණ විෂයය භාර ඇමතිවරයා වශයෙන් හිටියේ. මට මතකයි, ඒ කාලයේ ආපදා තත්ත්වය හේතුවෙන් මරණයක් වුණොත් රුපියල් ලක්ෂ 10ක්, ගොවිතැන් පාළු වුණොත් රුපියල් ලක්ෂ ගාණක් ගෙව්වා. ඒ ආපදා රක්ෂණය දැන් නැති කරලා තිබෙනවා. මොකද, මේ වාගේ වෙලාවක ඊට මුහුණ දෙන්න එවැනි දෙයක් තිබෙන්න ඕනෑ. එලෙස ආපදාවලට පත් වෙන්නේ අහිංසක, දුප්පත් මිනිස්සු. මේ ආපදා තත්ත්වය නිසා 26දෙනෙක් මැරිලා කියලා වාර්තා වෙලා තිබෙනවා. මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒ ආපදා රක්ෂණය නැවත ආරම්භ කරන්න කියලා. දුප්පත් මිනිස්සු මිස ලොකු ගෙවල්වල ඉන්න මිනිස්සු ආපදාවට ලක් වෙන්නේ නැහැ. කඳුවල, කැලෑවල ඉන්න මිනිස්සු තමයි මෙවැනි ආපදාවලට ලක් වෙන්නේ. ඒ අයට ගෙවන්න නැවත ඒ ආපදා රක්ෂණ ක්‍රමය ඇති කරන්න. මට මතක විධියට ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ තමයි ඒක තිබුණේ. ඒ රක්ෂණ ක්‍රමය නැවත ඇති කරන්න. මෙවැනි ස්වාභාවික ආපදාවකදී ආණ්ඩුව වැරදිත් නැහැ, අපි වැරදිත් නැහැ. නමුත් එවැනි තත්ත්වයන්ට අපි ලැහැස්ති වෙලා ඉන්න ඕනෑ, ගරු සභාපතිතුමනි.

දී නියඟයක් ආවා. ඒ නිසා අස්වැන්න අඩු වුණා. ඒ circle එක ආපසු ඒවි. කරුණාකරලා මේවාට ලැහැස්ති වෙන්න, මේ රටේ ගොවියා වෙනුවෙන් පොරොන්දු වුණු ආකාරයට වැඩ කරන්න කියලා රජයෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. K.D. Lal Kantha. You have 10 minutes.

[පූ.භා. 10.35]

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු සභාපතිතුමනි, මම මේ විවාදය අවසානයේදීත් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මගේ වේලාව මම බෙදලා තිබෙන්නේ ආරම්භයටයි, අවසානයටයි කථා කරන්න. මොකද, ඇති තරම් කථා කරන්න වේලාව මට තිබෙනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

විපක්ෂ නායකතුමා මීට කලින් සභාවේ හිටියා. මේ අවස්ථාවේදී විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සභාවේ ඉන්න නිසා මම මුලින්ම එතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ වනවිට රටේ පවතින ආපදා තත්ත්වය පිළිබඳව කිහිපදෙනෙකුම කියපු නිසා මම ඒ තත්ත්වය ගැන ආපහු කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අද දවස අවසානයේදී ඡන්දයක් තිබෙන බව තමයි කියැවෙන්නේ. විපක්ෂයේ ෂාණක්කියන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඡන්දයක් ඉල්ලනවා කියලා තමයි ආරංචිය තිබෙන්නේ. ඡන්දයක් තියන්න වුණොත් අපට මන්ත්‍රීවරු කැඳවන්න වෙනවා. එතකොටමේ ආපදා තත්ත්වයට මන්ත්‍රීවරුන්ට අවශ්‍ය මැදිහත්වීම් කරන්න වෙන්නේ නැහැ. ඒ නිසා විරෝධය සටහන් කරලා වැය ශීර්ෂ සම්මත කරමු. සම්පූර්ණයෙන් මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂවලට විරෝධය පළ කරනවා වාගේ එකක් ගැන තමයි අපි දැනුවත් වෙලා තිබෙන්නේ. ඒ නිසා විපක්ෂ නායකතුමාට හෝ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට පුළුවන් නම් ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙලා එතුමාව දැනුවත් කරන්න. මම දන්නා තරමින් ෂාණක්කියන් මන්ත්‍රීතුමා ඡන්දයක් ඉල්ලනවා. මේ වැය ශීර්ෂය ඡන්දයක් නැතුව සම්මත කර ගන්න පුළුවන් නම් මේ වෙලාවේදී අපි ඒ ආපදා තත්ත්වය පිළිබඳව කථා කරනවා වාගේම ඒ විසඳුම් ක්‍රියාවට නැඟීමකුත් වෙනවා. මම හිතන විධියට, එතුමා නියෝජනය කරන නැඟෙනහිර පළාතත් විශාල වශයෙන් මේ වනකොට ආපදාවට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා අද ඉස්කෝලුත් වහලා. ඒ වාගේ බරපතළ ප්‍රශ්න ගොඩක් තිබෙනවා. පුත්තලම, නුවර, බදුල්ල වාගේ ප්‍රදේශවල විශාල ආපදා තත්ත්වයක් තිබෙන නිසා ජනතාවත් බලාපොරොත්තු වෙනවා, එවැනි වෙලාවට මහජන නියෝජිතයෝ ඔවුන් සමඟ සම්බන්ධ වෙයි කියලා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Yes, Hon. (Dr.) Pathmanathan Sathiyalingam?

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

Hon. Speaker, we do not call for a Division today.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Okay. Hon. Minister, they are not asking for a Division.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

කෘෂිකර්මය සම්බන්ධයෙන්ම තමයි අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා කථා කළේ. නමුත් මේ විවාදය වඩාත් හරවත්වීම සඳහා මම කැමැතියි, පොඩි මතක් කිරීමක් කරන්න. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය කිව්වාම ඒකේ විෂය පථය ගොඩක් විශාලයි; කෘෂිකර්මය විෂයයට වඩා එහි විෂය පථය විශාලයි. ඒ නිසා අපේ ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාටත්, මන්ත්‍රීතුමියලාටත්, රටටත් දැනුවත්වීම සඳහා මෙන්න මේ මේ විෂයන් පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා මම යෝජනා කරනවා විවාදයේදී, හැමෝම.

එකක්, අපට තිබෙනවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. ඒ ගැන කථා කරන්න. ඒ වාගේම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව තිබෙනවා. මේවා පදනම් කරගෙන තමයි අපේ අමාත්‍යාංශයට මුදල් වෙන් වෙලා තිබෙන්නේ. ඒ වාගේම ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපනයන කෘෂිකර්මය ගැන ගොඩක් වේලාවට වාද විවාදවලදී කියැවෙන්නේම නැහැ. මොකද, පොහොර හම්බ වුණේ නැහැ වාගේ කාරණා ගැන තමයි කියැවෙන්නේ; වී මිල සම්බන්ධ කාරණා තමයි ගොඩක් වේලාවට කියැවෙන්නේ; අල ලූනු ගැන තමයි ගොඩක් වේලාවට කියැවෙන්නේ. ඒවා කියැවෙන එක හොඳයි. නමුත් මේ පැතිත් සැලකිල්ලට ගන්න. ඒ වාගේම කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව තිබෙනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉන්න පැත්තේ ඒක තිබෙන්නේ.

ඊළඟට, අපට තව ආයතන 20ක් තිබෙනවා. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය තිබෙනවා. අපේ මේ ගරු මන්ත්‍රීතුමාත් රක්ෂණය ගැන කථාවක් මේ වේලාවේත් ඉදිරිපත් කළා. ඒ වාගේම වී අලෙවි මණ්ඩලය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවත් -SLCARP එක- තිබෙනවා. ඒ වාගේම ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය - ශ්‍රී ලංකා හදබිම අධිකාරිය- තිබෙනවා. ජාතික පොහොර ලේකම් කාර්යාලය, State Fertilizer Company Limited, ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය තිබෙනවා. ඒකට ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය කියලාත් කියනවා. ඊළඟට, ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය තිබෙනවා. එය අනුරාධපුරයේ තිබෙන්නේ. ඒ වාගේම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - NLDB එක - හා ආශ්‍රිත සමාගම් තිබෙනවා. Milco (Pvt.) Limited -මිල්කෝ ආයතනය- ගත්තොත්, මේ ආයතනය මේ වෙනකොට පාඩු ලබන තත්ත්වයේ සිට ලාභ ලබන තත්ත්වයකට මේ සුළු කාලය තුළ ඒ ආයතනයේ වගකිව යුතු මහත්ම මහත්මීන් විසින් ගෙනැල්ලා තිබෙනවා.

ඊළඟට, සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටර්ප්‍රයිස් සමාගම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - LRC එක - ඒ වාගේම මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, ඉඩම් මැනුම්

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

සභාව, ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය, රීළහට, උමා ඔය, මොරගහකන්ද, කළු ගඟ, ගිං, නිල්වලා, මල්වතු ඔය ඇතුළු අනෙකුත් ප්‍රධාන වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය - CECB- හා එහි පාලිත සමාගම් වාගේම ආශ්‍රිත සමාගම් තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියත් තිබෙනවා.

**ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ඒක වහන්න යනවාද?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
නැහැ, එහෙම එකක් නැහැ. සාකච්ඡාවක් තිබෙනවා. අපි ඉල්ලීමක් කරලා තිබෙනවා, තව කාලයක් මේ ආයතනයට කාර්යභාරයක් තිබෙනවා කියලා.

ඒ වාගේම සීමාසහිත මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගම අයත් වනවා. එතැන ආයතන 20ක් තිබෙනවා. දෙපාර්තමේන්තු 10ක් තිබෙනවා. එතකොට, මේක විශාල කාර්යභාරයක් තිබෙන අමාත්‍යාංශයක්, ගරු සභාපතිතුමනි. නමුත් නිතරම සාකච්ඡා වෙන්නේ මේවායෙන් බොහොම සුළු ප්‍රමාණයක් ගැන විතරයි. අය වැයෙන් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන්නේ මේ සියල්ලම සම්බන්ධ කරගෙන. ඒ නිසා අපට අය වැය විවාදය වඩාත් හරවත් එකක් බවට පත් කර ගන්න පුළුවන්, මේ පිළිබඳ අවධානය අරගෙනම අපේ පක්ෂ, විපක්ෂ දෙපාර්ශ්වයම මේකට සම්බන්ධ වෙනවා නම්.

පොහොර සහනාධාරය පිළිබඳ මාතෘකාව මේ වෙලාවේ මතු වෙලා තිබෙන නිසා ඒ ගැනත් විශේෂයෙන්ම මම කියන්න ඕනෑ. කවුරුත් දන්නවා, මේක සාර්ථකව ක්‍රියාත්මක කරන්න නම්, ගොවි සංවිධානවල හොඳ ක්‍රියාකාරීත්වයක් අවශ්‍යයි කියන එක. ඒ වාගේම ගොවි ජනතාවගෙන් පැත්තෙන් මේ සම්බන්ධයෙන් කාර්යක්ෂම වගකීම් සහගත උනන්දුවක් අවශ්‍යයි.

ගොවි ජනතාවට වගකීමක් තිබෙනවා, ගොවි සංවිධානවලට වගකීමක් තිබෙනවා, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර - කෘපනිස - නිලධාරිතුමා කැඳවන රැස්වීමට නිසි වෙලාවට පැමිණ තමන්ගේ දත්ත ලබා දෙන්න. කන්න රැස්වීම ඉවර වෙලා ඊට පසුව එතුමා හෝ එතුමිය ගොවි ජනතාව කැඳවනවා. නමුත් කියන්න කනගාටුයි, සමහර වෙලාවට සියයට 50යි, 60යි ඒවාට සහභාගි වෙන්නේ. සැලකිය යුතු සංඛ්‍යාවක් සහභාගි වෙන්නේ නැහැ. තමන්ගේ දත්ත වෙලාවට දෙන්නේ නැහැ. මම අක්කර මෙච්චරක් කරනවා කියා හෝ අක්කර භාගයක් මට තිබෙන්නේ කියා හෝ අක්කර දෙකයි මට තිබෙන්නේ කියා ඒ දත්ත හරියට දෙන්නේ නැහැ. ඒ වාගේම account number එක පවා සමහර වෙලාවට වරද්දනවා. ගොවි මහත්තයා කියපු account number එක තමයි කෘපනිස නිලධාරිතුමා වාර්තා කරන්නේ. ඒ නිසා පොහොර සඳහා වන මුදල්, - පොහොර නොවෙයි නේ දෙන්නේ. පොහොර සඳහා මුදල් නේ දෙන්නේ- නිසි පරිදි ලබා ගන්න නම් අනිවාර්යයෙන්ම ගොවි මහත්වරුන් නිසි වේලාවට කෘපනිස නිලධාරිතුමා හෝ තුමිය පවත්වන රැස්වීමට සහභාගි වෙලා තමන්ගේ තොරතුරු ලබා දිය යුතුමයි. එසේ තොරතුරු දුන් අයගේ accountsවලට මුදල් ලැබෙනවා. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමනි, ඔබතුමාත් බොහොම පැහැදිලිවම දන්නවා ඇති, මොනරාගල දිස්ත්‍රික්කයේ සේවය කරන නිලධාරීන්ට සමහර වෙලාවට ගෙවල් ගාණේ යන්න වෙලා තිබෙන බව, අත්සන ගහගන්න, account number එක ගන්න. එහෙම යනවා, ඇත්තටම. කෘපනිස නිලධාරීන් 4,000කට ආසන්න ප්‍රමාණයකගේ පුරප්පාඩුත් තිබෙනවා. දැනට ඒ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. ඒකට උත්තර හොයන එක අපේ වගකීමක්. ඒක අපි භාර ගන්නවා. භාර ගෙන ක්‍රියාත්මක වෙනවා. එම වගකීම නිසි පරිදි ඉටු කරන්න අවශ්‍ය නිසා තමයි මේ අවධාරණය කිරීම ගොවි මහත්වරුන්ගේ පැත්තටත් කරන්නේ. ගොඩක් වෙලාවට අපි පුරුදු වෙලා තිබෙන්නේ,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, your time is over.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

කෘපනිස මැතිතුමාට-මැතිනියට, දිස්ත්‍රික් නිලධාරීන්ට, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට තමයි චෝදනාව එන්නේ. අපිටත් එනවා චෝදනාව. මොකද, රජය මෙහෙයවන්නේ අපි නිසා. භාණ්ඩාගාරයෙන්, රජයෙන් සියලු මුදල් වෙන් කර තිබෙන්නේ. කිසිම හිඟයක් නැහැ. ඒ වගකීම ඉෂ්ට කර තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ බිමේ; පහළ. අපි ගොවි ජනතාවගෙන් ඉල්ලනවා, නිසි පරිදි නිසි වේලාවට තමන්ගේ රාජකාරිය කරන්න කියලා. එහෙම ඉල්ලමින් මගේ මූලික පැහැදිලි කිරීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have 15 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[மு.ப. 10.46]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
எல்லோருக்கும் வணக்கம்!

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்தக் கார்த்திகை மாதத்தின் இன்றைய நாள் உலகமெங்கும் வாழுகின்ற தமிழ் பேசும் மக்களுக்கு ஒரு விசேடமான தினம். இதுபோன்றதொரு தினத்தில் எங்களுடைய மண்ணுக்காக மரணித்த மாவீரர் களுக்கு இந்தச் சந்தர்ப்பத்தில் சிரம் தாழ்ந்த வணக்கத்தை நான் தெரிவித்துக் கொள்கின்றேன்.

கமத்தொழில் கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சின் இன்றைய விவாதத்தில், முதலாவதாக நான் ஒரு திருக்குறளைச் சொல்லி, என்னுடைய உரையைத் தொடங்க நினைக்கின்றேன்.

"சுழன்றும்ஏர்ப் பின்னது உலகம் அதனால்
உழந்தும் உழவே தலை"

இது 1031ஆவது குறள். இதனுடைய பொருள் என்ன வென்றால், உழவுத் தொழிலைச் செய்ய முடியாமல் பிற தொழில்களைச் செய்வோர் எல்லோரையும் உழவர்களே தாங்குவதால், அவர்களே இந்த உலகுக்கு அச்சாணியாவார்கள் என்பதாகும். ஆகவே, இந்த அமைச்சு மீதான விவாதம் மிகவும் முக்கியமானது. விவசாயம், விலங்கு வேளாண்மை, நீர்ப்பாசனம், மீன்பிடி, தோட்டத் தொழிற்றுறை போன்றவை இந்த நாட்டு மக்களின் வாழ்வாதாரம் என்பதற்கப்பால், எங்களுடைய மக்களின் பாரம்பரிய கலாசாரம் மற்றும் வாழ்க்கை முறையோடு தொடர்புடைய முக்கியமான தொழில்கள். அந்த வகையில் இத்தொழிற்றுறைகள் வருமானம் ஈட்டுவதற்கானவை என்று மாத்திரமல்லாமல், இவை எமது கலாசாரமாகப் பார்க்கப்படுகின்றது. எங்களுடைய நாட்டின் மக்கள் தொகையில் கிட்டத்தட்ட 30 சதவீதமானவர்கள் விவசாயிகளாக இருக்கிறார்கள். அப்படியிருந்தும் எங்களுடைய மொத்தத் தேசிய உற்பத்தியிலே இந்த 30 சதவீதமான விவசாயிகள் 7 தொடக்கம் 8 சதவீதமான பங்களிப்பையே வழங்குவதாகப் புள்ளிவிபரம் சொல்லுகிறது. ஆகவேதான் இன்றும் வெளிநாடுகளிலிருந்து உணவுப் பொருட்களை இறக்குமதி செய்யவேண்டிய ஒரு சூழல் எங்களுக்கு ஏற்பட்டிருக்கின்றது. அந்த வகையிலே, இந்தப் பாதீடு மிகவும் முக்கியமானது. இந்தப் பாதீட்டிலே குறிப்பிடப்பட்ட சில முக்கியமான விடயங்களை முதலில் சுட்டிக்காட்டி, தொடர்ந்து பேசலாம் என்று நினைக்கின்றேன்.

விவசாய உற்பத்திப் பொருட்களைப் பதப்படுத்தல், சேமித்து வைத்தல், சந்தை வாய்ப்பை அதிகரித்தல் என்ற விடயத் தலைப்புகளின்கீழ் இந்த அமைச்சுக்கு 4 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கிறது. இது மிகவும் நல்ல விடயம்! எங்களுடைய வவுனியாவிலே திறந்து வைக்கப்பட்டிருக்கின்ற பொருளாதார மத்திய நிலையத்திலே இதே தேவைக்காகக் குளிரூட்டிய அறைகளுக்கான வசதிகளை ஏற்படுத்தித் தரவேண்டும் என்று நான் கேட்டிருந்தது கௌரவ அமைச்சர் அவர்களுக்கு ஞாபகமிருக்கும். அவர் தன்னுடைய அமைச்சின் கீழ் இந்த விடயம் இல்லாவிட்டாலும், கூட்டுறவு அபிவிருத்தி அமைச்சரோடு பேசி இதைச் செய்வதாக உறுதியளித்திருந்தார். அதை அவர் செய்வாரென நம்புகிறேன்.

கௌரவ அமைச்சர் அவர்களே, கிவுல்ஓயா திட்டத்திற்காக 2,500 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டிருக்கிறது. இந்தக் கிவுல்ஓயா திட்டம் நடைமுறைப்படுத்தப்படும்போது, அந்தப் பிரதேசத்திலே வாழுகின்ற பூர்வீகத் தமிழ் மக்களுடைய குளங்களும் காணிகளும் நீரேந்து பகுதிக்குள் செல்லக்கூடிய நிலை இருப்பதாக ஓர் அச்சம் இருக்கின்றது; அப்படிச் செல்லும் என்றுதான் நானும் நினைக்கின்றேன். அந்த வகையிலே, அம்மக்கள் இந்தக் கிவுல்ஓயா திட்டத்துக்குப் பாரிய எதிர்ப்பைத் தெரிவிக்கின்றார்கள். ஏனென்றால், கடந்த காலத்திலே மாறிமாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்கள் இனவாத நோக்கத்தோடு, எங்களுடைய மாகாணத்துக்கே தொடர்பில்லாத மக்களை வேறிடங்களிலிருந்து கொண்டுவந்து அங்கு குடியேற்றியிருந்ததன் அடிப்படையில், அந்த மக்களுக்கான ஒரு வாழ்வாதாரத்தை உண்டாக்குவதற்காகத் தான் இந்தக் கிவுல்ஓயா திட்டம் கொண்டுவரப் பட்டிருக்கின்றது. எனவே, அங்கே பூர்வீகமாக வாழுகின்ற மக்களுக்குப் பாதிப்பை ஏற்படுத்தி, கிவுல்ஓயா திட்டத்தை நடைமுறைப்படுத்துவது ஒரு புதிய பிரச்சினையை உண்டு பண்ணும். இந்தத் திட்டம் தொடர்பாகக் கடந்த காலங்களிலே வெளிப்படைத்தன்மை இருக்கவில்லை. ஆகவே, நீங்கள் இந்தத் திட்டத்தோடு சம்பந்தப்பட்டவர்களை அழைத்து, வெளிப்படைத்தன்மையோடு ஒரு கலந்தாலோசனையை நடாத்தி, அதனை முன்கொண்டு செல்வது தொடர்பாக நடவடிக்கை எடுக்க வேண்டும் என்று உங்களை மிகவும் தயவாகக் கேட்டுக் கொள்கின்றேன். இதனால் தேவையில்லாத பிரச்சினைகளை உண்டு பண்ணக்கூடாது என்றொரு நோக்கத்திற்காகத்தான் நான் உங்களிடம் மிகவும் அன்பாக இதைக் கூற விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, பால் உற்பத்தி தொடர்பாக உங்களுடைய அறிக்கையிலும் நாட்டினுடைய சனாதிபதி அவர்களுடைய உரையிலும் குறிப்பிடப்பட்டிருக்கின்றது. அதாவது, இப்போது இந்த நாட்டினுடைய பாலுக்கான மொத்தத் தேவையிலே 40 சதவீதமான பால் உற்பத்திதான் எங்களுடைய நாட்டினுள் நடைபெறுகின்றது எனவும், 2030ஆம் ஆண்டளவிலே உங்களுடைய அரசாங்கம் அதில் 70-80 சதவீதத்தை உள்நாட்டில் உற்பத்தி செய்யக்கூடிய வேலைத்திட்டத்தை முன்னெடுக்க இருப்பதாகவும் குறிப்பிடப்பட்டிருக்கின்றது. அதுவும் மிகவும் நல்ல விடயம்! ஏனென்று சொன்னால், எங்களுடைய நாட்டின் பெருந் தொகையான அந்நியச் செலாவணி பால்மா இறக்குமதிக்காகச் செலவிடப்படுகிறது; அதைத் தடுக்கலாம். அதேவேளை, எங்களுடைய உற்பத்தியாளர்களுடைய பொருளாதாரத்தையும் உங்களுடைய இந்தத் திட்டங்களினூடாக மேம்படுத்தக் கூடியதாக இருக்கும். கௌரவ அமைச்சர் அவர்களே, பால் உற்பத்தியை நாட்டில் அதிகரிக்க வேண்டுமாக இருந்தால், உங்களுடைய இந்தத் திட்டத்தைக் குறிப்பிட்ட பகுதிகளில் மாத்திரம் செயற்படுத்தாமல், நாட்டின் அனைத்துப் பகுதி களுக்கும் அதனை விரிவுபடுத்த வேண்டும் என்றும் கேட்டுக் கொள்கின்றேன்.

அதுமாத்திரமில்லாமல், அனைத்து மிருக வைத்தியர் பிரிவுகளிலும் சிறிய மற்றும் நடுத்தரக் கால்நடை வளர்ப் பாளர்களை ஊக்குவிக்கக்கூடிய வசதி வாய்ப்புகளைத் தயவுசெய்து ஏற்படுத்துங்கள்! எங்களுடைய மிருக வைத்திய நிலையங்களிலே பெருமளவான மனித வள மற்றும் பௌதிக வளக் குறைபாடுகள் - தட்டுப்பாடுகள் - இருக்கின்றன. எங்களுடைய கால்நடை மருத்துவர்களுக்குப் போதிய போக்குவரத்து வசதிகள் இல்லை. அவர்கள் காடு மேடெல்லாம் செல்கின்றவர்கள்; அவர்களுக்கு நல்ல நிலையிலுள்ள வாகனங்கள் இதுவரை வழங்கப்படவில்லை. கால்நடை மருத்துவர்களுக்கு மாத்திரமல்ல, அங்கே வேலைசெய்கின்ற ஏனைய களப் பணியாளர்களுக்கும் அவ்வாறான ஓர் இடர் நிலை காணப்படுகின்றது. தயவுசெய்து அந்த வசதியை நீங்கள் ஏற்படுத்திக் கொடுக்க வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, இப்போது எங்களுடைய மிருக வைத்திய நிலையங்களிலே கால்நடைகளுக்கான மருந்துகள் இல்லை. மிருக வைத்தியர்கள் மருத்துவ ஆலோசனையை வழங்குகின்றார்கள்; கால்நடை வளர்ப்பாளர் அந்த மருந்துகளைப் பெரிய தொகை கொடுத்து வாங்க வேண்டிய தேவையிருக்கின்றது. ஆகவே, மிகவும் அவசியமான, அடிப்படையான மருந்துகளையேனும் மிருக வைத்திய நிலையங்களுக்கு வழங்குவதற்கு நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும்.

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய நாட்டிலே பால் மற்றும் இறைச்சிக்கான விலை நிர்ணயிக்கப் பட்டிருந்தாலும் அந்த நிர்ணய விலை என்பது பெரும்பாலும் நடைமுறையில் இல்லையென்பதையும் இந்தச் சந்தர்ப்பத்திலே நான் உங்களுக்குச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதை நடைமுறைக்குக் கொண்டு வாருங்கள்!

வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையிலே, எங்களு டைய பிரதேசங்களிலே, பாரிய நீர்ப்பாசனத் திட்டங்கள் இல்லை; சிறு குளங்கள், சிறிய நீர்ப்பாசனத் திட்டங்கள்தான் இருக்கின்றன. நீங்கள் சிறிய நீர்ப்பாசனத் திட்டங்களுக்கு நிதி ஒதுக்கியிருந்தாலும் எங்களுடைய பிரதேசங்களில் இருக்கின்ற சிறிய நீர்ப்பாசனத் திட்டங்களை அபிவிருத்தி செய்வதற்கு இந்த நிதி போதாமலிருக்கும் என்று நான் நம்புகின்றேன். எங்களுடைய வவுனியா மாவட்டத்திலே மாத்திரம் 854 குளங்கள் இருக்கின்றன. அதிலே 600 குளங்கள் இப்போது செய்கை பண்ணுவதற்குப் பயன்படுத்தப்படுகின்றது. ஆனால், இந்தக் குளங்கள் நீண்டகாலமாகப் புனரமைக்கப்படவில்லை. வவுனியா மாவட்டத்தில் மாத்திரம் கடந்த சில வருடங்களுக்கு முன் ஏற்பட்ட வெள்ள நிலைமையால் பழுதடைந்த 150 குளங்கள் இருக்கின்றன. அவற்றைத் திருத்துவதற்கு 4,500 மில்லியன் ரூபாய் மதிப்பீடு - estimate - செய்யப் பட்டிருக்கின்றது. அந்த நிதியை முழுமையாக இப்போது கொடுக்க முடியாதுவிட்டாலும் இந்த 150 குளங்களில் படிப்படியாக ஒவ்வோர் ஆண்டும் குறிப்பிட்ட எண்ணிக்கை யான முக்கியமான குளங்களைத் தெரிவுசெய்து அவற்றைப் புனரமைப்பதன் ஊடாக இந்த நாட்டினுடைய தேசிய உற்பத்திக்கு எங்களுடைய மாவட்ட மக்களின் பங்களிப்பு அதிகரிக்கும் என்பதை இந்தச் சந்தர்ப்பத்திலே உங்களுக்கு நான் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய மாவட் டத்திலே கைவிடப்பட்ட நிறையக் குளங்கள் காடுகளுக்குள் இருக்கின்றன. அவற்றின்மூலம் பயன்பெறக்கூடிய நிறைய வயல்வெளிகள் இருக்கின்றன. அவற்றைப் புனரமைத்து எங்களுடைய மாவட்டத்திலேயிருக்கின்ற வயல் காணிகளற்ற மக்களுக்கு வழங்குவதனூடாக மக்கள் பயன்பெறுவார்கள்; தன்னிறைவடைவார்கள். அத்தோடு, இந்த நாட்டின் மொத்த உற்பத்திக்கும் அவர்கள் பங்களிப்புச் செய்வார்கள். அதை உணர்த்தும் வகையில் நான் ஒரு திருக்குறளைச் சொல்ல விரும்புகின்றேன்.

“இரவார் இரப்பார்க்கொன்று ஈவர் கரவாது

கைசெய்தூண் மாலை யவர்”

கௌரவ அமைச்சர் அவர்களே, தம்முடைய கையால் உழுதுண்ணும் இயல்பை உடையவர்கள் பிறரிடம் பிச்சை கேட்க மாட்டார்கள். தம்மிடம் கேட்டு வந்தவர்களுக்கு இல்லையென்றும் சொல்ல மாட்டார்கள் என்ற கருத்து இந்தக் குறளில் சொல்லப்பட்டிருக்கின்றது. ஆகவே, காணியற்ற மக்கள் பிச்சை கேட்காத நிலைமையையும், இல்லையென்று வருபவர்களுக்குக் கொடுக்கின்ற நிலையையும் உங்களால் ஏற்படுத்த முடியும். எனவே, நீங்கள் இந்தக் காணியற்ற மக்களுக்குக் காணிகளை வழங்கி, இந்தப் பாழடைந்த குளங்களையும் திருத்திக் கொடுக்க வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே நான் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, சிறிய குளங்களைப் பரிபாலனம் செய்யும் கமநல அபிவிருத்தித் திணைக்களத்திலே - Department of Agrarian Development - தொழில்நுட்ப உத்தியோகத்தர் பணியிடங்கள் பல காலியாக இருக்கின்றன. எங்களுடைய வவுனியா மாவட்டத்தில் மாத்திரம் 209 அனுமதிக்கப்பட்ட ஆளணி இருந்தாலும் 119 பேர்தான் கடமை புரிகிறார்கள்; கிட்டத்தட்ட 45 சதவீதம் வெற்றிடமாக இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, ஒரு விவசாய மாவட்டத்திலே அந்தப் பணியில் ஈடுபடுகின்ற 45 சதவீதமான ஊழியர்கள் இல்லையென்றால் விவசாயத்தை எங்களால் முன்னேற்ற முடியாது. ஆகவே, அதிலே கூடிய கவனத்தை நீங்கள் செலுத்த வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். அதுபோல், ACAD தொடக்கம் விவசாய ஆராய்ச்சி உற்பத்தி உதவியாளர்கள் வரை எங்களுடைய மாவட்டத்திலே நிறைய வெற்றிடங்கள் இருக்கின்றன; மன்னார், முல்லைத்தீவிலும் இதே நிலைமை காணப்படுகின்றது. அதேபோல எங்களுடைய மாவட்டத்திலே குருக்கள் புதுக்குளம் என்ற இடத்திலே கடந்த சில வருடங்களுக்கு முதல் ஆரம்பிக்கப்பட்டிருக்கின்ற புதிய கமநல சேவை நிலையம் RDS buildingஇல் தற்காலிகமாக மிகவும் கஷ்டத்தின் மத்தியிலே இயங்குகிறது. ஆகவே, தயவுசெய்து இந்த வரவு செலவுத்திட்டத்திலிருந்து அதற்கான ஒரு புதிய கட்டிடத்தைக் கட்டுவதற்கு உங்களுடைய அமைச்சின் ஊடாக நிதியை ஒதுக்க வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய மாவட் டத்திலே 9 கமநல சேவைத் திணைக்களங்கள் - APC - இருக்கின்றன. அதிலே முக்கியமான ஓமந்தை மற்றும் பம்பைமடு கமநல சேவைத் திணைக்களத்தின் கீழ் 18,000 ஹெக்டயர் வயல் நிலங்கள் இருக்கின்றன. அவற்றினூடாகச் சேவை வழங்குவதில் அவர்களுக்குப் பாரிய இடர்பாடு இருக்கின்றது. ஆகவே, இந்த இரண்டு கமநல சேவைகள் நிலையங்களையும் மூன்றாகப் பிரித்து, அங்குள்ள ஈச்சங்குளம் என்ற பிரதேசத்தில் புதிய APCஐத் தொடங்க வேண்டுமென நான் ஓர் ஆலோசனையை முன்வைக்கின்றேன். அதேவேளை, அங்குள்ள பல சிறு நீர்ப்பாசனக் குளங்களைப் பெரு நீர்ப் பாசனக் குளங்களாக மாற்றுவதற்குரிய வசதி இருக்கின்றது. தயவுசெய்து அவற்றை உங்களுடைய கவனத்தில் எடுத்துக் கொள்ளுங்கள்!

அடுத்து, எங்களுடைய வவுனியா மாவட்டம் தொடர்பில் சில கோரிக்கைகளை இங்கே முன்வைக்கிறேன். நான் ஏற்கெனவே இது தொடர்பில் இங்கே பேசியிருக்கிறேன். பேராறு குடிநீர் வழங்கல் திட்டத்துக்காக 165 ஏக்கர் வயற்காணிகளும் 35 ஏக்கர் மேட்டுநிலக் காணிகளும் அரசாங்கத்தால் கையகப்படுத்தப்பட்டு, மாற்றுக் காணிகளும் வழங்கப்பட்டன. கௌரவ அமைச்சர் அவர்களே, இது நடைபெற்று 11 வருடங்கள் நிறைவடைந்துள்ள நிலையில் இன்றுவரை அவர்களுடைய காணிக்கான ஆவணங்கள் கொடுக்கப்படவில்லை. காணிக்கான ஆவணங்களை வழங்குவதற்கு அமைச்சரவை அங்கீகாரம் கொடுத்திருந்தும் நடவடிக்கை எதுவும் எடுக்கப்படவில்லை. அதுபோல், செட்டிகுளம் பிரதேச செயலாளர் பிரிவிலுள்ள முசல்குத்தி என்ற கிராமத்தில் 1977ஆம் ஆண்டு குடியேறிய 250 குடும்பங்களைச் சேர்ந்தவர்கள் இந்த நாட்டிலே இருந்த போர்ச் சூழல் காரணமாக 1983-1990ஆம் ஆண்டு காலப்பகுதியில் இந்தியாவுக்கும் வேறு இடங்களுக்கும் இடம்பெயர்ந்து, தற்போது மீள்குடியேறி இருக்கிறார்கள். அவர்களுக்கு குழந்தைகள் கிடைத்து உப குடும்பங்கள் இருக்கின்றன. அந்தக் குடும்பங்களுக்குக் காணியை வழங்குவதற்கு நில அளவைத் திணைக்களம் அளவீடு செய்து கொடுத்திருந்தாலும், இன்னும் அந்தக் காணிகள் வழங்கப்படவில்லை என்பதை

உங்களுக்கு நினைவுபடுத்த விரும்புகிறேன். தயவுசெய்து இதற்குரிய நடவடிக்கையை எடுங்கள்!

அதேபோல, முல்லைத்தீவு மாவட்டத்தில் 31 குளங்களும், 973 விவசாயிகளுக்குச் சொந்தமான 3,371 ஏக்கர் நீர்ப்பாசன காணிகளும் வனவளத் திணைக்களத்தினால் கையகப்படுத்தப் பட்டுள்ளது. தயவுசெய்து, இந்த 3,371 ஏக்கர் காணியையும் வனவளத் திணைக்களத்திடமிருந்து விடுவித்து, ஆவணங் களோடு இருக்கின்ற அந்த மக்களுக்கு மீண்டும் கையளிக்க நடவடிக்கை எடுங்கள்! இது தொடர்பில் DCC Meetingஇல் பல தடவை கதைத்தும் எதுவும் நடக்கவில்லை. நான் சொன்ன குறைபாடுகளுக்கு மேலதிகமாக அவர்களுக்கும் அதே பிரச்சினைகள் இருக்கின்றன.

அதேபோல, புளியமுனை என்ற கிராமத்தில் 226 விவசாயி களுக்குச் சொந்தமான 700 ஏக்கர் மேட்டுநிலப் பயிர்ச் செய்கைக்கான நிலம் இருக்கின்றது.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
ஒரு நிமிடம் தாருங்கள்!

விவசாயிகள் அங்கு செல்லக்கூடிய நிலைமை இருந்தாலும் யானைகளின் அச்சுறுத்தல் பெரும் பிரச்சினையாக இருக்கின்றது. ஆகவே, யானை வேலி, நீர்ப்பாசனத்துக்கான பொதுக் கிணறு போன்றவற்றை அங்கு அமைத்துக் கொடுப்பீர்களானால், அந்த விவசாயிகள் அந்தக் காணியில் கடலை, வெங்காயம் போன்ற பயிர்களைச் செய்கை பண்ணு வார்கள். அதுபோல், உங்களுடைய வடக்கு மாகாண தெங்கு உற்பத்திச் செயற்பாட்டினுள் சிறு தெங்கு விவசாயிகளையும் உள்ளீர்க்குமாறு நான் இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கிறேன்.

வவுனியா, மன்னார், முல்லைத்தீவு ஆகிய மாவட்டங்களில் நோய்த் தாக்கம், உர மானியம் உரிய நேரத்தில் கிடைக்காமை, நெல்லுக்கான உத்தரவாத விலை கிடைக்காமை போன்ற பல விடயங்களால் நெல் உற்பத்தி பாரிய சவால்களுக்கு முகங்கொடுத்திருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, அந்த விடயத்தில் நீங்கள் கவனம் செலுத்த வேண்டுமென இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கிறேன்.

அத்தோடு, 'பிம்சவிய' காணி உரித்து நிகழ்ச்சித் திட்டத்திற்காக நிதி ஒதுக்கீடு செய்திருக்கிறீர்கள்; அது நல்ல விடயம். கடந்த அரசாங்கத்தால் அறிமுகப்படுத்தப்பட்ட 'உறுமய' என்ற காணி உரித்து வழங்கல் திட்டம் தற்போது நிறுத்தப்பட்டுள்ளது. தயவுசெய்து உங்களுடைய அரசாங்கத்தில் அதைத் தொடருங்கள்! காணி ஆவணம் இல்லாத மக்களுக்கு அதைக் கொடுக்க வேண்டும். ஏனென்றால், அனைத்து விடயங்களுக்கும் காணி ஆவணங்கள் கேட்கப்படுகின்றது. ஆகையால், மீண்டும் அந்தத் திட்டத்தைச் செயற்படுத்தும்படி இச்சந்தர்ப்பத்தில் கேட்டு, மேலதிக நேரம் வழங்கியமைக்கும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ගයන්ත කරුණාතිලක විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.03]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඉතාම වැදගත් හාරදූර අමාත්‍යාංශ කිහිපයක් පිළිබඳව කථා කරන මේ වෙලාවේ මම කැමැතියි, පළමුවෙන්ම කෘෂි කර්මාන්තය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න. අද වනකොට කෘෂිකර්මය ගොවියාට කරුමයක් වෙලා තිබෙනවා. ඒකට ප්‍රධාන හේතු කිහිපයක් තිබෙනවා. මම දකින ප්‍රධානම හේතුවක් තමයි, පසුගිය රජය කාලයේ ගත් අමනෝඥ තීන්දු. රසායනික පොහොර තහනම් කරලා කාබනික පොහොර ගෙනාපු නාඩගමේ විපාක නිසා අදටත් අපේ ගොවි ජනතාවත්, සමස්ත රටත් විඳවනවා. ඒ ගත්ත අමනෝඥ, අදූරදර්ශී තීරණය නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පෙරදිග ධාන්‍යාගාරය බවට පත්ව තිබූ අපේ රටේ ධාන්‍යාගාරයත්, භාණ්ඩාගාරයත් දෙකම හිස් වුණා. අපේ ජනතාව හිතුවා, පසුගිය මැතිවරණයෙන් පස්සේ අපේ රටේ ගොවිතැනට, කෘෂි කර්මාන්තයට හොඳ කලදවසක් උදා වෙයි කියලා. මොකද, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවේ හිටපු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යවරයා වාගේම ගොවි ජනපදයකින් බිහි වෙච්ච නායකයෙක් රටේ ජනාධිපති වුණාම රටේ කෘෂි කර්මාන්තයට නව ජවයක් ලැබෙයි කියලා තමයි මිනිස්සු හිතාගෙන හිටියේ.

ඒත් මේ වන විට ක්‍රියාත්මක වෙන්නේ වැටට තියලා අමුඩේ ගහපු කෘෂිකර්ම ප්‍රතිපත්තියක්. වැටට තියලා අමුඩේ ගැහුවාම ඉස්සරහට යන්න බැහැ. ඒක නිසා ඉදිරියට යෑමක් නැහැ, ගරු ඇමතිතුමනි. කෘෂි කර්මාන්තයේ අර්බුද එහෙමම තිබෙනවා. මුල් කාලයේ සහල් හිඟයක් ආවා. ඒකෙන් මිනිස්සු දුක් වින්දා. පොහොර කලට වෙලාවට ලැබෙන්නේ නැති ප්‍රශ්නය දිගටම තිබෙනවා. අල, ලූනු ගොවීන්ගේ අස්වැන්න විකුණා ගන්න නොහැකිව ගොවි ජනතාවට ගැටලු රාශියක් අද වෙනකොටත් ගොඩගැහිලා තිබෙනවා. එළවලු ගොවියාට නිසි මිලක් නොමැතිවීම, පසුඅස්වනු හානිය, වගාවලට වන සතුන්ගෙන් වන හානිය, කෘෂි රක්ෂණ ක්‍රමයේ මන්දගාමීත්වය වාගේ ප්‍රශ්න මේ ක්ෂේත්‍රයේ අනන්තවත් දකිනවා. මේ ආණ්ඩුව ආපු ගමන්ම රටේ සහල් හිඟයක් ඇති වුණා. කවදාවත් නැති විධියට රතු කැකුළු සහල්වලට රටේ තැන් තැන්වල දිග පෝලිම් ආවා. "හැප්පිලා බලමු" තියරිය අනුගමනය කරන ජනාධිපතිතුමා අන්තිමට මෝල්හිමියෝ ගෙන්වලා මේසයට හයියෙන් තට්ටුවක් දාලා, රුපියල් 10කින් සහල් කිලෝග්‍රෑම් එකක් වැඩි කරලා මෝල්හිමියෝ සනසන හැටිත් අපට දකින්න සිදු වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියටත් මතක ඇති, එතුමා විපක්ෂයේ ඉන්නකොට කිව්වා, "රටින් සහල් ගෙන්වන්න නම් ආණ්ඩුවක් මොකටද" කියලා. අපේ මහ ලේකම්තුමා සඳහන් කළා වාගේ, එතුමා කිව්වා, "පිටකොටුවේ මුදලාලි කෙනෙකුටත් පුළුවන් ඕක කරන්න." කියලා. සහල් ඇටයක්වත් පිට රටින් ගෙන්වන්නේ නැහැ කියලා තමයි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වුණේ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සහල් පිට රටින් ගෙන්වනවා විතරක් නොවෙයි, ඒ ගෙන්වන සෑම සහල් කිලෝග්‍රෑම් එකකටම රුපියල් 65ක විතර අසීමිත බද්දක් පාරිභෝගිකයා පිට පැටෙව්වා.

2024 අවුරුද්දේ තත්ත්වය බැලුවොත්, දේශීය කෘෂි කර්මාන්තය රැක ගන්නවා කියලා බලයට ආපු මේ ආණ්ඩුව, පසුගිය අවුරුද්දේ රුපියල් බිලියන ගණනක පරිභෝජන භාණ්ඩ සහ ආහාර ද්‍රව්‍ය ගෙන්වීමට මුදල් වැය කර තිබෙනවා. රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් ආහාර ද්‍රව්‍ය ආනයනයට 2024 අවුරුද්දේ රුපියල් බිලියන 1,045ක් මේ ආණ්ඩුව වැය කර තිබෙනවා. ඒ අනුව අපේ රටේ කෘෂි කර්මාන්තය යන්නේ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

කොහේටද කියලා අපට දැන් හිතා ගන්න පුළුවන්. දේශීය කෘෂි කර්මාන්තය නඟා සිටුවනවා කියලා ආපු ආණ්ඩුව, දේශීයව නිෂ්පාදනය කරන්න පුළුවන් ආහාර ද්‍රව්‍ය පවා පිට රටින් ගෙන්වන්න ප්‍රමුඛතාවක් දෙන බවක් තමයි අපට පැහැදිලිවම පෙනෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් පමණ වෙසෙන්නේ ආසියානු කලාපයේ රටවල. ඒ කලාපයේ වී ගොවිතැන තමයි හුඟක් ප්‍රචලිත වෙලා තිබෙන්නේ. ශ්‍රී ලංකාවේ යැපුම් කෘෂි කර්මාන්තය වාගේම ආහාර භෝග වගාවෙහි ප්‍රධානතම භෝගය වී කියලා අපි කවුරුත් දන්නවා. අද වන විට ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම පාහේ අඩු වැඩි වශයෙන් වී වගා කරනවා. නමුත්, රටට බත සපයන වී ගොවියා මේ වන විට මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් තමයි අස්වැන්නට නිසි මිලක් නොලැබීම. වී කිලෝග්‍රෑම් එකක් විකුණුවාට පස්සේ මොනවාද ගන්න පුළුවන් කියලා මිනිස්සු කල්පනා කරනවා. ඒ සඳහා රජයෙන් ලබා දෙන සහතික මිල ප්‍රමාණවත් නැහැ කියන මැසිවිල්ල ගොවි ජනතාව ඉන්න හැම ප්‍රදේශයකින්ම අපට අහන්න ලැබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2024-2025 මහ කන්නයේ වී මිලදී ගැනීමට රජය රුපියල් මිලියන 500ක් වෙන් කළා. වී මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක් මිලදී ගන්නවාය කියලා තමයි ඒ මුදල් ප්‍රමාණය වෙන් කළේ. නමුත් මිලදී ගන්න හැකි වුණේ, අපේක්ෂිත ප්‍රමාණයෙන් දශමයක් වාගේ ප්‍රමාණයක්. 2025 යල කන්නයේ මෙට්‍රික්ටොන් 5,000ක් මිලදී ගන්නවාය කිව්වත් මිලදී ගන්න හැකි වුණේ සියයට 20ක් වාගේ සුළු ප්‍රමාණයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වී වගාවට මුලින්ම යොදන මඩ පොහොර ප්‍රමාදය ගැන කන්න රැස්වීම්වලදී දිගින් දිගටම කියැවෙනවා අපි දැක්කා. ඒ නිසා රට පුරා ප්‍රමාදයකින් තොරව පොහොර ලබා දීමට කටයුතු කරන්නය කියන ඉල්ලීම අපට හැම තිස්සේම විපක්ෂය හැටියට ආණ්ඩුවෙන් කරන්න සිද්ධ වෙනවා. මීට පෙරත් ගොවීන්ගේ පොහොර සහනාධාරය ප්‍රමාද වුණා. අවශ්‍ය වෙලාවට පොහොර නොලැබුණොත් ඒක අස්වැන්නට බලපාන බව අපි කවුරුත් දන්නවා. ඒ ගැන ආණ්ඩුවේ අවධානය අනිවාර්යයෙන්ම යොමු කරන්න කියන ඉල්ලීම අපි දිගින් දිගටම කරනවා.

ඊළඟට, මේ ආණ්ඩුව බලයට ආපු ගමන්ම සද්දෙ දාගෙන කරපු දෙවැනි වැඩේ තමයි රිළා සංගණනය. මද්දුම බණ්ඩාර මැතිතුමාත් ඒ ගැන කථා කළා. විශාල වියදමක් දරලා කරපු සංගණනයෙන් පස්සේ නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාවේදී කිව්වා, ඒකෙන් සියයට 50ක් අසාර්ථකයි කියලා. ඒ සංගණනයේ වාර්තාවත් එළියට දමන්න තවම ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා. ඒ සංගණනයෙන් වන සතුන්ගෙන් වගාවට සිදු වන හානිය අවම කර ගන්න තඹ දොයිතුවක ප්‍රයෝජනයක් වුණාද කියලා අපට අහන්න සිද්ධ වෙනවා. එච්චර වියදම් කරලා, එච්චර සද්දෙ දමලා ලොකුවට කරපු සංගණනයෙන් මොකක්ද වෙච්ච ප්‍රයෝජනය කියලා අපි අහන්න කැමැතියි.

දැන් ඔබතුමන්ලා 76 වසරක ශාපයක් ගැන හැම වෙලාවේම කථා කරනවා. 76 වසරක ශාපය ගැන තමයි මේ සභාවේ නිතරම ඇහෙන්නේ. හුඟක් අය කථාව පටන් ගන්නේම ඒකෙන්. නමුත් හෙළ රජ දවසෙන් පස්සේ අපේ රට ගොවි බිමක් බවට පත් කරන්න අපේ පැරණි නායකයන් ඒ ඒ යුගවලදී කටයුතු කළ බව නම් අපි මතක් කළ යුතුවම තිබෙනවා. අපි බැලුවොත් ජාතියේ පියා, මහාමාන්‍ය ඩී.එස්. සේනානායක ශ්‍රීමතාණන් 19**33දී ඉඩම් සංවර්ධන ආඥා පනත** රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරලා, රජරට ගොවි ජනපද නිර්මාණය කිරීමට පදනම දමපු බව අපට කවදාවත් අමතක වෙන්නේ නැහැ. ඒ අනුව මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කරලා, ගොඩින් අක්කර 2යි මඩින් අක්කර 5යි ගණනේ අක්කර 2,000ක් බෙදා දුන් හැටි අපට මතකයි. ඊට පස්සේ ඇලහැර, රිදී බැඳි ඇල්ල, තබ්බෝව වැනි ප්‍රදේශවලවල ගොවි ජනපද ආරම්භ කළා. "බත් දුන් පියා" යන විරුදාවලිය ලත් ඩී.එස්. සේනානායක යුගයේදී ආරම්භ කරපු ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය අමතක කරලා සංවර්ධනය ගැන කථා කරන්නේ කොහොමද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊට අමතරව කියනවා නම් ලංකාවේ බලයට පත් වෙච්ච ආණ්ඩුවක් විසින් රටේ ආර්ථිකය නඟාසිටුවීම පිණිස ආරම්භ කළ විශාලතම සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කළේ, ජේ.ආර්. ජයවර්ධන යුගයේදී. අවුරුදු 30කින් නිම කරන්න තිබුණු මහවැලි යෝජනා ක්‍රමය කඩිනම් කරලා අවුරුදු 6කින් අවසන් කළා. වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ, කොත්මලේ, උල්හිටිය, රත්කිඳ හා මාදුරුඔය වැනි සප්ත මහා ජලාශ ඉදි කරලා කෘෂිකර්මාන්තයත්, රටත් සංවර්ධනය කිරීමට පියවර ගත්ත බව අවුරුදු 76ක ශාපය ගැන කථා කරන උදවිය ඉදිරියේ මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම කෘෂිකර්මාන්තය පිළිබඳව කථා කරනකොට තවත් යමක් කියන්න මම කැමැතියි. පසුගිය අවුරුද්ද වෙනකොට කෘෂිකර්මාන්තයෙන් දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය සියයට 5ක් දක්වා පහත බැහැලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ වාගේම 2023 අවුරුද්දේදී 147,000ක පමණ පිරිසක් කෘෂිකර්මාන්තයෙන් ඈත් වෙලා තිබෙනවා. වී වගා කරන බිම් ප්‍රමාණය සියයට 10කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම අද වෙනකොට කෘෂිකර්මාන්තයේ පළපුරුදු ශ්‍රමිකයන්ගේ විශාල හිඟයක් තිබෙනවා. මේ තත්ත්වය කෘෂිකර්මාන්තයේ අනාගතයට විශාල අර්බුදයක් වෙන්න පුළුවන් බව අපි කවුරුත් පිළිගත යුතුව තිබෙනවා. ඒ නිසා කෘෂිකර්මාන්තයේ නවීකරණය පිළිබඳවත් වැඩි අවධානයක් යොමු කරන්න, ආහාර සුරක්ෂිතතාව තහවුරු කරන්න වැඩි බරක් දීලා කටයුතු කරන්නය කියන ඉල්ලීම් අපි දිගින් දිගටම කරනවා.

අපේ ඇමතිතුමා කිව්වා, කුරුඳු වගාව අයිති එතුමාගේ අමාත්‍යාංශයට කියලා. ඇත්ත වශයෙන්ම මම ඒක දැන ගත්තේ ඒ වෙලාවේ. මගේ ඔළුවේ තිබුණේ ඒක වැවිලි අමාත්‍යාංශයට අයිති එකක් කියලා. ඒ නිසා, *[බාධා කිරීමක්]* ඔව්, අලුතෙන් එකතු වුණේ. මම හෙට තමයි කුරුඳු ගැන ටිකක් කථා කරන්න හිටියේ, ගරු ඇමතිතුමනි. ඔබතුමා කිව්වා වාගේ අපේ දිස්ත්‍රික්කයට හුඟක්ම බලපානවා, කුරුඳු වගාව. මම හිතන විධියට ලංකාවේ වැඩිම කුරුඳු වගාව තිබෙන්නේ, අපේ ගාලු දිස්ත්‍රික්කයේ. ඒ වාගේම අම්බලන්ගොඩ, මීටියාගොඩ, බටපොළ, කරන්දෙනිය, ඌරගහ, බලපිටිය, කොස්ගොඩ, ඉඳුරුව, ඇල්පිටිය ඇතුළු ප්‍රදේශ ගණනාවකත් කුරුඳු වගාව ව්‍යාප්ත වෙලා තිබෙනවා.

ඉතින්, කුරුඳුවල තත්ත්වය ගැන කථා කරනකොට සුළු අපනයන භෝගවලින් වැඩිම ආදායමක් ලැබෙන්නේ Ceylon cinnamonවලට බව අපි දන්නවා. ලෝක වෙළඳ පොළෙන් සියයට 85ක පංගුවක් අපේ කුරුඳුවලට හිමි වෙලා තිබෙනවා. 2015දී යහ පාලන රජය මේ රට භාර ගන්නකොට රුපියල් බිලියන 17.9ක ආදායමක් ලබපු කුරුඳු කර්මාන්තය, 2018 වනකොට ආදායම රුපියල් බිලියන 34.8 දක්වා වර්ධනය කර ගත්තා. 2022 වනකොට එහි ආදායම බිලියන 45 ඉක්මවා තිබෙනවා. කුරුඳු කර්මාන්තයේ විශාල වර්ධනයක් ඇති වුණා. ගරු ඇමතිතුමනි, 2015 මෙට්‍රික්ටොන් 13,548ක් වූ කුරුඳු අපනයනය, 2018 වනකොට මෙට්‍රික්ටොන් 17,536 දක්වා ඉහළ නංවන්නට පුළුවන් වුණා. ඉතින් අපි කියන්න කැමැතියි, 76 අවුරුද්දක් ගැන කියමින් දොස් කියනකොට මෙම සංඛ්‍යා ලේඛනත් පොඩ්ඩක් සැලකිල්ලට අරගෙන දොස් කියන්න කියලා.

ගරු ඇමතිතුමනි, කුරුඳු කර්මාන්තය බොහොම දියුණු කරන්න ඕනෑ කර්මාන්තයක්. ඒකට දිගු ඉතිහාසයක් තිබෙනවා. යුරෝපීය රටවල ජනතාව ශරීරයේ ලුණු ප්‍රමාණය අඩු කර ගන්න වාගේම ඖෂධීය පානයක් විධියටත් අපේ රටේ කුරුඳු භාවිතා කරනවා. ඒ නිසා යුරෝපීය රටවල ජනතාව අතර එයට ලොකු ඉල්ලුමක් තිබෙනවා. එම නිසා අපට හොඳ වෙළෙඳ පොළක් ඇති කර ගන්න අවස්ථාව තිබෙනවා. එම වෙළෙඳ පොළ වැඩි කර ගන්න අගය එකතු කළ නිෂ්පාදන සඳහා දිරිගැන්විය යුතුයි. විශේෂයෙන්ම කුරුඳු තේ, කුරුඳු හකුරු, කුරුඳු පවුඩර් වාගේ අලුත් නිෂ්පාදන සඳහා ව්‍යවසායකයින් දිරිගැන්වීමත් හොඳයි කියලා මම කල්පනා කරනවා. අපි දන්නවා, විශේෂයෙන්ම දකුණු පළාතටයි, සබරගමුව පළාතටයි සීමා වෙලා තිබුණු කුරුඳු වගාව දැන් වනකොට අනුරාධපුරය, පොළොන්නරුව හා අම්පාර වාගේ දිස්ත්‍රික්කවලට ප්‍රවර්ධනය කරන්න පියවර ගෙන තිබෙන බව. එම වගාවන් පුළුවන් තරම් දියුණු කරන්න. එම පළාත්වලට එම භෝගය ගැළපෙයි. ආදායම වැඩි වෙයි. මිනිසුන්ට එය හොඳ අවස්ථාවක් වෙයි.

හිටපු ජනාධිපතිතුමා, කරන්දෙණියේ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවක් ඇති කළා. හෙට පැවැත්වෙන වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡාවේදී ඔබතුමාටත් දැන ගන්න මම කථා කරන්නම්. ඒ ගැන හෙට කියන්න ඕනෑ නිසා මම හිතාගෙන හිටියේ ඒ පිළිබඳව කරුණු ටිකක් හවසට සකස් කර ගන්න. ගරු ඇමතිතුමනි, කුරුඳු තලන අයගේ ලොකු හිඟයක් තිබෙනවා. පොහොර ප්‍රශ්න තිබෙනවා. නඩත්තුව පිළිබඳ ගැටලු තිබෙනවා. ඒවා ඉතින්, විසඳුම් සෙවිය යුතු කාරණා. මම ඒ පිළිබඳව හෙට කථා කරන්නම්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා එක එක ආයතන ගැන කියලා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව ආදී ආයතන ගැනත් කථා කරන්න කිව්වා. මම කලක් ඉඩම් අමාත්‍යාංශයේ ඇමතිවරයා හැටියටත් හිටපු නිසා මම කැමතියි ඊළඟ විනාඩි කිහිපය ඒ පිළිබඳව අදහස් දෙක, තුනක් දක්වන්න.

මුදල් අමාත්‍යවරයා විධියට ජනාධිපතිතුමා එතුමාගේ අය වැය කථාවේදී විශේෂයෙන්ම සඳහන් කළ ඉඩම් විෂයට අදාළ කරුණු කිහිපයක් ගැන මම මතු කරන්න කැමතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එතුමා අය වැය කථාවේදී ආයෝජන සඳහා ඉඩම් නිදහස් කිරීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන බවට ප්‍රකාශ කළා. ඒක ඉතාම වැදගත්. ඒ වාගේම යහපත් තත්ත්වයක් ලෙස සලකන්න පුළුවන්කම තිබෙනවා. ඇමතිතුමනි, ඒ සඳහා ඉඩම් විෂයට සම්බන්ධ රාජ්‍ය ආයතනවල පහසුකම් වැඩිදියුණු කිරීමටත්, දැනට තනි තනිව රාජකාරි කරන එම ආයතන ඒකාබද්ධ කරමින් ඉඩම් තොරතුරු ඇතුළත් මධ්‍යම ඩිජිටල් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරන්නත් යෝජනා කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය සඳහා මෙය කියන්න මම කැමතියි. ඩිජිටල් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරන්න යෝජනා කිරීම හොඳයි. එම යෝජනාව නිසියාකාරයෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණොත් ආයෝජන ව්‍යාපෘතිවලට ඉඩම් ලබා දීම සාර්ථකව කරන්න පුළුවන් වෙයි කියලා කලක් ඉඩම් ඇමති හැටියට කටයුතු කරලා අත්දැකීම් තිබෙන නිසා මම විශ්වාස කරනවා. ඒක හොඳ දෙයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම ඌන උපයෝජිත තත්ත්වයේ පවතින ඉඩම් සහ ගොඩනැඟිලි ආර්ථික කටයුතුවලට යොදා ගැනීමට අවධානය යොමු කිරීමත් වැදගත් කාර්යයක් ලෙස මම දකිනවා.

පසුගිය රජය කාලයේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා විසින් ආරම්භ කරන ලද රජයේ ඉඩම් සඳහා නිදහස් දීමනා පත්‍ර ලබා දීමේ "උරුමය" වැඩසටහන වර්තමාන රජය විසින් නතර කිරීම නිසා මහ ජනතාවට ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන බවත් අපි දන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ඉඩම් ඔප්පු වැඩසටහන ගැන අපි පසු ගිය අය වැය විවාදයේදීත් ප්‍රශ්න කළාම ඇමැතිතුමා කිව්වා, එම වැඩසටහන යළි සමාලෝචනය කරලා මතුවී තිබෙන ගැටලු නිරාකරණය කරලා ඉතා ඉක්මනින් නැවත ආරම්භ කරනවා කියලා. තමුන්නාන්සේලා බලයට ආවට පස්සේ 2024 නොවැම්බර් මාසයේ ඉඳලා "උරුමය" ඔප්පු ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම නතර කර තිබෙනවා. නැවත නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීම සඳහා වැඩසටහනක් ආරම්භ කළ බවක් නම් තවම අපට දැන ගන්නට නැහැ. මහ ජනතාව වෙත ලබා දීලා තිබුණු අවසර පත්‍ර සහ දීමනා පත්‍ර 70,000ක් විතර රජයට භාර ගත්තා. ඒත් "උරුමය" දීමනා පත්‍ර ලබා දීලා තිබුණේ ඉන් 30,000කට විතරයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රජයට ලිපිගොනු භාර දීලාත් "උරුමය" දීමනා පත්‍ර නොලැබුණු ඉඩම් 40,000ක විතර අවසර පත්‍ර සහ දීමනා පත්‍ර අවලංගු කර තිබෙන නිසා එම ඉඩම් හිමියන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දී තිබෙනවා. "උරුමය" කියන නම "හිමිකම" ලෙස වෙනස් කර නව ඔප්පු ලබා දීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට ඇමති මණ්ඩලයේ අනුමැතිය ලැබුණු බව දැනගන්නට තිබුණත්, එවැනි වැඩසටහනක් තවම අපේ පළාත්වල නම් ක්‍රියාත්මක වන බවක් අපි දැකලා නැහැ. බලාගෙන යද්දි ඉඩම් ඇමතිතුමා කර තිබෙන්නේත් පරණ වීදුරුවට අලුතින් වයින් දැම්මා වාගේ වැඩක්. මේ නව නිදහස් දීමනා පත්‍ර ලබා දීමේ රජයේ වැඩ පිළිවෙළ පිළිබඳව අද අපටත්, රටටත් මේ විවාදයේදී පොඩ්ඩක් හරි පැහැදිලි කර දුන්නොත් ඒක ප්‍රයෝජනවත් වෙයි කියලා මම හිතනවා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ඊයේ ඒ ගැන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
තිබුණාද? මම සිටියේ නැහැ, ඒ අවස්ථාවේ.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ඒක ගැන බලන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
හොඳයි.

ඊළඟට, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පසුගිය වසර 5ක් පුරාම අය වැය විවාදවලදී මේ ගරු සභාවේදී අපි පෙන්වා දුන්නත් බාලගිරි දෝෂයට හසුවී තවමත් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ ඉඩම් ක්ෂේත්‍රයට වැදගත් වන කරුණු කිහිපයක් ගැන මේ සභාවේ අවධානය යොමු කරන්න මට හිතුණා. ඉඩම් ක්ෂේත්‍රයට අදාළ පැරණි අණ පනත් හා නීති-රීති වර්තමානයට ගැළපෙන අයුරින් සංශෝධනය කිරීමත්, යුගයේ අවශ්‍යතාව අනුව නව නීති-රීති හඳුන්වා දීමත් සිදු කළ යුතු වනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් ඒක පිළිගන්නවා ඇති. ගරු ඇමතිතුමනි, ඉඩම් අත්කර ගැනීමේ පනතත්, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතත් සංශෝධනය කිරීමේ මූලික ක්‍රියාවලිය ආරම්භ කළේ ඇත්තවශයෙන්ම මම ඉඩම් ඇමති හැටියට ඉන්න කාලයේ. නමුත්, අද වන විටත් එම පනත් දෙකෙහි සංශෝධන අවසන් කර ගැනීමට බැරි වුණා. පසුගිය රජයටත් බැරි වුණා, වර්තමාන රජයටත් තවම එය කර ගන්න බැරිවෙලා තිබෙනවා. අපේ ඉඩම් ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා,

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

කඩිනමින් මීට අවශ්‍ය කටයුතු කරන හැටියට නිලධාරින් මෙහෙයවන්න, ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය උපදෙස් ලබා දී ඒ කටයුත්ත ඉක්මන් කරන්න කියලා. ඒ වාගේම තමයි, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් පනත සකස් කිරීමේ කටයුතුත් තවම අවසන් කර නැහැ. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

මීට අමතරව, ඉඩම් විෂයයට අදාළ වන තවත් වැදගත් කරුණක් පිළිබඳව මේ සභාවේදී මම මතක් කරන්න කැමැතියි. ඒ තමයි, ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් නොමැති වීම. ගරු ඇමතිතුමනි, ජාතික ඉඩම් ප්‍රතිපත්තිය තමයි ඉඩම් කළමනාකරණයේ මූලික පදනම වන්නේ. නමුත්, එම ප්‍රතිපත්තිය සකස් කරන්න මේ දක්වාම බැරිවෙලා තිබෙනවා. මේකට තිබෙන ප්‍රධාන බාධාව තමයි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් ජාතික ඉඩම් කොමිෂන් සභාව පිහිටුවීමට ක්‍රියා නොකිරීම. පසුගිය අවස්ථා කිහිපයකදීම ජාතික ඉඩම් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා පනතක් කෙටුම්පත් කළත්, ඒ කටයුත්ත සම්පූර්ණ කරන්න තවම බැරිවෙලා තිබෙනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, යම් යම් හේතු මත ආරම්භ කරපු සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්ම පසුගිය රජයන් විසින් අතරමඟ නතර කිරීම නිසා මහජනතාව අපහසුතාවට පත් වී තිබෙන බව. ඒ ව්‍යාපෘතිවලින් මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටසත්, රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉංගිරිය දක්වා කොටසත් නැවත ආරම්භ කිරීමට මෙවර අය වැයෙන් මුදල් වෙන් කිරීම ගැන අපි සතුටු වනවා. නමුත් දඹුල්ල-හබරණ දුම්රිය මාර්ගයත්, මධ්‍යම අධිවේගී මාර්ගයේ හා රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉතිරි කොටස් ඉදිකිරීමත්, කැලණිවැලි දුම්රිය මාර්ගය කණු මතින් ඉදිකරන දුම්රිය මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමත් වැනි ව්‍යාපෘති රාශියක් අතරමඟ නතර වෙලා තිබෙනවා. එම ඉඩම්වල හා දේපළවල අයිතිකරුවන්ට හා පදිංචිකරුවන්ට ඒ ඉඩම් සංවර්ධනය කරන්නත් බැහැ. මොකද, ඒවා රජයට අත්පත් කර ගත් නිසා. ඒ වාගේම ඒ ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ඒ මිනිස්සුන්ට ගෙවන්න තිබෙන වන්දි මුදල් රජය තවම ගෙවලාත් නැහැ. ඒ ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු අතරමඟ නතර වීම නිසා පාරිසරික ගැටලු රාශියකුත් මේ වනකොට මතුවෙලා තිබෙනවා. ඒ ව්‍යාපෘති ඉදිරියට කරගෙන යනවාද, නැද්ද කියන එක පිළිබඳව ස්ථිර තීරණයක් ගැනීම රජය සතු වගකීමක්. එම ව්‍යාපෘති ඉදිරියට කරගෙන යනවා නම් රජයට අත්පත් කරගත් ඉඩම් හා දේපළ වෙනුවෙන් අදාළ පුද්ගලයින්ට කඩිනමින් වන්දි ගෙවන ලෙසත්, ව්‍යාපෘතිය කරගෙන යන්නේ නැත්නම් රජයට අත්පත් කරගත් ඉඩම් හා දේපළ අදාළ පුද්ගලයින්ට නැවත ලබා දීම ගැන අවධානය යොමු කරන්න කියාත් මා ඉල්ලා සිටිනවා. මම හිතන විධියට මගේ කාලයෙන් තව විනාඩියක් විතර ඉතිරි වෙලා ඇති. ඒ ඉතිරි වුණු විනාඩිය හෝ විනාඩි දෙක ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට ලබා දෙන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ අවස්ථාවේදී මම ඔබතුමියගෙන් විශේෂ ඉල්ලීමක් කළේ රටේ ඇතිවෙලා තිබෙන ආපදා තත්ත්වය සම්බන්ධයෙන් රජය හැටියට අදහසක් දක්වන්නයි. විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් සහ අදාළ නිලධාරින් එක්ක රටේ ඇතිවෙලා තිබෙන ආපදා තත්ත්වය සම්බන්ධයෙන් අපි පාර්ලිමේන්තුවේදී පැවැත්වූ විශේෂ සාකච්ඡාවක් දැන් නිම කරනු ලැබුවා. එහිදී අනාවරණය වුණා, කාලයකට පසුව මේ දිනවල ලංකාවට අධික වැසි තත්ත්වයක් පතිත වෙමින් තිබෙනවා කියලා. නිලධාරින් පෙන්වා දෙන විධියට ඇතිවෙලා තිබෙන අවපීඩන තත්ත්වයත් එක්ක ඉදිරි දින කිහිපයේත් රටට අධික වැසි ලැබෙයි කියා බලාපොරොත්තු වනවා. මේ වනකොට විශාල ආපදා ප්‍රමාණයක් වාර්තා වනවා. ඒ වෙනුවෙන් ක්ෂණික මැදිහත්වීම් ප්‍රමාණයක් කරන්නත් අපි සාකච්ඡා කරනු ලැබුවා.

විශේෂයෙන්ම වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පැත්තෙනුත් පැහැදිලි කළා, රටේ විශාල වැව් 73කින් මේ වනකොට 30ක් වාන් දමන තත්ත්වයේ පවතිනවා, ඒ නිසා ඒ ප්‍රදේශවල සැලකිය යුතු ජනතාවක් ආපදාවට ලක්වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම මධ්‍යම කඳුකරයේත් ඛේදනීය තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් අපි කනගාටුවට පත් වනවා. විශේෂයෙන්ම එම ප්‍රදේශවල නායයෑම් අවදානම මේ වන විට විශාල වශයෙන් උග්‍ර වෙලා තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කයේ මේ වනකොට මරණ 26ක් පමණ වාර්තා වෙලා තිබෙනවා.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඉදිරි පැය කීපය තුළ වැඩියෙන් වැසි ලැබෙයි කියලා අනාවරණය කළා. ඒ නිසා ජනාධිපතිතුමාගේත් විශේෂ අවධානය යොමු වුණා, ඉක්මනින් මේ සඳහා මැදිහත් වෙලා ජීවිත හා දේපළ හානිය අවම කර ගැනීමට අදාළ කටයුතු කිරීම කෙරෙහි. ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඇතුළු ආරක්ෂක අංශත්, විශේෂයෙන්ම අපේ නිලධාරිනුත් ඊයේ රාත්‍රියේ සිට දිගටම අවධානයෙන් සිටිමින් මෙහෙයුම් කටයුතු සිදු කළා. ඔවුන් ඒ වෙනුවෙන් විශාල කැප කිරීමක් කරනවා. ඒ පිළිබඳව මම ඒ සියලුදෙනාටම ස්තුතිවන්ත වෙනවා. අද අපි සාකච්ඡා කරලා තීන්දුවක් ගත්තා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු කැඳවලා ආපදා තත්ත්වය සම්බන්ධයෙන් තොරතුරු අරගෙන ඉක්මනින් ඒ සඳහා මැදිහත්වීමක් සිදු කරන්න. ඒ අනුව අපේ මහජන ආරක්ෂක ඇමතිතුමා මේ මොහොතේ නුවරට පිටත් වෙනවා, ඒ දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කටයුතු කරන්න. ඒ වාගේම අපේ මේජර් ජනරාල් අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමාත්, අපිත් සම්බන්ධ වෙලා අද හවස් වරුවේ බදුල්ල දිස්ත්‍රික්කයේ ආපදා තත්ත්වය පිළිබඳව කරුණු සමාලෝචනය කරලා, ඒ සඳහා මැදිහත් වෙන්න බලාපොරොත්තු වෙනවා.

දැනට තිබෙන ආපදා තත්ත්වයේ වර්ධනය වීමක් සමහර විට තවදුරටත් සිදු වීමට පුළුවන් වාගේ තත්ත්වයක් දැනෙන නිසා ගරු අග්‍රාමාත්‍යතුමියත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරිනුත් මැදිහත් වෙලා උසස් පෙළ විභාගය දවස් දෙකකින් කල් දමනු ලැබුවා. එම අවස්ථාවට විපක්ෂ නායකතුමාත් සහභාගී වෙලා හිටියා. මේ, එවැනි ජාතික තීන්දු ගන්නා අවස්ථාවක්. ඒ වාගේම ජනතාව

ආපදාවකට මුහුණ දීලා සිටින අවස්ථාවක පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ මැති-ඇමතිවරුන් බිම් මට්ටමට බැහැලා ජනතාවගේ ප්‍රශ්නවලට වේගයෙන් මැදිහත් විය යුතු නිසා අපි ජනාධිපතිතුමාත් මේ සභාවේ ඉන්න අවස්ථාවේදී ඉල්ලීමක් කළා, අය වැය පිළිබඳ විවාදය තිබුණත් දින කීපයක් හෝ මේ ජනතාව වෙනුවෙන් මැදිහත් වෙන්න අපිට යම් පහසුවක් සලස්වලා දෙන්න කියලා. ඒ අනුව, අද සවස 2.00ට පක්ෂ නායකයින්ගේ රැස්වීම කැඳවලා ඒ සම්බන්ධයෙන් යම් තීන්දුවක් ගන්නවා කියලා අපේ සභානායකතුමාත් දැනුම් දුන්නා. අපි ඉල්ලීමක් කරනවා, අපිට බිම් මට්ටමින් මේ සඳහා මැදිහත් වෙලා මේ කාර්යය කරන්න ඉඩ ප්‍රස්ථාව ලබා දෙන්න කියලා.

විශේෂයෙන් හෙට දවසේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයයි තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම කඳුකරය නියෝජනය කරන අපි ඒ ජනතාව වෙනුවෙන් මැදිහත් වීමේ අවශ්‍යතාවක් තිබෙනවා. අපි ඒ කාරණයත් එහිදී අවධාරණය කළා. ඒ වාගේම අග්‍රාමාත්‍යතුමියත් පැහැදිලි කළා, උසස් පෙළ විභාගය දින දෙකයි කල් දාලා තිබෙන්නේ, තත්ත්වය තවත් උග්‍ර වෙනවා නම් මේ පිළිබඳව සලකා බලා තවත් යම් සහනයක් දරුවන්ට ලබා දෙන්න ඕනෑ, දරුවන්ට ඒ අවස්ථාව නැති කරන්න බැහැ කියලා. මේ වෙනකොට පවුල් විශාල ප්‍රමාණයක් ආපදාවට ලක් වෙලා තිබෙනවා. ඔවුන්ට ලබා දෙන ආධාර සම්බන්ධයෙන් ජනාධිපතිතුමා සාකච්ඡා කළා. ඒ වාගේම කඳවුරුගත ජනතාවට පිසූ ආහාර ඉක්මනින්ම ලබා දෙන වැඩ පිළිවෙළක් සම්බන්ධවත්, සමහර ඥාති පවුල්වල සහ සමහර තැන්වලින් විතැන් වෙලා ඉන්න අයට වියළි ආහාර ලබා දීම සම්බන්ධයෙනුත්, වගා හානි ලබා දීම සම්බන්ධයෙනුත් එහිදී සාකච්ඡා කළා. කෘෂිකර්ම ඇමතිතුමාත් ඒ සඳහා මැදිහත් වෙනවා.

මගේ දිස්ත්‍රික්කයේ, පස්සර, කනවැරැල්ල ප්‍රදේශයේ ඊයේ දවසේ අධිනාය යෑම් අවදානම් තත්ත්වයක් වාර්තා වුණා. ඒ ප්‍රදේශයේ පවුල් 63ක් ඉන්නවා. අපි ඒ අයව ආරක්ෂිත ස්ථානවලට කැඳවන්න බැලුවත් සමහරු ඒ නිවාසවලින් එළියට එන්න සූදානම් වුණේ නැහැ. ඊයේ රාත්‍රියේම නිලධාරින්, සභාපතිතුමන්ලා සහ පොලීසිය ගෙයින් ගෙට ගිහිල්ලා ඒ ජනතාව ඒ නිවාසවලින් එළියට ගන්න මහන්සි ගත්තා. නමුත්, අපිට එළියට ගන්න පුළුවන්කම ලැබුණේ පවුල් හතරක් පමණයි. ඒ නිසා අදත් අපි කිව්වා, "අනාරක්ෂිත තැන්වල ඉන්න එපා. එළියට එන්න" කියලා. මම මේ රටේ ජනතාවගෙන් ඉල්ලන්නේ මේ අධික වැසි සමයේ ඔවුන්ගේ පැත්තෙනුත් පරිස්සමක්, ඒ සිදුවීම් කෙරෙහි අවධානයක් යොමු කළ යුතුව තිබෙනවාය කියන එකයි. විශේෂයෙන් නාය යන ප්‍රදේශවල වාගේම සමහර වැව් වාන් දමන තත්ත්වය තුළ කොටු වෙච්ච කණ්ඩායමකුත් ඉන්නවා. ඒ අයගේ ආරක්ෂාව වෙනුවෙන් නිලධාරින් සහ රජය ලබා දෙන උපදෙස් පිළිපදිමින් ඔවුන් ඒ අනාරක්ෂිත ස්ථානවලින් එළියට එනවා නම් අපිට මේ ජීවිත හානි වාගේම දේපළ හානි හුඟක් වළක්වා ගන්න පුළුවන්. ඒ සඳහා අපි නිලධාරින් ඉදිරියේදීත් යොදවන බව මම කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා, ඒ අවදානම් කලාපවලින් ඉවත් වෙන්න කියලා. ඒ ජනතාව රැක බලා ගන්න, අවශ්‍ය ආරක්ෂාව දෙන්න, ඔවුන් පෝෂණය කරන්න රජයක් හැටියට අපි උපරිමයෙන්ම කැප වෙනවා කියන පණිවුඩයත් මම මේ මොහොතේදී ලබා දෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට කථා කරන්න වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 11.28]

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අද දිනයේ පවත්වනු ලබන විවාදයේදී මට කථා කරන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධව බෙහෙවින්ම මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. 2026 වර්ෂය සඳහා වූ අය වැයේ මෙම අමාත්‍යාංශයට අයත් ආයතන විසි හතරක් සඳහා රුපියල් මිලියන 221,300ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, වර්තමානයේ ඇති වෙලා තිබෙන කාලගුණික තත්ත්වයත් එක්ක බලනකොට අපි මූලධන වියදම් හැටියට රුපියල් මිලියන 131,300ක් වෙන් කරලා තිබෙනවා. නමුත්, කාලගුණ විපර්යාසය නිසා සිද්ධ වෙලා තිබෙන හානි ගත්තොත්, අපේ අමාත්‍යාංශය යටතේ ඇති අංශවලට තමයි වැඩිම හානි සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා අමාත්‍යාංශයීය වැය ශීර්ෂ විවාදයට කලින් පැහැදිලි කිරීමක් කර ගන්න ඕනෑකම තිබෙනවා, විශේෂයෙන්ම මේ අවස්ථාව විශේෂ අවස්ථාවක් හැටියට සලකා. ලංකාවේ සියලු දිස්ත්‍රික්ක ගත්තොත්, කාලගුණ විපර්යාස නිසා එම ප්‍රදේශවල ජනතාව ගොඩක් ආපදාවලට ලක් වෙලා තිබෙනවා.

මහනුවර දිස්ත්‍රික්කය ගත්තොත්, එම දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ජනතාව ආපදාවලට ලක්ව මේ වෙලාව වනකොට ලොකු කරදරයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම උඩදුම්බර ආසනය ගත්තොත්, එම ආසනයේ මේ වනකොට පුද්ගලයින් 500කට ආසන්න ප්‍රමාණයක් කඳවුරු 7ක අවතැන් වෙලා සිටිනවා. ඒ වාගේම ගෙවල් 20කට වැඩි ප්‍රමාණයක් නාය ගිහිල්ලා, ඒවායේ හිටපු පිරිස පිළිබඳව හරියට ගණනය කර ගන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඒ වාගේම මේ වනකොට අවතැන් කඳවුරු 17ක ප්‍රමාණයක් දිස්ත්‍රික්කය පුරාවටම තිබෙනවා. මම මේ කිව්වේ මීට පැයකට විතර කලින් ගත්ත තොරතුරු. මේ වෙලාවේදී මම ඒ කාරණය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම උඩදුම්බර ආසනයේ, උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මොනම මාර්ගයකින්වත් ළඟා වෙලා ඒ අවතැන් වෙච්ච පිරිස මුදා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම පාරවල් අවහිර වෙලා තිබෙනවා. ඒ වාගේම මීදුම හා දැඩි වර්ෂාපතනය තවමත් තිබෙන නිසා ගුවන් මාර්ගයෙනුත් ඒ අවතැන් වෙච්ච පිරිස් ළඟට ළඟා වෙන්න බැරි කනගාටුදායක තත්ත්වයක් මේ මොහොත වනවිටත් තිබෙනවා.

අද විවාදය සම්බන්ධයෙන් කථා කළොත්, 2026 අවුරුද්ද මූලික කරගෙන 2025 අය වැයෙන් ප්‍රමාණවත් වී ආරක්ෂණ තොගයක් පවත්වා ගැනීම සඳහා රුපියල් මිලියන 8,000ක් වෙන් කළා. 2026 අවුරුද්දේ රුපියල් මිලියන 10,000ක් ආරක්ෂිත වී තොග පවත්වාගෙන යෑම සඳහා අපි වෙන් කර තිබෙනවා. ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රුපියල් මිලියන 5,500ක් මෙවර අය වැයෙන් අපි වෙන් කර තිබෙනවා. රසායනික හා කාබනික පොහොර සඳහා පොහොර සහනාධාර ලබා දීම එහෙම නැත්නම් අපේ අස්වැන්න වැඩි කර ගැනීමට ආයෝජන හැටියට කරන වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 36,900ක මුදල් ප්‍රමාණයක් අපි මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම අපි ගත්තොත්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද කෘෂි කාර්මික සහ පශු සම්පත් වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 1,400ක මුදලක් 2026 අවුරුද්ද සඳහා වෙන් කර තිබෙනවා. ඒ වාගේම භෝග රක්ෂණය සඳහා මේ අවුරුද්දේ අපි රුපියල් මිලියන 1,800ක මුදලක් වෙන් කර තිබෙනවා. මේ අවුරුද්ද තුළ කුඩා ඇළ මාර්ග, වැව් පද්ධති, වාරිමාර්ග පද්ධති සංවර්ධනය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 3,000ක මුදලක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා, ග්‍රාමීය කෘෂි ආර්ථිකය, නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා.

[ගරු ටී.එම්. බිස්නායක මහතා]

ඒ වාගේම පශු සම්පත් පැත්තට ආවොත්, කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කර තිබෙනවා. සතුන් අභිජනනය කිරීමේ ගොවිපළවල් වැඩිදියුණු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 3,000ක මුදලක් වෙන් කර තිබෙනවා. අපේ රටේ කිරි අවශ්‍යතාව ගත්තොත්, වාර්ෂික දියර කිරි නිෂ්පාදනය කරන්නේ ලීටර මිලියන 400ක වාගේ ප්‍රමාණයක්. නමුත් අපට අවශ්‍ය වෙනවා, කිරි ලීටර මිලියන 1,200ක ප්‍රමාණයක්. 2030 වසර වනකොට දේශීය කිරි අවශ්‍යතාවෙන් සියයට 75ක ප්‍රමාණයක් සපුරාලීමේ ඉලක්කය වෙත ළඟා වීම සඳහා මේ අවුරුද්දේ අපි පශු සම්පත් අංශයට මුදල් වෙන් කරමින් අවශ්‍ය කටයුතු සිදු කරනවා.

ඒ වාගේම තිරසර ගොවි ණය අරමුදලක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 800ක මුදලක් වෙන් කර තිබෙනවා. අපි දන්නවා, වී තොග පවත්වා ගෙන යාමේදී වී වේළා ගැනීමේ යන්ත්‍ර තවමත් අපට නැති බව. ඒ නිසා තෙත වී මිලදී ගැනීමේ ප්‍රශ්නයක් ආණ්ඩුවක් හැටියට අපට තිබෙනවා. ඒක නිසා යන්ත්‍රානුසාරයෙන් වී වේළීම සඳහා පහසුකම් සැලසීමට මේ අවුරුද්දේ අපේ අය වැයෙන් රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කර තිබෙනවා.

විශේෂයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ කුඩා වාරිමාර්ග ව්‍යාපෘති 100ක් - ග්‍රාමීයව බලපාන කුඩා වැව්, කුඩා වාරි ඇළවල් - ප්‍රතිසංස්කරණය සඳහා අපි රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කර තිබෙනවා.

කෘෂි කර්මාන්තයත් එක්ක බද්ධ වුණු තව විශේෂ කාරණාවක් තමයි අලි-මිනිස් ගැටුම. අලි-මිනිස් ගැටුම නිසා වාර්ෂිකව අපේ රටේ මරණ 80ක විතර ප්‍රමාණයක් අනිවාර්යයෙන් සිද්ධ වෙනවා. ඒ වාගේම අලි ඇතුන් 260ක විතර ප්‍රමාණයකගේ ජීවිත හානි වෙනවා. මෙහි විශේෂම කාරණාව තමයි, අද වනකොට ඇතිවෙලා තිබෙන ආපදා තත්ත්වය අනුවත්, විශේෂයෙන්ම බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ආසනයේ, ඒ වාගේම මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ආසනයේ මීනිපේ ප්‍රදේශයේ ඇතිවෙලා තිබෙන ගංවතුර තත්ත්වය නිසා අලින්ටත් කොතැනකටවත් යන්න නොහැකි වීම. මේ වෙනකොට අපට දැන ගන්න තිබෙන ආරංචි අනුව ඊයේ රෑත් ගෙවල් හත අටකට වැඩි ප්‍රමාණයකට හානි කරලා තිබෙනවා. විශේෂයෙන් ලංකාවේ අම්පාර, පොළොන්නරුව, අනුරාධපුර, බදුල්ල, මහනුවර දිස්ත්‍රික්කවල අලි-මිනිස් ගැටුම් සිදු වීම පිළිබඳව විශේෂ ප්‍රවණතාවක් තිබෙනවා. එම නිසා අලි- මිනිස් ගැටුම් අවම කර ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට අත්‍යවශ්‍ය වාහන 294ක් ලබා ගැනීමට අපි 2026 අවුරුද්ද ඇතුළත අවශ්‍ය කටයුතු සලසා දෙනවා. ඒ වාගේම අලි-මිනිස් ගැටුම් වැළැක්වීමේ ස්ථිරසාර විසඳුම් සඳහා අවශ්‍ය යෙදවුම් හැටියට අපි මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කර තිබෙනවා.

පොදුවේ ගත්තොත්, කෘෂිකර්ම අමාත්‍යාංශය විශාල විෂය පථයක් තිබෙන අමාත්‍යාංශයක්. ඒ වාගේම, සියලු ජන ජීවිත මෙම අමාත්‍යාංශයට සම්බන්ධ වෙනවා. ලංකාවේ කිසිම පුරවැසියෙක් මෙම අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඈත් වෙන්නේ නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී මෙම අමාත්‍යාංශයටත්, ඒ වාගේම මේ අමාත්‍යාංශයත් එක්ක බද්ධ වුණු සියලු ආයතනවලටත් ලොකු වගකීමක් පැවරිලා තිබෙනවා. ඒ කියන්නේ, මේ රටේ හැම මනුෂ්‍යයකුගේම බඩ වියත රැක ගැනීමේ මූලික අවශ්‍යතාව සම්පූර්ණ කරන අමාත්‍යාංශය හැටියට එක පැත්තකින් අපට සතුටකුත් තිබෙනවා. අවසාන වශයෙන් මං විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා, අද වන විට ඇතිවෙලා තිබෙන කාලගුණික ආපදා තත්ත්වය තුළ එම ප්‍රදේශවල ජනතාවට අවශ්‍ය කටයුතු සිදු කිරීමේදී පක්ෂ විපක්ෂ කිසිදු භේදයකින් තොරව අපට අවශ්‍ය සහාය ලබා දෙන්න කියලා. විශේෂයෙන්ම මෙම ආපදාවලින් වැඩිපුර හානියට ලක්වෙලා තිබෙන්නේත්, කෘෂි කර්මාන්තයට සම්බන්ධ අපේ රටේ පුරවැසියෝ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

මීළඟට, ගරු නීතිඥ අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 11.37]

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, අද දින විවාදයේදී කථා කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව.

විශේෂයෙන්ම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය ඉතාම සුවිශේෂී අමාත්‍යාංශයක්. ඒ වාගේම මෙම වැය ශීර්ෂය යටතට විෂයයන් ගණනාවක් වැටෙනවා. එම නිසා, රටේ සමස්ත කාරණාව වෙනස් කරන්න පුළුවන් අමාත්‍යාංශයක්; සමස්ත කාරණාව වෙනස් කරලා රට ඉදිරියට ගෙන යන්න පුළුවන් අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් කියලා මම විශ්වාස කරනවා. එම නිසා මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ යුතු පළමු කාරණාව තමයි, මුළු කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහ වාරිමාර්ග ක්ෂේත්‍රයේ සංවර්ධනය ඇතුළු ඒ සියලු කාරණා වෙනුවෙන් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට national plan එකක් ගේන්න කියන එක. ඔබතුමාට ඒක කරන්න පුළුවන් නම් ඉතාම හොඳයි. මම පසුගිය අය වැය විවාදයේදීත් මේ ගැන කිව්වා. මොකද, ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු 159ක් සිටින වෙලාවේ, අපේ සමස්ත වාරි පද්ධතිය සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රය වෙනුවෙන් ඔබතුමා හිතන, ඔබතුමන්ලාගේ නිලධාරින් සහ විද්වතුන් තීන්දු කරපු යම් ප්‍රතිපත්තියක් තිබෙනවා නම් ඒක national plan එකක් හැටියට මේ පාර්ලිමේන්තුවේ සම්මත කරලා ඉදිරියට ක්‍රියාත්මක කරමුයි කියන යෝජනාව මම මේ වෙලාවේ කරනවා.

ඒ වෙන කිසිවක් නිසා නොවෙයි, ගරු ඇමතිතුමනි. 2015දී මමත් මහවැලි විෂයය සම්බන්ධයෙන් නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට කටයුතු කළා. 2015දී කළ මොරගහකන්ද ව්‍යාපෘතියේ, උතුරු මැද පළාත් ඇළ, වයඹ පළාත් ඇළ වැඩකටයුතු ටික අපි 2015දීත් කළා, 2019දීත් කළා, 2022දීත් කළා, 2024දීත් කළා. ඔබතුමන්ලාත් තව අවුරුදු 4ක් කරනවා. හැබැයි මේ තෝරා ගත්ත ව්‍යාපෘති, එදා, මහවැලි ව්‍යාපාරය හැටියට ගෙනාපු ව්‍යාපෘති ටිකට පස්සේ කඩිනම් මහවැලි ව්‍යාපාරය හැටියට යම් ව්‍යාපෘති ප්‍රමාණයක් කරලා අවසන් වුණා. හැබැයි එතැනින් එහාට දැන් අද කරගෙන යන, උතුරු මැද පළාත් ඇළේ වතුර ටික, හුරුළු වැව දක්වා අරගෙන ගිහිල්ලා එතැනින් ඉරණමඩු ජලාශය දක්වා ගෙනියනවා නම්, ඒකට වෙනම ශක්‍යතා අධ්‍යයනයක් ඕනෑ. මේ කියන කාරණා ටික අර කියන සමස්ත plan එක අවසන් වුණාට පස්සේ මොකක්ද කරන්නේ කියන එක පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සම්මත කරපු වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියන එක මම ඔබතුමාට යෝජනා කරනවා.

මොකද, සමහර ඇමතිවරු ඉන්න කොට අපි දැක්කා ලංකාව මිරිස්වලින් ස්වයංපෝෂිත කරනවා කියලා වෙනම වැඩ පිළිවෙළක් කරගෙන ගියා. තවත් ඇමතිවරු ඉන්න කොට තවත්

භෝග තෝරාගෙන, ඒ භෝගවලින් ලංකාව ස්වයංපෝෂිත කරනවා කියලා වැඩ පිළිවෙළක් කරගෙන ගියා. හැබැයි අදාළ ඇමතිතුමා හිටපු අවුරුදු දෙක, තුන, හතර ඇතුළත ඒ කටයුතු ටික කරගෙන ගියා. හැබැයි, ඇමතිතුමා වෙනස් වෙනකොට භෝගයත් නැහැ, කරපු නිලධාරි ටිකත් නැහැ, ඒ වැඩ පිළිවෙළත් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව කාලය තිබෙනවා මේකේ වගකීම අරගෙන මේ වැඩ පිළිවෙළ ඉදිරියට කරගෙන යන්න. මම කියවපු ලේඛනයක දැක්කා, භෝග 13ක්, -මම නිවැරදියි නම්- වගා කරලා, ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නවත්වලා, දේශීය වශයෙන් ස්වයංපෝෂිත කරන්න ඔබතුමාගේ වැඩ පිළිවෙළක් තිබෙන බව. හැබැයි, ගරු ඇමතිතුමනි, මේක ඔබතුමාගේ ඔළුවේ විතරක් තිබුණාට ප්‍රමාණවත් වෙන්නේ නැහැ. මේ වෙලාවේ ඉන්න නිලධාරින්ගේ ඔළු ගෙඩිවල තිබුණාට ප්‍රමාණවත් වෙන්නේත් නැහැ. මේක national plan එකක් හැටියට ස්ථාපිත කරමු කියන අදහසයි මම ඔබතුමාට ඉදිරිපත් කරන්නේ. එහෙම නැත්නම් අලුත් අලුත් කාරණා ගැන හැම අවුරුද්දකම, එහෙම නැත්නම් අවුරුදු තුනකට සැරයක්, හතරකට සැරයක්, පහකට සැරයක් මේකේ කථා කරනවා. අදාළ අමාත්‍යවරයා, අදාළ නිලධාරින්, ඒකට මහන්සි වෙන පිරිස ඉවත් වෙනකොට එතැනින් එහාට මේ වැඩේ කෙරෙන්නේ නැහැ. ඒ නිසා මම පළමුවැනි කාරණාව හැටියට ඒක යෝජනා කරනවා.

ගරු ඇමතිතුමනි, දෙවැනි කාරණාව මෙයයි. සමස්ත වැඩ පිළිවෙළක්, යෝජනාවක් තිබිය යුතුයි කියන එකට තව කාරණයක් තමයි, 1950දී මේ රටේ වී නිෂ්පාදනය තිබුණේ මෙට්‍රික්ටොන් 185,000යි. ආනයනය කරලා තිබෙනවා, 482,000ක්. ඇමතිතුමනි, 2024 අවුරුද්ද වෙනකොට මෙට්‍රික්ටොන් 4,698,000ක් මේ රට තුළ නිෂ්පාදනය කරලා තිබෙනවා. ඒ වාගේම මෙට්‍රික්ටොන් 131,000ක් -සංඛ්‍යා ලේඛන අනුව- අපි නැවත ආනයනය කරලා තිබෙනවා. එතකොට ඇමතිතුමනි, 1950දී මෙට්‍රික්ටොන් 185,000ක් නිෂ්පාදනය කරපු එක මෙට්‍රික්ටොන් 4,698,000ක් දක්වා වැඩි කළා. ඒ වාගේම ආනයනය කරපු මෙට්‍රික්ටොන් 482,000ක ප්‍රමාණය, මෙට්‍රික්ටොන් 132,000 දක්වා අඩු කළා. එහෙම නම් "වසර 75ක ශාපය" කියලා කිව්වාට ඒක නරකම නැහැ නේද, ඇමතිතුමනි? මොකද, යම් තත්ත්වයකට, හොඳ සාධනීය තැනකට ඇවිල්ලා තිබෙනවා.

හැබැයි, ඔබතුමාගේ කාරණාවේදී එතැනින් එහාට සාධනීය තැනකට යන්න ඕනෑ නම්, ඒකට හරියන plan එකක් පසුගිය මාස 12 ඇතුළත මේ පාර්ලිමේන්තුවට අරගෙන ආපු බවක් නම් අපි දැක්කේ නැහැ, ඇමතිතුමනි. අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළවල් තිබෙන්න පුළුවන්. ඒ පිළිබඳව තර්කයක් නැහැ. හැබැයි, ඊට එහාට ගිය සාධනීය වැඩ පිළිවෙළක් හැටියට මේක ක්‍රියාත්මක කළොත් තමයි ඒ වැඩේ වේගවත් කරලා ඉදිරියට යන්න පුළුවන්කම ලැබෙන්නේ.

ඒ වාගේම තව කාරණාවක්, මේ ගරු සභාවේ අවධානයට යොමු කරවන්න කැමැතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ 2021 වසරේ වාර්ෂික වාර්තාවේ සඳහන් වෙනවා, එළවලු, පලතුරු භෝගවල සිදුවෙන සමස්ත හානිය සියයට 10කින් අවම කර ගන්න පුළුවන් නම්, රුපියල් මිලියන 5,800ක් අපට ඉතුරු කර ගන්න පුළුවන් කියලා. ඒ කියන්නේ, රුපියල් බිලියන 58ක් අපට ඉතුරු කරන්න පුළුවන් එළවලු, පලතුරුවල පසු අස්වනු හානිය අවම කර ගන්න පුළුවන් නම්. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ වාර්තාවක සඳහන් වෙනවා, පලතුරුවල හානිය සියයට 20යි, 40යි අතර, එළවලුවල හානිය සියයට 20යි 46යි අතර කියලා. හැබැයි, මේ කාරණාව සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක පිළිබඳව අපි පැහැදිලිවම බැලිය යුතුයි.

මොකද, මම පෞද්ගලිකවම මේ පාර්ලිමේන්තුව තුළ කථා කරලා තිබෙනවා, සතුන්ගෙන් වගාවට වන හානි පිළිබඳව. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කාරණාවක් සම්බන්ධයෙන් ගෞරව කරන්න ඕනෑ. මොකද, ඔබතුමා කළ යුතු දෙය හරියටම කිව්වා. හැබැයි, ඔබතුමාටත් ඒ වැඩේ කරන්න බැරි යම් හේතුවක් ඇති. හැබැයි, අපි විපක්ෂය හැටියටත් කිව්වා, එන්පීපී අය, කවුරු මොන කතන්දර කිව්වත් භය නැතිව මේ වැඩේ කරන්න කියලා. අද ගහක පොල් ගෙඩියක්වත් ඉතුරු වෙන්නේ නැහැ. මේකට යම් කළමනාකරණ වැඩ පිළිවෙළක් හැදුවේ නැත්නම්, මේ සිදුවන විනාශය කාටවත් නතර කරන්න බැහැ. මොකද, පසු අස්වනු හානිය සියයට 10කින් අවම කරගෙන, රුපියල් බිලියන 58ක් ඉතුරු කරගන්න පුළුවන් නම්, අද සතුන්ගෙන් වගාවලට වන හානිය කොච්චරද කියන එක බැලුවාම බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, Dambulla Cold Storage එක හැදුවා. මම දැක්කා, අය වැයෙන් රුපියල් මිලියන 250ක් වෙන්කරලා තිබෙනවා. හැබැයි, රුපියල් මිලියන 500ක් වෙන් කරලා හදපු cold storage එක අදටත් function වෙන්නේ නැහැ. මෝදි අගමැතිතුමා ආපු වෙලාවේදී ඒක විවෘත කළා. හැබැයි, එතැනින් එහාට ඒක පවත්වාගෙන යන්න බැරි වුණා. ඒක function වෙන්නේ නැහැ. දැන් ආයෙත් වතාවක් රුපියල් මිලියන 250ක් වෙන් කරලා තිබෙනවා, ඒ cold storage එක හදන්න. හැබැයි, ඒ cold storage එක හරියාකාරව function කර ගන්න පුළුවන් වුණොත්, එය හරියාකාරව ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක් හදා ගත්තොත් තමයි රුපියල් බිලියන 28ක් වුණු පසු අස්වනු හානියෙන් යම් ප්‍රමාණයක් හෝ අවම කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ කටයුත්ත කරන කාල වකවානුවේදී අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඒ සඳහා විශාල වශයෙන් මැදිහත් වුණා. එය හැකි ඉක්මනින්, කඩිනම්ව සක්‍රිය කළ යුතුයි කියන කාරණාව අපි මතක් කරනවා.

ගරු ඇමතිතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් සිටින මේ වෙලාවේ මේ කාරණයත් කියන්න ඕනෑ. රිළවුන් පිළිබඳව, වන සතුන් පිළිබඳව ඔබතුමන්ලා කරපු සංගණනයේ ප්‍රගතිය මොකක්ද, ඒකෙන් මොකක් හරි පිළිතුරක් සපයා ගන්න පුළුවන් වුණාද, ඒ සංගණනය කරපු ඒකේ ප්‍රයෝජනයක් තිබුණාද කියන එක පිළිබඳව මම නම් දන්නේ නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මොකද, ඒ සම්බන්ධයෙන් අප දකින දේ, ගමට ගියාම මිනිසුන් කියන දේ, වගාවට සිදු වෙලා තිබෙන හානි පිළිබඳව සංඛ්‍යා ලේඛනවලින් දැක්කාම අපට කියන්න තිබෙන දේ තමයි, අවසානයේදී අල්ලපු රිළවෙකුත් නැහැ, රිළවුන් ගිහින් දාපු දූපතකුත් නැහැ, ගොවියාට වෙච්ච සෙතකුත් නැහැ කියන එක.

ඔබතුමන්ලාගේ ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමා එක තැනකදී කියනවා මම දැක්කා, මේක ආණ්ඩු වෙනස් කරන තරම් සාධකයක් කියලා. ඒක ඇත්ත. අපේ ආණ්ඩුවලට ගෙදර යන්න හේතු වුණා මේවාත්. අර පැත්තෙන්, වගාව කරනවා කියන කතන්දරය ගොවියාට කිව්වාට, අවසානයේ වගාව, ගොවියා ඇතුළු සියලුදෙනා අසරණ වුණා. මා අද පාර්ලිමේන්තුවේදී මේ කියන්නේ ආණ්ඩු පක්ෂ, විපක්ෂ කතන්දරයක් ගැන නොවෙයි, ගරු ඇමතිතුමනි. අපි කණ්ඩායමක් හැටියට විවෘතව කථා කරලා මේකට මොකක් හරි විසඳුමකට එන්න ඕනෑ. මෙහි පව් පින්, අරවා මේවා සියල්ලම බලලා වැඩ කරන්න ගියොත් මිනිසුන්ට කන්න නැතිව හාමතේ මැරෙන්න සිදු වෙනවා. එම නිසා කවුරු කැමැති වුණත් නැතත් ඒ සියල්ල පැත්තක තියලා ප්‍රායෝගික, නිවැරදි වැඩ පිළිවෙළකට එන්න වෙනවා. එම නිසා අප ඒ පිළිබඳව නිසි අවධානය යොමු කරලා වැඩ පිළිවෙළක් සූදානම් කළ යුතුයි කියා මම විශේෂයෙන් සඳහන් කරනවා, ගරු ඇමතිතුමනි.

ඊළඟ කාරණාව මේකයි. මා ඉස්සෙල්ලාත් කිව්වා වාගේ අපි උතුරුමැද පළාත් ඇළ සහ වයඹ පළාත් ඇළ ගැන අවධානය යොමු

[ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා]

කරන්න ඕනෑ. දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීම පිණිස ADB එකෙන් ලැබෙන fundsවලින්, කිලෝමීටර් 96ක් වන උතුරුමැද පළාත් ඇළ පද්ධතියේ tunnel එකේ කිලෝමීටර් 27න්, කිලෝමීටර් 24ක විතර වැඩ කටයුතු මේ වනකොට අවසන් කර තිබෙනවා. වයඹ පළාත් ඇළේ කිලෝමීටර් 94ක් තිබුණා. ADB loan එක හම්බ වෙනකොට ඒ කිලෝමීටර් 94 වැඩ කටයුතුත් කෙරේවි. හැබැයි ගරු ඇමතිතුමනි, මම මෙහිදී එක කාරණාවක් ගැන අවධානය යොමු කරවනවා. හැකි ඉක්මනින් ගිවිසුම්ගත වෙලා ADB එකේ මුදල් ටික පුළුවන් තරම් මේ ව්‍යාපෘතිවලට දෙන්න. මොකද, දැනට ගිවිසුම්වලට යැමේ හැකියාව තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ රටේ ක්‍රියාත්මක වුණු අසාර්ථක වෙච්ච සමහර ව්‍යාපෘති යෝජනා ගැන අපි දන්නවා. ඒවා ක්‍රියාත්මක කළත්, අවුරුදු ගණනාවක් ගිහිල්ලාත් ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැ. අප කරපු ව්‍යාපෘති අතරත් අදටත් ප්‍රතිලාභ නොලැබෙන ව්‍යාපෘති තිබෙනවා. එහෙම වෙන්න අප අතින් වෙච්ච වැරැදිත් බලපාන්න ඇති. එවැනි ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා, අදටත් මේ රටේ ආර්ථිකයට මුදල් එකතු වෙන්නේ නැති.

හැබැයි, මේ කියන උතුරුමැද පළාත් ඇළ හැදුවොත්, වයඹ පළාත් ඇළ හැදුවොත් කුඩා වැව් 1,200කට විතර වතුර ටික ලැබෙනවා. කුඩා වැව් 1,200කට වතුර ලැබෙනවා කියන්නේ, තවත් අක්කර, හෙක්ටෙයාර බර ගාණක් මේ රටේ මිනිසුන්ට වගා කරන්න පුළුවන් වනවා කියන එකයි. ඔබතුමන්ලා හෙට වතුර ටික දුන්නොත් අනිද්දා ඉඳලා මේ රටේ ආර්ථිකයට මුදල් ටික එකතු වෙනවා. ඒ ඇළ මාර්ග හදන ව්‍යාපෘති ගැන අපි 2015දීත් කථා කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම මේ කියන්නේ මගේ වයසත් එක්ක, අප දේශපාලනයේ හිටපු කාලයත් එක්ක බලලායි. අපි 2015දීත් ඒ ව්‍යාපෘති ගැන කථා කළා; යම් යම් ක්‍රියා මාර්ග අර ගත්තා; එහි වැඩ ටික පටන් ගත්තා; වැඩ කටයුතු කර ගෙන ගියා. හැබැයි, අද ඔබතුමන්ලාත් එය කරගෙන යනවා. එම නිසා පුළුවන් නම් ඒ ව්‍යාපෘතිවලට දෙන්න පුළුවන් උපරිම හයිය, ශක්තිය එකතු කරන්න. එහෙම කරලා ඒවා සක්‍රිය කරන්න. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලය තුළ මේ රටේ මිනිසුන්ට ප්‍රයෝජනයට ලබා ගන්න පුළුවන් මට්ටමට ඒවා හදන්න කියන ගෞරවනීය ඉල්ලීම අපි ඔබතුමන්ලාගෙන් කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒවා හැදුවාටම විතරක් මදි. ඒවායෙන් කුඩා වැව් විතරක් පෝෂණය වෙනවා 1,200කට වඩා. අපි පසුගිය කාලවලදී ලංකාව පුරා තිබෙන වැව් හදන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා, වැව් 5,000ක් තෝරාගෙන. ඒවායෙන් වැව් 1,700ක් වාගේ ප්‍රමාණයක් හැදුවා. හැබැයි, මේ කියන වැව් 1,200 හදන වැඩ පිළිවෙළක් ඔබතුමන්ලාට දැන් ඉඳලාම තිබුණේ නැත්නම් වයඹ පළාත් ඇළ, උතුරුමැද පළාත් ඇළ හැදුවාට වැඩක් වෙන්නේ නැහැ. මොකද, කුඩා වැව්වලට වතුර ගිහිල්ලා ගොවියාට අවශ්‍ය කරන වතුර ටික ලැබෙන වැඩ පිළිවෙළ ඒ තුළින් හැදෙන්නේ නැහැ. එහෙම නම්, උතුරුමැද පළාත් ඇළ හැදෙන්න ඕනෑ, වයඹ පළාත් ඇළ හැදෙන්න ඕනෑ, මහකිරුල, මහකිතුල වාගේ විශාල ව්‍යාපෘති ටික කෙරෙන්න ඕනෑ. හැබැයි, ඒ ව්‍යාපෘති ටික කෙරෙන කොට එයට සමගාමීව අනෙක් පැත්තෙන්, අවශ්‍ය කරන කුඩා වැව් ටිකත් සංවර්ධනය වෙන්න ඕනෑ. ඒ සඳහා වන වැඩ පිළිවෙළක් ඔබතුමන්ලා හදන්න කියන ඉල්ලීම මම කරනවා. නමුත්, ඒ යෝජනාව මේ අය වැය තුළ අපි දැක්කේ නැහැ, ගරු ඇමතිතුමනි. ඒ යෝජනාව අපි දැක්කේ නැහැ. ඒ සඳහා වෙන් වෙච්ච මුදල් ප්‍රමාණයක් දැක්කේ නැහැ.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට යම් මුදල් ප්‍රමාණයක් ලැබුණාට අඩුම ගානේ තිබෙන වැව් ටිකවත් නඩත්තු කර ගන්න ඒ අයට බැහැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට නම් යන්තම් මුදල් ටිකක් තිබෙනවා. ඒ ගොල්ලෝ කොහොම හරි ඒක manage කර ගෙන යනවා. හැබැයි, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව වෙනම අමාත්‍යාංශ මට්ටමින් මුදලක් වෙන් කරලා වැඩ පිළිවෙළක් හැදුවේ නැත්නම් මේ කියන කුඩා වැව් ටික හැදෙන්නේ නැහැ. මොකද, ඒ කුඩා වැව් ටික හදලා ඒ වතුර ටික රුඳුණේ නැත්නම් හුරුළු වැවට වතුර යන්නේත් නැහැ, මේ රටේ කිසිම දවසක ඉරණමඩුවලට වතුර ගෙන යන්න හම්බ වෙන්නේත් නැහැ, ඔය කියන කඳුකරයේ තිබෙන වතුර ටික උතුරට ගෙන යන වැඩ පිළිවෙළ කවදාවත් සාර්ථක කරගන්න හම්බ වෙන්නේත් නැහැ. එම නිසා ජාතික වැඩ පිළිවෙළක් හැටියට මේ සම්පූර්ණ වැඩ පිළිවෙළ සලකන්න කියන ඉල්ලීම අපි මේ වෙලාවේදී කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම මම තවත් කාරණයක් අවධානයට යොමු කරන්න කැමැතියි. අප කවුරු මොන කථන්දර කිව්වත්, 2025දී වෙච්ච වැඩ ටිකත් එක්ක තමයි 2026 වසර කොච්චර හොඳද කියලා සැලසුම් කරන්න අපට හැකි වෙන්නේ. 2025දී කවුරු පිළිබඳ චෝදනා ආවත් නිලධාරින් පිළිබඳ චෝදනාවක් නැහැ. හැබැයි, මේ කියන්න යන කාරණා අපි අවධානයට ගත යුතුව තිබෙනවා.

පළමුවැනි කාරණාව මෙකයි. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනයට වෙන් කරපු මුදල රුපියල් මිලියන 500යි. මම මේ කියන්නේ, 2025 අයවැය ප්‍රගති වාර්තාවේ 30වන පිටුවෙන්. හැබැයි, එහි ප්‍රගතිය සියයට 0යි. තරුණ ව්‍යවසායකයන්, තරුණ කෘෂිකර්ම ව්‍යවසායකයන් බිහි කරන්න එම අයවැයෙන් වෙන් කර තිබුණා රුපියල් මිලියන 500ක මුදලක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එහි ප්‍රගතිය සියයට 0යි. අපනයන කෘෂිකර්ම භෝග ප්‍රවර්ධනයට වෙන් කරපු මුදල රුපියල් මිලියන 100යි; ප්‍රගතිය සියයට 0.4යි. පොල් වගාවට වෙන් කළා, රුපියල් මිලියන 600ක්. වැය කළ මුදල රුපියල් මිලියන 299යි. ඒක ටිකක් හොඳයි. මොකද, සියයට 50ක ප්‍රගතියක් තිබෙනවා. ව්‍යවසායකත්ව සංවර්ධනයට වෙන් කරපු රුපියල් මිලියන 500ට අදාළ ප්‍රගතිය සියයට 0ක් වනකොට, SMEsලා වෙනුවෙන් ණය යෝජනා ක්‍රමයක් සඳහා මෙවර වෙන් කර තිබෙනවා, රුපියල් බිලියන 80ක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙහිදී සාධාරණ තර්කයක් නැඟෙනවා, රුපියල් මිලියන 500 වියදම් කර ගන්න බැරි වෙච්ච කණ්ඩායමක්, රුපියල් මිලියන 80,000ක ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලා. මේ විධියට කොළයට, ලේඛනයට විතරක් සීමා වුණොත්, 2026 අවුරුද්දේ දෙසැම්බර් මාසයේ මේ අය වැය ගැන කථා කරන විටත්, නැවත වතාවක් එකම සංඛ්‍යාලේඛන ටික ගැනම තමයි අප හැමෝටම කථා කරන්න වෙන්නේ. ඒ නිසා මම ඒ කාරණය කෙරෙහි ඔබතුමන්ලාගේ විශේෂ අවධානය යොමු කරවනවා. අමාත්‍යාංශ මට්ටමින් තිබෙන ප්‍රගතිය මේක නම්, අප වගා කරන ඉඩම් ප්‍රමාණය වගා කරලා ලබා ගත්තු සංවර්ධනය මේක නම්, වෙන් කරපු මුදල්වලට අදාළව ලබපු ප්‍රගතිය මේක නම් මේ පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියගේ අවධානයට යොමු කළ යුතු තවත් කාරණාවක් තිබෙනවා. ඒ තමයි, ඉඩම් හිමිකම පිළිබඳ ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, "උරුමය" කියලා වැඩසටහනක් කලින් තිබුණා. ඊයේ දිනයේ ඒ සම්බන්ධයෙන් සභාව කල් තැබීමේ යෝජනාවක් ද ඉදිරිපත් කර තිබුණු බව කියැවුණා. මම ඒ අවස්ථාවට සහභාගි වුණේ නැහැ. ඔබතුමා ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට ඒ ගැන කියද්දීයි මම දැනුවත් වුණේ. "උරුමය" වැඩසටහනේදී විශාල පිරිසකට ඔප්පු ලබා දීම සඳහා ඒ අයගෙන් ලේඛන කැඳවුවා; මැනුම් කටයුතු කළා.

30,000කට විතර ඔප්පු ලබා දුන්නත් තවත් විශාල පිරිසකට ඔප්පු ලබා දෙන්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා ඒකට අදාළව චක්‍රලේඛය, ලියුම ගහලා තිබෙන්නේ 10වැනි මාසයේයි. අවුරුද්දේ මාස 10ක් යනකල්ම අඩුම ගණනේ "උරුමය" ඔප්පු දුන්නේත් නැහැ, අවසානයේදී "හිමිකම" ඔප්පුත් නැහැ. මාස 10ක් යනකල් "උරුමය" ඔප්පු දෙන්නේත් නැතුව ඉඳලා, "හිමිකම" ඔප්පු දෙන්නේත් නැතුව ඉඳලා 10වැනි මාසයේදී තමයි ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා ලියුම ගහන්නේ, ඉඩම් අවසරපත්‍ර තිබෙන අයට, දීමනාලාභින්ට "හිමිකම" වැඩසටහන යටතේ ඔප්පු ටික ලබා දෙන වැඩ පිළිවෙළ නැවත වතාවක් හදන්න කියලා. එහෙම නම්, මේ මාස 10 ඇතුළත මැනුම් කරපු, විස්තර - තොරතුරු - එකතු කර ගත්තු මිනිසුන්ට මොකක්ද වෙන්නේ? ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව තිබෙන්නේ බරපතළ ප්‍රශ්නයක්. මේ කථා කරන මහජන නියෝජිතයන් 225දෙනාට නොවෙයි, ඒ වැඩසටහන පිටුපස ඉන්න නිලධාරීන්ට ඒ කටයුත්ත කරන්න පුළුවන්. මොකද, ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ ඔප්පු ටික හැදුවා නම්, "හිමිකම" කියන නම වෙනස් කරලා පසුවදාම ඒ ටික release කරන්න ඔබතුමන්ලාට පුළුවන්. ජනවාරි ඉඳලා ගත්තාම අප අද මේ කථා කරන මාසය 11වැනි මාසයයි. 11වැනි මාසය වනකොටත් ඒ ජනතාවට හිමිකමත් නැහැ; උරුමයත් නැහැ. එහෙම නම් මේක බරපතළ ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවනවා. මේක "හිමිකම" ද, "උරුමය" ද කියන එක ප්‍රශ්නයක් කර ගන්න එපා. හැමදාම වුණේ, ආණ්ඩු මාරු වෙන කොට තිබුණු වැඩසටහන්වල නම වෙනස් වුණු එකයි. ඒ නිසා ඔබතුමන්ලාත් මෙහි නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. නම වෙනස් කළාට කමක් නැහැ. හැබැයි, අවසානයේ ඔප්පුව ඒ මිනිසුන් අතට ලැබෙන වැඩ පිළිවෙළ කඩිනම් කරන්න කියන ගෞරවනීය ඉල්ලීම අපි ඔබතුමාගෙන් කරනවා.

මට තවත් වැඩි වෙලාවක් නැති නිසා අවසාන වශයෙන් කියන්න ඕනෑ, මේ පවතින ආපදා තත්ත්වය ගැන. ගරු ඇමතිතුමනි, මේ පවතින ආපදා තත්ත්වය නිසාම ඔබතුමාත්, අපත් නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ land use plan එක පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. ඒ පිළිබඳව නිසි වැඩ පිළිවෙළක් කඩිනමින් හදන්න, ගරු ඇමතිතුමනි. වතුකරයේ ජනතාව LRC ඉඩම්වල, JEDB ඉඩම්වල ඉන්නවා. අද ජනාධිපතිතුමා ආපු රැස්වීමේදීත් අපි ඒ ගැන කිව්වා. සොගම වතුයාය ගත්තොත්, සැන්කුවාර් වතුයාය ගත්තොත්, ඒ ඉඩම්වල වතු පවුල් ගණනාවක් ඉන්නවා. අද ඒ අය "ගොවිසෙවණ" හෝ වෙනත් තැනකට හෝ ගෙනැල්ලා දමන්න ඕනෑ. ඒ කණ්ඩායම් ටික ඒ තැන්වලින් ඉවත් කරලා, නිවාස සාදා දෙන්න පුළුවන් ඉඩම් ටික හරියට හඳුනා ගෙන, ඒ නිවාස වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන සැලසුමක් අපි හදන්න ඕනෑ.

අවසාන වශයෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ ඉල්ලීම කරන්නේ මහනුවර දිස්ත්‍රික්කයට විතරක් සීමා වෙච්ච කාරණාවක් සම්බන්ධයෙන් නොවෙයි. ගරු ඇමතිතුමනි, ලංකාව පුරා ක්‍රියාත්මක කළ යුතු land use plan එක හදන්න. වගා කරනවා නම් කොහේද වගා කරන්නේ, පදිංචි වෙනවා නම් කොහේද පදිංචි වෙන්නේ කියන කාරණා පිළිබඳ land use plan එක විධිමත්ව හදලා ඒකට අනුව වැඩ පිළිවෙළ කරගෙන යන්න කියන ගෞරවනීය ඉල්ලීමයි මා කරන්නේ. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු නීතිඥ රවූෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 11.53]

**ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද දින විවාදයට ගැනෙනවා, වැදගත් අමාත්‍යාංශයක් ලෙස සැලකෙන, අපේ දිස්ත්‍රික්කයේ නායකයා වන ගරු ලාල් කාන්ත මැතිතුමා අමාත්‍ය ධුරය දරන කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කියන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත්. නමුත්, අපට අද වැඩියෙන්ම කථා කරන්න වෙලා තිබෙන්නේ ආපදා තත්ත්වය පිළිබඳවයි. ඒ ගැන සමාවෙන්න ඕනෑ. අප දිස්ත්‍රික්කයේ නොයෙකුත් පළාත්වලින් උතුරන නොයෙකුත් ගංගා පිළිබඳ තොරතුරු දැන් ලැබෙමින් තිබෙනවා. විශේෂයෙන්ම දැන් මට තොරතුරක් ලැබුණා, උඩුදෙනියට උඩින් පිහිටා තිබෙන "මුරපොළ ඇළ" සම්බන්ධයෙන්. ඒක කන්ද හන්දියේ ඉඳලා දෙහල්කඩ හරහා යන වාරිමාර්ග ඇළක්. ඉතින්, ඒ ඇළ උතුරලා ගල් පහළට කඩා වැටෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන් තලාතුඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උඩුදෙනිය ගම්මානය විශාල ලෙස අවදානම් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේ අවදානම් තත්ත්වයට බලපාන කාරණාවක් හැටියට අපි දකින්නේ එතැන තිබෙන ගල් වළක්. එතැන නිතරම වෙඩි බෙහෙත් පාවිච්චි කරන නිසා ඇති වන දෙදරීම මේවාට හේතුවක් වෙලා තිබෙනවා. UGD කියන සමාගමෙන් පවත්වාගෙන යන මේ ගල් වළ පිළිබඳව නැවත පරීක්ෂණයක් කරන්න වෙයි, මේ ගම්මානය බේරාගන්න නම්. එතැන තිබෙන දෙදරීම තමයි මේකට හේතු වෙලා තිබෙන්නේ කියලා දැන් ගම්වාසීන් කියනවා. එවැනි තත්ත්වයක් තමයි උදා වෙලා තිබෙන්නේ. ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය හරහා නැවත වාරයක් මේ පිළිබඳ පරීක්ෂා කළ යුතුයි කියලා මම ඉල්ලා සිටිනවා. මේ ගම්මානයේ සිට දෙල්තොට දක්වා යන මාර්ගයේ ගමනාගමනයට බාධාවක් සිදු වෙන තත්ත්වයක් දැන් උදා වෙලා තිබෙනවා. මේ කාරණයත් එක්ක තවත් කාරණා කිහිපයක්ම සඳහන් කරන්න තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු ඇමතිතුමනි, ඉඩම් පිළිබඳ ප්‍රශ්න තිබෙන නොයෙකුත් පැරණි ගම්මාන තිබෙනවා. 1947දී ඇති වූ විශාල ගංවතුර හානියෙන් පස්සේ 1950 ගණන්වල ඇති කරපු කළුගමුව ජනපදය කියන ජනපදය ගැන ඔබතුමා දන්නවා. ගෙලිඔයට ආසන්නවම තිබෙන ඒ ජනපදය ඇත්තටම ගම්පොළ ආසනයේ එක කොණක තිබෙන්නේ. මේක උඩුනුවර ආසනයට යාබදව තිබෙන විශාල ගම්මානයක්. එය 4,500ක් පමණ ජනතාවක් ජීවත් වන ගම්මානයක්. ඒ ගම්මානයේ තිබෙන ප්‍රශ්නය මේකයි. ඒ ජනපදය ඉදිකරලා අවසර පත්‍ර ලබා දුන්නාට තවම නිසි ඔප්පු ලබා දීලා නැහැ. සියයට 30ක් වැනි සුළු කොටසකට ඔප්පු ලබා දීලා තිබෙනවා. සියයට 70ක් වන විශාල පිරිසකට කිසිම ඔප්පුවක් ලබා දීලා නැහැ. ඒ නිසා ඔවුන්ට ව්‍යාපාරයක් ලියාපදිංචි කරගන්න බැහැ. ඒ ඉඩම්වල ගෙවල් හැදිලා තිබෙනවා. නමුත් ඒවා කාටවත් පවරන්න බැරි තත්ත්වයක් තිබෙනවා. දැන් ඒවායේ පවුල් කිහිපයක් ඇති වෙලා, ඒ පවුල් අතර පොඩි පොඩි ආරවුල් ඇති වෙන තත්ත්වයකුත් තිබෙනවා. මේ තත්ත්වය නිසා දිගටම ගම්මානයේ ජනතාවගෙන් විශාල ඉල්ලීමක් තිබෙනවා. මේක ගැන අපේ අනුරාධ ජයරත්න මැතිතුමාත් කථා කළා. එතුමාගේ තාත්තාගේ කාලයේ කිහිප දෙනෙකුට ඉඩම් ඔප්පු ලබා දුන්නා. නමුත් විශාල පිරිසකට තවම ඉඩම් ඔප්පු ලැබිලා නැහැ. "ස්වර්ණ භූමි" ඔප්පු ලබා දුන්නා. ඊට පසුව "රණ භූමි" කියලා එකක් තිබුණා. ඒ නොයෙකුත් ක්‍රියාදාම හරහා ඔප්පු ලබා දුන්නාට, විශාල පිරිසකට තවම ඉඩම් ඔප්පු ලැබිලා නැති ප්‍රශ්නය තිබෙනවා. ඒ

[ගරු නිතිඥ රවුෆ් හකීම් මහතා]

නිසා ඉඩම් කච්චේරියක් තියලා ඒ පළාතේ ජනතාවට තිබෙන ඒ ඔප්පුවල ප්‍රශ්නය නිරාකරණය කර දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒත් එක්කම *[බාධා කිරීමක්]* LRC එකට අයත් ඉඩම් තමයි, ලාල් කාන්ත ඇමතිතුමනි. මේක කලින් රබර් වත්තක් හැටියට තිබුණේ. ඒ වාගේම මහවැලියට අයත් ඉඩම් තිබෙනවා. ගඟ ආශ්‍රිතව මහවැලි අධිකාරියට අයත් ඉඩම් කිහිපයකුත් තිබෙනවා. LRC ඉඩම් තමයි වැඩිපුරම තිබෙන්නේ, විශේෂයෙන්ම එය රබර් වත්තක් බැවින්. ඒවාට තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඔබතුමා මැදිහත් වෙලා ඒකට පිළිතුරක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම පුත්තලම දිස්ත්‍රික්කයේ මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුලුදිවයල් කියන ප්‍රදේශයේ මුදලියාර් සේනෙයි කියන ප්‍රදේශයේ තිබෙනවා, වගා ඉඩම් කිහිපයක්. සිය දෙනෙක් විතර වගා කටයුතු කරන ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. ඒවාට LRC එක හරහා ඔප්පු ලබා දෙනවා කියලා මුදල් ලබාගෙන රිසිට් පවා ලබා දීලා තිබෙනවා. දැන් කියනවා ලු, "ඔප්පු ලබා දිය නොහැකියි. අපි ඒක දීර්ඝ කාලීන බදු හැටියට ලබා දෙනවා" කියලා. නමුත් මේ ජනතාව අවුරුදු හතළිහකට වැඩිය වගා කරගෙන හිටපු ඉඩම්, මේවා. මුන්දලම ප්‍රාදේශීය ලේකම් හරහා පුලුදුවයල් ප්‍රදේශයේ මුදලියාර් සේනෙයි කියන ප්‍රදේශයේ ජනතාවට තිබෙන මේ දීර්ඝ කාලීන ප්‍රශ්නය නිරාකරණය කර දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම, මම විෂයභාර අමාත්‍යවරයා වෙලා හිටපු කාලයේ ඒ ප්‍රදේශයට නළ මාර්ගයෙන් වතුර ලබා දීම සඳහා පයිප්ප පද්ධතියක් ගෙනාවා. නමුත් දැන් ඒක අරගෙන යන්න හදනවා කියලා ගම්වාසීන් උද්ඝෝෂණය කරනවා. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හරහා ඉඟිනිමිටිය වැවෙන් මේ පයිප්ප මාර්ගය හරහා Puttalam-South Water Supply Project එක යටතේ ඒ පළාතට ජලය ලබා දීමේදී ඇති වූ මේ ප්‍රශ්නය පිළිබඳවත් ඒ ප්‍රදේශවල ජනතාව සඳහන් කරනවා. එය ඒ ගම්මානයේ ප්‍රශ්නයක් හැටියට දැන් මතු කර තිබෙනවා.

නොයෙකුත් ප්‍රදේශවල ඉඩම් පිළිබඳව මේ වාගේ ප්‍රශ්න තිබුණත් ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් වාරිමාර්ග ක්ෂේත්‍රය ගැනත් කථා කරන්න ඕනෑ. ගංවතුර ප්‍රශ්නය දැන් ව්‍යාකුල වෙලා තිබෙනවා. ඒ නිසා ගොවීන්ට විශාල ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. මේවා සංරක්ෂණය කිරීම සඳහා අපට වැඩ පිළිවෙළක් නැහැ. මම නම් යෝජනා කරන්නේ අපි මේ ගංගා ද්‍රෝණි, මිටියාවත් ආරක්ෂණය සඳහා වූ ජාතික මට්ටමේ අධිකාරියක් වෙනම සෑදිය යුතුයි කියලායි. නැත්නම් මේවා නොයෙකුත් ආයතන යටතේ තිබෙන ගංගා හැටියට තිබෙන්න පුළුවන්. ගංගා නිම්න වාගේම ගංගා ද්‍රෝණි ආරක්ෂා කිරීමේ කටයුත්තට කවුරුත් වගකියන්නේ නැහැ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වැනි නොයෙකුත් ආයතන යටතේ තිබෙන ගංගා 100කට වැඩිය තිබෙනවා. නමුත් මේ ගංගා මිටියාවත්වලින් විශේෂයෙන්ම පහළ නිම්නයේ තිබෙන ප්‍රශ්නවලට විසඳුමක් හැටියට අඩුම වශයෙන් අපි ඒ ගංගා පිළිබඳව සැලකිල්ල යොමු කරන්න ඕනෑ. ඒ ගංගා මිටියාවත තමයි විශේෂයෙන්ම වැඩිම ජනවාස තිබෙන ගංගා මිටියාවත හැටියට අපි හඳුනාගන්නේ. අඩුම වශයෙන් මහවැලි ගඟ, මල්වතු ඔය, මහ ඔය, දැදුරු ඔය, කැළණි ගඟ, අත්තනගලු ඔය, කලා ඔය, ගිං ගඟ, නිල්වලා ගඟ, ගල් ඔය කියන ගංගා 10 සම්බන්ධයෙන්වත් ගංගා ද්‍රෝණි සංරක්ෂණ අධිකාරිය හැටියට ආයතනයක් පිහිටුවලා, ඒවා පිළිබඳ යම් දීර්ඝකාලීන සැලැස්මක් ඇති කරන්න උත්සාහ කළොත් හොඳයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙනුත් මම අසා සිටියා, මේ මහවැලි අධිකාරිය පිළිබඳව. ඒකේ අනාගතය පිළිබඳව අරගෙන තිබෙන තීරණය මොකක්ද කියලා මම ඇහුවා. මොකද, කථාවක් තිබුණා, මේක සම්පූර්ණයෙන්ම අහෝසි කරනවා කියලා. ඔබතුමා කිව්වා, "ඒක එහෙම අහෝසි කරන්න යන්නේ නැහැ. අපි ටික කාලයක් ඒක පවත්වාගෙන යනවා" කියලා. මොකද, ඒක අහෝසි කරන්න ගියොත් විශාල ප්‍රශ්නයක් මතු වෙනවා. මොකද, ඊට සම්බන්ධ නීතිමය කටයුතු රාශියක් තිබෙනවා, නඩු ගණනාවක් තිබෙනවා. මම පිළිගන්නවා, නොයෙකුත් ආණ්ඩු විටින් විට තමන්ගේ ආධාරකරුවන්ට ඒ හරහා නොයෙකුත් විධියේ සැලකීම් කළා මිස, අහිංසක ගොවීන්ට එච්චර සෙතක් වෙලා නැහැ කියලා. ඒ නිසා මේ ගංගා නිම්නවල, ගංගා ද්‍රෝණිවල ආරක්ෂාව පිළිබඳව ජාතික වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මොකද, ඒක පානීය ජලය සම්බන්ධයෙනුත් අවශ්‍යයි. ඒ වාගේම වාරි ජලයටත් ඒ ප්‍රශ්නය තිබෙනවා. මේවා ඔක්කෝම ආරක්ෂා කර ගැනීම සඳහා අපි යම් ක්‍රියාදාමයකට අවතීර්ණ වෙන්න ඕනෑ කියලා මම කියනවා.

ඔබතුමන්ලාගේ මෙවර අය වැයේදී පහළ මල්වතු ඔය ව්‍යාපෘතියට රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා කියලා විතරක් සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම, කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතියට සහ තවත් ව්‍යාපෘතියකට විදේශ ආධාර සෙවීම සඳහා ප්‍රයත්නයක් දරනවා කියලා සඳහනක් තිබෙනවා මිස වෙන කටයුත්තක් පිළිබඳ කියලා නැහැ. නමුත් ගියවර කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය පටන් ගන්නවා කියලා පොරොන්දුවක් දීලා තිබුණා. නමුත් දැන් කුඹුක්කන් ඔයට කුමක්ද වෙන්නේ කියන එක පිළිබඳව කථාවක් නැහැ. කුඹුක්කන් ඔයට පහළ තිබෙන තවත් ව්‍යාපෘතියක් තමයි හැඩ ඔය ජලාශ ව්‍යාපෘතිය.

මේ හැඩඔය ව්‍යාපෘතිය පිළිබඳවත් විශාල ප්‍රශ්නාර්ථයක් තිබෙනවා. ඒක ක්‍රියාත්මක කළ යුතුයි කියලා ඒ පිළිබඳව ශක්‍යතා වාර්තා හදලා තිබුණා. පානීය ජලය ලබා දීම සඳහා නැඟෙනහිර පළාතට අවශ්‍ය වුණේ වාරි ජලය විතරක් නොවෙයි. යාන් ඔය ව්‍යාපෘතිය, මුන්දෙනිආරු, හැඩඔය ව්‍යාපෘතිය මේ තුනම ක්‍රියාත්මක කරන්න ඕනෑ. නැඟෙනහිර පළාතේ සංචාරකයන් වැඩියෙන් එන ප්‍රදේශ වන කුච්චවේලි ආශ්‍රිත ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ වෙරළබඩ ප්‍රදේශවල හෝටල් ගණනාවක් ඉදිවෙලා තිබෙනවා. නමුත් ඒවාට පානීය වතුර නැහැ. යාන්ඔය ව්‍යාපෘතිය හරියට ක්‍රියාත්මක කළා නම්, අපට ඒක සාර්ථක කරගන්න පුළුවන්. ඒක, එක ව්‍යාපෘතියක්. මුන්දෙනිආරු පිළිබඳව සඳහනක් වෙලා තිබෙනවා. නමුත් මුන්දෙනිආරු ව්‍යාපෘතියේ රුගම් ජලාශය හා කිතුල් ජලාශය මේ දෙකම එකතු කරලා විශාල වැව් පද්ධතියක් හදන්න සැලසුමක් තිබෙනවා. නමුත් ඒ සැලසුම ක්‍රියාත්මක කරන්න අවශ්‍ය මුදල් නැති තත්ත්වයක් තමයි අපි දකින්නේ.

හැම අය වැයකදීම මුන්දෙනිආරු ගැන සඳහන් කරනවා. නමුත් කිසි දෙයක් සිද්ධ වෙලා නැහැ. කුඹුක්කන් ඔය ගැන සඳහන් වෙනවා. කිසි දෙයක් සිද්ධ වෙලා නැහැ. හැඩඔය ගැන සඳහනකුත් නැහැ. හැඩඔය, මුන්දෙනිආරු සහ යාන්ඔය නැඟෙනහිර පළාතට අවශ්‍ය වාරිමාර්ග ව්‍යාපෘති විතරක් නොවෙයි, පානීය ජලය ලබා ගන්න තිබෙන ජල ව්‍යාපෘති. විශේෂයෙන් සංචාරකයන් එන එක වැඩි කරගන්න අපි බලාපොරොත්තු වෙනවා. හෝටල් ඉදිකරන්න උත්සාහ කරනවා. හෝටල් රාශියක් ඉදි වෙලා තිබෙනවා. නමුත් හෝටල්වල පානීය ජලයට විකල්ප මාර්ග තමයි ඒගොල්ලන්ට හොයන්න වෙලා තිබෙන්නේ. එබැවින් මේ ව්‍යාපෘති තුන පිළිබඳවත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්නන කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තවත් වැදගත් ව්‍යාපෘතියක් තමයි ගිං-නිල්වලා ව්‍යාපෘතිය. ඒ ගැනත් සඳහනක් වෙලා තිබෙනවා. විශේෂයෙන් මේ වර්ෂාපතනය එන වෙලාවේ ගිං, නිල්වලා ගංගා පිටාර ගැලීමෙන් ඒ ගංගා නිම්නවල සිදුවන වගා හානි ගැන අපට කථා කරන්න සිදු වේවි. මේ මුහුදට එකතු වෙන ජලය - අපතේ යන ජලය - වෙනස් කරන්න නම් ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපාරය අපි ක්‍රියාත්මක කළ යුතුයි. ඒ ගැන කිසිම සඳහනක් නැහැ. නමුත් හම්බන්තොට දිස්ත්‍රික්කයට පානීය ජලය ලබා දිය යුතුයි කියලා කථා කරනවා. කොහෙන්ද පානීය ජලය ලබා ගන්නේ? එතැන තිබෙන වැව් හරහා විතරක් මේක කරන්න පුළුවන් කියන එක මිථ්‍යාවක් විතරයි. නමුත් ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපාරය ගැන කලින් ලොකු දෝෂාරෝපණයක් තිබුණා, "ඒ සඳහා රුපියල් මිලියන 4,000ක් වැනි මුදලක් වෙන් කළාට ඒ මුදල් කොහෙන් හරි නැති වුණා. දැන් ඒක හොයා ගන්නත් නැහැ" කියලා. ඒ පිළිබඳව විශාල වංචාවක් වුණා කියලා කථා කළා. ඒ වංචාව පිළිබඳව කිසිම කථාවක් නැහැ.

ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපාරය පිළිබඳව යම් කටයුත්තක් කළ යුතුයි කියලා මම බලාපොරොත්තු වෙනවා. 2040 වනකොට හම්බන්තොට දිස්ත්‍රික්කයට ජලය කියුබික් මීටර් 90,000ක් අවශ්‍යයි කියලා කිව්වාට හරි යන්නේ නැහැ. නමුත් අපි මේකට ක්‍රමවේද හොයන්න ඕනෑ. එහෙම හොයන්න තිබෙන එකම මාර්ගය මේකයි. අපි නිතරම ගංවතුර පාලනය පිළිබඳව කථා කරනවා. ඊයේ පෙරේදාත් මම කථා කළා. SLLDC කියන ඉඩම් සංවර්ධනය කිරීමේ ආයතනය තමයි විශේෂඥ දැනුම තිබෙන ආයතනය. කොළඹ, ගම්පහ, ගාල්ල, අම්පාර, මන්නාරම, පුත්තලම වැනි නගරවල තිබෙන ගංවතුර උවදුර පාලනය කිරීම සඳහා ශක්‍යතා වාර්තා හදන්න එම ආයතනයට රුපියල් මිලියන 250ක් වෙන් කරලා තිබෙනවා කියලා අය වැය කථාවේදී ජනාධිපතිතුමා සඳහන් කළා. දැනටම ශක්‍යතා වාර්තා කිහිපයක් හදලා තිබෙනවා. ඒක කරන්න තවත් රුපියල් මිලියන 250ක් ලබා දීලා තිබෙනවා. මධ්‍ය කාලීන වැඩ පිළිවෙළක් හැටියට, medium-term Budgetary framework එක ඇතුළේ මේක ලබා දෙනවා කියලා තිබෙනවා. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවත් එක්ක, නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක - ඒක දැන් බිමල් රත්නායක මැතිතුමා යටතේ තිබෙන ආයතනයක්- එකතු වෙලා, ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ ආයතන ප්‍රධානීන් කැඳවලා මේ පිළිබඳව කටයුතු කරන්න කියලා මම අමාත්‍යතුමාගෙන් ඉල්ලනවා. මොකද, ජනාකීර්ණ නාගරික ප්‍රදේශවල ඇති වෙන ගංවතුර පාලනයට ගත යුතු ක්‍රියාමාර්ග සඳහා මේ රුපියල් මිලියන 250 උපයෝගී කර ගෙන අවශ්‍ය ශක්‍යතා වාර්තා හදන්න කටයුතු කරන්න. දැන් අම්පාර දිස්ත්‍රික්කයේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මඩකලපුව දිස්ත්‍රික්කයේත් විශාල ප්‍රදේශයක් යට වෙලා තිබෙනවා. මේවාට බලපෑ හේතු ඔක්කොම හොයලා, අවශ්‍ය කාණු පද්ධතිය සකස් කළ යුතුයි. හැම තැනම මෝය කටවල් හැදිලා. ඊළඟට ගංගා ද්‍රෝණි ආරක්ෂිත අධිකාරිය කියලා ජාතික ආයතනයක් පිහිටුවා, මේ රටේ මතුපිට තිබෙන ගංගා ආරක්ෂා කිරීම සඳහා කටයුතු කළ යුතුයි කියන එක නැවත වාරයක් මම අවධාරණය කරනවා. ඒවා පානීය ජලය, වාරි ජලය වැනි අවශ්‍යතාවලට පාවිච්චි කිරීමට අවශ්‍ය පරිදි සකස් කළ යුතුයි. ඒ සඳහා සැලැස්මක් හදන්න කියලා ඉල්ලා සිටිමින්, මගේ කථාව සමාප්ත කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.10]

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මේ, රටක් ආපදාවට ලක් වෙලා තිබෙන මොහොතක්. මේ මොහොත වන විට මගේ දිස්ත්‍රික්කයේ - බදුල්ල දිස්ත්‍රික්කයේ - ජීවිත 29ක් අහිමි වෙලා තිබෙනවා. ඇළ වේලි, අමුණු පමණක් නොවෙයි, නිවාස පවා විශාල ප්‍රමාණයේ ආපදාවලට ලක් වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ අපේ රාජ්‍ය නිලධාරින් ඉතාම යුහුසුලුව කටයුතු කරනවා. ඒ සඳහා අපිත් ඉතා ඉක්මනින් මැදිහත්වීමක් කරනවා. අද රාත්‍රී 7.00ට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව රැස් වෙලා දිස්ත්‍රික්කයේ ආපදා තත්ත්වයන්ට මුහුණ දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පසුගිය කාලයේම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ආපු චෝදනාවක් තමයි, "කෝ ඔයාලාගේ භෞතික ප්‍රගතිය?" කියන එක. ඒ නිසා මම රටේ ප්‍රගතිය නොවෙයි, අපේ දිස්ත්‍රික්කයේ ප්‍රගතිය සම්බන්ධව කථා කරන්නම්. මේ වෙනකොට අපේ දිස්ත්‍රික්කයේ මූල්‍ය ප්‍රගතිය සියයට 74.79යි; භෞතික ප්‍රගතිය සියයට 81.67යි. අපි මේක ගත්තේ කොහොමද? ඔබතුමන්ලා අපට ඉතිරි කර ගිය රාජ්‍ය නිලධාරින්ගෙන් තමයි අපි මේ ප්‍රගතිය ලබා ගත්තේ. ඉතාම අඩු ඉංජිනේරුවන් සංඛ්‍යාවක්, කාර්මික නිලධාරින් සංඛ්‍යාවක් සිටින මොහොතක තමයි මේ ප්‍රගතිය ලබා ගත්තේ. 2024දී ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන, වතුයටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙන් මිලියන 700ක් වෙන් කරනකොට, අපි මිලියන 2,800ක් වෙන් කරලා භෞතික ප්‍රගතිය ඉතා ඉහළින් ගත්තා. ඒ වාගේම තමයි කෘෂිකර්ම අමාත්‍යාංශයත්. අපි ඉතා ඉහළින් ඒ භෞතික ප්‍රගතිය අත්පත් කර ගත්තා.

මම ජීවත් වෙන්නේ මහියංගනය ආසනයේ. මහියංගනය ආසනයේ "සී" කලාපය තුළ ගොවි සංවිධාන 51ක් තිබෙනවා. අපි ගොවි සංවිධාන 40කට රුපියල් ලක්ෂ 10 ගණනේ දුන්නා. අපි ඔවුන්ට කිව්වා, ශ්‍රම දායකත්වයෙන් මේ වැඩේ කරන්න කියලා. ඔවුන් ලක්ෂ 10කට, ලක්ෂ 12ක 13ක වැඩ කළා. ව්‍යාපෘති 40න් 39ක වැඩ අවසන් කළා. කාර්මික නිලධාරින් දෙදෙනායි හිටියේ; එක ඉංජිනේරුවරයායි හිටියේ. හැබැයි, මිනිස්සු එකතු වෙලා මේ වැඩේ ගොඩ දැම්මා. ඒ තමයි මේ ආණ්ඩුවේ හැටි. ඒක තමයි ඔබතුමන්ලා සහ අප අතර තිබෙන වෙනස. වෙනදා ලක්ෂ 10ක් දුන්නා නම්, ගොවි සංවිධානයේ සභාපති, රජයේ නිලධාරින්, එහෙම නැත්නම් මන්ත්‍රීවරයා මැදිහත් වෙලා ඒකෙන් සියයට 10ක්, 20ක් ගසා කනවා. හැබැයි, අපි සියයට 120ක, 130ක ප්‍රගතියක් පෙන්වා තිබෙනවා. ඒ වාගේම තමයි සුළු වාරිමාර්ග, මහා වාරිමාර්ග කටයුතු. අපි 2025 අවුරුද්දේත් සැලකිය යුතු ප්‍රමාණයක් කළා.

2026දී අපේ ඉලක්කය මොකක්ද? ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සාම්ප්‍රදායික ගොවියා, රුපියල පමණක්ම හොයන ගොවියා ඩොලර් හොයන ගොවියෙක් බවට පත් කිරීම තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. මහියංගනය ආසනයෙන්, වියලුව ආසනයෙන්, එහෙම නැත්නම් බදුල්ල දිස්ත්‍රික්කයෙන් ඩොලර් උත්පාදනය කරන ගොවියන් හදන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. මහියංගනය "සී" කලාපයේ අක්කර 1,050ක් විශාල ඉතා දැවැන්ත බිමක් තිබුණා. අපි ඒකට කිව්වේ සත්ව ගොවිපොළ කියලා. වසර 20කට, 25කට ආසන්න කාලයක් තිස්සේ ඒ බිම වල් වැදෙමින් තිබුණේ. හැබැයි, අපි දැන් ඒ සඳහා

[ගරු සුදත් බලගල්ල මහතා]

ආයෝජකයෙක් ගේනවා. කවුද? දේශීය ආයෝජකයෙක්. අක්කර 200ක පැෂන් ෆෲට් වගාව, අක්කර 200ක වෙනත් පලතුරු වගාව, සම්පූර්ණයෙන් අක්කර 650ක් ඒ විධියට වගාවට ගන්නවා. ඉතුරු බිම් කොටස් වෙනත් කර්මාන්තවලට ගන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සෘජු රැකියා 2,500ක් එක්ක 2026 වසරේ අපි ඒ සත්ව ගොවිපොළේ වැඩ ආරම්භ කරනවා. මේ, වසර 20ක්, 30ක් තිස්සේ වල් වැදෙමින් තිබුණු බිමක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි,"සඳුන් වගා භූමිය" කියලා එකක් තිබුණා. දේශපාලකයින්ගේ හයියට යම් පිරිසක් ඇවිල්ලා එතැන වැඩ කරමින් සිටියා; එතැන අක්කර 130ක්. අපි වාරි ඉඩමක් නැති විවාහක ගොවීන් සඳහා අක්කරය බැගින් එම භූමියෙන් අක්කර 100ක් දෙනවා. ඉතිරි අක්කර 30 ආයෝජකයෙකුට දෙනවා. ඔහු පලතුරු ෆැක්ටරියක් ගහනවා, ගොවීන් පලතුරු වගා කරනවා. අපි ඒ සියලු පලතුරු නිෂ්පාදන පිට රට යවන්න අවශ්‍ය වැඩ කටයුතු කරමින් යනවා. ඒ අනුව ඩොලර් උත්පාදනය කරන ගොවියෙක් හැදීම තමයි අපේ අරමුණ. අපි ඒ අරමුණ කරා ළඟා වනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මහියංගනය, රිදීමාලියද්දේ තිබුණා, පැහිරි වගාව කළ භූමියක්. කාලයක් තිස්සේ ඒ භූමිය බෙදාගෙන හිටියේ දේශපාලකයෝ; එතැන අක්කර 500යි. අපි ඒකට හොඳ ආයෝජකයෙක් ගේනවා. රිදීමාලියද්ද කියන්නේ ලංකාවේ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් එකක්. අපි අලුත් ආයෝජන හොයාගෙන යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි බලයට පත්වෙලා තවම අවුරුද්දයි. ඒ අවුරුද්ද ඇතුළතයි අපි මේ වැඩ පටන් ගත්තේ.

ඔබ කවුරුත් දන්නවා, මහියංගනය, වේවත්ත, දඹාන කියන ප්‍රදේශය අතිදුෂ්කර ප්‍රදේශයක් බව. එක වාරි කර්මාන්තයක්වත් තිබුණේ නැහැ. අපි යෝජනා කරලා තිබෙනවා, 2026දී පුල්ලගස්යාය වැව හදන්න. ඒ සඳහා සැලකිය යුතු මුදලක් යනවා. ඒ වැව හැදුවාට පස්සේ පහළින් තිබෙන බකිනිගහඋල්පත වැව, පහළින් තිබෙන ගොන්ඔළුව වැව, පහළින් තිබෙන මීවැත්තේ වැව කියන වැව් ඔක්කෝම පුරවන්න පුළුවන්. හේන් වගාව පමණක් කරගෙන හිටපු ගොවීන්ට යල මහ දෙකම අස්වද්දන්න පුළුවන් සරු බිමක් අපි හදලා දෙනවා. අවු කාෂ්ටකයට හැම දාමත් ඉරිතළපු භූමියට අපි පණ අරගෙන දෙනවා. එහෙම සැලසුමක් එක්කයි අපි මේ ගමන යන්නේ, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි.

ඒ විතරකුත් නොවෙයි. අවුරුදු ගාණක් තිස්සේ කරගෙන ගිය සති පොළක් මහියංගනයේ තිබුණා. ඒ, ඌව පළාතේ තිබෙන දෙවෙනි වැඩිම ආදායම ගන්න පොළ. හැබැයි ඒ සඳහා ස්ථිර බිමක් තිබුණේ නැහැ. අපි 2026දී ඉතාම කෙටි කාලයක් තුළ හොඳ ශක්තිමත් සති පොළක් හදනවා, වෙළෙන්දෝ 1,000කට ඉන්න පුළුවන් විධියට. ඒ තුළින් අපි හොඳ ආදායමක් ප්‍රාදේශීය සභාවටත් ගන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මහියංගනයේ උළු කර්මාන්තශාලාවක් තිබුණා. හැබැයි උළු කැටයක් නිෂ්පාදනය වුණේ නැහැ; අත්හැර දාලා තිබුණේ. චාමර සම්පත් මන්ත්‍රීතුමා සභාවේ හිටියා නම් එතුමා දන්නවා, මහියංගනය උළු කර්මාන්තශාලාවට මොකද වෙලා තිබෙන්නේ කියලා. හැබැයි අපි අන්න ඒ කර්මාන්තශාලාවට නව ආයෝජන ගේනවා. කෘෂි කර්මාන්තයත්, අනෙක් කර්මාන්තත් ඔක්කෝම එකතු කර ගත් හොඳ ගමනක සැලසුම් අපි හදලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

දැන් අපි මේ වැඩ ටික කරගෙන යනකොට ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, මේ වැඩ අපි මෙච්චර හොඳට කරන්නේ කොහොමද කියලා. ඒකට හේතුවක් තිබෙනවා. දැන් විපක්ෂයට තිබෙන ප්‍රශ්නයක් තමයි, කොහොමද රුපියල් ලක්ෂ 10කින් ගෙයක් හදන්නේ කියන එක. ඇයි, එතුමන්ලාට ස්වේච්ඡා ශ්‍රමය ගැන නොහිතෙන්නේ? අපි ගිය අවුරුද්දේ ගෙවල් 55ක් හැදුවා. ඒ පිළිබඳව මම කලිනුත් කිව්වා. හැබැයි රුපියල් ලක්ෂ 25ක් විතර වටිනා ගෙයක් රුපියල් ලක්ෂ 10න් හැදුවා. මේ අවුරුද්දේ එම ග්‍රාම නිලධාරි වසම් 77ම අපි ගෙවල් හදනවා. ඒ හදන්නේ ස්වේච්ඡා ශ්‍රමයේ දායකත්වයෙන්, මිනිසුන්ගේ උදව්වෙන්.

විපක්ෂයෙන් ආ චෝදනාවක් තමයි, ඔබතුමන්ලා සල්ලි වෙන් කළාට ඒ සල්ලිවලින් වැඩක් ගත්තේ නැහැ කියන එක. අපි කියනවා, 2026 වසර තමයි ඇත්තටම ජාතික ජන බලවේගයේ අපට වැඩ කරන්න පුළුවන් වසර කියලා. අපේ සියලු මන්ත්‍රීවරුන් සූදානම්, බිමට බැහැලා වැඩ කරන්න. අපි විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා. මේ රට ගොඩ ගන්න ඕනෑ නම් අපි අනිවාර්යයෙන් නිෂ්පාදන ආර්ථිකයකට යන්න ඕනෑ. ඒ නිෂ්පාදන ආර්ථිකයට යනකොට කර්මාන්ත විතරක් නොවෙයි, කෘෂි භෝගවලටත් අලුත් අගයන් එකතු කරන්න ඕනෑ. ඔබතුමන්ලා එන්නකෝ පොඩ්ඩක් මහියංගනය පැත්තට. මේ ප්‍රදේශයේ ගම්මිරිස් වගාව විශාල වශයෙන් කරන්නේ නැහැ. හැබැයි මහියංගනය කියන්නේ, ගම්මිරිස් විශාල වශයෙන් එකතු කරන ප්‍රදේශයක්. අද අපට ඉතා හොඳ ව්‍යාපාරිකයෙන් ඉන්නවා. ඔහු වර්ණ පහකින් ගම්මිරිස් පිට රට යවනවා. සාමාන්‍යයෙන් ඩොලර් මිලියන 25ක් මහියංගනය ආසනයට ඒ මිනිස්සු අරගෙන එනවා. ඒක ලෙහෙසි නැහැ. අලුත් කර්මාන්ත මිනිස්සුන්ට අරගෙන දුන්නාට පස්සේ, අලුත් නිෂ්පාදනවලට මිනිස්සු හුරු කළාට පස්සේ, කෘෂි කර්මාන්තයට හොඳ අගයක් අරගෙන දුන්නාට පස්සේ අපි විශ්වාස කරනවා, අපේ රට හොඳ තැනකට අරගෙන යන්න පුළුවන් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ මොහොතේ ඉතාම අවාසනාවන්ත විධියට අපේ රට ආපදා තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. හැබැයි අපි විශ්වාස කරනවා, මේ තත්ත්වය හොඳින්ම කළමනාකරණය කරන්න පුළුවන් වන්නේ ජාතික ජන බලවේගයටයි කියලා. මම එහෙම කියන්නේ ඇයි? ඔබ ආණ්ඩු කරද්දීත් අපි "රතු තරුව" විධියට ගම්මානවලට ගියා. මට මතකයි, එක්තරා කාලයක රත්නපුර, අයගම ඉස්කෝලය ඒ කලාප අධ්‍යක්ෂ මාස එකමාරක් වහන්න තීන්දු කරලා තිබුණා. හැබැයි බදුල්ල දිස්ත්‍රික්කයේ අපි අයගමට ගිහිල්ලා ඒ ඉස්කෝලය සති දෙකක් ඇතුළත යථා තත්ත්වයට පත් කළා. සුනාමිය ආපු වෙලාවේත් අපි කවුරුත් එක මිටට  වැඩවලට බැස්සා. මම වැඩ කළේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කිරින්දේ. එහිදී දින 40ක් පුරාවට අපි ස්වේච්ඡා ශ්‍රමය වැගිරුවා. එහෙම ස්වේච්ඡා බලකායක් අපට ඉන්නවා. මේ ආපදාවෙන් විනාශ වූ ස්ථාන නැවත ගොඩනඟන්න අදින් පසුව අනිවාර්යයෙන්ම අපේ ස්වේච්ඡා ශ්‍රමය අරගෙන යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දැන් බලයට පත් වෙලා ඉන්නේ දැවැන්ත ස්වේච්ඡා ශ්‍රමයක් සහිත ආණ්ඩුවක්. ඒ නිසා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් කියනවා, හැමදාම කියනවා වාගේ අපි ගැන ටිකක් වෙනස්ව හිතන්න කියලා. ඇයි, ඒ? ඔබ හිතාගෙන හිටියා, වාහන පර්මිට් එක නැත්නම් කවදාවත් මන්ත්‍රීකම් දරන්න බැහැ කියලා. ඔබ හිතාගෙන හිටියා, අනිවාර්යයෙන්ම නිල නිවාස ඕනෑ කියලා. ඔබ හිතාගෙන හිටියා, වාහනයෙන් බැස්සාට පසුව වටේට police guard එක තිබෙන්න ඕනෑ කියලා. ඔබ හිතාගෙන හිටියා, වාහනයේ දොර අරින්න කෙනෙක් ඉන්න ඕනෑ, කුඩේ අල්ලන්න තව කෙනෙක් ඉන්න ඕනෑ කියලා. එහෙම නැහැ. ඊට එහා ගියා දේශපාලන සංස්කෘතියක් අපි දැන් මේ බිමේ පැළ කරලා තිබෙනවා. හැමදාම තමන් එනකොට නැඟිටින රාජ්‍ය සේවකයා නොවෙයි, තමන්ට හදවතින් ගරු කරන රාජ්‍ය සේවකයා තමයි දැන් මේ නිර්මාණය කරමින් යන්නේ. සමහර අවස්ථාවල අපෙන් කියැවෙන දේවල්වල පොඩි පොඩි වචන අල්ලාගෙන ඒවා කියමින් අපට මඩ ගහන කොටසකුත් ඉන්නවා. ප්‍රශ්නයක් නැහැ. ඔබ හිතන්නේ

නැති දියුණු දේශපාලන සංස්කෘතියක් අවුරුදු හතරක් ඇතුළත අපි හදලා දෙනවා, ගරු විපක්ෂයේ මන්ත්‍රීවරුනි. ඒ නිසා අපි ඔක්කෝම එකතු වෙලා රට හදමු. මොකද, අපට දිනාගන්න තිබෙන්නේ මේ රට විතරයි. වෙන කිසිවක් නොවෙයි. ඒ නිසා ආදරණීය විපක්ෂයට ආදරණීය ඇරයුමක් කරනවා, මේ ගමන යන්න අපට සහයෝගය දෙන්න කියලා. ඒ ඉල්ලීම කරමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු. වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 12.20]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய விவாதத்துக்குரிய கமத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு இந்த நாட்டுக்கு மிக முக்கியம் வாய்ந்தது. இந்த நாட்டின் தலைவர் மேதகு அநுர குமார திஸாநாயக்க அவர்கள் ஒரு விவசாயினுடைய மகன். அதேபோன்று, கௌரவ லால் காந்த அவர்களும் விவசாயினுடைய மகன்; கௌரவ பிரதி அமைச்சர் அவர்களும் ஒரு விவசாயி; நானும் ஒரு விவசாயி. அந்த வகையில், விவசாயிகளுடைய பிரச்சினை பற்றி எங்களுக்கு நன்றாகத் தெரியும். விவசாயிகளுடைய பிரச்சினைகளைத் தீர்க்காத பல சந்தர்ப்பங்களிலே இந்த நாட்டின் ஆட்சி வீழ்ச்சியுற்றதையும் நாங்கள் அவதானிக்கக்கூடியதாக இருந்தது.

விசேடமாக, 1972ஆம் ஆண்டு ஏற்பட்ட விவசாயிகளின் அதிருப்தி, சிறிமாவோ பண்டாரநாயக்க அவர்களுடைய ஆட்சியின் வீழ்ச்சிக்குக் காரணமாயமைந்தது. கோட்டாபய ராஜபக்ஷ அவர்கள் 2019இல் விவசாயிகளின் விருப்பத்துக்கு மாறாக எடுத்த முடிவினால் அவரும் ஆட்சியில் இல்லாமற் போயிருந்தார். 2002ஆம் ஆண்டு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் உரத்துக்கான விலையை அதிகரித்ததனால் அந்த அரசாங்கம் இல்லாமற்போனது. அந்த மாதிரியான ஒரு சூழ்நிலை மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களுக்கும் இந்த அராசங்கத்துக்கும் வரக்கூடாது என்பதை நாங்கள் சொல்லிக்கொள்ள விரும்புகின்றோம். அப்படியானால், நீங்கள் விவசாயத்தை மேம்படுத்தக்கூடிய அல்லது விவசாயிகளுக்கு நல்லது செய்யக்கூடிய ஒரு சூழ்நிலையை உருவாக்க வேண்டுமென்பது எங்களுடைய கருத்தாக இருக்கின்றது. நீங்கள் அதைச் செய்வீர்கள் என்று நாங்கள் எதிர்ப்பார்க்கின்றோம். இன்று இலங்கையில் இருக்கின்ற மொத்த விவசாயிகளின் எண்ணிக்கை 2,065,000 ஆகும். அதிலே எங்களுடைய மாவட்டத்தில் இருக்கின்ற விவசாயிகள் 85,000 பேர். ஆகவே, விவசாயிகளுடைய பிரச்சினையைத் தீர்ப்பதற்கு அரசாங்கம் தகுந்த நடவடிக்கை எடுக்க வேண்டுமென்பது எங்களுடைய வேண்டுகோளாக இருக்கின்றது.

இலங்கையைப் பொறுத்தவரையில் 'விவசாயிகள்' எனும்போது, வெறுமனே நெல் உற்பத்தி செய்யும் விவசாயிகள் மாத்திரமே கவனத்தில் கொள்ளப்படுகிறார்கள். கரும்பு விவசாயிகள், சோள விவசாயிகள், கிழங்கு விவசாயிகள், மரக்கறி விவசாயிகள், வெங்காய விவசாயிகள் போன்றவர்களை எல்லாம் கணக்கெடுப்பதில்லை. ஏனென்றால், ஏதாவது அனர்த்தம் - disaster - ஏற்பட்டால் அவர்களுக்கு நஷ்ட ஈடு கொடுக்கின்றீர்கள்; இந்த விவசாயிகளுக்கு எந்தவித நஷ்ட ஈடும் கொடுப்பதில்லை. கடந்த இரண்டு நாட்களாக ஏற்பட்ட பாரிய வெள்ளத்தினால், நுவரெலியா, பதுளை பகுதிகளில் இருக்கின்ற விவசாயிகள் தங்களுடைய விளைநிலங்களிலிருந்த உற்பத்திகள் எல்லாவற்றையும் இழந்திருக்கின்றார்கள். அவர்களுக்கு ஆதரவு வழங்கும் வகையில் அல்லது உதவும் வகையில் எந்தவிதமான நஷ்ட ஈட்டுத் திட்டமோ, insurance திட்டமோ அரசாங்கத்திடம் இல்லை. நாங்கள் காலையில் மாண்புமிகு சனாதிபதி அவர்களிடம் பேசியபோது அவர் சொன்னார், "நெல் விவசாயிகளுக்கு நாங்கள் நஷ்ட ஈடு கொடுக்கப் போகின்றோம்" என்று. அப்போது நான் கேட்டேன், மரக்கறி விவசாயிகளுக்கு என்ன கொடுக்கப் போகின்றீர்கள் என்று. "அதுபற்றி பார்ப்போம்" என்று சொன்னார். அவர்களை நீங்கள் ஒதுக்கிவைக்கக் கூடாது. அவர்களும் இந்த நாட்டில்தான் வாழ்கின்றார்கள், அவர்களும்தான் வாக்களிக் கிறார்கள், அவர்களும்தான் பிரதிநிதிகளைத் தெரிவுசெய்து பாராளுமன்றத்துக்கு அனுப்புகின்றார்கள். ஆகவே, அவர்களுக்கு என்ன முடிவைச் சொல்லப் போகின்றீர்கள் என்பதை நீங்கள் தெரிவிக்க வேண்டும். விவசாயிகளில் ஒரு பகுதியினருக்கு மட்டும் நஷ்ட ஈட்டைக் கொடுத்து, இன்னுமொரு பகுதியினருக்கு அதனைக் கொடுக்காமல் விடுவது என்பது எந்தவிதத்திலும் ஏற்றுக்கொள்ள முடியாத விடயம் என்பதை நான் இந்த இடத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

நுவரெலியா மாவட்டத்திலிருக்கின்ற விவசாயிகள் தங்களுடைய உற்பத்திப் பொருட்களுக்குத் தாமே விலை நிர்ணயம் செய்ய முடியாத நிலை காணப்படுகின்றது. அந்த விலை நிர்ணயத்தைச் செய்பவர்கள் வியாபாரிகளாகத்தான் இருக்கின்றார்கள். உலகத்தில் எங்குமே இவ்வாறு நடைபெறுவதில்லை. தான் உற்பத்தி செய்கின்ற பொருளுக்கு அவரேதான் விலை நிர்ணயத்தைச் செய்ய வேண்டும். ஆனால், நுவரெலியா மாவட்டத்திலிருக்கின்ற விவசாயிகளுக்கு அதைத் தீர்மானிக்கும் சக்தி இல்லை; ஒரு குழுவினர்தான் அதைத் தீர்மானிக்கின்ற சூழ்நிலை இருக்கின்றது. இந்த நிலையை மாற்றியமைக்குமாறு பல்வேறு சந்தர்ப்பங்களில் நாங்கள் முறையிட்டிருக்கின்றோம். ஆனாலும், இதுவரைக்கும் எந்த விதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை என்பது என்னுடைய கருத்தாக இருக்கின்றது.

இப்பொழுது ஏற்பட்டிருக்கின்ற வெள்ள அனர்த்தம் காரணமாக நுவரெலியா, கந்தப்பொல, உடபுசல்லாவ, ஹைபொரஸ்ட், தலவாக்கலை மற்றும் பதுளை போன்ற இடங்களில் விவசாயச் செய்கைக்கு மிகுந்த சேதம் ஏற்பட்டிருக்கின்றது. இந்த விவசாய நடவடிக்கைகளைச் சீரமைப்பதற்கு எங்களுக்கு இன்னும் சில காலம் எடுக்கும். அந்த வகையில், அடுத்த போகத்திற்கான விதைக் கிழங்கையாவது எங்களுடைய விவசாயிகளுக்கு மானிய விலையில் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்பதே எங்களுடைய கோரிக்கையாக இருக்கிறது. அதுபோல், அங்கு உரத்திற்கான subsidyஉம் வழங்கப்படுவது கிடையாது. ஆகவே, உரத்திற்கான subsidyஉம் அங்குள்ள விவசாயிகளுக்குக் கிடைப்பதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டும். ஏனென்றால், ஒரு கிலோ கிழங்கு உற்பத்தி செய்வதற்கு 200 ரூபாய் வரை செலவாகின்றது. அதில் 50 சதவீதமான தொகை விதைக் கிழங்கின் கொள்வனவுக்காகத்தான் செலவாகின்றது. ஆகவே, விதைக் கிழங்கின் விலையைக் குறைத்துக் கொடுப்பதற்கும் நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

இலங்கையிலே பால் அதிகமாக உற்பத்தி செய்யப் படுகின்ற ஓர் இடமாக நுவரெலியா மாவட்டம் காணப் படுகின்றது. இலங்கையினுடைய தேசிய பால் உற்பத்தி சுமார் 35 சதவீதமாக இருந்தாலும், நுவரெலியா மாவட்டம் அதிலே 17 சதவீதமான பங்களிப்பைச் செய்கின்றது. தேசிய உற்பத்திமூலம் ஒரு மாதத்துக்கு 350 இலட்சம் லீற்றர் பால் உற்பத்தி செய்யப்படுமானால், நுவரெலியா மாவட்டத்தின் பால் உற்பத்தி அதிலே 55 இலட்சம் லீற்றராக இருக்கின்றது. இந்த 55 இலட்சம் லீற்றர் பால் உற்பத்திக்கான கால்நடை விவசாயிகள் மஸ்கெலியா, பொகவந்தலாவை, ஹட்டன் ஆகிய பகுதிகளிலேதான் அதிகமாக இருக்கிறார்கள்; கிட்டத்தட்ட 9,000 பேர் இந்தத் தொழிலால் நன்மை பெறுகின்றார்கள். எனினும், அந்த மாவட்டங்களிலே அவர்களுக்குப் பல்வேறு பிரச்சினைகள் இருக்கின்றன. அங்கு இருக்கின்ற கால்நடை களுக்கான ஆஸ்பத்திரியிலே veterinary doctors கிட்டத்தட்ட 4 பேர்தான் இருக்கின்றார்கள். ஆகவே, பொகவந்தலாவை, மஸ்கெலியா போன்ற பகுதிகளிலே கால்நடை வைத்தியர் களின் எண்ணிக்கை அதிகரிக்கப்பட வேண்டும். அதன் மூலமாகத்தான் பால் உற்பத்தியை நாங்கள் நல்ல முறையிலே செய்ய முடியும். நுவரெலியா மாவட்டத்திலே பால் தரும் மாடுகள் 14,000 வரை இருக்கின்றன. அங்கு 20,000 முட்டைகள் வரை உற்பத்தி செய்கின்றார்கள். ஆகவே, இந்த விவசாயிகளுக்குத் தேவையான வசதிகளை ஏற்படுத்திக் கொடுத்து, அவர்களின் உற்பத்திகளை அதிகரிப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும் என்பதை நாங்கள் சொல்லிக்கொள்ள விரும்புகின்றோம்.

கால்நடை வைத்தியர்கள் நீண்ட தூரம் போய்த்தான் ஆடு, மாடுகள் உட்பட ஏனைய விலங்குகளுக்குச் சிகிச்சை செய்யவேண்டி இருக்கின்றது. அப்படிச் சென்று சிகிச்சை செய்வதற்கு அவர்களிடம் போதுமான வாகன வசதிகள் இல்லை. 10-20 வருடங்களுக்கு முன் கொடுக்கப்பட்ட வாகனங்கள்தான் அங்கே இருக்கின்றது. இப்பொழுது அரசாங்கம் 1,700 cabs வாகனங்களைத் தருவிப்பதாகச் சொல்லியிருக்கின்றது. அதிலே கால்நடைச் சுகாதாரத் திணைக்களத்துக்கும் தேவையான வாகனங்களைக் கொடுத்து, அந்தத் திணைக்களத்தின் மூலமான செயற்பாடுகளை மேம்படுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதை நான் இந்த நேரத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

அவ்வாறு நுவரெலியாப் பிரதேசத்தில் சேவை செய்கின்ற கால்நடை வைத்தியர்களுக்கு, கஷ்டப் பிரதேசத்தில் வேலை செய்கின்றவர்கள் என்ற அடிப்படையில் வழங்கப்படும் additional கொடுப்பனவும் கிடையாது. ஆகவே, அவர்களுக் கான கொடுப்பனவு அதிகரிக்கப்பட வேண்டும் என்பதையும் சொல்லிக்கொள்கின்றேன்.

இன்றைய தினம் நுவரெலியா மாவட்டத்திலும் பதுளை மாவட்டத்திலும் அதிகமான மழை காரணமாகப் பல இடங்கள் சேதப்படுத்தப்பட்டிருக்கின்றன. கிட்டத்தட்ட 33 பேர் இதுவரைக்கும் இறந்திருப்பதாகத் தகவல் கிடைத்திருக் கின்றது. பதுளையிலே அதிகமான சேதம் ஏற்பட்டிருக்கின்றது. அதேபோல, கடுகண்ணாவ பகுதியிலே சேதம் ஏற்பட்டிருக் கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, நுவரெலியாவில் உங்களுடைய ஹங்குராங்கெத்தை, வலப்பனைப் பகுதியிலே, குறிப்பாக முன்வத்த என்ற இடத்திலே மண்சரிவின் மூலமாக ஆறு பேர் இறந்ததாகச் சொல்லப்படுகின்றது. ஆகவே, இவ்வாறான சந்தர்ப்பத்தில் பாகுபாடு இல்லாமல் எல்லோருக்கும் உரிய உதவிகள் போய்ச்சேர வேண்டும் என்று சொல்லிக் கொள்கின்றேன்.

தோட்டப் பகுதியிலே இருக்கின்ற வீடுகளுக்கு நஷ்ட ஈடு கொடுப்பது மிகக் குறைவு. காரணம், தோட்டப் பகுதியிலே வசிக்கின்றவர்களுக்கு வீட்டு உரிமை இல்லை என்ற காரணம் சொல்லப்படுகின்றது, மற்றவர்களுக்கு 2,500,000 ரூபாய் நஷ்ட ஈடு கொடுக்கப்பட்டால், தோட்டத் தொழிலாளர்களுக்கு 100,000 ரூபாய்தான் நஷ்ட ஈடு கொடுக்கப்படுகின்றது. ஆகவே, இந்த நஷ்ட ஈடு சமமான விகிதத்தில் வழங்கப்பட வேண்டும். இப்பொழுது உங்களுடைய அரசாங்கத்தினுடைய கொள்கை "எல்லோரும் சமம்" என்பது. அதற்கிணங்க, அனைத்துச் சலுகைகளும் தோட்டத் தொழிலாளர்களுக்கும் சமமாகப் போய்ச்சேர வேண்டும். அவர்களும் இந்த நாட்டினுடைய பிரஜைகள், அவர்களும் இந்த நாட்டில் வாக்குரிமை உள்ளவர்கள், அவர்களுக்கும் இந்த நாட்டிலே சகல உரிமைகளும் இருக்கின்றது என்பதை நீங்கள் ஏற்றுக்கொள்வதாக இருந்தால், நிச்சயமாக அவர்களுக்கும் இது போய்ச்சேருவதற்கான வசதி வாய்ப்புகளை உருவாக்க வேண்டுமென்று கேட்டு, என்னுடைய பேச்சை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

Order, please! පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ කටයුතු දිවා ආහාර විවේකය සඳහා පස් වරු 1.00 දක්වා අත්හිටුවනු ලැබේ.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ කාලගුණයත් එක්ක පීඩාවට පත් වුණු, ආපදාවට පත් වුණු පිරිස මම පළමුවෙන්ම මතක් කළ යුතුයි. විශේෂයෙන්ම ජීවිත නැති වුණු අයගේ පවුල්වල අයට අපගේ ශෝකය පළ කරන්නත් මෙය අවස්ථාවක් කර ගන්නවා. මම හිතන විධියට, මේ වනවිට විශාල පිරිසක් ආපදාවට ලක් වෙලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, ආණ්ඩුවක් විධියට ඔබතුමුන්නාන්සේලා ඒ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගනියි කියලා. ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේ දේශපාලනය කියන කාරණය

පැත්තක තබා, විපක්ෂයක් විධියට ලබා දිය හැකි උපරිම සහයෝගය මේ ජනතාව වෙනුවෙන් ලබා දෙන්නත්, ඔබ ගන්නා ක්‍රියාවලියට දායක වෙන්නත් අපි කටයුතු කරනවා. ඒ වාගේම මේ වෙලාවේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, බිම් මට්ටමේ සිට ඉහළට යනකම් සිටින රජයේ සියලු නිලධාරින් -ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, දිසාපතිතුමන්ලා, ග්‍රාම නිලධාරින්, සමෘද්ධි නිලධාරින්, කෘෂිකර්ම නිලධාරීන් වාගේම ප්‍රාදේශීය සභාව, සභාවේ මන්ත්‍රීවරුන්- ඇතුළු සියලු දෙනා මෙම ආපදාවට ලක් වුණු අයගේ ජීවිත බේරා ගන්න, දේපළ බේරා ගන්න ගන්නා වූ උත්සාහය අපි අගය කළ යුතුයි. ඒ වාගේම ඔවුන්ව මේ අවස්ථාවේ ඉතාම ගෞරවයෙන් මතක් කළ යුතුයි. ඒ වාගේම මම මතක් කරන්න කැමැතියි, ආණ්ඩුව ඉදිරි දවස් කිහිපය ඇතුළතත් මේ තත්ත්වය පිළිබඳව අවධානයෙන් සිටිය යුතු බව. ඒ වාගේම ඒ සඳහා ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා ක්‍රියාමාර්ග ගනියි කියාත් අපි විශ්වාස කරනවා.

දැනටත් අවදානම් ප්‍රදේශ බොහොමයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. පළමුවෙනි කාරණය විධියට, ආණ්ඩුව එම ජනතාවගේ ජීවිත බේරා ගැනීම සඳහා මැදිහත් විය යුතුයි. අපි දන්නවා, සමහර ප්‍රදේශවලින් පිරිස් ඉවත් කිරීම ඉතාම අපහසු කාර්යයක් බව. ඔවුන්ගේ දේපළ පිළිබඳව, ඒවායේ ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම ඔවුන් ඒ ප්‍රදේශවලින් ඉවත් කිරීමේදී ගැටලු ඇති වෙනවා. හැබැයි, මම හිතන විධියට අපි පළමුව කළ යුත්තේ ජීවිත ටික බේරා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමයි. මේ වෙනකොටත් ලංකාවේ බොහෝ ප්‍රදේශවල සිදුව ඇති නාය යෑම් සහ ගංවතුර තත්ත්වය නිසා ජීවිත ගණනාවක් අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා මේ ජනතාවගේ ජීවිත බේරා ගන්නත් අපි කටයුතු කළ යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කෘෂිකර්මාන්තයට දැන් විශාල හානියක් සිද්ධ වෙමින් පවතිනවා. ඒක මීට පෙරත් වුණා, ඒ කියන්නේ, මේ ගංවතුරට පෙරත්. විශේෂයෙන්ම පසුගිය මාස කිහිපය තුළ පිට රටින් ලංකාවට ආහාර ගෙන්වීමේ ප්‍රතිපත්තිය නිසා මේ රටේ දේශීය ගොවියාට විශාල අසාධාරණයක් සිද්ධ වුණා. පසුගිය අවුරුද්ද අවසානය වෙනකොට, ඒ කියන්නේ පසුගිය ආණ්ඩුව සමයේ අවසාන කාර්තුවේදී අපේ කෘෂිකර්මාන්තය සියයට 3.7ක වර්ධනයක් පෙන්නුම් කළා. මේ අවුරුද්දේ පළමුවන කාර්තුව වෙනකොට ඒ තත්ත්වය සියයට ඍණ 1කට පහත වැටී තිබෙනවා. දැන් ධන 2ක් දක්වා ඉහළට ඇවිත් තිබෙනවා. හැබැයි, පසුගිය වසරේ කෘෂිකර්මාන්තය තුළ තිබුණු වර්ධනය තවම අපට දකින්න නැහැ. ඒකට හේතු ගණනාවක් තිබෙනවා. එක පැත්තකින්, පොහොර සම්බන්ධයෙන් වන ගැටලුව තිබෙනවා. අනෙක් පැත්තෙන්, මිල සම්බන්ධයෙන් වන ගැටලුව තිබෙනවා. අපි දැක්කා, පසුගිය දින කිහිපය තුළ ලූනු ගොවීන්, අල ගොවීන්, වට්ටක්කා ගොවීන් මිල සම්බන්ධයෙන් විශාල වශයෙන් පීඩනයකට පත් වෙලා තිබුණු ආකාරය. ඒ වාගේම ලොකු චෝදනාවක් තිබෙනවා. අපේ නියෝජ්‍ය ඇමතිතුමා චෝදනා කර තිබෙන්නේ ගොවියාට. ඇයි, ඒ? වැඩිපුර වගා කළා කියලා. ගොවි මහත්වරුන් වවන එක තමයි විය යුත්තේ. කෘෂිකර්ම අමාත්‍යවරයාගේ සහ අමාත්‍යාංශයේ වගකීම වන්නේ ගොවියා වවන්න පොලඹවන එකයි, පිටින් ගෙනෙන එක නොවෙයි. ඒක පාරිභෝගික කටයුතුවලට සම්බන්ධ අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය වෙන්න පුළුවන්. හැබැයි, එක ඇමතිවරයෙක් ලූනු පිටින් ගෙනැත් විකුණන එක ලාභයි කියා විශ්වාස කළ නිසා අර වාගේ චෝදනාවක් ගොවියාට එල්ල කරන එක වැරදියි. වැඩිම ආනයනය සිදු කළේත් මේ අවුරුද්දේ, වැඩිම ලූනු අස්වැන්න තිබෙන්නේත් මේ අවුරුද්දේ. ඒකට ගොවියාට චෝදනා කළාට වැඩක් වෙන්නේ නැහැ. තරුණ ගොවියාගේ වගකීම වවන එක තමයි. ඔහුගේ රැකියාව ඒක; ජීවනෝපාය ඒක. ඉතිහාසයේ අපි මිනිසුන්ට චෝදනා කළේ වවන්නේ නැහැ කියලා නේ. දැන් තරුණ ගොවි මහත්වරුන් වවන්න පෙලඹෙනකොට, අස්වැන්න වැඩියි, නුඹලා වවපු එක වැරදියි කියන එක සාධාරණ නැහැ කියා තමයි අපි විශ්වාස කරන්නේ. පිටින් ගෙනැල්ලා කන්න දෙන එක ආණ්ඩුවේ ප්‍රතිපත්තියද, අමාත්‍යවරයෙකුගේ ප්‍රතිපත්තියද කියන එක අපිට අදාළ කාරණයක් නොවෙයි. හැබැයි, මේ කාරණය ඇතුළේ ඔබතුමන්නාන්සේලා ගොවියාට සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

අද මිල සම්බන්ධවත් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, පිටින් ගෙනෙන නිසා. ගංවතුර නිසා වගා භූමිවලට හානි වෙලාත් තිබෙනවා. ඊළඟ කන්නයේදීත් මේ ප්‍රශ්නය එනවා. සමහර විට ආණ්ඩුවේ සමහරු ඒ ගැන සතුටු ඇති. මොකද, එතකොට පිටින් ගෙනෙන්න පුළුවන් නේ. පසුගිය ආණ්ඩු පිටින් හාල් ගෙනෙනකොට ඇහුවා, පිටින් හාල් ගෙනෙන්න නම් ජනාධිපතිවරයෙක් ඕනෑද කියලා. ඒක මාෆියාවක්, එක පැන් පහරින් ඒක අයින් කරනවා කිව්වා. එළවලු, පලතුරු ජාති පිටින් ගෙනෙනකොට, එහෙම ගෙනෙන්නේ කොමිස් ගහන්නය කිව්වා. කොමිස් ගහන්න පිටින් පලතුරු, එළවලු ලංකාවට ගෙනෙනවා කියලා චෝදනා කරපු අය, හාල් ගෙනෙන එක මාෆියාවක්, ඒක අයින් කරනවා කියා බලයට ආපු අය අද වෙනකොට ලංකාවට පිටින් එළවලු, පලතුරු සහ හාල් ඉතිහාසයේ වැඩිම ප්‍රමාණයක් ගෙන්වන තැනට පරිවර්තනය වෙලා තිබෙනවා. දැන් මිලත් වැඩියි. පිටින් හාල් ගෙනෙන්නේ හාල් මිල පාලනය කරන්න නම්, මිල වැඩි වෙන්න විධියක් නැහැ නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එහෙම නම් එදා ඔබ චෝදනා කළ කොමිස් ගැහිල්ල කියන කාරණය අද වලංගුද, නැද්ද? මිලත් වැඩියි නම්, එදා පිටින් ගෙනාවේ කොමිස් ගහන්න නම්, අද ගොවියාට සාධාරණයක් වෙන්නේත් නැත්නම්, කවුද ඒ කොමිස් එක ගන්නේ? කවුද, ඒක පිටිපස්සේ ඉන්නේ? කවුද, මේ මාෆියාව කරන්නේ? ඔබතුමන්ලාගේම වචනයක් තමයි මේ "මාෆියාව" කියන එක. කවුද, මේක පිටිපස්සේ ඉන්නේ? එක පැත්තකින් ගොවියා අසරණ වෙනවා. අනික් පැත්තෙන් පාරිභෝගිකයා අසරණ වෙනවා. මොකද, ගොවියාට සාධාරණ මිලකුත් නැහැ. පාරිභෝගිකයාට සාධාරණ මිලකුත් නැහැ. හැබැයි, ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් විධියට පිටින් හාල්, එළවලු, පලතුරු ගෙනැල්ලා කන්න දෙන යුගයකට මේ රට පරිවර්තනය කරන්න ඔබතුමන්නාන්සේලා කටයුතු කරනවා. ඔබතුමන්ලා අද ටයි කෝට් දාගෙන කොළඹ හිටියාට, එදා අමුඩය ඇඳගෙන ගොවියෝ එක්ක කුඹුරේ හිටියේ. එහෙම හිටපු ඔබතුමන්නාන්සේලා අද ටයි කෝට් දාගෙන කොළඹ ඉන්නවා. ගොවියෝ ගැන සොයන්නේ නැහැ. ගොවියාට වෙන අසාධාරණය බලන්නේ නැහැ. අද මේ වෙනකොටත්, වර්ෂාපතනය නිසා වගා භූමි හානි වෙලා තිබෙනවා. ඒ හානි වෙච්ච වගා භූමි සම්බන්ධයෙන් ඔබතුමන්නාන්සේලා ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? ඒ පිළිබඳව රටේ ජනතාව බලාගෙන ඉන්නවා. පළමුවැනි කාරණය තමයි, ඒ ජීවිත ටික බේරා ගන්න; ජීවිත බේරා ගන්න කටයුතු කරන්න. දෙවැනි කාරණය තමයි, කෘෂිකර්මාන්තයට, කෘෂි වගා භූමිවලට වෙන හානියට ඔබ කොහොමද මුහුණ දෙන්නේ කියන එක. ආයේ පිටින් ගෙනැල්ලා දෙන එක ලාභයි කියන න්‍යාය පත්‍රය ගැන නොවෙයි, මම මේ අහන්නේ. ගොවියාගේ ආර්ථිකය ශක්තිමත් කරන්න ඔබ කටයුතු කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත් අපි අවධානයෙන් ඉන්නවා කියන එකත් ඔබට මතක් කරන්න ඕනෑ. අද මේ වෙනකොට හරි නම් මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු දැන් ඉන්න ඕනෑ ගම්වල. විපක්ෂයෙත් එහෙමයි. අද Parliamentary Business Committee එක රැස් වෙනවා කියලා තිබෙනවා; පාර්ලිමේන්තු කටයුතු පිළිබඳව සහ මේ ආපදා තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද කියලා තීන්දු කරන්න. මම හිතන විධියට ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පාර්ලිමේන්තුව කල් තියලා හරි මේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවල සභාපතිවරු, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවල සභාපතිවරු ගම්වලට යවන්න. ඒක නිලධාරින්ගේ,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
හොඳයි.

ඒක නිලධාරින් පිට පටවලා, ඒ බර නිලධාරින්ට විතරක් දීලා ඉන්න එපා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ කාරණයේදී පාර්ලිමේන්තුව කල් තියලා හරි මැති ඇමතිවරු ටික දැන්වත් ගම්වලට යවන්න. නැත්නම් වතුර බැස්සාට පස්සේ ඒ අය ගම්වලට ගිහිල්ලා වැඩක් වෙන්නේ නැහැ. දැන් ගිහිල්ලා, ඒ මිනිස්සුන්ට ඕනෑ කෑම බීම ටික දීලා, උදවු උපකාර ටික කරලා වගා හානිය අවබෝධ කරගෙන කටයුතු කරන්න.

අවසාන වශයෙන් මම තව එක කාරණයක් කියන්න ඕනෑ. අද රටේ තිබෙන වාතාවරණයට, පරිසරයට, කාලගුණයට මේක ගැළපුණේ නැතත් ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ පිළිබඳව යම් ප්‍රශ්නයක් නගන්න ඕනෑ කියා මා හිතනවා. විශේෂයෙන්ම අර කන්ටේනර් 323 සම්බන්ධ කාරණයේදී විපක්ෂයෙන් ඉල්ලුවා, ඒ සම්බන්ධයෙන් Select Committee එකක් පත් කරන්න කියලා. විපක්ෂ නායකතුමා ඒ ඉල්ලීම යැව්වා. ඒ කමිටුව ඔබතුමන්ලා පත් කළා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඒකේ ආණ්ඩු පක්ෂයෙන් අටදෙනෙකු ඉන්නවා; විපක්ෂයෙන් හතරදෙනෙකු ඉන්නවා. ආණ්ඩුවෙන් පන්නපු කන්ටේනර් ගැන හොයන්න ආණ්ඩුවෙන් අටදෙනෙක් ඉන්නවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
අපි ඉල්ලුවා; දුන්නේ නැහැ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
විපක්ෂයෙන් ඉල්ලුවාට දුන්නේ නැහැ. ඒ කන්ටේනර් ටික වාගේම තවත් කන්ටේනර් දෙකක් කුඩු එක්ක පන්නලා තිබෙනවා. ඊට අමතරව, තවත් හඬපටයකුත් සංසරණය වෙනවා ඇමතිවරයෙකු හාල් පන්නන්න කථා කරන. ඉතින්, ගොවියා අසරණ වෙන එක අහන්න දෙයක්ද? ලේබන ලැහැස්ති නැත්නම් ලේබන හදලා හෝ පන්නන්නම් කියලා කියනවා නේද? ලයිසන් ඕනෑ නැහැ, හදලා දෙන්න පුළුවන් කියනවා. කන්ටේනර් එක වරායට ගෙනැල්ලා ඇමතිවරයාට කිව්වාම වැඩේ හරි යන සීන් එකක් තමයි තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අර කුඩු කන්ටේනර් එක ඔබතුමාගේ බොඩිගාඩ් කෙනෙකු,-

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔව්, ඔව්, මගේ ගෝලයා; ඔබතුමාගේ ඥාතියා. ඒක අමතක කරන්න එපා. ඔබතුමාගේත් ඥාතියා. ඒක අමතක කරන්න එපා. ඒ හින්දා තමයි මම කියන්නේ, නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. එතකොට හැම කෙනාගේම ඥාතීන් කවුද කියලා එළියට එයි. මම කියන්නේ නැහැ ඕවා. මොකද, අපි ඉතින් ගමේ නේ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Lawyerත් ඉන්නවා ඒ පැත්තේ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔබතුමාගේ ඥාතියාගේ නීතිඥ මහත්මයාත් ඉන්නවා ඔය පැත්තේ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ඉස්සරහම ඉන්නවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

හැබැයි ඒ කමිටුවට කවුද පත් කරලා තිබෙන්නේ? ඒ කමිටුවේ ඉන්නවා, අනුර කරුණාතිලක ඇමතිතුමා. එතුමා වරාය භාරව දැන් ඉන්න අමාත්‍යවරයා. අනෙක් පැත්තෙන් ඉන්නවා, මේ ආණ්ඩුවේ පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිවරයා. ඊළඟට, සභාපති හැටියට ඉන්නවා, අපේ අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර මැතිතුමා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මේක හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ වැඩක් නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. පරීක්ෂණය කරන්නේ පොලීසියෙන්. පොලීසිය භාර ඇමතිවරයාත් ඉන්නවා, කමිටුවේ. පරීක්ෂණය කරන්නේ වරාය සම්බන්ධයෙන්. වරාය භාර ඇමතිවරයාත් ඉන්නවා, කමිටුවේ. පරීක්ෂණය අන්තිමට යන්නේ අධිකරණයට. අධිකරණ ඇමතිත් ඉන්නවා කමිටුවේ, සභාපති විධියට. ඒ පත් කිරීමෙන්ම පැහැදිලියි, ඒ කන්ටේනර් 323 පැන්නුවේ ආණ්ඩුවෙන් කියන එක. ආණ්ඩුවට ඒක වහගන්න ඕනෑ නිසා තමයි එහෙම පත් කරලා තිබෙන්නේ. ආයේ පරීක්ෂණ කරන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ආයේ පරීක්ෂණ කරන්න දෙයක් නැහැ, ඒ කමිටුවෙන්. මොකද, පන්නන කට්ටියම තමයි පත් කරලා තිබෙන්නේ, ඒ ගැන සොයන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා මම

ඔබතුමියට කියන්නේ, මේ කාරණය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරන්න කියලායි. ඒ ගැන හොයන්න ආණ්ඩුවෙන් අටදෙනෙකු පත් කරලා, ඒවා පන්නපු අයම කමිටුවට පත් කරලා, විපක්ෂයෙන් හතරදෙනෙකු විතරක් පත් කරලා හොයලා වැඩක් වෙන්නේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳව ගරු කථානායකතුමාව දැනුවත් කරන්න කියන ඉල්ලීම මම කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.11]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද මේ මොහොත වනකොට, කාලගුණය අනපේක්ෂිත ලෙස වෙනස් වෙලා, ජීවිත ගණනාවක් අහිමි වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම රටේ දිස්ත්‍රික්ක විශාල ප්‍රමාණයක් ආපදාවට ලක් වෙලා තිබෙන වෙලාවක තමයි කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයත් පැවැත්වෙමින් තිබෙන්නේ. මේ ආපදා තත්ත්වයෙන් පීඩාවට පත් වෙච්ච ජනතාව සම්බන්ධයෙන් කනගාටුව ප්‍රකාශ කරමින්, මියැදුණු අයගේ පවුල්වල සාමාජිකයන්ට ශෝකය ප්‍රකාශ කරමින් මේ විවාදයට අදාළව මගේ අදහස් ප්‍රකාශ කරන්නම්.

අද උදේ සිටම මේ විවාදයට එක්කාසු වෙච්ච විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු වෙනදා වාගේම බොරු ප්‍රමාණයක් තහවුරු කරන්න උත්සාහ කළා. ඒ නිසා ඒවා නිවැරදි කරන්න ඕනෑ කියලා මම අදහස් කළා. විශේෂයෙන් මීට පෙර කථා කළ මන්ත්‍රීතුමා මේ ආපදාව සම්බන්ධයෙන් කරුණු මතු කරමින් කිව්වා, මේ ගැන අවධානය යොමු කරන්න කියලා. මට හිතෙන්නේ, එතුමා උදය වරුවේ පාර්ලිමේන්තුවේ හිටියේ නැතුව ඇති. ගරු ජනාධිපතිතුමා අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආපදාවට ලක් වෙච්ච දිස්ත්‍රික්කවල ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් අය - ඒ ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් ඇතුළු සියලුදෙනා - එක්කාසු කරගෙන මේ පවතින තත්ත්වයට මුහුණ දෙන්න ඕනෑ කොහොමද කියලා සාකච්ඡා කළා. පව්! ඒ මන්ත්‍රීතුමා ඒ වෙලාවේ හිටියේ නැතුව ඇති. ඒ වාගේම, එතුමා තවත් චෝදනාවක් කළා, වගා කටයුතු කරපු ගොවි ජනතාවට නියෝජ්‍ය ඇමතිතුමා සහ ඇමතිතුමා චෝදනා කළා කියලා. නැහැ, අපි ඒ චෝදනාව ප්‍රතික්ෂේප කරනවා. අපි කිසිදු වෙලාවක වගාව වැඩි කිරීම සම්බන්ධයෙන් ජනතාවට චෝදනා කරලා නැහැ. ආණ්ඩුවක් විධියට අපි නැවත නැවතත් කියන්නේ, ගොවි ජනතාවට ආරාධනා කරන්නේ, "වගා කරන්න, ආණ්ඩුව සූදානම් ප්‍රශ්න ටික විසඳන්න" කියලායි. එහෙම නම් අර වාගේ බොරු තහවුරු කරන්න එපා කියලා මම කියනවා.

ඒ වාගේම, ගයන්ත කරුණාතිලක, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, මේ පසුගිය කාල සීමාව තුළ පෝලිම් යුගයක් තිබුණා කියලා. මම අහනවා "මන්ත්‍රීතුමා, මොකක්ද තිබුණු පෝලිම?" කියලා. කිසිදු පෝලිමක් තිබුණේ නැහැ. මේ ගෙවුණු අවුරුද්ද තුළ පෝලිම් තිබුණේ නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
කාලයක් කැකුළු හාල්වලට පෝලිම් තිබුණා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
කැකුළු හාල්වලට තිබෙන්න ඇති. *[බාධා කිරීමක්]* එහෙම නම්, ඒක ඒ විධියට කියන්න ඕනෑ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඒ විධියට තමයි කිව්වේ.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ප්‍රකාශ කළා, ගොවි ජනතාව සියයට 10ක් වගාවෙන් ඈත් වෙලා කියලා. නැහැ, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නායකත්වයෙන් "එක මිටට - ගොවි බිමට" කියන වැඩසටහන ආරම්භ කරලා, අපේ රටේ වගා නොකළ ඉඩම් වගා කිරීම සම්බන්ධයෙන් වන කටයුතු අපි ආරම්භ කරලා තිබෙනවා. වගා නොකළ ඉඩම් අක්කර 50,000කට වැඩි ප්‍රමාණයක් මේ වනකොට වගාවට එක්කාසු කරලා තිබෙනවා. ඒ නිසා, බොරු කියන්න එන්න එපා කියලා අපි නැවත කියනවා.

ඒ වාගේම කිව්වා, ගොවියාට නිසි මිලක් හම්බ වුණේ නැහැ කියලා. ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ ගෙවුණු අවුරුද්ද ඇතුළේ පසුගිය යල කන්නයේත්, ගිය මාස් කන්නයේත් වී මිල දී ගැනීමේදී නාඩු වී කිලෝග්‍රෑම් එකකට රුපියල් 120ක සහතික මිලක් නියම කළා. ඒ වාගේම, සම්බා වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 125 ගණනේ මිල දී ගත්තා. කීරි සම්බා වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 132 ගණනේ මිල දී ගත්තා. මේ ගෙවුණු යල කන්නයේ වී මෙට්‍රික්ටොන් ලක්ෂ 50ක් මිල දී ගෙන තිබෙනවා. ඔබතුමන්ලා තවමත් කියන්නේ අපි වී සඳහා මිලක් නියම කළේ නැහැ කියලාද? නැහැ, අපි මිලක් නියම කළා. අපි ඒ මිලට වී මිල දී ගත්තා. අපි වී අලෙවි මණ්ඩලය ක්‍රමානුකූලව ශක්තිමත් කරමින් ඉදිරියට යනවා. ඒ නිසා අපි තවදුරටත් විපක්ෂයට කියන්නේ, බොරුව තහවුරු කරන්න එපා කියලායි.

ඒ වාගේම, ගිය මාස් කන්නයේ ඉඳන් මේ වනතෙක් මෙට්‍රික්ටොන් 22,000කට ආසන්න ප්‍රමාණයක් මුං නිෂ්පාදනය කර තිබෙනවා. මේ වනකොට අපි ආණ්ඩුව විධියට තීරණයක් ගෙන තිබෙනවා, ආපහු අපේ රටට මුං ආනයනය කරන්න ඕනෑ නැහැ කියලා. අපි ඒ තීරණය අරගෙන තිබෙනවා. මොකද, අපි දැන් අපේ රටට අවශ්‍ය ප්‍රමාණයට මුං නිෂ්පාදනය කර තිබෙනවා. ඒ නිසා මම නැවතත් විපක්ෂයට කියන්නේ, බොරු කියන්න එපා කියලායි.

ඒ වාගේම, රංජිත් මද්දුම බණ්ඩාර මහත්මයාත් අර චෝදනාවම කළා. මොකක්ද ඒ චෝදනාව? ගොවි ජනතාවගෙන් සියයට 10ක් වගාවෙන් ඈත් වෙලා ලු. අපේ රටේ තරුණ පරම්පරාවට, අලුත් ව්‍යවසායකයන්ට අපේ රටේ කෘෂි කර්මාන්තයේ අලුත් බලාපොරොත්තුවක් සහිතව වගා කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 500ක් වෙන් කළා වාගේම එය රුපියල් මිලියන 750 දක්වා වැඩි කරලා තිබෙනවා. අඩුපාඩු තිබෙන්න පුළුවන්. අපි ඒක පිළිගන්නවා. නමුත්, අපි ආරම්භයක් තබලායි තිබෙන්නේ. අපි මේ ආණ්ඩුව පිහිටුවලා තවම අවුරුද්දයි. ලබන අවුරුද්ද වෙනුවෙන් අපි කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට රුපියල් මිලියන 221,300ක් වෙන් කර තිබෙනවා. එම මුදලින් කෘෂිකර්ම සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 115,828ක් වෙන් කර තිබෙනවා. ඒ, අපේ රටේ කෘෂි කර්මාන්තය ගොඩනැඟීම වෙනුවෙන්. අපේ රටේ

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

මහ පොළොවත් එක්ක ඔට්ටු වන, පොරබදන ගොවි ජනතාවට කෘෂි කර්මාන්තය විශ්වාසයෙන් යුතුව කරගෙන යන්න පුළුවන් වන විධියට අපි වැඩ කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, පසුගිය විවාදවලට එකතු වෙච්ච විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කියා සිටියා, පොහොර සහනාධාරය දෙන්න පරක්කු වෙනවා කියලා; පොහොර සහනාධාරය ප්‍රමාදයි කියලා. නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට ආවාට පසුව තමයි, හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක්ව තිබුණු පොහොර සහනාධාරය රුපියල් 25,000 දක්වා වැඩි කළේ. හෙක්ටෙයාරයකට ලබා දුන්නු පොහොර සහනාධාරය අපි රුපියල් 25,000 දක්වා වැඩි කළා. හෙක්ටෙයාරයකට ගෙවන මුදල අපි රුපියල් 10,000කින් වැඩි කළා. අන්න ඒ මුදල් ප්‍රමාදයකින් තොරව දෙන්න ඕනෑ කියලා අපි තීරණයකුත් ගත්තා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පසුගිය කාලයේ පොහොර සහනාධාරය දුන්නේ ගොයම් කපනකොටයි; ඒ වාගේම ගොයම බණ්ඩි වෙලාවේදීයි. හැබැයි, අපේ ආණ්ඩුව අවධානමක් තියාගෙන තීරණයක් ගත්තා. ඒ මොකක්ද? වගාවට බහින්න පෙර ගොවියාට පොහොර සහනාධාරය ලබා දෙන්න ඕනෑ කියන තීරණය. වගාව පටන් ගන්නා ප්‍රමාණයත් අනුව, ඒ කන්න රැස්වීමේ දින තීරණය වන විධිය අනුව, අන්න ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා, කෘ.ප.නි.ස. නිලධාරින්ගේ පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබියදීත් පොහොර සහනාධාරය ජනතාවට ලබා දෙන්න කටයුතු කරමින් සිටිනවා. සියයට 50කට, 60කට වැඩි ප්‍රමාණයක් මේ වනකොට ගොවි ජනතාවගේ අතට, බැංකු ගිණුම්වලට ඒ මුදල් ටික ගිහින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, එතුමන්ලා තවත් බොරුවක් කිව්වා. ඒ තමයි, පොහොර සහනාධාරය දෙන්නේ වීවලට විතරයි කියන එක. අපි විපක්ෂයට මේ කාරණය කියනවා. මේ ගෙවුණු යල කන්නය දිහා බලන්න. කුඹුරු ඉඩම්වල ගොඩ භෝග වගා කරන, ක්ෂේත්‍ර භෝග වගා කරන ගොවියාට -බඩ ඉරිඟු වෙන්න පුළුවන්; ලූනු වෙන්න පුළුවන්; වෙනත් ක්ෂේත්‍ර භෝගයක් වෙන්න පුළුවන්- හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක මුදලක් ලබා දෙන්න තීරණය කර තිබෙනවා. එහෙම කළේ අපේ ආණ්ඩුවෙන් බව මතක් කර දෙනවා, මේ මොහොතේදී. මේවා පසුගිය ආණ්ඩුවලින් දුන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ ආණ්ඩුවෙන් තමයි කුඹුරු ඉඩම්වල ක්ෂේත්‍ර භෝග වගා කරන ගොවි ජනතාවටත් හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක් ලබා දෙන්න තීරණය කළේ. මට මේ මොහොතේ ඒ කාරණා ටික නිවැරදි කරන්න ඕනෑ වෙලා තිබුණා.

ලබන අවුරුද්දේ පොහොර සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන 36,000ක් වෙන් කර තිබෙනවා. ඒක පොඩි මුදලක් නොවෙයි. ඒ වාගේම, අපි තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. මීට පෙර මන්ත්‍රීවරු කිහිප දෙනෙක් අපේ කිරි කර්මාන්තය ගැන කථා කළා; විශේෂයෙන්ම මිල්කෝ ආයතනය ගැන කිව්වා. මිල්කෝ ආයතනයේ බඩල්ගම කර්මාන්තශාලාව ආරම්භ කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 3,000ක් ලබන අවුරුද්දට වෙන් කර තිබෙනවා. රුපියල් මිලියන 3,000ක්! ඒක පොඩි මුදලක් නොවෙයි. මිල්කෝ ආයතනය පසුගිය කාලයේ බිඳ වැටිලායි තිබුණේ; බිඳ වට්ටලායි තිබුණේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ ආයතනයේ සභාපතිතුමා ගැනත් කියන්න ඕනෑ. ගෝඨාභය රාජපක්ෂ මේ රට වැට්ටුවා. හැබැයි, හේමජීව ගෝඨාභය මිල්කෝ ආයතනය ගොඩ දැම්මා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, බැංකුවලට ගෙවන්න තිබෙන රුපියල් මිලියන 18,000ක් වන ණයවලින්, රුපියල් මිලියන 14,000ක් මේ අවුරුද්ද ඇතුළේ -ලාභ ලබලා- ගෙවා අවසන් කර තිබෙනවා කියන එකත් අපි මේ මොහොතේ ප්‍රකාශ කරනවා. එම ආයතනයේ රුපියල් මිලියන 18,000ක බැංකු ණයවලින් රුපියල් මිලියන 14,000ක් මේ වනකොටත් ගෙවලා ඉවරයි. රුපියල් මිලියන 17,000ක් ගොවීන්ට ණය තිබුණා. ගොවීන් කිරි ටික දුන්නාම දවස් 14කට සැරයක් හම්බ වෙන කිරි payment එක ගොවි ජනතාවට හම්බ වුණේ නැහැ. ඒක මාස දෙකතුන පරක්කු වුණා. ගොවීන්ට ණය වෙලා තිබුණු මිල්කෝ ආයතනය, එහි අධ්‍යක්ෂ මණ්ඩලය, කාර්ය මණ්ඩලය ඇතුළු හැම කෙනාම මහන්සි වෙලා, වෙහෙස වෙලා ලාභ ලබන තත්ත්වයට පත් කරලා, අන්න ඒ රුපියල් මිලියන 17,000 ණයත් ගෙවලා අවසන් කර තිබෙනවා. මිල්කෝ එකට කිරි සපයන ගොවි ජනතාවට දැන් නියමිත දිනයට මුදල් ටික ලබා දෙමින් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා තමයි 2004දී අද ගරු ලාල් කාන්ත ඇමතිතුමා දරන කෘෂිකර්ම ඇමැතිකම දැරුවේ. මාස 14ක් ඇතුළත අනුර දිසානායක සහෝදරයා කෘෂිකර්ම අමාත්‍යාංශය එක මිටකට අරගෙන ඉහළට ඔසවලා මිල්කෝ ආයතනය හරහා ඒ ලැබූ ලාභවලින් ගොවි ජනතාවට 2004දී ලාභාංශ බෙදුවා. ඉන් අවුරුදු 21කට පසුව - අනුර දිසානායක සහෝදරයාගෙන් පසුව - මේ අවුරුද්දේ අද මිල්කෝ ආයතනය ලාභ ලබා තිබෙනවා. ලක්ෂ 1,650ක් ගොවි ජනතාවට ලබා දෙන්න පුළුවන් මට්ටමට අපි මේ අවුරුද්ද ඇතුළත මිල්කෝ ආයතනය ගොඩනගලා තිබෙන බව කියන්න ඕනෑ. අපි අහනවා, මේවා වැරදි ද කියලා. නැහැ. ඔබතුමන්ලා බලන්න, මෙන්න අපි කටයුතු කරලා තිබෙන විධිය. මෙන්න, අපි ආයතනය ගොඩ දාලා තිබෙන විධිය.

මම කැමැතියි ඊළඟට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය පැත්තට හැරෙන්න. මීට කලින් පැවැති ආණ්ඩුව NLDB එක විකුණන තත්ත්වයට පත් කර තිබුණා. NLDB එකට අයිති ගොවි පොළවල් 32ක් තිබෙනවා; ඉඩම් අක්කර 28,802ක් තිබෙනවා. එම ආයතනය විකුණන තත්ත්වයට පත් කරලා තිබුණේ. අපි ඒකට පත් කළා හොඳ සභාපතිවරයෙක්. ඒ වාගේම හොඳ අධ්‍යක්ෂ මණ්ඩලයක් ඉන්නවා. ඔවුන් වුවමනාවෙන් සහ කැපවීමෙන් යුතුව ස්වේච්ඡාවෙන් වැඩ කරනවා. මිල්කෝ ආයතනයේ සභාපතිතුමා ස්වේච්ඡාවෙන් තමයි ඒ කටයුත්ත කරන්නේ. NLDB එකේ සභාපතිතුමාත් ඒ ආයතනයට පණ දෙන්නේ ස්වේච්ඡාවෙන්. අපි NLDB එක භාර ගන්නකොට ඒ ගොවි පොළවල කිරි නිෂ්පාදනය තිබුණේ ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කිරි ලීටර් 7,000ක හෝ 8,000කට ආසන්න ප්‍රමාණයක්. ඒක අපි දෙගුණයක් කර තිබෙනවා. අද අපි කිරි ලීටර් 16,000 දක්වා වැඩි කර තිබෙනවා. NLDB එකට අයිති ගොවි පොළවල කිරි නිෂ්පාදනය අවුරුද්දක් තුළ වැඩි කළ එක වැරදි ද? ඒක නරක ද? ඒවා පෙනෙන්නේ නැද්ද කියලා අපි අහනවා. ඇයි ඒවා පෙනෙන්නේ නැත්තේ? අපි ඒ ආයතන ඒ තත්ත්වයට පත් කර තිබෙනවා. අපි භාර ගන්නකොට එම ගොවි පොළවල් 32 තුළ අවම වශයෙන් බඩඉරිඟු අක්කරයක්වත් වගා කර තිබුණේ නැහැ. අපි මේ වනකොට අක්කර 1,500කට වඩා බඩඉරිඟු වගා කරලා ගොවි පොළවල ඉන්න සතුන්ගේ ආහාර වෙනුවෙන් දැන් සැලැස්මක් ඇතුළේ එම කටයුත්ත ඉස්සරහට ගෙන යමින් තිබෙනවා. ඒවා වැරදි ද? ඇයි ඒවා පෙනෙන්නේ නැද්ද කියලා අපි විපක්ෂයේ කට්ටියගෙන් අහනවා.

අපි මේ රට හදනවා. අපි රට භාර ගත්තේ හදන්න. අපි මේ රට භාර ගත්තේ ගොඩ දාන්න. අපි භාර ගත්ත රට හදලා මිසක් නවත්වන්නේ නැහැ කියලාත් කියනවා. 2026 වනකොට අපේ ඉලක්කය තමයි, අක්කර 1,500ක බඩඉරිඟු වගාව අක්කර 5,000 දක්වා වැඩි කිරීම. ඒ සඳහා අපි සූදානම් කියන පණිවුඩයත් මේ මොහොතේ ලබා දෙනවා. එම ගොවි පොළවල් සතුව පොල් අක්කර 11,000ක් තිබෙනවා. පොල් අක්කර 11,000කින් ගත්ත ඒ ලාභය දැන් ටික ටික වැඩි කරමින් තිබෙනවා.

කෘෂි රක්ෂණ මණ්ඩලය ගැනත් මා මතක් කරන්න ඕනෑ. පසුගිය කාලයේ වගා හානි වෙලා මාස ගණනක් ගියාට පසුව තමයි කෘෂි රක්ෂණ මණ්ඩලයෙන් ගොවි ජනතාවට වගා හානිවලට වන්දි හම්බ වුණේ. හැබැයි කියන්න සතුටුයි, මෑතකදී සිදු වූ වගා හානියේදී ගොවි ජනතාවට ඉතා කෙටි කාලයක් ඇතුළත රක්ෂණ වන්දි මුදල් ලබා දීමට කෘෂි රක්ෂණ මණ්ඩලය මැදිහත් වෙලා තිබෙනවා. හොඳ කාර්ය මණ්ඩලයක් යටතේ අපි දැන් එය සක්‍රිය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගොවියා ආරක්ෂා කිරීම වෙනුවෙන් ලබන අවුරුද්දට මිලියන 5,550ක මුදලක් ගොවි විශ්‍රාම වැටුප් වෙනුවෙන් වෙන් කර තිබෙනවා. අපි ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබෙනවා. අපේ රටේ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් අපි ඒ මුදල වෙන් කර තිබෙනවා. ඒ වාගේම මිලියන 10,000ක මුදලක් අපි වෙන් කර තිබෙනවා, හොඳ වී සංචිතයක් ආරක්ෂා කර ගන්න ඕනෑ කියන වුවමනාව නිසා. ආහාර සුරක්ෂිතතාව ගැන බොරු පාරම්බාන අයට අපි කියනවා, භය වෙන්න එපා, අපි ආණ්ඩුව විධියට අවශ්‍ය සැලසුම් හදලා තිබෙන්නේ කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තව විනාඩියක් දෙන්න.

අපි ආහාර සුරක්ෂිතතාව සඳහා සැලසුම් හදලා තිබෙන්නේ. ගොවියා නිෂ්පාදනය කරන අස්වැන්න සතොස ආයතනය හරහා මිලදී ගන්න රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා, ලබන අවුරුද්ද වෙනුවෙන් සැලසුම් හදලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගොවියාගේ නිෂ්පාදන මිලදී ගන්න අපි සැලසුම් හදලා තිබෙන්නේ. ඒ සඳහා තමයි රුපියල් මිලියන 1,000ක් වෙන් කළේ. ජනාධිපතිතුමාගේ උපදේශකත්වයෙන් සහ මැදිහත් වීමෙන් අපි ජනාධිපති ලේකම් කාර්යාලයට ලූනු ගොවියෝ එක්කහු කළා, බඩඉරිඟු ගොවියෝ එක්කහු කළා, වී ගොවියෝ එක්කහු කළා, අල ගොවියෝ එක්කහු කළා. ඒ අය එක්කහු කරලා, ඒ අය එක්ක සාකච්ඡා කරලා ලබන අවුරුද්දේ අර්බුදයක් නොවන විධියට ගොවීන්ගේ ගැටලු විසඳන්න අපි සැලසුම් හදලා තිබෙනවා. දඹුල්ලේ වසා දමා තිබුණු ගබඩාව නැවත ආරම්භ කරලා, ගොවි ජනතාව පීඩාවට පත් නොවන ලෙස තොග පවත්වාගෙන යන්න රුපියල් මිලියන 250ක් වෙන් කරලා තිබෙන බව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම බොහොම විශ්වාසයෙන් කියනවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පශු සම්පත් ක්ෂේත්‍රය පැත්තෙන් ගත්තත් පියවරක් ඉස්සරහට තබා තිබෙන බව. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව බෙහොම වෙහෙස මහන්සි වෙමින් අපේ රටේ කඩා වැටී තිබෙන නිෂ්පාදන ක්ෂේත්‍රය ඉහළට එසවීම වෙනුවෙන් කටයුතු කරනවා.

අපේ රටේ ගොවි ජනතාවගෙන් ලක්ෂ 4කට ආසන්න ප්‍රමාණයක් කිරි නිෂ්පාදනයේ යෙදී සිටිනවා. ඒ වාගේම, සත්තු ඉන්නවා ලක්ෂ 18කට ආසන්න ප්‍රමාණයක්. මේක නිෂ්පාදන කර්මාන්තයක් විධියට සංවර්ධනය කිරීම වෙනුවෙන් අපි පියවර තබා තිබෙනවා. අපි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට මැදිහත් වෙමින් තිබෙනවා දවසින් දවස, පියවරෙන් පියවර ඉදිරියට ගෙනයන්න. ඒ නිසා අපි විපක්ෂයේ අයගෙන් ඉල්ලනවා, තවත් මේ රටේ ජනතාවට බොරු බෙගල් අතාරින්න ලැහැස්ති වෙන්න එපා කියලා. ජනතාව වෙනුවෙන් තමයි අපි මේ මුදල් වෙන් කරලා, මේ කටයුතු ඉස්සරහට කරගෙන යන්නේ. කෘෂිකර්ම හා කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයන් වෙනුවෙන් රුපියල් මිලියන 750ක් වෙන් කර තිබෙන බව මම ඉස්සරවෙලා කිව්වා.

ඒ වාගේම, අපේ රටේ ගම් මට්ටමේ ඉන්න ජනතාවගේ අස්වැන්න වැඩි කිරීම වෙනුවෙන් අපි කටයුතු කරනවා. අද නිෂ්පාදන පිරිවැයේ වැඩිකමක් තිබෙනවා. ඒ නිෂ්පාදන පිරිවැය අඩු කරන්න නම් අපේ රටේ කෘෂි කර්මාන්තය සැලසුම්සහගත කරන්න ඕනෑය කියලා අපි කථා කළා. ඒ සැලසුම් සහගතකරණය වෙනුවෙන් අන්න කෘෂිකර්ම දෙපාර්තමේන්තුව "යාය 500" වැඩසටහන ආරම්භ කරලා, ඒ "යාය 500" වැඩසටහන හරහා නිෂ්පාදනය කොහොමද වැඩි කරන්නේ කියන එක ජනතාව එක්ක කථා බහ කරමින් ඉන්නවා. ජල කළමනාකරණය, පොහොර භාවිතය -මේ හැම එකක්ම- පිළිවෙළට කරන්නේ කොහොමද කියන එක ගැන කථා බහ කරමින් පියවරින් පියවර ඉස්සරහට යමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම කථාව අවසන් කරන්නම්. අපි විපක්ෂයේ බොහෝ දෙනාගෙන් ඉල්ලනවා, වැරදි තොරතුරු තවත් මේ රටේ ජනතාවට දෙන්න එපා කියලා. අඩුපාඩු තිබෙන්න පුළුවන්. කමක් නැහැ. අඩුපාඩු ගැන අපි කථා කරමු; සංවාද කරමු. ඒ සංවාදය කරලා අපි මේ රට මෙතැනින් ඉහළට එසවීම වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවත්, රටේ ජනතාවත්, ගොවි සංවිධාන නායකත්වයත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, අමාත්‍යාංශයේ සියලු සේවකයනුත් එක්කහු වෙලා සියයට 40කට වඩා කෘෂි කර්මාන්තයත් එක්ක ගැට ගැහිලා ඉන්න ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරමු, ඒ ජීවිත උසස් කරමු කියන ඉල්ලීම කරමින් මම නවතිනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.26]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අයහපත් කාලගුණික තත්ත්වය තුළ මහා විශාල ව්‍යසනයකට ලක් වෙමින් ජීවිත අහිමි වුණු, උන්හිටි තැන් අහිමි වුණු, ඉමහත් හානියකට ලක් වුණු අපේම රටේ ජනතාවට අපේ බලවත් කනගාටුව, ඒ වාගේම අපේ දැඩි ශෝකය මේ අවස්ථාවේ පළ කරන්නට කැමැතියි.

විශේෂයෙන්ම මේ ආපදාව තුළ විපතට පත් වුණු ජනතාවට උදවු උපකාර කරන්නට කටයුතු කරන රජයේ නිලධාරි මහත්ම මහත්මීන් සියලුදෙනාටත්, අපේ ආරක්ෂක අංශවලටත් අපේ ස්තුතිය පුද කර සිටිනවා.

මේ ඇති වී තිබෙන ආපදා තත්ත්වය තුළ අසහනයට පත් වෙච්ච, පීඩනයට පත් වෙච්ච, හානියට පත් වෙච්ච ජනතාවට ඒ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සහන ටික ලබා දීලා, මේ අමාරු වෙලාවේ ඒ අයට යම්කිසි සැනසීමක් ලබා දෙන්නට කටයුතු කරන්නය කියන ඉල්ලීමත් මා කරනවා.

මේ ආපදාව නිසා මහා දැවැන්ත විනාශයක් සිදු වෙලා තිබෙන මොහොතක, මේ මොහොත වෙනකලුත් මම නම් අහලා නැහැ, ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කර තිබෙනවාය කියලා. ඇයි ඇමතිතුමා එහෙම නොකරන්නේ, මෙච්චර විනාශයක් සිදු වෙලා තිබෙන වෙලාවකත්? ගිනිකොන දිශාවෙන් කිලෝමීටර 170කට පමණ එහා ගැඹුරු පීඩන අවපාතයක් නිර්මාණය වෙලා, ඒක සුළි සුළඟක් බවට පත් වෙමින් තිබෙන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් අපට දැනගන්නට ලැබෙන මොහොතක, ඔබතුමන්ලාගේ ආණ්ඩුව දන්නේ නැද්ද, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත පිළිබඳව? මෙහි 11වන වගන්තියේ තිබෙනවා, ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කර, ඒ තුළින් ඉතාම ඉක්මනින් පීඩනයට, අසහනයට පත් වන පවුල්වලට සහන ටික ලබාදෙන්න පුළුවන් කියලා. ඉතින්, කරුණාකර ඔබතුමා මේ උපදෙස දෙන්න ඒ අදාළ පුද්ගලයන්ට සහ ජනාධිපතිවරයාට. වහාම ක්‍රියාත්මක වන පරිදි ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
දැන් හමුවෙලා නේ ආවේ, කියන්න තිබුණා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම පෞද්ගලිකව හමු වුණේ නැහැ. වෙනම සාකච්ඡාවක් කැඳවූවා ව්‍යසන තත්ත්වය පිළිබඳව. එතැනදීම අපි කිව්වා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
එහෙනම් හරි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද හරි කියන්නේ? එහෙම හරි කිව්වාට ප්‍රකාශයට පත් කරන්නේ නැහැ නේ. ඒක නීත්‍යනුකූලව කරන්නට ඕනෑ. ඒ දේවත් කරලා නැහැ. මේ දේවත් කරන්නට තිබෙන අණ පනත් ටික දන්නෙත් නැහැ. ඔන්න, ඇත්ත තත්ත්වය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ආපසු එන්නම්, ආපදා කළමනාකරණ විෂයයට. මේ රටේ ගොවි ජනතාව ගැන, විශේෂයෙන්ම එක මිටට ගොවියා රකිනවාය කියන කථාව දැන් අපිට අහන්නට ලැබුණා. මම අහන්න කැමතියි, එක මිටට ගොවියා රකින මේ ආණ්ඩුව කලට වේලාවට පොහොර සඳහා මුදල් ටික ලබා දෙනවාද කියලා. අද ගුණාත්මකභාවයෙන් පොහොර ලැබෙනවාද? සහන මිලට පොහොර ටික ලැබෙනවාද? සහන මිලට කෘෂි රසායනික ලැබෙනවාද? අනෙකුත් යෙදවුම්, ඒ වාගේම උපකරණ මිල ශීඝ්‍ර ලෙස ඉහළ ගිහිල්ලා. වනඅලි-මිනිස් ගැටුමට තිරසර විසඳුමක් නැ. ස්ථාවර මිලක් ලැබෙනවා කියලා කියනවා. මේ විෂයය භාර ඇමතිතුමාටයි, නියෝජ්‍ය ඇමතිතුමාටයි මම අභියෝග කරනවා, පුළුවන් නම් වට්ටක්කා ගොවියා ළඟට ගිහිල්ලා අහන්න, මේ වතාවේ හොඳ මිලක් ලැබුණාද කියලා; පුළුවන් නම් අර්තාපල් ගොවියා ළඟට ගිහිල්ලා අහන්න, හොඳ මිලක් ලැබුණාද කියලා; පුළුවන් නම් ලොකු ලූනු ගොවියා ළඟට ගිහිල්ලා අහන්න, හොඳ මිලක් ලැබුණාද කියලා; පුළුවන් නම් ගොවිතැනේ නියැළෙන ජනතාව අතරට ගිහිල්ලා අහන්න, කලට වේලාවට පොහොර සඳහා මුදල් ටික ලැබුණාද කියලා. මම අභියෝග කරනවා. ඒ කියන්නේ. වායු සමීකරණය කරපු අමාත්‍යාංශ කාර්යාලවල ඇතුළේ ඉඳගෙන නොවෙයි, යන්න ගොවි බිමට. පසුගිය කාලයේ ගොවියා වෙනුවෙන් ගොවි බිමට ගිහිල්ලා, කුඹුරට ගිහිල්ලා ගොයම් කාලා ගොවියා ගැන තිබෙන ආදරය, දයාව, කරුණාව, කැක්කුම රටටම පෙන්නුවා අපි දැක්කා. එදා විපක්ෂයේ ඉන්නකොට තිබුණු ඒ කැක්කුම අද නැහැ නේ. අද ගොවියාව අමතක කරලා නේ. මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, මේ අයහපත් කාලගුණික තත්ත්වය තුළ විපතට පත්වුණු ගොවිතැන් කටයුතුවල නියැළුණු සියලු ගොවීන්ට කරුණාකරලා ඒ ලබා දිය යුතු වන්දි ටික ලබා දෙන්න, ඒ සහන ටික ලබා දෙන්න කියලා. ගොවියාට පමණක් නොවෙයි. ධීවර රස්සාව කරගන්නට බැරිව අද අතරමං වී සිටින ධීවර ප්‍රජාවටත් මේ සහන ටික ලබා දෙන්නට ඕනෑ. මේ ඇති වී තිබෙන ව්‍යසනකාරී තත්ත්වය තුළ වගාවට හානියක් සිදු වුවොත් ඒක බරපතළ ලෙස රටේ ආහාර සුරක්ෂිතභාවයට බලපානවා කියන එකත් මම මේ අවස්ථාවේ දී කියන්න කැමතියි.

මේ රටේ ගොවියා රකිනවා වෙනුවට ඔබතුමන්ලා කරලා තිබෙන්නේ රටේ නීතිරීති කඩ කරලා අනීතිකව කන්ටේනර් 323ක් නිදහස් කිරීමයි. ඒක නම් ඔබතුමන්ලා කරලා තිබෙනවා. ගොවියාගේ සුරක්ෂිතභාවය තහවුරු කරනවා කියලා ගොවියාගේ කරපිටින්, හිස මතින් රාජ්‍ය බලය අරගෙන ඔබතුමන්ලා කරලා තිබෙන්නේ රතු ලේබල් ගහපු කන්ටේනර් 323ක් අනීතිකව නිදහස් කිරීමයි. ඒ විතරක් නොවෙයි. දැන් දැන් අපිට ආරංචි ලැබෙනවා, ඒවායේ හඬ පට නිකුත් වෙලා තිබෙනවා. අනීතිකව ආපු කන්ටේනරයක් නීත්‍යනුකූලභාවයට පත් කරන්නේ කොහොමද? ඒ කන්ටේනර් release කර ගන්නේ කොහොමද? නීත්‍යනුකූලව ගහන වන්දි ටික ඉවත් කර ගන්නේ කොහොමද? ඒ කරුණු කාරණා පිළිබඳව නම් අද ඔබතුමන්ලා විශාරදයෝ බවට පත්වෙලා තිබෙනවා. අපි අහන්න කැමතියි, ඔබතුමන්ලා කියපු ගොවියා සුරකිනවා කියපු යුගය කෝ? ගොවියා සුරකින යුගයක් බිහි කරනවා කියපු ඔබතුමන්ලා අද මේ රටේ ලක්ෂ ගණන්, දස ලක්ෂ ගණන් ගොවි ජනතාව අනාථ කරලා තිබෙනවා. ගොඩ බෝග වගා කරන ගොවියාත් අනාථ කරලා; තේ, පොල්, රබර් ගොවියාත් අනාථ කරලා; එළවළු ගොවියාත්, පලතුරු ගොවියාත් අනාථ කරලා සමස්ත කෘෂිකර්මාන්තයම වට්ටලා තිබෙනවා. ඉතින්, ඔබතුමන්ලා කෘෂිකර්මාන්තය නංවාලන්නට ප්‍රායෝගිකව මහ පොළොවේ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද කියලා මම අහන්න කැමතියි.

අද ඔබතුමන්ලා වාරි කර්මාන්තය දියුණු කරන්නට මොනවාද කරන්නේ? ජාතික වාරි පුනරුත්ථාපන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට සැලසුමක් තිබෙනවාද, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබෙනවාද? මහා වාරි, මධ්‍ය වාරි, සුළු වාරි පද්ධතිය ආරක්ෂා කරගෙන මේ රටේ කෘෂි කර්මාන්තය ශක්තිමත් කරන්නට අපි කැප වෙන්නට ඕනෑ. ඔබතුමන්ලා විපක්ෂයේ සිටියදී ලොකුවට කථා කළාට, අද ප්‍රායෝගිකව ඒ දේ ඉෂ්ට සිද්ධ කරලා නැහැ. තමුන්නාන්සේලා ගොවියාගේ කර පිටින් බලය අරගෙන කන්ටේනර් release කරන විශේෂඥයන් බවට - ගොවියා රකින විශේෂඥයන් නොවෙයි, කන්ටේනර් release කරන විශේෂඥයන් බවට - අද පත් වෙලා තිබෙන බව බොහොම පැහැදිලිව මම කියන්නට ඕනෑ.

මේ වාගේ මහ ව්‍යසනයක් සිද්ධ වෙලාත්, අඩුම ගණනේ ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්නට බැරි ආණ්ඩුවක්, මේක. නොහැකියාවෙන් පෙළෙන ආණ්ඩුවක්, මේක. 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත ගැනවත් දන්නේ

නැති ආණ්ඩුවක්, අද මේ රටේ තිබෙන්නේ. ඒ නිසා, මේ රටේ හැම වගාවක්ම කරන ගොවි ජනතාව ශක්තිමත් කරන්නට කටයුතු කරන්න කියලා විශේෂයෙන්ම මේ අවස්ථාවේ අපි ඉල්ලීමක් කරනවා.

කෘෂි කර්මාන්තය හරහා දළ දේශීය නිෂ්පාදනයට එකතු කරන අගය වැඩි කරන්නට විශේෂිත වූ ජාතික වැඩසටහනක් අවශ්‍යයි. ව්‍යසනකාරී තත්ත්වයක් උද්ගත වෙලා තිබෙන මොහොතක කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව කථා කිරීමේදී විශේෂයෙන්ම ආපදාව තුළින් විපතට පත් වූ ජනතාව ගැන අපි කථා කරනවා. කරුණාකරලා ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරලා වැඩ කටයුතු කරන්න. ඉස්සෙල්ලාම කරන්න ඕනෑ ඒකයි. ඒ විතරක් නොවෙයි. ජීවිත අහිමි වුණු අයට, දේපළ අහිමි වුණු අයට, ජීවනෝපායන් අහිමි වුණු අයට සහන ලබා දීමේදී යල් පැන ගිය චක්‍රලේඛ ඉවත් කරලා, යුගයට සුදුසු ආකාරයට ඒවා යාවත්කාලීන කරලා ඉදිරියට ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. ඒ වාගේම විපතට පත් වුණු අයට වහාම වන්දි ලබා දෙන්නට කටයුතු කරන්න. ඔබතුමා ඕනෑ නම් හොයලා බලන්න, අම්පාර දිස්ත්‍රික්කයේ ආපදාවලට ලක් වුණු ගොවීන්ට තවමත් සහන ලබා දීලා නැහැ. ඒ වැඩකටයුතු ටිකත් ක්‍රියාත්මක කරන්න.

ඒ වාගේම ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සහ ආපදා කළමනාකරණ පනතත් යාවත්කාලීන කරන්න. යුගයට ඔබින ආකාරයට ඒවා සංශෝධනය කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ බරපතළ ගැටලු තිබෙනවා. පූර්ව අනතුරු ඇඟවීම්, තොරතුරු බෙදා හැරීමේ දුර්වලතා තිබෙනවා. ආයතන අතර සම්බන්ධීකරණය සීමිත වෙලා තිබෙනවා. යල් පැන ගිය අවදානම් සිතියම් අද ක්‍රියාත්මක වෙනවා. ප්‍රජා සූදානම ගත්තොත්, ඒ තරමම සූදානම්භාවයක් අද නැහැයි කියන එක අපට හැඟෙනවා. දුර්වල යටිතල පහසුකම් නඩත්තුව නිසා ආපදා වර්ධනය වනවා. පසු ආපදා ප්‍රතිචාරය මන්දගාමීව ක්‍රියාත්මක වනවා. ඒ වාගේම ප්‍රමාණවත් අරමුදල් වෙන් නොවන තත්ත්වයක් තිබෙන මොහොතක, විශේෂයෙන්ම දේශගුණ, කාලගුණ විපර්යාසවලට අනුවර්තනය සඳහා පවත්වන ඒකාබද්ධතාවයේ අඩුපාඩුකම් තිබෙනවා. පරිසර ආරක්ෂණ නීති බලාත්මක කිරීමේ බරපතළ සීමාවන් තිබෙනවා. මම මේ කරුණු කාරණා ඉදිරිපත් කළේ විශේෂයෙන්ම හැම ආපදාවක් තුළදීම කරුණු කාරණා ඉදිරිපත් වීමක් සිදු වුණත්, කවදාවත් මේවා නිවැරදි වෙන්නේ නැති නිසායි.

ඊළඟට මම විශේෂ යෝජනාවක් කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ වාගේ ආපදාවන් සිදු වනකොට, අපේ රටට තිබෙන්නේ Doppler Radar System එක. පුත්තලමේ ඒක පටන් ගත්තේ. ඒක ක්‍රියාත්මක කරන්නට ජපන් රජය JICA ආධාර ලබා දෙනවා. ඒකට යෙන් බිලියන 2.6ක් යනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු විපක්ෂ නායකතුමනි, කාලය අවසානයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තව විනාඩි දෙකක් ගන්නවා.

විශේෂයෙන්ම Doppler Radar System එකෙන් nowcasting, ඒ කියන්නේ දැනට තිබෙන weather එකේ තත්ත්වය, සුළි සුළං - cyclones, tornadoes, typhoons පිළිබඳ අනතුරු ඇඟවීම් කිරීම සඳහා අවශ්‍ය දත්ත ටික ලැබෙනවා. පුත්තලමේ ආරම්භ කළා වාගේම පොතුවිල්වලත් Doppler Radar System එකක් ආරම්භ කිරීම අත්‍යවශ්‍ය කාරණාවක්. ජපන් රජයෙන් මේ ඉල්ලීම කළොත්, JICA ආධාර යටතේ ඒක ලබා දෙන්න ඒ අය සූදානම්. විපක්ෂය හැටියට අපි සූදානම්, ජපන් රජයත් සමඟ, ඒ වාගේම ජපාන තානාපතිතුමාත් සමඟ සාකච්ඡා කරලා පොතුවිල්වලටත් Doppler Radar System එකක් ලබා ගන්න. මොකද, ඒක ලබා ගැනීම තුළින්, මේ නිර්මාණය වන අවදානම් තත්ත්වය පිළිබඳව වඩාත් නිවැරදි දත්ත -තොරතුරු- ජනතාවට ලබා දෙන්න හැකියාව ලැබෙනවා.

මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, මේ කාරණයත්. අපේ රටට ජාතික කෘෂි කාර්මික ප්‍රතිපත්තියක් අවශ්‍යයි. මේ කෘෂි කාර්මික ප්‍රතිපත්තිය තුළ කට වචනයට සීමා වුණු, සටන් පාඨවලට සීමා වුණු, ප්‍රකාශනවලට සීමා වුණු දේශපාලන සන්දර්ශන ක්‍රියාත්මක කිරීම නතරකොට, මේ රටේ ගොවියා සැබැවින්ම සුරක්ෂා කරන්නට, නිෂ්පාදන චක්‍රයේ යෙදවුම්වල ඉඳලා, උපකරණවල ඉඳලා, පොහොරවල ඉඳලා, කෘෂි නාශකවල, වල් නාශකවල ඉඳලා නිශ්චිත - ස්ථාවර - මිලක් ලබා දීම, වනඅලි-මිනිස් ගැටුමට විසඳුම් ලබා දීම සහ පසු අස්වනු තාක්ෂණය සහ ගබඩා කිරීම ඉතාම වැදගත් වනවා. එම නිසා මේ නිෂ්පාදන චක්‍රය ශක්තිමත් කරන්නට ඔබතුමන්ලා කටයුතු කරන්න. දේශපාලන වාසි තකා වී කිලෝවකට රුපියල් 150ක් දෙනවා කියලා කුඹුරට බැහැලා ගොයම් කැපුවාට හරියන්නේ නැහැ, පුණ්ණක්කු බිව්වට හරියන්නේ නැහැ. ඒකෙන් මං මුළා කරපු යුගය අද වන විට අවසන්. අද රටට අවශ්‍ය වන්නේ තිරසර ජාතික කෘෂි කාර්මික ප්‍රතිපත්තියක්. ඒ උදෙසා ඔබ කටයුතු කරන්න. නැතහොත්, කරන්නට පුළුවන් අපට මේ රටභාර දෙන්න කියලා මම යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
මේක Point of Order එකක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටේ ඇතිවෙලා තිබෙන ජාතික ආපදාව පිළිබඳව අද උදේ ගරු ජනාධිපතිතුමා කාරක සභා කාමර අංක 1දී අප සියලුදෙනා එක්ක සාකච්ඡා කළා. ඉතින්, මේ ආපදා තත්ත්වය පාවිච්චි කරලා දේශපාලන ගේම් ගහන වැඩ කරන්න එපා කියලා මම විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම විනාඩියක කාලයක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම ප්‍රකාශ කළේ, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 11(1) වගන්තියට අනුව - මෙතුමා දන්නේ නැති නිසා මම ඒකේ පිටපතක් එවන්නම් - ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කළාම විශේෂිත වූ සහන ලබා දීමේ අවස්ථාව එළඹෙනවා කියන එකයි. ඒක මම අද උදේ වරුවේත් යෝජනා කළා. ඒ වෙලාවේ ඔබතුමාත් ගරු සභාවේ සිටියා. මේ මොහොත වෙනකල් ඒක ක්‍රියාත්මක නොවූ නිසා මම දැනුත් ඒ යෝජනාව කරනවා. ඒක මගේ අයිතිය, ඒක මගේ නිදහස.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 1.43]

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙන් වූ කාලය සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ නේද? විනාඩි 7ක කාලය තිබෙනවා නේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය කියන්නේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක්. අද මේ අමාත්‍යාංශය තුළ ආයතන ගණනාවක් තිබෙනවා. හැබැයි, අද පවතින අයහපත් කාලගුණික තත්ත්වයත් එක්ක ඇති වී තිබෙන ආපදා තත්ත්වය යටතේ වුවත්, මේ අවස්ථාවේ දිස්ත්‍රික්ක 25ම නියෝජනය කරන මන්ත්‍රීවරුන් මෙම විවාදයට සහභාගි වනවා. රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට, අපේ රටේ ඇති වී තිබෙන මෙම ආපදාවලින් මිය ගිය ජනතාවගේ පවුල්වලටත්, ඒ වාගේම දේපළ හානි වුණු ජනතාවටත් මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. මොකද රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට මම දන්නවා, හැම අවුරුද්දකම මෙවන් ආපදාවලට අපේ දිස්ත්‍රික්කයේ ජනතාවට මුහුණ දෙන්න සිදු වන බව. මොකද, අපේ දිස්ත්‍රික්කයට අවුරුද්දකට දෙවතාවක් පමණ ගංවතුර තත්ත්වයක් ඇති වනවා. ඒ නිසා මේවායෙන් සිදු වන හානිය ගැන, ජීවිත හානි වුණු අයගේ පවුල්වලට සිදු වන අසාධාරණය ගැන, වන්දි නොලැබීම ගැන අපට අත්දැකීම් තිබෙනවා. අද මේ සභාව තුළ අපේ මන්ත්‍රීවරුන් කථා කළේ, වන්දි සහ ආපදා තත්ත්වය සම්බන්ධවයි. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමනි, මේ වනකොට රත්නපුර දිස්ත්‍රික්කයේ වී වගා කරන ගොවීන්ට අවශ්‍ය පොහොර සහනාධාරය ලබා දීමේ යම් අඩුවක් තිබෙනවා. ඒ පොහොර සහනාධාරය නිසි ලෙස ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

අපේ දිස්ත්‍රික්කයේ කුරුඳු, ගම්මිරිස් වැනි සුළු අපනයන භෝග රාශියක් වගා කරනවා. කොලොන්න ආසනයේ ගම්මිරිස් වගා කරපු ගොවීන් පසුගිය කාලයේ විශාල අපහසුතාවකට පත් වුණා, ගම්මිරිස් හැදුණේ නැති නිසා. ගම්මිරිස් හැදෙන්නේ අවුරුද්දකට එක සැරයයි. ඒකත් හැදෙන්නේ නැති වුණාම ඒ ගොවීන්ට විශාල ගැටලුවකට මුහුණ දෙන්න සිදු වනවා. නමුත් ඒ ගොවීන්ට කිසිම වන්දියක් ලැබුණේ නැහැ.

අපේ දිස්ත්‍රික්කයේ තේ කර්මාන්තය තිබෙනවා. හැබැයි, මේ වනකොට තේ කර්මාන්තයෙන් ඈත්වෙලා අපේ දිස්ත්‍රික්කය තුළ කුරුඳු කර්මාන්තය බහුලව ප්‍රචලිත වෙලා තිබෙනවා. කුරුඳු කර්මාන්තය ගැන කථා කරනකොට, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් අද ගැටලුවක් මතුවෙලා තිබෙනවා. ඒ දෙපාර්තමේන්තුව වෙන ආයතනයකට සම්බන්ධ කිරීමේ අදහසක් තිබෙන බව අපට දැනගන්න ලැබී තිබෙනවා. පසුගිය අවුරුද්දට කලින් අවුරුද්දේ ලංකාවේ වැඩිම අපනයන ආදායම ලැබෙන භෝගය බවට පත් වුණේ කුරුඳු. ඒ නිසා මේ දෙපාර්තමේන්තුව පවත්වාගෙන යමින්, කුරුඳු කර්මාන්තය සාර්ථක කර ගන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා. මොකද, ලෝකයේ හොඳම කුරුඳු තිබෙන්නේ ලංකාවේ කියන එක තමයි අපේ අදහස.

පශු සම්පත් අංශය ගැනත් ගරු මන්ත්‍රීතුමෙකු කථා කළා. මිල්කෝ ආයතනය රුපියල් මිලියන 18,000ක් ලාභ ලබලා, කිරි ගොවියන් සඳහා ගෙවීමට තිබුණු හිඟ මුදල් ගෙවන තත්ත්වයට පත් කළ බව කිව්වා. ඇත්තටම මිල්කෝ ආයතනය එහෙම ලාභ ලැබුවා නම් අපි ඒ ගැන සන්තෝෂ වනවා. ඒකේ කිසිම ගැටලුවක් නැහැ. ඒ සම්බන්ධව අපට කකුලෙන් අදින්න කිසිම වුවමනාවක් නැහැ.

ඒ වාගේම කිරි ගොවියා ගැනත් අද කථා කළා. රත්නපුර දිස්ත්‍රික්කයේත් කිරි ගොවීන් රාශියක් ඉන්නවා. කිරි ගොවීන් වැඩියෙන්ම ඉන්නේ වතු ආශ්‍රිතව. කිරි කර්මාන්තයේ යෙදෙන වතු ආශ්‍රිතව ඉන්න ද්‍රවිඩ සහෝදරවරුන් මේ වන විට ගැටලු රාශියකට මුහුණ දෙමින් සිටිනවා. ඒ වත්ත ඇතුළේ කිසිම shelter එකක්, ගව ගාලක් හදන්න වතු පාලන අධිකාරිය ඉඩ දෙන්නේ නැහැ. ඒවා හදපු ගමන් ම කඩලා දමනවා. ඒ මිනිස්සු ජීවත් වෙන්නේ ඒ රැකියාවෙන්. ඔවුන් කුකුළෝ ඇති කරනවා, හරක් ඇති කරනවා. ඔවුන් අලුතින් යම්කිසි ඉදිකිරීමක් කළොත් ඒවා කඩලා දමනවා. අපේ ප්‍රදේශයේ තේ වගා කරන්නේ නැති මුඩු බිම් රාශියක් තිබෙනවා. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය එක්ක කථා කරලා ඒ ඉඩම් නිදහස් කරගන්න පුළුවන්. ඒ වාගේම ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන LRC එක එක්කත් කථා කරලා මේ ඉඩම් ලබා ගන්න පුළුවන් නම්, කිරි කර්මාන්තයේ යෙදෙන ගොවීන් හඳුනාගෙන ඒගොල්ලන්ට තෘණ වගා කරන්න අවස්ථාවක් හදලා දෙන්න පුළුවන්. එහෙම කරන්න පුළුවන් නම්, ඒගොල්ලන්ගේ ජීවන තත්ත්වයත් ඉස්සරහට ගන්න පුළුවන්

කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මම ගරු අමාත්‍යතුමාගෙන් එම ඉල්ලීම කරනවා.

විශේෂයෙන් ඇඹිලිපිටිය ප්‍රදේශයේ කිරි කර්මාන්තය සිදු කරන්නේ මී හරකුන්ගෙන් ලබා ගන්නා කිරිවලින්. නමුත්, ඒ මී හරක් ටික ගාල් කරන්න ඒ ප්‍රදේශයේ තෘණ භූමියක් නැහැ. ඒ නිසා උඩවලවට තමයි ඒ සත්තු ගෙනියන්නේ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට පුළුවන් නම්, LRC එකත් එක්ක කථා කරලා, මහවැලි අධිකාරියට අයත් ඉඩමක් හරි අරන් දෙන්න, එම ගොවීන්ට තෘණ වගා කරන්න. එතකොට ඒක ඔවුන්ට විශාල ශක්තියක් වෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
ආයතන ගණනාවක් ගැන කථා කරන්න තිබෙන නිසා මට තව පොඩි කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනෙක් කාරණය, වාරිමාර්ග ක්ෂේත්‍රය. ගරු අමාත්‍යතුමනි, වාරිමාර්ග ආඥාපනත සංශෝධනය වෙලා නැහැ. පසුගිය දිනවල පැවති කාරක සභාවලදීත් අපි කිව්වා, වාරිමාර්ග ආඥාපනත සංශෝධනය කරලා දෙන්න කියලා. හැබැයි, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඒ අවස්ථාවේ ඇවිල්ලා හිටියේ නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා හරි ඉක්මනට මේක කරලා දෙන්න පුළුවන් වුණොත්, ඒ තුළින් අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු නිලධාරින්ට වැඩ කිරීමට තව ශක්තියක් ලැබෙනවා.

ගරු අමාත්‍යතුමනි, මම dry dam concept එක සම්බන්ධයෙන් සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කළා. මේ වනකොට ලංකාවේ ආපදා තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඒ තත්ත්වය හැම අවුරුද්දකම වාගේ එන්නේ රත්නපුර දිස්ත්‍රික්කයට. විපක්ෂයේ හිටියත් අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, ගංවතුර පාලනය කිරීම සඳහා dry dam එක ඉදිකර දෙන්න කියලා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා මේ වෙලාවේදී මගේ ස්තුතිය ඔබතුමාට පුද කරන්න ඕනෑ. මොකද, ගංවතුර පාලනය කිරීම සඳහායි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන්නේ. එසේ රුපියල් මිලියන 500ක් ඔබතුමන්ලා දුන්නා වාගේම අපට තිබෙන්න ඕනෑ, Planning Division එකක්. මාතර තමයි තිබුණේ වාරිමාර්ග අමාත්‍යාංශයේ Planning Division එක. අද ඒක වහලා තිබෙනවා. එම නිසා මම කියන්නේ CECB එකට හරි දීලා ඒ සඳහා ශක්‍යතා වාර්තාව හදා ගන්න කටයුතු කරන්න පුළුවන් නම් අපට එතැනින් එහාට යන්න පුළුවන් කියන එකයි.

ඒ කාලයේ අපේ චමල් රාජපක්ෂ හිටපු ඇමතිතුමා සිටියදී මම ඇල්ලේවැව ජලාශය නිර්මාණය කරන්නත් දායකත්වය ලබා දුන්නා. ඔබතුමා ඒ වෙනුවෙනුත් රුපියල් බිලියනයක් ලබා දීලා තිබෙනවා. මේ ඇල්ලේවැව ජලාශය අපි සම්පූර්ණ කළාට පස්සේ ඇඹිලිපිටියේ වී වගාවේ යෙදෙන අපේ ගොවීන්ට වී වගා කරන්න විශාල ශක්තියක් ලැබෙනවා.

ඊළඟට, LRC එක සම්බන්ධයෙන් මම තව පොඩි කාරණයක් කියන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට නඩුවක් දාලා තිබෙනවා, හැම වත්තකටම ඔප්පු දෙන්න එපා, පෞද්ගලික ආයතනවලට ඔප්පු දෙන්න එපා කියන කාරණය සම්බන්ධයෙන්. LRC එකේ ඔප්පු ගත්තොත්, Kahawatte Plantations PLC, Balangoda Plantations PLC කියන ඒවාට ඔප්පු නොලැබීම නිසා ජනවාරි මාසයේ පාසලකට යන දරුවන්ට ලකුණු 15ක් අහිමි වෙනවා, ගරු අමාත්‍යතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
මට තව සුළු වේලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම නිසා ඔබතුමා LRC එකට අයත් ඉඩම්වල පදිංචි වෙලා ඉන්න අය වෙනුවෙන් යම් වැඩසටහනක් හදනවා නම් හොඳයි. ඒ අයට ලියුමක් හරි පාසලට ලබා දෙන්න පුළුවන් වන විධියේ ක්‍රමවේදයක් හදලා දෙන්න පුළුවන් නම් ඒක ඔබතුමාට ලොකු ගෞරවයක් වෙයි. තව කාරණා රැසක් කියන්න තිබුණත් කාලය මදි නිසා මම නිහඬ වනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඉදිරි කාලයේදී මේ වැඩකටයුතු කරන්න ධෛර්යය හා ශක්තිය ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුණ පනාගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.51]

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂවලට අදාළ කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙනවා. අද රටම ව්‍යසනකාරී තත්ත්වයකට පත් වෙලා තිබෙන බව අපි කවුරුත් දන්නවා. මේ ව්‍යසනකාරී තත්ත්වය එද්දිම අද උදෑසන කාලයේ ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ අනෙකුත් මන්ත්‍රීවරුත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් එක්ක සාකච්ඡා කරලා මේ තත්ත්වයට උත්තර දෙන්න පුළුවන්, මුහුණ දෙන්න පුළුවන් වන විධියට වැදගත් තීන්දු තීරණ ගණනාවක් ගත්තා. ඒ විතරක් නොවෙයි, මේ වෙනකොටත් අමාත්‍යවරු කීපදෙනෙක් ආපදාවට පත් දිස්ත්‍රික්ක සඳහා පිටත් කර යවා අදාළ කටයුතු සාකච්ඡා කරන්න අවශ්‍ය වටපිටාව සකස් කර තිබෙනවා. අද හවස 2.00ට පක්ෂ නායකවරුන්ගේ රැස්වීමක් නැවත පවත්වලා අදාළ තීන්දු තීරණ ගනිමින්, කඩිනමින් මේ තත්ත්වය වෙනස් කිරීමට, ජනතාවට අවශ්‍ය පහසුකම් සහ ඔවුන්ට අවශ්‍ය සහන ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න තීරණය කරලා තිබෙනවා. හැබැයි, අපට පෙනෙන්න තිබෙන්නේ මොකක්ද? එක් කෙනෙක් ඇවිල්ලා කියනවා, ගමට යන්න කියලා. තව එක් කෙනෙක් ඇවිල්ලා කියනවා, ගොවි බිමට යන්න කියලා. අපි ගමේ වාගේම ගොවි බිමේත් ඉඳලා තමයි පාර්ලිමේන්තුවට එන්නේ. ඒගොල්ලන් ගමට ගිහිල්ලාත් නැහැ, ගොවි බිමේ ඉඳලාත් නැහැ. මම නම් කවදාවත් දැකලා නැහැ, විපක්ෂ නායකතුමා ගොවි බිමකට, කුඹුරකට

[ගරු අරුණ පනාගොඩ මහතා]

ගිහිල්ලා ඉන්නවා. හැබැයි, පසුගිය මැතිවරණ කාලයේදී එතුමා අමාරුවෙන් ඒදණ්ඩකින් යන්න ගිහිල්ලා වෙච්ච අකරතැබ්බයක් නම් මම දැක්කා. එතුමා කුඹුරක ඉන්නවා නම් අපි කවදාවත් දැක්කේ නැහැ.

අද වනකොට මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු කීදෙනෙක් ගොවියෝ විධියට කටයුතු කරනවාද? අපේ නාමල් කරුණාරත්න සහෝදරයා, සුදත් බලගල්ල සහෝදරයා, ටී.බී. සරත් සහෝදරයා, මීට මොහොතකට කලින් කථා කරපු සුසන්ත කුමාර නවරත්න සහෝදරයා කියන මේ කවුරුත් ගොවියෝ; ගොවි බිමේ ඉඳලා තමයි එතුමන්ලා මේ පාර්ලිමේන්තුවට එන්නේ. විපක්ෂ නායකතුමා කොළඹ හිටියාට, ගොවි බිමට, ඒදණ්ඩක යන්න එතුමාට බැරි වුණාට මේ කවුරුත් එන්නේ ගොවි බිමේ ඉඳලාය කියන එක එතුමා හොඳට මතක තබා ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ දිස්ත්‍රික්කයත් කෘෂි කර්මාන්තය තිබෙන දිස්ත්‍රික්කයක්. හැබැයි, පසුගිය කාලයේ කොළඹ දිස්ත්‍රික්කයට අදාළව කෘෂි කර්මාන්තය නැහැ කියන පැත්තෙන් තමයි හිටියේ. හිටපු සමහර ජනාධිපතිවරු ප්‍රකාශ කළා, බස්නාහිර පළාතට කෘෂි කර්මාන්තය ඕනෑ නැහැ, එම නිසා කුඹුරු ගොඩ කරන්න කියලා. එහෙම තත්ත්වයක් ගෙනාවා. එහෙම මතයක් ඇති කළා. හැබැයි අපි කියනවා, ඒක එහෙම නොවෙයි කියලා. වත්මන් ආණ්ඩුව හැටියට අපි කොළඹ දිස්ත්‍රික්කයේ කෘෂි කර්මාන්තය නඟාසිටුවන්න අවශ්‍ය වටපිටාව, වැඩ පිළිවෙළ මේ වෙනකොට සකස් කරලා තිබෙන්නේ. මම නියෝජනය කරන කොළඹ දිස්ත්‍රික්කය ගත්තොත්, එහි ගොවිජන සේවා මධ්‍යස්ථාන 9ක් තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම මේ දිස්ත්‍රික්කය තුළ කුඩා වැව් 5ක් තිබෙනවා. පසුගිය කාලය පුරාවට ඒ ආයතනවලට අදාළ සේවකයෝ හරියට බඳවා ගත්තේ නැහැ; නිලධාරින් බඳවා ගත්තේ නැහැ. ඒ නිසා වැව් ටික මනින්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ වාගේම එම රක්ෂිත ආරක්ෂා කරන්න පුළුවන්කමක් තිබුණේත් නැහැ. ඒවා තමන්ගේ දේශපාලන හිතවතුන්ට අල්ලා ගන්න ඉඩ හැරලා, ඒවා අත්හැර දාපු තත්ත්වයක් තිබුණේ. මගේ ආසනයේ, මත්තේගොඩ මහවැව ප්‍රදේශයේ පිහිටි රක්ෂිතය අවුරුදු ගණනාවක් තිස්සේ පිරිසක් අල්ලා ගෙන ඉන්නවා. ඒ අය කවුද කියලා හොයා බලන්න ඕනෑ. ඒවා මැනුම් කටයුතු කරන්න අවශ්‍ය තීන්දු තීරණ ගනිද්දී මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අදාළ නිලධාරින් නැහැ කියන එක අපි දකිනවා. ඒ නිසා මෙවර අය වැයෙන් අපි ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා වාගේම රජය තීරණය කරලා තිබෙනවා, මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අදාළ නිලධාරින් බඳවා ගෙන ඉදිරි කාලයේදී මේ තත්ත්වය වෙනස් කරන්න අවශ්‍ය මැදිහත්වීම් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයේදී අපි දකිනවා, විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂය බොහොම සාධනීය විවේචන ඉදිරිපත් කරපු නැති තත්ත්වයක්. ඒ අයට විවේචන තිබුණා. අය වැය සම්බන්ධයෙන් සාධනීය විවේචනයක් ඉදිරිපත් කරලා, මේ කෘෂි කර්මාන්තය නඟාසිටුවන්න, වැවිලි ක්ෂේත්‍රය ඉහළට ඔසවා තබන්න, එහෙම නැත්නම් පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කරන්න යනාදී වශයෙන් යහපත් විවේචන ඒ තුළ තිබුණේ නැහැ. ඒවා වෙනුවට එක්කෝ කන්ටේනර් ගැන කියනවා. පසුගිය සතියේම police report එකක් ගැන තමයි කථා කළේ.

ඒ අතරේ විපක්ෂ නායකතුමා කියනවා මම අහගෙන හිටියා, මේ චක්‍රලේඛ යල් පැන ගිහිල්ලා, එම නිසා ඒ චක්‍රලේඛ ඉවත් කරන්න ඕනෑ කියලා. අපි හිතනවා, විපක්ෂ නායකත් යල් පැන ගිහිල්ලා තිබෙන්නේ කියලා. හැබැයි, අපි නම් කියනවා, යල් පැන ගිය චක්‍රලේඛ හදන්න ඕනෑ, විපක්ෂ නායක නම් ඉවත් කරන්න හොඳ නැහැ කියලා. එතුමා යල් පැන ගියපු කෙනෙක් හැටියට මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑ. එතකොට හැමදාම විපක්ෂයට අබ සරණයි.

විශේෂයෙන් කෘෂි කර්මාන්තය දියුණු කිරීම සඳහා වන දැවැන්ත අමාත්‍යාංශයක් පිළිබඳවයි අද අපි විවාද කරන්නේ. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය භාර ඇමතිවරයා හැටියට ඉන්නේ ලාල් කාන්ත ඇමතිතුමා. මේ විෂයයන් සියල්ලට ඉන්නේ එක ඇමතිවරයෙක්. පසුගිය කාලයේ මේ අමාත්‍යාංශයට ඇමතිවරු කී දෙනෙක් හිටියාද? පොල් ගස් සම්බන්ධයෙනුත් සොයා බලන්නත් ඇමති කෙනෙක් හිටියා. බිත්තරවලටත් ඇමති කෙනෙක් හිටියා. අපි දැක්කා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ බෝඩ් එකක් පැත්තකට දාලා තිබෙනවා, බිත්තර, කිරි ආදී වශයෙන් සඳහන් රාජ්‍ය ඇමතිකමක් පිළිබඳව තිබුණු. එහෙම තමයි රටේ මහජන මුදල් නාස්ති කළේ.

රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා අද උදේ විවාදයට සම්බන්ධ වෙමින් කියනවා මම අහගෙන හිටියා, කෘෂි කර්මාන්තය කඩා වැටිලා, ගොවි ජනතාවගේ දරිද්‍රතාව වැඩි වෙලා, අවුරුදු 30ක් ඇතුළත ගොවියෝ සියයට 30ක් විතර දරිද්‍රතාවට පත් වෙලා ඉන්නේ කියලා. පසුගිය කාලය පුරා තමුන්නාන්සේලාගේ මැදිහත්වීම තුළ ඇමති ධුර විශාල ප්‍රමාණයකට මේ අමාත්‍යාංශය බෙදාගෙන, මහජන මුදල් නාස්ති කරමින්, ඉඩම් බෙදා ගෙන, ගජ මිතුරන්ට ඉඩම් ටික දීගෙන, මේ අමාත්‍යාංශය මොන තරම් පහළට ඇද දැමුවාද? අපි රජයක් විධියට මේ තත්ත්වය සහ ගැටලු හඳුනා ගෙන, ඒවාට මුහුණ දීලා, මේ තත්ත්වය වෙනස් කරන්න දැවැන්ත මුදලක් මේ අවුරුද්දේ මේ අමාත්‍යාංශයට විතරක් වෙන් කරලා තිබෙනවා.

මම දැක්කා, ගම්මිරිස් ආදී විවිධ අපනයන භෝග සම්බන්ධයෙනුත් විවිධ චෝදනා එල්ල කරනවා. මම කියන්න කැමැතියි, 1984දී පී. දයාරත්න කියන හිටපු ඇමතිවරයා මගේ ආසනය වන හෝමාගම ආසනයේ ඉඩම් අක්කර 40ක් -කෘෂි කාර්මික ඉඩමක් වෙච්ච LRC ඉඩම- කිසිදු පදනමක් නැතුව නිදහස් කළ බව. 1984දී දුන්නේ අක්කර 40, රුපියල් 561,000කට. මම සන්තෝෂ වෙනවා, මේ අවස්ථාවේදී සභාවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉන්නවා නම්. නමුත්, එතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. අක්කර 40ක් වෙච්ච LRC එකේ ඉඩම පී. දයාරත්න නිදහස් කරනවා. කෘෂි කාර්මික පදනමක් නැතුව 1984දී නිදහස් කළාට, 2017දී විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉඩම් ඇමති කාලයේදී කෘෂි කාර්මික පදනමින් මේ ඉඩම අයින් කරලා දාලා, මේක භාවිතාවෙන් ඕනෑම දෙයක් කර ගන්න හරිනවා. පසුගිය කාලයේ අපි ආණ්ඩුව භාර ගන්නකොට ඒක land sale එකක්. අක්කර 40ක ගම්මිරිස් වගාව තමන්ගේ ඇමතිවරුන්ට, තමන්ගේ දේශපාලන මිතුරන්ට ඕනෑ ඕනෑ විධියට, රිසි විධියට පරිහරණය කරන්න, පෞද්ගලිකව පාවිච්චි කරන්න දීපු තත්ත්වයක් තුළ තමයි, මෙතැනට ඇවිල්ලා අපිට මේ උපදෙස් දෙන්නේ. මේක තමයි පසුගිය කාලය පුරා අපේ කෘෂි කර්මාන්තයට වෙච්ච අලකළංචිය. කෘෂි කර්මාන්තය පහළට ඇදලා දමන්න, මේ නිෂ්පාදන කර්මාන්ත ටික පහළට ඇදලා දමන්න, අපනයන සංවර්ධනය පහළට දමන්න, රජයේ ඉඩම්වල තිබුණු වගා සියල්ල විනාශ කරලා, බෙදා ගත්ත කෑත දේශපාලන සංස්කෘතියක් මේ රටට ගෙනාවේ තමුන්නාන්සේලායි. එම නිසා ඒ තත්ත්වය වෙනස් කිරීම වෙනුවෙන් තමයි අද වනකොට අපි කවුරුත් එකතු වෙලා, මේ අමාත්‍යාංශය ඉහළට ඔසවන්න අවශ්‍ය යෝජනා ඒක රාශි කරමින්, ගොවියෝ සම්බන්ධ කර ගනිමින්, අදාළ ගොවි බිමේ හිඳගෙන කටයුතු කරමින්, මේ තත්ත්වයන් නිරාකරණය කරන්න මැදිහත් වෙන්න අවශ්‍ය වටපිටාවක් නිර්මාණය කරලා තිබෙන්නේ. මේ තත්ත්වය ඇති කරද්දී අද

වනකොට තරුණ පරම්පරාව කෘෂි කර්මාන්තයෙන් ඉවත් වෙමින් තිබෙනවා. ඊට බලපා තිබෙන්නේ මොකක්ද? ඒක කෘෂි කර්මාන්තයට ගැටලුවක්. ඒක වෙනස් කරන්න ඕනෑ. අලුත් තරුණ ව්‍යවසායකයින්, කෘෂි කාර්මික ව්‍යවසායකයින් මේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්න ඕනෑ. අපේ රටේ කෘෂි නිෂ්පාදනය ඉහළට ගෙනියන්න අලුත් තාක්ෂණික මෙවලම් හඳුන්වා දෙන්න ඕනෑ. ඒ තත්ත්වය නිවැරදි කරන්න අවශ්‍ය වටපිටාව හදන්න ඕනෑ කියලා ඒ නිසා අපි තීරණය කරලා තිබෙනවා.

මේ සඳහා වූ ආකල්පමය වෙනසක් තරුණ ගොවි පවුල් ඇතුළේ, තරුණ ව්‍යවසායකයන් තුළ ඇති කරන්න ඕනෑ. කෘෂි කර්මාන්තය නඟා සිටුවීම වෙනුවෙන් නවීන දැනුම, තාක්ෂණය මේ කර්මාන්තයට එකතු කරලා දීලා මෙය ඉහළට ඔසවන්න අවශ්‍ය වටපිටාව නිර්මාණය කරන්න මේ අය වැයෙන් දැවන්ත මුදල් සම්භාරයක් වෙන් කරලා තිබෙනවා.

වත්මන් රජය විධියට අද අපි මුහුණ දෙන අභියෝගය මොකක්ද? පසුගිය කාලයක් පුරා ගොවි ජනතාව තමන්ගේ වෘත්තියෙන් ඉවත් කරන්න මැදිහත් වෙච්ච මේ වටපිටාව වෙනස් කරලා නැවත ප්‍රබෝධමත් කෘෂි කාර්මික තත්ත්වයක් මේ රට තුළ ගොඩ නඟන්න අවශ්‍ය වටපිටාව නිර්මාණය කිරීමේ අභියෝගය අපි භාරගෙන තිබෙනවා. ලාල් කාන්ත සහෝදරයා ඇතුළු කෘෂිකර්ම අමාත්‍යාංශයට මැදිහත් වෙච්ච අපි කවුරුත් මේ තත්ත්වය වෙනස් කරන්න තමයි කටයුතු කරන්නේ. ඒ වෙනුවෙන් මේ වර්ෂයේ හොඳම මැදිහත්වීමක් කරන්න පුළුවන් වෙන විධියට ගරු ජනාධිපතිතුමා අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. මේ තත්ත්වය නිවැරදි කරන්න අපි කවුරුත් එකට මැදිහත් වෙනවාය කියන කාරණය මතක් කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.00]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මුලින්ම, ගංවතුර නිසා අවතැන් වූ ජනතාවට, ජීවිත හානි වෙච්ච පවුල්වල සියලුදෙනාට මගේ කනගාටුව, ශෝකය ප්‍රකාශ කරනවා. රජය මැදිහත් වෙලා ඒ අයට කඩිනමින් විසඳුම් ලබා දෙන්න කියන යෝජනාවත් මා ඉදිරිපත් කරනවා. අද දිනට නියමිත කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථාවේ විවාදයට අදාළව අදහස් ඉදිරිපත් කරන්නට පෙර මම මතක් කරලා දෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ගොවි ජනතාව සම්බන්ධව ගත්ත වැරදි තීන්දු තීරණ නිසා සහ දුන්න පොරොන්දු ඉෂ්ට කරගන්න බැරි වෙච්ච නිසා ජනාධිපති කෙනෙක් එළවපු රටක්, මේක. ඒක අපි කවුරුවත් අමතක කරන්න හොඳ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය දිහා බැලුවාම, විසඳුම් වෙනුවට ලස්සන ඉලක්කම් ටිකක් නම් දීලා තිබෙනවා කියලා පෙනෙනවා. කෘෂිකර්ම ඇමතිතුමනි, මේ මහ පොළොවේ පය ගහලා ඉන්න ඇමති කෙනෙක් විධියට ඔබතුමාත් මේ අවස්ථාවේ අපහසුතාවට පත්වෙනවා ඇති. මොකද, 2025 වර්ෂයට වෙන් වෙච්ච මුදල් අපි වියදම් කරලා තිබෙන්නේ කොහොමද, මොකක්ද ප්‍රගතිය කියලා බැලුවොත්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම හා කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයන් 50,000කට වසර පහක් ඇතුළත ණය පහසුකම් ලබා දෙන්න ඔබතුමන්ලා 2025 අය වැයෙන් මුදල් වෙන් කරගන්නවා. මේකට රුපියල් මිලියන 500ක් වෙන් වෙනවා. හැබැයි, 28දෙනාටයි ණය දීලා තිබෙන්නේ. මේ target එකට යන්න නම්, වසරකට අඩුම ගණනේ 10,000කටවත් ණය දෙන්න වෙනවා. නමුත්, දීලා තිබෙන්නේ 28දෙනාටයි. ඒකයි මම කිව්වේ ඉලක්කම් තිබෙනවා, බොහොම ලස්සනයි කියලා. ඒ, පළමුවැනි අය වැයෙන්. දෙවැනි අය වැයෙන් ඒ ක්ෂේත්‍රයටම රුපියල් මිලියන 750ක් වෙන් කරලා තිබෙනවා. 2026 වර්ෂයේ 10,000කට යන්න බැරි වුණත් අඩුම ගණනේ 5,000කටවත් මේ රුපියල් මිලියන 750 දීලා මේ target එකට යන්න කියලා මම මේ අවස්ථාවේ ඉතාම ඕනෑකමින් කියනවා.

වී ගොවියාගේ පොහොර සහනාධාරය සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 36,000ක් වෙන් කරලා තිබෙනවා. රුපියල් මිලියන 36,000ක් වෙන් කළාට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදට හරියටම දින 27යි වතුර දීලා මඩ වැඩ පටන් අරගෙන. එතකොට අපි බලන්න ඕනෑ, මඩ පොහොර ගැනීම සඳහා මේ පොහොර සහනාධාරය ලැබුණාද කියලා. පොහොර සහනාධාරය දෙන්නේ මඩ වැඩ පටන් ගන්නකොට නේ. ඔබතුමන්ලා කියනවා, හෙක්ටෙයාරයකට රුපියල් 25,000ක් දෙනවා කියලා. මේක දෙන්නේ දෙපාරකට. මේක දෙපාරකට හෝ ලැබුණාද, නැද්ද කියලා අපි ගොවීන් එක්ක කථා කරලා බැලුවා. පසුගිය දිනවල හැම දාම TVවල ගියා, වෙලාවට පොහොර ටික ලැබුණේ නැහැ, ඉක්මනට පොහොර ටික දෙන්න කියලා. අපි ගිහින් ඒගොල්ලන්ට කියලාවත්, ඔබතුමන්ලා ගිහින් මොකවත් කියලාවත් නොවෙයි, ගොවීන් ස්වේච්ඡාවෙන් එළියට ආවා. ඒ ආපු ගොවියාගේ දුක TVවලින් පෙන්නුවා, පොහොර ටික ලැබිලා නැහැ කියලා. පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තත්, පොහොර සහනාධාරය කොටසකට ලැබිලා තිබෙනවා, කොටසකට ලැබිලා නැහැ.

අද මේ පොහොර සහනාධාරය ප්‍රමාණවත්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? පොහොර සහනාධාරය ප්‍රමාණවත් නැහැ කියන්නේ මේ නිසායි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෙක්ටෙයාරයකට කොච්චර පොහොර ඕනෑද කියලා කියනවා. යූරියා කිලෝ 225යි, TSP කිලෝ 55යි, MOP කිලෝ 60යි. මේ පොහොර ටිකට නිර්දේශිත මිලක් තිබෙනවා.

ඒ මිල රුපියල් 66,700යි. එතකොට හෙක්ටෙයාරයකට මෙච්චර පොහොර ප්‍රමාණයක් අවශ්‍යයි, මෙච්චර මුදලක් යනවා කියලා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් කියන කොට පොහොරවලට රුපියල් 25,000ක් ලබා දීලා, ඒකත් දෙපාරකට දීලා, නියමිත වෙලාවට දෙන්නේත් නැති වුණාම අපට පුළුවන්ද, නිසි අස්වැන්නක් ලබා ගන්න? අපි කියන්නේ හෙක්ටෙයාරයකින් මෙච්චර වී අස්වනු ප්‍රමාණයක් තිබෙන්න ඕනෑ කියලායි. මේ අස්වැන්න ලැබෙන්න නම් වෙලාවට වතුර ටික දෙන්න ඕනෑ, වෙලාවට පොහොර ටික දෙන්න ඕනෑ, කෘමිනාශක, වල්නාශක දෙන්න ඕනෑ. මේවා නොලැබීම තුළින් අද ගොවියා දැඩි අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ගොවියා කියන්නේ මේ මහ පොළොවත් එක්ක ගැටෙන, අලින් ඇතුළු සතා සිව්පාවාත් එක්ක ගැටෙන පිරිසක්.

මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, මේ පාර්ලිමේන්තුවේ බහුතරයක් ඉන්නේ ගොවියෝ කියලා. එහෙම නම් අපි දැනගන්න

[ගරු කිංස් නෙල්සන් මහතා]

ඕනෑ, මේ ගොවියා ඉන්න තැන මොකක්ද කියන එක. ගොවියා කියන්නේ කොච්චර අසරණ කෙනෙක්ද? අද ගොවියා වැටිලා තිබෙන තැන මොකක්ද? ගොවියා කිසිම වෙලාවක තමුන්නාන්සේලා හම්බ වෙන්න, අපි හම්බ වෙන්න ඇවිල්ලා කියනවාද, "මට රස්සාවක් දෙන්න" කියලා? ඉල්ලන්නේ වෙලාවට වතුර ටිකයි, පොහොර ටිකයි. මෙන්න මේ ටික තමයි ඉල්ලන්නේ. ඊට පස්සේ, අස්වැන්න නෙළනකොට වීවලට හොඳ මිලක් ඉල්ලනවා. මෙන්න මේ දේවල් තුන විතරයි ඉල්ලන්නේ. ඒ දේවල් තුන දෙන්න අපිට පුළුවන් වුණොත් මේ රටේ බත සපයන ගොවියාට උපරිම සාධාරණයක් ඉෂ්ට සිද්ධ වෙයි කියලා මම විශ්වාස කරනවා. විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රී කෙනෙක් වන මම ඉන්නේත් ගොවි ජනපදයක. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, පොළොන්නරුව දිස්ත්‍රික්කයට මේ වෙනකොට අත්වෙලා තිබෙන ඉරණම මොකක්ද කියන එක. අනුරාධපුරයට අත් වෙලා තිබෙන ඉරණම මොකක්ද කියලාත් ඔබතුමා දන්නවා. ඒ නිසා විශේෂයෙන්ම අපේ ඇමතිතුමාට මම යෝජනාවක් කරනවා. ඔබතුමාට පළමුවැනි අය වැයේදී ඒ ඉලක්කයට යන්න බැරි වුණත්, මේ දෙවැනි අය වැයේදී මහ කන්නය වෙනුවෙන් ගොවියාට සාධාරණයක් ඉෂ්ට සිද්ධ කරයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම, පසුගිය යල කන්නයේ රජය විසින් වීවලට මිලක් ලබා දුන්නා. ඒ, තෙත වී කිලෝවකට රුපියල් 102ක මිලකුත්, වේළපු වී කිලෝවකට රුපියල් 120කුත් ලෙසයි. මෙතැනදී කරගත්ත වරද මොකක්ද? තෙත වී කිලෝවකට අපි රුපියල් 102ක මිලක් දුන්නා. එතකොට මොකද වුණේ? රජයේ ආයතනවලින් තෙත වී ගත්තාද? ලංකාවේ කිසිම තැනක තෙත වී ගත්තේ නැහැ, ගරු ඇමතිතුමනි. වී මෝල් මුදලාලිලා මොකක්ද කළේ? වී ගොවියෝ ළඟට ගිහිල්ලා කිව්වා, තෙත වී කිලෝව රුපියල් 102ට රජය ගන්නේ නැත්නම් අපි ඔයගොල්ලන්ගෙන් ගන්නේ ඇයි කියලා. ගත්තේ කීයටද? කිලෝවක් රුපියල් 80ට, රුපියල් 90ට.

අද අපේ රටේ ඉන්න ගොවීන් අතර වී ටික සියයට 14 ප්‍රමිතියට වේළන්න පුළුවන් ගොවියෝ කීයෙන් කී දෙනාද ඉන්නේ? රත්තරන් බඩු ටික ඇතුළු ගෙදර තිබෙන උගස් තියන්න පුළුවන් සෑම භාණ්ඩයක්ම උගස් තියලා තමයි බහුතරයක් ගොවියා කුඹුරට බහින්නේ. එතකොට අස්වැන්න නෙළාගෙන පාරට ගිහිල්ලා සියයට 14 ප්‍රමිතියට වේළන්න පුළුවන්ද, කිලෝවක් රුපියල් 120ට දෙන්න? දෙන්න විධියක් නැහැ. පාරේ වී ටික වේළන්න බැහැ, පොලීසියෙන් නඩු දානවා. මේ මහ කන්නය. මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා, වී වේළන්න ක්‍රමවේදයක් හදලා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්න. නිලධාරීන්ව දැනුවත් කරන්න, ගරු ඇමතිතුමනි. නිලධාරීන්ව කැඳවලා කියන්න, අපේ අමාත්‍යාංශයට මෙච්චර මුදලක් වෙන් කරලා තිබෙනවා, පොහොර සහනාධාරයට මෙච්චර මුදලක් වෙන් කරලා තිබෙනවා කියලා. අනිවාර්යයෙන්ම මේවා මේ අවුරුද්දේ වියදම් කරන්න ඕනෑ. මේක නැවතත් මහ බැංකුවට යවලා මහ බැංකුවේ සල්ලි මෙච්චරක් තිබෙනවා, රුපියල් මෙච්චරක් තිබෙනවා කියලා කිව්වාට වැඩක් නැහැ. මේවා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම යෝජනා කරනවා, තෙත වී කිලෝවකට දාලා තිබෙන රුපියල් 102ක මිල අයින් කරන්න කියලා. මේ මහ කන්නයේ මේ මිල අයින් කරන්න. ගොවියෝ මේක ඉල්ලුවේ නැහැ. තෙත වී කිලෝවකට නියම කර තිබෙන රුපියල් 102ක මිල වහාම අයින් කරන්න. ඒ වාගේම මේ වේළපු වී කිලෝවකට දෙන රුපියල් 120ක මිල සාධාරණ වේවි; කෘෂි උපකරණවලට තිබෙන සියයට 18ක VAT එක අයින් කරන්න. ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොර මිටියක් දෙන්න. වල්නාශකවලට, කෘමිනාශකවලට, පොහොරවලට තිබෙන VAT එක අඩු කළොත් මේ රුපියල් 120ක මිල ප්‍රමාණවත්. එතකොට ඔබතුමන්ලා කියන විධියට ගොවියෝ වී ටික දේවි. මේ ටික අඩු කරන්න.

අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ ගොවි ජනතාවගේ ඡන්දයෙන්. අපි මේ හඬක් නඟන්නේ ගොවියා වෙනුවෙන්. ගරු ඇමතිතුමනි, ගොවියාගේ හඬ තමයි මම අද මේ අවදි කරන්නේ. ඒ නිසා මම යෝජනා කරනවා, මේ සියයට 18 VAT එක අයින් කරන්න බැරි නම්, ගොවියාට මේ සහන දෙන්න බැරි නම් ගොවියාට රුපියල් 140ක සාධාරණ මිලක් ලබා දෙන්න කියලා. මෙන්න මේක තමයි විය යුත්තේ. ඒ නිසා මම විශ්වාස කරනවා, ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරයි කියලා.

ඊළඟට, ලොකු ලූනු ගොවියා ගැනත් කථා කරන්න ඕනෑ. ලංකාවේ බී ලූනු අවශ්‍යතාව මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක් කියලා තමයි කියන්නේ. මේකෙන් සියයට 82ක් අපි ආනයනය කරනවා. අද බී ලූනු ගොවියාට වෙලා තිබෙන්නේ මොකක්ද? මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අක්කර 700කට වැඩි ප්‍රමාණයක ලොකු ලූනු වගා කළා. මේ වෙනකොට එක ගෙදරක ලොකු ලූනු කිලෝ 10,000ක්, 15,000ක් තිබෙනවා. ලොකු ලූනු කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 130ක් වැය වුණා කියලා ඒ ගොවියෝ කියනවා. හැබැයි, ගොවීන්ට අද ලොකු ලූනු කිලෝ එකක් විකුණන්න සිදු වෙලා තිබෙන මිල කීයද? රුපියල් 110යි, 120යි. එහෙම නම්, අපි මේ ගැටලුව විසඳන්න ක්‍රමවේදයක් හදන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, අපට ඒ සඳහා ක්‍රමවේදයක් හදන්න පුළුවන්, ලොකු ලූනු අවුරුද්දක් පමණ කල් තබා ගත හැකි ගබඩා පහසුකම් තිබෙනවා නම්. ගබඩා පහසුකම් තිබෙනවා නම් ලොකු ලූනු අවුරුද්දක් තියා ගන්න පුළුවන් කියලායි කියන්නේ. ඒ විශේෂඥයෝ කියනවා, හරි ප්‍රමිතියට ගබඩාවක් හැදුවොත් ලොකු ලූනු එතරම් කාලයක් තියා ගන්න පුළුවන් කියලා. අපට එවැනි ක්‍රමවේදයක් හදන්න පුළුවන්. ලොකු ලූනු ගොවියා ශක්තිමත් කරන්න නම් ඒවාට මුදල් වෙන් කරලා ඒ අවශ්‍ය කරන ගබඩා ටික අපි හදලා දෙමු. එතකොට ඉබේම ඒ ගොවීන්ට හොඳ මිලක් ලැබේවි. එහෙම නම්, ලොකු ලූනු ගොවියා කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරන්න කියලා මම කියනවා.

මට පෙර කථා කරපු අනුරාධපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා ගොඩ හෝග වගාව ගැනත් කථා කළා. කුඹුරු ඉඩම්වල ගොඩ හෝග වගා කරන ගොවියාට හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක් දෙනවා කියලා එතුමා කිව්වා. එතකොට, බඩ ඉරිඟු වගා කරන ගොවියාටත්, කෙසෙල් වගා කරන ගොවියාටත් එය දෙනවාද? කුඹුරේ ගොඩ හෝග වගා කරන්නේ කීයෙන් කීදෙනාද? ගරු ඇමතිතුමනි, පොළොන්නරුව කජුවත්ත කියන ගම්මානයේ අක්කර 700කට වඩා බඩ ඉරිඟු වගා කරනවා. ඒ කිසිම ගොවියෙකුට මේ කියන පොහොර සහනාධාරය හම්බ වෙන්නේ නැහැ නේ. එහෙම කරන්න එපා. ඒ අහිංසක ගොවි ජනතාව ජීවත් වෙන්න කීයක් හරි හම්බ කර ගන්නේ ගොඩ හෝග වගාවෙන්. ඔවුන් වී ගොවියා හා සමානයි. බඩ ඉරිඟු වගා කරන, කෙසෙල් වගා කරන -ගොඩ හෝග වගා කරන- අයටත් පොහොර සහනාධාරය කුඹුරු ඉඩම්වල ගොඩ හෝග වගා කරන ගොවියාට වාගේම ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම මම මේ අවස්ථාවේදී කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිරි ගොවියා ගැනත් කියන්න ඕනෑ. පසුගිය අය වැයෙන් කිරි ගොවියා වෙනුවෙන් රුපියල් මිලියන 2,500න් වෙන් කළා. ඒ රුපියල් මිලියන 2,500ට මොකක්ද කළේ? මිල්කෝ එකට අහසින් කිරි එන්නේ නැහැ නේ. මිල්කෝ එකට කිරි එන්නේ අපේ ගම්වල ඉන්න අහිංසක කිරි

ගොවියාගෙන්. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන් රුපියල් මිලියන 2,500ක් වෙන් කළාට ඒ ගොවියාට අවශ්‍ය කරන තණ බිම් ටික අපි සොයා දීලා තිබෙනවාද, ගරු ඇමතිතුමනි? තණ බිම් නැහැ. හරකෙක් වනජීවී කලාපයකට ගියාම දඩය රුපියල් 30,000යි; 40,000යි; 50,000යි. කිරි ගොවියා අද ඒ කර්මාන්තයෙන් අයින් වෙන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අපේ කිරි ගොවියාත් ශක්තිමත් කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මම කරනවා.

ගරු ඇමතිතුමනි, කිරි ගොවියා ශක්තිමත් කරන්න නම් අප කළ යුතු දෙයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මට තවත් ඉතාම පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වාරි කර්මාන්තය ගැනත් මම පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. වාරි අංශයේ සංවර්ධනය සඳහා 2025 වර්ෂයේ රුපියල් මිලියන 78,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ රුපියල් මිලියන 78,000න් රුපියල් මිලියන 2,000ක් වෙන් කළා, ගල්ඔය, රාජාංගනය, හුරුළුවැව සහ මින්නේරිය ඇතුළු වාරිමාර්ග පද්ධති සඳහා. මින්නේරිය වැව සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කළා. ඒ ව්‍යාපෘතියේ වැඩ සියයට 85ක් දැන් වන විට අවසන් වෙලා තිබෙනවා. මේ අවුරුද්දේත් රුපියල් මිලියන 6,500ක් ඒ වැව් හතරටම වෙන් වෙලා තිබෙනවා. ඔබතුමාට නුවරවැව හදවත වගේ නේ. ඒ වාගේම තමයි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පරාක්‍රම සමුද්‍රය මගේ හදවතයි. මම පොළොන්නරුවෙන් එන හැම වාරයකදීම පරාක්‍රම සමුද්‍රයට වැඳලා එන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පරාක්‍රම සමුද්‍රයේ ඩී1 ඇළ ආරම්භ කරන තැන පළල තිබෙන්නේ අඩි 30යි. කිලෝමීටරයක් ඈතට යනකොට ඇළේ පළල අඩි 50, 60, 70 වෙලා වතුර අපතේ යනවා, ගරු ඇමතිතුමනි. එකම ව්‍යාපෘතියට 2025 වර්ෂයේත් රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා, මේ අවුරුද්දේත් රුපියල් මිලියන 6,500ක් වෙන් කරලා තිබෙනවා. ඉතිරි වැව්වලටත් මුදල් වෙන් කරන්න. ඒ වැව්වලටත් මුදල් වෙන් කරලා ඒ වැව්වලත් ජලය ඉතිරි කරලා දුන්නොත් ගොවියාට තමයි සෙතක් වෙන්නේ. තව කරුණු ගණනාවක් කියන්න තිබුණත් කාලය ප්‍රමාණවත් නැහැ.

ගරු ඇමතිතුමනි, මා අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමා මේ මහ පොළොවේ පය ගහලා ඉන්න ඇමතිවරයෙක්. ඒ ගැන මම සතුටු වෙනවා. ඔබතුමා ගොවියාගේ හද ගැස්ම හඳුනන කෙනෙක්. ඔබතුමා අපව දැක්කාම හිනා වෙලා කථා කරනවා. පමණක් ඇමතිවරු හිනා වෙන්නේත් නැහැ; කථා කරන්නේත් නැහැ. මම දන්නේ නැහැ මොකක්ද මේ වෛරය කියලා. ජනතා විමුක්ති පෙරමුණ කිව්වාම, මිනිස්සු අතරේ තිබෙන මතය වන්නේ වෛරය, ක්‍රෝධය තිබෙන අය කියලායි. ඒක වෙනස් කර ගන්න. ඒ නිසා ඔබතුමා අනෙක් ඇමතිවරුන්ටත් කියලා දෙන්න, දැක්කාම හිනා වෙලා කථා කරලා ඉන්න කියලා. "අනේ මල්ලී, මොකක්ද වෙන්න ඕනෑ" කියලා අහන්න. වැඩේ වුණේ නැතත් අපේ හිතට සතුටුයි. ගරු ඇමතිතුමනි, 2025 වසරේ ඔබතුමාගේ අමාත්‍යාංශයට වෙන් වුණු මුදල්වලට වෙච්ච දේ 2026 අවුරුද්දේ නොවන විධියට කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.14]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන මේ විවාදයේදී ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ වැදගත් විෂයයන් ගණනාවක්ම තිබෙනවා. ගොවි ජනතාවගේ පැත්තෙන් ගත්තොත්, ඔබතුමාට විශාල කාර්යභාරයක් කරන්න තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ මැති ඇමතිවරු මේ විවාදයට සම්බන්ධ වෙලා නොයෙකුත් අදහස් උදහස් දැක්වූවත් මහ පොළොවේ යථාර්ථය බැලුවාම, කෘෂිකර්මය පැත්තෙන් අපි ආපස්සට ගිහිල්ලා තිබෙනවා කිව්වොත් මම නිවැරැදියි. අපි දැක්කා, පසුගිය දවස්වල මේ රටේ ගොවි ජනතාව විවිධ කාරණා සම්බන්ධයෙන් උද්ඝෝෂණය කළ ආකාරය. මේ ආණ්ඩුව බලයට එන්න ඉස්සෙල්ලා පැවැති උද්ඝෝෂණවල මෙහෙයවීම් කටයුතු කළේ ඔබතුමන්ලායි. වීවලට සාධාරණ මිලක් ලබා දෙන්න කියලා වී ගොවියෝ නොයෙකුත් තැන්වල උද්ඝෝෂණය කරන ආකාරය අදත් අපි දකිනවා. ඔබතුමන්ලා කියනවා, ඔබතුමන්ලා වී ගබඩා ආරම්භ කළා, වී මිල දී ගැනීමට අවශ්‍ය කටයුතු කළා කියලා. නමුත්, ගොවි ජනතාවත් එක්ක සාකච්ඡා කළොත්, ගොවි ජනතාවගේ පැත්තෙන් බැලුවොත් ඒ අයට සාධාරණ මිලක් ලැබුණේ නැහැ කියන මැසිවිල්ල තවමත් නැඟෙනවා කියන කාරණය මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

ඒ වාගේම තමයි, අනෙකුත් භෝග වගාවන් කරන ගොවීන්ගේ තත්ත්වය ගත්තත්. විශේෂයෙන්ම එළවලු ගොවීන් ගත්තත්, ලොකු ලූනු ගොවීන් ගත්තත්, අල ගොවීන් ගත්තත් එහෙමයි. පසුගිය දවස්වල එම ගොවීන් නොයෙකුත් ආකාරයේ උද්ඝෝෂණ කරනවා අපි දැක්කා. තමන්ට වෙච්ච අසාධාරණකම් සම්බන්ධයෙන් තමයි ඒ ගොවීන් දිගින් දිගටම කථා කළේ. ඉතින් ඒ ගැටලු සම්බන්ධයෙන් පිළියම් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වෙනවා. මම කියන්නේ නැහැ ඔබතුමන්ලා මේ හැම කටයුත්තකටම සියයට 100ක් වග කියන්න ඕනෑ කියලා. දීර්ඝ කාලයක් තිස්සේ පැවත ආපු යම් යම් හේතූන් ද මේ තත්ත්වයට බලපාන්න ඇති. තමුන්නාන්සේලා අවුරුද්දෙන්

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

දෙකෙන් කෘෂිකර්මය පැත්ත ගොඩ දමනවා නම්, අනෙකුත් භෝග වගා කරන ගොවීන් ගැන කල්පනා කර බලා යම්කිසි වැඩ පිළිවෙළක් කරනවා නම් හොඳයි. ඒ සඳහා දිගු කාලීන වැඩ පිළිවෙළක් අවශ්‍ය කරනවා කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා. මේ තත්ත්වයත් එක්ක නම් ගොවි ජනතාවගෙන් විශාල පිරිසක් දිගින් දිගටම ගොවිතැනෙහි නියැළෙයි කියලා හිතන්න පුළුවන්කමක් නැහැ. දැනටමත් ලක්ෂයකට අධික සංඛ්‍යාවක් ගොවිතැනෙන් ඉවත් වෙන්න තීරණය කර තිබෙනවා කියන එක තමයි අපට සමීක්ෂණවලින් දැනගන්න තිබෙන්නේ. වී ගොවිතැන ගත්තොත්, මේ කාලය වන කොට සියයට 10ක විතර බිම් ප්‍රමාණයක් වගා කරන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. විවිධ මූලාශ්‍රවලින් අපට ලැබෙන තොරතුරු අනුවයි අප මේවා ගැන කථා කරන්නේ. ඒක තමයි තිබෙන තත්ත්වය. මේ වාගේ ප්‍රශ්න තිබියදී, අස්වැන්න අලෙවි කර ගැනීමේ ගැටලු සහගත තත්ත්වයන් තිබියදී වගා කරන කොට ඇති වන තත්ත්වය අපි දන්නවා.

විශේෂයෙන් අපේ දිස්ත්‍රික්කය ගත්තොත්, ගෙවතු වගාවට සම්බන්ධ වෙලා එළවලු වගා කරන විශාල පිරිසක් ඉන්නවා. ඒ අයට පසුගිය දවස්වල තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි වන සතුන්ගෙන් වන හානිය. වත්මන් ආණ්ඩුව ආපු ගමන්ම වන සතුන්ගෙන් වන හානිය අවම කරන්න කියලා, ඔබතුමන්ලා මැදිහත් වෙලා ලොකු සමීක්ෂණයක් කරන්න, සංගණනයක් කරන්න කටයුතු කළ බව අපි දන්නවා. ඒ සංගණනයට පසුව දැන් මාස ගණනාවක් ගත වෙලා තිබෙනවා. අපි දන්නේ නැහැ, ඒ සංගණනයේ ප්‍රතිඵල මොනවාද, ඒ සංගණනයට අනුව ගත්තා වූ පියවර මොනවාද, ඒ තුළින් ඒ වන සතුන්ගෙන් වගාවට වන හානිය වළක්වන්න, එහෙම නැත්නම් වන සතුන් ටික පළවා හරින්න ගත්තා වූ පියවර මොකක්ද, ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ අදහස, පණිවුඩය මොකක්ද කියලා. ඒ ගැන අපි කවුරුවත් දන්නේත් නැහැ; මේ රටේ ගොවි ජනතාව දන්නේත් නැහැ. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක බරපතළ ප්‍රශ්නයක්. මේ සම්බන්ධව ඔබතුමන්ලා කඩිනමින් විසඳුමක් දෙන්න ඕනෑ. කෘෂිකර්මය නඟා සිටුවන්න ඕනෑ, වගා සංග්‍රාම ඇති කරන්න ඕනෑ, අපේ ගොවි ජනතාවට අවශ්‍ය දේවල් ලබා දෙන්න ඕනෑ කියමින් ඒ හැමදේම ලබා දුන්නා වුණත් ඒ අයට වගා කටයුතු කරන්න පුළුවන්කමක් නැත්නම්, වන සතුන්ගෙන් එහෙම නැත්නම් විවිධ හේතූන් නිසා ඒ වගා කටයුතු කර ගන්න ලැබෙන්නේ නැත්නම් ඔබතුමන්ලා බලාපොරොත්තු වන ඉලක්කයට යන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. ඒ නිසා අපි ඉල්ලා සිටින්න කැමැතියි, මේ වන සත්ත්ව උවදුර සම්බන්ධව යම්කිසි ක්‍රියා මාර්ගයක් කඩිනමින් ගන්න කියලා.

මට මතකයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ මැදිහත්වීමෙන් පෙබරවාරි මාසයේ 15වැනි දා "වගා සංග්‍රාමය" කියලා වැඩසටහනක් ආරම්භ කරන්න ඔබතුමන්ලා කටයුතු කළ ආකාරය. මම එය මාධ්‍යයෙන් දැක්කා. ඒකට මොකක්ද වුණේ කියලාත් අපි දන්නේ නැහැ. ඒකත් අර වන සතුන්ගේ සංගණනය වාගේම තමයි. මේ මේ වැඩ කටයුතු ආරම්භ කරනවා කියලා ඔබතුමන්ලා ප්‍රචාරය කළාට, ඒවායින් ජනතාවට සේවයක් වෙනවා කිව්වාට, කෘෂිකර්මය පැත්තෙන් සේවයක් වෙනවා කිව්වාට තවම ඒ සම්බන්ධයෙන් යම්කිසි වැඩ පිළිවෙළක්, ඉදිරි ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන එක තමයි අපට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න වෙන්නේ.

කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා සේවය කරන නිලධාරීන්ගේ ප්‍රශ්නයක් ගැනත් විශේෂයෙන් කියන්න තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගේ ගමන් දීමනා වශයෙන් මීට ඉස්සර වෙලා දීලා තිබුණේ රුපියල් 400ක්. 2024දී කැබිනට් තීරණයක් අරගෙන තිබෙනවා, එය රුපියල් 1,000 දක්වා වැඩි කරන්න ඕනෑ කියලා. ඒ අනුව රුපියල් 1,000ක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා ගිය මාසය වෙනකම්ම. ඊට පස්සේ නැවත තීන්දුවක් අරගෙන තිබෙනවා ඒක නැවත අය කර ගන්න. ඒ තීන්දුව නීත්‍යනුකූල නැහැ, ඒක ගෙවලා තිබෙන්නේ වැරදි ක්‍රමයකට කියලා, නැවත වරක් ඒ දීමනාව අය කර ගන්න කටයුතු කරලා තිබෙනවා. මම හිතනවා ඒක බරපතළ තත්ත්වයක් කියලා. මොකද, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරු කරන සේවය වෙනුවෙන් තමයි ඒ දීමනාව ලබාගෙන තිබුණේ. ඒ මුදල නැවත ගෙවීමට ඒගොල්ලන්ට හැකියාවක් නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ඒ තීන්දුව වෙනස් කරලා කැබිනට් තීන්දුව අනුව රුපියල් 1,000 දීමනාව ලබා දීමේ වැඩ කටයුත්ත කරන්න කියලාත් මම මේ අවස්ථාවේ ඒ අය වෙනුවෙන් කියන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ඔප්පු පිටපත් ලබා ගැනීමේදී අපේ ජනතාව නොයෙකුත් ආකාරයේ ගැටලු, දුෂ්කරතාවලට පත් වෙනවා කියලා නිරන්තරයෙන් මැසිවිලි තිබෙනවා. අපි දන්නවා තමුන්නාන්සේලා සෑම ස්ථානයකම එක් දින සේවයක් හඳුන්වලා දීලා, රුපියල් 600ක් ගෙවලා ඒ පිටපත් ලබා ගැනීම කර ගන්න පුළුවන්කම තිබෙන බව. නමුත් එක් දින සේවයෙන් කවදාවත් එක් දිනයකින් ඒ පිටපත් ලබා ගන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. හුඟක් වෙලාවට දවසක් දෙකක් යනවා. සාමාන්‍ය සේවයෙන් ගන්නා කෙනෙකුට මාසයකට අධික කාලයක් ගත වෙන අවස්ථා තිබෙනවා. එහිදී නොයෙකුත් ආකාරයේ නීත්‍යනුකූල නොවන කටයුතු සිදු වෙනවා කියලාත් මැසිවිලි තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඉල්ලා සිටින්න කැමැතියි, ඒ කටයුතු යාවත් කාලීන කරලා, අලුත් ක්‍රමයකට ජනතාවට ඒවා කඩිනමින්, අක්‍රමිකතාවලින් තොරව ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, වාරිමාර්ග අමාත්‍යාංශය ගැන කථා කළොත්, යටියන්තොට වී ඔය ජලාශය සම්බන්ධ යෝජනාව ආවේ යහ පාලන ආණ්ඩුව තිබෙන කාලයේ. 2017දී පමණ අය වැය යෝජනාවක් හැටියට ඇවිල්ලා, ඒ සම්බන්ධ සමීක්ෂණ කටයුතු ආරම්භ කරන්න කටයුතු කළා. මම හිතන විධියට, දැන් ඒකට අවුරුදු 8ක් විතර ගත වෙලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යටියන්තොට ප්‍රදේශයේ පවුල් 25ක් විතර ඉවත් කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ අය තවම දෙකට දෙවාරේ ඉන්නේ මේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වෙනවාද නැද්ද කියලා. ගරු ඇමතිතුමනි, දැන් අවුරුදු 8ක විතර කාලයක සිට ඒ අයට ඒ ඉඩම් සංවර්ධනය කර ගන්න පුළුවන්කමක් නැහැ. තේ, රබර් වැනි අපනයන භෝග වගාවෙන් ජීවත් වන විශාල පිරිසක් ඒ ඉඩම්වල පදිංචි වෙලා ඉන්නවා. අවුරුදු 8ක සිට ඒ අයට ස්ථිරසාර විසඳුමක් නැති නිසා ඒ අයට ඒ ඉඩම් ටික සංවර්ධනය කර ගන්න පුළුවන්කමක් නැහැ, නැවත වගා කරන්න හැකියාවක් නැහැ. ඒ තුළින් ඒ ප්‍රදේශවල ජනතාව බරපතළ අසීරුතාවට පත් වෙලා ඉන්නවා. මම ගරු ඇමතිතුමන්ලාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, එක්කෝ ඒ ජනතාවට කියන්න ඒ යෝජනා ක්‍රමය ස්ථිර වශයෙන් වෙනවා කියලා. ඒක සිදු වෙන්නත් තව අවුරුදු ගණනාවක් යයි. අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ ඒ තීන්දුව අනිවාර්යයෙන් ක්‍රියාත්මක වෙනවා නම්, ඒ පවුල් ටික ඉවත් කරන්න කටයුතු කරනවා නම්, අඩුම ගණනේ, -ඒ අයට වන්දි ලබා දීමේ ක්‍රමයක් තමුන්නාන්සේලා ගණනය කරලා ඇති නේ- වන්දි ලබා දීමේ වැඩ පිළිවෙළවත් ක්‍රියාත්මක කරලා ඒ අය ඉවත් කරන්න. එහෙම නැත්නම් ඒ අය ඉල්ලා සිටිනවා අඩුම ගාණේ ඒ අහිමි වෙන ඉඩම් ටිකට සරිලන ඉඩම් ටිකක් ලබා දෙන්න කියලා. ඒ කිව්වුව ජනතා

වතු සංවර්ධන මණ්ඩලයට අයත් නාගස්තැන්න වත්ත සහ කන්දැල්ල වත්ත තිබෙනවා. ඒගොල්ලන් යෝජනා කරන විධියට ඔබතුමන්ලාට පුළුවන් ඒ අයට ඒ අහිමි වෙන ඉඩම් ප්‍රමාණයට සරිලන්න ඒ වතුවලින් ඉඩම් අරගෙන දීලා ඒ අයගේ ජීවිතය දියුණු කර ගන්න, ස්ථාවර කර ගන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ගරු ඇමතිතුමනි, ඒ කටයුත්ත ඉක්මන් කරලා කරන්න. ඔබතුමන්ලා මේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළත් ඒක පටන් ගන්න තව අවුරුදු හත අටක්, එහෙම නැත්නම් දහයක් යන්නත් පුළුවන් මේ යන විධියත් එක්ක බලනකොට. ඉතින් ඒ තීන්දුව ඒ ආකාරයට ක්‍රියාත්මක වෙනවා නම්, අනිවාර්යයෙන්ම ඒ අයට විකල්ප ඉඩම් ටික ලබා දීලා, ඒ අයට අවශ්‍ය වන්දි ටික ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා තමයි මම මේ අවස්ථාවේදී යෝජනා කරන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සෙල්ලතම්බි තිලකනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.23]

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் கமத் தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான இன்றைய குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன்.

இலங்கை நாடானது ஒரு விவசாய நாடாகும். உண்மையிலே இந்த நாட்டில் வசதியாக வாழவேண்டியவர்கள் விவசாயப் பெருமக்கள்! எனினும், கடந்த கால அரசாங்கங்கள் விவசாயத்துக்கும் கால்நடை வளர்ப்புக்கும் முக்கியத்துவம் கொடுக்காததன் காரணமாக, தற்போது இலங்கையில் விவசாயிகள் சொல்லொணாத் துயரங்களை அனுபவித்து வருகின்றார்கள். இதனால் எமது அரசாங்கமானது பல்வேறு திட்டங்களை விவசாயிகளுக்காக உருவாக்கியுள்ளது. அதன் அடிப்படையில், நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற வன்னிப் பிரதேசத்தில் பல்வேறு அபிவிருத்தித் திட்டங்களை மேற் கொண்டுள்ளது. வவுனியா, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களில் குடிநீர்ப் பிரச்சினை காணப்படுகின்றது. அத்துடன், அங்கு விவசாயிகளுக்குப் பயிர்ச்செய்கைக்கான நீர்த் தட்டுப்பாடும் நிலவுகின்றது. இவற்றை நிவர்த்தி செய்வதற்காக 6 பில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டில் பாலியாறு நீர்த்தேக்கத் திட்டம் வருகின்ற வருடம் ஆரம்பிக்கப்படவுள்ளது.

இந்த வருடம் நாட்டின் பல பகுதிகளில் ஏற்பட்ட வெள்ளப்பெருக்குபோல், மன்னார் மாவட்டத்தில் ஒவ்வொரு வருடமும் வெள்ளப்பெருக்கு ஏற்படுகின்றது. இந்தப் பாலியாறு நீர்த்தேக்கத் திட்டம் நடைமுறைப்படுத்தப்படுமானால், மன்னார் மற்றும் யாழ்ப்பாண மாவட்டங்களிலுள்ள குடிநீர்த் தேவையை நிவர்த்தி செய்ய முடிவதுடன், மன்னார் மாவட்டத்தினுள் காணப்படுகின்ற பல்வேறு சிறுசிறு குளங்களுக்கான நீர்த் தேவையையும் பூர்த்திசெய்யக்கூடியதாக இருக்கும். மேலும், இந்த நீர்த்தேக்கத் திட்டத்துக்கு அருகாமையில் காணப்படுகின்ற நிலங்கள் கால்நடை களுக்கான மேய்ச்சல் தரையாக உருவாக்கப்படும் என்பதையும் நான் இந்தத் தருணத்தில் குறிப்பிட விரும்புகின்றேன். அதேபோல், கீழ் மல்வத்து ஓயா திட்டமும் எதிர்வருகின்ற வருடம் ஆரம்பிக்கப்படவுள்ளது. இந்தத் திட்டத்துக்கு 5 பில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப் பட்டுள்ளது. இந்தத் திட்டம் பூர்த்தியடையும் பட்சத்தில், மன்னார் மாவட்டத் திலுள்ள கட்டுக்கரைக் குளத்தின் கீழுள்ள வயல் நிலங்களில் இரண்டு போகமும் நெற்செய்கையை மிகத் திறம்படச் செய்யக்கூடியதாக இருக்கும். இவ்வாறான திட்டங்களை நடைமுறைப்படுத்துவதன்மூலம் மன்னார் மாவட்ட மக்களுக்குச் சிறந்ததோர் எதிர்காலத்தை எங்களுடைய அரசாங்கத்தால் ஏற்படுத்திக் கொடுக்க முடியும் என்பதை நான் இந்தத் தருணத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த காலத்தில் கால்நடை வளர்ப்பாளர்கள் கட்டுக்கரைக் குளத்தின் கீழாகக் காணப்படும் நீரேந்துப் பகுதிகளை மேய்ச்சல் தரையாகப் பாவித்து வந்தனர். ஆனால், சில வருடங்களுக்கு முன்னர் சிலர் அந்த நிலங்களை குறிப்பிட்ட சில அதிகாரிகளின் ஒத்துழைப்புடன் பங்கீடுசெய்து, விவசாயத்தில் ஈடுபட்டு வருகின்றனர். இதனால் நானாட்டான் பிரதேசத்திலுள்ள கால்நடை வளர்ப்பாளர்களுக்கு மேய்ச்சல் நிலத்துக்கான தட்டுப்பாடு ஏற்பட்டுள்ளது. எமது அரசாங்கத்தின் Clean Sri Lanka திட்டத்தின்கீழ் அந்தக் குளத்துக்குக்கீழ் காணப்படுகின்ற நீரேந்துப் பகுதிகள் தற்போது எல்லையிடப்பட்டு வருகின்றன. அந்தப் பணி முடிந்ததன் பின்னர், அந்த நிலங்களை கால்நடை வளர்ப்புக்குப் பயன்படுத்த முடியும் என்பதை நான் இந்தத் தருணத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

எதிர்வருகின்ற வருடம் கிவுல் ஓயா நீர்த்தேக்கத் திட்டமானது 25,000 மில்லியன் ரூபாய் செலவில் ஆரம்பிக்கப் படவுள்ளது. இந்தத் திட்டத்தை நடைமுறைப்படுத்தினால் நெடுங்கேணி, வெலிஓயா போன்ற பிரதேசங்களில் வாழுகின்ற விவசாயிகளினது நீர்த் தேவையையும் ஒட்டுசுட்டான், நெடுங்கேணி போன்ற பிரதேசங்களில் வாழ்கின்ற மக்களின் குடிநீர்த் தேவையையும் நிவர்த்தி செய்யக்கூடியதாக இருக்கும் என்பதை நான் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். நெடுங்கேணியிலும் அதை அண்டிய பிரதேசங்களிலும் காணப்படும் நிலக்கீழ் நீரானது, உண்மையிலேயே சிறுநீரகத் துக்குப் பொருத்தமில்லாத நீராகக் காணப்படுகின்றது. எமது அரசாங்கம் அந்தப் பிரதேசத்திலுள்ள மக்களின் குடிநீர்த் தேவையைப் பூர்த்திசெய்வதற்குச் சிறந்ததொரு திட்டத்தை நடைமுறைப்படுத்த உள்ளது. அதன்மூலம் வவுனியா, முல்லைத்தீவு மாவட்டங்களிலுள்ள விவசாயிகளுடைய நீர்த் தேவையையும் பூர்த்திசெய்ய உள்ளோம். மேலும், முத்தையன் கட்டுக் குளம், தண்ணிமுறிப்புக் குளம், வவுனிக் குளம், கட்டுக்கரைக் குளம் ஆகியவற்றின் புனரமைப்புக்காக பெருமளவு நிதி ஒதுக்கப்பட்டுள்ளது.

வவுனியா, மன்னார், முல்லைத்தீவு பகுதிகளில் வாழ்கின்ற விவசாயிகளின் நிலங்கள் கடந்த 2012ஆம் ஆண்டு GPSஇனூடாக வன வளத் திணைக்களத்துக்குக்கீழ் கொண்டு வரப்பட்டது. எமது அரசாங்கமானது அந்த விவசாயிகளின் எதிர்காலத்தைக் கருத்திற்கொண்டு, அவ்விவசாய நிலங் களைப் படிப்படியாக விடுவிக்கும் என்பதை நான் இந்தத் தருணத்தில் கூறிக் கொள்கின்றேன்.

கடந்த காலங்களில் Milco நிறுவனம் பாரிய நட்டத்திலே இயங்கியது. எமது அரசாங்கம் ஆட்சியைக் கையேற்றதன்

[ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා]

பின்னர், இந்த வருடம் அந்த நிறுவனமானது 1.25 பில்லியன் ரூபாய் இலாபம் அடைந்துள்ளது. அதில் 165 மில்லியன் ரூபாய் அங்குள்ள கால்நடைப் பண்ணையாளர்களுக்கு இலாபப் பங்காகப் பகிர்ந்தளிக்கப்படவுள்ளது. இலங்கையில் ஒரு நாளைக்கு பத்து இலட்சம் லீற்றர் பால் உற்பத்தி செய்யப்படுகின்றது. இதை முப்பது இலட்சம் லீற்றராக அதிகரிப்பதற்கு எமது அரசாங்கம் அடுத்த வருடம் dairy products என்ற திட்டத்தை ஒவ்வொரு மாவட்டத்திலும் அறிமுகப்படுத்த உள்ளது. இந்தத் திட்டத்தினூடாக, சுமார் 10 லீற்றர் பாலை உற்பத்தி செய்கின்ற பண்ணையாளர்களுக்குத் தேவையான பொருட்கள் மானியமாக வழங்கப்படவுள்ளது. மேலும், 20 லீற்றருக்கும் மேல் பாலை உற்பத்தி செய்கின்ற பண்ணையாளர்களுக்கு உள்ளீடுகளும் நிதி வசதிகளும் வழங்கப்படவுள்ளன. இவ்வாறு எமது அரசாங்கம் பால் உற்பத்தியை அதிகரிப்பதற்குப் பல்வேறு நடவடிக்கைகளை எடுத்து வருகின்றது. NLDB அரசாங்கப் பண்ணை சிறந்த முறையில் இயங்குவதற்கு எதிர்வருகின்ற வருடம் ஒரு பில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்படவுள்ளது என்பதை நான் இந்தத் தருணத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் காணப்படுகின்ற மயிலத்தமடு - மாதவனை பிரதேசத்திலுள்ள மேய்ச்சல் தரைக்காக அம்மாவட்டத்திலுள்ள கால்நடைப் பண்ணையாளர்கள் 700 நாட்களாகப் போராடி வருகின்றார்கள். அவர்கள் கோருகின்ற 3,000 ஏக்கர் நிலத்தில், மகாவலித் திட்டத்தில் உள்வாங்கப் பட்டு இருக்கின்ற 1,400 ஏக்கர் நிலத்தை மேய்ச்சல் தரைக்காக எமது அரசாங்கம் வெகுவிரைவில் விடுவிக்கவுள்ளது. மிகுதி 1,600 ஏக்கர் நிலமும் எதிர்வரும் காலங்களில் படிப்படியாக விடுவிக்கப்படும். இதன்மூலம் அந்தக் கால்நடைப் பண்ணை யாளர்களுக்குச் சிறந்த வாழ்க்கையையும் நல்ல எதிர்காலத் தையும் எங்களால் ஏற்படுத்திக் கொடுக்க முடியுமெனக் கூறிக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා. කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)
මට තව විනාඩියක් ලබා දෙන්න.

கடந்த கால யுத்தம் காரணமாக எங்களுடைய மன்னார், வவுனியா, முல்லைத்தீவு மாவட்டங்கள் பல்வேறு பாதிப்பு களுக்கு உட்பட்டன. எதிர்வருகின்ற வருடத்தில் எமது அரசாங்கமானது வவுனியா நகரை அண்டிய பகுதியில் பல்வேறுபட்ட அபிவிருத்தித் திட்டங்களை மேற்கொள்ள வுள்ளது என்பதை இத்தருணத்தில் கூறிக்கொண்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.32]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සෙල්ලාම, ගංවතුරෙන් ජීවිත අහිමි වෙච්ච සියලු දෙනාගේ පවුල්වල අයට අපේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. අවතැන්වූවන්ට ඉක්මනින් ආණ්ඩුව අවශ්‍ය පහසුකම් සලසයි කියලාත් අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද උදේ උත්සාහ කළා, ප්‍රශ්නයක් අහන්න. නමුත් ඒකට වේලාව ලබා දුන්නේ නැති නිසා මම මේ විනාඩි 4 ඒ සඳහා ලබා ගන්නවා.

ඊයේ ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිවරයා මේ සභාවේ ප්‍රකාශ කළා, මිලියන 15ක පොලිකාබනේට් කාඩ් ගන්න ඉදිරිපත් කරපු ටෙන්ඩර් එක වෙනස් කළා කියලා. මම එතුමාට කිව්වා, "නැහැ, මම විනාඩි දෙකකට කලින් ඒ කාරණා download කළා, නොවැම්බර් 24වෙනි දා මේ ටෙන්ඩර් එක වහන්න තිබෙනවා" කියලා. ඊට පස්සේ අද උදේ අලුත් ටෙන්ඩර් එකක් මේගොල්ලෝ විවෘත කරලා තිබෙනවා. මම ඊයේ ඉදිරිපත් කළ ඊට අදාළ ලේඛනයයි, අද මම ඉදිරිපත් කරන ලේඛනයයි දෙකම **සභාගත*** කරනවා.

ලොකු ගැටලුවක් මෙතැන තිබෙනවා. අපේ විවේචනයක් තිබෙනවා. මොකද, මේ පොලිකාබනේට් කාඩ් එකට සෑහෙන මිලක් යනවා; සාමාන්‍යයෙන් ඩොලර් එකක්, ඩොලර් දෙකක් විතර යනවා. අද දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අහපු වෙන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් එතුමා කිව්වා, කාඩ් එකක් print කරලා දෙන්න රුපියල් 800ක් විතර යනවා කියලා. ඒ කියන්නේ, ඩොලර් 2.65ක් විතර වෙනවා. එතකොට, මේ වියදම මිලියන 15ක් ලෙස දැරිය යුතුද, නැද්ද කියන එක තමයි අපේ ප්‍රශ්නය තිබුණේ. මොකද, අපි ඩිජිටල්කරණය වෙනවා නම්, එතුමා කිව්වා වාගේ Super App එකක්, එහෙමත් නැත්නම් DigiLocker එකක් හදනවා නම්, අපේ මේ Unique ID එක තියෙන්නේ, smartphone එක ඇතුළේ. ඒ smartphones නැති කට්ටියට transition period එකට කාඩ් එකක් ගන්නවාට අපේ අවුලක් නැහැ. හැබැයි, ඒකට පොලිකාබනේට් කාඩ් එකක් ගන්න ඕනෑ නැහැ. ඇමෙරිකානු ඩොලර් ශත 5ක්, 10ක් වාගේ මුදලකට PVC card එකක් ගන්න පුළුවන්. හැබැයි, එතුමා ඊයේ පාර්ලිමේන්තුව නොමඟ යැව්වා. අපට ඉතාම කනගාටුයි, එතුමා කරපු ඒ ප්‍රකාශය ගැන. එතුමා කිව්වා, මේ මිලියන 15, මිලියන 5ට අඩු කරලා තිබෙනවා කියලා. ඒක සඳහන් වෙනවා කිව්වා, අලුතෙන් ඉදිරිපත් කරපු document එකේ. දැන් මේ අලුතෙන් ඉදිරිපත් කරපු document එක තිබෙනවා, මේකේ වෙනස් කරලා තිබෙන්නේ bid closing document එක විතරයි. "Other terms and conditions will remain unchanged" කියලා සඳහන් වෙනවා. මම මේ Invitation for Bids **සභාගත*** කරනවා,

මේ Invitation for Bidsහි මොකක්ද, තිබෙන්නේ? එහි මෙසේ සඳහන් වෙනවා:

> "01. The Chairperson, High Level Procurement Committee, Ministry of Digital Economy on behalf of Department for Registration of Persons, Sri Lanka now invites sealed bids from eligible and qualified bidders for the Procurement of Fifteen million (15,000,000) Pre-Printed Polycarbonate Cards for the issuance of National Identity Card."

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳයි.

මේ මිලියන 15ක ප්‍රමාණය මිලියන 5ක් කළා කියලා ඊයේ පාර්ලිමේන්තුවේදී සඳහන් කළාට, එහෙම වෙලා නැහැ කියන එක තමයි අපට පෙනෙන්නේ. මට වැරැද්දක් වෙලා තිබෙනවා නම්, මට මේක කියවා ගන්න බැරි වෙලා තිබෙනවා නම්, එහෙමත් නැත්නම් මෙහි attachment එකක් වෙනම ඉදිරිපත් කරලා නැත්නම් කරුණාකරලා පිළිතුරක් දෙයි කියා මම බලාපොරොත්තු වෙනවා.

ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා අවසාන විනාඩියේ මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපි රජයේ මුදල් පිළිබඳ කමිටුවේදී මේ ගැන සාකච්ඡා කළා. වී අලෙවි මණ්ඩලයේ ගබඩාවල දැනට වී මෙට්‍රික් ටොන් 49,500ක් තිබෙනවා කියලා කිව්වා. මේවා කොටලා ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා කියලා කිව්වා. මෙතැනදී අපි වසන්ත සමරසිංහ ඇමතිතුමාටත් පෙන්වා දුන්නා, පනවා තිබිච්ච Regulation එක අනුව පැයකට මෙට්‍රික් ටොන් 15ක් අඹරන්න පුළුවන් ආයතනවලට විතරයි මේක දෙන්න පුළුවන් කියලා ඒකේ සඳහන් වෙලා තිබුණු බව. අපි ඒක මෙතැනදී තර්ක කළා. තර්ක කළාම, ඇමතිතුමා කිව්වා ඒක වෙනස් කරනවා කියලා. දැන් අපට ආරංචි වුණා, ඒ සම්බන්ධයෙන් Cabinet Paper එකක් දාලා තිබෙනවා හෝ පාස් වෙලා තිබෙනවා කියලා. නමුත්, දැන් මේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නත් එක්ක -කීරි සම්බා ප්‍රශ්නය, හාල් මිලේ ප්‍රශ්නය එක්ක- ලොකු මෝල් හිමියන්ට එහා ගිහිල්ලා ඒ කට්ටියත් එක්ක තරග කරන්න තව ආයතන අපට හදන්න වෙනවා කියන එක අපි කවුරුත් දන්නවා. එකක් Paddy Marketing Board එක. ඒකේ වෙනම ප්‍රශ්න තිබෙනවා. අපි "ශක්ති" සහල් ව්‍යාපාරය පටන් ගත්තා. ඒ හරහා අපි 300ක් විතර කුඩා හා මධ්‍යම පරිමාණයේ මෝල් හිමියෝ එකතු කරලා දිස්ත්‍රික්ක 8ක සමුපකාරයක් හැදුවා, ශ්‍රී ලංකාවේ හාල් නිෂ්පාදනය කරන කොට්ඨාසවල. ඉතින් ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන්ටත් මේ මෙට්‍රික් ටොන් 49,500න් යම් ප්‍රමාණයක් කොටන්න අවස්ථාවක් ලබා දෙන්න කියලායි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.37]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான இன்றைய குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு கருத்துத் தெரிவிப்பதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன்.

இந்த வாரம் நாடு முழுவதும் அடைமழை பெய்துகொண்டு இருக்கின்றது. இயற்கை அனர்த்தத்தால் மக்கள் துன்புறுகின்ற இந்த நேரத்திலே நாங்கள் விவசாயம், நீர்ப்பாசனம், காணி பற்றி பேசிக்கொண்டு இருக்கின்றோம். கடந்த வருடமும் இதே காலப் பகுதியில் பல துயரச் சம்பவங்கள் நடைபெற்றன. அவற்றால் பாதிக்கப்பட்ட மக்களுக்கு இழப்பீடுகள் வழங்கப்பட்டு, அதன்மூலம் அவர்கள் நன்மையடைந்து இருக்கின்றார்களா என்று பார்த்தால், எதுவும் நடந்ததாகத் தெரியவில்லை. இன்று காலையில்கூட, சாய்ந்தமருது பிரதேசத்தில் வாகனம் ஒன்று ஆற்றினுள் மூழ்கி 3 உயிர்கள் காவுகொள்ளப்பட்டு இருக்கின்றன. கடந்த வருடம் ஏற்பட்ட வெள்ளமும் இந்த வருடம் ஏற்பட்டுள்ள வெள்ளமும் மாவடிப்பள்ளி ஆற்றின் மூலமாகவே ஏற்பட்டு இருக்கின்றது. மழை காலத்தில் அந்தப் பிரதேசத்தினூடாக வழிந்தோடும் நீர் வேகமாகச் சென்றடைய முடியாத நிலை ஏற்படுவதன் காரணமாகவே இவ்வாறான நிலை ஏற்படுகின்றது. இந்தப் பாராளுமன்றத்தில் தொடர்ச்சியாக மாவடிப்பள்ளி பாலம், கிட்டங்கிப் பாலம் தொடர்பில் நாங்கள் கூறுகின்ற விடயங்களுக்கு இந்த அரசாங்கம் செவிசாய்த்து, ஒரு பாலத்தை அமைப்பதற்கான பூர்வாங்க நடவடிக்கைகளை மேற்கொண்டு இருந்தாலும், அதற்கு அடிக்கல் மாத்திரமே நடப்பட்டு இருக்கின்றது. எனினும், அது தொடர்பான வேலைகள் இன்னும் நடைபெறவில்லை. அந்தப் பிரதேச மக்களினதும் விவசாயிகளினதும் பாதுகாப்பைக் கருத்திற்கொண்டு, மேற்குறித்த இரண்டு பாலங்களையும் முன்னுரிமை அடிப்படையில் உடனடியாகச் செய்ய வேண்டுமென நாங்கள் அந்த மக்கள் சார்பாகக் கேட்டுக் கொள்கின்றோம்.

அடுத்து, நாங்கள் இந்த நாட்டின் உற்பத்தி பற்றி பார்ப்போம். கிழக்கு மாகாணத்தில் புல்மோட்டையிலிருந்து பானம வரை கூடுதலான பரப்புடைய காணிகள் காணப்படுகின்றன. அந்தக் காணிகள் சிறுசிறு காடுகளாகவும் புற்கள் நிறைந்த புதர்களாகவும் காணப்படுகின்றன. இந்தக் காணிகளை விவசாயத்துக்குப் பொருத்தமான வகையில் மாற்றியமைக்க வேண்டும். பயங்கரவாதச் செயற்பாடுகள் காரணமாக யுத்தம் இடம்பெற்ற இடங்களில் இருக்கின்ற விவசாயக் காணிகளில் மக்களால் விவசாயம் செய்ய முடியாமல் இருந்தது. அவர்கள் 30-35 வருடங்களுக்குப் பிறகு, அங்கு சென்று பார்த்தபோது அவை காடுகளாக மாறியிருந்தன. அவற்றை அரசாங்கம் வன இலாகவுக்குச் சொந்தமான காணிகளாக gazette பண்ணியதால், அந்த மக்களால் இன்றும் அந்தக் காணிகளில் விவசாயம் செய்ய முடியாமல் உள்ளது. நாங்கள் ஒருபுறம் நாட்டில் உற்பத்தியை அதிகரிக்க வேண்டுமெனக் கூறுகின்றோம். ஆனால், மறுபுறம் அரசாங்கம் விவசாயிகளின் காணிகளை வழங்காமல் கையகப்படுத்துகின்ற துர்ப்பாக்கிய நிலைமை காணப்படு கின்றது. அந்தக் காணிகளை விடுவித்து, அவற்றை விவசாய நடவடிக்கைகளுக்குப் பயன்படுத்துவதற்கு உதவ வேண்டு மென நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற அரசாங்கத்துக்குச் சொந்தமான வெற்றுக் காணிகளில் கால்நடைகளை வளர்ப் பதற்காக, அவற்றைத் தனியாருக்கு அல்லது வெளிநாட்டுக் கம்பனிகளுக்கு வழங்குவதன்மூலம், இந்த நாட்டுக்கு இறக்குமதி செய்யப்படுகின்ற பால்மாவின் அளவைக் குறைத்து, பசுப்பாலை மக்களுக்கு குறைந்த விலைக்குக் கொடுக்கலாம். மேலும், இதன்மூலம் இந்த நாட்டில் இருக்கின்ற குறிப்பாக, கிழக்கு மாகாணத்தில் இருக்கின்ற மக்களுக்கு தொழில்வாய்ப்பையும் வழங்கலாம். இவ்வாறு நாங்கள் வளங்களை வைத்துக்கொண்டு, பால்மாவை

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

இறக்குமதி செய்வதில்தான் கூடுதல் கவனம் செலுத்து கின்றோம். இறக்குமதியின்போது commission பெறுகின்ற செயற்பாட்டை முன்பிருந்த அரசாங்கத்தினர் மேற் கொண்டார்கள். எனினும், நீங்கள் அதற்கு மாறாகச் செயற்பட வேண்டுமென இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

வட்டமடு மேய்ச்சல் தரை மிக நீண்ட காலமாகப் பிரச்சினைக்குள்ளாகி இருக்கின்றது. அது விவசாயக் காணியாகப் பயன்படுத்தப்பட்டதென ஒரு சாராரும், மேய்ச்சல் தரையாகப் பயன்படுத்தப்பட வேண்டுமென இன்னுமொரு சாராரும் கூறி வருகின்றார்கள். இவ்வாறு இழுபறி நிலையில் இருக்கின்ற இந்தப் பிரச்சினையை, கடந்த காலத்தில் இருந்த அரசாங்கங்கள் அரசியல் நோக்கத்துக்காகத் தீர்த்துக் கொடுக்கவில்லை. இன்று மக்களுக்கு நம்பிக்கையை ஏற்படுத்தக்கூடிய, நம்பகத்தன்மையுள்ள ஓர் அரசாங்கம் ஆட்சிக்கு வந்திருக்கிறது. இந்த அரசாங்கத்தின்மூலம் இதற்குரிய தீர்வைப் பெற்றுக்கொள்ளலாம் என்ற நம்பிக்கையோடு, ஒரு வருடத்தைக் கடந்தும் அந்த மக்கள் காத்துக்கொண்டு இருக்கிறார்கள். எனவே, இந்த விடயத்தை கௌரவ அமைச்சர் அவர்கள் கவனத்தில் எடுக்க வேண்டு மெனக் கேட்டுக் கொள்கின்றேன்.

கடந்த அரசாங்க காலத்தில் 'உறுமய' என்ற திட்டத்தின்மூலம் காணி உறுதிகளை மக்களுக்குக் கையளிக் கின்ற திட்டமொன்று இருந்தது. எனினும், அது கால இழுத்தடிப்புச் செய்யப்பட்டது. தற்போது ஆட்சிக்கு வந்திருக் கின்ற அரசாங்கம் அரசியல் இலாபம் கருதி "හිමිකම" என்ற வேறொரு labelஐ அதற்குப் போட்டு, அந்தத் திட்டத்தை முன்னெடுப்பதற்கான முயற்சிகளைச் செய்கின்றது. பரவா யில்லை! இது ஒவ்வோர் அரசியல்வாதிக்கும் அரசியல் கட்சிக்கும் இருக்கின்ற ஆசைதான்! கடந்த கால அரசாங்கங்களைப் போன்று இழுத்தடிப்புச் செய்யாமல், மிகக் குறைந்த காலத்துக்குள் அந்தத் திட்டத்தை நிறைவேற்ற வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

நாங்கள் அம்பாறை, கிழக்கு மாகாணம் என நாடு பூராவும் பிரயாணங்களை மேற்கொள்ளும்போது, மிகக் கூடுதலான பிரதேசங்கள் காடுகளாவும் வெற்றுநிலங்களாகவும் இருப் பதைக் காண்கின்றோம். அந்தக் காணிகளில் அப்பிரதேசங் களின் தேவைக்கு ஏற்பவும் காலநிலைக்கு ஏற்பவும் பயிர்ச்செய்கைகளையும் ஏனைய உற்பத்திகளையும் ஏன் நாங்கள் மேற்கொள்ள முடியாது? அதற்கானதொரு முயற்சியை அரசாங்கம் ஏன் மேற்கொள்ளக்கூடாது? எனவும் கேட்கின்றேன்.

தற்பொழுது, இங்கு கௌரவ அமைச்சர் அவர்கள் இருக்கிறார். அவர், இந்த நாட்டை விசுவாசிக்கக்கூடியவர். இந்த நாட்டிலுள்ள வளங்களைச் சிறப்பாகப் பயன்படுத்த வேண்டும் என்ற நோக்கத்துடன், மிக நீண்ட காலமாக மக்களுக்காகப் போராடியவர். எனவே, உங்களுக்குக் கிடைத்திருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தை சரியாகப் பயன்படுத்துங்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)

මට තව විනාඩියක් ලබා දෙන්න.

இந்தத் திருநாட்டில் இருக்கின்ற அநேகமான நிலங்கள் வெற்று நிலங்களாகக் காணப்படுவதையும் மழைமூலம் கிடைக்கின்ற நீரானது வெறுமனே கடலுக்குச் சென்றடை வதையும் நாங்கள் பார்க்கின்றோம். ஏன் இதற்குரிய மாற்று வழியை இந்த அரசாங்கம் மேற்கொள்ளக்கூடாது எனக் கேட்கின்றேன்.

எமக்கு நிலநடுக்கம் தொடர்பான செய்தியொன்று கிடைக்கப்பெற்று இருக்கிறது. இதனால் மக்கள் பயத்துடன் இருக்கிறார்கள். சுமாத்திரா தீவில் சுனாமி ஏற்படுவதற்கான alert ஒன்று கிடைத்திருப்பதாகக் கூறுகின்றார்கள். இது சம்பந்தமாக மக்களுக்கு விழிப்புணர்வை ஏற்படுத்தி, அவர்களின் பாதுகாப்புக்கும் அபிவிருத்திக்கும் உரிய நடவடிக்கைகளை எடுக்குமாறு கேட்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி, வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දීප්ති වාසලගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 08ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.45]

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ 2026 වැය ශීර්ෂය විවාද කරන මේ අවස්ථාවේදී මා නියෝජනය කරන මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ආසනය පිළිබඳව කථා කරන්න ඕනෑය කියලා මට හිතෙනවා. මොකද, මේ වනකොට එම ප්‍රදේශයේ බොහෝ පිරිසක් කිසිම තැනකට යන්න එන්න නොහැකිව lock down වෙලා, ඉතාම දුක්ඛදායක තත්ත්වයක තමයි ඉන්නේ. එම නිසා මම මාතලේ දිස්ත්‍රික්කයට යා යුතුයි. ඉක්මනින් කථා කරන්න අවස්ථාව ඉල්ලා ගත්තේත් ඒ නිසායි.

ගරු ඇමතිතුමනි, මගේ ආසනයේ ජනතාවට ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළ වන ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබෙනවා. මාතලේ රත්තොට ආසනයේ ජනතාවට ඉඩම් පිළිබඳ ගැටලුවක් තිබෙනවා කියලා මම ගිය සතියේ ඒ පිළිබඳව විමර්ශනය කරන්න, සාකච්ඡා කරන්න ගියා. ගමේ ජනතාව කියනවා, ඔවුන් අවුරුදු විස්සකටත් කලින් ඉඳලා එම ප්‍රදේශයේ නිවාස හදාගෙන පදිංචි වෙලා ඉන්නවා, නමුත් තමන් පදිංචි වෙලා ඉන්න භූමිය කාටද අයිති කියලා දන්නේ නැහැ කියලා. LRC එකට අයිති ද, වත්තට අයිති ද, ප්‍රාදේශීය ලේකම්ට අයිති ද කියලා දන්නේ නැහැ කියනවා. ඔවුන් ඉඩමේ අයිතිය ඉල්ලනකොට ඒ අයිතිය ලබා දෙන ආයතනය මොකක්ද කියලා දන්නේත් නැහැ. රත්තොට ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ අවස්ථා ගණනාවකදී මැති ඇමැතිවරුන් හිටියා. නමුත්, මේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දීලා නැහැ.

නිවාස විෂය භාර නියෝජ්‍ය ඇමතිතුමා ඉන්න නිසා මේ අවස්ථාවේදී මම මේ කාරණය කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වතු ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වන ජනතාව මට

කියනවා, ඔවුන්ට නිවාස ණයක් දීලා රුපියල් 800 ගණනේ අවුරුදු හතරක් එම නිවාස ණය මුදල කපලා තිබෙනවා; හැබැයි, වත්තෙන් නිවාස සංවර්ධන අධිකාරියට එම මුදල යවලා නැහැයි කියලා. මාතලේ දිස්ත්‍රික්කයේ නිවාස සංවර්ධන අධිකාරියේ කළමනාකාරතුමිය කියනවා, දැනටත් රුපියල් මිලියන 30කට විතර ආසන්න හිඟ මුදලක් මේ සම්බන්ධව තිබෙනවා කියලා. මාතලේ දිස්ත්‍රික්කයේ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරුන් කී දෙනෙක් හිටියාද? ඒ කිසි කෙනෙක් මේ ප්‍රශ්න විසඳලා නැහැ.

ඒ වාගේම යහ පාලන ආණ්ඩුව පැවති 2015දී නිවාස ව්‍යාපෘතියක් පටන් අරන් තිබෙනවා, මාතලේ, කටාරම්තැන්න, මැදවත්ත කියන ප්‍රදේශයේ. එම නිවාස ව්‍යාපෘතිය භාගෙට හදලා අත හැර දමා තිබෙනවා. නිවාසලාභීන් 50ක් විතර ගෙවල් භාගෙට අටවා ගෙන ඉතාම දුක්ඛිත තත්ත්වයේ ජීවිතයක් ගෙවනවා. එවකට ආණ්ඩුවේ සිටි මේ විපක්ෂය ඒ සියලු ප්‍රශ්න විසඳන්නේ නැතිව අද අපට නොයෙක් අවවාද උපදෙස් දෙනවා. හැබැයි ඔබ ඇති කරපු සියලු ප්‍රශ්නවලට විසඳුම් හොයන්න තමයි අපි ආණ්ඩුවක් වශයෙන් මැදිහත් වෙන්නේ. මම අර කියපු නිවාස 50න් වැසිකිළි පහසුකම් තිබෙන්නේ නිවාස 08කට විතරයි. එම ප්‍රශ්න ඔක්කෝම ජනතාව අපට කියනවා.

රත්තොට ආසනය කියන්නේ, නිතර නිතර ස්වාභාවික ආපදාවන්ට ලක් වන ප්‍රදේශයක්. එම නිසා ඉඩම් ගැන කථා කරනවාට වැඩිය මට හිතෙනවා, කාලෝචිත මාතෘකාවක් කථා කරන්න ඕනෑය කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන "දුම්බර හරිත සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය" ගැන කථා කරන්න මම කැමැතියි. මම හිතන්නේ එම ව්‍යාපෘතිය මීට වසර ගණනාවකට කලින් තමයි පටන් ගත්තේ. හැබැයි, අපට එය සක්‍රිය තත්ත්වයෙන් මහ පොළොවේ ක්‍රියාත්මක වනවා කියලා දැනුණේ නැහැ. 2024දී අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව තමයි, දුම්බර හරිත සවිබලගැන්වීමේ අරමුදලේ - GCF එකේ - ක්‍රියාකාරිත්වය දකින්න ලැබුණේ. Green Climate Fund එකෙන් ඒ සඳහා අපට ලැබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 39.77ක්. ඒ වාගේම වාරිමාර්ග අමාත්‍යාංශය මේ සඳහා ඩොලර් මිලියන 9.2ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවා. මේ අරමුදල භාවිත කරමින් අපි දැන් බොහෝ සක්‍රිය තත්ත්වයෙන් විවිධ ව්‍යාපෘති ආරම්භ කරමින් පවතිනවා.

හැම දාම මේ විධියට ස්වාභාවික ආපදාවලට ලක් වෙනවා නම් අපි මේ වගාව ගැන කථා කළාට වැඩක් නැහැ. ආපදාවලට මුහුණ දීලා අපේ වගාවන්; භෝග විනාශ වෙනවා නම්, අපි කොච්චර වගා කරන්න හැදුවත් අපේ ජනතාවගේ ජීවනෝපාය දුර්වල තත්ත්වයකට පත් වෙනවා. මේ ව්‍යාපෘතියේ අරමුණ තමයි, ලෝක උරුමයක් වන නක්ල්ස් අධිසංවේදී පරිසර කලාපය රැක ගැනීම. මම හිතන විධියට අපේ රටේ කෘෂි කර්මාන්තයට ජලය සපයන බොහෝ ජල පද්ධතිවල ආරම්භය නක්ල්ස් කඳුකර ප්‍රදේශයයි. මේ නක්ල්ස් කඳුකර ප්‍රදේශය ඇතුළු ගංගා ද්‍රෝණි ආශ්‍රිතව ජීවත් වන මිලියන 2ක් පමණ වන ජනතාවක් ගොවිතැන මුල් කර ගනිමින් ජීවනෝපාය සකස් කරගෙන තිබෙනවා.

ඒ අය එසේ ජීවනෝපාය සකස් කරගෙන හිටියාට දැන් ලෝකයේ අර්බුදයක් තිබෙනවා. ලෝකයේ ජනතාව සුඛෝපභෝගී ජීවන රටාවකට හුරු වීම නිසා වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩි වෙලා, හරිතාගාර වායු ප්‍රමාණය වැඩි වෙලා, ගෝලීය උෂ්ණත්වය වැඩි වෙලා නිතර නිතර වර්ෂා තත්ත්වයන් සහ සුළි සුළං තත්ත්වයන් ලෝකයේ කොහේ හරි තැනක සිටින ජනතාවට අත්විඳින්න වෙනවා. එවැනි තත්ත්වයන්ගෙන් අපේ රට මුදා ගැනීම සඳහාත්, අපේ රටේ කඳුකරය ආශ්‍රිතව ඉන්නා ජනතාවගේ ජීවනෝපාය සවිබලගැන්වීම සඳහාත් අපි විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. ඒ අනුව GCF එහෙම නැත්නම් දුම්බර හරිත සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ යටතේ විශේෂයෙන්ම 2025 වර්ෂයේ මාතලේ දිස්ත්‍රික්කය තුළ රුපියල් මිලියන 300කට ආසන්න වටිනාකමින් යුක්ත ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් ආරම්භ කළා.

අපි දුප්පත් ජනතාවගේ ජීවනෝපාය සවිබලගැන්වීම සඳහා ආක්‍රමණික ශාකයක් වන අලිමානා ශාකය භාවිත කරලා කඩදාසි නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් ආරම්භ කර තිබෙනවා. මගේ අතේ තිබෙන මේ ෆයිල් කවරයත් මාතලේ දිස්ත්‍රික්කයේ ජනතාව අලිමානා ශාකවලින් හදපු එකක්. අපි දන්නවා, මේ ව්‍යාපෘතිය සඳහාත් අපේ අමාත්‍යාංශය මඟින් 2025 වර්ෂයේදී රුපියල් මිලියන 2,400ක් වෙන් කරනු ලැබූ බව. මෙවර අය වැය මඟින් මේ දුම්බර හරිත සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයට රුපියල් මිලියන 3,250ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම අපේ තේ ගොවීන් වාගේම බෑවුම් සහිත ප්‍රදේශවල ජීවත් වන ගොවි ජනතාවගේ ගෙවතු වගා සංවර්ධනය කිරීම සඳහාත් අපි 3,000ක් ඉලක්ක කර ගනිමින් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. අපි ඒ සඳහා බොහෝ වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මෙය සාර්ථක ව්‍යාපෘතියක් බවට පත් කර, ස්වාභාවික ආපදාවලට ලක් වෙන අයව සවිබලගන්වා, ඒගොල්ලන් දේශගුණික බලපෑම්වලට හුරු කරමින් හොඳ, ඵලදායී ජීවනෝපායක් ඔවුන්ට අත් කර දීමට. අපි ඒ සඳහා අවශ්‍ය වැඩ කටයුතු ක්‍රියාත්මක කරනවා.

ඒ වාගේම අපේ අරමුණ දුප්පත්කම ජය ගැනීමයි. අපි පොහොසත් රටක් හදන්න ඕනෑ. ඒ නිසා අපේ රටේ ජනතාවට ලස්සන ජීවිතයක් ලබා දීම වෙනුවෙන් මේ ව්‍යාපෘතිය ඵලදායීව භාවිත කරන බවට සපථ වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් වෙන් කර තිබෙනවා.

[පි.ප. 2.53]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான இன்றைய குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு எனக்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன்.

தற்பொழுது நாட்டில் நிலவுகின்ற மழையுடனான காலநிலை காரணமாக உயிரிழப்புகளும் சொத்தழிவுகளும் ஏற்பட்டு இருக்கின்றன. இதனால் பாதிக்கப்பட்ட அனைவருக்கும் எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன். எமது நாட்டில் இவ்வாறான அழிவுகள் வருடத்துக்கு இரண்டு தடவை ஏற்படுகின்றன. இயற்கையாக ஏற்படக்கூடிய அழிவுகளை ஒன்றும் செய்ய முடியாது. இருந்தாலும், எதிர்காலத்தில் இவற்றால் ஏற்படக்கூடிய

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

பாதிப்புகளைக் குறைப்பதற்குரிய நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

மக்கள் பாரிய எதிர்பார்ப்புடனேயே தேசிய மக்கள் சக்தியை ஆட்சிபீடம் ஏற்றினார்கள். எனவே, மக்களுடைய எண்ணங்களுக்கு ஏற்றாற்போல் உங்களுடைய ஆட்சி அமைய வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். கடந்த சில வருடங்களுடன் ஒப்பிடுகையில், இந்த அமைச்சுக்கு இம்முறை கூடுதலான நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. அதாவது, கிட்டத்தட்ட 221 பில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. இது உண்மையிலே வரவேற்கக் கூடிய விடயமாகும். ஒதுக்கப்பட்டு இருக்கின்ற நிதி போதுமானது எனக் கூற முடியாது. ஆனாலும், ஓரளவு ஒதுக்கப்பட்டு இருக்கிறது. பரவாயில்லை!

வவுனியா, மன்னார், முல்லைத்தீவு மாவட்டங்கள் உட்பட வடக்கு, கிழக்குப் பகுதிகளில் போதியளவு காணிகள் இருந்தும், அவற்றை அவர்களுக்கு - காணி இல்லாதவர்களுக்கு - வழங்கு வதற்கு எந்தவோர் அரசாங்கத்துக்கும் மனம் வருவதில்லை. Forest Department, Department of Wildlife Conservation, Department of Archaeologyக்கு காணிகளை gazette பண்ண வேண்டும் என்றால், பிரதானமாக வடக்கு, கிழக்கைத்தான் எடுத்துக் கொள்கிறார்கள். காணிகளை வழங்கினால், investmentஐ மேற்கொண்டு, வேலைத்திட்டங்களைச் செய்வ தற்கு எங்களுடைய புலம்பெயர் சமூகத்தினரில் எத்தனையோ பேர் தயாராக இருக்கிறார்கள். எமது பகுதியில் காணிகள் இருந்தும், அவற்றைக் கொடுப்பதற்கு மனம் இல்லாமல் இருக்கின்றது. கடந்த காலங்களில் அதை நிவர்த்தி செய்வதற் காக எடுத்த முயற்சிகளை நீங்களும் தொடர வேண்டும். தேவையில்லாமல் forest என்று காணிகளை gazette பண்ணக் கூடாது. காணி விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் என்ற அடிப்படையில், நீங்கள் இந்த விடயத்தில் சரியாகச் செயற்பட வேண்டும். Forest Department குளங்களைக் கையகப்படுத்தி இருக்கிறது; மேய்ச்சல் தரைகளைக் கையப்படுத்தி இருக்கிறது. அதுமாத்திரமன்றி, விவசாயக் காணிகளையும் கையப்படுத்தி இருக்கின்றது. எனவே, நீங்கள் அமைச்சு மட்டத்தில் இது சம்பந்தமான முடிவுகளை எடுத்துச் செயற்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, பல வருடங்களாக இருந்து வருகின்ற பிரச்சினைகளைத் தீர்ப்பதற்குரிய முயற்சிகளை நீங்கள் எடுக்க வேண்டும். எமது வட, கிழக்குப் பகுதியில் நெல் அறுவடை முன்கூட்டியே இடம் பெறுகின்றது. எனினும், அந்த நேரத்தில் அரசாங்கம் நெல்லுக்கான விலையை நிர்ணயம் செய்வதில்லை. அரசாங்கம் நெல்லுக்கான விலை நிர்ண யத்தைச் செய்தால்கூட, அவர்கள் ஓரளவுக்காவது நன்மை களைப் பெறக்கூடியதாக இருக்கும். எனினும், அவ்வாறான நிலைப்பாடுகள் இல்லை. எனவே, இதனைக் கருத்திற் கொண்டு, இந்த முறை எதிர்வரும் சனவரி மாதம் முதலாம் திகதியிலேயே நெல்லுக்கான விலை நிர்ணயத்தைச் செய்து, Paddy Marketing Board ஊடாக நெல்லைக் கொள்வனவு செய்வதற்குரிய ஏற்பாட்டைச் செய்ய வேண்டும். விவசாயிகளின் வறுமை நிலையைச் சில வர்த்தகர்கள் சாதகமாகப் பயன்படுத்திக்கொண்டு, நெல் மற்றும் ஏனைய தானிய விதைகளை buy-back systemஇல் உற்பத்தி செய்து, அவற்றைக் குறைந்த விலையில் எடுக்கிறார்கள். எனவே, அதனை நிவர்த்தி செய்யக்கூடிய திட்டங்களை நீங்கள் எதிர்காலத்தில் கொண்டுவர வேண்டும்.

இன்று எந்தத் துறையை எடுத்துக்கொண்டாலும், ஆளணிப் பற்றாக்குறை அதிகமாக இருக்கின்றது. அதனை நிவர்த்தி செய்வதற்கு நாங்கள் கடந்த காலங்களில் பல முயற்சிகளை எடுத்தோம். எனினும், அதனை நிவர்த்தி செய்யக் கூடியதாக இல்லை. எனவே, நீங்கள் எதிர்காலத்தில் இதனை நிவர்த்தி செய்வதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். வட மாகாணத்திலுள்ள விவசாய போதனாசிரியர் களுக்கு, அவர்களுக்குரிய போக்குவரத்துக் கொடுப்பனவுகள் கொடுக்கப்படுவதில்லை. எனினும், ஏனைய மாகாணங்களில் இருக்கின்றவர்களுக்குக் கொடுக்கப்படுகின்றது. வட மாகாணத்தில் ஆளணிப் பற்றாக்குறைக்கு மத்தியில், இருக்கின்றவர்களை வைத்து விவசாயிகளுக்குரிய வேலைத் திட்டங்களைச் செய்தாலும், அவர்களுக்குரிய கொடுப் பனவுகள் கொடுக்கப்படுவதில்லை. எனவே, இது சம்பந்தமாக கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

வவுனியா, முல்லைத்தீவு மற்றும் மன்னாரில் மாவட்ட விவசாயப் பணிப்பாளர்கள் இல்லை. மன்னாரில் தற்காலிக ஒருவரே இருக்கிறார். அவருக்கும் நிரந்தர நியமனம் கொடுக்கப்படவில்லை. அவருக்கு எதிராக எந்தவித குற்றச்சாட்டும் இல்லையென Governor சொல்லியிருக்கிறார். அதேபோல், மனித உரிமைகள் ஆணைக்குழு சொல்லி இருக்கிறது; விவசாய அமைச்சின் செயலாளர் சொல்லி இருக்கிறார். இவை ஒன்றையும் கருத்திற்கொள்ளாமல், அவரைப் பழிவாங்கும் விதத்தில், அங்கிருக்கின்ற PLCஆல் கிட்டத்தட்ட 5 வருடங்களாக நிரந்த நியமனம் வழங்கப் படாமல் இருக்கின்றது. எனவே, இது தொடர்பில் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
தயவுசெய்து, இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

கௌரவ அமைச்சர் அவர்களே, கடந்த காலங்களில் இந்த அமைச்சின் ஊடாக உளுந்து, பயறு, ஆடு என்பன வழங்கப்பட்டன. இதனால் ஒவ்வொரு வருடமும் குறிப்பிட்ட குடும்பங்களின் வாழ்வாதாரம் முன்னேற்றம் அடைந்தது. நான் இராஜாங்க அமைச்சராக இருந்ததன் அடிப்படையில், இது பற்றி எனக்கு நன்றாகத் தெரியும்! 2023 அல்லது 2024ஆம் ஆண்டில் என்று நினைக்கின்றேன், மன்னார் மாவட்டத்தில் கிட்டத்தட்ட 6,000 ஏக்கர் நிலத்தில் உளுந்து பயிரிடப்பட்டது. இலங்கையில் அதிகளவு உளுந்து பயிரிடப்பட்ட இரண்டாவது மாவட்டமாக அது திகழ்ந்தது. ஒரு கிலோகிராம் உளுந்தை 200 ரூபாய் வீதம் எடுத்தார்கள். தற்பொழுது இந்த வேலைத்திட்டம் எமது பகுதிகளில் இடைநிறுத்தப்பட்டு இருக்கின்றது. அதேபோல், ஆடு வழங்கப்படுவதும் இடைநிறுத்தப்பட்டு இருக்கின்றது. எனவே, மீண்டும் அவற்றைக் கொடுத்து, வருடத்துக்கு ஒரு குறிப்பிட்ட குடும்பங்களாவது அரசின் உதவியை எதிர்பார்க்காமல், வாழ்வாதாரத்தில் முன்னேறு வதற்குரிய வாய்ப்பை ஏற்படுத்திக் கொடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன். நேரம் போதாமை காரணமாக இன்னும் விடயங்களைப் பேச முடியவில்லை. அங்கிருக்கின்ற LRC காணிகளுக்குரிய 82 உறுதிகள் வந்து கிட்டத்தட்ட ஒரு வருடமாகியும் அவை உரியவர்களுக்குக் கொடுக்கப்படாமல்

இருக்கின்றன. அந்த உறுதிகளை அவசரமாக அவர்களுக்குக் கொடுப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்யுமாறு கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.01]

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම ගැන සතුටු වෙනවා. ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මේ රටේ ඇති වී තිබෙන ආපදා තත්ත්වය හේතුවෙන් මිය ගිය, විපතට පත් සියලුදෙනා සිහිපත් කරමින්, මම මගේ කථාව ආරම්භ කරනවා. වාරිමාර්ග අමාත්‍යාංශය පැත්තෙන් අපේ ගරු ඇමතිතුමාට විශාල වගකීමක් පැවරිලා තිබෙනවා, මේ මොහොතේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. KINS NELSON took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිස්ත්‍රික්ක 25හිම ආපදා තත්ත්ව ඇති වෙලා තිබෙන මේ මොහොතේ විශේෂයෙන්ම මා ජීවත් වන මොනරාගල දිස්ත්‍රික්කයේ ආපදා තත්ත්වය ගැන කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ වෙනකොට මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව, කෝන්ගස්පිටිය කියන ප්‍රදේශ ජලයෙන් යටවෙලා, මාර්ග අවහිර වෙලා, විශාල ආපදාවකට ලක්වෙලා තිබෙනවා. ඒ වාගේම බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඹුක්කන් ඔය පිටාර ගැලීම නිසා කුඹුක්කන් ඔය හරහා වැටී තිබුණු අත්වැල් පාලමක්, ඒ කියන්නේ පහළගම ග්‍රාම නිලධාරි වසම සහ කෝන්තැටිය ග්‍රාම නිලධාරි වසම යා කරන අත්වැල් පාලම කඩාගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි ඔක්කම්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ජනතාව ජලය නිසා තැන් තැන්වල ස්ථාන කිහිපයක කොටු වෙලා ඉන්නවා. ඒ ජනතාවට පිහිට වීම සඳහා, ආහාර පාන ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බව ප්‍රාදේශීය ලේකම්තුමා ප්‍රකාශ කළා. ඒ කටයුතු සිදු වෙනවාද කියලා සොයා බලන්න කියලා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, මේ වෙනකොට කොළඹ-මොනරාගල-අම්පාර A4 මාර්ගය කුඹුක්කන කියන ස්ථානයෙන් යටවෙලා, ගමනාගමනය සම්පූර්ණයෙන්ම නතර වෙලා තිබෙනවා. ඒ වාගේම කුඹුක්කන් ඔය අමුණ - කුඹුක්කන පිහිටා තිබෙන ඔක්කම්පිටිය ව්‍යාපාරයේ කුඹුක්කන් ඔය අමුණ - මේ වෙනකොට කඩා යාමට ආසන්න වෙලා තිබෙනවා. එක පැත්තකින් සේදිලා ගිහිල්ලා තිබෙනවා. මේ මොහොත වෙනකොට ජල මට්ටමේ පොඩි අඩුවීමක් තිබෙන නිසා සතුටුදායක තත්ත්වයක් තිබෙනවා. හැබැයි වර්ෂාව ආපහු පටන් ගත්තා කියලා ආරංචියකුත් තිබෙනවා. වර්ෂාව වැඩි වුණොත්, ඒ ස්ථානයෙන් උතුරලා අමුණ කඩාගෙන ගියොත්, මුළු ඔක්කම්පිටිය ව්‍යාපාරයම, කුඹුක්කන් ඔය ව්‍යාපාරයම විනාශ වෙලා යන්න ඉඩ තිබෙනවා. ඒ නිසා කඩිනමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනුවත් කරන්න. මම මීට මොහොතට කලින් ඒ සම්බන්ධව කථා කළා, වාරිමාර්ග ඉංජිනේරුතුමාටත්, ප්‍රාදේශීය ලේකම්තුමාටත්. වැලි කොට්ට තබලා ශක්තිමත් කරන ආකාරයක් පැවසුවා. කොහොම වුණත් ජල මට්ටම තවත් වැඩි වුණොත් ගැටලුවක් ඇති වෙන්න පුළුවන්. මා දන්නා තරමට මගේ ජීවිත කාලය තුළ කවදාවත් ආවේ නැති ගංවතුරක් තමයි කුඹුක්කන් ඔයට අද ඇවිල්ලා තිබෙන්නේ. මේ ගංවතුර තත්ත්වය වැඩි වුණොත්, වැලි කොට්ට ඔරොත්තු දෙන එකක් නැහැ. ඒ නිසා මොනවා හෝ පියවරක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, අද උදේ ගරු ජනාධිපතිතුමා සමඟ ආපදා තත්ත්වය සම්බන්ධව අපි සාකච්ඡා කළා. එතුමා ප්‍රකාශ කළා, කඩිනමින් මේ සම්බන්ධයෙන් පියවර අරගෙන ආපදාවට ලක්වූ අයට සහන ලබා දෙන්න කටයුතු කරනවාය කියලා. ඒ එක්කම ආපදාවට ලක්වුණු ගොවි බිම්වලට, ආපදාවට ලක්වූ අයට වන්දි ගෙවීමේදී ග්‍රාම නිලධාරින්ගෙන් සහ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින්ගෙන් වාර්තා අරගෙන කඩිනමින් ඒ ගෙවීම් කරන්න කටයුතු කරන බවත් ප්‍රකාශ කළා.

නමුත් ගරු අමාත්‍යතුමනි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් 10,400ක් අවශ්‍ය වන මොහොතක මේ වෙනකොට එම නිලධාරින් සිටින්නේ 4,062ක් පමණයි. මොනරාගල දිස්ත්‍රික්කයට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් 293ක් අවශ්‍ය වන වෙලාවේ, මේ වෙනකොට නිලධාරින් 116කගේ අඩුවක් තිබෙනවා. හැබැයි, එම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ගෙන් මේ වාර්තා ගන්නකොට, මේ පුරප්පාඩු වෙලා තිබෙන කොට්ඨාසවල වාර්තා කුමන නිලධාරියෙකුගෙන් හරි අරගෙන කඩිනමින් මේ ක්‍රියාවලිය ඉක්මන් කරලා ගෙවීම් කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

ඊළඟට ඉඩම් සම්බන්ධවත් මා කථා කරන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, අවුරුදු 30, 40 වගා කටයුතු කළත් ඉඩම් බලපත්‍ර ලබාගෙන නැති ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගොවියෝ අවුරුදු 30ක්, 40ක් තිස්සේ වගා කරන ඉඩම් තිබෙනවා. හැබැයි, ගොවියාගේ අදහසකුත් නැහැ හරියට බලපත්‍රයක් ලබා ගන්න. ගොවියාට ඒ සම්බන්ධයෙන් දැනුමකුත් නැහැ. ඒ කටයුතු බාරව සිටින නිලධාරින් මේ ගොවි ජනතාව ඒ සම්බන්ධයෙන් හරියට දැනුවත් කරන්නේත් නැහැ. ඒ නිසා මේ බලපත්‍ර ලබා දීම කඩිනම් කළොත් හොඳයි කියන අදහස තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. නැත්නම් මොකක්ද වෙන්නේ? මේ ඉඩම්වලට බලපත්‍ර නොමැතිකම නිසා දවසින් දවස ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් ගැටලු ගොඩ ගැසෙමින් පවතිනවා. මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති වුණාම ගොවි ජනතාව නිතරම පොලීසියට යන ආකාරයත් අපි දකිනවා. ඉඩම් ආරාවුල් සම්බන්ධව පොලීසියට ගියාට පස්සේ, පොලීසිය ඔවුන්ව සමථ මණ්ඩලවලට යවනවා. සමහර අයට අධිකරණවලට ගිහිල්ලා තමයි මේ ප්‍රශ්න විසඳා

[ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා]

ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මෙයට විසඳුමක් වශයෙන් සෑම ඉඩමකටම කුමන හෝ බලපත්‍රයක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා අප ඉල්ලා සිටිනවා. අඩුම තරමින් වාර්ෂික බලපත්‍රයක් හරි, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ලබාදෙන බලපත්‍රයක් හෝ කුමන ආකාරයක බලපත්‍රයක් හරි ලබා දීලා ඉඩම් කච්චේරි තියලා මේවා කඩිනම් කර දෙන්න කියා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ ආකාරයට කටයුතු කළොත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබෙන ඉඩම් ගැටලු අඩු වෙයි කියන විශ්වාසයත් තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, ඔප්පු ලබා ගැනීමට බලාපොරොත්තු වන අයට පසුගිය රජය කාලයේ, -රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපතිවරයා වශයෙන් හිටපු කාලයේ- "උරුමය" වැඩසටහන හරහා ඔප්පු ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න සූදානම් වුණා. ඒ වෙලාවේ තමන්ට තිබුණු ඉඩම් බලපත්‍රය, තමන්ට තිබුණු ජය භූමි, ස්වර්ණ භූමි වැනි දීමනා පත්‍ර අවලංගු කරලා ඒවා ප්‍රාදේශීය ලේකම්තුමන්ලාට බාර දුන්නාට පස්සේ, සමහර ඔප්පු බලපත්‍ර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබෙනවා. සමහර ඔප්පු බලපත්‍ර ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්යාලවල තිබෙනවා. එතැනින් එහාට ගියාට පස්සේ සමහර ඔප්පු ජනාධිපති ලේකම් කාර්යාලයේත් හිරවෙලා තිබෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, ඒ "උරුමය" වැඩසටහන යටතේ කඩිනමින් ඔප්පු ලබා දෙන්න බැරිකමක් තිබෙනවා නම්, ඉක්මනින්ම අර ලබා ගත්ත බලපත්‍ර ටික, ඔප්පු ටික, දීමනා පත්‍ර ටික නැවත ඉඩම් හිමියන්ට ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. හැබැයි, එහෙම වුණා කියලා මේ ප්‍රශ්නය විසඳෙයි කියලා අපට හිතන්න බැහැ, ගරු අමාත්‍යතුමනි. මේ ඉඩම් ගැටලුව විසඳා ගන්නවා නම්, මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට හැමදාම යන ජනතාව අඩු කර ගන්නවා නම්, මේවාට ස්ථිර වශයෙන්ම සින්නක්කර ඔප්පු ලබාදෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළොත් හොඳයි කියන අදහස තිබෙනවා. එහෙම කළොත් පමණයි අද මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබෙන ඉඩම් ගැටලු, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබෙන තදබදය අඩු කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, කඩිනමින් මේ ප්‍රශ්නය විසඳා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු අමාත්‍යතුමනි, ඒ වාගේම අපි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගැන කථා කරද්දී කිරි ගව පාලනය ගැනත් කථා කරන්න ඕනෑ. පාරම්පරිකව කිරි ගවයින් ඇති කරන අය අපේ ප්‍රදේශවල හිටියා. සමහර කිරි ගව හිමියන්ට ගවයින් 400ක්, 500ක් හිටියා. දැන් ක්‍රම ක්‍රමයෙන් ඒක අඩුවෙලා තිබෙනවා. දැන් කිරි ගව හිමියන් ගවයින් 40ක්, 50ක්, 100ක් විතර ප්‍රමාණයක් තමයි රැක බලාගෙන ඉන්නේ.

ගරු ඇමතිතුමනි, මම මෙය ඔබතුමන්ලාට විතරක් කියන දෙයක් නොවෙයි. පසුගිය කාලයේවත් කිසිම රජයක් කිරි ගවයන් ඇති කරන අයට තෘණ භූමි -තණ බිම්- ලබා දෙන වැඩ පිළිවෙළට මූලිකත්වය ගත්තේ නැහැ. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ අයට තණ බිම් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, අපේ ප්‍රදේශවල තිබෙනවා වැව් ඉස්මත්ත. වැව් ඉස්මත්තෙහි පිට්ටනි හැටියට තිබෙනවා විශාල ඉඩම් ප්‍රමාණ. ඒවායේ විශාල ගහ කොළ නැහැ, පිට්ටනි විධියට තිබෙන්නේ. අපේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා මේවා ගැන හොඳාකාරවම දන්නවා. තණ බිම් සඳහා ඒ ඉඩම් වෙන් කර දෙන්න කියන ඉල්ලීම මම කරනවා. ඒ වාගේම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති ඉඩම්වලත් විශාල ගස් කොළන් නැති, පිට්ටනි වාගේ කොටස් තිබෙනවා. ඒවාත් තණ බිම්වලට ලබා දුන්නොත් කිරි ගවයන් රැක බලා ගන්නා ගොවීන් ආරක්ෂා කර ගන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා.

ඔබතුමන්ලාගේ ආණ්ඩුව කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා 2025 වසරේ අය වැයෙන් රුපියල් මිලියන 2,500ක් වෙන් කර තිබුණා. ඒවායින් ඒ අදාළ වැඩ කොටස් කෙරුණාද, නැද්ද කියන්න මම හරියටම දන්නේ නැහැ. හැබැයි, මේ වසරේ කිරි නිෂ්පාදනය වැඩි කිරීමට රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා. ඒ මුදල් වියදම් කරලා කිරි ගොවියා ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම මා කරනවා. ඇත්තටම කිරි ගොවියාගෙන් විශාල ආදායමක් මේ රටට ලැබෙනවා. තෘණ භූමි ලබා දීලා කිරි ගවයන් ඇති කරනවාට වඩා නිවාසවල කිරි ගවයන් ඇති කිරීම හොඳයි කියන කාරණය සමහර නිලධාරි මහත්වරු ඔබතුමන්ලාට කියනවා ඇති. ඒක හොඳ වෙන්න පුළුවන්; ඔබතුමන්ලාගේ තාක්ෂණය අනුව ඒක හොඳ වෙන්න පුළුවන්. හැබැයි, අපේ ප්‍රදේශවල තණ බිම් ලබා දීලා පාරම්පරිකව කිරි ගවයන් ඇති කරන ගොවි මහත්වරුන් ආරක්ෂා කර ගත්තොත් ඊට වඩා ආදායමක් ලබා ගන්න පුළුවන් කියා මම විශ්වාස කරනවා. මොකද, අපේ ප්‍රදේශවල විශාල බිම් ප්‍රමාණ තිබෙන නිසා කිරි ගවයින් ඇති කරන අයට තණ බිම් ලබා දෙන්න පුළුවන්. කිරි එළදෙනුන් පමණක් නොවෙයි පිරිමි ගවයන් ද මිල දී ගෙන විශාල ආදායමක් ලබා ගන්නා වැඩ පිළිවෙළවල් ඒ අයට තිබෙනවා. එම නිසා කිරි ගවයින් සහ කිරි ගොවීන් ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීමත් මා කරනවා.

අවසාන වශයෙන්, අපේ ගරු වාරිමාර්ග ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. කුඹුක්කන් ඔය ව්‍යාපාරය යටතේ වන නක්කල අමුණ අද වන විට ආපදා තත්ත්වයට ලක් වෙලා තිබෙනවා; කැඩී බිඳී යෑමට ලක් වෙලා තිබෙනවා. ඒ අමුණ ආරක්ෂා කර ගැනීම සඳහාත්, ජල ප්‍රශ්නය විසඳා ගැනීම සඳහාත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මුල්ගල තබා ආරම්භ කරපු ව්‍යාපෘතියක් තමයි කුඹුක්කන් ඔය ව්‍යාපාරය; නක්කල අමුණ සංවර්ධනය. එම ව්‍යාපාරය කඩිනමින් ආරම්භ කළොත්, මේ ආපදාවට ලක් වන ස්ථාන අඩු කර ගන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා. එම නිසා මම ඉල්ලා සිටිනවා, එම ව්‍යාපාරය කඩිනමින් ආරම්භ කරන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

එම ව්‍යාපාරය ආරම්භ කළොත් මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5කට, එනම් බුත්තල, බඩල්කුඹුර, මොනරාගල, මඩුල්ල, සියඹලාණ්ඩුව කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පානීය ජල අවශ්‍යතාව සියයට සියයක්ම ඉටු කර ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා එම කුඹුක්කන් ඔය ව්‍යාපාරය, එහෙම නැත්නම් නක්කල අමුණ ව්‍යාපාරය කඩිනමින් ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.14]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටම ආපදා තත්ත්වයකට පත් වෙලා තිබෙන මේ මොහොතේ, ඒ ආපදාවත් එක්ක අපේ රටේ පුරවැසියන්ගෙන් යම් ප්‍රමාණයක් මේ වනකොට ආපදාවට පත් වෙලා තිබෙනවා, කරදරයට පත් වෙලා තිබෙනවා, ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම, වගා හානි සිදු වෙලා තිබෙනවා, ගෙවල් කැඩිලා තිබෙනවා. පළමුවෙන්ම ඒ පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කිරීම සඳහා මම මේ අවස්ථාව යොදා ගන්නවා.

අද උදේ සිට අපි කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයට කන් දුන්නා. මේ වෙලාව වනකොට ගොඩක් කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා. විපක්ෂය පැත්තෙන් සාධනීය කාරණාත් මතු වුණා, හොඳ යෝජනාත් ඉදිරිපත් කළා, අසත්‍ය කරුණු බොහොමයකුත් ඉදිරිපත් කළා, විකෘති කිරීම් ද සැලකිය යුතු ප්‍රමාණයක් කළා.

ඉතින් අපි ඒ සියල්ල සැලකිල්ලට ගන්නවා. පසුගිය කාලය තුළ අප වී ගොවියාගේ ගැටලුව සැලකිය යුතු මට්ටමකින් විසඳුවා කියලා මම හිතනවා. පසුගිය කන්න දෙකක් ගත වුණා. ඒ කන්න දෙක ඇතුළත වී ගොවියා පාරට බැස්සේ නැහැ; උද්ඝෝෂණය කළේ නැහැ; වී විකුණා ගන්න බැහැ කියලා කිව්වේ නැහැ. අපි පෙරේදා වනකොට ලංකාවේ ඉන්න සියලු වී ගොවි නායකයෝ කැඳෙව්වා. අපේ ගරු ලාල් කාන්ත ඇමතිතුමා, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා, අපි, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු වග කිවයුතු සියලු නිලධාරින්, ජනාධිපති ලේකම් කාර්යාලයේ අදාළ වග කිවයුත්තන් ආදි සියලු දෙනාම ඒ අවස්ථාවලට සම්බන්ධ වුණා. එතැනදීත් ඒ ගොවි නායකයන් ප්‍රකාශ කළේ, මේ තිබෙන වී මිල සම්බන්ධයෙන් ඒගොල්ලන් සෑහීමකට පත් වෙනවා, ඒගොල්ලන් සතුටට පත් වෙනවා කියන කාරණයයි. ඒ වාගේම, අපි දිස්ත්‍රික්ක විසිපහේම ගොවි නායකයන් අමාත්‍යාංශයට වට දෙකක් කැඳෙව්වා. එසේ කැඳවපු වෙලාවේත් ඒ ගොවි නායකයන් මාධ්‍යයට ප්‍රකාශ කළේ, "මේ වී මිල සම්බන්ධයෙන් අපි සතුටට පත් වෙනවා" කියන කාරණයයි. එහෙම නම්, වී ගොවියාගේ ගැටලුව නිරාකරණය කිරීමට අපි යම් යම් උපක්‍රම පාවිච්චි කර තිබෙන බව පැහැදිලියි. අපි සහතික මිල වෙනුවට අවම මිලක් නියම කළා; වහලා තිබුණු, වල් බිහි වෙන්න ඉඩ හැරලා තිබුණු ගබඩා ටික විවෘත කළා; වී මිල දී ගැනීම ආරම්භ කළා; තවත් උපක්‍රම පාවිච්චි කළා. වී ගොවියාගේ ගැටලුව විසඳන්න අප ඒ විධියට කටයුතු කළා.

සාමාන්‍යයෙන් මේ කාලය වන කොට කථා බහට ලක් වෙන්නේ මොකක්ද? හාල් හිඟයි, හාල් පට්ට ගණන් - ගිනි ගණන්, හාල් හංගලා වගේ දේවල් නේ. වෙනදා මේ කාලය වන කොට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, මාධ්‍ය ආදි ඔක්කෝම ක්‍රියාත්මක වෙන්නේ ඒ කාරණාවලට අදාළවයි. සාමාන්‍යයෙන් හාල් මාෆියාවක් තිබෙනවා කියලා කථා වෙනවා. ඒක ඔක්තෝබර් මාසයෙන් තමයි පටන් ගන්නේ. ජනවාරි අග විතර වනකල් එය ක්‍රියාත්මක වෙනවා. දැන් අප මේ ගත කරන කාල පරාසය තුළ පාර්ලිමේන්තුව තුළත් හාල් සම්බන්ධයෙන් සාකච්ඡා වෙනවා. හැබැයි, අද දවසේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන කොට හාල් විෂයය - subject එක - ගැන කවුරුවත් කථා කළේ නැහැ. ඒ ගැන විවේචනයක් ආවේ නැහැ. ඇයි ඒ? එහෙම ප්‍රශ්නයක් දැන් නැති නිසායි. හාල් මිලත් අඩු වෙලා. දැන් රතු හාල් එහෙම කිලෝව එකසිය ගණන්වලට තිබෙනවා. දැන් හාල් හිඟයකුත් නැහැ; කීරි සම්බාත් තිබෙනවා; මිලත් සාධාරණයි. ඔක්කොම ගැටලු බේරිලා තිබෙනවා.

ඊයේ දවසේ මට කථා කළා, නිශාන්ත අත්තනායක මහත්මයා. ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ මෝල් සංගම්, එහෙම නැත්නම් සහල් නිෂ්පාදකයන්ගේ සංගම් කිහිපයක් තිබෙනවා. නිශාන්ත අත්තනායක මහත්මයා කියන්නේ, සහල් නිෂ්පාදකයන්ගේ සංගමයක සභාපතිවරයෙක්. එතුමා වී මෝල්වලට අදාළ හාල් නිෂ්පාදන සංගම්වල නායකයෙකු විතරක් නොවෙයි, උඩුදුම්බර ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ආසන සංවිධායකවරයාද වනවා. ඔහු මට කිව්වා, "මම දේශපාලඥයෙක් විධියට නොවෙයි මේ කථා කරන්නේ. මම මේ කථා කරන්නේ ස්තුතිය පුද කරන්නයි, ඇගයීමට ලක් කරන්නයි. මමත් දශක ගණනාවක සිට හාල් නිෂ්පාදන ක්‍රියාවලියේ ඉන්නවා; වී මෝල් හිමියන්ට නායකත්වය ලබා දෙනවා; ගොවි සංවිධානවල ගොවීන් එක්ක ගනුදෙනු කරනවා. මම දේශපාලනයත් කරනවා. හැබැයි, මට තිබෙන අත්දැකීම අනුව මට මතක ඇති කාලයේ ඉඳන් පළමුවෙනි වතාවට මේ හාල් මාෆියාවට නැවතීමේ තිත තබලා තිබෙනවා. අද වෙනකොට හාල් පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙලා නැහැ; මතු වෙන්නේ නැහැ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඒ ප්‍රශ්නය බේරන්න සමත් වෙලා තිබෙනවා" කියලා. නිශාන්ත අත්තනායක මහත්මයා ඒ කාරණය මා එක්ක ප්‍රකාශ කළා. නිශාන්ත අත්තනායක මහත්මයා කවුද කියලා තිස්ස අත්තනායක මහත්මයාගෙන් ඇහුවා නම් තවත් වැඩිදුරට දැනගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ ප්‍රධාන භෝගය තමයි, වී. ලංකාවේ ප්‍රධාන ගොවියා තමයි, වී ගොවියා. වී ගොවියෝ ලක්ෂ අටකට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ලංකාවේ ප්‍රධාන ආහාරය තමයි, බත්. එහෙම නම්, වීවල ගැටලුවට, බතේ ප්‍රශ්නයට -ප්‍රධාන ආහාරයේ ප්‍රශ්නයට- ආණ්ඩුව විධියට අපි යම් සාර්ථක ප්‍රතිචාරයක් දක්වන්න සමත් වෙලා තිබෙනවා. බත් පතට එකතු වෙනවා, එළවලු. ඒ එළවලු අතරට අල හොද්ද එනවා.

අල හොද්ද හැම වෙලාවේම එන්නේ නැහැ. බැදපු අල එනවා. ඒ අල හොද්ද, එළවලුව රස කරන්න ලූනුත් එනවා. බතේ ප්‍රශ්නය බේරපු වේගයෙන් අපි ලූනු ගෙඩියේ ප්‍රශ්නය, අල ගෙඩියේ ප්‍රශ්නය බේරන්න සමත් වුණේ නැහැ. ඒක අපි පිළිගන්නවා. හැබැයි, ඒකත් අපි ක්‍රමානුකූලව බේරනවා. මේ දවස්වල ලොකුවට සාකච්ඡා වෙච්ච මාතෘකාවක් තමයි, ලූනු. 2023 අපේ රටේ ලූනු නිෂ්පාදනය මෙට්‍රික්ටොන් හයදහස් නවසිය ගණනක්; හත්දහසට අඩු ප්‍රමාණයක්. ඒක ඉතාම අඩු ප්‍රමාණයක්. එහෙම තත්ත්වයක තිබුණු නිෂ්පාදනය මේ වනකොට මෙට්‍රික්ටොන් 60,000කට ආසන්න නිෂ්පාදනයක් දක්වා අටගුණයකින්, නවගුණයකින් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේදී ඒ ගොවි ජනතාවට විශේෂ ස්තුතියක් පුද කරනවා. අපි ඒ සඳහා මැදිහත් වුණා, රජය මිලදී ගැනීම් ආරම්භ කළා, යම් යම් මැදිහත්වීම් කළා. නමුත්,

[ගරු නාමල් කරුණාරත්න මහතා]

ඒකේ ගැටලු ප්‍රමාණයක් තිබුණා. ගොවියාට ගැටලුවක් ඇති වුණා. හැබැයි, ඒ ගැටලුවත් මේ වනකොට නිරාකරණය වෙලා තිබෙනවා.

අල ගොවියාගේ ප්‍රශ්නයත් එහෙමයි. අපි කියනවා, ඊළඟ වතාව වනකොට ලොකු ලූනු ගොවියාට ගැටලුවක් එන්න අපි ඉඩ තියන්නේ නැත, අර්තාපල් ගොවියාට ගැටලුවක් එන්න අපි ඉඩ තියන්නේ නැත කියලා. පසුගිය කාලයේ බඩඉරිඟු ගොවියාගේ ගැටලුවක් ආවේ නැහැ; එහෙම ලොකු ගැටලුවක් ආවේ නැහැ. බඩඉරිඟු මිලදී ගත් අතරමැදියන්ගේ ගැටලුවක් ආවා. බඩඉරිඟු ගොවීන්ට ගැටලුවක් එන්න ඉඩ තියන්නේත් නැත. ආණ්ඩුව විධියට අපි ගොවි ජනතාවත් එක්කත් සාකච්ඡා කරලා, ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ඒ ගැටලු විසඳන්න අදාළ වැඩ පිළිවෙළක් මේ වනකොට හදලා තිබෙනවා.

විශේෂයෙන්ම දැන් කඳුකන්න ආරම්භ වෙලා තිබෙන්නේ. අර්තාපල් කිලෝවකට රුපියල් 250-300 අතර මිලක් ඔබට අනිවාර්යයෙන්ම ලැබෙනවා. ඒ තත්ත්වය ඇතුළේ ඔබට තව රැකවරණ ගොඩක් ලබා දෙනවා. ඒ වාගේම ලොකු ලූනු ගොවියාටත් රැකවරණ ගොඩක් ලැබෙනවා. ඒ නිසා ඔබ වැඩි වැඩියෙන් වගා කරන්න, භය නැතිව වගා කරන්න කියන කාරණය මේ වෙලාවේ අපි කියනවා.

සියයට 10ක් විතර ගොවියා වගාවෙන් ඈත් වෙලා, අස්වැන්න අඩුයි වාගේ කතන්දර විපක්ෂය පැත්තෙන් මතු කළා. ඒක සම්පූර්ණයෙන්ම බොරුවක්. මුංඇට පිට රටින් ගෙනෙන එක අපි නතර කළා. මුංඇටවලින් අපේ රට ස්වයංපෝෂිත වුණා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ විතරක් අක්කර 20,000කට වැඩි භූමි භාගයක මුංඇට වගා කළා. වගා නොකරන අනෙකුත් භූමිවලත් වගා කළා. ඒ ආකාරයට අපි මුංඇටවලින් ස්වයංපෝෂිත වුණා. මේ තත්ත්වය අපි අඛණ්ඩව අල්ලාගෙන යන්න ඕනෑ. ලබන අවුරුද්දේත් මේ වගාව ඉස්සරහට ගෙන යන්න ඕනෑ. මේ විධියට අපි ලොකු ලූනු, අර්තාපල්, කව්පි, තල, උඳු ආදී හැම භෝගයකින්ම ඉදිරියට ආවා මිස, ආපස්සට ගිහින් නැත. ඒක තමයි ඇත්ත තත්ත්වය. වී වගාව ගත්තත් එහෙමයි.

දැන් විපක්ෂයෙන් කිව්වා, වී අස්වැන්න අඩු වුණා කියලා. මෑත ඉතිහාසයේ යල කන්නයේ වැඩිම වී අස්වැන්න මෙදා ගත්තා. ගොවි ජනතාවගෙන් අහන්න වෙන දා අස්වැන්නයි, මෙවර අස්වැන්නයි කොහොමද කියලා. මෙදා වැඩිම අස්වැන්නක් ගත්තා. එහෙම නම්, මේ තත්ත්වයත් එක්ක හැම වගාවකින්ම අපි පියවරක් ඉදිරියට තැබුවා මිස, ආපස්සට ගිහිල්ලා නැහැ. ඒක අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. අපනයන භෝග ගත්තාමත් එහෙමයි. අපි පියවරක් ඉදිරියට තබා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, විකුණන්න දාලා තිබුණා NLDB එක, මිල්කෝ ආයතනය. NLDB එකේ අක්කර 28,802ක් වන වටිනා සාරවත් ඉඩම් සියල්ල විකුණන්න සැලසුම් කරලා තිබුණේ. ඒ අවසාන ගිවිසුම ගහන්න විතරයි තිබුණේ. මිල්කෝ එකට අයිති කිරි ෆැක්ටරි 5ක්, කිරි එකතුකිරීම් මධ්‍යස්ථාන 92ක්, චංචල, නිශ්චල දේපළ සියල්ල විකුණන්න නිර්දේශ කරලා තිබුණේ. බඩල්ගම ෆැක්ටරි එක හදන්න ණයක් ගත්තා. ඒ ගත්ත ණය මුදලටත් වඩා අඩු මුදලකට මිල්කෝ ආයතනය ලංසු කරන්න ලෑස්ති කරලා තිබුණේ. ඒවා බේරා ගැනීම සඳහා අපි මහා අරගළයක් කළා.

ඒ අරගළයට නායකත්වය දුන් අය විධියටයි අපි අද කථා කරන්නේ. ඒවා විකිණීම සඳහා පාඩු ලබන තත්ත්වයට පත් කෙරුවා. මිල්කෝ ආයතනය ගත්තොත්, ගොවීන්ට විතරක් රුපියල් ලක්ෂ 5,000ක පොල්ලක් තියලා තිබුණේ. ඒ සල්ලි ගෙවලා තිබුණේ නැහැ. වෙන්රිච් ආයතනයේ රත්නායක මහත්මයාටත් ලක්ෂ 2,000ක් ගෙවන්න තිබුණා. ඒ සල්ලිත් ගෙවලා තිබුණේ නැහැ. ගොවීන් ඇතුළු වෙනත් පුද්ගලයන් විශාල පිරිසකටත් ණය වෙලා, තව, තව ආයතනවලට ණය වෙලා හිර කරලා තිබුණේ. හැබැයි, අද වෙනකොට ඒ ණය ක්‍රමානුකූලව බේරාගෙන ඇවිල්ලා, කිරි නිෂ්පාදනය දෙගුණයක් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ වෙනකොට කෝටි 16කට ආසන්න මුදලක් වෙන් කරලා තිබෙනවා, ඒ කිරි ගොවීන්ට ලාභාංශ විධියට බෙදලා දෙන්න. ඒ වාගේම මිල්කෝ ආයතනයේ වැඩ කරන සේවකයන්ටත් දීමනා ලබා දෙනවා. අපි අද අන්න ඒ තැනට ඇවිල්ලා තිබෙනවා.

NLDB එක ගත්තත් එහෙමයි. ඒක විකුණන්න තීරණය කරලා තිබුණු නිසා පාඩුයි කියලා පෙන්වීමට තමයි කටයුතු කළේ. හැබැයි, අද වෙනකොට ඒ ආයතනය ලොකු ඉදිරියකට ඇවිල්ලා තිබෙනවා. බඩ ඉරිඟු විතරක් අක්කර 1,500කට වැඩි භූමි ප්‍රමාණයක් වගා කළා. පසුගිය කාලයේ බඩ ඉරිඟු වාගේ දේවල් එක අක්කරයකවත් වගා කළේ නැහැ. ලබන අවුරුද්දේ අපි ඒ ප්‍රමාණය තවත් වැඩි කරනවා. ඒ වාගේම අපි තවත් වැඩසටහන් ගණනාවක් දියත් කරලා තිබෙනවා.

අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමන්ලා, අතිරේක ලේකම්තුමියලා, සභාපතිතුමන්ලා සහ සභාපතිතුමියලා, අධ්‍යක්ෂකතුමන්ලා, කොමසාරිස් ජනරාල්තුමන්ලා ඇතුළු වගකිව යුතු නිලධාරීන් හැමෝටම මම ස්තුතිවන්ත වෙනවා. සමහර අය මේ වෙලාවේත් මෙතැන රාජ්‍ය නිලධාරීන් සඳහා වෙන් වූ මැදිරියේ ඉන්නවා. තව සමහර අය ගැලරියේ ඉන්නවා. ඒ වාගේම දිස්ත්‍රික් මට්ටමින් කටයුතු කරන නිලධාරීන් ඉන්නවා. දැනට ඒ නිලධාරීන්ගේ විශාල හිඟයක් තිබෙනවා. ඒ සමහර අයට යන්න වාහන නැහැ. තිබෙන වාහන පරණයි. ඒ computers වැඩ කරන්නේ නැහැ. ඒ වාගේ දුෂ්කරතා ගොඩක් මැද්දේ තමයි ඔවුන් වැඩ කරන්නේ. ඒ අඩුපාඩු අපි ඉදිරියේදී ක්‍රමානුකූලව විසඳනවා. නිලධාරීන්ගේ හිඟයක් තිබෙනවා. විශේෂයෙන්ම කෘ.ප.නි.ස. නිලධාරීන් 3,900කට වැඩි ප්‍රමාණයක - 4,000කට ආසන්න ප්‍රමාණයක - හිඟයක් තිබෙනවා. මේ ඔක්කෝම ප්‍රශ්න තියාගෙන තමයි වැඩ කරන්නේ. ඒ අඩුපාඩුත් ඉදිරියේදී ක්‍රමානුකූලව විසඳනවා. මේ අඩුපාඩු විසඳුවාට පස්සේ අපට මෙහි තවත් පියවරක් ඉස්සරහට තියන්න පුළුවන්.

මම මේ වෙලාවේ තවත් කාරණයක් කියන්න අවස්ථාව ගන්නවා. අද විපක්ෂයේ බොහෝදෙනෙක් ගොවියා ගැන කිඹුල් කඳුළු හෙළනවා. අද අල ගැන කථා කරනවා, ලොකු ලූනු ගැන කථා කරනවා. අල ගොවියා ගැන කථා කරනකොට මම මේ මහත්වරුන්ට මතක් කරන්න කැමැතියි, මේ කාරණයත්. වැලිමඩ, ඌව පරණගම, බොරලන්ද, මොරගස්වැව, කැප්පෙටිපොල ඇතුළු ස්ථාන 6කදී තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගොවීන්ගෙන් අල ගත්තා. ගොවියාට රුපියල් 95 ගණනේ ගෙවනවා කියලා අල කිලෝ 20,44,000ක් ගත්තා. නමුත්, ශත 5ක් ගෙව්වේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අල කිලෝ 2,044,000කට සල්ලි ගෙව්වේ නැහැ. අපට එදා උද්ඝෝෂණය කරන්න සිද්ධ වුණා. අපි එදා ගිහිල්ලා අමාත්‍යාංශය වැටලුවා. එදා හිටපු ඇමතිගේ -මෙන්න මේ පුටුව හිමි ඇමතිගේ- අමාත්‍යාංශය වැටලුවා. ඒකට නායකත්වය දුන්නේ අපි. එතැන වටලලා, උද්ඝෝෂණය කරලා, ගොවීන්ගේ ඒ මුදල්වලින් කොටසක් ගත්තා. හැබැයි, ඒ ගොවීන්ට කෝටි ගණනක් ගෙව්වේ නැහැ. තමුන්නාන්සේලා වැඩ කළේ අන්න එහෙමයි. ගොවියාගේ අල ටික ගත්තා, සල්ලි ගෙව්වේ නැහැ.

ඊළඟට, තමුන්නාන්සේලා ලොකු ලූනු ගැන කථා කළා. විපක්ෂ නායකතුමාත් පුදුම අනුකම්පාවකින් කථා කළා. මම මතක් කරන්න ඕනෑ, දඹුල්ල, කිඹිස්ස, දේවහුව වාගේ ප්‍රදේශවල ගොවි ජනතාවගේ ලොකු ලූනු බීජ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගත්තා. ඒවාට රුපියල් 9,000 ගණනේ ගෙවනවා කිව්වා. නමුත් ශත 5ක් ගෙව්වේ නැහැ. එදා අපි අනුරාධපුරයට ගිහිල්ලා පී. හැරිසන් ඇමතිවරයාත් එක්ක කථා කළා. ඒකට නායකත්වය දුන්නේ අපි. ඊට පස්සේ අලුවිහාරේ ඇමතිවරයාත් එක්ක කථා කරන්න දඹුල්ලට ගෙන්වූවා. පසුව විදුර වික්‍රමනායක ඇමති දඹුල්ලට ගෙන්වූවා. ඒ අය එක්ක කථා කළා. දඹුල්ල පුරා අපි පෙළපාළි ගියා, උද්ඝෝෂණය කළා. ඒ අහිංසක ලොකු ලූනු ගොවියාගේ ලූනු ඇට ටික ගත්තා, ශත 5ක් ගෙව්වේ නැහැ. ගොවියාට පොලු තිබ්බ ආණ්ඩුවල හිටපු තමුන්නාන්සේලා අද කිඹුල් කඳුළු හෙළනවා.

පලුටාව ලොකු ලූනු බීජ ගම්මානයේ ගොවි ජනතාව හොඳින්ම දන්නවා, සාමාන්‍යයෙන් ගොවියෙක් රුපියල් ලක්ෂ 2ක ණය මුදලක් ගත්තොත් බැංකුවෙන් රුපියල් 16,000ක් කපන බව. ඒ මුදල කපලා ඔවුන් රක්ෂණය කරනවා. එසේ රක්ෂණය කරපු ගොවියාට අදාළ වන්දි මුදල් ගෙව්වේ නැහැ. මම එදා පලුටාවේ ඉඳලා උද්ඝෝෂණය කරලා, එතැන ඉඳලාම කෘෂි රක්ෂණ මණ්ඩලයට කථා කළා.

කථා කළත් ගෙව්වේ නැහැ. අරගළ කරලා තමයි ඒවා ගන්න පුළුවන් වුණේ. අද වෙනකොට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා ගොවීන්ගේ වන්දි මුදල් සියල්ල ගෙවා තිබෙනවා. අපි ආණ්ඩුව ගන්නකොට, යල කන්නය සඳහා වන්දි ගෙවලා තිබුණේ නැහැ. හැබැයි, අපි ඒ වන්දි ගෙව්වා. ඒවා ගෙවලා තමයි පටන් ගත්තේ. ඒ විතරක් නොවෙයි. මේ තත්ත්වයත් එක්ක ගොවි ජනතාවට ගැටලු මතු වුණා. ඒ වාගේම වන්දි ගැනත් කථා කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
හොඳයි, මම අවසන් කරනවා.

අද අපි භාරව සිටින කෘෂිකර්ම අමාත්‍යාංශය, එදා අපට වටලන්න සිද්ධ වුණා. ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන ඉන්නවා. අපේ සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා, අපි කෘෂිකර්ම අමාත්‍යාංශය වැටලුවා. තමුන්නාන්සේලා කිව්වා, 2016 දී ලොකු නියඟයක් ඇති වුණු බව. එතකොට වන්දි මොනවත් ලැබුණේ නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය වටලලා, අරගළ කරලා තමයි එදා අපි වන්දි සටන් ජයග්‍රහණය කළේ. ගොවියාගේ හදගැස්ම පිළිබඳව අපට හොඳ අවබෝධයක් තිබෙනවා, හොඳ නිනව්වක් තිබෙනවා. ඒ තත්ත්වය මත ගොවි ජනතාවගේ ගැටලු අපි එකෙන් එකට බේරනවා.

මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂ නායකතුමා කිව්වා, වී කිලෝවකට රුපියල් 150ක් ඉල්ලුවා කියලා. විපක්ෂ නායකතුමා දවසක් පාර්ලිමේන්තුවේදීම කිව්වා, එදා පොහොර තහනම් කළාට පස්සේ වී නිෂ්පාදනය සියයට 36 දක්වා අඩු වුණා කියලා. ඒ වෙලාවේ මම කිව්වා, "මම ඒක පිළිගන්නවා" කියලා. පොහොර තහනම් කළාට පස්සේ වී නිෂ්පාදනය සියයට 36 දක්වා අඩු වුණා. පොහොර මිටිය රුපියල් 40,000ට ගියා. අන්න ඒ තත්ත්වය ඇතුළේ ගොවියාට වී කිලෝවක් නිෂ්පාදනය කිරීම සඳහා රුපියල් 150කට වැඩි වියදමක් දරන්න සිද්ධ වුණා. ඒක තමයි එදා අපි කිව්වේ. එදා තත්ත්වයට ගැළපෙන විධියට, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අවසන් කරන්න. ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ඒ නිසා කරුණු විකෘති කරන්න එපා කියන කාරණය මම මතක් කරනවා. ඒ අතරම කියන්න ඕනෑ, අපි අනිවාර්යයෙන්ම අපේ රටේ කෘෂිකර්මාන්තය ඉදිරියට අරගෙන යන බව. අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරින් දුෂ්කරතා මැද්දේ, අභියෝග මැද්දේ මේ කටයුතු සාර්ථක කර ගන්න වැඩ කටයුතු කරගෙන යනවා. අපි කණ්ඩායමක් විධියට සාමූහිකව කටයුතු කරමින් මේ අභියෝගය ජයග්‍රහණය කරනවා කියන එක මතක් කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු මන්ත්‍රීතුමාට කාරණාව කියන්න අවස්ථාව දෙමු නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ පාර ගෙන්වන බීජ අලවලට subsidy එකක් දෙන්න බැරිද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු මන්ත්‍රීතුමනි, අර්තාපල්, ලොකු ලූනු, වී සහ බඩ ඉරිඟු කියන භෝග 4ට අය වැයෙනුත් මුදලක් වෙන් කරලා තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධව සාකච්ඡා කරලා ගොවියාට වාසිවෙන විධියට තීන්දුවක් ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.34]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට විනාඩි 15ක් තිබුණා. සාමාන්‍යයෙන් විපක්ෂයෙන් අපේ පක්ෂයට ලබා දීපු වෙලාව අඩු කරන්නේ නැහැ. ඒ නිසා, මට ඒ විනාඩි 15ම ලබා දෙන්න.

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்று கார்த்திகை மாதம் 27ஆம் திகதி மாவீரர் தினமாகும். இது மாவீரர் வாரமும் ஆகும். முதலில் எங்களுடைய மண்ணுக்காகவும் மண்ணின் விடுதலைக்காகவும் தமிழ் மக்களின் எதிர்காலத்துக்காகவும் தங்களைத் தியாகம்செய்த அனைத்து மாவீரர்களுக்கும் இந்த உயரிய சபையில் எனது அஞ்சலியைச் செலுத்த விரும்புகின்றேன். தேசிய மக்கள் சக்தி ஆட்சிக்கு வந்த பின்னர், இது இரண்டாவது முறையாக அனுஷ்டிக்கப்படுகின்றது. கடந்த வருடமும் மாவீரர் தினம் அனுஷ்டிக்கப்பட்டது; இந்த வருடமும் அனுஷ்டிக்கப் படுகின்றது. உண்மையிலே நாங்கள் தேசிய மக்கள் சக்தி அரசாங்கத்துக்கு நன்றி சொல்ல வேண்டும். ஏனெனில், இந்த வருடம் வடக்கு, கிழக்கு பூராவும் மக்கள் சுதந்திரமாகத் தங்களுடைய அஞ்சலியைச் செலுத்துவதற்கான வாய்ப்பை தேசிய மக்கள் சக்தி அரசாங்கம் வழங்கி இருக்கின்றது.

மேலும், வடக்கு, கிழக்கு பூராவும் மக்கள் தங்களுடைய மண்ணுக்காக உயிர்நீத்த உறவுகளை நினைவுகூரும் முகமாகப் பல நிகழ்வுகளை ஏற்பாடு செய்து, சுதந்திரமாக அவற்றை நடாத்திக்கொண்டு இருக்கிறார்கள். இருந்தபோதிலும், அரசாங்கத்திடம் ஒரு வேண்டுகோளை முன்வைக்க வேண்டும். வழமையாக இப்படித்தான் நடக்கும். அதாவது, ஆட்சிக்கு வருகின்ற அரசாங்கங்கள் முதல் இரண்டு வருடங்களில் மாவீரர் தினத்தை அனுஷ்டிக்க அனுமதி அளிக்கும். அந்த இரண்டு வருடங்களில், அஞ்சலி செலுத்துபவர்களையும் அந்த நிகழ்வுகளை முன்னின்று ஏற்பாடு செய்பவர்களையும் அடையாளங்கண்டு, கடைசி இரண்டு வருடங்களில் அவர்களுக்குச் சிறைத் தண்டனை வழங்குவதும், அவர்களைப் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்வதும், பயங்கரவாதத் தடுப்புப் பிரிவினர் மற்றும் புலனாய்வுப் பிரிவினர் விசாரணை செய்வதும் எனப் பல செயற்பாடுகள் கடந்த காலங்களில் நடந்திருக்கின்றன. எனவே, உங்களுடைய ஆட்சிக் காலத்தில், நீங்கள் முதல் இரண்டு வருடங்களில் நடந்துகொண்டதுபோல தொடர்ந்தும் நடந்துகொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அரசியல் காரணங்களுக்காகப் போராடி உயிரிழந்தவர்களுக்கு அஞ்சலி செலுத்துவதற்கு வழங்கியிருக்கின்ற வாய்ப்புக்கு நான் மீண்டும் நன்றி சொல்கின்றேன்.

இன்று மிக முக்கியமான ஒரு விவாதம் நடைபெறுகின்றது. அதாவது, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதம் நடைபெறுகின்றது. 'விடுதலைப் போராட்டம்' என்றதொன்று ஆரம்பிக்கப்பட்டு, ஆயிரக்கணக்கான மாவீரர்கள் இந்த மண்ணில் விதைக்கப்படுவதற்கு மிக முக்கிய காரணமாக அமைந்தது, அந்தக் காலப்பகுதியில் ஆட்சியாளர்கள் செய்த குடியேற்றத் திட்டங்கள்தான். நீர்ப்பாசனத் திட்டங்களை மறைமுகமாகக் காட்டித்தான் இந்தக் குடியேற்றத் திட்டங்களை உருவாக்கினார்கள். முன்னர், அம்பாறை என்றதொரு மாவட்டமே இருக்கவில்லை. அம்பாறை மாவட்டத்தில் சேனாநாயக்க திட்டம், கல்ஓயா திட்டம்போன்ற திட்டங்களை உருவாக்கி, அந்தத் திட்டங்களில் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களுக்கு முன்னுரிமை வழங்காமல், வேறு பிரதேசங்களில் இருந்து மக்களைக் கொண்டுவந்து குடியேற்றினார்கள். இவ்வாறு வடக்கு, கிழக்கில் இருக்கின்ற demographyஐ - மக்களுடைய விகிதாசாரத்தை - மாற்றி அமைத்தமை விடுதலைப் போராட்டம் முன்னெடுக்கப்படுவதற்கு முக்கியமானதொரு காரணமாக இருந்தது. இந்த விடயத்துடன் சம்பந்தப்பட்ட முக்கியமானதொரு விவாதம் இடம்பெறுகின்ற இந்த நேரத்தில், மக்கள் பிரதிநிதிகளாகிய நாங்கள், அந்த மாவீரர்களுடைய தியாகத்துக்கு நீதியைப் பெற்றுக் கொடுப்பதாக இருந்தால், அவர்கள் தனிநாடு கோரி போராடி இருந்தாலும்கூட, ஆகக் குறைந்தது இலங்கைக்குள் ஓர் அரசியல் தீர்வை நோக்கியாவது பயணிக்க வேண்டும்.

கடந்த காலங்களில் மாவீரர்களுக்கு அஞ்சலி செலுத்த விடாமல் மக்களைக் குழப்பி, அவர்களை அச்சுறுத்தும் போதெல்லாம், நாங்கள் அந்த இடத்தில் மக்கள் பிரதிநிதியாக - பாராளுமன்ற அமர்வுகள் நிகழ்ந்தபொழுதும்கூட - மக்களோடு மக்களாக நின்று, அந்த அஞ்சலி நிகழ்வில் கலந்து கொண்டோம். நான் நினைக்கின்றேன், 2023ஆம் ஆண்டு தரவை மாவீரர் துயிலும் இல்லத்துக்கு நாங்கள் அஞ்சலி செலுத்தச் சென்றபொழுது, அங்கு 6.00 மணியளவில் வந்த பொலிசார், அங்கிருந்த பதாகைகளையும் கொடிகளையும் கிழித்து அகற்றியதுடன், வயதான தாய்மாரையும் தாக்கினார்கள்; அங்கு இருந்தவர்களைக் கைது செய்தார்கள். இவ்வாறான நெருக்கடியான சூழல் இருந்தபொழுதும், நாங்கள் அந்த மக்களோடு மக்களாக களத்தில் நின்று, அந்த அஞ்சலி நிகழ்வில் கலந்து கொண்டோம். இன்று இந்த அரசாங்கம் சுதந்திரமான முறையில் அஞ்சலி செலுத்துவதற்கு எங்களுடைய மக்களுக்குச் சந்தர்ப்பம் வழங்கியிருக்கின்ற நிலையிலே, இன்று இந்தச் சபையில் நீர்ப்பாசன அமைச்சின் குழுநிலை விவாதம் நடைபெறுகின்றது. எங்களுடைய மாவீரர்களுடைய நியாயமான அபிலாஷைகளை அடையக் கூடிய வகையில், எனது நேரத்தைப் பயன்படுத்த வேண்டும் என்ற நிலைப்பாட்டிலேயே நான் இன்றைய குழுநிலை விவாதத்தில் கலந்துகொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய மண்தான் எங்களுடைய பிரதான சொத்து! நாங்கள் எங்களுடைய வடக்கு, கிழக்கில் internal right for self-determinationஐக் கோருவதாக இருந்தாலும் சரி, எங்களுடைய external rightஐக் கோருவதாக இருந்தாலும் சரி, எங்களுடைய மண் - நிலம் - மிக முக்கியமானது. எங்களுடைய நிலத்தை அரசாங்கம் அபகரிப்புச் செய்கின்றது. கௌரவ கே. டி. லால் காந்த அவர்களே, எங்களுடைய நிலத்தைப் பறிப்பதில் உங்களுடைய அமைச்சுதான் மிக முக்கிய பங்கு வகிக்கின்றது. உங்களுடைய அமைச்சுக்குக்கீழ்தான் மகாவலி அதிகாரசபை வருகின்றது. இன்றுவரை வடக்கு, கிழக்குக்கு மகாவலி திட்டத்தின் ஊடாகஒரு சொட்டுத் தண்ணீர்கூட வரவில்லை. Not even a single drop of water has been diverted to the North and the East through the Mahaweli Scheme, but successive governments had taken over land under the guise of the Mahaweli to create colonization schemes. Unfortunately, it is happening under your Government as well.

கௌரவ அமைச்சர் அவர்களே, நிலம்தான் முக்கியமானதென நான் எனது உரையில் சொல்லியிருந்தேன். இன்று மகாவலி அதிகாரசபையானது, மகாவலி "B" வலயம் என்ற பெயரில், மட்டக்களப்பு மாவட்டத்தில் காணிகளை அபகரித்திருக்கின்றது. கௌரவ செல்லத்தம்பி திலகநாதன் அவர்கள் உரையாற்றும்போது சொல்லியிருந்தார், மகாவலி அதிகாரசபை 1,200 ஏக்கர் காணியை மேய்ச்சல் தரைக்கு வழங்குவதாக. மயிலத்தமடு - மாதவனை பிரதேசத்திலுள்ள பண்ணையாளர்கள் 750 நாட்களுக்கும் மேலாகப் போராட்டத்தில் ஈடுபட்டுக்கொண்டு இருப்பது, 1,200 ஏக்கர் காணியைப் பெறுவதற்காக அல்ல. அவர்கள் கோருகின்ற நிலங்கள் மகாவலி அதிகாரசபை உருவாக்கப்படுவதற்கு முன்னரே பூர்வீகமாக மேய்ச்சல் தரையாகப் பயன்படுத்தப் பட்டவை. அந்த நிலங்கள் மகாவலி அதிகாரசபைக்குச் சொந்தமானவையாக இருந்தபோதிலும், அவற்றை அந்தப் பண்ணையாளர்கள் பயன்படுத்தினார்கள். ஐந்து இலட்சத் துக்கும் அதிகமான கால்நடைகளை வைத்திருக்கின்ற அந்தப் பண்ணையாளர்களுக்கு ஆகக் குறைந்தது 7,000 ஏக்கர் காணியாவது மேய்ச்சல் தரைக்காகத் தேவை.

நான் நேற்றையதினம்கூட சொல்லியிருந்தேன், எங்களுடைய வடக்கு, கிழக்கிலுள்ள மக்களின் பொருளாதாரம் தங்கியிருப்பது மீன்பிடி, விவசாயம் மற்றும் கால்நடை வளர்ப்பில் என்று. உங்களுடைய அமைச்சர்கள் மீன்பிடியை அழித்துக்கொண்டு இருக்கிறார்கள். உதாரணத்துக்கு, மட்டக்களப்பு மாவட்டத்தில் கால்நடைகளை வைத்திருப்ப வர்களுக்கு இன்னும் நீதி கிடைக்கவில்லை. வவுனியா, திருகோணமலை, முல்லைத்தீவு மாவட்டங்களில் மகாவலி "L" வலயத்திலுள்ள அதிகளவான நிலங்கள் வேறு மாவட்டங் களிலிருந்து வருகைதருபவர்களுக்கு வழங்கப்பட்டிருக்கின்றது. குடியேற்றத் திட்டங்களாக உங்களுடைய அமைச்சின்கீழ் அது நடக்கின்றது.

இன்று காலையில் உரையாற்றிய வவுனியா மாவட் டத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர் டாக்டர் சத்தியலிங்கம் அவர்கள் சொல்லியிருந்தார், நீங்கள் கொண்டு வந்து இருக்கின்ற கிவுல்ஓயா Projectமூலம் தமிழ்பேசும் மக்களுக்கு இனவாத அடிப்படையில் அநீதி நடப்பதாக. உங்களுடைய அரசாங்க காலத்தில் இவ்வாறான விடயங்களை நாங்கள் அனுமதிக்க முடியாது. இவ்வாறான விடயங் களால்தான் 30 வருட ஆயுதப் போராட்டம் இந்த மண்ணில் நடந்தது. இன்று வடக்கு, கிழக்கு பூராவுமுள்ள மக்கள் மாவீரர்களுக்கு அஞ்சலி செலுத்தவேண்டிய சூழ்நிலைக்குத் தள்ளப்பட்டதற்குக் காரணம் எங்களுடைய நிலங்கள் அபகரிக்கப்பட்டதுதான். இன்றும் அதே நில அபகரிப்பு நடந்துகொண்டு இருக்கின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, இன்று எங்களுடைய பிரதேசங்களில் வெள்ள அனர்த்தம் ஏற்பட்டுக்கொண்டு இருக்கின்றது. அரசாங்கம் இதற்கான முன்னாயத்தோடு இருந்திருக்க வேண்டும். உதாரணத்துக்கு, மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொள்வோம். மலையகத்திலிருந்து வரும் மழைநீர் முழுவதும் எங்களுடைய அம்பாறை, மட்டக்களப்பு மாவட்டங்களின் ஊடாகத்தான் கடலிலே போய்ச் சேர்கின்றது. மகாவலி அதிகாரசபையின் ஊடாக இகலகொத்மலை என்று அழைக்கப்படுகின்ற பிரதேசத்தில் ஐந்துக்கும் அதிகமான நீர்த் தாங்கிகளை - water tanksஐ - அமைத்தால் மாத்திரமே அந்த நீரைத் தேக்க முடியும். அந்தப் பிரதேசத்தில் மழைநீர் தேங்கி நிற்பதற்கான இடம் இல்லாததால், அதிகளவு மழை பெய்யும்போது நீரானது அப்படியே எங்களுடைய கிழக்கு மண் ஊடாக கடலுக்குப் போகின்றது. அதேநேரம், ஏற்கெனவே கட்டப்பட்ட குளங்களின் நீர் மட்டம் அதிகரிக்கும்போது, திட்டமிடல் இல்லாமல் அதன் நீர்மட்டம் அதிகரிக்கும் வரைக்கும் இருந்துவிட்டு திடீரென வான் கதவுகளைத் திறந்துவிட்டவுடன் எங்களுடைய மாவட்டங்கள் வெள்ளத்தால் பாதிப் படைகின்றன.

இன்று இடம்பெற்ற பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டத்தில் நானும் கலந்து கொண்டேன். அதில், எதிர்வரும் 28, 29ஆம் திகதியாகும்போது காலநிலை சீரடைந்துவிடுமென பேசப்பட்டது. 28, 29ஆம் திகதிக்குப் பிறகுதான் மட்டக்களப்பு மாவட்டத்துக்குத் தாக்கமே வரும். ஏனென்றால், இன்று பெய்யும் மழை ஊடாகக் கிடைக்கும் நீர் மட்டக்களப்புக்கு வந்துசேர 2-3 நாட்களாகும். இன்று காலையில் சனாதிபதி அவர்கள் கூட்டமொன்றை நடத்திவிட்டுப் போகிறார். அந்தக் கூட்டம் ஒரு வாரத்துக்கு முதலே நடந்திருக்க வேண்டும். அனுபவம் இல்லாத உங்களுடைய மாவட்டப் பிரதிநிதிகள் பெயருக்குப் பொறுப்பை ஏற்றிருக்கிறார்கள். அவர்கள் வெள்ளம் வரும்வரை கொழும்பில் இருப்பார்கள். வெள்ளம் வந்ததன் பின்னர், மட்டக்களப்புக்கு அல்லது வட, கிழக்குக்கு ஓடிச் செல்வதன்மூலம் அனர்த்த முகாமைத்துவத்தைச் சரியாகச் செய்ய முடியாது.

கௌரவ அமைச்சர் அவர்களே, கடந்த வருடம் பாராளுமன்றத் தேர்தல் நடைபெற்று முடிந்து சில நாட்களில் வெள்ளப்பெருக்கு ஏற்பட்டது. அப்போது நான் தனியாகச் சென்று, என்னுடைய சொந்த வாகனங்களைப் பயன்படுத்தி, அனர்த்தத்தில் சிக்குண்டிருந்த எங்களுடைய மக்களைக் காப்பாற்றி வெளியே கொண்டுவந்தேன். அந்த நேரத்தில் நாங்கள் அரசாங்கத்தைக் குற்றஞ்சாட்டவில்லை. ஏனெனில், அப்பொழுது சனாதிபதித் தேர்தல் நடைபெற்று ஒன்றரை மாதங்களும், பாராளுமன்றத் தேர்தல் முடிவடைந்து 5-6 நாட்களுமே கடந்திருந்தன. அதாவது, உங்களுக்கு அனுபவம் வருவதற்கு கொஞ்சம்காலம் தேவை. நீங்கள் ஆட்சிக்கு வந்து ஒரு வருடம் கடந்தும் இன்றும் அதே நிலைதான். இன்று சனாதிபதி அவர்கள் சொல்கிறார், பாராளுமன்ற உறுப்பினர் களுக்கு மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களை நடாத்தி முடிவு எடுக்குமாறு.

கௌரவ அமைச்சர் அவர்களே, கடந்த வருடம் வெள்ளம் ஏற்பட்டபோது, எங்களுடைய பகுதியிலுள்ள சில மக்களுக்கு இரவு உணவு இல்லாமல் இருந்தபோது, நான் அவர்களுக்கு 'நூடில்ஸ்' வாங்கிக் கொடுத்தேன். அந்த நேரத்தில்

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

எங்களுடைய மாவட்ட அபிவிருத்திக் குழுவின் தலைவராக இருந்த திருகோணமலை மாவட்டப் பாராளுமன்ற உறுப்பினரான அருண் ஹேமச்சந்திரா அவர்கள் சொன்னார், "மக்களுக்குத் தேவையானவற்றை வாங்கிக் கொடுங்கள்! அரசாங்கம் அதற்குரிய பணத்தை வழங்கும்" என்று. ஆனால், இன்றுவரை 'நூடில்ஸ்' வாங்கிக் கொடுத்ததற்குரிய பணத்தைக்கூட தரவில்லை. இருந்தாலும், இப்பொழுது வெள்ளத்தால் பாதிக்கப்பட்டுள்ள எங்களுடைய மக்களுக்கும் நாங்கள்'நூடில்ஸ்' வாங்கிக் கொடுப்போம். அதுமாத்திரமன்றி, எங்களால் முடிந்த சகல உதவிகளையும் அவர்களுக்குச் செய்வோம். அரசாங்கம் செய்யாதென எங்களுக்குத் தெரியும்! ஏன் நான் இந்த விடயத்தைக் கூறினேன் என்றால், நீங்கள் அனர்த்த நிலைக்கு முகங்கொடுப்பதற்குத் தயார் நிலையில் இல்லை என்பதற்காகத்தான்.

மிக முக்கியமாக, மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற விவசாயிகள் வெள்ளத்தால் பாதிக்கப்படப் போகின்றார்கள். இப்பொழுது பெய்கின்ற மழையால் கடுமையான வெள்ளம் ஏற்பட்டால் நிச்சயமாக அவர்களுக்குப் பாதிப்பு ஏற்படும். மட்டக்களப்பு மாவட்டத்தில் கடந்த காலங்களில் இருந்த அதே முறைமையைப் பின்பற்றுவீர்களாக இருந்தால், அங்குள்ள விவசாயிகளுக்குப் பாரிய நஷ்டம் ஏற்படும். வழமையாக என்ன செய்வார்கள் என்றால், வெள்ளம் வந்த பின்னர் காப்புறுதி நிறுவனங்களைச் சேர்ந்தவர்கள் மட்டக்களப்பு மாவட்டத்துக்கு வருகைதந்து, அவர்களுக்கு வசதியான ஓர் இடத்தைப் பார்வையிட்டு, இந்தளவுதான் பாதிப்பு ஏற்பட்டு இருக்கிறது என்று சொல்லி, வயல் நிலம் 25 சதவீதம் பாதிப்படைந்து இருந்தால் 8,000 ரூபாய் என்றும் அதற்குமேல் பாதிப்படைந்து இருந்தால் இந்தளவு தொகை என்றும் ஏதோவொரு தொகையைச் சொல்வார்கள். ஆனால், சில பிரதேசங்களில் காப்புறுதி நிறுவனங்களைச் சேர்ந்தவர்கள் எவ்வளவு நிலங்கள் பாதிப்படைந்து இருக்கின்றது என்று உள்ளே சென்று சரியாகப் பார்வையிட மாட்டார்கள். மாறாக, blanket policy ஒன்றை எடுப்பார்கள். இதனால் விவசாயிகள் கடுமையாகப் பாதிக்கப்படுவார்கள். இந்த முறையும் வெள்ளப்பெருக்கு ஏற்பட்டு இருக்கின்றது. அதற்கும் நீங்கள் தயார் நிலையில் இல்லை. அதேபோல், அனர்த்தம் நடந்திருக்கிறது. அதற்கும் தயார் நிலையில் இல்லை. குறைந்தபட்சம் வெள்ளத்தால் பாதிக்கப்படுகின்ற விவசாயிகளுக்கு நஷ்டஈட்டை வழங்குவதற்காகவேணும் நீங்கள் தயார் நிலையில் இருக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම අවසන් කරනවා.

கௌரவ அமைச்சர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்தில் மிக முக்கியமான நான்கு குளங்கள் இருக்கின்றன. அதேபோன்று, அம்பாறை மாவட்டத்தில் ஒரு குளம் இருக்கின்றது. அதைக் குளம் என்று கூறுவதைவிட, சேனாநாயக்க சமுத்திரம் என்று கூறுவது நல்லது. அதன் Right Bankஐ நீங்கள் சரியான முறையில் முகாமைத்துவம் செய்து, கஞ்சிக்குடிச்சாறு பிரதேசத்திலுள்ள ரூபஸ் குளத்துக்கு அந்த வாய்க்காலினூடாக தண்ணீரை அனுப்புவீர்களாக இருந்தால், 4,500க்கும் அதிகமான ஏக்கர் வயல் நிலங்களில் இரண்டு போகமும் செய்கை பண்ணக்கூடியதாக இருக்கும். இதை நீங்கள் கவனத்தில் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மட்டக்களப்பு மாவட்டத்திலுள்ள கண்டியனாறு குளம் தொடர்பான ஆய்வுகளைச் செய்து, நாங்கள் அறிக்கை வழங்கி இருக்கின்றோம். இந்தக் குளத்தை இந்த வருடத்துக்குள் புனரமைப்புச் செய்து தந்தால், அதிகமான வயல் நிலங்களைப் பயன்படுத்தக்கூடியதாக இருக்கும். அடுத்தது, பனிச்சங்கேணி குளம். இந்த மூன்று குளங்கள் தொடர்பிலும் நீங்கள் கவனம் செலுத்த வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

French அரசாங்கத்தின் நிதி உதவிமூலம் மட்டக்களப்பு மாவட்டத்துக்குக் கிடைத்த பாரிய நீர்ப்பாசனத் திட்டமொன்று பொருளாதார நெருக்கடி காரணமாக நிறுத்தப்பட்டது. உங்களுடைய பாராளுமன்ற உறுப்பினர்கள் தாங்கள் செய்வது போன்று காட்டுவதற்காக அந்த விடயத்தைக் கையில் எடுத்தார்கள். அதற்கு என்ன நடந்ததென்று தெரியாது. அந்த விடயத்திலும் நீங்கள் கவனம்செலுத்த வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.49]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாடளாவிய ரீதியில் மழை காரணமாக அசாதாரண சூழ்நிலை ஏற்பட்டு இருக்கின்றது. இந்த அனர்த்தத்தால் மரணித்த அனைவரினது குடும்பத்தினருக்கும் என்னுடைய ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, அம்பாறை மாவட்டத்தின் சாய்ந்தமருது பிரிவில் சபுறுதீன், தஸ்மி, அஸ்லா மெஹவில் ஆகியோர் மரணித்துள்ளார்கள். இவர்களுக்கு எல்லாம் வல்ல இறைவன் மேலான 'பிர்தௌஸ்' எனும் சுவர்க்கத்தை வழங்க வேண்டுமென நானும் எங்களுடைய கட்சியின் தலைவர் அல்ஹாஜ் ரவூப் ஹக்கீம் அவர்களும் ஏனைய பாராளுமன்ற உறுப்பினர்களும் பிரார்த்திக்கின்றோம்.

பொத்துவிலில் அக்கரைப்பற்று வீதி, பானம வீதி, லகுகல வீதி என்பன வெள்ள நீரால் நிரம்பி வழிகின்றன. Dhuvya bund - பாலம் - உடைப்பெடுக்கும் நிலையில் இருக்கின்றது. அதைப் பாதுகாப்பதற்காகப் பாடுபட்டு வருகின்ற அப்பகுதியைச்

சேர்ந்த இளைஞர்கள், உறுப்பினர்கள், பிரதேச செயலாளர், உதவித் தவிசாளர், நீர்ப்பாசனப் பொறியியலாளர், இராணுவத்தினர் ஆகியோருக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அம்பாறை மாவட்டத்தின் பல பிரதேச செயலாளர் பிரிவுகளில் 1990ஆம் ஆண்டு யுத்தம் காரணமாக செய்கை பண்ணப்படாத பல்லாயிரக்கணக்கான ஏக்கர் விவசாயக் காணிகள் 2006ஆம் ஆண்டும் 2009ஆம் ஆண்டும் வன இலாகா, வனஜீவராசிகள் திணைக்களத்தால் வர்த்தமானிமூலம் காடுகளாகவும் சிறுபற்றைக் காடுகளாகவும் பிரகடனப்படுத்தப்பட்டன. அவற்றை விடுவிக்க பல வருடங்கள் முயற்சி எடுத்தும் அவை விடுவிக்கப்படவில்லை. கடந்த அரசானது, மாவட்ட ரீதியான குழுக்களை அமைத்து காணிகளை விடுவிக்க சிபாரிசு கோரியபோது, அம்பாறை மாவட்ட அரசாங்க அதிபர் தலைமையிலான குழுவானது பொத்துவில் மற்றும் லகுகல பிரதேச செயலாளர் பிரிவுகளில் பின்வரும் அளவான காணிகளை விடுவிக்க சிபாரிசு செய்தது.

கச்சக்கொடியில் 23.25 ஹெக்டெயாரையும் ஆமவட்டு வானில் 26 ஹெக்டெயாரையும் பாய்ச்சல் ஏரியாவில் 69.30 ஹெக்டெயாரையும் தங்கப்பிள்ளை கனத்தையில் 0.3 ஹெக்டெயாரையும் வடக்குப் பிரிவில் 4.38 ஹெக்டெயாரையும் பள்ளியடியான் வீதியில் 14.5 ஹெக்டெயாரையும் வடக்குப் பிரிவில் 8.99 ஹெக்டெயாரையும் தாரும்பளையில் 275 ஹெக்டெயாரையும் றொட்டைக் குளத்தில் 327 ஹெக்டெயாரையும் செம்மணிக் குளத்தில் 8.49 ஹெக்டெயாரையும் செல்வவெளியில் 7.68 ஹெக்டெயாரையும் செல்வவெளி பகுதியில் 22.2 ஹெக்டெயாரையும் துக்கொள்ளவில் 32 ஹெக்டெயாரையும் கும்மாவெளியில் 3.36 ஹெக்டெயாரையும் வேகாமத்தில் 186 ஹெக்டெயாரையும் விடுவிக்க சிபாரிசு செய்தது. இவற்றுடன், செல்வவெளி வடக்கு, பள்ளியடிவட்டை 80 ஏக்கர், செங்காமம், சர்வோதயபுரம், ஹிஜ்ரத் நகர் போன்ற பிரிவுகளையும் மீள்பரிசீலனை செய்து, இந்த அரசானது நியமித்துள்ள புதிய குழுமூலம் விரைவாக அறிக்கையைப் பெற்று, குறித்த பிரதேச செயலகப் பிரிவு உட்பட மாவட்டத்தில், மாகாணத்தில் விடுவிக்க சிபாரிசு செய்துள்ள காணிகளை விடுவிக்க ஆவன செய்ய வேண்டுமென இந்தச் சபையைக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பள்ளியடிவட்டையில் 180 ஏக்கர் நெற்காணியில் 2016ஆம் ஆண்டு வரை செய்கை பண்ணப்பட்டு இருந்தன. 2009ஆம் ஆண்டில் அது பற்றைக்காடாகப் பிரகடனப்படுத்தப்பட்டு, 69 விவசாயிகளில் 17 பேருக்கு எதிராக வழக்குத் தாக்கல் செய்யப்பட்டுள்ளது. அரசானது, செய்கை பண்ணப்பட்டு வந்த இந்தக் காணிகளை மீள்பரிசீலனை செய்து சுமார் 80 ஏக்கர் காணியையாவது விடுவித்து அதில் விவசாயம் செய்ய அனுமதிக்க வேண்டுமென நான் இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஹெடஓயா திட்டம் ஆரம்பிக்கப்பட்டு விவசாயத்துக்கு நீர்ப்பாசனம் வழங்கப்படும் வரை அரசாங்கமானது ரதெல்ல குளத்தை விஸ்தரிக்க நடவடிக்கை எடுக்க வேண்டும். ஏனெனில், ரதெல்ல குளத்தை விஸ்தரிப்பதனால் மேலும் 4,000 ஏக்கரில் விவசாயத்தை மேற்கொள்ள முடியும். மேலும், Radella anicut, Udakavai bund என்பன வெள்ளம் காரணமாக உடைப்பெடுத்துள்ளன. இவற்றை மீளமைப்பதற்கு அரசாங்கம் ஆவன செய்ய வேண்டும். Kinniyady, Kundhanodai anicuts உடன் Siriya Road, Maruthayady Road, Kundanodai Road, Palliyadiyan Road, Jamanthurai Road, Selvavely Road, Poththana Road, Tharampola Road, Radella Roadஐயும் விரைவாகச் செப்பனிட நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அப்பகுதி விவசாயிகள் சார்பாக முஸ்தபா, ரியான் ஸுபைர், ஆரிபீன், சித்தீக், முஹிதீன் பாவா ஆகியோக்கு இச்சபையில் நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

பொத்துவில் மத்திய நீர்ப்பாசனக் காரியாலயமானது ஏழு schemesஐக் கொண்டு இயங்கி வருகின்றது. மகா போகம் 12,741 ஏக்கரிலும், சிறு போகம் 7,095 ஏக்கரிலும் செய்கை பண்ணப்பட்டு வருகின்றது. Engineering Assistant 7 பேரும் 2 படவரைஞர்களும் தேவையாக இருக்கிறார்கள். அதுமாத்திர மன்றி, பாரிய இயந்திரங்களும் இல்லாமல் உள்ளது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் பொத்துவில் விவசாயிகளின் நலன்கருதி பாரிய இயந்திரங்களை வழங்க வேண்டும் என்பதுடன், குறித்த ஆளணியினரை நியமனம் செய்வதற்கு விரைவாக நடவடிக்கை எடுக்க வேண்டுமெனவும் நான் இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன். பல்வேறு குறைபாடுகள், அசௌகரியங்களுக்கு மத்தியில் கடமைபுரிகின்ற நீர்ப்பாசனப் பொறியியலாளர் ஏ.எல். நியாஸ் அவர்களுக்கும் அவருடைய staffக்கும் என்னுடைய மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இறக்காமம் பிரதேச செயலாளர் பிரிவிலுள்ள கரும்புக் காணிகள் மற்றும் பொதுத் தேவைக்குப் பயன்படுத்தப்படுவது தவிர்ந்த ஏனைய காணிகளை நெற்செய்கை பண்ணுவதற்கு வழங்குவது குறித்து சாதகமாகப் பரிசீலிக்க வேண்டும். உழைப்புக்கேற்ற ஊதியம் இல்லை, ஆளணிப் பற்றாக்குறை, மூலப்பொருட்களைப் பெறுவதிலுள்ள தாமதம் என்பன அந்த விவசாயிகளை நெற்செய்கையின்பால் நாட்டம்கொள்ளச் செய்கின்றது. கரும்புச் செய்கையில் வருமானம் குறைவாக இருப்பதனால்தான் இந்தக் கோரிக்கை விடுக்கப்படுகின்றது.

Pottuvil Base Hospitalகுக் தேவையாகவுள்ள பொத்துவில் MPCSஇனது காணியை, மாற்றுக் காணியைப் பொருத்தமான இடத்தில் வழங்குவதன்மூலம் பெற்று, ஆதார வைத்தியசாலையின் அபிவிருத்திக்கு உதவ வேண்டுமென இந்தச் சபையைக் கேட்டுக் கொள்கின்றேன். மேலும், ஊறணி கனகர் வித்தியாலயத்தின் நீண்ட காலத் தேவையாக இருக்கின்ற மைதானத்துக்கான காணியையும், கோமாரி எம்.எம்.ரி.எம். வித்தியாலயத்துக்குத் தேவையாக இருக்கின்ற விளையாட்டு மைதானக் காணியையும் விரைவாகப் பெற்று, அவற்றை மாணவர்களின் நலன் கருதி வழங்க வேண்டுமென இந்தச் சபையில் அரசாங்கத்தைக் கேட்டுக் கொள்கின்றேன். பொத்துவிலில் Technical College, Open University Regional Centre, South Eastern Universityஇன் tourism பிரிவையும் ஆரம்பிப்பதற்கு அரச நிலத்தை அவசரமாக அடையாளப் படுத்தி வழங்க ஆவன செய்ய வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன்.

அக்கரைப்பற்று, திருக்கோவில் மக்களுக்கிடையில் ஏற்பட்டுள்ள இனமுரண்பாட்டைக் களையும் பொருட்டு, வட்டமடு காணிப் பிரச்சினையை இருதரப்பாரும் இணைந்து தீர்த்துக்கொள்ள ஒரு குழு நியமிக்கப்படல் வேண்டும் என்பதுடன், இதனை விரைவாகச் செயற்படுத்த அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன்.

அம்பாறை மாவட்டத்தின் Labour Officeஆனது கல்முனையில் வாடகைக் கட்டிடத்திலே 20 ஆண்டுகளுக்கும் மேலாக இயங்கி வருகின்றது. தற்போது, மாதாந்தம் 20,000

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

ரூபாய்க்கும் அதிகமான தொகை வாடகையாகச் செலுத்தப்படுகின்றது. இந்த officeக்கு அரச நிலம் ஒன்றை அடையாளப்படுத்தி, நிரந்தரக் கட்டிடம் ஒன்றை அமைத்துக் கொடுப்பதற்கு அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமென இந்த வேளையில் கேட்டுக் கொள்கின்றேன். பல்வேறு குறைபாடுகளுக்கு மத்தியில் அங்கு கடமைபுரிகின்ற பதில் மாவட்ட தொழில் அலுவலர் சட்டத்தரணி எம். ஸபால்தீன் அவர்களுக்கு எனது மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களத்தின் மாவட்ட பிரதிப் பணிப்பாளர்களது நியமனம் தரம்-II என்றே உள்ளது. ஏனைய சேவைகளில் தரம்-I என்றுள்ளது. இதனால் பல்வேறு சிரமங்களுக்கு மத்தியில் கடமைபுரிகின்ற தரம்-IIஇல் உள்ள பிரதிப் பணிப்பாளர்கள் பல அசௌகரியங்களுக்கு உள்ளாகின்றார்கள். அம்பாறையில் 20 காரியாலயங்களை மேற்பார்வை செய்யும் பொறுப்பு Dr. Nausath Jamaldeen அவர்களுக்கு இருக்கின்றது. அவரைப் பாராட்டுவதோடு, இவர்களுக்கான ஏனைய வசதிகளைச் செய்து கொடுக்க வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன்.

மாவட்ட ரீதியில் மேய்ச்சல் தரைப் பிரச்சினைகள் அதிகமாக இருப்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். பொத்துவிலில் 12,000க்கும் அதிகமாக கால்நடைகள் இருக்கின்றன. அவற்றுக்கான மேய்ச்சல் தரை விரைவாக ஏற்படுத்திக் கொடுக்கப்படல் வேண்டும். ஏற்கனவே கிரான் கோவை, கும்மாவெளி, உடகோவை போன்ற இடங்களில் 1,200 ஏக்கர் அடையாளப்படுத்தப்பட்டு இருக்கின்றன. அவற்றை அவசரமாக விடுவித்து வழங்க நடவடிக்கை எடுக்கப்படல் வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் உரிமம் வழங்கும் நடவடிக்கை தொடரப்பட்டு, மக்களுக்கான நிலபுல உரிமைகள் சீரமைக்கப்பட வேண்டுமெனவும் பொத்துவில் பிரதேச செயலகத்துக்கு காணி உத்தியோகத்தர் ஒருவர் விரைவாக நியமிக்கப்பட வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். பல்வேறு சிரமங்களுக்கு மத்தியில் பொத்துவிலில் கடமை புரிகின்ற veterinary surgeon கீர்த்தனாவுக்கு என்னுடைய மனமார்ந்த நன்றிகளை இந்தச் சபையில் தெரிவித்துக் கொள்கின்றேன்.

பொத்துவில் பிரிவில் இரண்டாற்றுக்கப்பு பாலம் நிர்மாணிக்கப்பட வேண்டும். இதனால் சுமார் 400 ஏக்கர் நில உரிமையாளர்கள் தங்களது போக்குவரத்து வசதிகளை இலகுபடுத்திக்கொள்ள முடியும் என்பதுடன், வீணான செலவுகளையும் குறைத்துக்கொள்ள முடியும். மேலும், மும்முனைக் குளத்தின் அணைக்கட்டானது புனர்நிர்மாணம் செய்யப்பட வேண்டும் என்பதோடு, அதற்கான gateஉம் அமைத்துக் கொடுக்கப்பட வேண்டும். இதனால் சுமார் 300 ஏக்கர் நில உரிமையாளர்கள் நன்மை அடைவார்கள். இங்கு கஷ்டப்படும் விவசாய அமைப்பைச் சேர்ந்த ரஹீம் அவர்களுக்கு எனது மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

பொத்துவில் கனகர் கிராம அலுவலர் பிரிவில் யுத்தம் காரணமாக 1990ஆம் ஆண்டு இடம்பெயர்ந்தவர்களை மீளக் குடியமர்த்துவதற்கான நடவடிக்கைகள் தற்பொழுது எடுக்கப்பட்டு வருகின்றன. குறிப்பாக, 100 குடும்பங்களுக்கு நில உரிமை வழங்குவதற்குப் பிரதேச செயலாளரால் நடவடிக்கை எடுக்கப்பட்டு வரும்போது, வீணான முறையீடு செய்யப்பட்டு இந்த நடவடிக்கை தாமதமாக்கப்படுகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
කරුණාකරලා මට තව විනාඩියක් ලබා දෙන්න.

இந்த விடயம் மீள்பரிசீலனை செய்யப்பட்டு, அம்மக்களது நிலபுல உரிமை வழங்கப்படுவதுடன், வீடு, மின்சாரம், குடிநீர், போக்குவரத்து வசதி உட்பட அடிப்படை வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்பட வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். அதற்காக கஷ்டப்படுகின்ற பார்த்தீபன், ஜெயராம், ராம்குமார் ஆகியோருக்கு இந்தச் சபையில் என்னுடைய நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். கல்முனைப் பிரிவில் நிரந்தரமான வடிகால் அமைப்பு ஏற்படுத்தப்படல் வேண்டும். இதன்மூலம் வெள்ள நீரை விரைவாக வெளியேற்ற முடியும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
තව තත්පර 30කින් මම කථාව අවසන් කරනවා.

கல்முனை பொலிஸ் நிலையமானது மாநகர சபைக்குரிய காணியிலே இயங்கி வருகின்றது. பொலிஸ் நிலையத்துக்கான நிலம் Rest House Roadஇல் இருக்கின்றது. அந்த இடத்துக்கு பொலிஸ் நிலையம் மாற்றி அமைக்கப்பட்டால், கல்முனை மாநகர சபைக்குரிய இடத்தில் வருமானத்தை ஈட்டக்கூடிய பல்வேறு திட்டங்களை மேற்கொள்ள முடியும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
අවසන් කරනවා.

நான் முகாமைத்துவ சேவை உத்தியோகத்தராக இருந்தவன் என்ற அடிப்படையில், பொத்துவில் பிரதேச செயலகப் பிரிவில் மிகவும் அக்கறையோடு செயற்பட்ட பிரதேச செயலாளர்களான எஸ்.எல்.எம். ஹஸீம், அன்வர், சேஹு இப்ராஹீம், மன்சூர், நஸீர், யூஸுப், அஸ்மி, முஸாரத், நியாஸ், தௌபீக், திரவியராஜ், சந்தருவன், நஸீல், ஆஸிக், ரஸீத், அருளம்பலம், நௌபல், அன்ஸார், பிர்னாஸ், மாலினி, ராமக்குட்டி, சச்சிதானந்தம், நவவி, மன்மதன், அபேரத்ன ஆகியோருக்கு என்னுடைய மனமார்ந்த நன்றியைத் தெரிவித்து விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රථමයෙන්ම, ආපදාවට ලක් වෙලා ඉන්න අපේ රටේ සමස්ත ජනතාවට වාගේම භවභෝග විනාශ වෙලා පීඩාවට පත් වෙලා ඉන්න අපේ ගොවි ජනතාවට මගේ කනගාටුව ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම, අපි රජයක් විධියට ඔවුන් සමඟ ඉන්නවා කියන පණිවුඩයත් ලබා දෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන කථා කරද්දී අපි අමාත්‍යාංශයක් විධියට වාගේම රජයක් විධියට ප්‍රධාන අවධානය යොමු කරලා තිබෙනවා, වාරි ක්ෂේත්‍රය පිළිබඳව. අපි 2026 අවුරුද්දට වාරි ක්ෂේත්‍රය වෙනුවෙන් රුපියල් මිලියන 77,000කට වැඩි මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව තිබෙන වාරිමාර්ගවල නඩත්තුව සහ ඒවා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මුදල් වෙන් කර තිබෙනවා වාගේම නව වාරි ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහාත් අපි අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන්ම පහළ මල්වතු ඔය ජලාශය ඉදිකිරීම අපි ආරම්භ කරලා තිබෙනවා. 2025 අවුරුද්දේ අපි ඒ සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කළා. මේ වනකොට එහි වැඩ කටයුතු සිද්ධ වෙමින් යනවා. 2026 අවුරුද්දේ තවදුරටත් ඒ වැඩ කටයුතු කරගෙන යෑම සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා.

ඊළඟට, දිගින් දිගටම මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් ඉල්ලීමක් තිබෙනවා, මුන්දෙනි ආරු ජලාශ ව්‍යාපෘතිය ආරම්භ කරන්න කියලා. අපි එහි මූලික වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ මූලික වැඩ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 50ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, අය වැය කථාවේදී ජනාධිපතිතුමා තවත් රුපියල් මිලියන 50ක් එහි මූලික වැඩ කටයුතු අවසන් කිරීම සඳහා වෙන් කළා. එමෙන්ම මුලතිව් සහ වවුනියාව දිස්ත්‍රික්කවල කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය තිබෙනවා. එහි වැඩ කටයුතු සඳහා 2026 අවුරුද්දේ අය වැයෙන් රුපියල් මිලියන 2,500ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි, මාදුරු ඔය දකුණු ඉවුරු සංවර්ධනය සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා. මේවා අලුතින් ඉදි වන අලුත් ව්‍යාපෘති.

අපි දන්නවා, යටිතල පහසුකම් දියුණු කිරීමෙන්ම පමණක් කෘෂි කර්මාන්තය දියුණු කරන්න බැහැ කියන එක. ඇළ වේලි හදන්න ඕනෑ, අලුත් ජලාශ හදන්න ඕනෑ, වතුර නැති ප්‍රදේශවලට වතුර ගෙනියන්න ඕනෑ. නමුත්, ඒ කාරණයෙන් පමණක් කෘෂි කර්මාන්තය දියුණු කරන්න බැහැ. අපේ රටේ කෘෂි කර්මාන්තයේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, සැලසුම් සහගත නැතිකම. සැලසුම්සහගත නැති නිසා අපේ ගොවියෝත් පීඩාවට පත් වෙලා ඉන්නවා; පාරිභෝගිකයෝත් පීඩාවට පත් වෙලා ඉන්නවා; රජයක් විධියට අපිත් සැලකිය යුතු මට්ටමක අවාසියක් ලබමින් සිටිනවා.

උදාහරණයක් විධියට වී ගොවියාගේ වී මිල සම්බන්ධ ප්‍රශ්නය ගත්තාම, අපි සහතික මිලක් දීලා සැලකිය යුතු මට්ටමකින් එය විසඳලා තිබුණාට, වී වෙළෙඳ පොළේ රාජ්‍ය පංගුව අරගෙන එන්න වී අලෙවි මණ්ඩලය ශක්තිමත් කරලා සැලකිය යුතු මට්ටමකට එය ගෙනැල්ලා තිබුණාට, වී ගොවීන්ට ලැබෙන ආදායම මදි බව අපි දන්නවා. ඒ වාගේම තමයි, අක්කරයකින් ලබා ගන්නා වී අස්වැන්න මදි. අපේ රටේ කෘෂි කර්මාන්තය සැලසුම්සහගත නොවීම නිසා ඇති වෙලා තිබෙන ප්‍රශ්න තමයි ඒවා. ඒ වාගේම ලූනු ගොවීන් සහ අල ගොවීන් සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති වෙන්නත් හේතුව ඒකයි.

ඒ කියන්නේ, එක පැත්තකින් ගොවීන්ගේ කෘෂි නිෂ්පාදන සඳහා නිශ්චිත මිලක් නොලැබීම, ගොවීන්ට හොඳ ආදායමක් නොලැබීම. අනෙක් පැත්තෙන්, රටක් විධියට ගත්තාම අපේ රටේ වැවෙන භෝගවල නිෂ්පාදනය අවම වෙලා තිබෙනවා. ඒ නිසා අපට පිට රටින් ගේන්න වෙලා තිබෙනවා. අපට පිට රට නිෂ්පාදන මත යැපෙන්න වෙලා තිබෙනවා. අපේ ඩොලර් ටික පිට රටට යවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ඔක්කොම සිද්ධ වෙලා තිබෙන්නේ සැලසුම් සහගත කෘෂි කර්මාන්තයක් නැති නිසායි. අපි මෙතැනට අත ගහන්න ඕනෑ. අපි රජයක් විධියට මේ සම්බන්ධයෙන් මූලික කටයුතු ආරම්භ කරලා තිබෙනවා. කෘෂි කර්මාන්තය සැලසුම්කරණය කරන්න ඕනෑ.

අපි දන්නවා, වී වගා කළාට කාලයෙන් කාලයට සම්බා අඩු වෙන බව. ඒ වාගේම කාලයෙන් කාලයට කීරි සම්බා නැති වෙනවා, තව කාලයක නාඩු වී පිළිබඳව ප්‍රශ්නයක් එනවා. ඇයි ඒ? අවුරුද්දට අවශ්‍ය නාඩු වී ප්‍රමාණය, කීරි සම්බා වී ප්‍රමාණය, සම්බා වී ප්‍රමාණය ඒ අවශ්‍ය ප්‍රමාණයෙන් වගා කෙරෙන්නේ නැහැ. සැලසුම් සහගත නැහැ. ඒ නිසා අපි එතැනට යන්න ඕනෑ. කෘෂි කර්මාන්තය සැලසුම්කරණය කරන්න ගියාම කාරණා දෙකක් තිබෙනවා. එකක් තමයි, භෝගවල නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. දෙවැනි එක තමයි, කලට වේලාවට භෝග වගා කරලා අමතර භෝග වගා කිරීම සඳහා අමතර කන්නයක් සහ අමතර කාලයක් අපි සොයාගන්න ඕනෑ. අපි වාරි ඉඩම්වල භෝග වගා කරනවා නම්, අපට ජල ගැටලුව නැහැ, අස්වැන්න වැඩියි, ගොවීන්ටත් පහසුයි, ඉඩම් කළමනාකරණයේදීත් පහසුයි. ඒ නිසා අපි හැකිතාක් දුරට අපට තිබෙන කුඹුරු ඉඩම්වලට, වාරි ඉඩම්වලට අමතර භෝග ගෙනෙන එක වාගේම අමතර කන්නයක් වගා කරන්න ඉඩපහඩු කාලය ගන්න එක කරන්න ඕනෑ. ඒක කරන්න ගියාම දැන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. කන්නයට වගා කෙරෙන්නේ නැහැ. අපි මොන සැලසුම් සකස් කළත්, අපි කොච්චර කථා කළත්, අපි පාර්ලිමේන්තුවේ කොච්චර කෑ කෝ ගැහුවත් වගා කරන්න ඕනෑ ගොවියා නේ. ගොවියා කලට වේලාවට වගා කරන්න, ගොවියා මේ කෘෂි කර්මාන්තයේ මෙහෙයවා ගන්න, ගොවියා මේ සැලසුම්වලට එකතු කරගන්න තමයි ගොවි සංවිධාන හදා තිබෙන්නේ. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ ගොවි සංවිධාන දහස් ගණනක් තිබෙනවා. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ගොවි සංවිධාන දහස් ගණනක් තිබෙනවා; 1,082ක් තිබෙනවා. ඒ වාගේම වාරි කළමනාකරණ අංශය යටතේ මහ වාරිවල ගොවි සංවිධාන තිබෙනවා. ඒ වාගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ මධ්‍ය වාරිවල ගොවි සංවිධාන තිබෙනවා. මේවා රජයේ නිල ලත්, රජයෙන් පාලනය කරන, රජයට බැඳීමක් තිබෙන, කෘෂිකර්ම අමාත්‍යාංශයට බැඳීමක් තිබෙන ආයතන. ඒ නිසා ගොවීන් එකතු කරගෙන තමයි මේ සැලැස්මට යන්න ඕනෑ. ඒ හින්දා තමයි අපේ නිලධාරින්, දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා සහභාගි වෙලා, ගොවීන් එකතු කරගෙන පෙර කන්න රැස්වීම් තියන්නේ.

පෙර කන්න රැස්වීමෙන් තීරණය කරනවා, කවදාද වගා කරන්න ඕනෑ කියලා. ඒ පණිවුඩය අරගෙන ගොවි නායකයින් සහ නිලධාරින් පේරාදෙණියේ එකතු වෙනවා. තීරණය කරනවා,

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

කවදාද වගා කරන්නේ කියලා. දැන් තිබෙන ප්‍රශ්නය තමයි දින වකවානු තීරණය කළාට ඒ දින වකවානුවලට වගා නොකිරීම. ඒ තැනට හදලා නැහැ. ඒක සැලකිය යුතු මට්ටමකින් අවධිමත් වෙලා තිබෙනවා. නිවැරදි කාලයට වගා කරන්නේ නැති නිසා අපට ස්වාභාවිකව තිබෙන පරිසර තත්ත්වයන්ගේ වාසිය ගන්න බැරි වෙලා තිබෙනවා. වැස්ස වැටෙනවා. වැස්සේ උපරිම ප්‍රයෝජනය ගන්න බැරි වෙලා තිබෙනවා, වගාවලට. උදාහරණයක් විධියට, පසුගිය ඔක්තෝබර් 15වැනි දාට ආසන්න කාලයේ හොඳටම වැස්සා. මට මතකයි, රාජාංගනය ජලාශයේ වාන් දොරටු හයක් විවෘත කළා. හැබැයි, රාජාංගනයේ ගොවියා වගා කරන්න පටන් ගන්නේ නොවැම්බර් පළමුවැනිදාට කිට්ටු වෙලා. රට පුරා ගත්තාම, වී වගා කරලා ඉවර වුණේ නොවැම්බර් 15, 16, 17, 18 වෙනකොටයි. හැබැයි මහ කන්නය වඩා හොඳ වෙන්න, මහ කන්නයේ වී වගාව ඉවර කරන්න ඕනෑ, නොවැම්බර් පළමුවැනිදා වෙනකොටවත්. එතකොට තමයි දවස් 15ක්, 20ක් පැළ ගොයමට වැස්ස වැටිලා ඒ වැස්සේ තිබෙන පෝෂක, නයිට්‍රජන් උරාගෙන ඒ පරිසර තත්ත්ව යටතේ පැළ හොඳට හැදෙන්නේ. වී වගාවේ අස්වැන්න වැඩිකර ගන්න මේක හොඳ ක්‍රමයක්. සාම්ප්‍රදායිකව අපේ පාරම්පරික ගොවියා ඒ ප්‍රයෝජනය ගත්තා. නමුත් ප්‍රධාන වශයෙන් මහා වාරි කලාපවල සහ මහවැලි කලාපවල මේ වැස්සේ ප්‍රයෝජනය ගන්නේ නැහැ. ඒ නිසා සති දෙක තුනක්, මාස භාගයක් එහාට තල්ලු වෙනවා. ඒ නිසා වෙන්නේ යල කන්නයේ වගා කරන එකත් එහාට තල්ලු වීමයි. අපට කුඹුරු ඉඩම්වල අමතර කන්නයකට යන්න කාලයක් නැති වෙනවා. ඒ නිසා මෙන්න මේක නිවැරදි කරන්න ඕනෑ. ඒ නිවැරදි කිරීම සඳහා වෙච්ච සැලැස්මට අපි අත තියලා තිබෙනවා. මෙය ඊළඟ මාස් කන්නය වෙනකොට නිවැරදි කාල වේලාවට වගා කරන තැනට අපි ගේන්න ඕනෑ.

අපි දන්නවා, අපේ රටේ ප්‍රධාන භෝගය වී කියලා. අපි කන්න දෙකක් වී වගා කරනවා. අපි වී අස්වැන්න වැඩි කළොත්, වී වගා කරන භූමිවලට අමතර භෝග ගෙන්වා ගන්න පුළුවන්. අද අපේ රටේ වී අස්වැන්න අඩුයි. අක්කරයකට බුසල් 80ක් වාගේ ප්‍රමාණයක් තමයි ගන්නේ. පසුගිය කාලයේ පොහොර සහනාධාරය වැඩි කළා. ඒ වාගේම යල කන්නයේ හොඳ වැස්සක් වැටුණා, වතුර තිබුණු නිසා අස්වැන්න වැඩි වුණා. නමුත් අස්වැන්න තව වැඩි කරගන්න පුළුවන්. අඩුම තරමින් අක්කරයකට බුසල් 100ක් දක්වාවත් අස්වැන්න වැඩි කළොත්, අපේ රටේ වී අස්වැන්න හොඳට වැඩි කරගන්න පුළුවන්. ඒ වාගේම වී වගා කරන භූමියට අමතර භෝග ගේන්න පුළුවන්.

එම නිසා අපි අනිවාර්යයෙන් අත තියන්න ඕනෑ, සැලසුම් කරන්න ඕනෑ, වී වගාවේ අස්වැන්න වැඩි කරන්න. ඒ කාරණයේදී, ගොවියා තමයි වී වගා කරන්නේ. ඒකට මහ ලොකු තාක්ෂණයක්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

වී අස්වැන්න වැඩි කිරීම සඳහා තාක්ෂණික පැකේජයක් තිබෙනවා. ඒ තාක්ෂණික පැකේජයත් එක්ක මේ කන්නයේ අපි අක්කර 50 යායවල් 500ක වී අස්වැන්න වැඩි කිරීමට අවශ්‍ය වැඩකටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒක තවත් බෝ කරන්න ඕනෑ. මේ කටයුත්තට තවත් ගොවියෝ ගන්න ඕනෑ. වී වගාවේ අස්වැන්න වැඩි කිරීම සඳහා අපි අත තබනවා වාගේම හරියටම කන්නයට වගා කිරීමට අවශ්‍ය සැලසුම හදන්නේ කොහොමද, ගොවියා එතැනට ගේන්නේ කොහොමද, ගොවියා එතැනට මෙහෙයවන්නේ කොහොමද කියන තැනට අපි සැලසුම් සකස් කරලා තිබෙනවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ ඊළඟ එන යල කන්නය, ඊළඟ එන මහ කන්නය වන විට නිවැරදි දින වකවානුවලට වගා කිරීම සඳහා අවශ්‍ය සැලැස්ම ගෙනෙන්න ඕනෑ. එතකොට තමයි අමතර කන්නයක අමතර බෝගයක් වගා කරන්න පුළුවන්, වී වගා කරන කන්න දෙකට අමතරව ගොවියාට අමතර බෝගයක් වගා කර ගන්න පුළුවන්. එතකොට තමයි වී වගාවෙන් එන ආදායමට අමතරව ගොවියාට තවත් ආදායමක් එන්නේ. එතකොට තමයි විශේෂයෙන්ම අපේ රටේ වගා කරන්න පුළුවන් ධාන්‍ය වර්ගවල අස්වැන්න වැඩි වෙන්නේත්, ඒවා පිට රටින් ගෙනෙන එක අඩු කරන්න පුළුවන් වෙන්නේත්.

ඒත් එක්කම වෙළඳ පොළ ගත්තොත්, එහි අස්ථාවර තත්ත්වයක් තිබෙනවා. එම නිසා කෘෂි කර්මාන්තය, වෙළඳ පොළ සහ කර්මාන්ත කියන අංශ එකට ගැට ගහන්න ඕනෑ. අපි දැනටමත් කෘෂිකර්ම අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය, වෙළෙඳ අමාත්‍යාංශය සමඟ එකතු වෙලා මේ සම්බන්ධව සාකච්ඡා කරලා වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. ඒ අමාත්‍යාංශ තුනේම ලේකම්වරු තිදෙනා, අමාත්‍යවරු තිදෙනා, ඒ වාගේම ඒ අමාත්‍යාංශ තුනේ මෙයට අදාළ ආයතනවල ප්‍රධානීන් එකතු වෙලා මාස කීපයකට කලින් මූලික වශයෙන් සාකච්ඡා කරලා අපි තීරණයකට ආවා, මේක එක තැනකින් පටන් ගනිමු කියලා. තෝරා ගත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කය. අපි අනුරාධපුර දිස්ත්‍රික්කයට ගියා. කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමිය එහිදී නායකත්වය ගත්තා. දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කර්මාන්ත, කෘෂි කර්මාන්ත, වෙළෙඳ කියන අමාත්‍යාංශ තුනට අදාළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිබෙන ආයතන සියල්ල එකතු කර ගෙන අපි සැලසුමක් හදන්න තීරණය කළා. ඒ කටයුතු දැන් සිද්ධ වෙමින් තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම, වෙළෙඳ සහ කර්මාන්ත කියන අංශ තුනේ ඒකාබද්ධ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලා ලබන 10වැනි දාට අපි සාකච්ඡා කරනවා. මේ තුළින් තමයි ගොවියාට තමන්ගේ නිෂ්පාදනයට හොඳ මිලක් හම්බ වෙන්නේ, ආදායම් වැඩි වෙන්නේ, කර්මාන්ත දියුණු වෙන්න ගන්නේ. එම නිසා අපි එතැනට මේ වැඩසටහන දියත් කරන්න සූදානම්. ඒ අංශ තුළින් අපි කෘෂි කර්මාන්තයේ සැලකිය යුතු මට්ටමක සංවිධානගත වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. අපි හිතනවා, මේ වැඩ පිළිවෙළ තුළින් කෘෂි කර්මාන්තයට සැලකිය යුතු දියුණුවක් අත්පත් වෙයි කියලා. 2026 අවුරුද්ද කියන්නේ මෙහි ඉදිරි දැක්මක් තිබෙන වසරක්. ඒ සඳහා අපි හොඳ අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි හිතනවා, සැලකිය යුතු මට්ටමකින් මේ වැඩකටයුතු සාර්ථක වෙයි කියලා.

බොහොම ස්තුතියි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

What is your point of Order, Hon. Member?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Presiding Member, ස්ථාවර නියෝග 27 (2) යටතේ මම මේ අවස්ථාව ගන්නේ. රටේ බොහොම දරුණු, අහිතකර කාලගුණික තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. දැන්, මේ මොහොතේ වාර්තා වුණා, මේ තත්ත්වය තවත් දවස් දෙකතුනකට

ව්‍යාප්ත වෙනවා කියලා. මේ වෙලාවේ සභාවේ ලාල් කාන්ත ඇමතිතුමාත් සිටින නිසා මම ජනාධිපතිතුමාට යෝජනාවක් කරනවා. කරුණාකරලා හදිසි තත්ත්වයක් ප්‍රකාශ කරලා ඒ තුළින් -මේ අවස්ථාවේ දේශපාලනය නොවෙයි අවශ්‍ය වන්නේ- රටේ හැම දෙනාම ආරක්ෂා කිරීමයි අවශ්‍ය වන්නේ. අපි සියලුදෙනාට එකට වැඩ කරන්න තිබෙන නිසා හදිසි තත්ත්වයක් ප්‍රකාශ කරලා ඒ තුළින් රටේ හැම කොනේම ඉන්න අයට දිය යුතු වරප්‍රසාද සහ ඔවුන්ගේ තිබෙන අවශ්‍යතා ඉටු කරන්න කියන යෝජනාව මම මේ අවස්ථාවේදී ලාල් කාන්ත ඇමතිතුමා තුළින් ජනාධිපතිතුමාට ඉදිරිපත් කරනවා. ඒක කළ යුතුයි. ඒ තුළින් tri-forces සහ පොලීසියට හැම දෙනාටම උදව් කරන්න පුළුවන් වේවි, මේ තත්ත්වය කළමනාකරණයට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.09]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව.

මම මුලින්ම මගේත්, අපේ විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු වෙනුවෙනුත් ශෝකය පළ කරනවා, මේ ඇති වෙලා තිබෙන හදිසි ආපදා තත්ත්වය නිසා විපතට පත් වූ අයට. මම හිතන විධියට, විශාල පිරිසක්, -අපි සංඛ්‍යාව හරියට දන්නේ නැති නිසා ඉලක්කම කියන්නේ නැහැ- මරණයට පත් වෙලා තිබෙනවා, ඒ වාගේම අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ අය වෙනුවෙන් අපේ පක්ෂයේ ශෝකය පළ කරනවා. ගරු රවී කරුණානායක මැතිතුමා කිව්වා වාගේම මේ ගැනත් කථා කරලා තමයි මම මගේ කථාව පටන් ගන්න හිටියේ. මේ ආපදා තත්ත්වය සාමාන්‍ය තත්ත්වයක් නොවෙයි. මේක අසාමාන්‍ය තත්ත්වයක්. මේ තත්ත්වය එක තැනකට බලපෑ කාරණයක් නොවෙයි. අපි දැක්කා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර තිබෙන ඒ තොරතුරුවල බැලුවාම අපේ රටේ සිතියම තනිකර රතු පාට වෙලා තිබුණා. ඒ කියන්නේ මේ ආපදා තත්ත්වය මුළු රටටම එක හා සමානව බලපා තිබෙනවා. සමහර තැන්වල යම් මට්ටමකින් වැඩි වීමක් තිබෙනවා. මේ ආපදා තත්ත්වය සමස්ත රටටම බලපෑ හදිසි තත්ත්වයක්. නමුත්, හදිසි තත්ත්වයක් යටතේ ඒ සම්බන්ධයෙන් රජය මැදිහත් වෙන්නේ කොහොමද, කටයුතු කරන්නේ කොහොමද කියන එක අපට පෙනෙන්නේ නැහැ.

මොකද, මේ හදිසි තත්ත්වය ඇති වෙච්ච වෙලාවේ වැඩියෙන්ම බලපෑම ඇති වෙලා තිබෙන්නේත් කෘෂි කර්මාන්තයටයි; ගොවිබිම්වලටයි. ඒක මධ්‍යම කඳුකරයේ නුවර ඉන්න අල ගොවියාගේ ඉඳන්, එළවලු ගොවියාගේ ඉඳන්, එහා පැත්තෙන් කල්පිටියේ ඉන්න, පුත්තලමේ ඉන්න ගොවියා දක්වා, රටේ සමස්ත කෘෂි කර්මාන්තයේ ප්‍රධානම භෝගය වන වී භෝගය වගා කරන සියලු කුඹුරු දක්වා පැතිරිලා තිබෙනවා. සමහර තැන්වල වගා කරලා සතියයි, දෙකයි. වගාව දවස් තුනහතරක් ජලයෙන් යට වෙලා තිබුණාට පසුව ඒ ගොවීන්ටසිදු වෙනවා නැවත අලුත් බීජ ඉසලා කුඹුරු සකස් කරන්න. සමහර තැන්වල පොහොර ගැහුවා විතරයි; ඒ පොහොර ටික දිය වෙලා ගිහින් තිබෙනවා. සමහර තැන්වල වැලි ගසාගෙන ඇවිල්ලා කුඹුරු යායවල් යට වෙලා තිබෙනවා. මේ වෙලාවේ මේ හදිසි තත්ත්වය නිසා වැඩියෙන්ම බලපෑම සිදු වෙලා තිබෙන්නේ කෘෂි කර්මාන්තයටයි කියන කාරණය මුල් කරගෙන ගරු කෘෂිකර්ම ඇමතිතුමාට අපි කියනවා, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේම ආපදා තත්ත්වයක්; හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කළ යුතුය කියලා. ත්‍රිවිධ හමුදාව, ප්‍රාදේශීය ලේකම්වරුන්, දිසාපතිවරුන්, ග්‍රාම නිලධාරින් ඇතුළු සමස්ත රාජ්‍ය යන්ත්‍රණය standby කරලා ඒ අයගේ අවධානය වෙනදාට වඩා යොමු කරවා රජය විධියට මේ ආපදාව කළමනාකරණය කරන්න අවශ්‍ය කටයුතු කරන්න.

අපි දන්නවා, මේ ආපදා තත්ත්වය නිසා දරුවන්ගේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය දවස් දෙකකට කල් ගියා කියලා. ඒක තව දවස් තුනකට හෝ හතරකට කල් යනවා කියලා ආරංචියක් තිබෙනවා. ඒ වාගේම, කඳු විශාල වශයෙන් නාය ගිහිල්ලා තිබෙනවා, මරණ ගණනාවක් වාර්තා වෙලා තිබෙනවා, පාරවල් වැහිලා තිබෙනවා, විදුලි සම්බන්ධතා බිඳ වැටිලා තිබෙනවා. ඒ නිසා මේ වෙලාවේ ඇල් මැරිලා වාගේ ඉඳලා හරියන්නේ නැහැ. මේක, පාර්ලිමේන්තුවේ ඉන්න, විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ගමට යන්න ඕනෑ වෙලාව. හැබැයි, යන්න කැබ් එකක් නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය. එහෙම නේද? දැන් මේ ගරු සභාවේ ඉන්න, පොළොන්නරුව නියෝජනය කරන නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ඉන්න ඕනෑ පොළොන්නරුවේ. එහෙම කියද්දී හිනා ගියාට සමාවෙන්න ඕනෑ. දවස් දෙකක් පාර්ලිමේන්තු රැස්වීමත් නැහැ. ඔබතුමන්ලා දැන් වහාම තමන්ගේ කාර්යභාරය සඳහා මැදිහත් වෙන්න ඕනෑ.

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)
ඔබතුමා ගිහිල්ලාද ආවේ?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම කුරුණෑගල ගිහිල්ලා ආවේ. මේ දුවගෙන ආවේ ඒකයි. මම කුරුණෑගල ගිහිල්ලා ආවේ. මම ඒ ගැන සතුටු වෙනවා. වාරියපොලින් එහාට යන්න බැහැ, යට වෙලා; දැදුරු ඔය ගලලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දුවගෙනද ආවේ?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
දුවගෙන ආවේ නැහැ. මට ජීප් එකක් තිබෙනවා. ඩබල් කැබ් එක හම්බ වෙනකල් බලාගෙන ඉන්නේ, ඒක විකුණන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක හිනා වෙන වෙලාවක් නොවෙයි නේ. ආණ්ඩුවේ ඔබතුමන්ලා මේ ආපදා තත්ත්වය හඳුනාගෙන විශේෂයෙන්ම සමස්ත රටේ කුඹුරු යායවල් යථා තත්ත්වයට පත් කරන්න කඩිනමින් කටයුතු කළ යුතුයි. මම ලාහුගලට කථා කළා, ගිරිබාවට කථා කළා, මැදිරිගිරියට, පොළොන්නරුවට කථා කළා, අනුරාධපුරේට කථා කළා. ඒ හැම තැනම කුඹුරු යට වෙලායි තිබෙන්නේ. ඒ ගොවීන්ට ඒවා නැවත වගා කරන්න වෙනවා, නැවත වී ටික ඉහින්න වෙනවා. එතකොට ඔවුන්ට බීජ අවශ්‍යයි. ඒ වාගේම, අපේ මධ්‍යම කඳුකරයේ නුවරඑළිය, වැලිමඩ ඇතුළුව එළවලු වගා කරලා තිබෙන තැන්වල, අල වගා කරලා තිබෙන තැන්වල වගාවන් සියල්ලම වාගේ -සියයට 90ක්ම- කුණු වෙලායි තිබෙන්නේ. ඒ නිසා ඒ

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ගොවීන් වෙනුවෙන් මොකක්ද කරන්න ඕනෑ කියන එක සම්බන්ධයෙන් කෘෂිකර්ම ඇමතිතුමා වහාම ක්‍රියාත්මක වෙන්න ඕනෑ, අවශ්‍ය සහනාධාර දෙන්න ඕනෑ, පොහොර ටික නැවත ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. අපි දන්නවා, "පොහොර සහනාධාරය" කියලා කිව්වාට, ඒක සහනාධාරයක් වෙන්නේ නැති බව. පොහොර ටික ගහලා, බීජ ටික විකුණන කොට තමයි සහනාධාරය හම්බ වෙන්නේ. අවශ්‍ය වෙලාවට සහනාධාරය හම්බ වෙන්නේ නැහැ. ලාල් කාන්ත ඇමතිතුමාටත් මේවාට හිනා යනවා කියලා මම දන්නවා. දැන් පොහොර ටික වතුරට ගහගෙන ගිහිල්ලා. සහනාධාරය දැන්වත් දුන්නොත් දෙවැනි පාර හරි පොහොර ටික ගහන්න පුළුවන්. ඒ නිසා ඒ ගැන දැඩි අවධානයක් යොමු කරන්න කියලා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

කෘෂිකර්මය ගැන කථා කරද්දී මම කියන්න ඕනෑ, අපේ රටේ තිබුණේ යැපුම් ආර්ථිකයක් බව. හැබැයි, නිෂ්පාදන ආර්ථිකයක් ගැන අපටත් වඩා කථා කරපු පිරිසක් තමයි මේ ආණ්ඩුව පාර්ශ්වයේ ඉස්සරහා ආසනවල ඉන්නේ. ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුද්දක් ගත වෙලාත්, අපි නම් දැක්කේ නැහැ ඔබතුමන්ලාගේ පසු ගිය අය වැයේදී නිෂ්පාදන ආර්ථිකයක් ඉලක්ක කරගෙන කථා කළ දේවල් සඳහා මුදල් යොදවා තිබෙන බවක්.

කෘෂි කර්මාන්තයේ ප්‍රධාන ප්‍රශ්නයක් තමයි වගා හානිය. අපේ දිස්ත්‍රික්කයේ නාමල් කරුණාරත්න මැතිතුමාව දකින කොටම අපට මතක් වෙනවා, වඳුරන්, රිළවුන්. එතුමා මගේ මිත්‍රයා; හොඳ ගොවියෙක්; ඉරුදෙනියාය පැත්තේ අක්කර ගණනාවක වගා කරන ගොවියෙක්. හැබැයි ඒත් වඳුරු, රිළා ප්‍රශ්නයට උත්තර හොයාගෙන නැහැ, තවම. වඳුරන් ගණන් කළා, රිළවුන් ගණන් කළා, වල් ඌරන් ගණන් කළා. සමහර සතුන් අරගෙන ගිහිල්ලා රන්දෙනිගල ජලාශයේ දූපතකටත් දැම්මා. හැබැයි, වඳුරු ප්‍රශ්නය ඉවර වෙලාත් නැහැ, අලි ප්‍රශ්නය ඉවර වෙලාත් නැහැ, රිළා ප්‍රශ්නය ඉවර වෙලාත් නැහැ; ඒ එකක්වත් ඉවර වෙලා නැහැ. ඒ වෙච්ච දේ එහෙමම තිබෙනවා. ඉතින් අපට පෙනෙනවා, මේ ප්‍රශ්නයට සැබෑ උත්තරයක් හොයා ගන්න ගත යුතු කිසිම ක්‍රියාමාර්ගයක් ආණ්ඩුව විසින් අරගෙන නැති බව. එහෙම නම්, ඒ ප්‍රශ්නය එතැනමයි කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

හාල් ගැන කථා කරද්දී කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා කියනවා අපි දැක්කා, හාල් ප්‍රශ්නයක් නැහැ කියලා. හාල් ප්‍රශ්නයක් නැත්තේ නැහැ. මොකද, වීවලට සැලකිය යුතු මිලක් ලැබුණේ නැහැ. ඒ වාගේම, වී මෝල් මාෆියාව බිඳිනවා කියලා ආපු රජය වී මෝල් මාෆියාවට යට වුණා. හාල් ඇටයක්වත් පිටරටින් ගේන්නේ නැහැ කියලා කියපු රජය පිටරටින් හාල් ගෙනාවා.

ඔබතුමන්ලාට දැන් තේරෙනවා ඇති, වේදිකාවල මයික්‍රොෆෝන පැළෙන්න මයික් ටයිසන්ලා වාගේ කෑ ගැහුවාට ඒ කියපු ඒවා ප්‍රායෝගිකව භූමියේ පැළ කරන්න බැහැ කියලා. එහෙම නම්, ඔබතුමන්ලා දැන් ඉස්සෙල්ලාම පිළිගන්න, පසුගිය වසර 76ක ශාපය ගැන, අරවා මේවා ගැන, මිනිසුන් අතර වෛරය වපුරන්න කියපු දේවල් යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් ඒවා නොවෙයි කියන එක. තමන් කියපු ඒ බොරු බයිලා යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් දේවල් නොවෙයි කියන එක පිළිගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අපනයන කෘෂිකර්ම ආර්ථිකයක් තිබෙනවා. මම මේ කථා කරන්නේ ප්‍රධාන වැවිලි භෝගවලට අමතරවයි. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අද සාකච්ඡා නොවන නිසා ප්‍රධාන වැවිලි භෝග ගැන මම කථා කරන්නේ නැහැ. අපේ රටේ අපනයන කෘෂිකර්ම ආර්ථිකයක් තිබෙනවා. අපනයන කෘෂිකර්මය තුළින් අපේ රටට ඩොලර් ගෙනෙන්න ඔබතුමන්ලා පසුගිය අවුරුද්දේ ආරම්භ කරපු වැඩ පිළිවෙළ මොකක්ද? ඒ වෙනුවෙන් මොකක් හරි ව්‍යාපෘතියක් - project එකක් - කරලා තිබෙනවාද? නැහැ. එහෙම කිසි දෙයක් කරලා නැහැ. ඔබතුමන්ලා සතුව මහවැලි ඉඩම් තිබෙනවා. ඔබතුමන්ලාට NLDB ඉඩම් තිබෙනවා. ඒ වාගේම රජයේ තවත් නොයෙක් ආයතනවල ඉඩම් තිබෙනවා. නමුත්, ඔබතුමන්ලා මොකක්ද කරලා තිබෙන ව්‍යාපෘතිය?

ඔබතුමන්ලාගේ නායකයා - රෝහණ විජේවීර මහත්මයා - සමූහ ගොවි පොළවල් කළා. ඔබතුමන්ලාටත් තිබුණා නේ, සමූහ ගොවිපොළක් කරන්න. ඒවා නේද මෙතුමන්ලා ඉස්සර කරනවා කිව්වේ, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා? සමූහ ගොවි පොළවල් ගැනයි මෙතුමන්ලා එදා කථා කළේ. අඩුම ගණනේ තිබෙන ගොවි පොළවල්වත් සාර්ථක කර ගන්න අවශ්‍ය එකදු ව්‍යාපෘතියක්වත් කළා කියලා පුළුවන් නම් ඔබතුමන්ලා මට කියන්න. එවැනි දෙයක් අපි දකින්නේ නැහැ.

මට කථා කරන්න වැඩි වෙලාවක් නැහැ. නමුත් ගරු ඇමතිතුමාත් සභාවේ ඉන්න මේ වෙලාවේ වාරිමාර්ග අමාත්‍යාංශය ගැනත් යමක් කියන්න ඕනෑ. අපි දන්නවා, ව්‍යාපෘති ගණනාවක් පෙළ ගැහිලා තිබෙන බව. ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය එකක්. මා දන්නා විධියට තවම -මේ දක්වා- විදේශ ආධාර ලැබිලා නැහැ. ඒ සඳහා ඔබතුමන්ලා කඩිනමින් කටයුතු කළොත් හොඳයි. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා අපේ රටේ මුදල්වලින් හරි ඒවා හදනවා නම් හොඳයි. නමුත්, තවම වැඩේ පටන් අරගෙන නැහැ නේ. තවම ඉබි ගමනින් නේ යන්නේ, ගරු ඇමතිතුමා. අපට වේගවත් ගමනක් පෙනෙන්නේ නැහැ. අඩුම ගණනේ වයඹ ඇළ ව්‍යාපෘතිය අවසන් කරන්න අවශ්‍ය ශක්තිය, දායකත්වය දීලා තිබෙනවාද?

පොල්පිතිගම පැත්ත -අපේ නියෝජ්‍ය ඇමතිතුමාගේ පැත්ත- සශ්‍රීක කරන්න, මීඔය සශ්‍රීක කරන්න, ඒ වාගේම අපේ වයඹ තිබෙන වැව් පද්ධතියට වතුර ටික ගෙනෙන්න වයඹ ඇළ ව්‍යාපෘතිය complete කිරීම අවශ්‍යයි. නමුත්, ඒක සිදු වෙලා නැහැ. ඒ වාගේම තවත් එවැනි ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. උමා ඔය ව්‍යාපෘතියේ අතුරු ඵලයක් විධියට බිම්තැන්නට, වෙල්ලස්සට ජලය ගෙනෙන්න සැලසුම් කළ පහළ උමා ඔය ව්‍යාපෘතිය අවුරුදු ගණනාවක් ඇදෙමින් යනවා. තවමත් ඒක අවසන් කරන්න අවශ්‍ය කටයුතු කරලා නැහැ. *[බාධා කිරීමක්]* ඒක කරලා ඉවර නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒක ප්‍රමාද වෙලායි තිබෙන්නේ. මම ගිය අවුරුදු පහේම ඔය ගැන කථා කළා. ඒක අවසන් කරලා නැහැ. ඒ ව්‍යාපෘතිය අවසන් කරන්න තිබුණු කාල පරිච්ඡේදය ගොඩක් පහු වෙලායි තිබෙන්නේ. ඔබතුමන්ලාගේ හිතවන්ත ආණ්ඩුව නේ - ගෝඨාභය මහත්මයාගේ ආණ්ඩුව නේ- මීට ඉස්සෙල්ලා තිබුණේ. ඒ කාලයේ ඒ ව්‍යාපෘතිය කෙරුණේ නැහැ. දැන් තිබෙන ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ කෙරෙන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප කථා කරන්න ඕනෑ නැඟෙනහිර පළාත ගැනත්. නැඟෙනහිර පළාත ගැන කථා කරද්දී කිව යුතු වෙනවා, හැඩ ඔය ව්‍යාපෘතිය ගැන. හැඩ ඔය ව්‍යාපෘතිය අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක්. හැඩ ඔය සංවර්ධනය කරන්න, එහි වතුර වැඩි ප්‍රමාණයක් ගොවිබිම්වලට හරවන්න අවශ්‍ය ව්‍යාපෘතියක් යෝජනා වෙලා තිබෙනවා. එය, ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක් විධියට අපි දකිනවා.

මේ විධියට කෘෂි කර්මාන්තයට වාරිමාර්ග පද්ධතිය ලබා දෙන දායකත්වය ගැන අපි අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. අපේ

රජවරුන් විසූ රජ දවසේ ඉඳන් පටන් ගත්තු වැව් පද්ධතිය, ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක මැතිතුමන්ලා පටන් ගත්තු මහා වාරි පද්ධතිය එක්ක ආපු කෘෂි කර්මාන්තයේ දියුණුවක් තමයි අදත් තිබෙන්නේ. 76 වසරක ශාපයක් ගැන ඔබතුමන්ලා කිව්වාට 1948 අපි නිදහස ලබන කොට ඒ වෙලාවේ ජීවත් වුණු ජනතාවගෙන් තුනෙන් එකකටවත් සෑහෙන ලෙස අපේ රටේ හාල් නිෂ්පාදනයක් තිබුණේ නැහැ. හැබැයි, 1948 ඉඳන් 80, 90 දශකවලට එනකොට මහවැලිය හදලා, ඒ වාගේම අනෙකුත් වාරි පද්ධති හදලා, සේනානායක සමුද්‍රය, ගල් ඔය ව්‍යාපෘතිය වාගේම අපේ ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කය වන පොළොන්නරුවේ තිබෙන සියලු වැව් පද්ධති ප්‍රතිසංස්කරණය කරලා ලබපු ඒ දියුණුවේ ප්‍රතිඵලයක් විධියට තමයි අද අපට සහලින් ස්වයං පෝෂණය වුණා කියලා කියන්න පුළුවන් වෙලා තිබෙන්නේ. හැබැයි, ඒ අතරේ හාල් ගෙනෙන්නත් වෙනවා. ඒකයි යථාර්ථය. අපට එතැනට එන්න පුළුවන් වුණේ, හාල් නිෂ්පාදනය අතින් අපි ඉදිරියට ආවේ පසුගිය අවුරුදු 76ක කාලයේ අපේ දැවැන්ත වාරි පද්ධතියේ සිදු වුණු වෙනසේ ප්‍රතිඵලයක් විධියටයි.

රජවරු වැව් හදලා තිබුණා. රජවරුන් හදපු වැව් සියල්ලක්ම වාගේ 1948 වනකොට ජරාවාස වෙලායි තිබුණේ; ප්‍රතිසංස්කරණය කරන්න අවශ්‍ය තත්ත්වයට පත් වෙලායි තිබුණේ; නටඹුන් වෙලායි තිබුණේ. ඩී.එස්. සේනානායක මැතිතුමා පටන් ගත්තු ඒ මහා කෘෂිකාර්මික විප්ලවය අපේ නායකයන් ඉස්සරහට ගෙනාපු නිසා තමයි අපට සහලින් ස්වයං පෝෂණය වෙන්න පුළුවන් වුණේ. ඒකත් අවුරුදු 76 ශාපයක්ද කියලා මම අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත්ම කාරණය වෙන්න ඕනෑ අපේ ගොවියා ආරක්ෂා කිරීමයි. අල ගොවියාගේ අල ටික නෙළන කාලය වෙනකොට ඔන්න, රටින් අල එනවා; රටින් අල ගේනවා. මේකද ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය? ලූනු ගොවියාගේ ලූනු ටික ගලවන කාලය වෙනකොට රටින් ලූනු ටික ගේනවා. මේක කළමනාකරණය කරන්න බැරිව කෘෂිකර්මය ගැන, ගොවියා ගැන කවර කථාද? මේක හරියට කළමනාකරණය කරන්න බැරි ආණ්ඩුවක් නේ, පසුගිය මාසයේ දෙකේ තිබුණේ. අපි දැක්කා නේ. ඉතිහාසයේ ප්‍රථම වතාවට දඹුල්ල ඇතුළු ආර්ථික මධ්‍යස්ථාන ගණනාවක් වහලා දැම්මා. එච්චර බලපෑම්. ඒවා දේශපාලන මැදිහත් වීම් නොවෙයි. ගොවියාට සිද්ධ වුණා පාරට එන්න. ගොවියාට සිද්ධ වුණා තමන්ගේ එළවලු ටික, අල ටික, බීජ ටික ඒ තැන්වලට ගේන්නේ නැතුව ඔවුන්ගේ පීඩනය පෙන්වන්න. එතැනට පත්වුණේ මේ ආණ්ඩුව කරපු අදක්ෂ, අසාර්ථක කළමනාකරණයේ ප්‍රතිඵලයක් නිසා. මම ඔබතුමන්ලාට කියනවා, ඊළඟ අවස්ථාවේදීවත් මේවා හරියට කළමනාකරණය කරන්න කියලා. විශේෂයෙන් වෙළඳ අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය මේ කටයුතු හරියට කළමනාකරණය කළේ නැත්නම්, ඒ දෙගොල්ලන් එකතු වුණේ නැත්නම් ඔබතුමන්ලා දන්නේ නැහැ ලූනු ගේනකම්, ඔබතුමන්ලා දන්නේ නැහැ අල ගේනකම්. අන්තිමට ඒ ගොවියාට තමයි ඒකේ බලපෑම තිබෙන්නේ. එහෙම නැතිව ඔබතුමන්ලාටවත්, අපටවත් නොවෙයි. බොහොම අමාරුවෙන් අල ටික වගා කරලා අස්වැන්න ලැබෙනකොට මිලක් නැත්නම් ඒ මිනිහාට ඒ අල වගාවෙන් වැඩක් නැහැ. ඒ මිනිහාට අල නොවෙයි කන්න වෙන්නේ වහ. ඒ වාගේම තමයි ලූනු ගොවියාටත්. ගරු කෘෂිකර්ම ඇමතිතුමනි, ඔබතුමා අනෙක් ඇමතිවරුන්ට සාපේක්ෂව යම්කිසි දෙයක් කරන්න උත්සාහ කරන ඇමතිවරයෙක්. ඒ නිසා ඔබතුමාට මේක අවබෝධ කරගන්න පුළුවන්. සමහරවිට ඔබතුමාත් පෙරළාගෙන වෙන වෙන අමාත්‍යාංශවලින් මේ ටික ගෙනාවාද දන්නේත් නැහැ. ඒ කෙසේ වෙතත්, ලබන සැරේවත් ඔබතුමා පොඩ්ඩක් පෙනේ පුප්පන්න. ඔබතුමා කන බොන මනුස්සයා නේ. පෙනේ පුප්පන්න දන්නවා. ඒ නිසා පෙනේ පුප්පලා මේ අයට කියන්න මේක කරන්න එපා, ගොවියා ආරක්ෂා කරන්න ඕනෑ කියලා. එහෙම කළොත් ඔබතුමාට අපේ රටේ ගොවියා ආරක්ෂා කරගෙන, කෘෂිකර්මාන්තය ඉදිරියට ගෙනියන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

මගේ කථාව අවසන් කරන ගමන් නැවත වතාවක් මතක් කරනවා, මේ ආපදා තත්ත්වය කළමනාකරණය කරන්න මීට වඩා රජයේ දායකත්වය, මැදිහත්වීම කරන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. KINS NELSON left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 4.23]

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැනයි අප මේ මොහොතේ කථා කරන්නේ. මේ වන විට රටේ ඇති වෙලා තිබෙන අයහපත් කාලගුණික තත්ත්වය නිසා ජීවිත හානි වාගේම දේපළ හානි සිදු වෙලා තිබෙනවා. ඒ විපතට පත් සියලු ජනතාවට අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. අද උදේ අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු, ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු, මන්ත්‍රීවරු සමඟ සාකච්ඡා කරලා රට තුළ ඇති වෙලා තිබෙන මේ ආපදා තත්ත්වයට මැදිහත් වෙන්න කටයුතු කළා. රටේ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරනවාද, නැද්ද කියන කාරණයත් පුළුල් ලෙස ඒ අවස්ථාවේ සාකච්ඡාවට බඳුන් කළා. නමුත් එහෙම නොකර තවදුරටත් ත්‍රිවිධ හමුදාව, පොලීසිය, ආපදා කළමනාකරණ කමිටුවේ නිලධාරින්, සියලු දිසාපතිවරු මේ සඳහා මැදිහත් වෙන්න ඕනෑ විධිය ගැන සාකච්ඡා කළා. හැබැයි එහෙම සාකච්ඡා කළත් විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු නින්දෙන් අවදි වුණා වාගේ පාර්ලිමේන්තුවට දුවගෙන ඇවිල්ලා එක එක දේවල් ප්‍රකාශ කරන්න පටන් අරගෙන තිබෙනවා, හරියට මේ තත්ත්වය වෙනුවෙන් ජනාධිපතිතුමා පියවර ගත්තේ නැහැ වාගේ. ඒ නිසා අපි කනගාටුව ප්‍රකාශ කරනවා, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගේ ඒ ප්‍රකාශ පිළිබඳව. රටක් අනතුරට පත් වෙලා තිබෙන මොහොතේ, ඒ පිළිබඳව බැරෑරුම් ලෙස සාකච්ඡා කරන්න ඕනෑ මොහොතේ එය විහිළුවට ලක් කිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා.

අර කථාවක් තිබෙනවා නේ, "කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බැලූ කල සඳ නැත අහසේ අමාවකයි" කියලා. විපක්ෂයට අද

[ගරු ටී.බී. සරත් මහතා]

සිද්ධ වෙලා තිබෙන්නේ ඒක. කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන සාකච්ඡා කරන්න ආවත් ඒක ගැන කියා ගන්න දෙයක් නැති වෙලා, හොයලා හොයලා සොයා ගන්න දෙයක් නැති වෙලා කණ කස්බෑවාට සිද්ධ වෙච්ච වැඩේ වෙලා.

අපි කෘෂිකර්ම අමාත්‍යාංශයට වෙන් කළ මුදල්වලින් සියයට 60කට, 65කට ආසන්න මුදලක් දැනට වියදම් කරලා තිබෙනවා. දෙසැම්බර් 31වෙනකොට සාමාන්‍යයෙන් සියයට 80ක්, 90ක් අතර මුදලක් වියදම් කරන්න පුළුවන් මට්ටමක තිබෙන්නේ. ඒ නිසා විපක්ෂය මතු කරණ සමහර කරුණු පට්ටපල් බොරු.

විපක්ෂයෙන් කියැවුණා ලංකාව අර්තාපල්වලින් ස්වයංපෝෂිත කළා කියලා. ලංකාවේ කවදාවත්ම අර්තාපල්වලින් ස්වයංපෝෂිත වෙච්ච වසරක් නැහැ. ඒ ජාතියේ බොරු තමයි කියන්නේ. චෛතිය රජ්ජුරුවන්ගෙන් පස්සේ ලොකුම බොරු කියන කණ්ඩායම බවට දැන් පත් වෙලා තිබෙන්නේ විපක්ෂය. ඒ ජාතියේ බොරු තමයි කියන්න පටන් අරගෙන තිබෙන්නේ විපක්ෂයෙන්.

වී ගොවියා, අල ගොවියා සහ බී ලූනු ගොවියා ගැන තමයි අද වැඩිපුරම කථා බහට ලක් වුණේ. කාලයක් තිස්සේ, අවුරුදු 30ක්, 40ක් තිස්සේ අපේ රටේ වී ගොවියාගේ නිෂ්පාදන සාධාරණ මිලකට විකුණා ගන්න බැරි වුණා. හැම කන්නයකදීම නිෂ්පාදන වියදම රුපියල් 100 වෙනකොට විකුණන්න වුණේ රුපියල් 80ට, 95ට. අල ගොවියාටත් එහෙමයි, බී ලූනු ගොවියාටත් එහෙමයි. පසුගිය කාලයේ, ජොන්ස්ටන් මහත්තයා ඉන්න කාලයේ බී ලූනු ගොවීන්ට රුපියල් 50ට, 60ට බී ලූනු කිලෝ එක විකුණන්න වෙලා තිබෙනකොට, රුපියල් 80ක් ගියා බී ලූනු කිලෝ එකක් නිෂ්පාදනය කරන්න. ඒ ගොවියෝ දහස් ගණනක් දඹුල්ලට ඇවිල්ලා, දඹුල්ල ඔරලෝසු කණුව වට කරගෙන රුපියල් 90ක සහතික මිලක් ඉල්ලුවා. ඒක දෙන්න අසමත් වුණා. හැබැයි අද රුපියල් 140ට ආණ්ඩුව බී ලූනු කිලෝව ගන්නකොට නිෂ්පාදන වියදම 100ට වඩා අඩුවෙන් තියලා තිබෙන්නේ. ඒ අනුව සාධාරණ මිලක් දීලා තිබෙනවා. ඒත් ගැටලු තිබෙන්න පුළුවන්.

වී ගොවියාටත් එහෙමයි. අද වී ගොවියාගේ නිෂ්පාදන වියදම රුපියල් 85ත්, 90ත් අතර තිබෙන්නේ. සමහර ප්‍රදේශවල ඊට වඩා අඩුයි. අපි ඊයේ පෙරේදා ගොවි නායකයෝ ජනාධිපති ලේකම් කාර්යාලයට කැඳවලා ගත්තු තොරතුරු අනුව සමහර ප්‍රදේශවල මේ කන්නයේ අක්කරයක අස්වැන්න කිලෝ 3,000ත් 3,500ත් අතර තිබුණේ. ඒ කිලෝ ගාණෙන් බෙදලා බලනකොට කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 78ට වඩා අඩුයි. අන්න එවැනි නිෂ්පාදන වියදමක් තිබෙනකොට තමයි රුපියල් 120ක මිලක් අපි තියලා තිබෙන්නේ. ඒ 120 මිල, රුපියල් 140-150 කරන්න විපක්ෂ නායකතුමා කථා කරනවා. රටේ එක වෙලාවක ගෝඨාභය රාජපක්ෂ මහත්තයා රසායනික පොහොර තහනම් කරලා, පොහොර මිටිය රුපියල් 40,000ට විතර වැඩි වෙලා තිබෙනකොට, ඒ අනපේක්ෂිත මොහොතේ රුපියල් 130ට, 140ට නිෂ්පාදන වියදම යනකොට වීවලට 150ක මිලක් ඉල්ලුවා තමයි. ඒ තත්ත්වය නොවෙයි දැන් තිබෙන්නේ. ඊට වඩා ගොඩක් වෙනස්. අපි වී ගොවියාට මේ වෙලාවේ මේ දීලා තිබෙන මිල අනෙකුත් වියදම් එක්ක ගත්තාම සාධාරණ නැති වෙන්න පුළුවන්. නමුත් නිෂ්පාදන වියදමට සාධාරණ මිලක් දීලා තිබෙනවා. මෙතැනින් එහාට වී ගොවියාගේ ජීවිතය නැඟිට්ටවන්න නම් අනිවාර්යයෙන් වී කිලෝ එකේ මිල වැඩි කර ගන්න නොවෙයි, නිෂ්පාදනය වැඩි කර ගන්නයි උත්සාහ ගන්න ඕනෑ. ඒ සඳහා සැලසුමක් අපි හදලා තිබෙන්නේ. 2028 වෙනකොට අපේ රටේ ගොවියාගේ අක්කරයක අස්වැන්න දැන් ලබන අස්වැන්නට වඩා එකහමාරකින් පමණ වැඩි කරන්න අදාළ සැලසුමක් ඇතුළේ අපි වගා සැලැස්මක් හදලා තිබෙන්නේ. විශේෂයෙන්ම මේ කන්නයේ අපේ රටේ වැඩි මිලක් හම්බ වෙලා තිබෙන්නේ කීරි සම්බා සඳහා. කීරි සම්බා සඳහා එහෙම වැඩි මිලක් ලැබෙන්න හේතුව වගා කරන ප්‍රමාණය අඩුවීමයි. ඒ නිසා අපි මේ අවුරුද්දේ හෙක්ටෙයාර 60,000කට වඩා කීරි සම්බා වගා කරන්න සැලසුම් කරලා තිබෙනවා.

නොවැම්බර් මාසයේ 26වෙනි දා වෙනකොට රටේ කීරි සම්බා වගා කරලා තිබෙනවා, හෙක්ටෙයාර 39,810ක. නාඩු වගා කරලා තිබෙනවා, හෙක්ටෙයාර 279,000කට ආසන්න ප්‍රමාණයක. රතු නාඩු වගා කරලා තිබෙනවා, හෙක්ටෙයාර 112,000කට ආසන්න ප්‍රමාණයක. සම්බා වගා කරලා තිබෙනවා, හෙක්ටෙයාර 32,000කට ආසන්න ප්‍රමාණයක. ඒ වාගේම රතු සම්බා වගා කරලා තිබෙනවා, හෙක්ටෙයාර 4,000 ගාණක්. කීරි සම්බා වගා කිරීම වැඩි කර ගන්න වුවමනා වෙලා තිබෙනවා, තව හෙක්ටෙයාර 12,000-15,000 අතර ප්‍රමාණයකින්. එහෙම වුණොත්, අපට මේ ඇති වෙන තත්ත්වය යම් ප්‍රමාණයකට පාලනය කරන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
මම කථාව අවසන් කරන්නම්, විනාඩියක් දෙන්න.

විශේෂයෙන්ම විපක්ෂය මතු කරපු කාරණා දෙකකට මම උත්තර දෙනවා. ගංවතුරෙන් ආපදාවට පත් වුණු ගොවි ජනතාවට වන්දි ගෙව්වේ නැහැ කියලා නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කියලා තිබුණා. ගිය දෙසැම්බර්වල දෙවතාවක් ගංවතුර ගැලුවා. ඒ දෙවතාවේදීම ගොවි ජනතාවට වන්දි ගෙවන්න මේ ආණ්ඩුව සමත් වුණා. මේ ආණ්ඩුව වන්දි ගෙව්වා. වෙන ආණ්ඩු ගංවතුරෙන් සිදු වුණු වගා හානි සඳහා, ගංවතුර ගලලා අවසන් වෙලා ඊට පස්සේ එන යල කන්නයත් පහු වුණාම තමයි වන්දි ගෙවන්නේ. *[බාධා කිරීමක්]* ඒක අමතක වෙන්න අරිනවා. හැබැයි, මේ ගමන එහෙම නොවෙයි. ඒ කන්නය තුළම දෙවතාවක් අපි වන්දි ගෙව්වා.

නාමල් රාජපක්ෂ මහත්මයා වී ගොවියා ගැන කථා කළා. අපට හිතෙනවා, මේ වේලාවේ හාල් ගෙනෙන එක ගැන නාමල් රාජපක්ෂ මහත්මයා කථා කරන්නේ ඇයි කියලා. මොකද, කීරි සම්බාවල මිල වැඩි කර ගන්න නාමල් මහත්මයාගේ පොළොන්නරුවේ මෝලට ඕනෑ වෙලා තිබෙනවා. නුගේගොඩ රැළියට වැඩිම බස් ප්‍රමාණයක් එව්වේ එයා. අන්න ඒ කීරි සම්බාවල මිල වැඩි කර ගන්න, තමන්ගේ මෝල්වල තිබෙන හාල්වල මිල වැඩි කර ගන්න තමයි මේ හාල් මාෆියාව ගැන දැන් කථා කරන්නේ. නමුත් වර්තමාන ආණ්ඩුව මේ මෝල් මාෆියාවට යට වෙන්න සූදානම් නැහැ. ඒ නිසා අපි හාල් මිල පාලනය කරන්න, හාල් ගෙන්වන්න ඕනෑ වුණොත් ගෙන්වනවා. හැබැයි, 2028 වෙනකොට සහල් ගෙන්වීම නතර කරන්න අප සතුව සැලැස්මක් තිබෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.32]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිස්ත්‍රික්කයේ යම් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. එම ප්‍රශ්න ඉදිරිපත් කිරීමට විනාඩි 8ක හෝ කාලයක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ප්‍රථමයෙන්ම, අද මේ රටේ විශේෂ ආපදාවකට ලක් වුණු ප්‍රදේශවල ජීවිතක්ෂයට පත් වුණු ඒ ආදරණීය ජනතාවගේ පවුල්වල අයටත්, ඒ වාගේම ආපදාවට පත් වූ බල ප්‍රදේශවල ඒ ජනතාවටත් මගේ ශෝකය ප්‍රකාශ කරමින්, විශේෂයෙන්ම මේ ආපදාව සමනය වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ඇත්තටම කෘෂිකර්ම අමාත්‍යාංශයත් පසුගිය කාලයේ ආපදාවට පත් වෙලා තිබුණා. වී ගොවියෝ මහ පාරට බැහැලා තිබුණා. අල ගොවියා, ලූනු ගොවියා මහ පාරට බැහැලා උද්ඝෝෂණ කරලා ඒ අයගේ අයිතිවාසිකම් රැක ගන්න කටයුතු කළා. ඒවා සමථයකට පත් වෙලා; මේ ඇමතිවරු මැදිහත් වෙලා ඒවා සමථයකට පත් කරගෙන හොඳ තත්ත්වයකට ගෙනෙන මොහොතක තමයි, ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ නැවතත් ආපදාවකට පත්වෙන ලකුණු පෙනෙන්නට තිබෙන්නේ. කෘෂිකර්මාන්තයේ සියලු වගා බිම් අද ගංවතුර ආපදාවට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම ඇළ වේලි, කුඹුරු ඔක්කෝම කඩා බිඳගෙන යන නිසා ඒ සියල්ල ආපදාවට පත් වෙනවා. ගරු ඇමතිතුමනි, ආපදාවට පත් වෙන ඒ කුඹුරු ඉඩම්වල ජනතාවට ඉදිරියේදී සහන ලබා දෙන්න කටයුතු කරන්න කියා මම ඉල්ලීමක් කරනවා.

මට වැඩි කාල වේලාවක් නැති නිසා, අපේ දිස්ත්‍රික්කයේ විශේෂ කාරණා දෙකක් ගැන සඳහන් කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඇමතිතුමාට මම ඒ කාරණාව යොමු කරන්න ඕනෑ. ඇමතිතුමා මැදිහත් වෙලා එය ඉෂ්ට කරන්න ඕනෑ කියා මම ඉල්ලා සිටිනවා. අම්බලන්තොට, ලියන්ගස්තොට සහ පුංචිහේනයාගම ග්‍රාම නිලධාරි වසම් දෙකේ පවුල් 234ක් පදිංචි වෙලා ඉන්නවා. අවුරුදු 70කට වැඩි කාලයක් ජීවත් වුණු පවුල් පරම්පරා දෙකක් ජීවත්වුණු ඒ ගම්වල ජනතාවගේ නිවාස ඉවත් කිරීමේ කටයුතු කරගෙන යනවා. ඉතින් මම ඔබතුමාට කියන්නේ මේකයි. ඒ සියලු දෙනා -පවුල් තුන්සිය ගාණම- අත්සන් කරලා ඔබතුමාට දෙන්න කියලා ලිපියක් භාරදීලා තිබෙනවා.

නැවත වතාවක් ඒවායේ මැනුම් කටයුතු කරනවා. කලින් මැනුම් කටයුතු කර තිබුණේ ජලාශ මට්ටමේ ඉඳලා අඩි 66 සීමාව තුළයි. දැන් නැවත වතාවක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අඩි 66 සීමාව ඉක්මවා මැනුම් කටයුතු කරගෙන යනවා. ඒ සීමාව ඉක්මවා එම කටයුත්ත කරගෙන යනවා. ඒ නිසා එම ප්‍රදේශයේ ජනතාව ලිඛිතව ඉල්ලීමක් කර තිබෙනවා. ඒ ප්‍රදේශයේ පවුල් 234ක් එහි විශාල ගෙවල් හදාගෙන පදිංචි වෙලා ඉන්නවා. කාපට් පාරවල්, විදුලි පද්ධති, ජල සම්බන්ධතා යනාදිය ලබා දී තිබෙනවා. පවුල් විශාල ප්‍රමාණයක් -දෙසිය ගණනක්- පදිංචි වෙලා සිටින ප්‍රදේශයක් තමයි රිදියගම ගම්මානය. එම ගොවි ජනතාව අද වනවිට එතැනින් ඉවත් කරන්න කටයුතු කරගෙන යනවා. ඒ නිසා, ගරු ඇමතිතුමා මැදිහත් වෙලා මේ සම්බන්ධව සොයා බලා ඒ අයගේ ඉල්ලීම ඉෂ්ට කරන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මෙම ලිඛිත ඉල්ලීම මම ඔබතුමාට පසුව භාර දෙන්නම්.

ඊළඟ එක තමයි, පොල් වගාව. මාතර ප්‍රදේශයේ පොල් කර්මාන්තය පවතිනවා. නමුත් එම ප්‍රදේශයේ පොල් ගස් 5,000ක් විතර රෝගයක් හැදිලා විනාශ වෙලා ගිහිල්ලා. ඒ ගස් මැරෙන බව කෘෂිකර්ම නිලධාරීන් ප්‍රකාශ කරලා තිබෙනවා. නමුත් මෙහෙම ගස් මැරෙන්න හේතුව මොකක්ද? මේ ගස් පවත්වා ගෙන යන්න කටයුතු කරන්න ඕනෑ. පොල් ගස් 5,000ක් පමණ විනාශ වෙනවා කියන්නේ, එතකොට පොල් කර්මාන්තයට මොකක්ද වෙන්නේ? ඒ, මාතර දිස්ත්‍රික්කයේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේත් ඒ තත්ත්වය උදා වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ ගැනත් සොයා බලන්නය කියලා මම ඔබතුමාගෙන් කාරුණිව ඉල්ලීමක් කරනවා.

ඊළඟට, කිරි ගොවියා ගැනත් විශේෂයෙන්ම කථා කරන්න ඕනෑ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරි ගොවියා දියුණු කරන්න ඔබතුමන්ලා ලොකු උනන්දුවකින්, උද්යෝගයකින් ලොකු මුදලක් වෙන් කර තිබෙනවා. 2025 අය වැයෙනුත් ඒ සඳහා මුදල් වෙන් කර තිබෙනවා. මේ අය වැයෙනුත් මුදල් වෙන් කර තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ රුහුණේ මී කිරි දැන් නැත්තටම නැති වී ගෙන යනවා. රුහුණේ සිටින මී ගවයින්ට ඒ ප්‍රදේශවල තෘණභූමි නැති නිසා එම කිරි ගොවීන් මොනරාගල, මා ඔය, මාදුරුඔය වැනි පැතිවල තමයි ගවයින් හදන්නේ. නමුත් දැන් වනවිට මාදුරුඔය සහ මා ඔය සිටින ගවයින් ඉවත් කර ගන්නය කියලා නියෝගයක් දීලා තිබෙනවා. නමුත් ඒ සතුන් ගෙනියන්න තැනක් නැහැ. දැන් ඒ ගවයින් ගෙන යන්න තැනක් නැති නිසා එම ගවයින් මරන්න මස් කඩවලට විකුණමින් පවතිනවා. මා ඔය දිසාපතිතුමා ඇතුළු නිලධාරීන් සාකච්ඡා කරලා එම ගවයින් ගෙන යන්න කියලා නියෝගයක් දීලා තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ කට්ටියට එම ගවයන් ගෙන යන්න තැනක් නැහැ. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ලුණුගම්වෙහෙර, කඩවර කැලෑවේ අක්කර 500ක් තෘණ භූමියකට වෙන් කර තිබෙනවා. අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේම සිටින ගොවීන් ඉල්ලන්නේ, ලුණුගම්වෙහෙර ජලාශය ඉස්මත්තේ තිබෙන අක්කර 5,000ක් වෙන් කර දෙන්න කියලා, අර අක්කර 500ත් එක්ක. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිටින සියලු ගවයින්ට එම තෘණ භූමිය සකස් කර දෙන්න කියලායි එම ගොවීන් ඉල්ලන්නේ. අවුරුද්දක් විතර යනකොට එම භූමිය සකස් කර ගන්න පුළුවන්, මේ වෙන් කර තිබෙන සල්ලිවලින්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තෘණ භූමිය සකස් කළොත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගවයින් වෙන කොහේටවත් ගෙනියන්න අවශ්‍ය නැහැ. පසුගිය කාලයේ පාර්ලිමේන්තුවටත් එම ගවහිමියන් සහ මැති ඇමතිවරුන් ගෙන්වා මා ඔය මන්ත්‍රීවරුත් ගෙන්වා සාකච්ඡා කළාම කෙළින්ම කියා තිබෙනවා, හම්බන්තොට ගවයින් හම්බන්තොටටම ගෙනියන්න කියලා. ඉතින්, හම්බන්තොට ගවයින් හම්බන්තොට දිස්ත්‍රික්කයේම තබා ගැනීම සඳහා තෘණ භූමියකට වෙන් කර තිබෙන අර අක්කර 500ට අමතරව, මොනරාගල දිස්ත්‍රික්කය හා හම්බන්තොට දිස්ත්‍රික්කය අතර ලුණුගම්වෙහෙර ජලාශය ඉහත්තාවේ තිබෙන අක්කර 5,000ක් විතර ප්‍රමාණය වෙන් කර දෙන්න කියලා මම ඇමතිතුමාගෙන් සහ රජයෙන් ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීමක්]* ඒක රජයට අයත් ප්‍රදේශයක්. මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කය අතර වැව් ඉස්මත්තේ තිබෙන්නේ. එම ඉඩම් ප්‍රමාණය වෙන්කර අවුරුද්දක විතර කාලයක් තුළ තෘණ වගා කර ගත්තා නම්, හම්බන්තොට ගවයින් කිසි තැනකට ගෙනියන්න ඕනෑ නැහැ. මොනරාගල ගෙනියන්න ඕනෑත් නැහැ, මා ඔය ගෙනියන්න ඕනෑත් නැහැ. හම්බන්තොට දිස්ත්‍රික්කයේම ගවයින් ටික හම්බන්තොට, ලුණුගම්වෙහෙර ජලාශය ඉහත්තාවේ තිබෙන ඒ තෘණ භූමියට දැම්මාම අපේ රුහුණේ මී කිරි රුහුණේම හදන්න පුළුවන්. නැත්නම් රුහුණේ මී කිරි මොනරාගල දිස්ත්‍රික්කයේ හැදුවොත් ඌවේ මී කිරි බවට පත් වෙනවා. එතකොට රුහුණේ මී

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

කිරි කියා නමත් නැති වෙනවා, ගරු ඇමතිතුමා. ඒ නිසා රුහුණේ මී කිරි කියන නම රැක ගන්න නම්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගවයින් සඳහා ඒ තෘණ භූමිය සකස් කර ලබා දෙන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා. මේ වෙන් කරපු සල්ලිවලින් ප්‍රතිපාදන ලබා දීලා ඒ වැඩ කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

කියන්න කාරණා ගොඩක් තිබුණත්, මට ලබා දී තිබෙන කාල වේලාව අවසන් නිසා ඒවා කියන්න අවස්ථාව නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් මගේ මුහුණ දිහා බලාගෙන ඉන්නවා.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ජලාශය ඉදිකර අද වනවිට අවුරුදු තිස් ගණනක් වෙනවා. දැන් ඒ ඇළ මාර්ග ඔක්කෝම ප්‍රතිසංස්කරණය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ කටයුතුත් ආරම්භ කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වාගේම අපේ දිස්ත්‍රික්කයේ ජීවත් වන ගොවි ජනතාවගේ වාරි කටයුතු, කෘෂිකර්ම කටයුතු යනාදී සෑම ක්ෂේත්‍රයක්ම දියුණු කර දෙන්න කියාත් ඉල්ලා සිටිමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.41]

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අයහපත් කාලගුණ තත්ත්වය නිසා ජීවිත හානි වුණු, ඒ වාගේම දේපළ හානි වුණු; ඒ ආපදාවට ලක් වුණු ජනතාව වෙනුවෙන් මුලින්ම මාගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ඇත්තවශයෙන්ම මේ සමහර ආපදා අපි කැඳවා ගත් ඒවා. විශේෂයෙන්ම මාතර දිස්ත්‍රික්කයේ වගා භූමි විශාල ප්‍රමාණයක් මේ වනකොට ගංවතුරට යටවෙලා තිබෙනවා. ඒ වාගේම ගෙවල් දොරවල් ඇතුළු මිනිසුන්ගේ දේපළ හානියට පත්වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි, නිල්වලා ගඟ හරස්කොට පසුගිය කාලයේ විද්‍යාත්මක නොවන ආකාරයට අනිසි ස්ථානයක ඉදිකරපු ලවණ බාධකය. ඒ නිසා ගංවතුර මුහුදට ගලාගෙන යන්නේ නැහැ. මුහුදට වතුර ගලාගෙන යන්නේ නැති නිසා නිල්වලා ගඟේ පහළ මිටියාවතේ වතුර පිරීම නිසා පවුල් විශාල ප්‍රමාණයක් ආපදාවට ලක්වෙලා තිබෙනවා. 2023 අවුරුද්ද වෙනකල් ඒ ඉදිකිරීම් කටයුතු කරද්දි නිල්වලා ගඟේ පහළ මිටියාවතේ ගොවීන්ට වගා කරන්න බැරි වුණා. ඒගොල්ලන්ගේ වගා හානිවලට වන්දි දෙන්න ඇස්තමේන්තු කරලා තිබුණා, රුපියල් මිලියන එක්දහස් දෙසිය ගණනක්. නමුත් මේ කථා කරන අය පසුගිය ආණ්ඩු කාලයේදී ඒ වන්දි ගෙව්වේ නැහැ. නමුත් 2026 අය වැයෙන් අපේ රජය ඒ රුපියල් බිලියන 1.2ක මුදල ඒ ගොවීන්ට ලබා දෙන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ සම්බන්ධව අපි මාතර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ස්තුතිවන්ත වනවා. ඒ වාගේම නිල්වලා ගඟේ ලවණ බාධකය නිසා වෙච්ච ඒ හානිය වළක්වන්න ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරලා, ඒ අවශ්‍ය කටයුතුවලට මූලික අඩිතාලම මේ රජය දමා තිබෙනවා. ඒ කාරණාවත් මම මේ වෙලාවේ සිහිපත් කරනවා.

අපි මේ වෙනකල් අහගෙන හිටියා, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් මේ අය වැය සම්බන්ධව ඉදිරිපත් කළ විවේචන. ඒ අතර සාධනීය විවේචනත් තිබුණා. අපි ඒවා භාර ගන්න කැමැතියි. නමුත් සමහර මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන සමහර විවේචන බැලුවාම අපට හිනා යනවා. සමහර මන්ත්‍රීවරුන් සඳහන් කළා, පොහොර නැහැ, සමහර භාණ්ඩවල මිල අධිකයි කියලා. එහෙම කථා කළ අයගේ බාප්පලා, ලොකු තාත්තලා ආණ්ඩු කළ කාලයේ තමයි රසායනික පොහොර නතර කරලා, මේ රටේ මිනිස්සුන්ට වගා කරන්න අවශ්‍ය වූ පොහොර ටික නැති කළේ. පොහොර වෙනුවට මාළු කුණු කරපු දියර ගෙනැල්ලා කුඹුරට ඉහලා ගොයම් බල්ලෝ කන තත්ත්වයට පත් කළ ආණ්ඩුවල හිටපු නායකයෝ තමයි අද පොහොර ගැන කථා කරන්නේ. ඒ සම්බන්ධව අවඥා සහගත හිනාවක් තමයි අපට තිබෙන්නේ.

අනෙක් කාරණය මෙයයි. සමහර ආණ්ඩු කාලවලදී සමහර රසායන ද්‍රව්‍ය, විශේෂයෙන්ම කෘෂි කර්මාන්තයට අවශ්‍ය රසායන ද්‍රව්‍ය ගෙන්වීම නතර කළා. ඒ තුළ කෘෂි කර්මාන්තය කරන්න බැරි වෙලා, ඇත්තටම ගත්තොත් පෞද්ගලික අංශයේ ආයෝජකයන් කෘෂි කර්මාන්තයෙන් ඉවත් වුණා. 2019 වාගේ කාලය වනකොට මේ රටේ කෘෂි කර්මාන්තයේ යම් කිසි ප්‍රබෝධයක් ඇතිවෙලා තිබුණා. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ආයෝජනය කරන්න විදේශ ආයෝජකයෝ, දේශීය ආයෝජකයෝ විශාල පිරිසක් ඉදිරිපත් වෙලා හිටියා. ආරක්ෂිත ගෘහ තුළ කෘෂි කර්මාන්තය කිරීමේ ලොකු නැමියාවක් ඒ කාලය තුළ තිබුණා. නමුත් ඒවා සම්පූර්ණයෙන් කඩාකප්පල් වෙලා අපි ආණ්ඩුව භාර ගන්නකොට කෘෂි කර්මාන්තයෙන් මිනිස්සු ඈත් වෙලා, වගා කරන්න පුළුවන්, නමුත් වගා නොකරන ඉඩම් විශාල ප්‍රමාණයක් තිබුණා. විශේෂයෙන්ම පසුගිය කාලයේ කැකුළු හාල් හිඟයක් ඇති වෙන්න හේතුවත් මාතර දිස්ත්‍රික්කය වාගේ කැකුළු හාල් වගා කරන දිස්ත්‍රික්කවල ඉඩම් විශාල ප්‍රමාණයක් වගා කරන්නේ නැතුව අත්හැර දැමීමයි. අපි සතුටු වනවා, අපේ රජය බලයට පත් වෙලා පළමුවැනි අය වැයෙන්ම කෘෂි කර්මාන්තයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කිරීම පිළිබඳව. ඒ, කෘෂි කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් සකස් කරලා, වගා නොකරන ඉඩම් වගා කරන්න සලස්වන්නයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ඒ වාගේම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වාගේ රජයේ ආයතන හරහා ඒ කටයුතු කරන්න අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන අපි ලබා දුන්නා. ඒ වාගේම මන්ත්‍රීවරුන්, අනෙකුත් දේශපාලන කණ්ඩායම් මැදිහත් වෙලා අවශ්‍ය පහසුකම් ලබා දීමෙන් වගා නොකළ ඉඩම් විශාල ප්‍රමාණයක් වගා කිරීම නිසා පසුගිය කන්නය වනකොට සහල් නිෂ්පාදනය විශාල ප්‍රමාණයකින් වැඩි කර ගන්න අපට පුළුවන්කම ලැබුණා.

අද ඉදිරිපත් වූ තවත් විවේචනයක් තමයි, අපට කෘෂි කර්මාන්තය සම්බන්ධව ප්‍රතිපත්තියක් නැහැ කියන එක. ඇත්තවශයෙන්ම අපේ රජය, අපේ කණ්ඩායම ප්‍රතිපත්ති හැදුවේ, ආණ්ඩු බලය තිබෙන කාලයේ නොවෙයි. මේ රටට ආදරය කරන, කෘෂි කර්මාන්තයේ කඩා වැටීම දැකපු, කම්පනයට පත් වෙච්ච විශ්වවිද්‍යාලවල, පර්යේෂණ ආයතනවල, අනෙකුත් රජයේ ආයතනවල හිටපු විවිධ වෘත්තිකයෝ, විවිධ ප්‍රවීණයෝ එකතු වෙලා තමයි මේ රටේ කෘෂි කර්මාන්තය නඟාසිටුවන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධව දීර්ඝ කාලීන සැලැස්මක් හදලා තිබෙන්නේ. ඒ සැලැස්මත් එක්ක තමයි අපේ රජය මේ කටයුතු කරගෙන යන්නේ.

ඒ ප්‍රතිපත්තිය අනුව තමයි අපේ රජය මේ කටයුතු කරගෙන යන්නේ. අපේ බලාපොරොත්තුව, අපේ සැලැස්ම මේ රටේ වගා කරන්න පුළුවන් සෑම භූමියකම අපේ රටේ නිෂ්පාදනයට, රටේ ජාතික ආදායමට යම්කිසි දායකත්වයක් දෙන නිෂ්පාදනයක් සිදු

කිරීම. ඒක කරන්න අවශ්‍යයි. එහෙම කළොත් තමයි අපේ රට සංවර්ධනය කරන්න පුළුවන් වන්නේ. විශේෂයෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න පුළුවන් වන්නේ.

අපේ රටේ අපතේ යන ශ්‍රමය කොපමණද කියලා බලන්න. විශේෂයෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සියයට 70ක් විතර වන ග්‍රාමීය ජනතාවගේ ශ්‍රමය ඵලදායී ලෙස භාවිත කරන්න පුළුවන් වන්නේ ග්‍රාමීය කෘෂි කර්මාන්තය සංවර්ධනය කළොත් විතරයි. මේ වෙනුවෙන් අපි විශාල කැපවීමක් කරලා තිබෙනවා. මේ මත පදනම් වෙලා තමයි අපි තාක්ෂණය දියුණු කරලා, කෘෂි කර්මාන්තය සංවර්ධනය කරන්න බලාපොරොත්තු වන්නේ. මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. ඇත්තවශයෙන්ම අපේ රටේ කෘෂි කර්මාන්තයේ ප්‍රබෝධයක් ඇති වුණු කාලයක් තිබුණා. විශේෂයෙන්ම වාරිමාර්ග ව්‍යාපෘති හරහා ජලාශ ඉදිකිරීමේ කටයුතු ඒ කාලයේදී සිදු වුණා. නමුත් මෑත ඉතිහාසයේ අපි දකින කාරණයක් තිබෙනවා. වුවමනාවෙන්ම කෘෂි කර්මාන්තය කඩා වට්ටලා, ආනයනය කරන ප්‍රතිපත්තියක හිටපු නිසා අපේ රටේ ජනතාව කෘෂි කර්මාන්තයෙන් ඈත් වුණා. අපට එක පාරටම මේ සැලසුම් සියල්ලම ක්‍රියාත්මක කරන්න අමාරුයි.

ඇත්තවශයෙන්ම අපේ රටේ සම්පත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ කටයුතු කිරීමේදී විශ්වවිද්‍යාලවලින්, පර්යේෂණ ආයතනවලින් අපට විශාල සහයෝගයක් ලැබෙනවා. ඒ වාගේම රටේ සිටින විවිධ වෘත්තිකයින්, ප්‍රවීණයින් විශාල පිරිසක් මේ වෙනුවෙන් අපට උපකාර කරනවා. එහෙම බලද්දී අපට හොඳ මානව සම්පතක් තිබෙනවා. මේ සියල්ල භාවිත කරලා අපට අපේ රටේ කෘෂි කර්මාන්තය අවුරුදු කිහිපයක් තුළදී හොඳ තැනකට ගේන්න පුළුවන්. ඒ සම්බන්ධව අපට ඕනෑ තරම් උදාහරණ ලබා ගන්න පුළුවන්, වෙනත් රටවලින්. අපි වාගේ හිටපු වියට්නාමය, ඊශ්‍රායලය, නෙදර්ලන්තය වාගේ රටවල් කෘෂි කර්මාන්තය අතින් දැන් තිබෙන තත්ත්වයට එන්න ලොකු පරිවර්තනයක් කරලා තිබෙනවා. ඔවුන් ඒ තත්ත්වයට ඇවිත් තිබෙන්නේ නවීන තාක්ෂණය භාවිත කරලා. අපේ රටේ තාක්ෂණයේ හිඟකමක් තිබෙනවා. නවීන තාක්ෂණය භාවිත කිරීම හරහා අපට අවශ්‍ය වන්නේ ඇත්තවශයෙන්ම කෘෂි නිෂ්පාදන වැඩිපුර ලබා ගැනීමයි. එහිදී වැඩියෙන් වියදම් කර නිෂ්පාදනය වැඩි කර ගැනීමටත් වඩා අපි බලාපොරොත්තු වන්නේ මේ ඒකක පිරිවැය අඩු කර ගැනීමටයි. අපේ අසල්වැසි රට වන ඉන්දියාවේ අර්තාපල් කිලෝ එකක, ලූනු කිලෝ එකක නිෂ්පාදන වියදම අපේ රටේ නිෂ්පාදන වියදමින් හතරෙන් එකකටත් වඩා අඩුයි. ඒ නිසා අපි මහන්සි ගන්නේ රටේ නිෂ්පාදනවල මිල වැඩි කිරීමට නොවෙයි. නවීන තාක්ෂණය භාවිත කිරීම හරහා පිරිවැය අවම කිරීමේත්, ඒ වාගේම තාක්ෂණය හරහා යෙදවුම් විද්‍යාත්මකව භාවිත කිරීමෙන් නිෂ්පාදනය වැඩි කිරීමේත්, පිරිවැය අඩු කිරීම හරහා ගොවියාගේ ලාභාන්තිකය වැඩි කිරීමේත් උත්සාහයක තමයි අපි නියැළී සිටින්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා, යම් යම් පසුබෑම්, යම් යම් කඩා වැටීම් තිබුණත්, කෙටි කාලයක් තුළ මේ රටේ කෘෂි කර්මාන්තය තුළ ඒ පෙරළිය ඇති කරන්න අපට හැකියාවක් තිබෙනවා කියලා. එම කාරණය සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.49]

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් කථා කරද්දී, පස තුළින් සිදු වන කාර්යභාරය අතිමහත් වනවා. මොකද, පස මඟින් භෝග වගාවට අතිමහත් ක්‍රියාවලියක් ඉෂ්ට වනවා. ඒ නිසා මේ පොළොව සරු වුණොත් තමයි භෝග වගාවලින් අපට වැඩි ප්‍රතිලාභයක් ලබා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ වාගේම නිසරු පසකින් ගස්වලට බරපතළ ව්‍යාධි ඇති වනවා වාගේම අපේ ජල ගෝලයට, සතුන්ට බරපතළ විනාශයන් තමයි අත්පත් වන්නේ. ඒ නිසා අපි මේ පස සම්බන්ධව සැලකිලිමත් වෙන්න ඕනෑ. මේ සම්බන්ධව රජයට වගකීමක් තිබෙනවා. පස සම්බන්ධයෙන් තිබෙන රජයේ ප්‍රතිපත්තිය තමයි, ගොවියා වගා කරද්දී ඒ පස සංරක්ෂණය කිරීම, පසේ ජීව විද්‍යාත්මක සාධක නඩත්තු කිරීම සහ ඒ සම්බන්ධයෙන් වඩාත් හොඳින් සොයා බැලීම. හැබැයි, රජයක් විධියට දීර්ඝ කාලයක පටන් භෝග සම්බන්ධයෙන් යම් යම් මැදිහත්වීම් සිද්ධ කළත්, පස සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේදී එයට ප්‍රායෝගික සහ එය විද්‍යානුකූල පදනමකින් නොවෙයි මැදිහත් වුණේ. හැබැයි, පස සංරක්ෂණය කිරීම වෙනුවෙන් ගොවීන් මැදිහත් වුණේ ඒ සම්බන්ධව සැබෑ දැනුම සහිතවයි. ඔවුන් ඒ සම්බන්ධයෙන් වෙනම සංවිධාන හදාගෙන, කාබනික පොහොර සංකල්පය, එහෙම නැත්නම් වස විස නැති එළවලු සහ පලතුරු වගාව වැනි හැඩයන්වලින් පස ආරක්ෂා කර ගන්න තනි තනිවමත්, සංවිධානාත්මකවත් මැදිහත් වෙලා තිබෙනවා.

ඒ වාගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වඩාත් හොඳ පසක් සහිතව වගා කරන්න අවශ්‍ය තාක්ෂණික පර්යේෂණ පවා සිදු කර තිබෙනවා. Good Agricultural Practices විධියට වඩාත් හොඳින් මේ පස සංවර්ධනය කරගෙන ගොවිතැන් කරන්න ඕනෑ කියලා තමයි මේ පර්යේෂණ සිදු කර තිබෙන්නේ. ජාත්‍යන්තර මට්ටමෙන් ගත්තත් අද වනකොට තිරසර කෘෂි කර්මාන්තයක්, ඒ වාගේම regenerative agriculture විධියට පස සංරක්ෂණය කරගෙන හොඳ පසක් තුළ වගා කරමින්, වඩාත් ඉහළ අස්වැන්නක් සහ අඩු යෙදුම් ප්‍රමාණයකින් වඩාත් හොඳ ප්‍රතිලාභ ලබා ගන්න තමයි සැලසුම් කර තිබෙන්නේ.

මෙන්න මේ ක්‍රියාවලිය ඉදිරියට එනකොට අපේ රට තුළ විවිධ වකවානුවලදී මේ තත්ත්වයට අවශ්‍ය උත්තර හොයනවා වෙනුවට, පසේ සැබෑ තත්ත්වය සම්බන්ධව නොසලකා වෙනත් දේශපාලනික ව්‍යාපෘති මඟින් ගෙනා කඩිනම් වැඩ පිළිවෙළක් තුළ මේ සමස්ත වැඩ පිළිවෙළම අවුල් වන තත්ත්වයක් තමයි අපට දකින්න ලැබුණේ. කොහොම නමුත්, 2024 නව රජය මඟින් ගත්ත ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් විධියට උපක්‍රම සහ උපාය මාර්ග සහිතව ගොවියා ශික්ෂණයට පත් කරමින් පස සම්බන්ධව වඩාත් මැදිහත්වීමක් කරලා තිබෙනවාය කියන එක මම සංඛ්‍යාලේඛන කිහිපයක් මඟින් ඔබතුමන්ලාට පෙන්වන්නම්.

මීට පෙර මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම කථා කරද්දී සඳහන් කළා, අස්වැන්න අඩු වෙලා තිබෙනවාය කියන කාරණය. මා ළඟ තිබෙනවා, මහ කන්නයේ සහ යල කන්නයේ අස්වැන්න පිළිබඳව 1979 අවුරුද්දේ ඉඳන් අවුරුද්දෙන් අවුරුද්ද දත්ත. ලංකා ඉතිහාසයේ යල කන්නයේ වැඩිම අස්වැන්න වන මෙට්‍රික්ටොන් මිලියන 2.2ක ප්‍රමාණයක් 2025 වර්ෂයේදී ලබා ගන්න සමත් වෙලා තිබෙනවා. මේ දැන් යන්නේ 2025 මහ කන්නය. යල කන්නයේදී තමයි මෙට්‍රික්ටොන් මිලියන 2.2ක ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබෙන්නේ. දැන් අපට ප්‍රශ්නයක් එනවා, පොහොර භාවිතය වැඩි වුණාද, නැද්ද කියන එක සම්බන්ධයෙන්.

[ගරු අසෝක සපුමල් රන්වල මහතා]

විද්‍යාත්මකව හිතුවොත් පොහොර භාවිතය වැඩි වෙලා තමයි. අපි ඉගෙන ගෙන තිබෙන විධියට පොහොර භාවිතය වැඩි වෙලා තමයි අස්වැන්න වැඩි කරගෙන තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ලෝකයේ ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි, අද වනකොට පාරම්පරික පොහොර බවට කෘත්‍රිම රසායනික පොහොර පත් වෙලා තිබීම. ඒවා traditional synthetic chemicals කියලා තමයි දැන් හඳුන්වන්නේ. යූරියා, TSP හා MOP කියන පොහොර වර්ග පාරම්පරික පොහොර දමන ක්‍රමවේදයටම අද වනකොට ගොවීන් විසින් අතිවිශාල ප්‍රමාණයෙන් යොදනවා. ගොවීන්ට පොහොර සහනාධාරයත් ලැබුණොත් මේ තත්ත්වය තවත් උත්සන්න වෙනවා. හැබැයි, අද වනකොට ගොවියා ශික්ෂණය වෙලා තිබෙනවා.

පොහොර සහනාධාරය ලෙස හෙක්ටෙයාරයකට ලැබුණු රුපියල් 15,000ක මුදල මෙම රජයෙන් රුපියල් 25,000 දක්වා වැඩි කළා. ගොවීන් එම ප්‍රතිලාභය අරගෙන, තවත් වියදම් දරාගෙන අර ප්‍රතිලාභයත් ඒකට සම්මිශ්‍රණය කරමින් වගා කළත් අද වනකොට පොහොර භාවිතය ක්‍රමානුකූලව අඩු වෙලා තිබෙනවා. පොහොර භාවිතය අඩු වෙලා කොහොමද අස්වැන්න වැඩි කර ගත්තේ? ඒ සඳහා ගොවියා විවිධ අත්හදා බැලීම් කරලා තිබෙනවා. තමන්ගේ ගොවි බිම් ආශ්‍රිතව regenerative agricultureවලට යනකොට improved varietiesවලට පරිවර්තනය වුණා වාගේම පාරම්පරික ගොවියා අද improved fertilizer අත්හදා බලන්නත් පෙලඹිලා තිබෙනවා. යූරියා දාන ප්‍රමාණය අඩු කරමින්, පස සංවර්ධනය කරමින්, නැවත සම්පාදනය කළ compound fertilizerවලට ගොවීන් මාරු වෙලා තිබෙනවා. Fourth generation එකේ පොහොර හොයාගෙන, ඒවා මිලට අරගෙන වැඩි අස්වැන්නක් අත්පත් කර ගන්න විධියට ඔවුන් සංවර්ධනය වෙලා තිබෙනවා. මම ඒ ගැන පොඩි උදාහරණයක් කියන්නම්. පොහොර සහනාධාරය නොලැබුණු කණ්ඩායමක් තමයි, උඩරට එළවලු ගොවියා. හැබැයි, උඩරට එළවලු ගොවියා තමන්ගේ වගා බිම් හදද්දී පර්චස් 20කට ගොම ට්‍රැක්ටර් 5ක් විතර දමා ගන්නවා. ඒ වාගේම ඔහු යූරියා, MOP, TSP භාවිතයෙන් අයින් වෙලා. ඒවා ඔවුන්ට පාරම්පරික රසායනික පොහොර වෙලා. ඔවුන් improved fertilizer - නව පොහොර - භාවිතයන්වලට මාරු වෙලා තිබෙනවා. පසත් සශ්‍රීක කරගෙන ඔවුන් හොඳ අස්වැන්නක් ගන්නවා. මෙන්න මේ ක්‍රමයම භාවිත කරමින් අපේ ගොවියා 2024 අවුරුද්දේ ඉඳන් ආරම්භ කරලා තිබෙනවා, අඩු පොහොර භාවිතයකින් වැඩි අස්වැන්නක් ගන්න අත්හදා බැලීම් කරන්න. ඒකේ ප්‍රතිඵලය තමයි මම මේ ඔබට කිව්වේ. එම සංඛ්‍යාලේඛන ටිකත් මා ඔබට ඉදිරිපත් කරන්නම්. 2017, 2018, 2019 සහ 2020දී තමයි සාමාන්‍ය ආකාරයෙන් රටේ පොහොර භාවිතය තිබුණේ. ලංකාවට 2017දී පොහොර මෙට්‍රික්ටොන් 667,000ක ප්‍රමාණයකුත්, 2018දී මෙට්‍රික්ටොන් 1,213,000කුත්, 2019දී මෙට්‍රික්ටොන් 723,000කුත්, 2020දී මෙට්‍රික්ටොන් 940,000කුත් ගෙන්වලා තිබෙනවා. එම ප්‍රමාණ අවුරුදු හතරෙන් බෙදුවාට පසුව සාමාන්‍ය අගය මෙට්‍රික්ටොන් 880,000යි. ඒ පොහොර ප්‍රමාණය තමයි අවුරුද්දක් තුළ අපේ මේ පොළොවට හෙළා තිබෙන්නේ. ගෙන්වන පොහොර ප්‍රමාණය ක්‍රමානුකූලව අඩු වුණු ආකාරයත් මම ඔබට පෙන්වන්නම්. 2023දී ගෙන්වූ පොහොර ප්‍රමාණය මෙට්‍රික්ටොන් 750,000 දක්වා අඩු වුණා.

2024දී මේ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 540,000කට අඩු වුණා. ලංකා ඉතිහාසය තුළ වැඩිම අස්වැන්නක් ගත්ත 2025 යල කන්නයේදී මේ පොහොර ප්‍රමාණය අඩුවෙලා තිබෙනවා, මෙට්‍රික් ටොන් 421,000කට. එය සියයට 46ක පොහොර භාවිතය අඩුවීමක්; විස්මිත අඩුවීමක්. මොකද, අපේ ගොවියා දැන් තමන්ගේ ගොවි බිම තුළ පරීක්ෂණ කරමින් ඉන්නවා. මම ඉදිරිපත් කරපු මේ සෑම සංඛ්‍යා ලේඛනයක්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ agriculture statistics, දත්ත මත, මහා භාණ්ඩාගාරයේ තිබෙන දත්ත මත සහ මහ බැංකු වාර්තා මත තමයි ඉදිරිපත් කළේ. මේ වාර්තා මම සභාගත කරන්නම්. මොකද, මේ වාර්තා ඉතාම වටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම මේ ඉදිරිපත් කරන සංඛ්‍යාලේඛනය ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලයේ Marketing Development Funds - MDF - මඟින් ගොවියා ආශ්‍රිතව ඉදිරිපත් කරපු සංඛ්‍යාලේඛනයක්. 2023 මහ කන්නයේදී තැන් කිහිපයක පමණක් improved fertilizer භාවිත කිරීමේ සිතියම තමයි මේ තිබෙන්නේ. ඔක්කොම ගත්තොත්, තැන් 6කට, 8කට අඩුයි. 2024 අවුරුද්දේ යල කන්නය වෙනකොට ඒක තැන් එකසිය ගණනකට ව්‍යාප්ත වෙලා තිබෙනවා. අපි කැමැති වුණත්, අකැමැති වුණත් අද අපේ රටේ ගොවියා improved fertilizer අත්හදා බලමින් ඉන්නවා වාගේම එය ව්‍යාප්ත වෙමින් ද පවතිනවා. එක්දහස් නවසිය පනස් ගණන්වල, හැට ගණන්වල අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පාරම්පරික බීජ පැත්තකට දමා improved varieties විධියට නව ප්‍රභේද හඳුන්වා දුන් විධියටම අපේ කෘෂි කර්මාන්තය තුළ මේ වනකොට විප්ලවයක් සිදු වෙමින් පවතිනවා. පස හදාගෙන වගා කරන්නේ කොහොමද, අඩු කෘෂිකාර්මික යෙදවුම් යොදන්නේ කොහොමද, වැඩි තාක්ෂණය භාවිත කරන්නේ කොහොමද කියලා ගොවියා සොයා බලනවා. ඔවුන්ට ලැබුණු මුදල කළමනාකරණය කරගෙන ඔවුන් මෙතැනට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා වැඩිම අස්වැන්න වාර්තා කරලා, අඩුවෙන්ම පොහොර භාවිත කරන්න මේ රජය ගත්ත ප්‍රතිපත්තිමය තීරණ ඒකට ඉවහල් වුණාය කියලා අපි විශ්වාස කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම අපි දන්නවා, මේ ක්‍රියාවලිය තුළ ඉස්සරහට යද්දී අපේ පස සාරවත් වෙනවාය කියන්නේ මේ පරිසරය වඩාත් හොඳින් රකිනවාය කියන එක බව. අපි වගා කරන දේ අපට කන්න බැරි නම් මොකටද වගා කරන්නේ? අපේ ශරීරය සුවපත් වෙන්න ඕනෑ වාගේම අපේ පසත් සුවපත් වෙන්න ඕනෑ. අන්න ඒ ක්‍රමවේදයට මේ improved fertilizer යොදා ගනිමින්, පොහොර භාවිතය අඩු කරමින් නීරෝගී පසක් ලබාගෙන, පසේ සිටින ජීවීන් රැකගෙන, සමස්ත ජීවී පද්ධතියත්, ජල පද්ධතියත් සුරක්ෂිත කරන ක්‍රමවේදයකට 2030 දක්වා යන ගමන් මාර්ගයකදී තමයි 2026 අය වැයට මේ යෝජනාව සම්බන්ධව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ සම්බන්ධව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.59]

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව අද උදෑසන සිටම ගරු පක්ෂ, විපක්ෂ මන්ත්‍රීතුමන්ලා විශාල වශයෙන් කථා කළා. 2025 වසරේ මේ සඳහා වැය ශීර්ෂ වශයෙන් රුපියල් මිලියන 208,722ක් වෙන් කර තිබෙනවා. 2026 වර්ෂයේ රුපියල් මිලියන 225,000ක් වෙන් කර තිබෙනවා. එය විශාල මුදලක්.

අපේ රටේ කෘෂි කර්මාන්තය සම්බන්ධව කථා කළොත්, අපි දන්නවා සියයට 75ක් පමණ ඉන්නේ කෘෂි කර්මාන්තය ඇතුළු විවිධ අංශවල යෙදෙන අය බව; වී, පලතුරු, එළවලු, එහෙම නැත්නම් විවිධ භෝග වර්ග වගා කරලා ජීවත් වන අය තමයි ඉන්නේ. අපි දැක්කා, පසුගිය වසර තුළ ගොවියාට විශාල වශයෙන් අසාධාරණකම් රාශියක් සිද්ධ වනවා. ආණ්ඩුවක් වශයෙන් ගොවියා දෙස බැලුවේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා, 2026 වසරේදී ඒ ගොවීන්ට සාධාරණය ඉටු වෙයි කියලා. මොකද, පසුගිය දවස්වල බී ලූනු වගා කරන ගොවියා බී ලූනු ටික ගලවන්න ඔන්න මෙන්න කියලා තිබියදී මේ රටට බී ලූනු ආනයනය කළ බව අපි දැක්කා. අල ගොවියාටත් ඒ දෙයම වුණා. බඩ ඉරිඟු ගොවියාටත් ඒ දෙයම වුණා. එළවලු ගොවියාට නිසි මිලක් ලබා ගන්න නොහැකි වුණා. අපි දන්නවා, එළවලු වගා කිරීමේදී එලදාව ගන්න අනිවාර්යයෙන් මාස 3ක් දුක් විඳින්න ඕනෑ, කෘෂි රසායන යොදන්න ඕනෑ, බීජ මිලදී ගන්න ඕනෑ බව. ඒ වාගේ විශාල වියදමක් දරලා ගොවියා ඒ එළවලු ටික, පලතුරු ටික වෙළෙඳ පොළට ගෙන ගියාට පසු ඔහුට නිසි මිලක් ලැබෙන්නේත් නැහැ.

මේ වෙනකොට ඇඹිලිපිටියේ කෙසෙල් ගොවියාට ඇඹුල් කෙසෙල් කිලෝවට රුපියල් 30යි ලැබෙන්නේ. කෝලිකුට්ටු කිලෝවට රුපියල් 90යි ලැබෙන්නේ. ඒ ගොවියා අවුරුද්දක් බලාගෙන ඉන්න ඕනෑ කෙසෙල් කැනක් කපන්න. ඒ කෙසෙල් කැන වනසතුන්ගෙන්, විවිධ කෘමීන්ගෙන් ආරක්ෂා කර ගෙන තමයි වෙළඳ පොළට ගෙන එන්න ඕනෑ. ඉතින් අපි දකිනවා ඒ ගොවියාට ලැබෙන මුදල එවැනි මුදලක් වුණාට පාරිභෝගිකයාට ඒවා මිලදී ගන්න වෙන්නේ ඉතා අධික මිලකට බව. ඊයේ මම බැලුවා, කොළඹ කෙසෙල් කිලෝවක් රුපියල් 130කට විතර විකිණෙන්නේ. ගොවියාගෙන් රුපියල් 30ට ගන්න කෙසෙල් කිලෝව කොළඹට ගෙනාවාම පාරිභෝගිකයාට ලබා ගන්න වෙන්නේ රුපියල් 130කට. එතකොට ගොවියාට ලැබෙන්නේ රුපියල් 30යි, පාරිභෝගිකයාට විකුණන්නේ 130ටයි. මෙතැනදී විශාල මුදලක් අතරමැදියකු ලබා ගන්නවා. ඉතින් මේ සඳහා විශේෂ අවධානයක් යොමු කරන්න. මොකද, ගොවියාට ඒ මුදල ලැබෙන්නෙත් නැහැ, පාරිභෝගිකයාට මිල අඩුවෙන් ලැබෙන්නෙත් නැහැ. නමුත් ගොවියාට ඒවා වගා කරන්න විශාල කාලයක් යනවා. සෑම දෙයක්ම එහෙමයි. එළවලුත් එහෙමයි. එළවලු, පලතුරු හැම දෙයක්ම, හැම භාණ්ඩයක්ම විකුණන කොට ගොවියාට ලැබෙන්නේ ඉතා සුළු මුදලක්. නමුත් පාරිභෝගිකයාට ඉතාම ඉහළ මිලකට තමයි මිලදී ගන්න වෙන්නේ. අතරමැදියන් තමයි මෙයින් විශාල මුදලක් හම්බ කරන්නේ. මේ ගැන විශේෂ අවධානය යොමු කරන්න කියලා මම මේ වෙලාවේ ගරු කෘෂිකර්ම ඇමතිතුමාගෙනුත්, නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා.

අපේ රටේ කෘෂිකර්මාන්තය දියුණු කරන්න හැම රජයක්ම විශාල උත්සාහයක් ගත්තා. ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ සිට වැව් අමුණු හදලා, සේනානායක සමුද්‍රය හදලා විශාල වැඩ කොටසක් කළා. ඩඩ්ලි සේනානායක මැතිතුමා ඇළ වේලි හැදුවා; වැව් අමුණු හැදුවා. මේ රට සහලින් ස්වයංපෝෂිත කළා. එතුමාව එදා "බත් දුන් පියා" ලෙසයි හැඳින්වූයේ. ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මහවැලිය ආරම්භ කරලා, පංච මහා ජලාශ හදලා මේ රටේ කෘෂි කර්මාන්තය විශාල සංවර්ධනයක් කරා ගෙනාවා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමන්ලා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය, මහින්ද රාජපක්ෂ මැතිතුමාත් විශාල කාර්යභාරයක් කළා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් අවසානයේදී මොරගහකන්ද ජලාශය වාගේ විශාල ජලාශයක් ඉදි කරන්න කටයුතු කළා. මේ වාගේ වැව් අමුණු ඉදිකරලා මේ රටේ ගොවියා ශක්තිමත් කරන්න, මේ රටේ ජනතාවට අවශ්‍ය කරන ආහාරපාන ලබා ගන්න හැකිවන පරිදි කෘෂිකර්මාන්තය දියුණු කරන්න සෑම රජයක්ම විශාල වෙහෙස මහන්සියක් ගත්තා. ඔබතුමන්ලා කිව්වේ "76 වසරක ශාපය" කියලා. ඉතින් 76 වසරක ශාපය කියලා කියපු කාලය තුළ තමයි ඒ සියලු දේවල් වුණේ. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අවුරුද්දක් වෙනවා. තව ඉස්සරහට අවුරුදු හතරයි තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් තුළ මේ රටේ කෘෂිකර්මාන්තය වෙනුවෙන් ලොකු වැව් ඉදිවෙයි, ඇළ වේලි හැදෙයි, ඒ වාගේම ගොවියාට අවශ්‍ය කරන භාණ්ඩ, ගොවි නිෂ්පාදන අළෙවි කර ගන්න හැකි වන ආකාරයට යම් වැඩ පිළිවෙළක් සකස් කරයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව කාරණයක් සඳහන් කරන්න ඕනෑ. මම මීට ඉස්සෙල්ලාත් මේ ගැන කථා කළා. ගරු ඇමතිතුමනි, අද පාරිභෝගිකයාට ලබා ගන්න වෙලා තිබෙන්නේ වස විස සහිත පලතුරු. විශේෂයෙන්ම කෙසෙල්, ගස්ලබු ඇතුළු පලතුරුවලට රසායනික ද්‍රව්‍ය යොදලා ඉදවනවා. අපි දන්නවා ඇඹිලිපිටියේ කෙසෙල් කැන් ඇඹිලිපිටියෙන් ලොරියට පටවන්නේ ඒ රසායනික ද්‍රව්‍ය යොදලා බව. කොළඹට එනකොට ඒවා ඉදිලා. ගස්ලබුවලටත් එහෙමයි. ගස්ලබු ගෙඩිය පැහෙන්න ඉස්සෙල්ලා ගහෙන් කඩලා රසායනික ද්‍රව්‍ය -කෙමිකල් - යොදලා තමයි ඉදවන්නේ. ඉතින් මේ තත්ත්වය උඩ පලතුරු වැඩි දවසක් තියා ගන්නත් බැහැ. දවස් දෙකක් හෝ තුනක් තමයි තියා ගන්න පුළුවන්. විනාශ වෙලා යනවා. එතකොට අපේ රටේ නිෂ්පාදනය කරන පලතුරු විශාල ප්‍රමාණයක් විනාශ වෙලා යනවා. මම හිතන විදියට, සියයට 50ක්වත් පරිභෝජනයට ගන්න හම්බ වෙන්නේ නැහැ. වැඩි මිලට ගන්නවා වගේම පාරිභෝගිකයාට ලැබෙන්නේ වස විස. මේ පිළිබඳවත් විශේෂ අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

කෘෂි කර්මාන්තයෙන් වාගේම කුරුඳු, ගම්මිරිස් ඇතුළු සුළු අපනයන භෝගවලින් අපිට විශාල අපනයන ආදායමක් ලැබෙනවා. ඉතින් මේවායින් අපනයන ආදායමක් ලැබෙනවා වාගේම අපි දන්නවා මේ වෙනකොට අපේ රටේ ගම්මිරිස් විශාල ප්‍රමාණයක් ඉන්දියාවට තමයි අපනයනය කරන්නේ කියලා. මීට පෙර ගම්මිරිස් ඇට කුඩු කරලා තමයි පරිභෝජනයට ගත්තේ. මේ වෙනකොට ගම්මිරිස්වලින් oil නිෂ්පාදනය කරනවා. ඉතින් අපේ රටේ තිබෙන සියලුම ගම්මිරිස් ඉන්දියාවට තමයි යන්නේ. අපේ රටේ oil නිෂ්පාදනය කරන ඒ plant එකක් නැහැ.

ඒ නිසා ඒ සියලු මුදල් යන්නේ ඉන්දියාවට. එම නිසා මම මේ අවස්ථාවේදී කෘෂිකර්ම ඇමතිතුමාට යෝජනාවක් කරනවා. පසුගිය ආණ්ඩුවෙනුත් ඒක මේ රටේ ඉදිකරන්න උත්සාහ කළා. ඒත් හරි ගියේ නැහැ. ලා ගම්මිරිස් කඩලා අපේ රට තුළදීම ඒවායින් oil අරගෙන, ඒ oil අපනයනය කිරීම සඳහා කටයුතු කළොත් අපේ ගොවියාගේ ගම්මිරිස්වලට ඉහළ මිලක් ලබා ගන්න අවස්ථාව ලැබෙනවා. මේ වනකොට ගම්මිරිස් එලදාව ලැබෙනවා. මම ඉන්න රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න, ගොඩකවෙල, බලන්ගොඩ වාගේ ප්‍රදේශවල මේ වනකොට අස්වැන්න හට ගනිමින් තිබෙන්නේ. අප්‍රේල් මාසය වනකොට තමයි ගම්මිරිස් නිෂ්පාදනය එළියට එන්නේ. එහිදී ගොවියාට උපරිම මිලක් ලබා ගැනීමට එම oil plant එකක් ලංකාවේ ස්ථාපනය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. වී ගොවියාටත් සාධාරණය ඉටු විය යුතුයි. වී ගබඩා කරන්න පසුගිය දවස්වල ඔබතුමන්ලා වී ගබඩා සුද්ද කළා. නමුත්, දැන් ඒවා වැසීගෙන යනවා.

ඒ වාගේම තමයි රිළා උවදුර. රිළා උවදුර නැවත පටන් ගෙන තිබෙනවා. පසුගිය දවස්වල රිළා සංගණනයක් කළා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
රිළව් වැඩි වෙලා.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
දැන් රිළව් වැඩි වෙලා. රිළව් දැන් ආණ්ඩුවට කෝචොක් කරනවා. ඒ මොකද? පසුගිය දවස්වල සංගණනයක් කරලා ඒ තුළින් මේ වනකල් කිසිම වැඩ පිළිවෙළක් සිදු වෙලා නැහැ. දැන් රිළව් ආණ්ඩුවට කෝචොක් කරන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. රිළවුන්ගෙන්, වඳුරන්ගෙන් වන හානිය විශාලයි. සමහර වෙලාවට අඹ ඇතුළු පලතුරු ගස් වතු පිටින් විනාශ වනවා. ඒ නිසා ඒ අයටත් වගා හානිය වෙනුවෙන් වන්දියක් ගෙවන්න. රිළවුන්ගෙන් සහ දඬුලේනුන්ගෙන් සිදු වන හානියටත් වන්දි මුදල් ලබා දීම සඳහා කටයුතු කරන්න කියා රජයෙන් ඉල්ලා සිටිමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.08]

**ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂවලට අදාළව කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට ප්‍රථම මම යම් කරුණක් සඳහන් කරන්න ඕනෑ. කාලගුණ විපර්යාසය නිසා පීඩන අවපාත තත්ත්වයක් නිර්මාණය වීමෙන් රට පුරා අධික වර්ෂාපතනයක් ලැබෙමින් පවතිනවා. ඒ නිසා ගංවතුර තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ හේතුවෙන් ජනතාව විශාල පීඩාවකට පත් වෙලා තිබෙනවා.

මේ ආපදා තත්ත්වය තුළ අම්පාර දිස්ත්‍රික්කයේ සයින්දමරුදු ප්‍රදේශයේ තුන්දෙනකුගේ දිවි අහිමි වුණා. තවත් දිස්ත්‍රික්ක කිහිපයක මිනිස් ජීවිත කිහිපයක් අහිමි වුණා. පළමුව, ඒ පවුල්වල උදවියට ආණ්ඩු පක්ෂය විධියට, මේ පාර්ලිමේන්තුව විධියට අපගේ ශෝකය පළ කරනවා. ඒ වාගේම ඒ විපතට පත් සියලු ජනතාව වෙනුවෙන් අපේ කනගාටුව පළ කරනවා. කනගාටුව පළ කිරීමෙන් නතර නොවී ඊයේ ඉඳන්ම -මෙහි ආරම්භයේ සිටම- රජයක් විධියට අපි ඊට අදාළ මැදිහත්වීම ආරම්භ කළා. ගරු ජනාධිපතිතුමා අද උදේ පාර්ලිමේන්තුවට පැමිණිලා ආණ්ඩු පක්ෂ, විපක්ෂ අපි කවුරුත් එක්ක ඒ සම්බන්ධව ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කළා. ඒ වාගේම හෙට සහ අනිද්දා දින තුළ පාර්ලිමේන්තුව පවත්වනවාද, නැද්ද කියන එක පවා තීරණය කරන්න එම සාකච්ඡාව හේතු වුණා. ඒ ආකාරයට, මේක ඉතා බරපතළ තත්ත්වයක් විධියට සලකලා අපේ මැදිහත්වීම ආරම්භ කර තිබෙනවා.

විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයට අදාළව එක කරුණක් මතක් කළොත්, සේනානායක සමුද්‍රය කියන්නේ ලංකාවේ වැඩිම ජල ධාරිතාවක් තිබෙන ජලාශය. මෙම සමුද්‍රයේ ජල ධාරිතාව අක්කර අඩි 770,000ක්. මෙම ජලාශයේ පිටාර මට්ටම අඩි 110ක්. මේ වනකොට ඒකෙන් අඩි 92ක් පිරිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල විශේෂ අවධානයකට ලක් වුණා, මෙහි ප්‍රධාන බැම්මේ යම් කිසි ඉරි තැලීමක් තිබෙනවා, ඒ නිසා මෙහි මුළු ධාරිතාව සියයට 40කට ආසන්න ප්‍රමාණයක රඳවා ගත යුතුයි කියලා. එවැනි තත්ත්වයක් තිබෙන මොහොතක මේ වනකොට පැය තුනකට අඩිය බැගින් ජල ධාරිතාව වැඩි වෙනවා. ඒ නිසා ඒ පිළිබඳ විශේෂ සැලකිල්ලට ලක් කරලා මේ වනකොට රජය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව අදාළ බලධාරින් විධියට තීන්දු තීරණ ගනිමින් ඉන්නවා. ඒ ජනතාවට සහන සැපයීමේ කටයුතු අපි ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම හෙට සිට රට පුරා සියලු දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු රැස් කරමින්, ජනතාවට කඩිනමින් සහන සැලසීම සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් රජයක් විධියට අපි මැදිහත් වෙමින්, කටයුතු කරමින් සිටිනවාය කියන කාරණය මම මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් කරපු ප්‍රකාශ කිහිපයකට මම ඉතා කෙටියෙන් උත්තර දෙන්නම්. එකක් තමයි, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ගේ ගමන් වියදම් දීමනාව සම්බන්ධයෙන් මතු කරපු ගැටලුව. ඇත්තවශයෙන්ම එය විසඳීම සඳහා අපි මේ වන විට කටයුතු කරගෙන යනවා. මම මේ අවස්ථාවේ ඉතාම වගකීමෙන් ඒ ප්‍රකාශය කරනවා. ඒ වාගේම කිව්වා, "තරුණ කෘෂි ව්‍යාවසායකයින් සඳහා පසුගිය අය වැයෙන් රුපියල් මිලියන 500ක් වෙන් කළත් මේ වනකොට ඒ වෙනුවෙන් ශතයක්වත් වියදම් කරලා නැහැ, ඒ මුදල් ලබා දීලා නැහැ" කියලා. නමුත් අපි කියන්න කැමැතියි, ඊයේ වන විට එවැනි තරුණ ව්‍යවසායකයින්ට රුපියල් මිලියන 352ක් ගෙවලා තිබෙන බව.

ඊළඟට, 76 වසරක ශාපය පිළිබඳවත් කථා කළා. ඔබතුමන්ලා කුමක් කිව්වත්, ඒ පිළිබඳ අපේ දේශපාලන විවේචනයේ බර අපි කිසි ලෙසකින්වත් අඩු කරන්නේ නැහැ. මොකද, 76 වසරක ශාපය ගැන දැන් ඔබතුමන්ලා නේ කිව්වේ. ඔබතුමන්ලා විෂයට අදාළව විතරක් කරුණු ඉදිරිපත් කළා නම්, අපටත් ඒ විධියට කරන්න පුළුවන්. හැබැයි, දේශපාලන විවේචන එල්ල කරමින් මේක දේශපාලන වේදිකාවක් කර ගන්නවා නම්, අපත් ඒකට උත්තරයක් දෙන්න ඕනෑ. ඉතිහාසයේ ඔබතුමන්ලා කරපු සංවර්ධන කටයුතු ගැන ඔබතුමන්ලා කිව්වා. ඔබතුමන්ලාට සංවර්ධන කටයුතු කරන්නේ නැතුව හොරකම් කරන්න බැහැ නේ. පාරක් හදන්නේ නැතුව හොරකම් කරන්න බැහැ, වැවක් හදන්නේ නැතුව හොරකම් කරන්න බැහැ, මහවැලිය හදන්නේ

නැතුව හොරකම් කරන්න බැහැ. ඒ කාලවල ජනතාවගේ බදු මුදල්වලින් යම් මුදලක් සංවර්ධනය සඳහා යොදවද්දී, ඒකෙන් සැලකිය යුතු පංගුවක් වංචා කළා, හොරකම් කළා, දූෂණයට ලක් කළා. ඒ අනුව තමයි මහවැලි ව්‍යාපාරයෙන් "Mr. Two Percent"ලා නිර්මාණය වුණේ. මාර්ග කිලෝමීටරයක් හදද්දී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා සංවර්ධනය වෙනවා, කිලෝමීටර 10ක් හදද්දී පළාත් සභා මන්ත්‍රීවරයා සංවර්ධනය වෙනවා, කිලෝමීටර 50ක් හදද්දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සංවර්ධනය වෙනවා, කිලෝමීටර 100ක් හදද්දී ඇමතිවරයා සංවර්ධනය වෙනවා. එහෙමයි මේ රටේ දේශපාලනය පැවතුණේ. ඒ හේතුව නිසා මේ රට හදන්න, කෘෂි කර්මාන්තය දියුණු කරන්න, ඊට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කරන්න, ගොවි ජනතාවගේ ජීවිත උසස් කරන්න හරියාකාරව බැරි වුණා. ඔබතුමන්ලාගේ සාක්කුවේ සල්ලි නොවෙයි, ඔබතුමන්ලාගේ ගෙදරින් ගෙනාපු සල්ලි නොවෙයි, මේ රටේ දුප්පත් ජනතාව, වැඩ කරන ජනතාව ලේ, දහඩිය, කඳුළු වගුරලා උපයාගත් ධනය තමයි ඒ කටයුතු සඳහා යෙදෙව්වේ. ඒකෙන් විශාල පංගුවක් හොරකම් කරලා තිබෙනවා, නාස්ති කරලා තිබෙනවා. ඒ පිළිබඳ සියලු විමර්ශන කටයුතු ඉදිරියේදී සිදු වෙනවා.

ඒ නිසා මෙවර අය වැයේදී හැම ක්ෂේත්‍රයක් පිළිබඳවම හොඳ අවධානයක් යොමු කරලා, ඒ හැම ක්ෂේත්‍රයක්ම සංවර්ධනය කරන්න, ගැටලු නිරාකරණය කරන්න මුදල් වෙන් කරලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, අලි-මිනිස් ගැටුම නිරාකරණය කිරීම අත්‍යවශ්‍ය දෙයක් කියලා අපි දන්නවා. ඒ වෙනුවෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වාහන 294ක් ගන්න මෙවර අය වැයෙන් මුදල් වෙන් කළේ ඇයි? නවීන සන්නිවේදන උපකරණ ගන්න ගරු ජනාධිපතිතුමා මුදල් වෙන් කළේ ඇයි? ඒ වාගේම අඩක් ඉදි කරපු, ඉදි කරන්න සැලසුම් කරපු, ඒ වාගේම බාධා වීම් නිසා ඉදිකිරීම් නැවතුණු සියලු අලි වැටවල් ප්‍රතිසංස්කරණය කරන්න, තිබෙන මුදලට අමතරව තවත් රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අලි වැට රැකීම -ආරක්ෂා කිරීම- වාගේම යාවත්කාලීන කිරීමත් අවශ්‍යයි. ඒ සඳහා අප විසින් විශේෂ තීන්දුවක් ගනු ලැබුවා. ඒ අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් 5,000ක් ස්ථිරවම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන්න තීරණයක් ගත්තා. ඒ, ගොවි ජනතාවට තිබෙන ප්‍රශ්නවල බරපතළකම ආණ්ඩුවට - රජයට - දැනෙන නිසායි. ඒ වාගේම, අපි මේ ප්‍රශ්නය දන්නා නිසා ඔවුන්ගේ ආහාර දීමනා සහ ගමන් වියදම් දීමනා සඳහා තවත් රුපියල් මිලියන 375ක් වෙන් කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් අවසන් කරන්නම්.

අපි ඒ ආකාරයෙන් මැදිහත් වීම් බොහොමයක් සිදු කළා. ඒ වාගේම නෙළාගත් වී අස්වැන්න වියළීමේදීත් ගොවීන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙනවා. තෙත වී මිල දී ගන්නේ අපේ මහා පරිමාණ ව්‍යාපාරික ප්‍රජාව පමණයි. හැබැයි, ගොවි සංගම්වලට, සමුපකාර සමිතිවලට වී වියළා ගැනීම සඳහා නවීන පන්නයේ යන්ත්‍ර සූත්‍ර ලබා දෙනවා නම් වඩාත් සුදුසුයි.

ඒ සඳහාත් අවධානය යොමු කරලා රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කර තිබෙනවා. මේ ආකාරයට සමහර ප්‍රශ්න ස්ථිරසාර ලෙස විසඳා දීම උදෙසා අපි ආරම්භක පියවරක් තබා තිබෙනවා. සමහර ගැටලු නොවෙයි, ගැටලු සියල්ලම විසඳීම සඳහා ආරම්භක පියවරක් තබා තිබෙනවා. "කෝ, තවම විසඳලා නැහැ නේ" කියලා ඔබතුමන්ලා දැන් ඇහුවාට, හෙට අනිද්දා වනකොට, අවුරුදු දෙකතුනක් යනකොට ඔබතුමන්ලාම කියයි, "හා හොඳයි, මේ වැඩේ ලස්සනට යනවා නේ" කියලා. ඔබතුමන්ලා කවදාවත් හිතුවේ නැහැ, අප බලයට එයි කියලා. ඔබතුමන්ලා හිතපු නැති ඒ දෙය සිද්ධ වුණා වාගේම තව අවුරුදු පහකින් සහතික ලෙසම ඔබතුමන්ලාට කියන්න සිද්ධ වෙනවා, "මාලිමා ආණ්ඩුව රට හැදුවා" කියලා. ඒ බව මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ இஸ்மாயில் முத்து மொஹம்மட் அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் உள்ளது.

[பி.ப. 5.17]

**ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා**
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான இன்றைய குழுநிலை விவாதத்தில் பங்குபற்றுவதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன்.

எங்களுடைய பிரதேச மக்கள் இந்த அமைச்சினால் பல்வேறு துன்ப துயரங்களை அனுபவித்து வருவதுடன், இந்த அமைச்சிடம் பல்வேறு தேவைகளையும் வேண்டி நிற்கின்றார்கள். எமது நாட்டிலுள்ள முக்கியமான தொழில்களில் விவசாயமும் ஒன்றாகும். எங்களுடைய பிரதேசமானது, விவசாயத்துறையில் பல்வேறு பிரச்சினைகளையும் சவால்களையும் எதிர்நோக்குகின்ற பிரதேசமாகக் காணப்படுகின்றது. அங்கு விவசாயத்துறையை அபிவிருத்தி செய்யாவிட்டால், அப்பிரதேச மக்களின் தொழில் பாதிப்படையும். "உப்பு விற்கப் போனால் மழை பெய்யுது; மாவு விற்கப் போனால் காத்தடிக்கின்றது" என்று தமிழில் சொல்வார்கள். இதுதான் எங்களுடைய விவசாயிகளுடைய நிலையாக இருக்கின்றது. இந்த இரண்டுமே அவர்களின் தொழிலுக்குத் தீங்கு விளைவிக்கின்ற விதமாகத்தான் இருக்கின்றன.

அதுமாத்திரமன்றி, எங்களுடைய விவசாயிகள் விவசாயம் செய்வதில் நாட்டம் இல்லாமல் ஒதுங்கி நிற்கக்கூடிய துர்ப்பாக்கிய நிலையும் ஏற்பட்டு இருக்கின்றது. அதற்குக் காரணம் அவர்கள் அனுபவிக்கின்ற கஷ்டங்கள்தான். மேலும், அவர்களின் உற்பத்திகளைச் சரியான முறையில் சந்தைப்படுத்தக்கூடிய வசதியும் இல்லை. வவுனியா மாவட்ட விவசாயிகள் தமது நெல்லை விற்பனை செய்வதாக இருந்தால் - நெல் சந்தைப்படுத்தும் சபைக்கு வழங்குவதாக இருந்தால் - சுமார் 50 கிலோமீற்றர் செல்ல வேண்டும். அதனால் அவர்களுக்கு மேலதிகச் செலவு ஏற்படுகின்றது. மேலும், நெல்லை உத்தரவாத விலைக்குக் கொடுக்கக்கூடிய

[ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා]

சந்தர்ப்பமும் அவர்களுக்கு இல்லை. அறுவடைக்குப் பின்னர்தான் அதனைக் கொள்வனவு செய்கின்ற நிலையும் காணப்படுகின்றது. கௌரவ அமைச்சர் அவர்களே, இந்த நிலை மாற்றமடைய வேண்டும்.

மேலும், உற்பத்திச் செலவு அதிகரிப்பு, நவீன விதைத் தானியங்கள் கிடைப்பதில் காலதாமதம், களைநாசினி, கிருமிநாசினி, உரம் என்பவற்றின் விலை அதிகரிப்பு போன்ற காரணங்களால் விவசாயிகள் விவசாயத்தில் நாட்டமில்லாமல் வேறு தொழிலை நாடக்கூடிய வாய்ப்பு இருக்கின்றது. ஒரு காலத்தில் வவுனியா மாவட்டம் உளுந்துச் செய்கையில் முன்னிலையில் காணப்பட்டது. இந்த வருடம் உளுந்துச் செய்கையை அறவே செய்ய முடியாதளவுக்கு விவசாயிகள் வெறுப்படைந்து இருக்கிறார்கள். காரணம், கடந்த வருடம் ஏற்பட்ட வெள்ளப் பெருக்கால் முற்றாகப் பாதிப்படைந்த உளுந்துச் செய்கையாளர்களுக்கு எந்தவித நஷ்டஈடோ, மானியமோ வழங்கப்படாமைதான்.

அடுத்து, நீர்ப்பாசனத் திட்டம் பற்றி கூற வேண்டும். எங்களுடைய மன்னார், வவுனியா, முல்லைத்தீவு மாவட்டங்கள் வரட்சியான பிரதேசங்களாகக் காணப்படுகின்றன. அங்குள்ள குளங்களைப் புனரமைப்புச் செய்யாவிட்டால், தங்களுடைய தொழிலைச் செய்யமுடியாத நிலை அங்குள்ள விவசாயிகளுக்கு ஏற்படும். மன்னார் மாவட்டத்திலுள்ள கட்டுக்கரைக்குளம், அகத்திமுறிப்புக்குளம், வியாயடிக்குளம், வவுனியா மாவட்டத்திலுள்ள பாவற்குளம், ஈரற்பெரியகுளம், வேலன்குளம், இரணை இலுப்பைக்குளம் ஆகியவற்றை அபிவிருத்தி செய்யவேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. மேலும், வவுனியா மாவட்டத்தில் கிட்டத்தட்ட 800 குளங்கள் இருக்கின்றன. அவற்றில் 2-3 குளங்கள் மாத்திரம் பாரிய நீர்ப்பாசனத் திட்டத்துக்குள் வருகின்றன. ஏனையவை சிறிய குளங்கள்! இந்த 800 குளங்களில் 180 குளங்கள் கைவிடப்பட்ட நிலையில் புனரமைப்புச் செய்யப் படாமல் இருக்கின்றன.

கடந்த காலங்களில் மக்கள் இடம்பெயர்ந்ததனால் அந்தக் குளங்களும் அவற்றை அண்டிய பகுதிகளும் காடடர்ந்த பிரதேசங்களாக மாறி இருந்தமையால், அவற்றை வன இலாகாவும் வனசீவராசிகள் திணைக்களமும் விசேட வர்த்தமானிமூலம் கையகப்படுத்தி இருந்தமைதான் இதற்குக் காரணமாகும். அந்தக் குளங்கள் புனரமைக்கப்படாத காரணத்தால் அந்தப் பகுதி விவசாயிகள் காணி இல்லாமல் மிகவும் கஷ்டப்பட்டு 2-3 பரப்பில் குடியேறி இருக்கின்றார்கள். இதனால் விவசாயம் செய்வதற்கோ, மேட்டு நிலப் பயிர்ச்செய்கை செய்வதற்கோ எந்த வசதியும் இல்லாத நிலை இருக்கின்றது. எனவே, அரசாங்கமானது இந்த விடயத்தில் கவனம் செலுத்தி, காணிக் கச்சேரிகளை நடாத்தி, அந்த விவசாயிகளுக்கு காணிகளை வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

வவுனியா, பம்பைமடு பிரதேச கமநலச் சேவை நிலையத்துக்கு உட்பட்ட இரண்டு சிறு குளங்கள் இருக்கின்றன. அவற்றின் வான்கரைகளுக்கு இடையில் கிட்டத்தட்ட 250 மீற்றர் தூரமே இருக்கின்றது. இலுப்பைக் குளம் மற்றும் வேலப்பர் புளியங்குளம் ஆகிய இந்த இரண்டு குளங்களையும் இணைத்தால் மேலதிகமாக 50 ஏக்கர் காணியில் விவசாயம் செய்யக்கூடிய வாய்ப்பும், நன்னீர் மீன் வளர்க்கக்கூடிய வாய்ப்பும், 100-150 குடும்பங்கள் சீவிக்கக்கூடிய வாய்ப்பும் கிடைக்கும். எனவே, இந்த விஷயத்தில் கவனம் செலுத்துமாறு கேட்டுக் கொள்கின்றேன்.

வவுனியா மாவட்டத்தில் நீண்ட காலமாக இருந்துவருகின்ற பிரச்சினைதான் காணிப் பிரச்சினை! இந்தக் காணிப் பிரச்சினையைத் தீர்ப்பதற்குக் கடந்த காலங்களில் பல்வேறு முயற்சிகள் மேற்கொள்ளப்பட்டன. மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களில் இது பற்றியே இப்பொழுது அதிக நேரம் கதைக்கிறார்கள். கௌரவ ரணில் விக்கிரமசிங்ஹ அவர்களின் ஆட்சிக் காலத்தில், எங்களுடைய மாவட்ட அபிவிருத்திக் குழுவின் இணைத் தலைவர்களாக இருந்த திலீபன் அவர்களும் கௌரவ காதர் மஸ்தான் அவர்களும் இதற்கான முயற்சிகளை எடுத்தும் எந்தப் பிரயோசனமும் இல்லாத நிலையே காணப்படுகின்றது. இப்பொழுது, எங்களுடைய மாவட்ட அபிவிருத்திக் குழுவின் தலைவராக இருக்கின்ற கௌரவ உபாலி சமரசிங்க அவர்கள் மற்றும் கௌரவ மயில்வாகனம் ஜெகதீஸ்வரன், கௌரவ செல்லத்தம்பி திலகநாதன் ஆகியோர் இதற்கான முயற்சியில் ஈடுபட்டு இருக்கிறார்கள். எனினும், இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கு எந்த வழியும் இல்லாமல் இருக்கின்றது. 'பிச்சைக்காரனின் புண்போல' இந்தப் பிரச்சினை தீர்க்கப்படாமல் நீண்டுகொண்டே செல்கின்றது. காலத்துக்குக் காலம் ஆட்சிக்கு வருகின்ற அரசாங்கங்கள் எங்களுடைய மக்களுக்கு அந்தக் காணிகளைக் கொடுக்க விரும்பாத நிலையில் இருக்கின்றனவா என்ற சந்தேகம் எழுகின்றது. இந்த நாட்டைப் பூர்வீகமாகக் கொண்ட எங்களுடைய மக்களுக்கு இந்தக் காணிகளைப் பெறுவதற்கு வாய்ப்பு இல்லாவிட்டால், அவர்களால் வேறு நாடுகளில் போய் காணிகளைப் பெற முடியுமா அல்லது கடலில்போய் விவசாயம் செய்ய முடியுமா? என நான் கேட்க விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அநுராதபுரத்தைச் சேர்ந்தவர். எங்களுடைய மாவட்டத்தின் பிரச்சினைகள், காலநிலை, அங்குள்ள வளங்கள் என்பன பற்றி உங்களுக்கு நன்றாகவே தெரியும்! எனவே, இந்த விடயத்தில் கவனம்செலுத்தி, காணிக் கச்சேரிகளை நடத்தி, காணி இல்லாத விவசாயிகளுக்கு காணிகளை வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இடப்பெயர்வு காரணமாகத்தான் இந்த நிலை ஏற்பட்டது. அந்த மக்கள் தாமாக விரும்பி அந்த இடப்பெயர்வை மேற்கொள்ளவில்லை. பலாத்காரமாக ஒரு மணித்தியாலத்தில் வெளியேற்றப்பட்ட அந்த மக்கள், 20-25 வருடங்களுக்குப் பிறகுதான் அந்தப் பிரதேசங்களில் மீளக்குடியேறி இருக்கிறார்கள். அதனால் அந்த இடங்கள் சிறு பற்றைகளாகக் காட்சியளிக்கின்றன. ஒரு காலத்தில் உளுந்து, நெல், கடலை, பயறு போன்றன செய்கை பண்ணப்பட்ட காணிகளைத்தான் இன்று வன இலாகா சுவீகரித்து இருக்கின்றது.

காணி வழங்குவது சம்பந்தமான சகல அதிகாரங்களும் அந்தந்த பிரதேச செயலாளர்களுக்குத்தான் இருக்கின்றன. ஆனாலும், அந்தக் காணியில் அத்துமீறியதாக குறித்த பிரதேச செயலாளருக்கு எதிராக வன இலாகா வழக்குத்தொடுத்து இருக்கின்றது. வித்தியாசமான ஒரு நிருவாகமே எங்களுடைய பிரதேசத்தில் நடைபெறுகின்றது. எங்களுடைய பிரதேசத்திலுள்ள காணிகள் சம்பந்தமாக மாவட்ட மற்றும் பிரதேச அபிவிருத்திக் குழுக்கள் செய்கின்ற சிபாரிசுகளை தேசிய மட்டக் குழுவுக்கு அனுப்பி வைத்தாலும் அவற்றுக்கு அதன் அனுமதி மறுக்கப்படுகின்றது. எனவே, இந்த விடயத்தில் அதிக கரிசனைகொண்டு, வட மாகாண ஆளுநர், அரசாங்க அதிபர், பிரதேச செயலாளர்களைக் கொண்ட ஒரு குழுவிடம் இதற்குரிய அதிகாரங்களைக் கொடுக்க வேண்டும். அவர்களுக்குத் தெரியும், இந்தக் காணிகளை எவ்வாறு விடுவிக்க வேண்டும், யாருக்குக் கொடுக்க வேண்டும், எப்படிச் செய்ய வேண்டும் என்று. எனவே, இதையும் கவனத்திற்கொள்ளுமாறு கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, கால்நடைகள் சம்பந்தமாகக் குறிப்பிட வேண்டும். எங்களுடைய பிரதேசத்தில் நிறைய கால்நடைகள் இருக்கின்றன. ஆனாலும், போதியளவு மேய்ச்சல் தரை இல்லை. அதேபோல், மேய்ச்சல் தரைக்குரிய காணிகள் இருக்கின்றன. ஆனாலும், அவற்றை வன இலாகா விடுவிப்ப தில்லை. எனவே, இந்த விடயத்தில் கவனம் செலுத்துமாறு கேட்டுக் கொள்கின்றேன். கால்நடை வளர்ப்பாளர்களையும் பண்ணையாளர்களையும் உற்சாகப்படுத்தும் வகையில், பாலுக்கான உத்தரவாத விலையைப் பெற்றுக் கொடுப்பதுடன், பால் சேகரிக்கின்ற நிலையங்களையும் உருவாக்கிக் கொடுக்க வேண்டும். ஏனெனில், நாங்கள் அதிகமான பணத்தைச் செலவழித்து, வெளிநாட்டிலிருந்து பால் மாவை இறக்குமதி செய்கின்றோம். எனவே, இந்த விஷயத்தில் அக்கறை யெடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

இன்னுமொரு முக்கியமான விடயத்தைக் குறிப்பிட வேண்டும். சோபால புளியங்குளம் என்று ஒரு குளம் இருக்கின்றது. அதன்கீழ் கிட்டத்தட்ட 150 ஏக்கர் வயல் காணி இருக்கின்றது. அதன் அருகாமையிலே வவுனியா பல்கலைக்கழகம் அமைந்திருக்கின்றது. அதற்கு 100 மீற்றருக்கு அப்பால் பெரியதெரு குப்பை மேடு உள்ளது. அந்தக் குப்பை மேட்டிலிருந்து கழிவு நீரானது, இந்தப் பல்கலைக்கழகத்தின் வளாகத்தின் ஊடாக அந்தக் குளத்தைச் சென்றடைகின்றது. அதனால் அந்தக் குளத்திலுள்ள நீர் மாசடைகின்றது. அதன் காரணமாக அங்குள்ள விவசாயிகளுக்குப் பாதிப்பு ஏற்படு கின்றது. எனவே, அந்தக் குப்பை மேடு சம்பந்தமாகவும் கவன மெடுக்குமாறு அன்பாக வேண்டி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරවින්ද සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.27]

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 අය වැය ලේඛනයට අදාළව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදය තමයි අද පැවැත්වෙන්නේ. අද රටේ ඇතිවෙලා තිබෙන ආපදා තත්ත්වය පිළිබඳව මුළු රටේම අවධානය යොමු වෙලා තිබෙනවා. මේ වනවිට ලැබිලා තිබෙන අලුත්ම තොරතුරු අනුව, තවත් පැය කිහිපයකින් අපේ රටට බලපාන තවත් තද සුළි කුණාටුවක් එමින් තිබෙනවා. ඒ වාගේම ගංවතුර තත්ත්වය දිහා බලනකොට, රට තුළ බරපතළ තත්ත්වයක් නිර්මාණය වෙමින් තිබෙන බව පෙනෙනවා. අපහසුතාවට පත්වෙලා ඉන්න, කරදරයට, පීඩාවට පත්වෙලා ඉන්න ජනතාවට අපේ සහයෝගය වැඩි වැඩියෙන් ලබා දිය යුතු මොහොතක්, මේක. එය මතක් කරන අතරේ, වැය ශීර්ෂයට අදාළව කථා කිරීමට මම දැන් බලාපොරොත්තු වෙනවා.

අද උදෑසන ඉඳලාම විපක්ෂයේ මන්ත්‍රීවරු මේ පාර්ලිමේන්තුව තුළ විවිධ යෝජනා සහ චෝදනා ඉදිරිපත් කළා. ඒ සමහර යෝජනා සාධනීයයි. සමහර ඒවා ඔවුන්ට ඉතිහාසය පුරා කරගන්න බැරි වූ නමුත් වර්තමානයේදී සැලසුම්සහගත වැඩ පිළිවෙළක් අනුව සිද්ධ වෙනකොට දැනුණු වේදනාවට කියපු දේවල්. ඒ අතර උතුරට වතුර ගෙනියන්නේ නැහැ, උතුරේ ජනතාවට ජාතිවාදී ස්වභාවයෙන් සලකමින් ඉන්නවා කියලා සමහර මන්ත්‍රීවරු මේ පාර්ලිමේන්තුවේදී චෝදනා කළා. අපි ඒ මන්ත්‍රීවරුන්ට කියන්න ඕනෑ, කෘෂිකර්මාන්තයේදී විතරක් නොවෙයි, අපි ආණ්ඩුවක් විධියට කටයුතු කරද්දී කිසිදු ආකාරයකින් ජාතිවාදය අනුව ජන කොට්ඨාසයක් ඉලක්ක කරලා විශේෂ වරප්‍රසාදයක් හෝ අගතියක් අත්වෙන ආකාරයට කටයුතු කරන්නේ නැහැ කියලා. උතුරටත් මහවැලියේ වතුර ගෙනියන්න කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය කටයුතු කරමින් ඉන්නවා.

ගරු මන්ත්‍රීවරු තමන් නියෝජනය කරන දිස්ත්‍රික්කවල තිබෙන විවිධ ගැටලු ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීවරයෙක් වවුනියා දිස්ත්‍රික්කයේ තිබෙන ඉඩම් ගැටලුවක් ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්තුමාට කථා කළාට පස්සේ ලැබුණු තොරතුර වුණේ, ඒ ඉඩම් මැනුම් කටයුතු සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා, ඉන් පසුව පියවරින් පියවර ඒ ප්‍රශ්න විසඳන්න අවශ්‍ය කටයුතු සිදු කරමින් ඉන්නවා කියන එකයි. ඒ ප්‍රශ්න විසඳීමට අපි මැදිහත්වෙලා කටයුතු කරන්න සූදානම් කියන පණිවුඩයත් මේ වෙලාවේ ලබා දෙන්න ඕනෑ.

ඒ වාගේම මුලතිව් දිස්ත්‍රික්කයේ අක්කර 3,771ක භූමි ප්‍රමාණයක් සම්බන්ධයෙන් ඇතිවෙලා තිබුණු ගැටලුව ගැන මුලතිව් දිස්ත්‍රික් ලේකම්තුමාට කථා කළා. එතුමාගෙන් ලැබුණු පිළිතුර වුණේ, ඒ භූමි හඳුනාගෙන, ඒවා නිරවුල් කරලා නිදහස් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා කියන එකයි. මේ වාගේ විවිධ යෝජනා, චෝදනා ඉදිරිපත් කළා. ඒ වාගේම ගොඩක් මන්ත්‍රීවරු ඇතිවෙලා තිබෙන මේ ගංවතුර තත්ත්වයත් එක්ක කියන්න උත්සාහ කළා, ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ආණ්ඩුවේ වැඩ පිළිවෙළක් පේන්න නැහැ කියලා. මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, එහෙම වැඩ පිළිවෙළක් පේන්නේ නැහැ කියලා. පේන්නේ නැහැ, හොරට නිදාගෙන ඉන්නකොට. හැබැයි, ඇස් දෙක ඇරගෙන, මේ ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයෙන් ඉන්නවා නම් ඒක පෙනෙනවා. අපි මාස දෙක තුනකට පෙර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී කිව්වා, ගංවතුර තත්ත්ව පිළිබඳව සහ නාය යෑම් තත්ත්ව පිළිබඳව කටයුතු කිරීමට නිලධාරීන් සූදානම් කරන්න, ඒ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් හදන්න කියලා. අපේ ආණ්ඩුවෙන් හැම දිස්ත්‍රික්කයකටම ආපදා කළමනාකරණය සඳහා මුදල් වෙන්කර දීලා තිබෙනවා. පළමුවැනි පියවරේදී, හැම දිස්ත්‍රික්කයකම නිලධාරීන් මැදිහත්වෙමින් ඔවුන්ට කරන්න පුළුවන් උපරිම කැපවීමෙන් ඒ කටයුතු කරමින් ඉන්නවා. හැබැයි, විපක්ෂයේ ඉන්න සමහර මන්ත්‍රීවරුන්ට ආණ්ඩුවේ මේ ක්‍රියාවලිය පේන්නේ නැහැ. ඒ නිසා අපි කියනවා, නිදාගෙන ඉන්නවා නම්, අවදිවෙලා ඇස් අරලා මේ වැඩ පිළිවෙළ දිහා බලන්න කියලා. මේ අර්බුදයට විසඳුම් ලබා දීමේ දෙවැනි පියවර හැටියට, ජනාධිපතිතුමා අද මැදිහත්වෙලා ඒ ගැන කථා කළා.

මේ රටේ ලක්ෂ 70කට ආසන්න පුරවැසියන් ප්‍රමාණයක් කෘෂිකර්මාන්තයේ නිරත වෙලා ඉන්නවා. ඒ වාගේම සේවා නියුක්තිකයන් සියයට 27ක වාගේ ප්‍රමාණයක් මේ ක්ෂේත්‍රය නියෝජනය කරනවා. කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් අපි සතුටු වෙන්න ඕනෑ මුල් ම කාරණය තමයි, දශක ගණනාවකට පස්සේ මේ ප්‍රශ්න හඳුනාගෙන, ඒවා විසඳන්න පුළුවන් අමාත්‍යාංශයක් අපි හදලා තිබෙන එක.

මේ වැඩ පිළිවෙළ පිළිබඳව, ආණ්ඩුවේ ගමන් මග පිළිබඳව විපක්ෂයට යමක් තේරුම් ගන්න වුවමනාවක් තිබෙනවා නම්, අපි තමයි මෑතකදී මේ අමාත්‍යාංශය විද්‍යාත්මකව ගොඩ නඟලා තිබෙන්නේ කියන එක තේරුම් ගන්න. ගොවියාට අවශ්‍ය ඉඩම්

[ගරු අරවින්ද සෙනරත් මහතා]

ටික දෙන්න, ගොවියාට අවශ්‍ය ජලය දෙන්න, ඒ එක්කම ගැට ගැහුණු පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කරන්න මිනින්දෝරු දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය වැනි ආයතන සියල්ල එකතු කරලා තනි අමාත්‍යාංශයක් හදලා තිබෙනවා. මොකටද, එහෙම හැදුවේ? කෘෂි කර්මාන්තයේ පුනරුදයක් ඇති කිරීම සඳහා තමයි අපි ඒ පළමුවැනි පියවර ආරම්භ කළේ. අමාත්‍යාංශවලට මුදල් වෙන් කරද්දිත් ඒ වාගේම තමයි. මේ රටේ ආර්ථිකය යැපුම් කෘෂි කර්මාන්තයේ ඉඳලා නිෂ්පාදන ආර්ථිකයකට ගෙන යද්දි, කෘෂි කර්මාන්තයට ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනවා. ඒ නිසා, අපි ආණ්ඩුවක් විධියට වැඩිම බර තැබීම කර තිබෙන්නේ මේ අමාත්‍යාංශයටයි. මිනින්දෝරු දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 6,203කුත්, ඉඩම් අමාත්‍යාංශයට රුපියල් බිලියන 13කුත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 91,000කුත්, -බිලියන 91කුත්- වශයෙන් සමස්තය ගත්තොත්, රුපියල් බිලියන 267ක වාගේ මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. ඒක ලොකු මුදලක්. මුදලක් වෙන් කරන්නේ නැතිව අපට සැලසුම් හදන්න බැහැ. එම නිසා ආණ්ඩුවක් විධියට අපි ප්‍රශ්නය හඳුනා ගෙන තිබෙනවා. ප්‍රශ්නයට ලබා දිය යුතු පිළිතුර අපි හොඳින් හඳුනනවා. ඒ පිළිතුරට ළඟා වෙන්න අවශ්‍ය කරන සියලු පහසුකම් අපි රට තුළ නිර්මාණය කරමින් තිබෙනවා. අපි ගොවියාත් එක්ක අරගළ කරපු දේශපාලන ව්‍යාපාරයක්. ඒ වාගේම, මේ රටේ කෘෂි කාර්මික නවෝදයක් හදන්න ඕනෑ කියලා ඒ පිළිබඳව ධනාත්මකව හිතපු, ඒ වෙනුවෙන් වැඩ කරපු දේශපාලන ව්‍යාපාරයක්. ඉ අපි බලය අරගෙන 2025දී මාස 5ක වාගේ කාලයක් තමයි සංවර්ධන ව්‍යාපෘති කරන්න කාලය ලැබුණේ. අය වැය සම්මත කරලා, මුදල් ඇවිල්ලා මැයි මාසයෙන් පසුව තමයි අපි ව්‍යාපෘති ක්‍රියාත්මක කළේ. හැබැයි, 2026 වසර එහෙම නොවෙයි. 2026 ජනවාරි පළමුවැනිදා ඉඳලාම මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ සඳහා ඉතාම විධිමත්, සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ඔස්සේ මුදල් වෙන් කරලා අපි ඒ කටයුතු කරමින් තිබෙනවා.

ඊළඟට ඉඩම් සම්බන්ධයෙන් කථා කළොත්, අපේ රටේ ඉඩම් පිළිබඳ නිශ්චිත වැඩ පිළිවෙළක් පැවති ආණ්ඩුවලට තිබුණේ නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, අපි 76 වසරක ශාපය ගැන කථා කළා, මතක් කළා කියලා. ගරු මන්ත්‍රීතුමන්ලා මතක තබා ගන්න, අපි ඒ කරපු චෝදනාව, සරල චෝදනාවක් නොවෙයි. රටක පවතින ඕනෑම ආණ්ඩුවක් මේ ප්‍රශ්න හොඳින් කළමනාකරණය කරලා විසඳිය යුතු වෙනවා. ඒවා විසඳුවේ නැතිව දැවැන්ත අර්බුද නිර්මාණය වුණාට පස්සේ පුරවැසියන් ඒ අර්බුදයේ ගිලිලා සිටිද්දි ඒකට ඒ ආණ්ඩු වග කියන්න ඕනෑ. එම නිසා තමයි අපි එවැනි චෝදනාවක් කළේ.

අපේ රටේ තිබෙනවා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - LRC එක. මේ කොමිෂන් සභාව ආරම්භ කළේ ඉතාම සද්භාවයෙන්, හොඳ අරමුණක් එක්ක. හැබැයි, දැන් විපක්ෂය නියෝජනය කරන අප්පලා, බාප්පලා, ඥාති වර්ගයා, පරම්පරාව ආණ්ඩු නියෝජනය කරමින් සිටි කාලයේ, 1972දී අත්පත් කර ගත් ඉඩම් ටිකවත් නිරවුල් කර ගන්න සමත් වෙලා නැහැ කියලා ඔබතුමන්ලා විශ්වාස කරනවාද? 1972දී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හැදුවාට පසුව මුලින්ම අත්පත් කර ගත් ඉඩම් ටිකවත් මැනුම් කරලා නිරවුල් කර ගන්න ආණ්ඩුවලට වැඩ පිළිවෙළක් තිබිලා නැහැ. ඒ වාගේම එදා ඉඳලා නිදහස් කරපු, බැහැර කරපු ඉඩම් ටික විධිමත් ක්‍රමවේදයක් යටතේ බැහැර කරන්න ඔය තිබුණු ආණ්ඩුවලට වැඩ පිළිවෙළක් තිබිලා නැහැ. එම නිසා දැවැන්ත අර්බුදයක් අතින් අත ගියා. එක් එක් පුද්ගලයන්ට හිතුමතේ ඉඩම් බෙදුවා. අපි පසුගිය දවස්වල මේ සම්බන්ධයෙන් කටයුතු කළා. සමහර නිලධාරීන් හිතුවක්කාර ලෙස මේ ඉඩම් බැහැර කරන්න උදවු කරලා තිබෙනවා. අපට තොරතුරු තිබෙනවා. මිය ගිය මිනිස්සුන්ටත් ඉඩම් දීලා තිබෙනවා. හැබැයි නිලධාරීන් විතරක් නොවෙයි, දේශපාලනඥයෝත් එකතු වෙලා. එම නිසා සමහර නිලධාරීන්ගේ සේවය ඉදිරියට පවත්වා ගෙන යනවාද, නැද්ද කියන එක පිළිබඳව අපි තීන්දු කරලා තිබෙනවා. ඇයි? රටක් විධියට මේ ගැටලු නිරවුල් වෙන්න ඕනෑ නිසා.

ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළ ගත්තොත්, පුරවැසියාට ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා. අපේ සංස්කෘතිය ඇතුළේ ඉඩමට ලොකු වටිනාකමක් තිබුණා. අපේ පවුල් ඒකකය ඇතුළේ ඉඩම් පිළිබඳ යම් සංස්කෘතියක් තිබුණා. හැබැයි, ඒ සමාජ සංවර්ධනයත් එක්ක ඉඩමේ ඔප්පුව පිළිබඳව තිබුණු ගැටලු ටික නිරාකරණය කර ගන්න අපි සමත් වෙලා නැහැ. පවුලේ වැඩිමහල් පුතා, දුව, බාලම පුතා, අම්මා, තාත්තා දෙන්නාගේ වැඩවලට උදවු කරපු, ඒ පවුල් ඒකකයේ තිබුණු සංස්කෘතිය වෙනස් වෙද්දී ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළ ඒ සමාජ වෙනසට සාපේක්ෂව වෙනස් වෙලා තිබුණේ නැහැ. දේශපාලනඥයින්ට ඕනෑ විධියට තමයි ඔප්පු ලබා දුන්නේ, බලපත්‍ර ලබා දුන්නේ. සමහර ඒවා තමන්ගේ හිතවතුන්ට විතරක් දීලා තිබෙනවා, සාමාන්‍ය මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳන්නේ නැතිව. පසුගිය කාලයේ ඔප්පු ලබා දෙන්න "උරුමය" කියලා වැඩ පිළිවෙළක් ගෙනාවා. ඒක තනිකරම දේශපාලන ඉලක්කයක්. ජනාධිපතිවරණය ඉලක්ක කර ගෙන ඔප්පු ලක්ෂ 20ක් දෙන්න වැඩ පිළිවෙළ හැදුවා. හැබැයි, භූමියේ ඒකට හැකියාව තිබුණාද කියන එක පිළිබඳ අධ්‍යයනයක් කළේ නැහැ. ප්‍රා ්යවවවවව

ඒක තුළ අඩුපාඩු තිබුණා. ඒ නිසා අපි ආණ්ඩුවක් විධියට ඒක විධිමත් කරන්න Cabinet Paper එකක් දාලා "හිමිකම" නමින් නව ඔප්පුවක් 2026 ඉඳලා ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. හිමිකම ඉල්ලා සිටි සියලුදෙනාට, එනම් ඔප්පු 75,000කට ආසන්න ප්‍රමාණයක් 2026 වසරේ ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. මේ, ජනතාවගේ ප්‍රශ්න අපි විසඳන්නේ. ඉඩම් ප්‍රශ්න ක්‍රමානුකූලව විසඳනවා. මිනින්දෝරු දෙපාර්තමේන්තුව මානව සම්පතේ හිඟකම නිසා දැවැන්ත අර්බුදයක ඉන්නවා. අපේ ආණ්ඩුව ඇවිල්ලා කෙටි කාලයක් ඇතුළත මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අලුතින් නිලධාරීන් බඳවා ගන්න කටයුතු කළා. ඒ සඳහා අපි පළමුවැනි පියවර තබා තිබෙනවා. මුදල් වෙන් කරලා තිබෙනවා, තාක්ෂණය ගෙනෙන්න කටයුතු කරලා තිබෙනවා. අපිට දෙපාර්තමේන්තුව පැත්තෙන් තිබෙන්නේ, නවීන තාක්ෂණය භාවිත කරලා බිම් කැබැලි හඳුනා ගැනීම. 2026දී මිලියන 20ක ඉලක්කයකට යන්න පුළුවන් කියලා අපි හිතනවා. මෙවා නිරවුල් කරන්න අපි සැලසුම් හදමින් තිබෙනවා. අපිට ක්‍රමානුකූලව පියවරෙන් පියවර යද්දී මේ ප්‍රශ්න විසඳා ගන්න පුළුවන් කියන විශ්වාසය තිබෙනවා.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගත්තොත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව තමයි ගොවියාගේ වැඩිම වගකීම් කොටස ඉෂ්ට කරන ආයතනය. අපි කොච්චර භූමිය දුන්නත්, වගා කරන්න අවශ්‍ය ජලය දෙන්න සමත් නැත්නම්, අපි ෆේල්. ඉඩම් ටික නිරවුල් කරනවා වාගේම, බීජ ටික දෙනවා වාගේම, නිලධාරියා තාක්ෂණය ගෙනැල්ලා දෙනවා වාගේම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විධිමත් ආකාරයේ ප්‍රතිව්‍යුහගතකරණයකට ලක් කරලා, අංග සම්පූර්ණ වාරි පද්ධතියක් නිර්මාණය කරන්න අවශ්‍ය කරන මූල්‍ය ප්‍රදානයන් ආණ්ඩුව විධියට ලබා දෙන්න කටයුතු කරනවා කියලා අපි ගොවියා තුළ විශ්වාසය හැදුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
**(மாண்புமிகு அரவிந்த செனரத்)**
(The Hon. Aravinda Senarath)

2025දී ඒ සඳහා රුපියල් මිලියන 74,000කට ආසන්න ප්‍රමාණයක් ලබා දීලා, 2026දී රුපියල් මිලියන 91,000ක් ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. අපේ රටේ වාරි පද්ධතිය ශක්තිමත් කරන්න අවශ්‍ය කරන මැදිහත්වීම අපි සිදු කරමින් තිබෙනවා. ඊට අමතරව ගමේ තිබෙන පුංචි වැව හදා ගන්න; ගමේ ගොවි මහත්මයාට වාරි පද්ධතිය තුළ තිබෙන ගමේ වැව හදා ගන්න ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා රුපියල් මිලියන 10,000ක් වෙන් කරලා තිබෙනවා. මෙන්න මේක තමයි ආණ්ඩුවක වගකීම. ඒ නිසා, ගොවියා ආදායම් ලබන පුද්ගලයෙක් බවට පත් කරන්න අපි සියලු ක්ෂේත්‍ර ගොඩ නඟමින් තිබෙනවා. ගොවියාගේ ප්‍රශ්න ටික විසඳනවා කියලා අපි කියනවා. ඒ වාගේම අද උදෑසන කාලයේ විපක්ෂ නායකතුමා කිව්වා, ගම්මිරිස් ගොවියා වැටිලා, රබර් ගොවියා වැටිලා, මේ හැම ගොවියෙක්ම වැටිලා, කෘෂි කර්මාන්තය කඩා ගෙන වැටිලා කියලා. නැහැ, අද ගම්මිරිස් ගොවියාට ගම්මිරිස් කිලෝවකට රුපියල් 2,000ක් දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි වේලාවක් දෙන්න. මම වැඩිපුර ගන්නේ මිනිත්තුවයි. අද රබර් ගොවියාගේ රබර් කිරි කිලෝවක මිල රුපියල් 580ට වාගේ යන්න පුළුවන්කම තිබෙනවා. 2026 අවුරුද්දේ මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙලා එද්දී, තවදුරටත් ඒ අයගේ ආදායම වැඩි කර දෙන්න අපට පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා, කෘෂිකර්මය වාගේම හැම ක්ෂේත්‍රයක්ම අපි ගොඩ නඟනවා. අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා කිව්වා, පොල් ගස්වලට වැලඳිලා තිබෙන රෝගය ගැන. අපි ඒක හඳුන්වන්නේ "වැලිගම රෝගය" කියලා. එතුමා මේ වෙලාවේ සභාවේ නැති වුණත්, ඒකට උත්තරයක් දෙන්න ඕනෑ. "වැලිගම රෝගය" මාතර දිස්ත්‍රික්කයේ පොල් ගස්වලට හැදිලා, අවුරුදු 20කට වැඩියි. හැබැයි, නිලධාරින් ඒක එක්ක පොර බදලා, ඒක වෙනත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත වෙන්න ඉඩ හැරියේ නැහැ. හැබැයි, දැන් ක්‍රමානුකූලව හම්බන්තොට දිස්ත්‍රික්කයට එමින් තිබෙනවා. ඒ නිසා තීන්දුවක් අරගෙන තිබෙනවා, එවැනි පොල් ගහක් කපා ඉවත් කර ගන්නවා නම් රුපියල් 10,000ක් දෙන්න. එහෙම දීලා, මේ රෝගයෙන් බේරා ගන්න. මොකද, ලෝකයේ සමහර රටවල, ප්‍රාන්තවල මේ රෝගයෙන් පොල් වගාව සම්පූර්ණයෙන් විනාශ වුණා. ඒ නිසා අපි ආණ්ඩුවක් විධියට සෑම ආකාරයෙන්ම ගොවියාගේ ප්‍රශ්න විසඳන්න සැලසුම් හදමින් තිබෙනවා. ඒ නිසා, 2026දී ජයග්‍රාහී වසරක් ලෙස ගොවියාට හොඳම කාලයක් උදා කර දෙන්න අපි කටයුතු කරමින් ඉන්නවා කියන පණිවුඩය ලබා දෙමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.41]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
**(மாண்புமிகு ரோஹண பண்டார)**
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කල් වැසි වසීවා, කෙත්වතු සාර වේවා, සත් සිත් නිවේවා, රජය දැහැමිව ලොවැඩ වේවා..." අද දවසේ අපේ රටේ ජනතාව ස්වභාව ධර්මයත් එක්ක ලොකු සටනක් කරනවා; අයහපත් කාලගුණයත් එක්ක සටනක් කරමින් ඉන්නවා. ජීවිත ගණනාවක් අපට අහිමි වෙලා තිබෙනවා. ඒ ජීවිත අහිමි වෙච්ච සියලුදෙනා වෙනුවෙන්, ඒ පවුල්වල අයට අපේ කනගාටුව, ශෝකය ප්‍රකාශ කරනවා. ඒ වාගේම අවතැන් වෙච්ච පිරිසක් ඉන්නවා. ඒ සියලුදෙනා වෙනුවෙන් අද පාර්ලිමේන්තුවේදී ජනාධිපතිතුමා ප්‍රමුඛ අපි ඒ සියලු කාරණාවලට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා සියලු ජනතාවට අවශ්‍ය කරන පහසුකම් ටික සපයන්න අපි කටයුතු කරමු.

අපේ රටේ අමාත්‍යාංශ ගණනාවක් ඒක රාශිව කටයුතු කරන වැදගත්, බලවත් අමාත්‍යාංශයක වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී මගේ කථාව, අමාත්‍යවරයාගේ ප්‍රකාශයකින්ම පටන් ගත්තොත් හොඳයි කියලා මා හිතනවා. මම හිතන විධියට ඇමතිතුමා හොඳ කථාවක් කිව්වා, ගොවියා වගාව පටන් ගන්න ඕනෑ වෙළෙඳ පොළ දැනගෙන කියලා.

මම හිතන විධියට ඒක හොඳ කථාවක්, එහි හොඳ අන්තර්ගතයක් තිබෙනවා. හැබැයි ගරු ඇමතිතුමනි, ඔබතුමාත්, මාත් ඇතුළු අපි ඔක්කෝම දන්නා කාරණාවක් තිබෙනවා. අද මහනුවරින් දේශපාලනය කළාට ඔබතුමාත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෙනෙක්. ඒ නිසා ඔබතුමා දන්නවා, ගොවීන්ගේ තත්ත්වය. අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් වෙළෙඳ පොළ දැනගෙන තමයි කටයුතු කරන්නේ. ගොවීන් වෙළෙඳ පොළ ගැන ඉගෙන ගන්නේ කොහොමද? ගොවියා මේ කන්නයේ වගා කළ භෝගයේ එළදාව දඹුල්ලට අරගෙන ගියාම එහි මිල තුට්ටුවට වැටිලා නම්, මේ කන්නයේම තව භෝගයක මිල වැඩි වෙලා තිබෙනවා නම්, අන්න ඒක දිහා බලලා තමයි ගොවියා වෙළෙඳ පොළ ගැන ඉගෙන ගන්නේ. ගොවියා හිතනවා, මේ කන්නයේ මගේ වට්ටක්කා ටිකට හොඳ මිලක් ලැබුණේ නැහැ, ලබන සැරේ මම පිපිඤ්ඤා හිටවන්නම් කියලා. අපේ ගොවියා වෙළෙඳ පොළ ඉගෙන ගන්නා ක්‍රමය ඒකයි. ඒක හරිද, ඇමතිතුමනි? එතකොට ලබන කන්නයේ පිපිඤ්ඤා ටික හදලා අරගෙන ගියාම ඒ කන්නයේ පිපිඤ්ඤා ටික තුට්ටුවට වැටෙනවා. ඔබතුමා තැන අවබෝධ කරගෙන තිබෙනවා. හැබැයි, තැනට අවශ්‍ය කරන උත්තරේ හඳුනාගෙන නැති එකයි ප්‍රශ්නේ. අපි වගා කරගෙන කන එක නැති කරලා, අපි වවාගෙන කනවා කියන තැන නැහැ කියලා ඔබතුමා කියනවා. අපි වවාගෙන කන්නේ නැත්නම්, රටින් ගෙනැත් කොමිස් ගන්නද බලාපොරොත්තු වෙන්නේ? ඒ නිසා මේ දේ නතර කරන්න ඕනෑ. අපි ක්‍රමවත් වෙන්න ඕනෑ.

අපි හැම දාම පොහොර සහනාධාරයේ එල්ලිලා ඉන්නවා. මේ දවස්වල පොහොර සහනාධාරය ගැන කථා කරනවා. ඔබතුමන්ලා කියනවා, අපි සියයට 90කට පොහොර සහනාධාරය දීලා තිබෙනවා, හරි ෂෝක්, ටොප් කියලා. හැබැයි ගොවීන්ගෙන් ඇහුවාම කියනවා, කොටසයි වැටිලා තිබෙන්නේ, තවම හරියට වැටිලා නැහැ, දෙන එකත් කැල්ලයි හම්බ වෙලා තිබෙන්නේ කියලා. ඒ විධියට ඔවුන් මැසිවිලි නඟනවා. අපි ඒ විධියට පොහොරත් එක්ක ඔට්ටු වෙනවා.

පොහොර ප්‍රශ්නය ඉවර වෙච්ච ගමන් පටන් ගන්නවා, වී මිලදී ගැනීම ගැන කථා කරන්න. වී මිලදී ගැනීමට ඔබතුමන්ලා මුදල් වෙන් කර තිබෙන බව කියනවා. Dryers සවි කරන්න කියලා මුදලක් වෙන් කරලා තිබෙනවා. ඔබතුමන්ලා කවද්ද මේ මුදල් ටික භාණ්ඩාගාරයෙන් නිදහස් කරගන්නේ? මේ මැෂින් ටික අරගෙන යන්නේ කවද්ද, මේවා ස්ථානගත කරන්නේ කොහේද, කොයි විධියටද මේකෙන් ගොවීන්ට අවශ්‍ය ශක්තිය ලබා දෙන්නේ කියලා ඔබතුමන්ලා සතුව යම් සැලැස්මක් තිබෙනවාද? පසුගිය මහ කන්නයේ වී මිලදී ගන්න කොච්චර සල්ලි වෙන් කළාද? ඒකෙන් ඔබතුමන්ලාට කොච්චර වී ප්‍රමාණයක් මිලදී ගන්න පුළුවන් වුණාද? ඒ කන්නයේ මෝල් හිමියා වැඩි මිලක් දීලා වී ටික ගත්තා. හැබැයි, යල කන්නයට එනකොට පෞද්ගලික වෙළෙන්දාගෙන් ඒ සහනය ලැබුණේ නැහැ. ඔබතුමන්ලාට යම් කිසි ප්‍රමාණයක් වී මිලදී ගන්න පුළුවන්කම ලැබුණා. හැබැයි, ඒ ගත්ත ක්‍රමය සාධාරණද? ගොවීන්ගෙන්මද ගත්තේ?

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

අතරමැදියන්ගෙන්ද ගත්තේ? කොමිස්කාරයන්ගෙන්ද ගත්තේ? ප්‍රායෝගිකව මේ ගොවීන්ට සාධාරණයක් ඉෂ්ට වුණාද කියන එක ඔබතුමාගේ හෘදය සාක්ෂිය දන්නවා. හැබැයි, මේ සඳහා හැම රජයක්ම උත්සාහ කරනවා.

ඔබතුමන්ලා දැන් කෘෂි කර්මාන්තය සම්බන්ධව කථා කළා. බොහොම පැහැදිලියි, හරි ලස්සනයි, අහගෙන හිටියාම හොඳයි. ඔබතුමන්ලා කියන විධියට දැන් කෘෂි කර්මාන්තයේ ප්‍රශ්න අවසන් වෙලා තිබෙන්නේ.

හැබැයි අපි දැක්කා, අපේ හඳුන්නෙත්ති ඇමතිතුමා CID එකට ගිහින් පැමිණිල්ලක් දැම්මා. එතුමාට call කළේ ඇයි කියලා දැන් CID එකට හොයන්න වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට call කළේ ඇයි කියලා අහන්න හෙට ඔබතුමාට CID එකට යන්න වෙයිද දන්නේ නැහැ. ගොවීන්ට ඔබතුමන්ලාට call කරන්න සිදුවන තත්ත්වයන් ඇති කරන්න එපා. මේ රටේ ඉතිහාසය පුරාවටම අහිංසක ගොවි ජනතාව විශාල වශයෙන් අපහසුතාවකට පත් වුණා. එක ප්‍රශ්නයකට විසඳුම් හොයනකොට තව ප්‍රශ්න 10ක් නිර්මාණය වනවා. එහෙම නොවන්න, සැබැවින්ම මේ ප්‍රශ්න විසඳන්නට ඕනෑ කරන තත්ත්වය අපි අවබෝධ කරගන්න ඕනෑ. මෙහිදී පොහොර සහනාධාරයෙන්, වී මිලදී ගැනීමෙන් ඔබ්බට ගිය කරුණු-කාරණා ගණනාවකට අපි මුහුණ දෙන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. ගොවීන් වගා කරන භෝගවල නිෂ්පාදනය වැඩි කරන්න, අවශ්‍ය ප්‍රමාණයෙන් අවශ්‍ය ප්‍රභේද වගා කරන්න අපි ඔවුන්ව පොලඹවන්න ඕනෑ.

දැන් වී අස්වැන්න මෙච්චර වැඩි වුණා කියනවා. හැබැයි, අපට කිරි සම්බා රටින් ගෙන්වන්න සිදු වෙලා තිබෙනවා. පසුගිය මහ කන්නයේදී කිරි සම්බාවලට මොකද වුණේ? නාඩුවලට වැඩිය කිරි සම්බා මිල පහළ බැස්සා. මොකද, කිරි සම්බා වගා කරන්නේ මහ කන්නයේයි. එතකොට මහ කන්නයේ කිරි සම්බා ටික මිලදී ගන්න ඔබතුමන්ලා විශේෂ වැඩසටහනක් හැදුවාද? යල කන්නයේ කිරි සම්බාවත්, සම්බාවත් වගා කරන්නේ නැහැ නේද, ඇමතිතුමනි? අපි සාමාන්‍යයෙන් යල කන්නයේ වගා කරන්නේ බාල වී කියලානේ කියන්නේ. අඩු කාලයකින් අස්වැන්න ලැබෙන වී තමයි යලට වගා කරන්නේ. ඒ නිසා නාඩු අස්වැන්නත් වැඩියි. එතකොටයි අනික් වී අස්වැන්න අපට නැති වෙන්නේ.

අනෙක් කාරණය මේකයි. ඔබතුමන්ලා කයිවාරු ගහන්න එපා, ඔබතුමන්ලාගේ කෙරුවාව නිසා මේ යල කන්නයේ අස්වැන්න වැඩි වුණා කියලා. මේ කන්නයට ස්වභාව ධර්මයේ ආශීර්වාදය ලැබුණා. මේ මොහොතේ ස්වභාව ධර්මය කුරිරු වෙලා තිබුණාට, යල කන්නයේදී අපට ස්වභාව ධර්මය ආශීර්වාද කළා. ඒ නිසා තමයි යල කන්නයේදී ඉතිහාසයේ වැඩිම අස්වැන්න ලැබුණේ. ඒක ආණ්ඩුවේ දක්ෂතාව නොවෙයි. ඔබතුමන්ලාට ස්වභාව ධර්මය පාලනය කරන්න පුළුවන් නම්, ස්වභාව ධර්මයට එරෙහිව කටයුතු කරන්න පුළුවන් නම්, මේ ව්‍යසන තත්ත්වය පාලනය කරලා ඔබතුමන්ලාගේ දක්ෂතාව පෙන්වන්න ඕනෑ. ඒ යල කන්නයේ වී අස්වැන්න වැඩි වුණේ, ස්වභාව ධර්මයෙන් අපට නිසි වෙලාවට වර්ෂාව ලැබුණු නිසායි. කවදාවත් නැති විධියට යල කන්නයේදී අපේ වැව් ටික පිරිලා ඉතිරිලා යන තත්ත්වයට පත් වුණා. ඒ නිසා ඒ දේවල්වලින් ඔබතුමන්ලා ලකුණු දාගන්න යන්න එපා. ඒක අපට ආශීර්වාදයක්. එහෙම වර්ෂාව ලැබෙනකොට අපේ වී ගොවියා ආරක්ෂා වුණා.

අපි වී, බඩඉරිඟු ඇතුළු ප්‍රධාන භෝග ගැන විතරක් කථා කරනවා. එතැනින් එහාට එළවලු වගාවත් තිබෙනවා. අපේ රටේ වගා කළ හැකි භෝග වර්ග ආනයනය කරන්න අපි රුපියල් බිලියන 1,000කට වැඩිය වැය කරනවා. හැබැයි, ඒවා අපේ රටේ වගා කළ හැකියි. නමුත්, ඒකට අපට සැලැස්මක් නැහැ. ඔබතුමා වෙළෙඳ පොළ ජයග්‍රහණය කරන්න කටයුතු කරන්න කියලා ගොවියාට කිව්වාට, ගොවියාට ඒකට ශක්තිය නැහැ. ඔබතුමන්ලා අද ඩිජිටල් ආර්ථිකයක් ගැන කථා කරනවා; ඩිජිටල්කරණය ගැන කථා කරනවා. මේ රටේ එක භෝගයකට එක සංවිධානයක්, එක සමුපකාර සමිතියක් වැනි මොකක් හරි ව්‍යුහයක් හදලා මේ රටේ පොළොව බෙදලා ගන්න අපට බැරි ඇයි?

එක එක භෝගයට ගැළපෙන භූමි තිබෙනවා. මෙහිදී ඒ භූමිවල පස පරීක්ෂා කරලා, ඒ පසට හරියන භෝගය හඳුන්වා දීලා, ඒ භෝගය වගා කරන සමිතියක් නිර්මාණය කිරීම ඉතාම වැදගත් වනවා. ඒ වාගේම ඔවුන්ගේ වෙළෙඳ පොළ අවශ්‍යතා වෙනුවෙන් දඹුල්ල හෝ වෙනත් ආර්ථික මධ්‍යස්ථානයක් හරහා ශ්‍රී ලාංකිකයන්ගේ දවසේ පරිභෝජනයට අවශ්‍ය භෝග ටික වෙළෙඳ පොළට එන්න පුළුවන් ක්‍රමවේදය හදන්න පුළුවන් නම් අපට බීජ ප්‍රශ්නයත් විසඳාගන්න පුළුවන් වනවා. දවසකට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි lot එකක් එක සැරේ වෙළෙඳ පොළට ආවාම ඒ වෙළෙඳ පොළ කඩාගෙන වැටෙනවා. ඒ තත්ත්වය ඇති නොවන්න අපි කටයුතු කළ යුතුයි. අද දවසේ ඉල්ලුම මෙච්චරයි, සැපයුම් මෙච්චරයි කියලා ගොවියා දන්නවා නම් එතකොට ඔහුට කුඹුරේ ඒ කොටස පැහෙන්න අරින්න පුළුවන්. එතකොට ඉතිරි ටික බීජවලට ගන්න පුළුවන්.

ඒ නිසා මේ ක්‍රමවත් සැලැස්ම හදන්නේ නැතුව ඔබතුමා මොනවා කිව්වත් වැඩක් නැහැ, ගරු ඇමතිතුමනි. මේ වෙළෙඳ පොළ ජයග්‍රහණය කරගන්න ගොවියාට ශක්තිය දෙන්න. අපි හාල් ප්‍රශ්නයේයි, වී ප්‍රශ්නයේයි, පොහොර සහනාධාරයේයි එල්ලී එල්ලී සිටියා කියලා ගොවියාට සාධාරණයක් ඉෂ්ට වන්නේ නැහැ. ඒ වෙනුවෙන් නිසි සැලැස්මක් ඇතුව කටයුතු කරන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ සඳහා දෙන්න පුළුවන් සහයෝගය දෙන්න අපි ලැහැස්තියි.

ඒ වාගේම වාරිමාර්ග ගැන කථා කරන්නත් මට බොහෝ කරුණු-කාරණා තිබෙනවා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමාම කියනවා, "නුවර වැව මගේ වැව" කියලා. මොකද, ඒක ඔබතුමාගේ ගෙදරට අල්ලපු වැටේ තිබෙන්නේ. ඔබතුමා ගෙදරින් එළියට බහින්නේ නුවර වැව දිහා බලාගෙන. ඒ හින්දා තමයි ඔබතුමා කියන්නේ, "නුවර වැව මගේ" කියලා. නමුත් ඒක ඔබතුමාගේ බූදලය නොවෙයි. ඔබතුමාගේ උපන් ගමේ, උපන් ප්‍රදේශයේ වැව. හැබැයි, අද ඔබතුමා ඩඩ්ලිට පාර පෙන්වන්න ගිහිල්ලා, පරාක්‍රම සමුද්‍රය ගැන කථා කරලා නන්නත්තාර කළේ කවුද? අනුරාධපුරයේ නුවර වැව ආශ්‍රිත පදිංචිකරුවන්ව. අද ඒවායේ පදිංචි පවුල් නවසිය ගණනකට වැඩිය නන්නත්තාර වෙලා. ඒ ඉඩම්වල තිබුණු වටිනාකම අද තුට්ටුවට බැහැලා. ඒ අය සරණාගතයන් බවට පත්වෙලා, අනාථයන් බවට පත්වෙලා. ඔබතුමන්ලා එතැන වැඩක් කළේත් නැහැ, ඉඩම් පවරා ගැනීම කළේත් නැහැ. මොකක්ද කරන්නේ කියලා හිතාගන්න බැරි තැනට ඒ අය දැන් පත් වෙලා. දේශපාලනික වශයෙන් යම් යම් අයගෙන් පළිගන්න හිතාගෙන ඔබතුමන්ලා තීන්දු ගත්තා. හැබැයි, අදාළ නිලධාරි මහත්ම මහත්මීන්ගේ අනුදැනුම මත දේශපාලනඥයා තමන්ගේ භූමිය උස්සාගත්තා. එතකොට ඒ අය ඒ සීමාවෙන් පිට. ඒ අය වැව් රක්ෂිත සීමා මායිම වන මීටර් 88.5 සීමාවට වඩා උඩට ඇවිල්ලා. හැබැයි, වැව ඇතුළේ ඉන්නේ. හැබැයි, භූමිය පුරවාගන්න බැරි වුණු අහිංසක මිනිස්සු ඉන්නවා. අද මීටර් 88.5 සීමාව කියලා නිර්ණායකයක් ගෙනැල්ලා තිබෙන නිසා, ඒ ජනතාව ඒකට ඇතුළත් වෙලා තිබෙනවා. දැන් ඒ අය තමන්ගේ භූමිය තුළ සරණාගතයන් බවට පත්වෙලා, අනාථයන් බවට පත්වෙලා. මුදල් ගෙවලා ඔප්පුත් එක්ක ඉඩම් මිලදී ගත් පිරිස් අද රක්ෂිත බලහත්කාරයෙන් අල්ලාගත් පිරිසක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා "උරුමය" අද කරුමය බවට පත් කරලා තිබෙනවා. උරුමයද, කරුමයද, හිමිකමද නැත්නම් ජය භූමිද, ස්වර්ණ භූමිද මොකක්ද කියන එක අද වැදගත් නැහැ, වැඩක් නැහැ. ඒ මිනිස්සුන්ට ඒ භූමියේ අයිතිය ලබා දීලා නිදහසේ ජීවත් වෙන්න පුළුවන් අවස්ථාව උරුම කරලා දෙන්න.

නුවර වැව ඔබතුමාගේ වැව වෙන්න පුළුවන්. ඔබතුමාට ඒ හැඟීම තිබෙනවා නම් අපට සතුටුයි. මහනුවරින් දේශපාලනය කළාට ඔබතුමාට තවමත් අනුරාධපුරයේ ගැමි සුවඳ දැනෙනවා කියලා මේකෙන් අපට පෙනෙනවා. නුවර වැවට "මගේ වැව" කියන්න ඔබතුමාට අභිමානය එනවා නම් හොඳයි. නුවර වැව වටේට ඉන්නේ ඔබතුමන්ලා පෝෂණය කළ අයම තමයි. ඒ භූමිය ඇතුළේ ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුනුත් ඉන්නවා නේ. එම නිසා මේ කටයුතු කරනකොට ඒ ජනතාවට සාධාරණයක් ඉටු කරන්න. ඒ අය එළවන්නත් බැහැ. මෙහිදී එක් එක් කාලයට වෙනස් නොකර එක නිර්ණායකයක් මත ඉඳගෙන කටයුතු කරන්න. දැන් ඒ වැව් රක්ෂිත සීමාව මීටර් 90.5ක් දක්වා වෙනස් කරන කථාවකුත් තිබෙනවා. මීටර් 90.5ක් කළොත් තව කී දෙනෙකුට මේ ප්‍රශ්න එනවාද? එම නිසා හරි නිර්ණායකයකට එන්න. දැන් මේක එක තැනකින් ඉවර කරලා, මෙතැනින් මතුවට ඒ භූමිවල අයිතිය අරක්ෂා වන විධියට සහ ඒ භූමිය අල්ලා ගන්නේ නැති තැනට කටයුතු සකස් කරන්න කියන එක අපි ඔබතුමාට බොහොම ගෞරවයෙන් කියනවා. ඒක ඔබතුමාගේ වැව නම්, ඒක ඔබතුමාගේ භූමිය නම්, ඒක ඔබතුමා දන්නා තැන නම් ඒ මිනිස්සුන්ට සාධාරණයක් ඉටු කරන්න. අද අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටින ඒ මිනිස්සු කරකියා ගන්න දෙයක් නැති තැනට පත්වෙලායි ඉන්නේ. අද අනුරාධපුර දිස්ත්‍රික්කයේ එවැනි තැනක තිබෙන ඉඩම්වල වටිනාකම බැලුවොත්, ඒක අනුරාධපුරය නගරයේ සංවර්ධනයට විශාල වටිනාකමක් දෙන භූමියක්. ඒ නිසා දැන්වත් මේ සඳහා ක්‍රමවත් සැලැස්මක් හදන්න. එතැන සිටින අයට සාධාරණයක් ඉෂ්ට වන විධියේ සැලැස්මක් හදලා, අපට සංචාරක කර්මාන්තය ගොඩනඟා ගන්නත්, එම ඉඩම්වල වගා කරන ගොවීන් ආරක්ෂා කරන්නත් ඔබතුමා සැලැස්මක් ඇතිව කටයුතු කරන්න.

අපි දේශපාලන මතවාද අයින් කරලා, ඒවා පැත්තකින් තියලා, සැබෑවම මිනිස්සු කියන තැන ඉඳලා කටයුතු කරමු. අපේ දිස්ත්‍රික්කයේ සංවර්ධනයත් අවශ්‍යයි, ගොවියාගේ අවශ්‍යතා ඉටු කරන එකත් අවශ්‍යයි. එම නිසා මේ කියන කාරණා සියල්ල දෙසම බලාගෙන නුවර වැව අවට පදිංචි ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න. නුවර වැව ඇතුළු රක්ෂිත තුළ සිටින දේශපාලනඥයන්ගෙන් පළි ගන්න ඕනෑ කියන කාරණය අමතක කරලා, මේකට සාධාරණ සහ නිදහස් විසඳුමක් ලබා දෙන්න කටයුතු කරලා, ඒ අය ළඟ තිබෙන වටිනා ඔප්පු ටික සුරක්ෂිත කරන්න කටයුතු කරන්න.

ඒ වාගේම "උරුමය" හරහා ඔප්පු ලබා දීම වෙනුවට, ඔබතුමන්ලා දේශපාලන කෝණයෙන් බලලා අද ඒක "හිමිකම" විධියට නම් කරලා තිබෙනවා. කමක් නැහැ. "හිමිකම" හරහා හෝ ඒක කරන්න. මේ වන විට රජය සතුව යම් ඔප්පු ප්‍රමාණයක් තිබෙනවා. අද සමහර ඉඩම් හිමියන්ට තමන්ගේ ඉඩම සඳහා කිසිදු ලියවිල්ලක් නැහැ. Duplicate ඔප්පුවක්, නැත්නම් photocopy එකක් විතරයි තිබෙන්නේ. එම නිසා මොකක් හෝ ක්‍රමයකින්, "හිමිකම" නැත්නම් "ඉලපත" කියලා හරි නමක් දාලා ඒ ඔප්පු ටික ලබා දෙන්න කටයුතු කරන්න කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස්වේ.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද දින සභාවේ වැඩකටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී. -***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பட்டது.-*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. -*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ.ඩී. ලාල් කාන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.53]

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K. D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අමාත්‍යාංශයට අදාළ නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනාත්, ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය ඇමතිවරු සහ මන්ත්‍රීවරුනුත් විපක්ෂය මතු කරපු සරල ප්‍රශ්නවලට මම හිතන විධියට ගැඹුරු උත්තර ලබා දුන්නා. ඒක නිසා මට අමුතුවෙන් පිළිතුරු කථාවක් කරන්න වුවමනාවක් නැහැ.

දැන් උරුමයක් ගැන කිව්වා නේ. උරුමයේයි, හිමිකමේයි තිබෙන වෙනස දන්නේ නැත්නම් ඊයේ සභාව කල් තබන අවස්ථාවේ විවාදය අහන්න කියලා මම එතුමන්ලාට කියනවා. ඒ සම්බන්ධයෙන් අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඊයේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒක හොඳ, වැදගත් යෝජනාවක්. දයාසිරි මන්ත්‍රීතුමා ඒ යෝජනාව ස්ථිර කළා. අපි පාර්ලිමේන්තුවේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විධියට ඒ ගැන සාකච්ඡා කළා. ඒ විවාදය අහන්න. ඒ වෙලාවේ සභාවේ හිටියේ නැති වුණාට කමක් නැහැ. එතකොට මේ ගොඩක් ප්‍රශ්නවලට උත්තර ලැබෙනවා.

අද මේ සභාවේ සාකච්ඡා නොවුණු පොඩි කාරණයක් මම අහන්නද? ආහාර සම්බන්ධයෙන් ගත්තාම, අපේ රටේ එක භාණ්ඩයකවත් හිඟයක් තිබෙනවා කියලා මේ සභාවේදී එක වචනයක් කියැවුණේ නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශයත්, වෙළෙඳ අමාත්‍යාංශයත්, අපේ නිලධාරි මහත්ම, මහත්මීනුත් සම්බන්ධවෙලා ආහාර සුරක්ෂිතතා කමිටුවක් පවත්වාගෙන යනවා. ඒ ආයතනය හරියට ක්‍රියාත්මක වෙලා තිබෙන බවට අද මේ පාර්ලිමේන්තුවේදී සහතිකයක් හම්බ වෙලා තිබෙනවා. ඒ සහතිකය තමයි, ආහාරවලට සම්බන්ධ කිසිම භාණ්ඩයක් හිඟයි කියලා වචනයක්වත් කියැවුණේ නැති එක. ඒ ගැන අපි සතුටු

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

වෙනවා. ඒ වාගේම "අහවල් භාණ්ඩයේ, අහවල් ආහාර ද්‍රව්‍යවල මිල වැඩියි, අහස උසට මිල ඉහළ ගිහිල්ලා. පාරිභෝගිකයා පුදුමාකාර අමාරුවකින් ඉන්නේ" කියලා එක වචනයක් කියනවා ඇහුණේ නැහැ. ගොවියාත් පාරිභෝගියෙක් නේ. නමුත්, එහෙම එක වචනයක් විපක්ෂයෙන් කියැවුණේ නැහැ. කොහෙන්වත් කියැවුණේ නැහැ. ඒ කියන්නේ, රටේ භාණ්ඩවල මිල සාධාරණ මට්ටමක තිබෙනවා කියන එකයි. ඒකයි ඒ ගැන සාකච්ඡාවක් නැත්තේ. අවශ්‍ය ප්‍රමාණයට ආහාර ද්‍රව්‍ය රටේ තිබෙනවා කියන එකත්, ඒවායේ මිල සාධාරණව තිබෙනවා කියන එකත් මම මේ මොහොතේදී මතක් කරන්න කැමැතියි. මොකද, මම එහෙම කියන්නේ ඒ ගැන කිසිවෙක් කථා නොකළ නිසායි.

ගොවියාගේ ආර්ථිකය දියුණු කරන එක තමයි අපේ වගකීම. ආහාර සුරක්ෂිතතාව එක පැත්තක්. අනෙක් පැත්තෙන්, ගොවියාගේ ආර්ථික ශක්තිය වැඩි කරන්න ඕනෑ. ඒකට අදාළ වැඩ කටයුතු ගොඩාක් කරගෙන යනවා; එවැනි වැඩ කටයුතු ගොඩාක් කරගෙන ඇවිල්ලාත් තිබෙනවා. ඒ කටයුතු සියල්ල සම්පූර්ණ වෙලාත් නැහැ. ඒ වෙනුවෙන් මෙවර අපේ අමාත්‍යාංශයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් වෙලාත් තිබෙනවා. එම නිසා ඒ කටයුතු අපි හරියාකාරව සම්පූර්ණ කරනවා. සමහරු තේරුමක් නැතුව කියපු දේවල්වලට උත්තර දීලා වැඩක් නැහැ.

මිනිස්සු කඳු මුදුන්වලටත් නැඟලා ඒවායේ පදිංචි වනතුරු ආණ්ඩු බලාගෙන හිටියා. අද ඔවුන් ආපදාවලට ලක් වෙනවා. මිනිස්සු ගංගා ද්‍රෝණි, ගංගා නිම්න ආශ්‍රිතව පදිංචි වනතුරු ආණ්ඩු බලාගෙන හිටියා. මිනිස්සු වැව් තාවුල්ලත් අල්ලලා, වැව් රක්ෂිත ප්‍රදේශත් අල්ලලා, වැවටත් බැහැලා, වැවත් අල්ලාගෙන අපට දැන් කියනවා, ඒ වැවේ ඉන්න දෙන්නය කියලා. නමුත්, අපි ඔවුන්ට එහෙම ඉන්න දෙන්නේ නැහැ. ඉතාම පැහැදිලිව, වැව් ආශ්‍රිතව ඉන්න ජනතාව ඉවත් කරනවා, ඒ ජනතාවට වඩාත් හොඳ තත්ත්වයක් ලබා දෙමින්. ඒ කටයුත්ත සිදු කරන්නේ ජනතාවට හානියක් සිදු වන ආකාරයට නොවෙයි. වැව් ආශ්‍රිත ඉඩම් අපි ගන්නවා. ඒ අයට අලුතින් ඉඩම් දෙනවා. ඒ අයට ඒ සඳහා අවශ්‍ය කරන වන්දි ද, අවශ්‍ය පහසුකම් ද අපි සපයනවා.

මහවැලිය කරද්දී නගර පිටින් නේ, යට වුණේ. ඒ නිසා ජනතාව වෙනම ප්‍රදේශවල තමයි පදිංචි කළේ. ඒක කරන්න වෙනවා. දැන් මේ ආපදා තත්ත්වයේදීත් සිද්ධ වෙන්නේ මොකක්ද? කඳු උඩ වාගේම තැන් තැන්වල ඉන්න ජනතාව ඒ ස්ථානවලින් ඉවත් කරන්න සිද්ධ වෙනවා. අපි පිළිගන්න ඕනෑ, අවිධිමත් ජනාවාසකරණයක් මේ රටේ සිද්ධ වෙලා තිබෙන බව. අවිධිමත් පදිංචිවීම් මේ රටේ සිද්ධ වෙලා තිබෙනවා. වනජීවී එකට අයිති භූමිය තුළත්, අලිමංකඩත් කියන හැම තැනම ජනතාව පදිංචි වෙලා. ඒවාට තමයි 76 අවුරුදු ශාපය කියලා කියන්නේ. වෙන මොකක්වත් නොවෙයි. අවුරුදු 76ක් රට අයාලේ ගිහිල්ලා, ඔක්කොම සිද්ධ වෙලා, ඔක්කොම විනාශ වෙලා සමහර අය වාචාලකමට තව කයිවාරු ගහන්නත් එනවා. කිසිම හරයක් නැහැ, ඒ දේවල්වල. අපේ මහනුවර දිස්ත්‍රික්කයේ ජයරත්න මන්ත්‍රීතුමා හොඳ අදහස් සහ යෝජනා ප්‍රමාණයක් ඉදිරිපත් කළා. මම ඒ සම්බන්ධයෙන් සතුටු වෙනවා.

ඒ වාගේම, පොළොන්නරුවේ අපේ කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා බොහොම හොඳ යෝජනා ප්‍රමාණයක් ඉදිරිපත් කළා. පරාක්‍රම සමුද්‍රයේ සොරොව්වෙන් යන වතුර පාර ඇළේ පහළට යන්න යන්න වැඩි වෙලා තිබෙනවාය කියන එක ඇත්ත. ඒ නිසා වතුර විශාල ප්‍රමාණයක් නාස්ති වෙනවා. ඒ සම්බන්ධයෙන් අපි අවබෝධයකින් තමයි කටයුතු කරන්නේ. ඒ නිසා නිකම් ගැඹුරක් නැතුව, හරයක් නැතුව, අවබෝධයක් නැතුව ඉදිරිපත් කරපු කරුණු සම්බන්ධයෙන් මම උත්තර බඳින්නේ නැහැ. මට ලැබී තිබෙන්නේ විනාඩි 10ක් නිසා මම ඒ වේලාව දීර්ඝ කරගන්නත් බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද, අවශ්‍ය උත්තර ලැබිලා තිබෙනවා. ගයන්ත කරුණාතිලක මැතිතුමාත් ඉඩම් අමාත්‍යවරයා විධියට කටයුතු කළා. එතුමාත් හොඳ යෝජනා ප්‍රමාණයක් ඉදිරිපත් කළා. ඒ නිසා වගකීමෙන් යුතුව යෝජනා ඉදිරිපත් කරපු විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ට වාගේම ආණ්ඩු පක්ෂය පැත්තෙන් මැදිහත් වෙලා කටයුතු කරපු, පිළිතුරු දීපු සියලුම ඇමතිවරුන්ට සහ මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙනවා. ඔක්කොටම කලින් මම කියන්න ඕනෑ, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය සහ කාර්ය මණ්ඩලය විශාල වෙහෙස මන්සියක් දරලා අපට මේ කටයුතු හොඳින් කරගෙන යාම සඳහා අවශ්‍ය සියලුම තත්ත්වයන් සම්පාදනය කර දී තිබෙන බව. එතුමිය ඇතුළු මුළු කාර්ය මණ්ඩලයටත් මම මේ අවස්ථාවේදී ඇමතිවරයා විධියට මගේ ස්තුතිය පළ කරනවා. ඒ වාගේම තමයි, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ කාර්ය මණ්ඩලය, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩලයත්. අපට ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ ආයතනවල සභාපතිතුමන්ලා, අධ්‍යක්ෂ මණ්ඩල සහ කාර්ය මණ්ඩල විසින් අපේ අමාත්‍යාංශයේ කටයුතු සාර්ථකව කරගෙන යන්න විශාල කැප කිරීමක් කරනවා. ඒ සියලුදෙනාටත් මම ස්තුතිවන්ත වෙනවා.

ඇත්තටම මේ විවාදය අදාළ වෙන්නේ විපක්ෂයට. මේක විපක්ෂයේ විවාදය. මේ විවාදය අවසන් කරන්න දැන් කාලය ඇවිල්ලා තිබෙනවා. අවසාන වශයෙන් ඒ සියලුදෙනාට මම ස්තුතිවන්ත වෙනවා. අද ඡන්දයක් තියන්න යෝජනාවක් ඇවිල්ලා තිබුණා. මම උදේ කථා කරද්දී ඉල්ලීමක් කළා, ඡන්දය නොතියා අවශ්‍ය මන්ත්‍රීවරුන්ට තමතමන්ගේ ප්‍රදේශවලට යන්න ඉඩ හදා දෙමු කියලා. ඒකට විපක්ෂයෙන් සහයෝගයක් ලැබුණා. ඒ අනුව ඒ අය දැනටමත් ඒ ආපදා සිදු වුණු ප්‍රදේශවලට පිටත්ව ගිහිල්ලා තිබෙනවා. ඒ වෙනුවෙන් මැදිහත් වෙච්ච විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඇතුළු සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
## கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு
## MINISTRY OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 90,000,000,000 |
| මූලධන | රු. 131,300,000,000 |

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 11 හා 12 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

| | |
|---|---|
| 'පුනරාවර්තන | රු. 90,150,000,000 |
| මූලධන | රු. 138,900,000,000' " |

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 90,150,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 138,900,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 90,150,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 138,900,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 90,150,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 138,900,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 4,294,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 277,000,000

"118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 277,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 4,294,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 277,000,000

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 277,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 4,294,000,000, for Head 118, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 277,000,000

Question, "That the sum of Rs. 277,000,000, for Head 118, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 49,453,000,000; මූලධන වියදම, රු. 97,089,000,000**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 49,453,000,000; மூலதனச் செலவு, ரூபாய் 97,089,000,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 49,453,000,000; Capital Expenditure, Rs. 97,089,000,000

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 118 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා:

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

*මතු පළ වන යෝජනාව සභා සම්මත විය:*
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"19 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02

සංවර්ධන වැඩසටහන - රු. 49,453,000,000 රු. 102,389,000,000' "

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අය වැය යෝජනා අංක 21,25, 27, හා 34 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින්, වැය ශීර්ෂ අංක 118 - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරි මාර්ග අමාත්‍යවරයා සඳහා මූලධන ප්‍රතිපාදන රු. 5,300,000,000කින් වැඩි කිරීමයි.)

"118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 49,453,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 102,389,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 49,453,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 102,389,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப் பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளை யிடப்பட்டது.

Question, "That the sum of Rs. 49,453,000,000, for Head 118, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 102,389,000,000, for Head 118, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

### 281 වන ශීර්ෂය.- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 1,000,000,000

"281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,000,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 90,000,000

"281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 90,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 12,107,000,000

"281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 12,107,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 4,270,000,000

"281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 4,270,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 282 වන ශීර්ෂය.- වාරිමාර්ග දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 1,066,000,000

"282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,066,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 129,000,000

"282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 129,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 4,086,000,000

"282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 4,086,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 20,609,000,000

"282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 20,609,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 285 වන ශීර්ෂය.- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 837,000,000

"285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 837,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 73,000,000

"285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 73,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 7,037,000,000

"285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 7,037,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 4,413,000,000

"285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 4,413,000,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 286 වන ශීර්ෂය.- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 804,000,000

"286 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 804,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

286 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු.126,000,000

"286 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 126,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

286 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 287 වන ශීර්ෂය.- ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 986,000,000

"287 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 986,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

287 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 38,000,000

"287 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 38,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

287 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 288 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

01වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 389,000,000

"288 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 389,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

288 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන. -මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 179,000,000

"288 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 179,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

288 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 4,983,000,000

"288 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 4,983,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

288 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 652,000,000

"288 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 652,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

288 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 289 වන ශීර්ෂය.- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,230,000,000

"289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,230,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,492,000,000

"289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,492,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 281.- கமநல அபிவிருத்தித் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,000,000,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,000,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 90,000,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 90,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 12,107,000,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 12,107,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 4,270,000,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 4,270,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 282.- நீர்ப்பாசனத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,066,000,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,066,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 129,000,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 129,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 4,086,000,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 4,086,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 20,609,000,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 20,609,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 285.- கமத்தொழில் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 837,000,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 837,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 73,000,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 73,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 7,037,000,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 7,037,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 4,413,000,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 4,413,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 286.- காணி ஆணையாளர் நாயகம் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 804,000,000

"தலைப்பு 286, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 804,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 286, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 126,000,000

"தலைப்பு 286, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 126,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 286, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 287.- காணி உரித்து நிர்ணயத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 986,000,000

"தலைப்பு 287, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 986,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 287, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 38,000,000

"தலைப்பு 287, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 38,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 287, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 288.- இலங்கை நில அளவையாளர் நாயகம் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 389,000,000

"தலைப்பு 288, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 389,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 288, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 179,000,000

"தலைப்பு 288, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 179,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 288, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02 .- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 4,983,000,000

"தலைப்பு 288, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 4,983,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 288, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 652,000,000

"தலைப்பு 288, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 652,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 288, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 289.- ஏற்றுமதி கமத்தொழில் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,230,000,000

"தலைப்பு 289, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,230,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 289, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 1,492,000,000

"தலைப்பு 289, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 1,492,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 289, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 281.- DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,000,000,000

Question, "That the sum of Rs. 1,000,000,000, for Head 281, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 90,000,000

Question, "That the sum of Rs. 90,000,000, for Head 281, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 281, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 12,107,000,000

Question, "That the sum of Rs. 12,107,000,000, for Head 281, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 4,270,000,000

Question, "That the sum of Rs. 4,270,000,000, for Head 281, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 282.- DEPARTMENT OF IRRIGATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,066,000,000

Question, "That the sum of Rs. 1,066,000,000, for Head 282, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 129,000,000

Question, "That the sum of Rs. 129,000,000, for Head 282, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 282, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 4,086,000,000

Question, "That the sum of Rs. 4,086,000,000, for Head 282, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 20,609,000,000

Question, "That the sum of Rs. 20,609,000,000, for Head 282, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 285.- DEPARTMENT OF AGRICULTURE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 837,000,000

Question, "That the sum of Rs. 837,000,000, for Head 285, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 73,000,000

Question, "That the sum of Rs. 73,000,000, for Head 285, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 285, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs.7,037,000,000

Question, "That the sum of Rs. 7,037,000,000, for Head 285, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 4,413,000,000

Question, "That the sum of Rs. 4,413,000,000, for Head 285, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 286.- DEPARTMENT OF LAND COMMISSIONER GENERAL

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 804,000,000

Question, "That the sum of Rs. 804,000,000, for Head 286, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 286, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 126,000,000

Question, "That the sum of Rs. 126,000,000, for Head 286, Programme 02, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 286, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 287.- DEPARTMENT OF LAND TITLE SETTLEMENT

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 986,000,000

Question, "That the sum of Rs. 986,000,000, for Head 287, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 287, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 38,000,000

Question, "That the sum of Rs. 38,000,000, for Head 287, Programme 02, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 287, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 288.- DEPARTMENT OF SURVEYOR GENERAL OF SRI LANKA

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 389,000,000

Question, "That the sum of Rs. 389,000,000, for Head 288, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 288, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 179,000,000

Question, "That the sum of Rs. 179,000,000, for Head 288, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 288, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 4,983,000,000

Question, "That the sum of Rs. 4,983,000,000, for Head 288, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 288, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 652,000,000

Question, "That the sum of Rs. 652,000,000, for Head 288, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 288, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 289.- DEPARTMENT OF EXPORT AGRICULTURE

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 1,230,000,000

Question, "That the sum of Rs. 1,230,000,000, for Head 289, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 289, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,492,000,000

Question, "That the sum of Rs. 1,492,000,000, for Head 289, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 289, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**292 වන ශීර්ෂය.- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,040,000,000

"292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,040,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 98,000,000

"292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 98,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

292 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 292.- கால்நடை உற்பத்தி மற்றும் சுகாதாரத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,040,000,000

"தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,040,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 98,000,000

"தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 98,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 292.- DEPARTMENT OF ANIMAL PRODUCTION AND HEALTH

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,040,000,000

Question, "That the sum of Rs. 1,040,000,000, for Head 292, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 292, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 98,000,000

Question, "That the sum of Rs. 98,000,000, for Head 292, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 292, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,697,000,000**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 1,697,000,000

Programme 02.- Development Activities - Capital Expenditure Rs. 1,679,000,000

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 292 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා:

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"20 වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

'වැඩසටහන 02

සංවර්ධන වැඩසටහන - රු. 3,697,000,000' "

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අය වැය යෝජනා අංක 19 හා 22 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින්, වැය ශීර්ෂ අංක 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සඳහා මූලධන ප්‍රතිපාදන රු. 2,000,000,000කින් වැඩි කිරීමයි.)

"292 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,697,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

292 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 3,697,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 292, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 3,697,000,000, for Head 292, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 292, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

**327 වන ශීර්ෂය.- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 688,000,000

"327 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 688,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

327 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 68,000,000

"327 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 68,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

327 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 327.- காணிப் பயன்பாட்டு கொள்கைத் திட்டமிடல் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 688,000,000

“தலைப்பு 327, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 688,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 327, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 68,000,000

“தலைப்பு 327, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 68,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 327, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 327.- DEPARTMENT OF LAND USE POLICY PLANNING

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 688,000,000

Question, "That the sum of Rs. 688,000,000, for Head 327, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 327, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 68,000,000

Question, "That the sum of Rs. 68,000,000, for Head 327, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 327, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**337 වන ශීර්ෂය.- කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව**

**தலைப்பு 337.- கறுவா தொழிற்றுறை அபிவிருத்தித் திணைக்களம்**

HEAD 337.- DEPARTMENT OF CINNAMON DEVELOPMENT

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 337 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"20 වන පිටුවේ, 17 වන පේළියට ඉනික්බිතිව පහත සඳහන් අයිතම ආදේශ කළ යුතු ය:

'ශීර්ෂ 337 - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන - රු. 150,000,000 රු. 300,000,000' "

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව වැය ශීර්ෂ අංක 337 - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා වෙන්කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු.150,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු.300,000,000ක්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය වෙත මාරු කිරීමයි.)

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 150,000,000

"337 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 150,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

337 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 300,000,000

"337 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 300,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

337 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 150,000,000

“தலைப்பு 337, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 150,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 337, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 300,000,000

“தலைப்பு 337, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 300,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 337, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 150,000,000

Question, "That the sum of Rs. 150,000,000, for Head 337, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 337, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 300,000,000

Question, "That the sum of Rs. 300,000,000, for Head 337, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 337, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ.භා. 6.06ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් විය.***
***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 නොවැම්බර් 28වන සිකුරාදා.***

*பி.ப. 6.06 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் அக்கிராசனத் தினின்று அகன்றார்கள்.*
*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 நவம்பர் 28, வெள்ளிக்கிழமை.*

*At 6.06 p.m., the Hon. Presiding Member left the Chair to report Progress.*
*Committee report Progress; to sit again on Friday, 28th November, 2025.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ශීර්ෂ අංක 118, 292 සහ 337සංශෝධන සහිතව ද, ශීර්ෂ අංක 281, 282, 285-289 සහ 327 සංශෝධන රහිතව ද කාරක සභාවේදී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

## වී අලෙවි මණ්ඩලය: වාර්ෂික වාර්තා (2017)
## நெல் சந்தைப்படுத்தல் சபை: வருடாந்த அறிக்கை (2017)
## PADDY MARKETING BOARD: ANNUAL REPORT (2017)

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2022.01.20 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වී අලෙවි මණ්ඩලයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.02.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.02.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.) "

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වී අලෙවි මණ්ඩලය: වාර්ෂික වාර්තා (2018)
## நெல் சந்தைப்படுத்தல் சபை: வருடாந்த அறிக்கை (2018)
## PADDY MARKETING BOARD: ANNUAL REPORT (2018)

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.01.20 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වී අලෙවි මණ්ඩලයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

"පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

### ත්‍රිරෝද රථ සේවාව නියාමනය කිරීම
### முச்சக்கரவண்டிச் சேவையை ஒழுங்குறுத்தல்
### REGULATION OF THREE-WHEELER SERVICE

[අ.භා. 6.09]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය ]

"දිවයින පුරා රටේ ජනතාව වෙනුවෙන් ඉමහත් සේවයක් සිදු කරන ත්‍රිරෝද රථ කර්මාන්තය වඩාත් ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීමට ත්‍රිරෝද රථ කර්මාන්තයේ නියැළෙන පුද්ගලයන්ට වඩාත් හොඳ රැකියා තත්ත්වයක් මෙන්ම එහි ගමන් ගන්නා මගීන්ටද වඩාත් පහසු ලාභදායක ආරක්ෂිත සේවාවක් ලබා ගත හැකිය.

පසුගිය කාලය පුරා ත්‍රිරෝද රථ සේවාව සැලකිල්ලට ගැනීමේදී රිය අනතුරු විශාල සංඛ්‍යාවක් දක්නට ලැබුණු අතර, එහිදී අධික මගීන් පටවා ගෙන යාම, නොසැලකිලිමත් ධාවනය මෙම අනතුරුවලට හේතු වී ඇති බව අනාවරණය වෙලා තිබෙනවා. විශේෂයෙන් පෙර පාසල් දරුවන් රැගෙන යාමේදී ත්‍රිරෝද රථයට නොගැළපෙන ප්‍රමාණයට අනාරක්ෂිතව කටයුතු කරන බව නිරීක්ෂණය වේ. එමෙන්ම රාත්‍රී කාලයේ ධාවනය වන ත්‍රිරෝද රථවල ආරක්ෂාවද බොහෝ විට ගිලිහී ගිය අවස්ථා දක්නට ඇත.

මෙම තත්ත්වයන් සැලකිල්ලට ගෙන වඩාත් සුරක්ෂිත මගී සේවාවක් පවත්වා ගෙන යාමට පෞද්ගලිකව ධාවනයේ යෙදෙන ත්‍රිරෝද රථ සහ කර්මාන්තයක් ලෙස ධාවනයේ යොදවන ත්‍රිරෝද රථ සඳහා සුදුසු නීති රීති කටයුතු සම්පාදනය කරමින් ත්‍රිරෝද රථ නියාමනය කෙරෙහි අවධානය යොමු කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ මාතෘකාවත් එක්කම මම පුංචි කාරණාවකුත් කියන්න කැමැතියි. මේ වන විට රට තුළ ආපදා තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මුලින්ම, ඒ ආපදා තත්ත්වයට මුහුණ දී සිටින සියලු ශ්‍රී ලාංකිකයින්ට අපගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ වාගේම ගරු ජනාධිපතිතුමා, අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් උදේත්, ඒ වාගේම දවල් වරුවේත් සියලු රාජ්‍ය ආයතන හා මන්ත්‍රීවරු එකතු කරගෙන ඒ හදිසි අවස්ථාවට මැදිහත් වෙන්න ඕනෑ කටයුතු සම්පාදනය කරලා තිබෙනවා. ඒ නිසා මේ අවදානම් තත්ත්වයේදී අපි කවුරුත් රටක් විධියට එකට එකතු වෙමින් ඒ සඳහා මැදිහත් වෙමු කියන ඉල්ලීමත් මම කරනවා.

දැන් මගේ යෝජනාව සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන්න කැමැතියි. පසුගිය දවස්වල අපි දැක්කා, ත්‍රිරෝද රථයක 10දෙනෙක් ගිහිල්ලා අනතුරක් වෙනවා. එහි ඉඳලා තිබෙන්නේ පෙර පාසල් දරුවන් 8දෙනෙක් සහ තව දෙන්නෙක්. එතකොට මේ ත්‍රිරෝද රථයේ 10දෙනකු ගිහිල්ලා තිබෙනවා. විරුද්ධ පැත්තෙන් ආපු ටිපර් රථයක එක පෙර පාසල් දරුවෙකුගේ ඔළුව වැදිලා ජීවිතක්ෂයට පත් වුණා. මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මම හිතන විධියට, අපි තවමත් රටක් විධියට මේ දරුවන්ට -පෙර පාසල් දරුවන් වේවා, පාසල් දරුවන් වේවා සියලු දරුවන්- ගමනාගමනයේදී සිද්ධ වෙන අනතුරු සම්බන්ධව සැලකිල්ලට අරගෙන නැති තත්ත්වයක් තිබෙනවා. බයිසිකලය, ත්‍රී වීලර් එක, වෑන් එක කියන මොන වාහනයක ගියත් දරුවන් හා පොදුවේ මගීන්ට සිදුවන අනතුරු වළක්වා ගැනීම සම්බන්ධයෙන් රටක් විධියට අපට ලොකු වගකීමක් තිබෙනවා. ඒ නිසා අපි යෝජනා කරන්නේ මේ ගැන සැලකිල්ලට අරගෙන යම් නියාමනය කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ කියලායි. මොකද, උදාහරණයක් විධියට පාසල් යන දරුවන් පලඳන හෙල්මට් එක ගත්තොත්, ඒක පපඩම් වාගේ පොඩි කරන්න පුළුවන්. කිසිම ආරක්ෂාවක් නැහැ; කිසිම සොයා බැලීමක් නැහැ.

ඒ වාගේම, ප්‍රවාහන අවශ්‍යතාව සපුරා ගන්න නඟින ත්‍රිරෝද රථයේ සමහර විට කැලි හැලෙනවා; එහෙම නැත්නම් ඒවායෙහි පුළුවන් තරම් පටවා ගෙන යනවා. ඒවායේ ප්‍රතිඵල තමයි රිය අනතුරු හැටියට අපට දකින්න සිදු වන්නේ. පාසල් ළමුන් ප්‍රවාහනය කරන වෑන් රථ ගත්තත් ඒ වාගේම තමයි; කැලි හැලෙනවා. සමහර විට පාවිච්චි කරලා කරලා පැත්තකට දමපු වෑන් රථ තමයි ස්කූල් වෑන් විධියට යොදා ගන්නේ. බස් එකක් ගත්තත් එහෙමයි. එය හොඳ මට්ටමේ තිබෙනවා නම් දුර ගමන්වලට යොදා ගන්නවා; ඊට පසුව ළඟ ගමන්වලට යොදා ගන්නවා; අන්තිමටම දරුවන් ටිකක් පාසල්වලට ප්‍රවාහනය කරන්න යොදවනවා. "හොඳම දේ දරුවන්ට" කියලා කිව්වාට විතරක් බැහැ. අප හිතන විධියට, ජනතාව අපට මේ පාලන බලය ලබා දුන්නේ මේ දේවල් නියාමනය කරලා, සමාජය තුළ කලින් තිබුණේ නැති අලුත් සංස්කෘතියක් ඇති කරන්න කියලායි. "අපි කරන්නේ වගකීමෙන් කරන, වගකීමෙන් මැදිහත් වන රැකියාවක්" කියන මනෝභාවය ඇති පිරිසක් වෙසෙන රටක් අපි හදන්න ඕනෑ. ඒක අප කවුරුත් එකට එකතු වෙලා කරන්න ඕනෑ දෙයක්. අපි එය කරමු කියන ඉල්ලීම මා කරනවා. අපට එය පොලීසියට හෝ වෙනත් ආයතනයකට හෝ භාර දීලා කරවා ගන්න බැහැ. මම යෝජනා කරන්නේ අප මෙහිදී රටක් හැටියට වගකීම දැරිය යුතු බවයි. පාසලක් ගත්තොත්, විදුහල්පතිවරයා පාසල් දරුවන් ප්‍රවාහනය කරන වාහන කළමනාකරණය සම්බන්ධයෙන් යම් දුරකට මැදිහත් වෙනවා. හැබැයි, ඒක මේ අනතුරු වළක්වා ගන්න හොඳම විධියේ මැදිහත්වීමක් කියලා අපි හිතන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ පාසල් ළමුන් රිය අනතුරුවලට ලක්වීම පිළිබඳ සංඛ්‍යාලේඛන කීපයක් අරගෙන බලමු. 2023දී මාරක අනතුරු 10ක්, බරපතළ අනතුරු 19ක් සහ සුළු අනතුරු 149ක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව 2023දී අනතුරු 180ක් පමණ සිද්ධ වෙලා තිබෙනවා. 2024 වසරේදී, මාරක අනතුරු 8ක්, බරපතළ අනතුරු 23ක් හා සුළු අනතුරු 66ක් වශයෙන් එකතුව රිය අනතුරු 97ක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම, 2025 මේ දක්වා මාරක අනතුරු 4ක්, බරපතළ අනතුරු 23ක් හා සුළු අනතුරු 44ක් යනාදි වශයෙන් එකතුව රිය අනතුරු 71ක් සිද්ධ වෙලා තිබෙනවා. මම හිතනවා, මේවායෙන් ගොඩක් ඒවා යම් නියාමන කටයුත්තක් තුළින් වළක්වා ගන්න පුළුවන් කියලා.

විශේෂයෙන්ම ත්‍රිරෝද රථ පාසල් දරුවන් ප්‍රවාහනයට පවා අද උදවු වන බව ඇත්ත. හැබැයි, ඒ දේවල් නියාමනය කළ යුතුයි. ඒ නිසා අපි හිතනවා, විදුහල්පතිවරුන්, දෙමව්පියන් වාගේම පාසලට සම්බන්ධ සංවිධාන එකතු වෙලා ඒ පිළිබඳව මාස තුනකට සැරයක්වත් යම් ඇගයීමක් කරන්න පුළුවන් නම් හොඳයි කියලා. ඒ කියන්නේ, එම රථ ඊට සුදුසු මට්ටමේ තිබෙනවාද, ඒවා පිළිබඳව තවදුරටත් අවධානය යොමු කළ යුතුද, ඒවා ගැන හොයා බලන්නේ කවුද කියන කාරණා සම්බන්ධයෙන් වගකීමක් සහිත වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ කියලා අපි හිතනවා. ඒ නිසා ඒ සඳහා යම් නියාමන වැඩ පිළිවෙළක් අධ්‍යාපන අමාත්‍යාංශය හා අදාළ ආයතන මැදිහත් වෙලා ආරම්භ කළ යුතුය කියලා මම යෝජනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.15]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි මට මේ කාලය ලබා දුන්නාට. පළමුකොටම ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

අද දවස තුළ ලංකාව පුරාම ආපදාවට පත් වෙලා සිටින ජනතාවටත්, ඒ වාගේම මෙම ආපදා තත්ත්වය නිසා මිය ගිය පුද්ගලයන්ගේ පවුල්වල සාමාජිකයන්ටත්, ඔවුන්ගේ ඥාතීන්ටත්, හිතවතුන්ටත් රජයේ කනගාටුවත්, අපගේ කනගාටුවත් අපි පළමු කොට ප්‍රකාශ කර සිටිනවා. මා හිතන විධියට රටක් හැටියට මේ

වෙලාවේ අප හැමෝටම වගකීමක් තිබෙනවා, එකතු වෙලා බොහොම සමඟියෙන් එකිනෙකාට උදවු කර ගනිමින්, මේ ඇති වෙලා තිබෙන දුෂ්කර තත්ත්වය හමුවේ පියමං කිරීමට. එය අප හැමෝම ජාතික වගකීමක් ලෙස සලකන්න ඕනෑ කියන කාරණයත් මම සඳහන් කරනවා.

අද දින ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අදාළ කාරණය, ඒ කියන්නේ සුරක්ෂිත මගී සේවාවක් පවත්වාගෙන යැමට පෞද්ගලිකව සහ පාසල් දරුවන් ප්‍රවාහනය ඇතුළු කර්මාන්තයක් ලෙස ධාවනයේ යොදා ගන්නා ත්‍රිරෝද රථ සම්බන්ධයෙන් නියාමනයක් කළ යුතුයි කියන අදහස අප හැමෝටම එකඟ වෙන්න පුළුවන් කාරණයක් කියලායි මං හිතන්නේ. විශේෂයෙන්ම මේ අවුරුද්දේ මුල් භාගයේදී අප විසින් සම්මත කරන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත තුළ ඕනෑ තරම් නීතිමය ප්‍රතිපාදන තිබෙනවා, පෞද්ගලික වාහන, එහෙම නැත්නම් ත්‍රිරෝද රථ ආදි වාහන නියාමනය කිරීමටත්, දරුවන්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි අනෙකුත් මගී ප්‍රවාහන පහසුකම් නියාමනය කිරීමටත්. ඒ අනුව පාසල් වෑන් රථ නියාමනය කිරීම සම්බන්ධයෙන් මේ වන කොට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අවධානය යොමු වෙලා තිබෙනවා.

විශේෂයෙන් අඩු ආදායම්ලාභී පවුල්වල අම්මලා තාත්තලා තමන්ගේ දරුවන් පාසලේ හෝ පෙර පාසලේ සිට ප්‍රවාහනය කිරීම සඳහා ත්‍රිරෝද රථ බහුලව පාවිච්චි කරනවා. සමහර වෙලාවට ඔවුන් ඒ සඳහා යන මුදල බෙදාගෙන ඒ කටයුත්ත කරනවා වෙන්න පුළුවන්. නමුත් එය ආරක්ෂා සහිතව කරන්නත් අවශ්‍යයි. අපි ඒ ගැනත් සංවේදී වෙන්නට ඕනෑ. ඒ නිසා ඒ කටයුතු නියාමනය කරන ගමන්ම දරුවන් ප්‍රවාහනය කිරීම සඳහා යම් පහසුකම් ප්‍රවර්ධනය කිරීමකුත් අවශ්‍ය වෙනවා. ත්‍රිරෝද රථ සංගම්වලට, එහෙම නැත්නම් රියැදුරන්ට මගීන්ගේ ආරක්ෂාව සම්බන්ධව උපදෙස් ලබා දීමට, එහෙම නැත්නම් ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට මොකක් හරි ක්‍රමවේදයක් සකස් කිරීමට ප්‍රවාහන අමාත්‍යාංශයටත්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවටත් විශේෂ වගකීමක් තිබෙන බව මම මතක් කරන්න කැමැතියි.

දවස් කිහිපයකට ඉස්සෙල්ලා ගරු ප්‍රවාහන ඇමතිතුමා ප්‍රකාශ කළා, පාසල් වෑන් රථවල CCTV උපකරණ සවි කිරීම සම්බන්ධයෙන්. ඒ නිසා දරුවන් ඇතුළු මගීන් ප්‍රවාහනය සම්බන්ධයෙන් වාගේම අනෙකුත් ප්‍රවාහන මාධ්‍ය සම්බන්ධවත් දැඩි අවධානයක් යොමු කරන ලෙස ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.18]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්තටම මම විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ අපේ ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමියට. එතුමිය වැඩිය කථා කරනවා මම දැකලා නැහැ. එතුමිය මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන සන්තෝෂයි. මොකද, මෙය හරිම වැදගත් කාරණාවක්.

ඇත්තටම වෙනත් දවසක නම් මම කැමති වෙන්නේ මේ මිනිත්තු 10ම යෝජනාවට අදාළව කථා කරන්නයි. නමුත් ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේත් අවසරය ඇතුව මම මේ අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන -මිනිත්තු දෙකක කාලයක් අරගෙන- මේ පවතින ආපදා තත්ත්වය ගැන කථා කරන්නම්. ඒ ගැන කථා කරන්න මට අවසර දෙන්න.

අද වන විට කල්මුණේ නගරයේ ඛේදනීය සිදුවීම් ගොඩක් සිදු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ කියන සිදුවීම ගැන දන්නවාද දන්නේ නැහැ. බලා සිටිද්දීම සයින්දමරුදු ප්‍රදේශයේ Vezel වාහනයක් එහෙම පිටින්ම වතුරේ ගිලුණා. ඒ වාහනයේ හිටියේ, මාත් හඳුනන "Foreign City" shop එකේ ජලීල් කියන කෙනාගේ මාමයි, නැන්දයි, කුඩා දැරියයි. ඇත්තටම ත්‍රිරෝද රථ සම්බන්ධව ඉදිරිපත් කරපු මේ යෝජනාවටත් ඒකේ පොඩි සම්බන්ධතාවක් තිබෙනවා. බොහෝ දෙනෙකුට හරි දැනුවත්භාවයක් නැහැ, එහෙම අවස්ථාවක කෙසේ කටයුතු කළ යුතුද කියන එක ගැන. සමහර විට ඒ කට්ටිය හිතන්න ඇති, තමන් වාහනය ඇතුළේ හිටියොත් බේරෙන්න පුළුවන් කියලා. නමුත් ඒ වාගේ අවස්ථාවක වහාම ජනේල ඇරලා එළියට පැනලා වතුරේ පීනලා බේරිලා යන එක තමයි කරන්න ඕනෑ හොඳම වැඩේ. ඒ ගැන දන්නේ නැති නිසා වෙච්ච ඒ සිද්ධිය හරිම ඛේදනීයයි. ඒ දෙමව්පියන්ට -ඒ සීයාටයි, ආච්චිටයි- ලොකු වයසක් නැහැ. පොඩි දැරියත් එක්කමයි මිය ගියේ. ඒ පවුල්වල අයට මගේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. මම අවස්ථාවක් අරගෙන ඒගොල්ලන් ගැනත් දමිළ භාෂාවෙන් පොඩ්ඩක් කථා කරන්නම්. ඒ ගැන මට සමා වෙන්න.

இன்று சாய்ந்தமருது பிரதேசத்தில் Vezel ரக வாகனமொன்று bridge ஒன்றைக் கடக்கும்போது, பாதையை விட்டு விலகி நீரில் மூழ்கியது. அதில் பயணித்த சாய்ந்தமருது பிரதேசத்தைச் சேர்ந்த தம்பதியினரும் அவர்களுடைய பேத்தியும் காலமானார்கள். *இன்னா லில்லாஹி வஇன்னா இலைஹி ராஜிஊன்!* அவர்களுடைய குடும்பத்தினருக்கு என்னுடைய அனுதாபத்தைத் தெரிவித்துக் கொள்கின்றேன். இவர்கள் "Foreign City" shop ஹில்மி அவர்களுடைய நெருங்கிய உறவினர்கள். இன்னுமொரு விடயத்தைச் சொல்லிவிட்டு, விடயத்துக்கு வரலாமென நினைக்கின்றேன்.

මම තව එක කාරණයක් කියන්න ඕනෑ. මට අද මිනිත්තු 10ක් ලබා දීම ගැන හරිම සන්තෝෂයි. ගරු ලාල් කාන්ත ඇමතිතුමා අද කල්මුනේ ජනතාව වෙනුවෙන් ලොකු දෙයක් කළා. ඒකට ස්තුති කරන්නවත් ප්‍රධාන විවාදය වෙලාවේ මට අවස්ථාව හම්බ වුණේ නැහැ. අවුරුදු 20ක, 25ක දීර්ඝ කාලීන ප්‍රශ්නයක් තිබුණා, අම්පාර කල්මුනේ නගරය මැද තිබෙන රජයේ ඉඩම් ටික -එම වෙළඳ සැල් ටික- සම්බන්ධයෙන්. අවුරුදු 20කට වැඩි කාලයක් තිස්සේ ඒ ප්‍රශ්නය තිබුණා. අපේ කට්ටියත් ඒ ප්‍රශ්නය නිරාකරණය කළේ නැහැ තමයි. ඒ බව මම දන්නවා. මට පෙනෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් හිනා වෙනවා. මා කියන්නේ ඇත්ත. අපි වරදක් කළා නම් පිළිගන්නත් එපායැ. ඒක තියාගෙන දේශපාලනය කළා. ඒ මදිවාට ප්‍රෝඩාකාරී තැනැත්තියක් ගිහිල්ලා "උරුමය" යටතේ ඒවාට බලපත්‍ර අරගෙන දෙන්නම් කියලා එක මනුස්සයෙකුගෙන් රුපියල් ලක්ෂ 6ක් බැගින් අරගෙන තිබෙනවා. ගරු ලක්මාලි මන්ත්‍රීතුමිය බලනවා ඇති, මේ මොකක්ද කියන්නේ කියලා. එක්කෙනෙකුගෙන් රුපියල් ලක්ෂ 6ක් බැගින් 120දෙනෙකුගෙන් රුපියල් කෝටි 6ක් අරගෙන තිබෙනවා. ඒක කරලා තිබෙන්නේ කාන්තාවක්. එයා කියා තිබෙන්නේ, එයා නීතිඥ මහත්මියක් කියලා. කාන්තාවක් එවැනි වංචාවක් කරලා තිබෙනවා. ඒ කියන්නේ, එහෙම වෙන තරමට ඒක ඒ මිනිස්සුන්ට -ඒ දෙමළ, මුස්ලිම් ජනතාවට- විශාල ප්‍රශ්නයක් වෙලා තිබුණා. அதையும் நான் தமிழில் சொல்ல வேண்டும். ඒ ගැන දෙමළ භාෂාවෙන්

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

කියන්න ඉස්සර වෙලා මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ගරු ලාල් කාන්ත ඇමතිතුමාට. එතුමාගේ අවධානයට මම ඒ කාරණය ලිඛිතව ඉදිරිපත් කළාම එතුමා එවේලේම ක්‍රියාත්මක වුණා. ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා ඉන්න අවස්ථාවක, එතුමාගේ ලේකම්තුමා ඉන්න අවස්ථාවක අදාළ නිලධාරින්ට කථා කරලා, "උරුමය" හෝ "හිමිකම" හෝ වේවා, දීර්ඝ කාලීන බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් කථා කිරීම සඳහා වන සාකච්ඡාවකට එතුමා එකඟ වුණා. ඒ සම්බන්ධයෙන් එතුමාට බෙහෙවින් ස්තුතියි.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 25 வருடங்களுக்கும் மேலாக கல்முனை நகரிலுள்ள பெரியதொரு பிரச்சினையைத் தீர்ப்பதற்கான அடித்தளத்தை இன்றைக்கு நாங்கள் இட்டிருக்கிறோம். குறித்த விடயத்தை அரசியலுக் காகப் பயன்படுத்தி, கல்முனை நகரத்தில் இருக்கின்ற தமிழ், முஸ்லிம் மக்களுக்கு இடையில் முறுகல் நிலையை ஏற்படுத்தி இருந்தார்கள். அங்கு ஏறத்தாழ 50 வருடங்களாக, அரச காணியில் கட்டிடங்களைக் கட்டி, அவற்றில் வியாபாரம் செய்துகொண்டு இருப்பவர்களுக்கு இப்பொழுது வழங்கப் படுவது annual permit. அவர்கள் annual permit அடிப்படையில் அந்தக் கடைகளை வைத்திருப்பதால், நிரந்தரமாக வியாபாரம் செய்வதற்கு வங்கியில் கடன்பெறுவதற்கோ அல்லது agencyஐ எடுப்பதற்கோ அந்த ஆவணத்தை ஏற்றுக்கொள்ள மாட்டார்கள். அங்கு இவ்வாறான கடைகள் கிட்டத்தட்ட 350 இருக்கின்றன. அவற்றை முஸ்லிம்களும் தமிழர்களும் ஒருசில சிங்களவர்களும் வைத்திருக்கிறார்கள். எங்களுடைய அரசியல்வாதிகளும்கூட, கடந்த 20 வருடங்களாக இவற்றுக்கு நிரந்தரமான அனுமதிப் பத்திரத்தைப் பெற்றுக்கொடுப்பதற்கு எந்தவித நடவடிக்கையும் எடுக்கவில்லை. எனினும், இந்த விடயத்தை அவர்கள் தங்களுடைய அரசியலுக்காகப் பயன்படுத்திக் கொண்டார்கள். இந்தச் சூழ்நிலையில், 'உறுமய' நிகழ்ச்சித்திட்டத்தின்கீழ் இந்தக் காணிகளுக்கு அனுமதிப் பத்திரத்தைப் பெற்றுத் தரலாமென ஒரு பெண்மணி -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කල් තැබීමේ යෝජනාවට සාධාරණයක් වන විධියට කථා කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

මම මිනිත්තුවකින් කථාව අවසන් කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාවෙලා මට තව මිනිත්තුවක කාලයක් ලබා දෙන්න. මම එතුමියගෙනුත් අවසරය ගත්තා.

அந்தப் பெண்மணி என்ன செய்தார் என்றால், அந்தக் காணிக்குரிய permitsஐப் பெற்றுத்தருவதாகக் கூறி, 6 கோடி ரூபாயை மோசடி செய்து விட்டார். நான் இது சம்பந்தமாக கௌரவ அமைச்சர் லால் காந்த அவர்களிடம் சொன்னபொழுது, உடனடியாக இது சம்பந்தமாக நடவடிக்கை எடுப்பதாகக் கூறியதோடு, அது சம்பந்தமாக சந்தித்துப் பேசுவதற்கு எழுத்துமூலம் தினமொன்றையும் குறித்துத் தந்தார். அதற்காக அவருக்கு நன்றி சொல்கின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන කථා කරන්නම්. මේ ත්‍රීවිල් ප්‍රශ්නය හරි බරපතළයි. මේ ත්‍රීවිල් ප්‍රශ්නය මොන වාගේද දන්නවා ද? ත්‍රීවිල් කියන්නේ ඇතිවත් බැරි, නැතිවත් දෙයක්. ඔය ත්‍රීවිල් රියැදුරන් රථය පදවන ආකාරය මම දැක තිබෙනවා. සමහර අවස්ථාවලදී මගේ වාහනයේ යනකොට පේනවා, ඉදිරියෙන් යන ත්‍රීවිල් රථය දකුණට සිග්නල් දාලා කිලෝමීටර 10ක් විතර දුර යනවා. ඒ මනුස්සයා දකුණට සිග්නල් දාලා පාර දිගටම යනවා. එතකොට පිටුපසින් යන මට overtake කරන්න sure නැහැ. ඒ විධියට ත්‍රීවිල් රථය පදවාගෙන ගිය මනුස්සයෙක් නවත්වලා මම දවසක් ඒ මනුස්සයාගෙන් මේ ගැන ඇහුවා. ඒ මනුස්සයා මගෙන් අහනවා, "ඇයි සර්, මොකක්ද ප්‍රශ්නය?" කියලා. මම කිව්වා, "ඔයා දකුණට සිග්නල් දාගෙනයි දිගටම යන්නේ" කියලා. ඊට පස්සේ ඔහු මගෙන් අහනවා, "ආ! එහෙමද?" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හේතුව මොකක්ද දන්නවා ද? ඉන්දියාවේ ඉඳලා නේ ඒ ත්‍රීවිල් ගෙන්වන්නේ. ඒ ත්‍රීවිල් එක හදලා තිබෙන විධිය අනුව ටක්, ටක්, ටක්, ටක් ගාලා සිග්නල් වදිනවා. ඒ සිග්නල් එක රතු පාටින් දකුණු පැත්තේ පෙන්වන්න පොඩි එළියක් තිබෙන්නේ. ඒ මනුස්සයාට ඒක තේරෙන්නේත් නැහැ. ඒ ත්‍රීවිල් එකේ කුටු, කුටු ශබ්දයට ත්‍රීවිල් එකේ සිග්නල් එක on කියලා පෙනෙන්නේත් නැහැ. සමහර විට ඒ ත්‍රීවිල්කාරයා - සමාවෙන්න, මම ත්‍රීවිල්කාරයා කියන එක වැරැදියි - ඒ ත්‍රීවිල් රථය පදවන මහත්මයා හෝ මහත්මිය දකුණට හරවනවා කියලා සිග්නල් එක දාගෙන ටික දුරක් යනකොට, ඒ ත්‍රීවිල් රථය දකුණට හරවන එකක් නැහැ කියලා හිතලා අපි ඒක overtake කරන්න ගිහිල්ලා අනතුරක් වෙන්නත් පුළුවන්. ඒ වාගේම, සමහර අවස්ථාවල පවුලේ ඉන්න හතර පස්දෙනාමත් ඒ ත්‍රීවිල් එකේ අරගෙන යනවා, විශේෂයෙන්ම අපේ ගම්වල. ඒකේ තවත් පැත්තකුත් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, ඒක දුප්පතාගේ ප්‍රවාහන පද්ධතියක්. ඒ මනුස්සයා ත්‍රීවිල් එකක යනවා වෙනුවට බස් එකේ යන්න ගියොත් පැය ගණනක් යනවා. වෙන වාහනයක් අරගෙන ගියොත් වියදම වැඩියි. මොකද තමන්ට කියලා වාහනයක් නැහැ. මේක මහා ලොකු අභියෝගයක්. ඇත්තටම මේ Adjournment Motion එක දැකපු ගමන් මට හරිම සන්තෝසයි. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියකට මේ යෝජනාව ඉදිරිපත් කිරීමට ධෛර්යයක් තිබීම පිළිබඳව මම සතුටු වෙනවා. ත්‍රීවිල් ප්‍රජාව කියන්නේ, මේ රජයම පෙරළන්න පුළුවන් ප්‍රජාවක්. ඒක මතක තියා ගන්න ඕනෑ. ඒ ත්‍රීවිල් කර්මාන්තය හරහා සෘජුව සහ වක්‍රව අපේ රටේ ලක්ෂ ගණනකගේ ආදායම රැඳී තිබෙනවා.

එපමණක් නොවෙයි, විශේෂයෙන්ම මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ පවුලේ අය හෝ ඕනෑම පවුලක දරු දැරියන් පාසල් යෑම සඳහා ප්‍රවාහන මාධ්‍ය විධියට සියයට 90ක්ම තෝරා ගන්නේ ත්‍රීවිල් රථ. විශේෂයෙන්ම kindergarten ඉඳලා, පළමුවැනි ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා දරුවන්ගේ ප්‍රවාහන මාධ්‍ය විධියට ඒ අම්මලා, තාත්තලා තෝරාගෙන තිබෙන්නේ ගමේ හඳුනන ත්‍රීවිල් එක. ඒ ත්‍රීවිල් එකේ දරු දැරියන් හතර පස්දෙනෙක් අරගෙන යනවා. දැන් මේක හරි ප්‍රශ්නයක්. මොකද, ත්‍රීවිල් කියන්නේ අපට අත්‍යවශ්‍ය දෙයක්. නමුත් ඒක නියාමනය කළ යුතුයි. මේක හරිම වැදගත් යෝජනාවක්. වෙන වෙලාවක නම් මම මේ ගැන වෙනම කථා කරනවා. මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ නියාමනය කිරීමේදී ත්‍රීවිල් රථ ධාවනය කරන අයටත්, ඒ ප්‍රවාහන පහසුකම් ලබා ගන්නා පාරිභෝගිකයාටත් කිසිම අසාධාරණයක් නොවන පරිදි ඒක කරන්න ඕනෑ. ඒක කිරීමේදී වැදගත් කාරණයක් තමයි සංවෘත ත්‍රිරෝද රථ යොදා ගැනීම. EV යටතේ එන ත්‍රිරෝද රථයක් තියා ගත්තාම ඒක ලොකු පහසුවක් වෙනවා. විවෘත ත්‍රීවිල් එකකින් මනුස්සයෙක් යනකොට පාරේ තිබෙන දූවිලි ටික එයාගේ ඇඟ පුරාම ගෑවෙනවා. වැස්ස වෙලාවට දැන් තිබෙන ත්‍රීවිල් රථවල යන්න බැහැ. නමුත්, යම්කිසි ආකාරයක නියාමනය කිරීම හරහා ඒ ත්‍රීවිල් රථ ධාවනය කරන අයට යම්කිසි දිරි දීමනාවක් ලබා දීලා, අත්‍යවශ්‍ය උපාංග සවිකිරීම සඳහා අපි අවස්ථාවක් ලබා දෙන්න ඕනෑ. ත්‍රීවිල් රථයේ ගමන් ගන්නා මගීන් ආරක්ෂිත වන ආකාරයට ආවරණය කර ගන්න, ඒ රථය තුළට හොඳින් වාතය

ලැබෙන පරිදි සකස් කර ගන්න, ඒ ත්‍රීවිල් එකේ සිග්නල් ටික හරියට දාගන්න අවශ්‍ය පහසුකම් වෙනුවෙන් අපි අවස්ථාවක් දෙන්න ඕනෑ. අපි electric vehicles - EVs - තත්ත්වයට යන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මම කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන මම එතුමියට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, මේ ත්‍රීවිල් රථ නියාමනය කිරීමේදී ඒ ත්‍රීවිල් රථ හිමියන්ට සහ එය භාවිත කරන පාරිභෝගිකයන්ට අසාධාරණයක්, ප්‍රශ්නයක් නොවන විධියට ඒ නියාමනය සිදු කළ යුතු බව කියමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.29]

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිරෝද රථ නියාමනය කිරීම පිළිබඳවත්, එහි ගමන් ගන්නා විශේෂයෙන්ම දරුවන් ඇතුළු ජනතාවගේ ආරක්ෂාව පිළිබඳවත් ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් කරුණු දැක්වූ ගරු මන්ත්‍රීතුමාට සහ මන්ත්‍රීතුමියට මා ස්තුතිවන්ත වෙනවා. මෙතැනදී මතු වුණු කරුණු අනුව මෙහි සැලකිය යුතු වගකීමක් ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශයටත් තිබෙන බව අප හිතනවා. එම වගකීමත් පදනම් කරගෙන තමයි මගේ කරුණු දැක්වීම ඉදිරිපත් කරන්නේ.

පළමුවන කාරණය මෙයයි. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම, අපේ රටේ ප්‍රවාහන සේවයේ සැලකිය යුතු ඉඩක් ත්‍රීවීලර් ක්ෂේත්‍රය අත්පත් කරගෙන තිබෙන බව අපි දන්නවා. හැබැයි, ත්‍රීවීලර් මඟින් සැලකිය යුතු සේවාවකුත් සිදු වනවා. නාගරික හෝ ග්‍රාමීය කියලා වෙනසක් නොමැතිව ත්‍රීවීලර් රථ රියැදුරන්ගෙන් ප්‍රවාහනය සඳහා ලොකු සේවාවක් සිදු වෙමින් තිබෙනවා. එක පැත්තකින් ආරක්ෂිත ප්‍රවාහන මාධ්‍යයක් ලෙසත්, පහසු ප්‍රවාහන මාධ්‍යයක් ලෙසත්, ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පොඩි මුදලකින් ගමන් පහසුව සලසා ගැනීමට හැකි ප්‍රවාහන මාධ්‍යයක් ලෙසත් ත්‍රිරෝද රථ ප්‍රචලිත වෙලා තිබෙනවා. එම ක්‍රියාවලිය එසේ සිදු වන අතරේ අපට ඒ දේවල් යම් ප්‍රමාණයකින් හෝ නියාමනය කර ගන්න බැරි වුණොත් එහි ප්‍රතිවිපාකත් නැවත ජනතාවටම තමයි විඳින්න සිද්ධ වෙන්නේ. එම නිසා, යම් ක්‍රමවේදයකට අනුව; යම් ක්‍රියාවලියකට අනුව මේ සියලු දේවල් නියාමනය විය යුතුයි කියලා අපි හිතනවා. අපි කියනවා, ඒ සඳහා system එකක් සාදා ගත යුතුයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ඛේදවාචක ඕපපාතිකව සිදු වුණු දේවල් නොවෙයි. ඒවා ඇතුළේ ආර්ථික ප්‍රශ්න, සමාජයීය ප්‍රශ්න තිබෙනවා. ආර්ථික තත්ත්වය මත තමයි එවැනි ඛේදවාචක සිදු වෙන්නේ. උදාහරණයක් ඉදිරිපත් කළොත්, 2023දී කළ සමීක්ෂණයකට අනුව රථ වාහන අනතුරු 24,784ක් සිදු වෙලා තිබෙනවා. ඒකෙන් ත්‍රිරෝද රථවලින් සිදු වුණු අනතුරු 5,972ක් තිබෙනවා. ඒ කියන්නේ, මුළු අනතුරු ප්‍රමාණයෙන් සියයට 24ක්ම ත්‍රිරෝද රථවලින් සිදු වුණු අනතුරු. ඒ කියන්නේ, අනතුරු 6ක් සිදු වෙද්දි එයින් එක අනතුරක් ත්‍රිරෝද රථ අනතුරු. එතකොට මේ තත්ත්වය තුළ දැන් ගැටලු ගණනාවකට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමිය යෝජනාවේදී සඳහන් කළා වාගේම, ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා වාගේම, පසුගිය දවසක වූ ත්‍රිරෝද රථ අනතුරත් එක්ක නියාමනයේ අවශ්‍යතාව මතු වනවා. සාමාන්‍යයෙන් ත්‍රිරෝද රථවල ගමන් කරන්න පුළුවන් ගණන නිශ්චිතව සඳහන් කරලා තිබෙනවා. හැබැයි බොහෝ අය මෙම නියාමනය යම් ප්‍රමාණයකට රැක්කාට, ඇතැම් අය එය කඩ කරන බව අපි දන්නවා, විශේෂයෙන්ම කුඩා දරුවන් රැගෙන යන ත්‍රිරෝද රථ හිමියන්. මොකද, දරුවන්ගේ ශරීරයත් කුඩා නිසාම පටවාගෙන යනවා. අපි කියන්නේ, පොල් පටවලා වාගේ කියලා නේ. අන්න ඒ විධියට අරගෙන යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
හොඳයි.

එම නිසා ත්‍රිරෝද රථ අනිවාර්යයෙන්ම නියාමනය කළ යුතුයි කියලා අපි හිතනවා. මොකද, ත්‍රිරෝද රථයට දරා ගත නොහැකි, එහෙම නැත්නම් නියම කර ඇති මගී සංඛ්‍යාවට වැඩියෙන් පිරිස රැගෙන යෑම පිළිබඳ ගැටලුවකට අප මුහුණ දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ත්‍රිරෝද රථයක විවෘත ප්‍රදේශ වැඩියි. එහි ආරක්ෂක පටි ආදිය නැහැ. එයත් දැන් ගැටලුවක් විධියට තිබෙනවා. ඒ වාගේම තමයි ත්‍රිරෝද රථවල, රථයකට නුසුදුසු පරිදි විවිධ භාණ්ඩ එල්ලා තිබෙනවා; සරසලා තිබෙනවා. ඒකත් ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා.

ඊළඟ කාරණය මේකයි. ත්‍රිරෝද රථයේ රෝද තුනයි තිබෙන්නේ. රෝද තුනක් දැමීමට විද්‍යාත්මක පදනමක් තිබෙනවා. නමුත්, නියමිත වේගය අභිභවා, අධික වේගයෙන් ගමන් කිරීම නිසාත් ගැටලු ගණනාවක් මතු වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි ධාවනයට නුසුදුසු තත්ත්වයේ පැවතීම. ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය මතු කළා, කුඩා ළමුන් රැගෙන යන ඇතැම් ත්‍රීවිලර්වල තත්ත්වය. ඇත්තටම ඒවා ප්‍රමිතියෙන් යුතු ත්‍රීවිලර් නොවෙයි. අබලන් තත්ත්වයේ තිබෙන ත්‍රීවිලර්. වෑන් රථත් එහෙමයි. එවැනි ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමාත් මතු කළ පරිදි යම් ක්‍රමවේදයකට අනුව ඒවා නියාමනය කර ගත යුතුයි කියලා අපි හිතනවා. නැත්නම් මෙම ඛේදවාචකය අවසන් කර ගන්න හැකි වෙන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ත්‍රිරෝද රථ රියැදුරන්ගේ ආර්ථික තත්ත්වය පිළිබඳවත් අපි කල්පනා කළ යුතුයි. ඒ මත සිටිමින්, ලබන වසරේ සිට යම් නියාමනයකට මැදිහත් විය යුතුයි

[ගරු එරංග ගුණසේකර මහතා]

කියලා අප කල්පනා කරනවා. ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය කිව්වා වාගේ දැනටත් නීතිරීති තිබෙනවා; රෙගුලාසි තිබෙනවා. නමුත්, ඒ අනුව නියාමනය වෙන්නේ නැහැ. අපේ ගරු ඇමතිතුමා කිව්වා වාගේම ලබන වසරේ ජනවාරි මාසයේ සිට විශේෂයෙන්ම වෑන් රථවල CCTV සවි කරලා ඒවා නියාමනය කරන්න යම් මැදිහත් වීමක් කිරීම සඳහා අපි සූදානම් වනවා.

විශේෂයෙන්ම දරුවන් සහ කාර්යාල සේවකයන් ප්‍රවාහනය කිරීම සඳහා තිබෙන වාහන යම් නියාමනයක් කිරීම සහ යම් ප්‍රමිතිගත කිරීමක් සඳහා මැදිහත්වීමට අප සූදානම් වෙනවා. ඒ විතරක් නොවෙයි. අපේ ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා කිව්වා වාගේම රියැදුරන් සඳහා පුහුණුවක්, ඔවුන් පිළිබඳ යම් විශේෂ මැදිහත්වීමක් කරලා ඔවුන්ට මේ පද්ධතිය ඇතුළේ වැඩ කිරීමට අමාත්‍යාංශය ලෙස යම් මැදිහත්වීමක් කරන්න අප සූදානම් වෙමින් සිටිනවා. එම ක්‍රියාවලිය ඇතුළේ මේක යම් නියාමනයකට ලක් කරන්න අපි සූදානම් වෙනවා. ඒ පිළිබඳව ඔවුන් සමඟත් සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. ත්‍රිරෝද රථ වෘත්තීය සමිති ගණනාවක් තිබෙනවා. එම ක්ෂේත්‍රයේ යෙදෙන ජනතාව විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන් සමඟත් සාකච්ඡා කර යම් නියාමනයකට මැදිහත් වෙන්න අප සූදානමින් ඉන්නවා.

අපේ ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ මේ යෝජනාව අනුවත්, පොදුවේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඒ වාගේම රටේ ජනතාවත් කියන අප සියලුදෙනා විශේෂයෙන්ම අපේ දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් විය යුතුයි. ඒ පිළිබඳව යම් නියාමනයකට ආ යුතුයි. ඒ ගැන විවාදයක් නැහැ. අපේ රටේ නීති රීති ඕනෑ තරම් තිබෙනවා. නමුත්, අප ඒ නීති රීති ක්‍රියාත්මක තලයට ගෙන යා යුතුයි. ඒ නීති රීති ක්‍රියාත්මක තලයට ගෙන යා යුත්තේ කවුරුත් අපහසුතාවට පත් කිරීමේ අරමුණින් නොවෙයි. අපේ දරුවන්, අපේ මඟීන්, අපේ කාන්තාවන්, අපේ අම්මලා, තාත්තලා ආරක්ෂා කරමින්, ඔවුන්ගේ ජීවිතය පිළිබඳ යම් වටිනාකමක් ඇතිව ඔවුන්ට සුවපහසු ගමනාන්තයක් ලබා දීම අප කාගේත් වගකීමක්. ඒ අරමුණින් යුතුව මේ මන්ත්‍රීවරු සියලු දෙනාගේ සහයෝගය ඇතිව, විශේෂයෙන් අපේ ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු යෝජනාව මත පදනම්ව මේ ක්ෂේත්‍රයේ යම් නියාමනයක් කර ගැනීම වෙනුවෙන් අප මැදිහත් වන බව ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ.භා. 6.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.36ට, 2025 නොවැම්බර් 13වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 28වන සිකුරාදා පූ.භා. 9.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.36க்கு, பாராளுமன்றம் அதனது 2025 நவம்பர் 13ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 28, வெள்ளிக்கிழமை மு.ப. 9.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.36 p.m. until 9.00 a.m. on Friday, 28th November, 2025, pursuant to the Resolution of Parliament of 13th November, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.